
ඩබ්ලියු. ඒ. සිල්වා
කැලෑහඳ

# කැළෑ හඳ

(සිනමා චිත්‍රයට නැඟුණු ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල නවකතාව)

## ඩබ්ලියු. ඒ. සිල්වාගේ වෙනත් කෘති

* සිරියලතා හෙවත් අනාථ තරුණී
* ලක්ෂ්මී හෙවත් නොනැසෙන ප්‍රීති
* හිඟන කොල්ලා
* පාසැල් ගුරුවරී
* දෙයියන්ගේ රටේ
* සුනේත්‍රා
* කථාරත්නාකරය
  1 කාණ්ඩය - ලේන්සුව
  2 කාණ්ඩය - සක්විතිරජ
  3 කාණ්ඩය - අමෘත හස්තය
  4 කාණ්ඩය - දල කුමාරි
* දෛව යෝගය
* විජයබා කොල්ලය
* රදළ පිළිරුව
* හඳපාන
* ජූලි හත
* මායා යෝගය (නාටකයකි)
* එක් දහස් එක් රැය - කාණ්ඩ 1,2,3,4
* රිදී හවඩිය
* වාල්මිකී - රාමායනය
* ඉෂ්ටාර්ථ සිද්ධියේ රහස
* ඉංග්‍රිසි ස්වාධ්‍යයනය
* සිල්වාගේ ඉංගිරිසි හෝඩිය

# කැලෑ හඳ

ඩබ්ලියු. ඒ. සිල්වා

සීමාසහිත
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

ප්‍රථම මුද්‍රණය = 2001
පහළොස්වන මුද්‍රණය = 2018

කැලෑ හඳ

ඩබ්ලියු. ඒ. සිල්වා

© වතවත සිරිසුමන හිමි

ISBN 955-20-0647-3

පරිගණක සැකසුම:
ඓශ්වර්යා

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661, 665, 675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

R-2809/2018/2000

# 1

වේල් බලන්නට පැමිණි මහ පිරිස් අතර, හැත්තෑ වියෙහි සිටි, පෙනුමෙන් දුබල මහල්ලෙක් ද, අටළොස් වියෙහි සිටි, බොළඳ තරුණියක ද වූහ. ඇඳුම්-පැළඳුම් වලින් පවා, බැලූ බැල්මට ම ඔවුන් නාගරිකයන් නො වන බව පෙනේ. මහල්ලාට වස්ත්‍රය වූයේ, අලුත් මඩකලපු සරෝමක් හා පරණ සුදු කබායකි. සරෝම කෙසේ වුවත්; කබාය නම්, තමාගේ වැනි සිත්කලු සිරුරකට නොව, සඹුප් කායකට සුදුසු වන පරිද්දෙන් මුවින් මස්වන ලද හෙයින්, දැන් පරණ වුව ද, තමාට අවනත නොවන්නකු සේ, දළයෙන් පසු බසින්නේ ය. එතෙක් නන්ද රාළට හෙවත් මේ මහල්ලාට ඇඳුමක හැඩය ඇති-නැති බවක් නො තේරේ. නන්ද රාළ වෙනුවෙන් යම් කිසි විටක සරෝමක් මැසුණත්, කබායක් නම් කිසි කලකත් නොමැසුණේ ය. නන්ද රාළ කබාය අඳින්නෙක් නොවේ. ඔහු කබායට හුපුරුදු ය. ඔහු පුරුදු සරෝමක් හිණට හැඳ ගෙන, සරෝමක් උරය පත්නා, උරය මතුපිට ලා ගෙන, ලේන්සුවක් හිස බැඳ ගෙන, ගමන් යාමට පමණකි.

කාලය වෙනස් විය. එයින් පහත රට වීසා දෙනකුට පමණක් විශේෂ වූ කබාය සාහටත් පොදු විය. පළමුවෙන් පිටිසර ද, තරුණ පෙළ ම කබායට යුහුව-යුහුව පුරුදු වූහ. පරණ පෙළ, මේ අලුත් වෙනස එ තරම් ඉක්මනින් නො පිළිගත්හ. එ හෙයින්, කල් යාමේ දී පරණ පෙළේ වෘඩයකු වූ නන්ද රාළ යෙස්සන් වැනි වූ ම සිත්-පිත් ඇති, ඇට-මස්-ලෙයින් සැදුණු, මිනිහකු වුව ද, නවීන ශිෂ්ටාචාරයෙන් යුත් මුළු රටට ම කෞතුක වස්තුවක් විය- නොහොත් සුදුමයක් විය. යට ගිය කලදී නම්, ඔහුට බැලූ-බැලූ අසින් තමා යේ වූවත් දකින්නට ලැබිණි. තමාගේ වැනි

ඇඳුම් පැළඳුම් හා සිරිත්-විරිත් දකින්නට ලැබිණි. එහෙත් දූන්, තමා හා සම කිසිවෙකුත් රටේ දක්නා නො ලැබෙති. ආයුෂ් ප්‍රකරණය තමාට පීඩාවක් නොවන පිණිස ඔහු ද කාලයට ඔබින පරිද්දෙන් වෙනස් වන්නට සිතට ගත්තේ ය. ඔහු මහලු කමෙන් පමණක් නොව, අපිරිසිදු කමෙන් ද, ජරාවට ගිය මහල්ලෙකි. පැරණි ගත් කරුවකුගේ වැනුමකට සුදුසු වන පරිද්දෙන්, පැතිර සිටිනා පතුල් ඇති, බත් මුළු සේ සිටිනා කොංඩා ඇති, මහත් වූ දණ මඩුලු ඇති, පළල්ව සිටිනා ඇළවර ඇති පැසුණු දළි රැවුල් ඇති, පිහුවත් ගැඹුරු නෙත් ඇති, මේ වෘද්ධයාගේ ඔපයකට පෙනෙන්නේ හිසේ තට්ටය පමණකි. ඔහු මෙ සේ වෙනස් වෙන්නට සිතට ගෙන, ගමෙන් බැහැර යන විට පමණක් - නොහොත් විශේෂ ප්‍රස්තාවයක දී පමණක්, මෑතක සිට-මේ "ගො මස් කඩ පෙරවීම" හෙවත් කබාය ලා ගැන්ම, කරන්නට පටන් ගත්තේ ය. එ සේ පටන් ගත්තේ ද, තමා වෙනුවෙන් මසන ලද, විශේෂ වූ කබායක් ඇඟ ලා ගැන්මෙන් නො වේ-එ වෙලාවට හරි යන තැනකින් අනුන් සතු කබායක් පිරුළු වශයෙන් ඉල්ලා හැඳ ගැනීමෙනි. වේල් බලන්නට සිය මිනිබිරිය හා කොළඹ පැමිණි මේ විශේෂ ප්‍රස්තාවයෙහි කබාය දළ දෙ කොනින් පසු බසින්නට කාරණය ද මේ මය.

මෙ සේ මහල්ලා වෘද්ධාවස්ථාවට ලාඤ්ජනය වූ පරිද්දෙන් බාලිකාව තරුණාවස්ථාවට ලාඤ්ජනය වූවා ය. අංග සංස්කරණයෙන් නගර ව්‍යවහාරයට අනුරූප වුව ද, ඇය කෙරෙන් තව ම පිටිසර පෙනුම සම්පූර්ණයෙන් දුරු නො වීය. කලට ඔබින ඇයගේ සේද සාරියෙනුත්, මේස්-සපත්තු ආදියෙනුත්, ඒ හැම, නිතර අඳින්නන් කෙරේ මෙන්, පුරුදු පෙනුම නො දක්විණි. ඇයට ම ඒ ප්‍රත්‍යක්ෂ ය. එ හෙයින් අපහසුවෙන් නමුත්, ඇඳුමට සුදුසු වන පරිද්දෙන් පියවරක්-පියවරක් පාසා, පුරුදු-පුහුණු කම් දක්වීමට ඈ පරිශ්‍රම දැරුවා ය. මාලිනී, එ නම් මේ තරුණිය, යම්තම් නව යොවුන් බවට පැමිණියා පමණකි. ස්ත්‍රිය බාල්‍යයෙන් යෞවන ප්‍රාප්ත වීම, කුට්මලය පුෂ්පාවස්ථාවට විකසිත වීම වැනි ප්‍රසාද ජනක සිද්ධියකි-අරුණෝදය සූර්ය ප්‍රකාශයට පෙරළීම



වැනි මහිමයකි. මෙයින් බාලිකා සමයය අවසන් වේ-ලලනා සමයය ආරම්භ වේ. දුටුවන් නෙත් සිත් පැහැර ගන්නා මේ සිත්කලු සමයයෙහි සිටි මාලිනී, වරක් බැලුවෙකුට නැවත බලන්නට සිත් දෙන, නැවත-නැවත බැලීමෙන් කිසි කලකත් නො තිත් වන, කදිම රූපයකින් ද යුක්ත වූවා ය.

මහල්ලා මේ රූමත් මිනිබිරිය අතින් ගත් ගමන් පෙතාහ මැදින් ගමන් කෙළේ, ඇයගේ රූපයට ලොල් කරන සලෙළුන් කෙරෙන් ඇය රැක ගන්නා බලාපොරොත්තුවෙන් ම නොව, උදක් ම ඇයගේ ඇඳුම්-පැළඳුම් හා කන-කර ආයිත්තම්, සොරුන් කෙරෙන් රැක ගන්නා අදහසිනි. ඇයගේ කන-කර ආයිත්තම් එ තරම් වහඟු දේ නො වේ. ඉතා ම මාර්ස මාණික්‍යාභරණයෙන් වුවත්, ඇයගේ රූපයට සවි කරන කල, කැට-කැබිලිති විය යුතු ය. ඇයගේ රූපයට ආභරණයන්ගේ අලංකාරය අවශ්‍ය නොවේ. ආභරණයනට නම් ඇයගේ රූපයේ අලංකාරය අවශ්‍ය විය යුතු ය. නන්ද රාළ ඒ බව නොදනී, මාලිනියට වඩා නොහොත් මාලිනිය පමණට ම, කන-කර ආයිත්තම් ද තමාට අගය බව පමණක් ඔහු දනී.

"ඔන්න මන් කිව්වා - වේල් බලන්නා වාගේ නොවෙයි, ඔය කන-කර හොඳට බලා ගනින් මාලිනී. ඕවා නැති වුණොත් රටුන්න ණය ගෙවන්න වේවි" මේ වේල් පොළට නොහොත් හින්දු කෝවිලට සමීපවූ තැන් පටන් මහල්ලා මිනිබිරියට කියන පාඨයකි.

නන්ද රාළ කෝට්ටෙක පිරුළට ඉල්ලා ගත් තැනින් ම, මාලිනියට කන-කර ආයිත්තම් ද ඉල්ලා ගෙන තිබෙන බව පෙනේ. හේ එ සේ ම ය. මේ පිටිසර බද මිනිස්සු ඇති තැන්වලින් නැති දෙය ඉල්ලා ගෙන, තමන් අඩු-පාඩු පිරිමසා ගනිති. මෙය ලජ්ජාවට හෝ මදිකමට කරුණක් සේ ඔවුහු නො සිතති. පිටිසර මිනිසුන් කෙරේ පමණක් නොව, මෙය නගර බදව ද තව මත් දක්නා ලැබෙන බැවින් මේ සිරිත ජාතික දුර්වලත්වයක් සේ පිළිගත යුතු ය.

මාලිනී ද, සීයාගේ නියමයට අනුව නිතර තම තන-තර හා දැන ගැන සෝදිසියෙන් සිටියා ය. ඇයට තම ගමේ උත්සවයන් හා රැස්වීම්වල දී මහ සෙනඟ අතර, හැසුරුණු පල-පුරුදුකම් ඇතිවත්, ඒ පල-පුරුදු කමක වග මෙහි දී නො දනේ. මේ දකුණු කොළඹ මෙන් ම, මේ හින්දු දේවස්ථානය ද, එහි බොහෝ සේ හැසිරෙන දෙමළ ජනයා ද, ඇයට අපූර්ව දර්ශනයකි. ඈ සිහළ පිරිසකට නම් කැමැති ය. සිහළ පිරිසක් අතර තෙරපෙන්නකුට ලැබෙන්නේ තෙරපීමේ පීඩාව පමණකි. දෙමළ සෙනඟක් අතර, තෙරපෙන්නකුට තෙරපීමේ පීඩාව සමඟ වැස්මක් නැති ඇඟෙන් නික්මෙන දෙමළ දහ දිය ගඳ ද ඉවසන්නට වේ.

"මට නම් බෑ මෙ තැන, කොතෙකුත් තෙරපෙන්න. යමු ද, සීයේ අපි අර මුටයි කඩය ළඟට" කියා මාලිනී කළකිරුණු සිතින්, එහෙත් සිනාසෙමින් යෝජනා කළා ය.

"ඔන්න ඕක තමයි, මා කිවුවේ මෙකේ බලන්න ඇති ඉලව්වක් නැහැ. මෙකේ තියෙන්නේ තෙරපිල්ලයි රස්තියාදුවයි විතරයි." මෙ සේ කියා මහල්ලා තරුණිය රැගෙන, සෙනඟ සැඩ පහරින් මඳක් අයින්ව, මුටයි සල්පිල ළඟට ගියේ ය.

"සීයා දත් තමයි, මෙහෙ ම කියන්නේ-ගම දී , මේ වගක් කිවුවේ නෑ. අපි මූද විතරක් බලා ලා, ගෙදර ගියා නම් මීට හොඳයි." මාලිනී මතක් කළා ය.

"ඔන්න, බලා ගනින් ඔය වළලු දෙක. නො කීවෙයි කියන්න එපා-ඕකේ යතුර බුරුල් වෙලා තිකම් ම ගැළවිලා වැටෙන්න පුළුවනි. ඕක එහෙමට දෙන වළලු දෙකක් නොවෙයි-"

මහල්ලා මෙ සේ කතා කරද්දී ම, අමුතු වැහි කළුවක් කඩා වැටී, බලවත් බවට පැමිණි දොළ පහරක් මෙන් මහ යන සෙනඟ සැඩ පහර තර විය- මහත් විය-ගන විය. තන්ද රාළ තම මිනිබිරිය රැගෙන, තව-තවත් අයින් වුණේ ය. අයින් වෙන්නට වෙන්නට තෙරපීම ද, තව - තවත් බලවත් විය. ඉඩක් නැති



තරමට පිරිස තැටි වෙන්නටත්, දඩි වෙන්නටත් පටන් ගැනුනෙන්, මුටයි කඩය පෙරළා ගෙන විනා, අන් විදියකින් තවත් අහලක්වත් ඔවුනට පසු බසිනු ද නො හැකි විය.

"හරි-හරෝ! හරි-හරෝ! රා-රා-රා-රා-රා" යන ආදී වූ හරි-හර නාදයෙන් ද කලහ ශබ්දය දිපුණු විය. අනතුරුව, නාග සිත්තම් තූර්ය නාදය හා කැටිව ගත් විප්ලවය ද, භයංකර විය. සමුද්‍රය ගොඩ ගමන් ගත්තාක් මෙනැයි පුරාතනයන් විසින් කියන ලද්දේ, මෙ වැනි දර්ශනයට විය යුතු ය.

"ඔන්න, ඔන්න, වේල් එනෝ! වේල් එනෝ!" සිංහලෙන් මාලිනියට ශ්‍රවණය වූ එක ම ජනරාවය මෙ පමණකි. එයින් මේ වේල් පෙරහැර එන කලබලය බව අද තේරුම් ගත්තා ය. ඇය කෙරේ ද වේල් පෙරහැර දකින ආශාව බලවත් විය. එහෙත් ඇයට එය තව ම නො පෙනේ. ඇයට වරින් වර පෙනෙන්නේ සෙනඟ සැඩපහර මැදින් පෙම් කෙළින මත්ස්‍යයන් මෙන් උඩ නැඟෙන වේ වැල් හා බැටන් පොලු පමණකි. කෙළි ලොලෙන් මත්ව, විගඩ වෙසින් නටන, දෙමළ ජනයා සංසිඳුවන, පොලිස් භටයන්ගේ හා පෙරහැර නායකයන්ගේ මේ බැටන් පොලු හා වේ වැල් සරමය. අන් කාහට කෙසේ වුවත්, මාලිනියට නම් සිත් පිණ වන දර්ශනයක් නො වීය.

සෙනඟ මැද, නොයෙක් නැටුම් නැටෙන බව ඇයට දනේ. එහෙත්, ඒ කිසිවක් ඇයට නොපෙනේ. ඇය ඉදිරියෙහි තාරගා කළු කළ තාප්පයක් වැනි, උරයෙන්-උර පැහැර සිටි, එක ම දෙමළ සරණියකි. හැකි තාක් උස් වෙමින්, ඒ දෙමළ වෙළට උඩින් කර නගා, ඈ මේ නැටුම් බලන්නට වෑයම් කළා ය ඇයගේ වෑයම සඵල නොවී ය. ඇය වැනි බොළඳ වියෙහි සිටි, මිටි තරුණියකට තබා, උස පිරිමියෙකුට වත් මේ සෙනඟ සරණිය ඉක්මවා කිසිවක් දෙස බැලිය නො හැකි යි. ඈ සුසුම් හෙළුවා ය. සුසුම් හෙළීමට විනා, ගැනීමටවත් ඇයට අවකාශයක් නැති-දෙමළ ඇඟවලින් නික්මෙන දුගඳ ඒ තරම් පිළිකුල් විය.

"අනේ! මේ ආවේ මොන මෝඩ ගමනක් ද?" යන්න ඇය මුවෙන් නිතැතින් ම නික්මිණි.

මේ කාහට වත් ඇසෙන්නට කියන ලද්දක් නො වේ. මේ කලහ ශබ්දය මැද සෙණ හඬකින් විනා, මාලිනියගේ වැනි මධුර ප්‍රගීතයකින් නම් කිසි දු වෙනසක් ඇති කළ නොහැකි යි. එ සේ ද වුව, මේ සුමිහිරි හඬ, කිසි යම් දෙ සවනක වැටුණේ ය. එ දෙ සවන හිමි තැනැත්තේ එයින් අවදිව, ඇය දෙස බැලීය. කට හඬ සුමිහිරි වුවත්, ඊට ප්‍රභවය දුන් ස්ථානය මේ තරම් සිත් කලුය යි ඔහු සීනයකින් වත් නො සිතුවේ ය. මේ වේල් පෙරහැරේ බලන්නට ඇති විසිතුර කිම? විසිතුර නම් මේ පිත්කලු මුව පෙදෙසෙහිම ය. එ හෙයින්, ඔහු පෙරහැර බැලුම තිබිය දී, නව-නවත් ඇය දෙස ම බැලුවේ ය.

ඇයගේ රූපය නිතැතින් ම, ඔහු සිත්ගන්නා සුලු විය. ඇයගේ තිලිපුල් කැලුමැති, එහෙත් අවංක, කුළුණු බර, දෙ නෙත, නියම සිංහල දෙ නෙතකි. එ දෙ නෙතින් නික්මෙන බැල්ම, සුවිශේෂයෙන් ම කාන්ත වූ මිණි රැස් කලඹකි. තවද දක්ෂ චිත්‍ර ශිල්පියකු විසින් චිත්‍රාරූඪ කොට දක්වීමට අතිශයින් ම සුදුසු ඇයගේ අපාංග දර්ශනය, එයින් සංග්‍රහ ලැබුවකුට කිසි කලකත් මතක නැති නොවන අලංකාරයකි. පැළ දිග ගැහැනුන් කෙරේ නම්, මෙ බඳු ගුණයක් පිහිටි කල ඔවුහු එය දන ගනිති- එය ම පරම ලාභය කොට ගෙන ඉසුරුමත් වෙති. එහෙත් අප රටවලට මෙ බඳු දුර්ලභ ලක්ෂණයක අගයක් නැති, අගයක් ඇතත්, ඇය දෙස දැන් මේ බලන්නා වැනි කෙනකුට පමණකි.

තමා වෙත රැඳුණු මේ පිරිමි නෙත් යුවල ගැන මාලිනී කිසිත් නොදන්නී ය. ඇයගේ සිත් සතන් සියල්ල පෙරහැර කෙරෙහි ම විය. මුහුණේ නැගෙන දහදිය, ලේන්සුවෙන් පිස දම-දමා, හැකි-හැකි පරිද්දෙන් උස් වෙමින්, බලන්නට කිසිවක් නොලැබෙතත්, එයින් අලුත් වාතය වත් ලබන්නට ඈ වෑයම් කළා ය.



"හිටින්න, මන් මේ මේසය උඩ නංවන්නම" කියන්නක් මෙහි දී ඇයට ශ්‍රවණය විය. ඒ ශ්‍රවණය වූ ශබ්දය හා සමග ම ප්‍රබල හස්ත යෙකින් ඈ මුටයි කඩේ මේසය උඩට ඔසවනු ලැබුවා ය.

ඇය සිත් කලබල විය. ඒ හස්ත ග්‍රහණය අතිශයින් දැඩි විය. ඒ ස්වකීය වැඩිහිටියා වැනි ජරාජීර්ණ වෘධයකු ගේ නොව, ශක්ති සම්පන්න තරුණ පුරුෂයකුගේ බව ස්පර්ශ මාත්‍රයෙන් ම ඈ ප්‍රත්‍යක්ෂ කළා ය. එ සේ ප්‍රත්‍යක්ෂ කොට, තමාට මේ දස්කමකින් උපකාර කළ තැනැත්තහු දෙසට නෙත් කොනින් පුදුම බැල්මක් හෙළුවා ය. ඒ ඇය මෙතෙක් හෙළූ බැලුම් වැනි, එසේ මෙ සේ වූ බැල්මක් නොවේ. යෞවන උද්වේගයෙන් ද ප්‍රීතියෙන් හා ස්වජන්දයෙන් ද ලලිතව, වෙසෙසින් බැඳුු බැල්මකි. මී මැස්සාට මෙන් තරුණියකට ද මේ බැල්මෙන් දෂ්ට කළ හැකි. එකම එක වරක් පමණකි. ඇයගේ මේ බැල්මට බැඳුණේ යම් කෙනෙක් ද, ඔහුට ඉතින් දෙවියන් පිහිට තමා. ඒ බැල්මෙන් දෂ්ට කරනු ලැබූ තැනැත්තේ විස පත්තු වන්නේ ය. නොබසින් විසෙන් නිතාන්තයෙන් පැසෙන්නේ ය. මේ, බැල්මක් නොවේ- බාල කාලය සැව පට හැරී බවට ලකුණක් වශයෙන් යොවුන් බව ඇස දල්වීමකි. මෙය විකල්පයෙන්- එහෙත් දෛවයෝගයෙන්- ප්‍රේමය නොහොත් මෝහනය විනාශයට පමුණුවන, නිරපරාධ අකපට සත්තානයක අපරිශ්‍රමයෙන් ප්‍රසරණය වන ජාලයකි. නොහොත් පාශයකි.

මේ බැල්මෙන් ඇය දකින්නට බලාපොරොත්තු වුණේ, සිංහල තරුණයෙකි. එහෙත් ඇයට දකින්නට ලැබුණේ, තරුණ දෙමළ වෙසකි. දෙමළ සළුවක් කර ලා ගත්, සුදු බැනියමක් හා සුදු රෙද්දක් හැඳ ගත්, මෙ තරම් බෞද්ධ සිංහල කතා කරන, මේ රූමත් තරුණයා කවරෙක් ද? මේ නම් ජාතික ඇඳුමෙන් පෙනී සිටින සිංහල තරුණයකුම විය යුතු ය. ඔහුගේ සිංහල කම මුහුණුවරින් පෙනේ. කලිසම්-කබා ලා ගන්නට බැරි කම නිසා, ඊට සුදුසු කම් නැති නිසා, වත් කම් හෝ උගත් කම් නැති නිසා, ඔහු මේ ඇඳුමට වැටුණු තරුණයකු නොව, අන්‍යයනට ආදර්ශය පිණිස, වියදම් අඩු පොදු ඇඳුමක් ප්‍රචාරයට පමුණුවනු පිණිස,

ආත්ම ත්‍යාගයෙන් වෙස් මාරු කළ තරුණයකු විය යුතු ය. මේ තෙමේ ප්‍රඥා සම්පන්න විනීත ස්වරූප ඇත්තෙකි- මටසිලුටු, මොළොක්, මිහිරි තෙපුල් ඇත්තෙකි- තරුණියට සම වූ වයස් ඇත්තෙකි- තරුණියගේ කටාක්ෂ ස්මිතයෙන් වෙසෙසින් ප්‍රබුද්ධ වූ මුහුණ ඇත්තෙකි. ඇඳුමේ හැඩයක් නැති කම ඔහුගේ මනොඥ දෙහ විලාසයට බලවත් පාඩුවකි. ඒ පාඩුවේ තරම තරුණයාට නොදනේ. ඔහුගේ වූ කලී හැඩ නැති ඇඳුමකින් නැත කළ හැකි දෙහ සම්පත්තියක් නොවේ.

"දන් හොඳට බලතැකි නොවේ ද?" කියා තරුණයා සිනා මුසු මුහුණෙන් ප්‍රශ්න කළේ ය.

"බොහො ම ස්තුතියි. දන් හොඳට පෙනෙනවා. මා හිතුවේ මහත්මයා දෙමළ මිනිහකු කියායි." මාලිනී පුරුද්ද සුමිහිරි හඬින්, සිනා මුසු මුහුණින් කීවා ය.

"මේ කාලේ, ඇඳුමෙන් නොවෙයි, සිංහල කම හැඳින්විය යුතු ක්‍රියාවෙන්" යයි තරුණයා පිළිතුරු දුන්නේ ය.

"අරෝ අරා! අරෝ අරා! අරෝ අරා!"

සිංහල බෞද්ධයන්ගේ සාධු නාදයට වඩා, හින්දු වරුන්ගේ මේ "හරි-හර" නාදය නොහොත් "අරෝ-අරා" නාදය ප්‍රචණ්ඩ ය. සාධු නාදයෙහි පිළිවෙළක් ඇත්තේ ය. හේ අවස්ථානුකූලව හැම දෙන කටින් එක විට පිට වෙන හඬකි. මෙහි, එ බඳු පිළිවෙළක් දක්නා නො ලැබේ. මෙහි කැමැති කෙනෙක්, කැමැති-කැමැති පරිද්දෙන්, මේ "හරි-හර" නාදය පවත්වති. එහෙත් කිසි යම් විටක, මේ අතිශයින් ම තීව්‍ර වෙයි. වේල් පෙරහැර දේවස්ථානයෙහි ද්වාරාභිමුඛ වූ කල්හි මේ හර්ෂෝන්මාදය විශේෂයෙන් දක් වේ. එ හෙයින් මාලිනියට තරුණයා පිළිතුරු වශයෙන් කී දේ එ තරම් පැහැදිලිව නො ඇසිණි.

දන් ඇයගේ නෙත් සිත් අන් හැමට ම වඩා වේල් බැලීමෙහි යොමු විය. කුඩ-කොඩි-සේසත් රැගත් මිනිසුන් මැද, මහත් සන් පුන් ගුණයෙන් හා පැදෙන ගමනින් යන ඇත්තු කෝවිල් බිමට ඇතුළු වූහ. ඇතුන් දකීම දකුණු කොළඹ නම් බොහෝ දෙනකුට ප්‍රීතියකි. එහෙත් මාලිනියට එහි අගයක් නැති, ඇයට අලි-ඇත්තු තවදත් පාහේ දකින්නට ලැබෙත්. එහෙත්, ඒ අනුව ගමන් කළ පඹයන් දෙදෙන වැනි පුදුමයක්, ඇය විසින් කලින් නම් නොදක්නා ලදි. මේ විශාල දෙමළ ජෝඩුව දුටු හැටියේ, ම හයින් මෙන් තිගැස්සුණා ය. හේ පණ ඇති මිනිස් යුවළක් නොව, වෙසෙසින් මහත් කොට, තැනූ පිළිරූ දෙකක් බව, තේරුම් ගත් කෙණෙහි, මේ දර්ශනය ඇයගේ විනෝදයට කාරණය විය. අනතුරුව, කට්ටියෙන්-කට්ටිය නටන දෙමළ නළු ගණයෝ වූහ. කට උල් ගසා ගත් නළුවන් දකීම මාලිනියට එ තරම් සතුටක් නොවී ය. එයින් ඇයට ඇති වූයේ, ලොමු දැහැගැන්මත්, සන්වේගයත්, භීතියත් පමණකි. එහෙත් ඒ හිරි කිති කම සියල්ල ඉස්සරහට තබලා එක-එක අඩියට පස්සට දෙ අඩිය බැගින් තබමින් නටන වේල් පෙරහැරේ මහ කපුවා නිසා දුරු විය.

"මේක තමයි නැටුම. මේ නැටුමේ හැටියට වේල් පෙරහැර මේ ආවා මදයි?" තවත්, තමා ළඟින් ම මේසය උඩ සිට ගත්, තරුණ කාන්තාවක විසින් කියන්නට යෙදුණු වචනය අනුමත කරමින් ඈ ද සිනාසුණා ය.

ඒ ළඟට ස්කන්ද කුමාරයාගේ රථය පැමිණියේ ය. එය දුටු මාලිනියට, වේල් බැලුම හිරිහැරයක් වුවත්, නො වටිනා වැඩක් ද නොවන බව ප්‍රත්‍යක්ෂ විය. ඒ, ඒ තරම් නෙත්-සිත් පිණ වන කර්මාන්තයකි. ස්කන්ද කුමාරයාගේ යුධ රථයට ප්‍රතිමූර්තියක් වශයෙන් තනන ලද මේ රථයෙහි ද අනුභාවය හා දීප්තිය නොමදව ඇත්තේ ය. ඒ ප්‍රකෘති රථය මෙතරම් විශාල විය නොහැකියි- මේ තරම් බර ද විය නොහැකි යි. එ කල පැවැති මංමාවත්වල හැටියට, පහසුවෙන් ගමන් යනු කැමැති අය, ඉතා ම සැහැල්ලු යාන-වාහන පිළියෙල කොට ගත්හ. විශේෂයෙන් යුධ රථය සැහැල්ලු වූ වාහනයකි;- සටන් කරමින් සතුරු සෙනඟ මැද වදින්නට වෙසෙසින් තනන ලද්දකි. සැලැස්මෙන් ද, මේ, ඒ

පරණ රථය හා සම විය නොහැකි යි. කල්පනාවෙන් බලන්නකුට මෙහි එක අඩු-පාඩුවක් දක්නා ලැබේ. එ නම්, රථයට සැලැස්ම විය යුතු ලාඤ්ජන ය යි. පෞරාණික යුඩ රථයන්හි මේ ලාඤ්ජනය විශේෂාංගයකි. එ කල, රථ ලාඤ්ජනයෙන් රථයෙහි සිටින්නා හඳුන්වනු ලැබී ය. මේ රථයෙහි විය යුතු මයුර ලාඤ්ජනයයි. මයුරයා ලාඤ්ජනය කොට ගත් බැවින්, ඒ යුඩ රථයට ද මයුර වාහනයයි කීහ. සිංහයා ලාඤ්ජනය කොට ගත් ආසනයට සිංහාසනයයි කී පරිද්දෙනි. එහෙත් නවීනයෝ ස්කන්ද කුමාරයන් මයුරයකු පිට හිඳුවා, ඔහු මයුරයකු පිට නැඟී කළ ගමන් ඇත්තකු සේ දක්වති.

ස්කන්ධ කුමාරයන්ගේ මුහුණ දුටු කෙණෙහි මාලිනිය ඉර බැස ගියාට කමක් නැතැයි සිතිණි. ස්කන්ද කුමාර වස්ත්‍රය පැළ දිගින් උදා වන ද්විතීය සූර්යා මණ්ඩලයක් මෙන් දීප්තිමත් විය. ඔහුට මුහුණු සයකි- අත් දොළසකි. කෘත්තිකාවන් ස දෙන විසින් පෝෂිත හෙයින් මුහුණු සයක් වී යයි පුරාණයෙහි පෙනේ. එහෙයින් ම, කාර්ත්තිකෙය නම් ද විය. ලක්දිව උතුරු කළුතර, කඳවුරු බැඳ, යශඃ ප්‍රතාපයෙන් දඹදිව පවා වෙව්ලුවා මහ සටන් කළ අසුර නිකායයෙහි වූ තාරක නම් දෛත්‍යයා මහා සංග්‍රාමයකින් විනාශ කළ මොහු ස්වකීය ප්‍රියාව සොයා කරන ගමන නිමිති කොට, මේ වේල් මගුල තව මත් පවත් වන උත්සවයකි. වේලාපුර කළුතර නොහොත් වේලුගේ කඳවුර පිහිටි කළුතර- දෙවශත්‍රු කළුතර (දෙසැස්තර කළුතර) නොහොත් දෙවියනට සතුරු තාරකයාගේ කඳවුර පිහිටි කළුතර නමින් තව මත් හඳුන්වනු ලබන, මේ එ ගොඩ-මෙගොඩ දෙකළුතර නිසා, මේ ඈත අතීතයෙහි වූ ඓතිහාසික සිඬියට ජන්ම භූමිය වූ ස්ථානය තව මත් නිසැකයෙන් සලකා ගත හැකයි.

දක්ෂිණාපථයෙහි ද්‍රවිඩයෝ ස්කන්ද කුමාරයනට වේලු යයි කියති. ඔහු තාරකයා ඇන මැරූ අවියට වේලායුදයයි කියති. නොයෙක් මිණි බරණින් සැදුණු ස්කන්ද කුමාර රූපය මේ නපුරු අවිය ගෙන සිටින සැටියෙන් දක්වන ප්‍රතාපය අතිශයින් භයංකරය.



මිලේච්ඡයෝ ගුණ ධර්මයට වඩා ප්‍රතාපයට හිස නමති - දාස වෙති. සමුවක් හා බර අතක් ඇති හෙයින් ස්කන්ද කුමාර තෙමේ සදෙනකුට සුදුසු වීරිය හා ධෛර්යය ඇතියකු සේ ගැණේ. මේ විශේෂය දක්වනු වස්, ඒ සමුව හා බර අත, මේ රූපයට දෙන ලද විකාරයකැයි සැලකිය යුතු ය.

මෙ බඳු රූපයක්, මේ මාලිනිය විසින් දක්නා ලද පළමු වන වතාව ය. ඇයගේ ගමේ පන්සලේ ප්‍රතිමාලය යේ ඇත්තේ, බුඩ රූපය පමණකි. එහි කතරගම දේවාලයක් නැති. එහෙයින් ඇයට තථාගත ප්‍රතිමාවට වඩා මෙහි ඇති වෙනස අරුමයක් සේ හැඟිණි. බුඩ ප්‍රතිමාව මිලේච්ඡයන් වසඟ කිරීමට සාදන ලද භයංකර වෙශයක් නොවේ. ඒ වූ කලී, ශිෂ්ටයන් පවා විශිෂ්ටයන් කරවීමේ චිත්තාහ්ලාදය ගෙන දෙන උපශාන්ත දෙහ විලාසයකි. ශිෂ්ටයන්ගේ සිත නිතැතින් ම එහි බැඳෙයි- හිස නිතැතින් ම ඊට නැමෙයි. වැඩි උගත් කමක් නැති මාලිනියට මේ වෙනස විස්තර කළ නොහැකියි. එහෙත් ප්‍රත්‍යක්ෂ කළ හැකි යි.

මේ ශූර වීර දේව රාජයා සහිත රථය කිකිණි හඬවමින්, ඔල්වරසන්, අත්පොළසන් මැද, මෙ සේ ගමන් කොට, මාලිනිය සිටි තැන තරණය කළේ ය. ඒ හා සමග ම, බැස යන බා දියක් මෙන් සෙනඟ සැඩ පහර ද හීන විය. තුනී විය- මාර්ගයෙහි මඳක් අවකාශ ඇති විය.

"ඉතින්, ඔය වේල් පෙරහැර ය කියන්නේ, ඔන්න ඕකට තමා"ය යි තරුණයා බිම සිට, මාලිනිය දෙස සිනා මුහුණෙන් බලා කීයේ ය.

දැන් මේසය උඩ මාලිනිය පමණක් නොව, තවත් සිංහල තරුණියෝ ද, ලන්සි තරුණියෝ ද, කිහිප දෙනෙක් සිටිති. තරුණයා, ඔවුන් හැම දෙනාගේ ම මුහුණු දෙස පිළිවෙළින් බැලුවේ ය. ඒ නාගරික කල එළිය කිම? ඇඳුම්-පැළඳුම්වල පමණක් ඔවුන්ගේ සැලකිය යුතු අගයක් තිබෙන බව ඇත්තකි. එහෙත්, මේ පිටිසර කැලෑ හඳක් වන් තරුණියට සම කළ කල,

ඇයට පිරිවර පිණිස ගත යුතු තරු, බවට වත් ඔවුහු නො සැහෙති. ඔවුන්ගේ වූ කලී සාත්තු වැඩි කමෙන් කැත කර ගත් තරුණ කමකි- නොහොත් රූපයකි. නාගරික තරුණී, ලද දෙයින් සතුටු වන්නට නො සිතන්නී. සමහරු තමන් රූපය නමැති දෑ සමන් මල, සෙව්වන්දියක් කරන්නට තැත් කරති. තවත් සමහරු සෙව්වන්දි, පද්මයක් කරන්නට තැත් කරති. මෙහි ප්‍රතිඵලය කිම? ද සමනටත් නැති, සෙව්වන්දියටත් නැති, පද්මයටත් නැති, විකාරයක් පහළ කිරීම ය. පුෂ්ප ලොකයෙහි උස්-පහත් කමක් නැති පද්මය විශාල වුවද, වර්ණ සම්පත්තියෙන් වැඩී සිටිය ද, සෙව්වන්දිය ජය නොගනී- සෙව්වන්දිය ද සමන ජය නොග නී. කාහටත් එක සේ පුදන අපමණ පිරිස ඇති ඉතින් එකක් අනෙකක් වන්නේ කුමට? පිටිසර තරුණියෝ යම් රහස නො දනිතත්, මේ විකාර නො කරති- අමුතු සායම් පොවා මල් කැත කරන්නට නො සිතති.

මේ තරුණයා පමණක් නොව, එහි සිටි තවත් තරුණයෝ ද මේ කැලෑ හඳේ සිසිල් ගුණය හා කලඑළිය ප්‍රත්‍යක්ෂ කළා ය. එහි රැස් වතුරු ලබමින් වැඩී වේලා සතුටු වන්නට පුල-පුලා සිටි නමුදු, ඊට පළමු මාලිනියට පිහිට පිණිස සිටි තරුණ තෙමේ නොලස්ව, ඇය මේසයෙන් ගෙන, පුළුන් පොදක් මෙන් බිම තැබුවේ ය.

''කෝ සියා?'' කියා, මෙහි දී ලජ්ජා වුව ද, මාලිනි සිනාසෙමින් වට-පිට බලා, ප්‍රශ්න කළා ය.

''මොන සීයා ද?''

''මගේ සීයා? උන් දෑ දූන් මේ තැන සිටියේ- මහත්තයා මහත්තයා මා උන්දෑගෙන් මග ඇරෙව්වා වාගෙයි.'' මෙසේ කියා, මාලිනී බිය රැඳි මුහුණෙන් තරුණයා දෙස බැලුවා ය. මෙහි දී තරුණයා සම්බන්ධයෙන් පළමු වරට ඇය සිත්හි සැක ඇති විය.



තරුණයා කතා නො කළේ ය. ඔහුගේ මුහුණ සුදුමැලි විය. මේ ඔහු අසන්නට බලාපොරොත්තු නුවූ චෝදනාවකි. ස්තුතිය වෙනුවට දූන් ඔහුට ලැබුණේ අපවාදයකි. ඇය ඔහු සැක කළාක් මෙන් පෙනේ. ඛේදයකි! තමා හුදු පහන් සිතින් ඇයට කළ උපකාරය, දූන් පිළිගැනී තිබෙන්නේ කූට ප්‍රයෝගයක් මෙනි. දූන් මේ වන පුෂ්පය සාවධානයෙන් හා සංශයෙන් ද, චකිතයෙන් ද පසු වන හෙයින්, ඔහු සිත් තැවුලෙන් හා ලජ්ජාවෙන් ද මිරිකුණේ ය.

මාලිනී වට-පිට බැලුවා ය. හේ පිටුවහලක් විමසා, අනාථ ලීලාවෙන් බැලූ බැල්මකි. මේ තරුණයා කෙරේ කිසි විශ්වාසයක් තබන්නට ඇයට පුළුවන් කමක් නොපෙනේ. ඇය තනි කොට ගෙන, ඇයට විපත් කරන අදහසින්, ඔහු මේ රැක සිටින්නකු මෙන් දූන් පෙනේ. නො එසේ නම්, මෙ තරම් කරුණාවෙන්, ඇහ-ඇලුම් කමක් මෙ වැන්නකු විසින් මෙ නො හඳුනන පිටිසර තරුණියකට පෙන්වන්නට ඇති යුතු කම කිම? මෙසේ සිතා, දිග සුසුමක් හෙළා, ඇ තම සීයා සොයා එ තැනින් පලා යන්නට සැරසුණා ය.

තරුණයා ඇය අතින් ගෙන නතර කළේ ය.

"යන්න එපා! මේ සෙනඟ අතර ඔබ වාගේ පිටිසර තරුණියකට මහ හැරුණු වැඩිහිටියකු සොයා ගන්න එක ලේසියක් නොවෙයි.'' තරුණයා කුසීත කම් යට පත් කොට කීවේ ය.

"දූන් උන්දෑ මා හොයනවා ඇති- උන්දෑ බය වෙලා ඇති- මහත්මයා එතකොට කියන්නේ මෝල්ගහක් වාගේ මට මෙ තැන, බලා ගත් ගමන් ඉන්න කියා දැයි?'' තරුණිය ඇසුවා ය.

තරුණයා සිනා වුණේ ය. මේ කැලෑ හඳ අදිසියෙන් ම පෙන් වූ අභයක සැටි! පිටිසර තරුණිය, සමහරුන් සිතන තරම් ඔතැනි නොවන බව දූන් ඔහුට පෙනේ.

තරුණිය කෙරෙන් සබ කෝළය දුරු විය. ඇ, දූන් බිය විය යුතු තැනත්, නොබිය විය යුතු තැනත් දන්නී ය. මේ තරුණයා

නම් සැක කට යුත්තෙකි. එහෙත් ඔහුට භය විය යුතු සේ, ඇයට නො පෙනේ. ඔහු අධම පංක්තියේ සාහසිකයෙක් නොවේ. ඔහු නො තරම් කම් කිරීමට තරම් නො තරම් නො වන බව ද ඇයට ස වන ඉන්ද්‍රියයකින් මෙන් දැනේ.

"මෙ තැන, මෙ හෙම ඉන්න. රස්තියාදු වෙන්න කමක් නැහැ. හැඩ-හිල කිව්වොත්, මං සීයා සොයාගෙන එන්නං"යි තරුණයා පිළිගත යුතු සැනසිලි බසින් කීයේය.

"ඇයි, මහත්තයා දුටුවේ නැද්ද, අර, මෙ තැන, හිටිය ඉස-නිකට පැසුණු තාකි මිනිහා? ඔහු, මඳක් වක්කලු යි. කටේ එක දතක් වත් නැහැ. රතු මඩකළපු සරමකුයි සුදු කෝට්ටෙක කුයි, ඇඳලා-"

"හා! හා! ඔහු දැන් මට මතකයි" තරුණයා ප්‍රීතියෙන් බබළමින් "වෙන කියන්න කමක් නැහැ"යි පවසා කෝවිල දිශාභිමුඛව පිටත් වුණේ ය.

ඔහු යුහුව සෙනඟ පීරා ගෙන යන සැටි, තරුණී බලා සිටියාය. ඔහු අදහස් අවංක විය යුතු බව දැන් ඇයට පෙනේ සීයා, සිය මෝඩ කමෙන් ම මග ඇරෙන්නට ඇත-උපක්‍රමයකින් මගහරනු ලැබුවේ නම්, ඔහු තරුණයා විසින් මෙ සේ සොයන්නට නො යෙදෙයි. තමන් ස්තුතිමත් විය යුතු තැන, තරුණයාට දුර්මුඛ වීම ගැන මාලිනී කනගාටු වූවා ය. තරුණයා සෙනඟ අතර, නො පෙනී ගිය හැටියේ ඇයට තනි කම් දෝසයක් වැනි හැඟීමක් ද ඇති විය. ඇය දැන් මෙ තැන තනියම ය.

වට-පිට බලන ඇයට මෙහි තනියක් නැති බවත්, තනි කම් දෝසයකින් සැලෙන්නට යුතු කමක් නැති බවත්, පෙනේ. මෙහි මහ යන-එන, නොයෙක් තරා තිරම්වල දහස් ගණන් පිරිස ය. දූර අඩි තබමින් ගමන් කරන නාටුකොට්ටයන් ද, සඳුනෙන් නලල-උර-ළැම අලෙවි දුන් දෙමළුන් හා ගෙලෙ වරළ, මල් ගැවසී දෙමළියන් ද, දත යුග දක්වා නොයෙක් පැහැති, කොට සායෙන්



සැරසුණු ලන්සි තරුණියන් හා දේදුනු පැහැති සාරිවලින් සකස් වූ සිංහල තරුණියන් ද, නොයෙක් අමුතු සැණකෙළි වෙසින් හැසිරෙන නානා ජාතීය සලෙළුන් ද මග යන-එන සැටි ඈ දුටුවා ය.

තරුණයාට ඇයගේ සීයා සොයා ගත නො හැකි වී නම්, වෙන්නේ තපුරකි. ඇයට මෙ තැන, කාගේ පිහිටක් ද? කාගේ රක්ෂාවරණයක් ද? තමන් පත් වූ අවස්ථාවේ නියම අනාථ භාවය ඇයට පැහැදිලි වන්නේ, දැන්-දැන් ය. සීයා කෙසේ වෙතත් තරුණයා නම් නොවැරදී ම තැපැලෙන් එන ලියුමක් මෙන්, තමා සොයා ආ පසු එන බව සහතික ය. ඉන් පසු, ඔහු ඇයට ආරක්ෂකයා වෙන්නට සිතනු නො අනුමාන ය. ඇතැම් විට, ඒ කල්පනාවෙන් ම ඔහු මහල්ලා සෙවීමට වැඩි වෙහෙසක් නො ගන්නවා වෙන්නට ද පුළුවන. ඔහු ඇදහිය යුතු තරුණයකු සේ පෙනෙතත්, සීයාගෙන් වන පුරප්පාඩුව පිරිමැසීමට තරම් සුදුසු ආරක්ෂකයකු කර ගැනීමට මාලිනී භය වූවා ය. "ඔව්, ඔහු, එ තරම් විශ්වාසයට ගන්නට මිනිහෙක් නො වෙයි. සීයා රැගෙන එතොත්, ඔහුට මම ස්තුති කරමි. නැතහොත්, ඔහු කෙරෙන් සැඟවෙමි." මෙසේ සිතා, ඈ මහ යන සෙනඟ වැල දෙස සෝදිසියෙන් බැලුවාය. නොබෝ වේලාවකට පසු ඇයගේ තියුණු දෙ නෙතට, ඈත පිරිස මැද නතර වී ගත නොහී වක්කලමකට හසු වූ දඬුකඩක් මෙන්, එකෙළ-මෙකෙළ වෙමින් කිසිවකු විමසන්නකුගේ ස්වරූපයක් පෙනිණි. ඒ, තම සීයා බව හැඳින ගත් කෙණෙහි ඈ ඔහු වෙත දිවුවා ය.

"සීයේ! සීයේ! මා මෙහෙ- මා මෙහේ-" මෙ සේ හඬගාමින්, මාලිනී වහා සෙනඟ මැදින් දිව ගොස්, උමතුවෙන් මෙන් ඇය සොයා ඇවිදින මහල්ලාගේ අතින් අල්ලා ගත්තා ය.

"උඹට මොන යකෙකු වැහි ලා, උඹ කොහේ මහ බැ වුණා ද බන්?" යනු එ කෙණෙහි ම, මහල්ලාගේ කටින් පිට වූ කොප භරිත ප්‍රශ්නය විය.

"මට වැහුණු යකෙක් නැහැ- මා මෙ තැනයි හිටියේ- යකා වැහි ලා ගිහින් තියෙන්නේ සීයාට යි."

"මා මේ කොයි වේලේ හිටන් ද, හැම තැන ම හොයනවා නේ? හූනා කියන්නා වාගේ කිවුවා නේ ද, ළහින් හෙල වෙන්න එපා යි කියා ලා? උඹ, මේ, හිටපු තැන නොහිට, මොන දෙයියන්ගේ කාරියක ගියා ද?"

"මා කොහේ වත් ගියේ නැහැ- මෙ තැන යි හිටියේ. මේ මේසේ උඩ-" කියා, ඇතින් සිටිය ද, ඈ මුටයි කඩේ මේසය පෙන්නුවා ය.

"ඔව් මේසේ උඩ?"

"මා දන්නේ කොහොම ද? උඹ ඔය තරම් සර්කස් කාරියක විත්තිය?"

"මට වේල් පෙනුණේ නැහැ- එ තැන, හිටි කෙනෙක් මට අනුකම්පා කර ලා මාව, ඒ මෙසේ උඩ තැංගුවා-"

"එහෙ නම් අනුකම්පා කරන්න ඇති! බලපන්, බලපන් උඹේ කන-කර හරි ද කියා. වළලු දෙක තියෙනවා ද කියා?"

"අනේ! අනේ!" කියා මාලිනී කලකිරුණා ය- "සීයාගේ හිතේ, මේ මුළු ලෝකය ම බලා ඉන්නේ, මගේ කන-කරටත්, වළලු දෙකටත්, තට්ටු කරන්නය කියා දැයි" ප්‍රශ්න කරමින්, සීයා කැඳවා ගෙන පළමු සිටි මුටයි කඩය ළහට ආවා ය.

මහල්ලාගේ කැළඹීම තවමත් බලවත් ය. එහි බලවත් කම තව මත් සැලෙණ ඔහු දෙ තොලින් පෙනේ. දෙ තොල් පමණක් නොව, ඔහු දෙ කකුල් පවා සැලෙන්නේ ය. එ සේ සැලෙමින් සිටත්, ඔහු බලන්නට වුණේ, මිනිබිරියගේ කන-කර ආයිත්තම් හා වළලු දෙක දෙස ය. ඊට උපද්‍රවයක් නැති තිසා දැක, හේ මදක් සැනසුම් ලැබුවේ ය.



"යමන්! යමන් ! ආයෙත් මොනවා වේ ද කියන්න බැහැ. ඔන්න, මන් නොකීවෙයි කියන්න එපා. මෙ තැන, ඉන්න තැනක් නො වෙයි ළමිස්සියන්ට." ඔහු යන්නට ඉස් පාසුවක් නැතිව, කීයේය. මේ මහ පිරිස ගැනු-පිරිමි සියලු දෙන, තමාත්, තම මිනිබිරියත් තමන් සතු අත-මිටත් කොල්ලකා ගන්නට ඔත්තු බලන්නා සේ ඔහුට පෙනේ.

සීයාගේ කැළඹීම මාලිනියට පුදුමයකි. ඔහුගේ අස්ථාන භීතිය ඇයට පිළිකුලකි. ඈ ඔහුගේ නියමයට නො කීකරුව, මග රැඳෙන්නට ම බැලුවා ය. තරුණයා නො දැක, ඔහු හා අවසාන වශයෙන් වචනයක් කතා නො කොට, යන ගමන ඇයගේ සිතට මදි තමකි. මේ තරුණයා එසේ මතක නැති කර දමන්නට සුදුසු පුද්ගලයෙක් නො වේ-දැනහැඳුනුම් කම් දික් කිරීමට- වගා කිරීමට- සුදුසු පුද්ගලයෙකි. දැන්, ඔහු නොදැක පිටත්ව යෑම, සීනයකින් අවදි වීම වැනි වෙන් වීමකි. තවත් නම් ඉතින් මේ සීනය, ඇයට දකින්නට නො ලැබේ. මතු මත්තයෙහි දකින්නට නම්, ඔහු එන තෙක්, පමා විය යුතු ය යි ඈ සිතුවා ය.

"ටිකක් හිටින්න. අර මා වෙනුවෙන්, සීයා සොයන්න ගිය මහත්තයා එනකන්"යි ඈ කෙඳිරි ගෑවා ය.

"මොන මහත්තයෙක් ද? ඔන්න මා නොකිව්වෙයි කියන්න එපා-ඔය උඹ මොකක් ද පිම්මක් පනින්නයි හදන්නේ. එහෙනං, ඔය බඩු ටික ගළවා ලා මට දීලා, උඹ පනින පිම්මක් පැනපන්."

නන්ද රාළගේ ඉව-බව නැති තට ගැන දන්නා මාලිනියට මේ වචනවලින් එ තරම් සන්වේගයක් ඇති නො වේ. ඔහු ද බොහෝ මිනිසුන් මෙන් ම, කියන තාක් කිරීම අදහස් නො කරන්නෙකි. නිරන්තරයෙන් ම ඔහුගේ තර්ජනය ශුෂ්ක ශබ්ද මාත්‍රයකි. යටි සිතින් වත් දරුණු අදහසක් නැතිව, ඔහු ජීවිත හානියෙන් පවා නොයෙක් විට, තර්ජනය කරයි- කණ්‍ණ කටුක භයානක දෙය කියයි. ඔහුගේ මෙ දුබල කම් දන්නා හෙයින්, මාලිනී, කිසි අමුත්තක් නැත්තා සේ, තරුණයා වෙනුවෙන් තව- තවත් ටික-ටික

පමා වෙන්නට ම සිතුවා ය. මේ තරුණයා රුවට්ලි කාරයකු වත්, තමාට අහිතවත් සතුරකු වත්, නො වන බව මාලිනියට සහතික ය. යටත්පිරිසෙයින් ඔහුට වචනයකින් වත් ස්තුති කොට, තමා යන බව, කිය යුතු ය. ඉතින්, එපමණ මනුෂ්‍ය ධර්මයක් වත් පෙන්වීමට මේ සිත් කැළඹුණු මහලු, දුබල, පියා ඇයට ඉඩ නො දෙයි.

වෙල් පොලේ විසිතුරු දක්වමින්, කුඩා අත දරුවන් මෙන් මහල්ලා නළවා පරක්කු කිරීමට මාලිනී වෑයම් කළා ය. මහල්ලාගේ නෙත්-සිත්, කිසිවකටත් නොපෙළඹේ- ඔහු සිත බැඳුණු භීතිය හා සන්වේගය කිසිවකිනුත් නුදුරු වේ. පණ බේරා ගත යුතු නම්, එකෙණෙහි ම එ තැනින් පිට විය යුතු ය කියා ඔහු, එක පයින් පිටියේ ය.

කොතෙකුත් හිතු මතයෙන් වැඩ කිරීම, ගැහැනුන් සතු නිදහසක් නො වේ. එ සේ ද වුව, පියා අතින් ගෙන ගමනට පෙරැත්ත කරද්දීත්, ඈ නො කැමැත්තෙන් ඇදි-ඇදී තරුණයා ගිය දිශාභිමුඛව බලා ගත් වනු ම සිට, සුසුම් හෙළුවා ය. ඇයට තව-තවත් පියාට මුරංඩු විය නො හැකි යි සීයාට කාරණය තේරුම් කරන්නට ද, ඇයට හැටියක් නැති. පියාට ආචාර ශීලය එ තරම් වැදගත් කාරණයක් නො වේ. එ හෙයින් පූජකයන් විසින් ගෙන යනු ලබන කෑණ්ණාපිනාවන් මෙන් මාලිනී ද, බලවත් නො කැමැත්තෙන් හා පෙරැත්තයෙන් ගෙන යනු ලැබුවා ය.

# 2

මාලිනී, මහ ඔය බඩ, අරනායකට නුදුරු, නිකිණියාන ගම වැසි තරුණියකි. මේ ගම, ගොඩ-මඩ ඉඩම්වලින් යුක්ත ය. ගොඩ ඉඩම්, රබර් වැවිල්ලෙන් හා මඩ ඉඩම්, කුඹුරු ගොවිතැනින් ද සමෘධ ය. මේ ගම්වැස්සෝ කවුරුත්, තම-තමන් සතු අක්කරයක්-දෙකක් රබර් ඇති, ලියද්දක්-දෙකක් කුඹුරු ඇති, පිරිසකි. මේ, ගොඩ-මඩ ඉඩම්වල, ඔවුහු තමන් වැඩ තුමූ ම කර ගනිති. සදා ගත්රබර් ටික, හිස පිටින් ගෙනවුත් අරණායක කඩ මංඩියේ කිසි යම් රබර් වෙළෙඳකුට විකුට, මුදල් කොට, එයින් තමන් කැමති-කැමති දෙයක් මිලයට ගන්නා, මේ ගම මිනිසුන් පිටින් බලාපොරොත්තු වෙන්නේ, දුරු-මිරිස් ආදි කුළු බඩු ටිකත්, රෙදි-පිළිත්, පමණකි. ඔවුනට තම ගමේ ම උපදින බත් තිබේ-මස් මාළු තිබේ-එළවලු තිබේ. මේ ගම වැස්සෝ, බෞද්ධයන් බැවින්, වැඩිපුර සතුන් මසට ඇති නො කරති. එහෙත්, ඇති කරන තැනකින් සොරා ගෙන, මරා ගෙන කන්නට කැමති අය ද එමට සිටිති.

රබර් ජය කාලයේ මෙ ගමට ද ලොකු මුදලක් ඇදුණේ ය. එයින් වුණේ ගමේ මිනිසුන්ගේ මොලය තරක් වීම පමණකි. මොටෝ කාර් ආදිය මිලයට ගෙන, තෙල් පුළුස්සමින් විනාශ මුඛයට හණික දුවන්නට තරම් විශාල ධනයක්, මෙ ගම වැස්සනට නො ලැබුණත්, තමන් ලද පමණින් ඔවුහු ද මොලය තරක් කරගෙන, නොයෙක් පිස්සු කම් කළහ. ඔවුනට සිය රට බත තිබිය දී, පිට රට වීත් කැම වුවමනා විය. සිය රට ඇඳුම්-පැළඳුම් තිබිය දී පිට රට දුහුල් වුවමනා විය. අනෙකක් තබා.

ගමේ ගෙහේ රා බොන බේබද්දාට පවා පිට රට මත් පැන් වුවමනා විය. අත මිට හිඟ දවස්වල ගමේ ගෙහේ රාවටත් නො පෙන් වූ නො ගරු කම් සමහරු විස්කිවලට පවා පෙන්වන්නට පටන් ගත්හ. කෙසේ වත්, ඇබය ලිහුණු විස්කි බෝතලයකට නම් ඔවුන්ගෙන් වැඩි ආයු වැළඳීමට ඉඩක් නො ලැබුණත්, සමහරුන්ට විසි-හතර පැයක් ගත වීමත්, එම විස්කි උපභෝගයට අයොග්‍ය පානයක් සේ සම්මත කොට, ඉවත දැමීමට කාරණය විය. මේ ඉසුරුමත් දවස්වල හැම ගෙදරකම, පාහේ අමුතු බත් දීම් ආදිය කෙරිණි. හැම ගෙදරකට ම නිතර යන-එන අමුත්තෝ ද එමට වූහ. "කවද්ද මය විස්කි බෝතලය ඇරියේ" මා කියාලා තියෙනවා නේ ද, දවසකට වැඩියේ රැස් ගිය විස්කි තියන්න එපයි කියලා?" මෙ සේ කියමින් අඹුවට පවා තර්ජනය කොට, යම්තම් කර වට දක්වුණු පමණින් බෝතල පිටින් විස්කි පඩික්කම්වල වත් කළ ඇතැම් මෝඩ වාහේලා ද මෙහි සිටියා ය. තව ද, මේ කාලයෙහි නො ගිය ගමන බිමන් යන්නටත් නුපුරුදු, කෙළි-සෙල්ලම් කරන්නටත්, ඔවුහු පුරුදු වූහ.

ඔවුනතර නොයෙක් සමාගම් ද පැන නැගිණි. ගමට මහ පාරක් කැපීමට සමාගමක් ද අසරණ ගම්මුන්ට ආධාර කිරීමට සමාගමක් ද, පන්සලේ ලොකු දා ගැබක් බැඳීමට සමාගමක් ද, ඒ සේ ම පා සැලක්-ගිමන් හලක්-බෙහෙත් ගෙයක්-පිහිටුවීමට එකි-එකී සමාගමක් බැගින් ද, ආරම්භ කරන ලදි. මේ කොයි සමාගම්වලත් ආරම්භය නම් කොළඹින් වෙසෙසින් කැඳවන ලද යම් කිසි ප්‍රභූවරයකුගේ අනුග්‍රහයෙන් මහෝත්සවයෙන් ම කෙරිණි. හැම සමාගමකම උසස් නිලතල සියල්ල වැඩි මුදල් ඇති ටික දෙනකුන් අතර ම හුවමාරු විය. මේ කරණකොට ඇතැමකුට සභාපති නිල ලේකම් නිල භාණ්ඩාගාරික නිල, එක විට දෙක-තුන බැගින් පැවරුණේ ය. මේ උනන්දුව නොහොත් පිස්සුව පැවතුණේ ටික කලකි. රබර් මිල පහත බැසීම හා සමග ඔවුහු ද මේ පටන් ගත් සමිති සමාගම සමග ම පහත බැස්සාහ. ඒ ඒ වැඩ පටන්ගත්-පටන්ගත් තැන් වල ම නතර විය- සමාගම්



සියල්ල ද කඩා කප්පල් විය-අමුතු බත් දීම ද නතර විය-පඩික්කම්වලට විස්කි පෙවීමත් අත් හිටියේය. තව ද පිරිමි මඩකලපු සරොමටත්, ගැහැනු එම කම්බායටත්, නැවත වැටුණාහ. බේබද්දා ද කිතුල් රා මුට්ටියට වැටුණේ ය. යළිත් සිංහල හාල සහ මන්නාරම් කරවල ඔවුන්ට අග්‍ර භොජ්‍යය විය.

මාලිනිය කොළඹ වේල් බලන්නට ගියේ, ගම මේ ප්‍රකෘති තත්ත්වයට නොහොත් දුඃඛිත භාවයට පැමිණි අවස්ථාවක ය. ඉතින් අත මිට හිඟ කාලයක, මෙ තරම් දුර ගමනක් ඔවුහු සෙල්ලම් පිණිස නම් නො යති. නන්ද රාළ කෙසේ වත් නො යයි. ඔවුන් මේ ගියේ, අනෙක් වැදගත් කරුණක් මුල්කර ගෙන ය. මාලිනියගේ පියා කඩකාරයෙක් විය. ඔහු ගමේ පොඩි කඩයක් දමා ගෙන වෙළෙඳාම් කළේ ය. ඒ වෙළෙඳාමෙනුත් ඉඩමේ රබර් වලිනුත් ලැබුණු ආදායමෙන් සුළු කොටසක් ඔහු විසින් කොළඹ සේවිංස් බැංකුවේ කලින් කල තැන්පත් කරන ලදි. ඔහු තම කඩයට බඩු පටවන්නටත්, රබර් කෙළින් ම මහ වෙළෙඳුන්හට වැඩි මිලකට විකුණන්නටත්, කොළඹ යන්නට-එන්නට පුරුදු විය. ඒ අතර, පහසුවකැයි සිතා සේවිංස් බැංකුවේ තම මුදල් තැන්පත් කළේ වී නමුත්, අදිසි මරණයකින් තමා නැති වූ කල දියණියන් හට එය ලබා ගැන්ම ඒ තරම් අපහසුවක් වෙතැයි ඔහු යම්තම් වත් නොසිතුවේ ය.

මාලිනියගේ පියා නන්ද රාළට සිටි එකම පුතා ය. ඔහු නන්ද රාළ වැනි රළු මිනිහෙක් වත් නූගතෙක් වත් නො වීය. ඔහුට රට-තොට ඇවිද ලබාගත් පල-පුරුද්දකුත් පුවත්-පත් හා පොත් කියවා ලබාගත් උගත් කමකුත් තිබිණි. මාලිනී ඔහුට සිටි එකම දියණියෝ ය. මාලිනියගේ මව, කොළඹ ගැහැනියක් වූවා ය. ඇ හෝටලයක රක්ෂාව කළ මෙහෙකාරියකි. තරුණ පුංචි රාළ, එ නම් මාලිනියගේ පියා, කොළඹ පැමිණි විට, මේ රුමත් මිසී, එ නම් මාලිනියගේ මව, රක්ෂාව කළ හෝටලෙ නවාතැන් ගැනීම සිරිත විය. මේ සිරිතෙන් මිසී හා විවාහයට ඔහුට මග පෑදුණේ ය.

මේ විවාහ ජීවිතය ඔහුට ඉතා ම සැපවත් විය. එහෙත් ඒ වැඩි කල් නො පැවති සැපතකි. දිනක් මහ ඔයේ නාන්නට ගිය ඔහු බිරින්ද, අදිසි ජල ප්‍රවාහයකට ගිලී ජීවිතක්ෂයට පත් වූවා ය. එ කල, මාලිනියට වයස තුන් අවුරුද්දක් විය. මාලිනියට පසළොස් විය වන විට, පියා මළේ ය. ඔහුට ද වූයේ අදිසි මරණයකි. දිනක් තමා ගමන් කළ බස්-රිය පෙරළී තවත් කිහිප දෙනකුත් ද කැටුව, ඔහු නැසුණේ ය.

සිය දියණියන් වෙනුවෙන් පුංචි රාළ රැස් කර තුබූ මුදල එ තරම් ලොකු නැතිවත්, ඒ මුදල අසරණ මාලිනියටත් තන්ද රාළටත් මහා ධනයකි. බාල වියෙහි සිටි බැවින් මාලිනියට එය ලබා ගැනීම මුල දී දුෂ්කර විය. එහෙත්, අවුරුදු කිහිපයකින් හා පෙත්සම් කිහිපයකින් ද පසුව, එය ලබා ගන්නට ඇයට අවසර ලැබිණි. මේ ගමන, මාලිනියට මේ සීයාත් සමග උදක් ම කොළඹ යන්නට උවමනා කෙළේ, ඒ සම්බන්ධයෙනි.

මාලිනිය මේ කොළඹ ගිය පළමු වන වතාව ද නොවේ. එහෙත් මේ වතාවේ පමණ කොළඹ ගමන අන් කිසි වතාවක, ඇයගේ සිහියේ නො රැඳිණි. මේ ගමනින් ඇය නිතර මතක් වුණේ, වෙල් පොළ ම ය. එහි දී තමනට වෙල් බැලීමට පිහිට වූ තරුණයා ගැන ඇ නිතර සිහි කළා ය. ඒ තරුණයාගේ මුහුණත්, ඔහුගේ ඇඳුමත් ඇයට තව ම මතක ය. ඔහුගේ කට හඬත්, ඇයට තවම මතක ය. ඔහුගේ ස්පර්ශය ද ඇයට කිසි කලෙක මතක නැති නො වේ. ඔහුගේ දැනැඳුනුම් කම ඇය ලැබුවේ මිනිත්තු කිහිපයකට පමණයි. ඒ මිනිත්තු කිහිපය තුළ ඇති වූ හිතවත් කම ඇයට නම් සුළුපටු නො වේ. එය නැවත නැවත සිහි කිරීම ද ඇයට සැපතකි- ස්වප්නයකිනුදු කිසි කලකත් දක්ක නොහැකි, නො ලද හැකි, සැපතකි. දැන් ඇය සිත ඔහු ඡායා රූපය රැගත් වීදුරු තහඩුව මෙනි. දර්ශනමාත්‍රයෙන් ම, එ දා ඔහුගේ ඡායා රූපය එහි ඇඳුණේ ය. තවත් ඇයට එය බැහැර ලා ගත නො හැකියි. ඒ තහඩුවට ඒ ඡායා රූපය පමණකි.



"අයියෝ! ඔහු ආපසු ඇවිත්, මා නො දක, කනගාටු වෙන්නට ඇති- මා ගුණමකු ගැහැනියක කියා සිතන්නට ඇති- සමහරවිට කපටි ගැහැනියක වශයෙනුත් කල්පනා කරන්නට ඇති. ඔහු මග හරින්නට සිතා ගෙන, මා ඇට වූ බොරු උගුලක කියාත් සිතන්නට ඇති. කොයි හැටි වුණත්, ඔහු නම් නරක මිනිහෙක් නොවෙයි. නරක මිනිසුන් ඔහොම හැසිරෙන්නේ නැහැ. නාගරික තරුණයකු නිසා තමා, ඔහුගේ ඒ සබකෝළ නැති කම මා ගත් ගමන් එදා ඔහු මේසේ උඩ සිටෙවූ සැටි! ඔහු අපේ තත්ත්වයට කැපෙන තරුණයකුත් වෙන්නට පුළුවනි. නාගරික උදවියගේ තරම-තිරම නිකම් දුටු පමණින් සලකා ගැනීම අමාරුයි. සමහර විට, මහ ලොකු උසස් මහතුන් මෙන් පෙනෙන අය, සොයා බැලුවා ම නිකම් වාම් මිනිස්සු, සීයා පොඩියක් නතර වුණා නම් කොච්චර හොඳ ද?

ගමට පැමිණ මාසයක්-දෙ මාසයක් ගත වන තුරුම අසරණ මාලිනියගේ කටින් නො යෙක් විට මෙ වැනි දේ කියැවිණි. ඇයට දියට ගියත් මේ මතකය-දරට ගියත් මේ මතකය-පිළට ගියත්, වෙලට ගියත්-මේ මතකය නො යෙක් තැන්වල දී ඇ වෙල් පොළ ගැන නම් සිය යෙහෙළියන් සමග කතා කළා ය. මුළු ජීවිතයට ම ගමෙන් පිට කිසි තැනක නො ගිය කිසි තැනක් නුදුටු නිකිණියාන යුවතියන්හට, මාලිනියගේ මේ ගමන් විස්තර ඉතා ම කන්කලු විය. ඇ ඔවුනට කොළඹ මං-මාවත් ගැනත්, විහාරස්ථානයන් ගැනත්, විස්තර කළා ය. වෙල් පෙරහැර ගැන ද ඇය මහා විස්තරයක් නිතර-නිතර කරන නමුත්, තරුණයාගේ හමුවීම පිළිබඳ කිසිවක් ඇ කිසිවකුටත් නො කීවා ය. ඒ නො කියන්නට කාරණය ඇ ම නො දන්නී ය. ඇතැම් විට ගම්මුන්ගේ පරිහාසයට බියෙන් නොහොත් හෘදයංගම නිධානයක් වැනි වූ ඒ පවිත්‍ර ස්මෘතියට අගෞරවයක් වේය යන බියෙන් නො කීවා විය හැකි යි.

ඉතා ම රසවත් මතක පවා නිතර-නිතර සිහි වන විට නී රස වේ. කල් යත්-යත් ම, මාලිනියට ද වෙල් පොළ පිළිබඳ මතකය

යට පත් විය. කොතරම් යට පත් වී ද යත් සිරිත් ලෙය ගෙදොර-දොරේ වැඩපොළ කර කියා ගැනීමට හැකි වන පමණටත්, මනැස ඉදිරියෙහි පෙනෙන්නට පටන් ගැනෙන ඡායා රූපය සුසුමක් හෙළීමෙන් දුරු කර ගත හැකි වෙන පමණටත්, යටපත් විය.

සාමාන්‍යයෙන් මේ ගම කවුරුත්, සතියකට වරක් වැඩි කොට ම සෙනසුරාදා දවසක කඩ පොළට යති. මෙ සේ යන විට, මිල කර ගත හැකි යම් කිසි අස්වැන්නක් ද රැගෙන ගොස් එයින් සතියකට සෑහෙන පමණ තුන-පහ මිලයට මිලයට ගැනීම ද සිරිතකි. ගමේ සෙසු ගැහැනු නම් මේ කඩ පොළට යන ගමන නිතර යතත් මාලිනිය යන්නේ, ඉතා ම කලාතුරකිනි. යම් දවසක, මහලු නන්ද රාළට යා ගත නො හැකි වී නම්, ඈ ද අහල-පහල සෙසු යුවතියන් හා එ දා කඩපොළ ගමන යන්නීය.

"අනේ! මේ ඉලව් තුනටියේ කැක්කුමක හැටි! මොන විදියකට වත් බෑනේ දිග ඇරෙන්න." කියමින් දිනක් සටස නන්ද රාළ, කටි වායුවෙන් මිරිකුණ තුනටියට පුගත් ගසා ගෙන සිටියේ ය. "මාලිනී, අන්න රබර් ටික හැදිලා තියෙනවා. මන් අන්දට කිවුවා හෙට උදෙන් එන්නය කියලා-ඒක අරන් කඩපළට පලයන් අගිදලත්, පොඩිනලාත් යාවි. උඹත් පලයන් උන් එක්ක. හැබැයි! ඔන්න මන් කිවුවා, අන්පිට කාසිවලට මිසක් ණයට රබර් දෙන්න එපා. උඹට ඕනැ එහෙකුත් උඹ අරගනින්-ඔන්න, නො කීවෙයි කියන්න එපා. මටත් අබින් රුපියලක අරන් වරෙන්"යි කෙඳිරි ගාමින් කීයේ ය.

ගමේ ගොඩේ ඇවිදිනුවාට වඩා සිදාදියේ ඇවිදීමට මාලිනී කැමැත්තී ය. ඊට ඉඩක් ලැබුණු කෙණෙහි ඈ එහි නියම ප්‍රයෝජන ගත්තා ය. එ හෙයින් ඈ හොඳට හැඳ-පැළඳ ගෙන, පසු දින උදයෙන් ම ගමනට පිටත් වුණා ය. මෙ බඳු ගමන් වලට ඈ සාරිය නො හඳින්නී ය- අලුත් රෙද්දක් හා අලුත් හැට්ටයක් හැඳ වාම් කත-කර නොහොත් තමන්ගේ ම කත-කර පළඳින්නී ය. පුරුදු ඇඳුම නිසා, මෙ සේ පසු වන විට ද ඇයගේ රූපයේ අගයෙන් කිසි අඩුවක් නො පෙනේ.



අන්දා රබර් ටික හිසට ගත්තේ ය. ඒ අතර අහල-පහල වෙනත් දෙය රැගත් වෙනත් ගැහැනු ද මහට බැස්සා හ. ඒ කවුරුනුත් පිරිසිදු හොඳ ඇඳුම් වලින් සැරසී සිටි බැවින්, මේ ඇතැම් පලාත්වල දකින්නට ලැබෙන වට්ටි කාරියන්ගේ වෙළෙඳ තවලමක් සේ නො පෙනිණි- පූජා භාණ්ඩ රැගෙන පින් කමකට යන පෙරහැරක් සේ පෙනිණි. එහෙත්, දොඩමලු කම නිසා මෙහි පින් කමකට සුදුසු ශාන්ත ගුණය දක්නා නො ලැබේ. විට කමින්, ගමනට හිණි මග කර ගන්නා කතාවක් වී නම්, ඒ නිතොරම අසල් වැසි නෑ-මිතුරු-ගැනු-පිරිමි-කෙලි-කොලු ආදීන් ගැන කෙරුණු ඕපාදූප කතාවක් ම ය. සමහරු පුරුෂයන්ගේ නුගුණ කථනයෙන් මග දිගට නඩු-අනඩු පවා විසඳූහ.

"ඈ! යෝදියේ, ඊයේ බොලැයෙ ගෙදර මොකද ඔය දෙව්ලාව?" කියා අගිදහාමී, ඇල්පිනාගෙන් ප්‍රශ්න කළවිට, ඊට උත්තරය පොඩිනා දුන්නා ය. "ඇයි අගිදක්කේ, ඒ තැන වාගෙ කෝලමක් නැහැ බන්. මේ මුළු ලංකාවේ කොතන වත් තරහ වෙන්න එපා. අල්පිනක්කේ. මන් මේ මූණ බලාගෙන යි කියන්නේ, බොට වගේ මිනිහෙක් මට හම්බු උණා නම්, උන්දගේ මන් බෙල්ල මිරිකන්නේ මෙන්න මෙහෙමය" කියා ඈ කතාවට සුදුසු වන පරිද්දෙන් දුම් කොළයක විටක් අඹරා කඩා ගත්තා ය. "අනේ! යෝදියේ, උඹ ඕක විහින් කර ගත්ත කරුමයක් නේ ද? ඔය ගරා යනා එක්ක මොන විකාරයකින්ද බන් උඹ ගියේ?" අගිදහාමි නැවතත් අල්පිනාගෙන් ප්‍රශ්න කළා ය. "අගිදක්කා ඔහොම කියනවාට මොකද, මන් නො ගියත්, කී දෙනෙක් හිටියා ද බන්, ඒ දවස්වල, ඔය මිනිහා එක්ක යන්න. ඒ දවස්වල ඔක්කෝට ම ඒ මිනිහා ඕනැ උණා-දන් තමයි, ඔක්කෝට ම ගොඩ කදුරු වෙලා තියෙන්නේ" ඇල්පිනා, පොඩිනා දෙස ද නෙතගින් බලා කීවා ය. "ගෑනුමයි බන්, මේ පිරිමි නරක් කරන තරමක් නරක් කරන්නේ. අර සාමෙලා කොච්චර හොඳට හිටිය මිනිහා ද? යසට ගෙදර ඉන්දැද්දී අම්මා තාත්තා පෝස්සිය කරගන හිටියා-

හිරයක් කර ගත්තා- ඉතින් මොකද උණේ? දැන් ඌ විතර වල් බේබද්දෙක් මුළු ගමේ නැහැ" කියා සොපියා නැමැති ගැහැනියක් ද කීවා ය. "හොඳකින්! එයත් නල්ලමලේ හිරයක් නොවැ කර ගත්තේ? තූ!" කියා පොඩිනා අහකට කෙල පහරක් ගසා, ඒකි තමයි ගෑනි! එහෙම කබර දෙනක් මේ ගමට අම්මා-මුත්තා කාලේ කවුරුවත් ම ගෙනාවේ නැහැ"යි කීවා ය. "හැබෑ ද බොල ඒකි සාමෙලාට ගහනවා යි කියන්නේ?" ජුඩයියා ඇහුවේ ය."අපොයි මතක් කරන්න එපා"යි පොඩිනා දෙනෙත් බමවා කීවා ය. "අනේ! බන්, මගේ මිනිහා ඔච්චර වැරදි කරනවා- ඔය ඊයේ රෑත්, අගිදක්කේ, කෝලහාලේ රිදියෙන්-රත්තරනෙන් ඔක්කොට ම තිබුණේ, ඔය කොලුවාගේ අතේ වලලු දෙක විතර යි- ඒක උගස් තිය ලා, ඔය මිනිහා සූදුවට ගියානේ බන්-ඉතින් කතා නොකර හිටියැකිද? ඒත් මන් නම් කවදා වත් තිය පිටින් පාරක්, හෙට මක් වෙතත් තාම මේ වෙනකන් ගැහුවේ නැහැ. අපේ මිනිසුංටත් හම්බු වෙන්න ඕනැ අන්න, ඒකිලා වගේ ගෑනු. එතකොට අගය තේරේවි."යි ඇල්පිනා කීවා ය.

මේ ආදී දෙය ගැන කවදත් කරන කතාවෙන් ඔවුහු ගමන් කළා හ. මේ ගමට ඇත්තේ, ගම් සබා පාරකි. ඒ කරත්තයක් ගෙන ගිය හැකි පාරක් නො වේ. කරත්ත යන මග පාර ඔවුනට දකින්නට ලැබෙන්නේ කඩ පොළ හංදියේ දී ය. සිත්කලු මහ ඔය නදී තීරය දිගේ වැටුණු මේ අඩි පාරේ ගමන් කරන මෙ ගම මිනිස්සු වතුර අඩු නම් ගහ බැස එතර වෙති- වැඩි නම් සංගිලි පාලමෙන් එතර වෙති. මාලිනී නම් වතුර අඩු වුණත්, වැඩි වුණත්, මහ ඔයට නො බසින්නී ය. මහ ඔය පෙණෙන විට, ඇයට තැති ගැන්මක් වැනි කිසි යම් හැඟීමක් ඇති වේ. මහ ඔය ඇයට සතුරු ය. ඇයගේ මෑණියන් ගිල ගත් සැතිරිය නිසා, මේ හැඟීම වෙතැයි ඇ කල්පනා කළා ය. මාලිනිය, සංගිලි පාලමෙන් විනා, ගහ බඩ එතර නොවන බව මුළු ගම ම දනී. මෙ දින, ගහ බැස, එතර විය හැකි වුවත් මාලිනිය නිසා කවුරුත් සංගිලි පාලමෙන් ම එතර වූහ.



සෙනසුරාදා වෙළෙඳාම වැඩි බැවින් මේ කඩ පොළේ හුඟක් ජනයා හැසිරෙන දවසකි. මෙ දින කලබලය ද වැඩි ය. වෙළෙඳ පොළට ළඟා වූ ඇසිල්ලේ, මාලිනියගේ කංඩායම තම-තමන් පුරුදු තැන් බලා ගනු දෙනු පිණිස කඩින්-කඩ ගියා හ. නැවත ඔවුන් එක් තැන් වෙන්නම දෙ පැයක් පමණ විය. මාලිනී රබර් තොගය දී මුදල් ලැබ ගෙන, ගෙදරට වුවමනා දෙයක් රැගෙන අන්දා ලවා සීයාට අබිනුත් ගෙන්වා ගත්තා ය. ඇ දැන් ආපසු ගමට යන්නට සූදානම් ය- ඇයගේ කාණ්ඩයේ අනෙක් උදවිය තව ම නො පැමිණි බැවින් බුලත් විටක් සපමින් පාර අයිනේ ගස් සෙවණක නතර වී සිටියා ය.

වරකට දෙ-තුන් දෙනා බැගින් කවුරුත් ගස් සෙවණට රැස්වූහ. එකිනෙකා කළ ගනු-දෙනු ගැනත්, බඩු ගත්-දුන් සැටි ගැනත්, කතා කරමින් එ සේ රැස් වූ අය ගිමන් ගත කළා හ. සමහරු රබර් වෙළෙඳුන්ගේ කේවෙල් ගැන කතා කළාහ. කොළොඹ මිල ගණන සතයක් අඩු වන කල මෙ තැන සත පහක් අඩු කරන්නට ඔවුන් කරන වෑයමට ඔවුහු අව-අවා දෙස් කළාහ. සමහරු රෙදි-පිළි ගණන විමසමින්, ඔවුනොවුන් ගත්-දුන් දෙය සම කරමින්, රැවටුණු-නො රැවටුණු තරම සැලකූහ. රවටනු ලැබුවෝ වෙළෙඳුනට දෙස් කළා හ. සෙස්සෝ නොරැවටුණු සිය හපන් කම ගැන මැත දෙඩූහ. ඔවුන්ගේ ඇනුම්-බැනුම් හා දෙස් දෙවොල් කීම, ඕපාදූප මෙන් ම නුපුරුදු කන් වලට නම් ඉතා ම කටුක ය. පුරුදු කන්වලට එහි වෙසෙසක් නැති.

"හාං! යල්ලා! යල්ලා! ඉතින් යමල්ලා- ඔය මදෑ. කොළ කන්දොස් කිරියාව" කියා මේ කාංඩයෙන් ම තලුකුනා ගෑනි එ නම් අගිදහාමි පළමු කොට සිල්ලර පොදිය හිසට ගත්තා ය.

"මේ ගොල්ලා එනකං අපි මෙච්චර වේලා හිටියා- මේ බුලත් ටික කන කං දැන් එකෙකුට වත් ඉස් පාදු නැගෑ යි" තරුණ වියෙහි සිටි අල්පිනා කීවා ය.

"අනේ! බොල මටත් දිය, දුන්කළ විටක්"යි කියා ගෙන මහලු වියෙහි සිටි ජුඩයියා ද, අල්පිනා ළඟ හිඳ ගත්තේ ය.

"ප්‍රටයියා, ව්ට කන්න හිටියොත්, අද තියා හෙට වත් යැමක් වෙන්නෙ නැහැ"යි අගිදහාමි හිසට ගත් සිල්ලර පොදිය නැවත බිම තබමින් කීවා ය.

මේ අතර මග යන මොටෝරියක් අදිසියෙන් ම එ තැන නතර කරනු ලැබුවේ ය. කවුරුත් පුදුමයෙන් මෙන් එය දෙස බැලූහ. කලිසන්- කබා ලා ගත්, නව යොවුන් වියෙහි සිටි කදිම තරුණයෙක් එයින් බැස්සේ ය. මෙ වේලේ, මාලිනී පාර අද්දර සිටගෙන සිටියා ය. මේ ගස යට, රැස් වූ සෙසු කවුරුත් බිම හිඳ ගෙන, නොහොත් බඩු පොදි පිට හිඳ ගෙන උන්හ. මේ පිරිසෙන් ඉතා ම රූමත් තරුණිය මෙන් ම ඉතාම ශිෂ්ට තරුණිය ද මාලිනී වන්නී ය. ඈ කවදා වත්, කොතැනක වත්, සුදුසු ආසනයක් නොදක අතර මග හිඳ නො ගන්නී ය. එ සේ ම ගිය-ගිය තැන හිඳ ගැනීමට සුදුසු ඇඳුම්-පැළඳුම් වලින් ද, නො සැරසෙන්නී ය. ඒ බව කවුරුත් දනිති. ඈ, මෙ වේලේ පිරිස මැද කෙරෙන කතාවට ඇහුම් කන් දී ගෙන සිටියා ය. එ හෙයින් මොටෝ රියෙන් එළියට වත් තරුණයා තමන් ළහට එන තෙක් ඈ නුදුටුවා ය.

මාලිනී බිය පත්ව මදක් පසුබා සිට නැවත ඇස දල්වා ඔහු මුහුණ බැලුවා ය. ඒ හඳුනන්නකු දකින බලාපොරොත්තු වෙන් බැලූ බැල්මක් නො වේ. නොහඳුනන්නකු තතු විමසන බලාපොරොත්තුවෙන් බැලූ බැල්මකි. ඈ ඔහු ඇඳින්නා ය. එ කෙණෙහි ඇයට ඇති වූ සන්වේගයත් තැති ගැන්මත් සුළුපටු නො වී ය. විලිකුන් දඹ ගෙඩියක් මෙන් මුහුණ පවා රත් පැහැ ගැනිණි. සැහෙන පමණට- පදමට- පරණ- වූ බුලත් විටක් ඇති වත් කට කෙළ සිඳිණි.

තරුණයා ඈ ඉදිරියෙහි සිනා මුසු මුහුණෙන් හිස වනා වනා සිටියේ ය. ඔහුගේ මුහුණු වූ කලී පැතිරී පැවතුණේ උදක් කපටි කමෙන් වසන් වී බොහෝ කල් සිටියකු අදිසියේ මුණ ගැසුණු විට දක් වෙන ප්‍රීතියකි.



"මා අඳුනනැකි නොවේ දයි?" තරුණයා ප්‍රශ්න කළේ ය.

මාලිනී බිම බලා ගත්තා ය. ඔහුගේ ඒ ප්‍රශ්නයට ඇයගෙන් පිළිතුරු අනවශ්‍ය ය. තරුණයාට පමණක් නොව, අවට සිටින්නන්ටත් ඇය විසින් තරුණයා හැඳින ගන්නා ලද බව පෙනේ.

"එ දා ඇයි- අර- මාට, එහෙම රස්තියාදු කෙරෙව්වේ?" කියා ඔහු නැවතත් ප්‍රශ්න කළේ ය.

"ඒ කළ වැරැද්දට සමා වෙන්න, සීයා මුණ ගැහුණු හැටියේ පරක්කු වෙන නිසා එ වෙලේ ම පිටත් වෙලා ආවා"යි ඈ බිම බලාගෙන ම සිට කීවා ය.

"මෙහෙ ද ගම?"

"නැහැ, මෙ ගහෙන් එ ගොඩ, හැතැප්ම තුනකට විතර එහා."

"පුදුමයි, දන ඇඳින ගන්න පුළුවන් වුණු එක." තරුණයා ස්වල්ප නිශ්ශබ්ද භාවයකට පසුව කීවේ ය.

"මට නම් මහත්තයාව එක පාරට අඳුනා ගන්න බැරි වුණා." තරුණී ද තව මත් පොළොව හා කතා කරන්නියක මෙන් බිම බලාගෙන ම කීවා ය .

"අර දෙමළ ඇඳුම නැති නිසා වෙන්න ඇති."

"ඔව්"

මාලිනිය කර බා ගෙන සිටියේ වී නමුදු ඇයගේ මුහුණ වරින් වර රත් පැහැ ගැනෙන බව කාහටත් පෙනේ. ඇයට හිස නගා ගත නො හැකි යි. තරුණයාගේ තියුණු බැල්ම ඇයට දරිය නො හැකි යි. දන් තරුණයා හා තමා අතර ලොකු වෙනසක් ඇත්තා සේ හැඟේ. ඇතැම් විට ඇයගේ ඇඳුමේ අඩුපාඩුව නිසා මෙ සේ සිතනු විය හැකි යි. මේ රෙද්ද සහ හැට්ටය, තරුණයා ඉදිරියෙහි

දත් පසු වන ඇයට මහත අඩු-පාඩුවක් සේ පෙනේ. වෙල් පොළේ දී මෙන් සාරියෙන් ම, තම අගය මෙහිදී ද පෙන්වන්නට ඇයට ප්‍රස්තාවය ලැබුණා නම් ලොකු සැනසීමකි.

එහෙත් තරුණයා නම්, ඇත්තෙන් ම ඇයගේ මේ වාම් ඇඳුම පහත් කොට නො සිතයි. එ දා සාරිය මෙන් ම අද මේ ඇඳුම් ද ඔහු සිත් ගත්තේ ය. නුපුරුදු සාරියට මතු වන නුඳුරු පිටිසර පෙනුම අද කොහෙත් ම ඇය කෙරේ නො පෙනෙන බැවින් ඔහු මේ ඇඳුමට වඩා ම කැමැති විය.

"මොකද මේ බිම බලාගත් ගමන්? මගේ මේ ඇඳුම නිසා ද මා දිහා බලන්නත් කැතෙන්වගේ ඉන්නේ?" තරුණයා පිළිවිසියේ ය.

මෙහි දී, ඇ හිස ඔසවා, නැවත වරක් තරුණයා දෙස බැලුවා ය. ඒ බැල්ම, ඇය තරුණයාට කළ සංග්‍රයකි. එ සේ ම තමනට ද කර ගත් සංග්‍රහයකි. පළමු බැල්මෙන් ඇය තරුණයා හැඳින්නා පමණකි. මේ දෙවන බැල්මෙන් ඈ, ඔහු ඇඳුමේ ද වෙනස සලකා ගත්තා ය. අර නිවට උපාසක ඇඳුමට වඩා, මේ ඇඳුම අතිශයින් ම ප්‍රතාපවත් ය. මේ ඇඳුමෙන් ඔහුගේ ශරීරාකාරය නො සැඟවී දක්වෙයි. තරුණයාගේ අගය, ඇති සැටියේ තරුණියට පෙනුණේ, මෙතන්හි දී ය. ඈ සිනාසුණා ය.

"ඉතින් කොහොම දැයි?' තරුණයා ද සිනාසෙමින් නැවත ඇළිටිසියේ ය.

ඒ අස්ථාන ප්‍රයුක්ත ප්‍රශ්නයකි. එ හෙයින් බලවත් විළියෙන් ඇයට නැවතත් බිම බැලුණේ ය. අමුතු කතාවක බසින්නට නොහොත් කතාව තව තවත් දික් කරන්නට අදහස් කර ඔහු මේ ප්‍රශ්නය නැගුවා සේ පෙනේ. ඔහු සමග කතාව දික් කිරීමට ඇයගේ නොමනාපයක් නැති එහෙත් මේ කතාවට ඇහුම් කන් දී ගෙන පුදුමයෙන් බලා සිටින, ගමේ උදවිය නිසා ඇයට නම් විළි-බිය නැතිව ඊට අනුබල දිය නො හැකියි.



තරුණයා සාක්කුවෙන් රත්රන් සිගරැට් කොපුවක් එළියට ගෙන, එයින් සිගරැට්ටුවක්, සිය දෙ තොලතර තබා ගෙන, මාලිනියට ද දුම් වැටියක් පිරිනමමින් එය දිගු කළේය. රැස් වූ පිරිස සිනාසෙන්නට වූහ.

"හත් වලාමේ! අපේ රටේ ගෑනු කොයි කාලේ ද ඔවා බිව්වෙ?" කියා, විට කමින් සිටි ප්‍රවයියා සිනාසෙන්නට විය.

තරුණයා ද පිරිස කැටුව ම සිනාසුණු නමුත් තරුණිය නම් ඊට සම්බන්ධ වුණේ වත්, අවනත වුණේ වත්, නැති. එහෙත් බැමි සහල අකුළමින් ඕ කරදර මුහුණ පමණක් දක්කුවා ය. ඈ හෙමින් හිස නහා, දෙ නෙත් දල්වා, ඔහු දෙස බලා "මහත්මයා, අපට පරක්කු වෙනවා." යයි අසාමාන්‍ය වූ ගැඹුරු මුහුණක් දක්වා අවධානයෙන් කීවාය.

"ඔව්. මහත්තියා, අපිලාටත් පරක්කුවෙනවා තමයි- වරෙන් වරෙන්." කියා ඒ අනුව කැඳවන අව්‍යක්ත සිංහල ශබ්දයක් මොටෝ රියෙන් ද නික්මිණි.

ඒ කතා කෙළේ, තරුණයා සමග මොටෝ රියේ පැමිණි අනෙක් තලතුනා මහතකු විසිනි. කථා ලීලාවෙන් ඔහු සිංහලයකු නො වන බව පෙනේ. එහෙත් පෙනුමෙන් හා පැහැයෙන් ඔහු සිංහලයකුට සමාන ය. උපනෙත් සහලකින් සැදුම් ලත් පස් පණස් විය ගත කළ ඔහු මුහුණ අපෙසින් මුඩු කරන ලද හෙයින් තවමත් නො මහලු සේ පෙනේ. ඔහු මෙසේ කතා කළ ඉක්බිති, තරුණයාට තවත් එහි නතර වෙන්නට හැටියක් නැත- කතා කිරීමට පුදුසු කරුණු සෙවීමෙහි නම් මේ තරුණ තෙමේ ගජ සමතෙකි. එහෙත්, මේ ඊට තැන නොවේ. ඔහු පිරිසට අමුත්තෙකි. හෙවත් ආගන්තුකයෙකි. සාමාන්‍ය ආගන්තුකයෙක් ද නොවේ. තත්ත්වයෙන් අහසට පොළොව සේ ද සමුද්‍රයෙහි එ තෙරට මෙ තෙර සේ ද දුරින් දුර වූ අමුත්තෙකි. එ හෙයින් එ තැනට තව-තවත් සෙනග රැස් වන බව, මිස ලිස්සන බවක් නොදක්නේ, ඔහු මග හරින්නට කල්පනා කළේ ය.

"මටත් පරක්කු වෙනවා. එතකොට යන්නම්. හැබැයි මන් ඔබ හමු වෙන්න ළඟ දී ම එන්නම්."යි කියමින් තරුණයා ආපසු ගොස් මෝටෝරියේ නැඟුණේ ය. මෝටෝර් රිය ද පිටත් විය.

මාලිනියට ප්‍රකෘති සිහිය ලැබුණේ, ඒ මෝටෝර් රිය සම්පූර්ණයෙන් ම නොපෙනී ගියාට පසු ය. එ තෙක්, ඈ මුසපත් වූ මෙන් සිටියා ය. වේල් පොළේ ඔහු දුටු දා ආයට මෙ තරම් තැළඹීමක් හෝ ලජ්ජාවක් ඇති නො වී ය. එ දා වේල් පොළේ, මීට සිය ගුණයෙන් අධික පිරිසක් සිටියේ වී නමුත් මෙ සේ කිසිවෙක් විපරමෙන් ඔවුන් දෙස බලා නො සිටියාහ. එ හෙයින් එ තැන, ඔවුනට අඳ-බිහිරි ලෝකයක මෙන් සිත් සේ කතා-බස් කිරීමටත්, හැසිරීමටත් නිදහස ලැබුණේ ය. දන් මෙ තැන, නම් නො එ සේ වූ තැනකි. තරුණයාගේ මෙහි ප්‍රාප්තියම, රඟ මඬලකට නළුවකුගේ නැමීණීම වැනි අවට සිටින්නන්ගේ නෙත්-සිත් ඇද ගැනීමට සුදුසු කරුණක් විය. මේ තැම දෙනාට අවුණු එක ම වැඩය, ඔවුන් දෙස බැලීමත්, ඔවුන් වචන ශ්‍රවණය කිරීමත් පමණකි. තරුණයා යන්නට ගිය බැවින් දන් ඔහුට මේ නෙත් රැවුම් වලින් සීමාවක් නැත- ඇනුම් පදවලින් පීඩාවක් නැත- එ හෙත් මාලිනියට නම් දන් ඒ සියල්ලෙන් පීඩාව දියුණු-කියුණු වෙගන එන්නේ ය.

"කොයි තැටි කොහො ම උණත්, අපරාදේ කියන්න බෑ. කදිම මහත්තයා" අබිදනාම් සිය දබරැඟිල්ලේ හුණු ගහේ උලමින් මාලිනියට ඇසෙන්නට කීවාය.

"එහෙ ම මහත් තැන් අඳුනනවා නම්, කාට ද බැරි- අපටත් පුළුවනි, කොළඹ ගිහිල්ලා. ඕනෑ තරම් සල්ලි අරන් එන්න-බැංකුවෙන් ය කිය-කියා" ඇලපිනා ද කට ඇළ කරමින් ජුවයියා දෙස බලා කීවාය.

"අනේ! චී! චී! අපේ බල්ලට වත් ඕනෑ නැහැ. එහෙම සල්ලි! කාට ද බැරි, එහෙ ම නම්. ඔය මුසිප්පාන්තු නටන්න?" සොපියා ද ඇයගේ බර පොදිය හිසට ගනිමින් කීවා ය.



"ඉන්න බොලව්? මාලිනීට නරි ගියා- ඉතින් බලන්න එපා" කියමින් හරමා නමැති කොලු ගැටයෙක් තරණවත් ගැහුවේ ය.

"ඕක තමයි, ගැහුනුන්ගේ පින සුණු මුල්ලේය කියන්නේ." මේ කලතුනා ජුවයියා කී පදයකි.

මාලිනියට ඇසෙන්නට කී මෙ වැනි පද හැර, තවත් කුසු-කුසු ගැමි කොළවරක් නැති විය. එක-එක තැන දෙ තුන් දෙනා බැගින් කුසු-කුසු කුට්ටම වී මේ ගැන කොල් මතුරන්නට වූහ. මාලිනී පමණක් තනි වූවාය. ඈ දිග හුස්මක් ඇද, ශරීරය සෘජු කොට ගෙන සියල්ලන් දෙස කරුණයෙන් බලා මෙ සේ කියන්නට වූවා ය.

"උඹලාට කතා කරන්නට දෙයක් නැතුවාට ද, උඹලා මේ මට පදයක් හැදුවේ? ඒ මහත්මයා මෙ තැන බැහැලා, වෙන එකියක එක්ක කතා කළා නම්, මේක මෙච්චර දිග් ගැහෙන්නේ නැහැ. මා දන්නවා මේ ඔක්කො ම උඩින් කතා කරනත්. යටින් මා එක්ක හිද හොඳ නැති විත්තිය. දන ගනියව්. එහෙ ම මහත්තයෙක්, මෙහෙ ම මඟ නතර වෙලා, මට කතා කරපු එක, තොපටත් එක්ක විතරක් නො වෙයි. මුළු ගමට ම නම්බුවක්-"

"හෝ!, මෙහෙ ම ගමට නම්බු ගෙනෙන නම්බු කාරියක්! අපොයි මගෙ කට" කියා පොඩිනා සිය කටට පහරක් ගසා ගත්තා ය.

දෙවියනේ! අපි යල්ලා යන්න- ඔය නම්බුකාරිට ඕනෑ හැටියට මහත්තුරු එක්ක කතා කර ගන්න ඉඩ හැර ලා" සොපියා ද ඉවසුම් නැතිව, කීවා ය.

ඒ යෝජනාව ස්ථිර විය. ඉන් පසු, මේ ආදී කතා නැවත නැවතත් කියමින්, සියලු දෙනා පොළ ගැසී, තම-තමන් බඩු මිටි හිසින් හා කරෙන් ගෙන, ගමට බැස්සාහ. ඔවුනට දන් මාලිනිය පුදුමනා නැති, ඔවුන්ගේ සමාගම අනෙක් සමාගමකි. මාලිනියට විරුද්ධව නැති කාත් දෙය ඉදිරිපත් කරමින් සුව සේ කතා කිරීමට

දැන් ඔවුනට නිදහස තිබිය යුතු ය. මේ ගඟ බැස යන ගමනින් ඊට සම්පූර්ණ අවකාශය ලැබුණා පමණක් නොව, මාලිනිය සමාගමයේ පිටුවාහල් කරන්නට ද අවකාශ ලැබිණ.

අන්දා පමණක් මාලිනිය අත් නො හළේ ය. අන්දා මාලිනිය හා සම වයස් වූ තරුණයෙකි. ඔහු ගමේ කුලී වැඩ කරමින් යැපෙන මෝඩ පාහේ නිවටයෙකි.

"ආ! එහෙ නම්, අන්දා විතරයි, මා අත් හැර දමා නො ගියේ" කියා, මාලිනී සුසුමක් හෙළා, "ඈයි, අන්දෝ, උඹත් නො ගියේ?" කියා යළිත් ප්‍රශ්න කළා ය.

"මා මොට ද යන්නේ?" කියා අන්දා ගණනකට නැතිව මෙන් මුහුණ පසකට හරවා ගෙන, "මට නන්ද සීයා කිවුවේ "අනේ අන්දෝ, මාලිනියට තනියට පල, කියා ලා යි. මන් ඉතින් "හා" කියා ආවා- මාලිනී මහත්තයෙක් එක්ක ගියත් එකයි, මට ගෙදර හිටියත් එකයි," නැවත කීයේ ය.

"අනේ! අන්දො, මේ ගමේ මිනිසුන් උඹට කියන්නේ මෝඩයා කියා ලා යි- නිවටයා කියා ලා යි- ලෝකයේ අනික් මිනිසුනුත් උඹ වාගේ නම්, මේකේ මෝඩකමටවත් නිවටකමට වත් ඉඩක් ලැබන්නේ නැහැයි" පවසා, මාලිනී ද අන්දා සමග ම පාලම බලා පිටත් වූවා ය.

මාලිනිය අන්දා සම්බන්ධයෙන් මෙ සේ කීවේ, කරුණු නැතිව නොවේ. අන්දාගේ කතාවෙන් හා ක්‍රියාවෙන් වීර චරිතයක ඇති විය යුතු වැදගත් ගුණාංග කිහිපයක් ඕහු කෙරේ පවතින බව ඇ දුටුවා ය. මෙ තරම් ගැඹුරු තැන් පෙනෙන්නට මාලිනියගේ උගත් කම් ඒ තරම් ගැඹුරු නො වේ. ඇය ගමේ පාසැලේ සිංහල හ වැනි ප්‍රමාණය අවසන් කළා පමණකි. එහෙත් පියා විසින් ගෙන්වා දුන් නොයෙක් පොත-පත කියවීමෙන් ඇ ලෝකය ගැනත්, ශිෂ්ට ගුණධර්මයන් ගැනත්, දත යුතු දෙය දන ගත්තා ය. අන් හැම දෙන තමා අතැර යද්දී, අන්දා පමණක් හුදකලාව



ම සිටියේ වීරයකු නිසා ම ය. සත්‍යවාදියකු බැවින් තනියට ගිය හෙතෙම ඇය තනි නො කළේ ය. කතාවෙන් ම ඔහුගේ වැදගත් අදහස් ප්‍රකාශයට පැමිණෙන බැවින් ඔහු අනුන් වග තුග නො සොයන, උස්-මිටි කම් නොසොයන සිය යුතු කම් පමණක් නොවළහා කරන, අවංක මහත්මයකු බව ඇයට ප්‍රත්‍යක්ෂ විය.

"එහෙත් මේ දුෂ්ට ලෝකය, මේ වැන්නන්හට කියන්නේ මෝඩයෝයි, නිවටයෝයි. වීරයන් හා නුවණක් කාරයන් වෙන්නට නම් අනුන්ගේ තරම්-තිරම් සෙවිය යුතුයි. උස්-මිටි කම් සෙවිය යුතුයි- එකක් සිත තබා ගෙන අනෙකක් කතා කළ යුතුයි- වාසි පැත්ත බල-බලා "හෝයියා! කිය යුතුයි- තමන්හට නැති ගුණ ඇති තැන් පෙනෙන විට, නින්දා කට යුතුයි- නැතහොත් ඊර්ෂ්‍යා කට යුතුයි- යුතු කමෙන් හෝ අයුතු කමෙන් සිය මඩිය ම පුරවා ගන්නට තැත් කළ යුතුයි. අනේ! අන්දො! උඹ ළඟ මේ කිසිවක් නැහැ- ඉතින් උඹ මෝඩයා-නිවටයා."

මාලිනී මෙ බඳු සිතිවිලි පහළ කරමින්, අන්දා සමග යන්නී, සංගිලි පාලම උඩට පැමිණියා ය. ඇ පාලම මැද නතරවී, ගඟ දෙපස බැලුවා ය. එක පසකින් ගඟ බැස, එතර වන සිය සතුරු පිරිස ඇයට මෙහි දී පෙනිණි.

"අහෝ! මේ නදිය කොතරම් අකාරුණික ද? ලොවට කිසි වරදක් නො කළ, මගේ අසරණ මැණියෝ මේ නදිය විසින් ගොදුරට ගනු ලැබුවා ය. ඉතින් මෙහි බිලි ගැනීමක් වෙතොත්, බිලියටම ගත යුතු අන්න, අර යන පිරිස ය. දැන් ඔවුන් යන්නේ, මට විරුද්ධව මුළු ගම ගිනි තියන අදහසින් ය. මට මින් පසු කෙනෙකුගේ මුහුණ බලන්නට වත්, ඔවුහු ඉඩක් නොතබති. ඔවුන් නො නැසෙන කල, අනේ! මට වත් නැසෙන්නට ඇත්නම්." මෙ සේ හුදකලා රාවයකින් යුතුව ගඟ පහල බැලුවාය.

මේ සංගිලි පාලම ඉතා උසය. එහි සිට බලන්නකුට පහළ ගඟ පාතාලයක් සේ පෙනේ. මෙ කල, ගඟ වතුර ඉතාම ටික බැවින්, මෙ තරම් උඩක සිට එහි පැනීම වධයකි. නැත්නම් මැණියන් හට

මෙන් ම මාලිනියට ද, මේ වේලේ මහ ඔය මරණ මඤ්චකය වෙන්නට තිබිණි.

"කොහේ ද මාලිනී මේ තීත වෙලා බලාගෙන ඉන්නේ. එන්නේ නැද්ද යන්න?" අන්දා පාලම එ තෙර සිටිමින් ඇය කැඳෙව්වේ ය.

ඈ කිසි කතාවක්-බහක් නැතිව, ඊට කීකරු වෙමින් යන්ත්‍ර රූපයක් සේ ඔහු පසු-පස්සේ ගමන් කළා ය. ගහ හරහා පයින් ගිය පිරිස, කලින් ම ගොඩ වී ඈත පෙළට ගමන් කරනවා ඇයට පෙනිණි. ඔවුන් වරින්-වර, උස් හඬින් කරන කතාවත්, උස් හඬින් කරන සිනාවත්, ඇයට ඇසිණි. ඒ කථා, අභිප්‍රාය තේරුම් ගැනීමට තරම් නොපැහැදිළි වුවත් සිනාව නම් ඉතා ම පැහැදිලි ය. මේ ඇයට පරිහාස වශයෙන් කරන සිනාවකි. ලේඩිත්තක විතරක් දයාවක් නැතිව, අභිමතයෙන් ම කරන සිනාවකි. එය තවත් ඇසිඃ නො හැකි බැවින්, හුණු වැල්ලෙහි කඩා ලන ලද පද්මයක් පරිද්දෙන් ඈ මලානිකව නතර වූවා ය.

"අන්දෝ අපි ටිකක් මෙහි වාඩි වෙලා ඉමු. ඒ ගොල්ල ගියා දෙන්. ඒ ගොල්ල පේනා එකත් මට ඇස් රුදාවක්- ඇසෙන එකත් කන් රුදාවක්-" මෙ සේ කියමින් මාලිනී ඒ පාර අයිනේ පිහිටි ලොකු ගලක් උඩ වාඩි වුණා ය.

"ආ! මාලිනී, එච්චරට මෙච්චර නම්- ඒ මහත්මයා හේ ම දවසක් මෙහෙ ආවොත්, මෙච්චරට කොච්චර වේවිද?" හිසින් බර පොදිය බිම තබා අන්දා විට කන්නට සූදානම් වෙමින් කීයේ ය. ඔහු ඉතා සැලකිල්ලෙන් විට කන්නෙකි. හිණෙන් බුලත් මඩිසලය ගෙන, දුනු පිහිය දිග හැර, අමු පුවකක් හතරට පලා, මනා සේ පිරිසිදු කොට කැලි දෙකක් කට ලා ගෙන සප-සපා, බුලත් කොළය අග මුල සිඳ කණ පිට හුනු තවරා කිහිප ගුණයකින් එක-එක අතට පිඩු කොට, හකු මුල තබා ඔහු විකන සැටි මාලිනියගේ දෙ නෙතට පවා දකුම්කලු දර්ශනයකි. තේඩා පොටකට මෙන් අඹරන ලද දුම් කොළයක් ද එළියට ගෙන, ඔහු එයින් ද අහලක් පමණ මිරිකා, කඩා කටේ ලා ගත්තේ ය. බුලත්



නැමෙහි කොතරම් සමතකුට වුවත්, පදමට හුනු විට කෑම එන වර කිසි කලකත් නොකළ හැකි බැවින්, සිරිත් ලෙස කිල්ලෝටයෙන් දබරැගිල්ලට හුණු පිඩක් ගෙන යැපෙන පමණ තා, සෙසු සියල්ල මහ දෙපස ගස්-ගල්-මුල්-කණු ආදියෙහි තැවරීම පිණිස ඉතුරු කොට ගෙන, කිල්ලෝටය නැවත මඩිසලයෙහි ලා, මඩිසලය නැවත හිණ දවටා ගත්තේ ය.

"උඹට හිතෙනවා ද අන්දෝ, ඒ මහත්මයා මා සොයා ගෙන මෙහේ ඒවිය කියා?" ඔහු විට කා ඉවර වූ පසු මාලිනී ඇසුවා ය.

අන්දා ඇඟිලි යුග මුඛයෙහි තබා, දෙ තොල් තද කොට සිහින් කෙළ පහරක් ගැසුවේ ය.

"මට හිතෙන්නේ, ඒවි යි කියා යි." ඔහු කීවේ ය.

"මොන බොරුද!"

මාලිනිය මෙ සේ කියනුවාට වෙනුවට කීවේ වී නමුත් ඇයගේ ප්‍රාර්ථනය අනෙකකි. තරුණයා තමා සොයා එ තැයි යන විශ්වාසය ද ඇය කෙරේ පවනී. එ හෙයින් ඔහු නැවත-නැවත මෑ, මත්තෙහි ද දකින්නට ලැබේවා යි ඈ යටි හිතින් එහෙත් ධීරාධිෂ්ඨානයෙන් ප්‍රාර්ථනා කළා ය.

"තරහා වෙන්න එපා මාලිනී. මන් මේ නිකමටම අහන්නේ- ඔය මහත්මයා කොහොම ද ඔබෑ අඳුනා ගත්තේ?" කියා අන්දා බුලත් මතින් මෙන් ඇසුවේ ය.

"මහ අහම්බයකින් අන්දෝ" කියමින් මාලිනී එදා වේල් පොළේ සිදු වූ සියලල විස්තර කරන්නට පටන් ගත්තා ය. ඇය කළ විස්තරය හොඳින් ශ්‍රවණය කළ අන්දා මෙ සේ කීවේ ය.

"ඔන්න, මාලිනී අන්දා අද කිව්වායි කියා ලා හිතන්න. අද ඒ මහත්තයා ඔබට හම්බ උණු එක ඉරණමෙන් සිද්ද උණු දෙයක්- එහෙ නම් බලන්න." කියා මහ පේන කාරයකු මෙන් කීයේ ය.

[illegible] තරින් මේ වෙලේ මත මය. අභිප්‍රායයන් නැතිව නොවට අන්දා පේන නායකු නුඹ වන් බලවත් විශ්වාසයෙන් සෙ පේ කියන්නට යෙදුනේ ය. භූගතකුගේ තබා, උදරුවකුගේ නපුන්, මේ වැනි වචන තෙරෙහි මිද්‍යාදෙගයන් කෙරෙහි මෙන් මුළු ජනයින් ඇති කිරීම සමහරුන්ගේ පිරිතකි. එහෙයින් මාලිනියට නිතැතින්ම අන්දා දෙස බැලුවේ ය. මුලත් එකින් මත්ව, දතදියෙන් පෙනේ. උන්න සාත් කෙළ කටින් ගල-ගලා, උරමත් ගත්තා සේ අනු කරන සතාටට ඇ තටට තම් කළා ය. ඇ මේ සේ කටට නුම් නළ නමුත්, අන්දාගේ අනාගත කථනය ඉෂ්ට වල දායක වන දකින්නට සතුටු වූවා ය.

අන්දා නැවත -නැවතත් ස්ථිර විශ්වාසයෙන් තම අදහස ප්‍රකාශයන් මෙන් බල-බලා අනුමත කරන්නට වූ විට, ඇ කට-තයක සතුටු වූවා ය. ඇයගේ ඒ සතුට අන්දාට වන් මතු පිටින් නටි නො පෙනේ. අන්දාට පමා ගතු පිටින් පෙනෙනන්නේ ඇයගේ සංදුව තව වගෙකි. ඉදිරියෙන් ගිය පිරිස දුන් ගම් වදින්නට තටම් නල් ගනවු බැවින්, "මිස්සු නැතුව යමන් අන්දෝ" කියා ඇ නුත් නැතින් නැගිට ගමනට සකස් වූණා ය.

ඔවුන් ගම් දොරට ළඟා වනවිට, අඳුරු වැටිණි. අඳුරු වැටෙන්නට පළමු ගම් වදින්නට ඔවුහු නො කැමති වූහ. විශේෂයෙන් ම මාලිනියගේ අප්‍රසාදය ඊට කාරණය විය. කලින් ගමට ගිය පිරිස එළිපතක් නැර, ඉලව්වන්-මඟුලන් කියන්නා සේ, තමා හා තරුණයා පිළිබඳ ප්‍රවෘත්තිය දන් කියා ඇවිදින බව ඇයට පසක්ව ය. ඒ හෙයින් මනමාලියක් බලන මිනැ පමෙන් සමහරුන් තමා දක, ඔච්චම් කරන්නට සිටින බව ද මාලිනී දන්නී ය.

රැයබෝ වූ කොණෙහි, මේ ගම් සත්පුරුත් තම-තමන් ගෙවල ඇතිරෙති. නාගරිකයනට මෙන්, රාත්‍රිය තිතිණියාන ගම්මුන්නට ප්‍රීති ප්‍රමෝදයට කාලයක් නොවේ. ඒ අමනුෂ්‍යයන්-භූතයන්-තිරශ්චීනයන් වැනි තියාවරයනට පමණක් අභිමත වූ සමයකි.



ඇයගේ මහත් සැනසීමට මෙන්, මේ ඉගු ඇවෑමෙන් පසු සවස, කිසිවෙක් මඟ නො සිටියා හ.

"මන් මේ මොක ද කිය ලා නැතුව. සිටියා නේ. මෙච්චර පරක්කු වෙන්නේ? මේ පොඩි වැඩේට දවසක්ම ගියානේ උඹලාට? හුඟා කියන්නා වාගේ. මන් කියන්නේ. මීක තමයි. තෝ බෙහෙත් ටික?"

මේ මාලිනිය හා අන්දා දුටු හැටියේ, නන්දරාළ කළ ප්‍රශ්නයකි. හැමටම පළමු මාලිනී, ඔහුගේ බෙහෙත් ටික. එ නම් අබින් ටික ඔහුට දුන්නා ය. ඒ කෙණෙහි ම නන්දරාළ අභිෂේකය ලැබූ නරපතියකු මෙන් සතුටු විය. අබින් නො ලත් නන්ද රාළ දිවි මස් නො ලත් කොටියකු මෙන් රෞද්‍ර ය. අබින් ටික ලත් කෙණෙහි ඔහු පෙහෙවස් සමාදන් වූ උපාසකයකු මෙන් උපශාන්ත වේ. ඔහු අබින් කොළය රැගෙන එළියට වඩා දුම් පැතිරෙන බුම් කෙල් කුප්පිය ළඟට ගියේ ය ගොස්, එහාරීස වස්තුවක් මෙන් එය දිග හැර බැලුවේ ය. අනතුරුව, සතුටු සුසුමක් හෙළා, මිහිය කටුවකින් එම අබින් ටික ඉතා පරෙස්සමෙන් සූරා ගෙන, පුරුදු හරක් අං කොප්පුවේ ලා ගත්තේ ය. ඉන් පසු කොළය ලෙවකා ඒක් මදිව, කෝපි දියෙන් සෝදා, තටේ ඩක් කර ගත්තේ ය.

"මොකද ළමයා, උඹ මච්චර පරක්කු උණේ? අරුන්ගෙන් අහපුවාම උන් ගියා- මොනවාද කිය-කියා මින්න මගේ ගස්සා ගෙන" අබින් ටිකෙන් පණ ලත් මහල්ලා, අල්ලෙ බුලත් මඩිය මිරිකමින් ඇසුවේ ය.

"අනේ! පියේ, ඒ ගොල්ලා මට පදයක් හදලා පලිච්චි කළ-මාව දා ලා එන්න ආටා-" යයි මාලිනී ඇඹුම් මුහුණ සහවා ගෙන කීවා ය.

"පදයක් හැදුවා! මීක තමයි. මන් හුඟා කියන්නා වාගේ කිස්සෙම කියන්නේ- මොන පදයක් ද?" මහල්ලා පුදුම වෙමින් ඇසුවේ ය.

"අප, එ දා වෙල් පොළේ දී, ඔය මහත්තයෙක් උදව් කළාය කියා ඔයාට මා කිවුවා නොවැ නැද්ද? ඒ මහත්තයා මට නැවැ පොළේ දී හම්බු වුණා. හම්බු වෙලා, මා එක්ක කතා කළා. ඉතින් ඒක මේ මිත්තෝට ම විස උණා." යයි මාලිනී කීවා ය.

"ඔව්, ඔව්, ඔව්, මන් කිවුවේ නැද්ද? මන් දන්නැද්දා නෝ? ඒකිලා මහත්තයාගේ වගතුත් කතා කර-කර කියා. හොඳකින් මේ ගම-හොස්ස උඩින් මැස්සා යන්න ඉස්සෙල්ලා අඩ බෙර ගහ ලා දායයි එන්න, නොකියේ ඕ තියන්න එපා. හෙට මන් උන්දලාට පතා හරින්නේ, කන්ඩල ඇහිලි ගහ ගන්න." මෙසේ කියා නන්දුගළ අතින් හෙප්පුට සුවිතිට කඩින ලෙස නාඹරයට ගියේ ය. අන්දා ද එවෙලේ ම යන්න ගියේ ය. මාලිනී රෑ-කෑම පිළියෙල කරන්නට සූදානම් වුණාය.

# 3

කොළඹ නගරයේ පරණ ගෙවල් අතුරෙන් සමන්ගිර ද සුබ නැකතකින්, හොඳ සැලැස්මකට අනුව, ගොඩ නැඟුණු කදිම ගෙයකි. සමන්ගිර පරණ වුවත්, ඉතා ම අලුත් ගෙවලට වඩා, තව මත් දකුම්කලු ය. පත වර්ෂය අත් කාලක් වයස් ගත වූ නමුදු තව මත් එහි අයිතිය නො සැලී මුල් අයිති කාරයන් වෙත ම, පරම්පරා පරවෙණියක්ව, පවතින්නේ ය. ඒ සමන්ගිර අයිති කාරයනට ගෞරවයකි. සමන්ගිර හා සම වයස් වූ තවත් ගොඩ නැඟිලි කිහිපයක් කොළඹ නගරයේ ඇතත්, මුල් අයිති කාරයන්ගේ පරම්පරාගත ස්වාමිත්වයෙහි රැකෙන්නේ, එයින් ඉතා ම ස්වල්පයකි. සමන්ගිර පිහිටි පෙදෙසට කලින් බරන්දෙණිය යයි කීහ. එහෙත් දන් එට කොල්ලුපිටිය යයි කියති. බරන්දෙණිය වුවත්, කොල්ලුපිටිය වුවත්, තවමත් සමන්ගිර නම් සමන්ගිර ම ය.

එ කල, මෙහි පැවති ඉතාම උස් දෙමහල් ගෙය මෙය වූ බැවින්, ඒ බොහෝ දුර ඈතට පවා පෙනුණේ ය. සමන්ගිර ද ඈතට පෙනෙන වස්තුවකි. එ බැවින් ඒ අනුව මීට ද සමන්ගිර යයි කීහ. මේ සමන්ගිර පිහිටියේ ද සිත්කලු උද්‍යානයකය. මෙහි වාසය කළ පරම්පරා කිහිපයකට ම සොඳුරු දන් විවේකය දුන්, විශ්‍රාමය දුන්, නොයෙක් විශාල ගහ කොළ තව මත් දක්නා ලැබේ. තව මත් මෙය විවේක සුව කැමති, මිනිසුන්ගේ නෙත් සිත් පැහැර ගන්නා සුබස්ථානයකි. පුරුද්ද සැපයක් නො වන හෙයින්, මෙය දකින්නන්නට ලැබෙන විශේෂ ප්‍රීතිය, එහි වෙසෙන්නන්නට නැත්තේ ය. සැපයට හෝ දුකට හෝ විශේෂය ම හේතු වන්නේ ය.

සමන්ගිර, ජයපාල වරුනට වාස භවනය විය. ජයපාල කුලය ඉතා පරණ සිංහල පරම්පරාවකි. සිහළ රජුන් කල පටන් ජයපාලවරුන් රට කිරීමෙහි යෙදුණු බව එක වරක් නමුත් සමන්ගිරට අවසරයක් ලැබූ කවරකුට වුවත් ප්‍රත්‍යක්ෂ විය යුතු ය. මේ සිත්කලු මන්දිරයේ එක් කොටසක් මුළුමනින් ම ප්‍රදර්ශනය පිණිස තබන ලද පෞරාණික වස්තූන්ගෙන් පිරී තිබේ. පෙර, සිහළ රජුන් කල, ජයපාලවරුන් සිය රට හා සිය දූය වෙනුවෙන් සටන් කළ කඩු හෙල්ල-කිනිසි-රන්හොට්ටී ආදිය තව මත් එහි දක්නා ලැබේ. එසේම ජයපාල-වරුනට නොයෙක් රජුන්ගෙන් ලැබුණු සන්නස් තළල්-පට කස්තාන ආදියත්, ඉතා පරෙස්සමින් රැස් කොට තබා ඇත්තේ ය. මෑත භාගයෙහි දී නම් ජයපාල පෙළ බට හිර රජුන්හට සේවය කළා හ. මේ සේවය සෙනරත් ජයපාල මුදියන්සේ විසින් පහත රට ඉංගිරීසින්හට බාර වූ තැන් සිට, පටන්ගන්නා ලදි. දෙමළ රජුන් සිංහල සිංහාසනයට පත් තැන් සිට, ඇති වූ අභ්‍යන්තර කලහ නිසා ම සිංහලයෝ ක්‍රමයෙන් බල පරාක්‍රමයෙන් පිරිහුණා හ. ද්‍රවිඩයෝ බලසම්පන්න සිහළ රදළ පවුල් නිසරු කොට, දක්ෂිණාපථයෙන් පැමිණි ස්වකීය නෑ-සියනට ලංකා රාජ්‍යය පාලනයෙන් පැවරූහ. මේ හේතු කොට ගෙන, රටේ සාමයට අකුල් හෙළුණේ ය- පර සතුරනට රජය අත් පත් කර ගැනීමට රුකුල් ලැබුණේ ය. ජයපාලවරු සිය රටත්, ආගමයත්, ජාතියත් පර සතුරන්ගෙන් මෙන් ම දෙමළ උවදුරෙන් ද ආරක්ෂා කර ගැනීමට නොයෙක් පරිශ්‍රමයන් දරමින් බොහෝ විට හිස් කැපුන් කැහ. මෙ සේ කොට ද බලාපොරොත්තු කඩ වූ කල්හි, සෙනරත් ජයපාල තෙමේ ඉංගිරීසිනට පක්ෂ විය. ලක එක සේ සත් කොට, රටේ සාමය ඇති කිරීමට ජයපාල පෙළ, ඉංගිරීසිනට බොහෝ පිහිට වූ බැවින් ඉංගිරීසින් විසින් ද ඔවුහු ගෞරවයෙන් හා සම්මානයෙන් සලකනු ලැබූහ. ශත වර්ෂ එක හමාරක් පමණ කල් ඉංගිරීසින් යටතේ ද මේ පැරණි පෙළපත නොයෙක් තනතුරු උසුලමින් රාජකාරිය කළේ ය.

ජයපාල වංශාවලියේ ආධුනිකයා, හෙවත් දන් සිටින පශ්චිම පුරුෂයා, නව යොවුන් තරුණයෙකි. ඔහු ජෝන් ජයපාල නම් වේ. පියා මිය ගිය දෙ-තුන් අවුරුද්දකින්, ඔහු පාසැලෙන් අස්ව, සිය බූදලයේ කටයුතු කරන්නට පටන් ගත්තේ ය. ස්වකීය පෙළේ අසහාය අවශිෂ්ටයා බැවින්, ජයපාල මැතිණි- එ නම් ජෝන්ගේ මව, සිය පුතණුවන් ඉතා ප්‍රේමයෙන් ඇති දැඩි කළා ය. ජෝන්ගේ පියාගේ එ නම් ලුවී ජයපාලගේ මරණය කරණ කොට ජෝන්හට අනවශ්‍ය ස්වතන්ත්‍රතාවක් නොහොත් නිදහසක් ලැබුණේ ය. නිදහස වැඩි වෙන්නට-වෙන්නට ජෝන් එහි ප්‍රයෝජනය නො තිසි ලෙස පරිහරණය කරන්නට විය. ජයපාල මැතිණි, රැජිනියකට බඳු ගැහැනියක වූ බැවින් පුත්‍රයාගේ ක්‍රියා පරිපාටිය පිළිබඳ තිසි පාලනයක් ඇති කිරීමට නිතර උත්සාහ කළා ය. ඇයගේ උත්සාහය බොහෝ දුරට සඵල වූ බව කිය යුතු ය. නො එසේ නම්, මෙලොකටත් තරුණ ජෝන් ජයපාල ගහෙනුත් වැටී, ගොනුගෙනුත් ඇනුම් කෑ, අභාග්‍ය සම්පන්න නරාධමයකු වී ඉවර ය. මුළු ජයපාල පෙළේ කිසිවකුටත් ජෝන්හට පමණ නිදහසක් හා බලයක් කිසි කලකත් ලැබුණේ යයි සිතිය නො හැකි යි. සමහර කලක, සමහර ජයපාලයකුට නිදහස ඇති වුව ද බලය නොමැති විය- බලය ඇති වුව ද, නිදහස නොමැති විය- බලයත් නිදහසත් එක වර ඇති වූ ජයපාලයනට තරුණ වයස නොමැති විය. එහෙත් මේ ආධුනික ජෝන් ජයපාලට වූ කලී, අර්ථ ශක්තියෙන් පමණක් නොව, ආත්ම ශක්තියෙන් ද ඥාන ශක්තියෙන් ද ස්වාධීනත්වයෙන් ද කිසි අඩුවක් හෝ හිඟ පාඩුවක් නොමැත්තේ ය.

ඇඩා ජයපාල හෙවත් ජෝන්ගේ මෑණියෝ, වරින්-වර සිය පුතණුවන්හට ජයපාල වංශාවලියේ ප්‍රතිපත්ති ධර්මය සිහි කරවමින් අනුශාසනා කළා හ.

"ජෝන්, ඔබට මා මේ දී තිබෙන නිදහස බොහෝම ලොකු එකක්- ඇහුණා ද? ඒක නරක අතට හරවා ගන්න එපා. ජයපාලවරුන් කවදත් බලාපොරොත්තුවක් ඇතුවයි වැඩ කෙළේ- ඔබ වැඩ කරන්නේ- ඇහුණා ද? කිසි බලාපොරොත්තුවක් නැතුවා වගෙයි- මේ මොක ද?" මේ ආදී වශයෙන් ඈ නොයෙක් විට පුත්‍රයාගෙන් ප්‍රශ්න කරන්නී ය.

ජෝන්ගේ සිතට කරදරයක් ඇති වන්නේ, මේ බඳු ප්‍රශ්නයක දී පමණකි. ඒ කරදරය වුවත්, ඔහු සිත් හි දෙ තුන් මොහොතකට වඩා නො පවතී. තවර හෙයින් ද යත්, ඔහු කිසි යම් උපායයකින් මැණියන් සිත් ගෙන, ඇය සතසා නැවතත් පළමු පුරුදු සිරිත ම අනුගමනය කරන හෙයිනි.

දරුවකුට- විශේෂයෙන් ම, පිරිමි දරුවකුට- නම් තරමක නිදහසක් දිය යුතු යයි ජයපාල මැතිණී කල්පනා කරන්නී ය. නිදහසක අගයක් නො දන, දෙගුරුන් අභිමතයට ම හැදෙන, දරුවා, එම දෙගුරුන් ඇවෑමෙන් අසරණ බවටත්, නිවට බවටත්, පත් විය යුතු ය යන සැකයක් ඇය කෙරේ පවතී. එ හෙයින් ජෝන්ගේ ප්‍රමාදාදියෙහි ඈ නොයෙක් විට උපේක්ෂා වූවා ය. ජයපාල අන්වය කෙරෙහි ද ඇයගේ බලවත් විශ්වාසයක් පවතී. ජයපාල පෙළෙන් පැවතෙන්නකුට කිසි කලකත් නො මග යා නො හැකි යි යනු ඇයගේ බලවත් විශ්වාසය යි. එ සේ ද වුව, ඈ ස්වකීය පුත්‍රයාගේ ක්‍රීඩාත්මක ක්‍රියා පරිපාටිය විෂයයෙහි සැලකිලිමත්ව, සිටියාය.

ජෝනගේ කෙළි සෙල්ලමෙන්, තමනට මුත් අනුනට ලෙල්ලමක් නොවීම ඇයට ලොකු සැනසීමකි. ඇයට නම් ඔහු තවම හය-අතර නොදන්නා කොල්ලෙකි. ජෝන් නම් ස්ථිර වශයෙන් කිසිම දුශ්චරිතයක අභ්‍යාස වූ බවක් නො පෙනේ. රේස් එළවීම ඔහුගේ ප්‍රධාන ක්‍රීඩාව වුව ද, ඒ වෙනුවෙන් මහත් ධනයක් විසඳුවේ වුව ද එය ද දුශ්චරිතයන් වන පමණට තව ම අභ්‍යාස වූ බවක් නො පෙනේ.

"ළමයා, ජයපාල වරුන් කවදාවත් අස්ස රේස් එළෙව්වේ නැහැ. ඇහුණාද? ඔවුන් කෙළේ රට පාලනය යි. මේ ඕනෑ නැති වැඩ කරන්න ගිහින් ඔබ අපරාදේ මුදල් නාස්ති කරන්න එපා" මෙ සේ ද, ඈ නොයෙක් විට කියන්නී ය.

"කලට ඔබින විදියට ඕනෑ වැඩ කරන්න බලන්න අම්මේ. මා මොනවා ද නො කරන්නෙ කියා- අපේ කිසි ම කෙනකු නොකරපු



වැඩ කරන්නේ නැද්ද කියා" මේ ආදී වශයෙන් මේ වැනි තැන, ජෝන් අඩක් කවට බසින් හා අඩක් කපට බසින් ද පිළිතුරු දෙන්නේ ය.

ජෝන් ජයපාලට තමා හා සම වයසෙහි වූ මහත් පිරිසක් මිත්‍රයෝ ද වෙති. ඔව්හු සැම දෙනා කල්‍යාණ සංඛ්‍යාවට නො ගැණෙන්නෝ ය. සමහරු දූ කෙළියෙහි ද, සමහරු බීමත් කමෙහි ද, සමහරු වෙනත් දුසිරිත්වල ද, ගැලුණෝ වෙති. කිසියම් මරාළයක් කඩා වැටීම හේතු කොට ගෙන, දුගී දුප්පත් පවුල් වලින් උසස් බවට පැමිණී අයත් දුශ්චරිතයන් කරණ කොට උසස් පවුල්වලින් පිරිහුණු උගත් අයත්, ඔහුනතර වූහ. මෙ බඳු සංකර සමාගමයේ නිතර හට ගත්තේ, දෙවනුවට කියැවුණු අයගේ හීන-දීන දුසිරිත් ම ය. තව ද, එ සේම ඔවුනතර මහජන සේවයෙහි හා දෙශ පාලන ක්‍රමයන්හි උනන්දු වූ කිහිප දෙනෙක් ද වූහ. මේ මිත්‍රයෝ නදුරුත් පාහේ, ධන ගර්වය හා කුල ගර්වය සලකා, ජෝන් ජයපාල සමාජ ප්‍රභූත්වයෙන් නිතර පිදූහ.

සමන්ගිර, මේ මිත්‍ර සමාජයට උදාරාර්ථය සලසන ඉතා හොඳ සරු ආසනයකි. ඔවුනට මෙහි උත්සවාකාරයෙන් නොයෙක් සංග්‍රහ කෙරෙන්නේ ය. එක් වූ තැන, ඔවුහු බොහෝ සේ අස්ස රේස් ගැන කතා කරති-නොහොත් දෙශ පාලනය ගැන කතා කරති. කතාව කුමක් ගැන වුවත්, එය දිගින්-දිගට කර ගෙන යෑමට රුකුලක් වශයෙන් හොඳට මත්-පැන් පානය ද කරති.

ජෝන් ද මත්-පැන් පානය කරන්නේ වී නමුත්, සිය නිවසෙහි පවත් වන මෙ බඳු මිත්‍ර සමාජයෙහි දී නම්, මේ දුෂ්චරිතයෙහි නො ඇලෙන්නේ ය. ඒ ඔහුගේ ප්‍රතිපත්තියකි. ඉතා ම අවශ්‍ය ප්‍රස්තාවයක දී, ඉතා ම අවශ්‍ය පුද්ගලයකු සමග මිනා, ඔහු සම්භාෂණය හා සමාගමය සලකා වුවත් කැවුද් මත්-පැන් පානය නො කරන්නේ ය.

"මොවුන්ගෙනුත් මට ප්‍රයෝජන තියෙනවා. අම්මේ. හැම මිනිහාගේ ම අද වටිනා කමක් තියෙනවා ලොක්කන් විතරක්

නො වෙයි- අද සොක්කනුත් අපට ඕනෑ.'' කියමින් ජෝන්, මිත්‍රයන්ගේ බේබදු කලහ වැඩි වැඩි වන විට, නො සතුටු වන මැණියන් සනසන්නේ ය.

එසේ ද වුව, ජයපාල මැතිණියට මෙහි වැඩි කරදරයක් නැත්තේ ය. මේ සියලු විගඩම් කෙරෙන්නේ, සමන්ගිරේ ඈත කොනේ මහා ශාලාවක හෙයින් ඔවුන්ගේ කන් දොස් කිරියාව ඇයට ඇසෙන්නේ, කලාතුරකිණි. එහෙත් මෙහි කරදරයත්, කන්දොස්කිරියාවත්, නිබඳව ම ලැබෙන්නේ, සමන්ගිරේ ජුසේ නැමැති ප්‍රධාන මෙහෙකරුවාට ය. මේ ප්‍රීති ප්‍රමෝදයන් නිසා හැම සවසක ම අසරණ ජුසේට තරමක මගුල් ගෙදරක වැඩ ඇත්තේ ය. විස්කි ඩීකැංටර්, වීදුරු බඳුන් හා නානා කටගැසුම් හා අවුළපත් පිළියෙල කරන්නටත්, මේ බේබදු අමුත්තන්ගේ දහසකටත් වැඩි ඕනෑ කම්වලට ඇහුම්කන් දෙන්නටත් වීම ඔහුට මහත් කරදරයකි.

''මේවා තමයි, නර ලොව හොල්මන්.'' මේ සුරා මතින් අහිතය දක් වන තරුණයන් දකින ජුසේ නිතර කියන පදයකි. ඒ ඔහු අප්‍රසාදය දක් වන සැටි තමා, ඇතැම් විට ''ඔන්න එනවා තව හොල්මනක්.'' කියමින් ඔහු වෙරි මතින් එන බේබද්දකු පෙන් වන්නේ ය.

වෙරි මතින් පසු වන කල්හි ද, මේ මිත්‍ර සමාජයෙහි අමද්‍යප වැඩ ගැන කතා ද කෙරෙන්නේ ය.

''ජෝන්, අප මේ වැඩියෙන් ම ආවේ, එන ඉරිදා තියෙනවා අමද්‍යප රැස්වීමක්- ඒක අපේ ගමේ- මගේ කල්පනාව ඒකේ මුල් පුටුව ඔබට පිළිගන්වන්නයි.'' වීදුරුවට වත් කර ගත් විස්කි අඩියක් අතේ ඇති ව, මෙ සේ දොඩන්නකු ද මෙහි දකින්නට නො ලැබෙන්නේ නො වේ.

මෙ වැනි තන්හි, ජෝන් ජයපාල සිනාසෙනු පමණකි. ඇතැම් විට හේ කිසි කතාවක් ද නොකොට, ආරාධනය පිළිගත්තාක් මෙන් ද සිටියි.



''හැබැයි, එන දාට ජාතික ඇඳුමෙන් එන්න ඕනෑ. අප කවුරුනුත් එන්නේ, ජාතික ඇඳුමෙනුයි'' කිසිවෙක්. මෙ ලෙ ද යෝජනා කරති.

වෙරි මතින් ඇත්ත කතා කරන්නන් හා ධර්ම ශාස්ත්‍රිය ප්‍රශ්නයන්හි නිරත වන්නෝ ද, දේශ පාලන ක්‍රමයන්හි ගුණ දොස විවේචනය කරන්නෝ ද, මෙ වැනි තන්හි නිසොල්මන්ව නො සිටිති.

''මේ ලෝකය මහ අලි බොරුවක්ය'' කියමින් තරුණයෙක් විස්කි-සෝඩා වීදුරුවක් පුරවා ගත්තේ ය. ඇතැම් විට, ඔහුට සිංහලයට වඩා ඉංගිරිසිය හුරු බව කතාවෙන් පෙනේ. නොයෙක් විට ඔහු කතා කරන්නේ ද ඉංගිරිසියෙනි. ඔහු ලංසි තරුණයෙක් නොවෙයි නම්, ලංසි කලවම් සිංහල තරුණයෙක් වන්නේ ය. ''මේ ලෝකය මහ අලි බොරුවක්- මා හොඳ මිනිහෙක් ය කියා මේ කියනවා නොවෙ යි. මගේ දෙමවුපියන් සන්තක වස්තුව ඇති ඇත්තේ නැති කර ලායි, මා මේ ඉන්නේ- මේ බිමට වාල් තුණා නම්, මා අද ඉන්නේ, මෙ තැන නො වෙයි. එහෙ නම් දැන් සුපිරීම්කෝට් බෙංචියෙහි-''

''ඇති, ඇති, අපි දන්නවා- ඉතින් ඔය කියන්න හදන එක කොටින් කියාපන්කෝ.'' කියා තවත් තරුණයෙක් මෙහෙ ම තැන, කෑ ගාන්නේ ය.

''මේ ලෝකය මහ අලි බොරුවක්- මොනවා ද අප මේ නටන නාඩගං? මේ ජුසේ කියන්නේ වාගේ ''මේවා තමයි නර ලොව-හොල්මන්'' ඉතින් මේ අමද්‍යප වැඩ කරන අපේ මේ හැටි තමයි. බොන කොට බොන්නේ උගුර ළඟට එන කං- පාන් කියන්න බැරි වෙන කං- ඒකට මොක ද රැස්වීම්වලට ගියා ම කතා කරන්නේ, උපන් තේකට බීම පොදක් ඇහින් නුදුටු උපාසකයන් වාගෙයි. මට එකක් කියන්න පුළුවනි- ඔබ කරන ඕනෑ ම වල් කමක් මමත් කරන්නං- හැබැයි, මේ තක්කඩි කම් විතරක් මට කරන්න බැහැ.'' මෙ සේ කියමින් ඔහු අමෘතය තොල ගා බොන්නකු මෙන් විස්කි වීදුරුව ටික-ටික පානය කරන්නේ ය.

ඔබ බොහොම හරි, තවත් තරුණයෙක් එම අදහස අනුමත කරමින්. "ඒත් ඔබ හිතනවා ද යාළුවා, අද කෙලින් වැඩ කරන්නන්හට ලෝකේ ඉඩක් හේම තියෙනවාය කියා? ඒයි! ඒයි! මාත් මුල දී හැදුවේ- අවංකව තමයි, වැඩ කරන්න. ඒකට කිසි ආධාරයක් නෑ ලැබුණේ"යි නැවත කියන්නේ ය.

"මොනවාද මිස්ටර් දේසෙ හැටියට තමයි, අපේ බාසේ" කියන්නෙක් ද මෙහි දී ඉදිරිපත් වන්නේ ය. "අපට මිනිසුන්ව හදන්න බෑ ඕය්. මිනිසුන්ගෙන් අප හැදෙන්න ඕනෑ. හා! හා! හා! ඒක තමයි, ඔන්න අද කවුරුනුත් හිතා ගන්න ඕනෑ ඒක. මිනිසුන් ගෙන් අප හැදෙන්න ඕනෑ. උනුත් බොනවා. අපත් බොනවා. ඒකට මොක ද එක් වුණු තැන බීමේ වැරදි කියනවා. මැරෙතත් බීම නො බොන්නන් වාගේ පස් පංගුවේ බීමට බනිනවා."

"අන්න, ඒක තමයි, මාත් කියන්නේ." යනුවෙන් තවෙකෙක් පටන් ගත්තේ ය. "ඔ විතරක් ද? නෑ, නෑ මස් කෑම ගැනත් ඔහොමයි විරුද්ද කම, කතා කරන කොට බ්‍රාහ්මණයන් වාගෙයි කතා කරන්නේ, ඔව්, ඔක්කෝ ම මස් කන්නන් වසළයන් කරලායි කතා කරන්නේ. ඒකට මොක ද ගෙදර ගිහින් බලන්න ඕනෑ. කන හැටි කොහොම ද කියා- හරකාගේ හං-අං-කුර වත් නෑ. ඉතුරු කරන්නේ හා! හා! හා!"

අවංක සිතින් අදහස් පළ කරන අකපට මිනිසුන්හට මහජන ප්‍රසාදය දිනා ගන්නට නුපුළුවන යන්න මේ සමාජයේ බො හෝ දෙනා තුළ පවතින මතයකි. අමද්‍යප සභාවකදී, අවංක සිතින් ඇත්ත කියන්නකුට මහා ජනයාගේ සිත් දිනා ගැනීම තිබිය දී, වෙන්නේ, ගල්-මුල් පහර කන්නට යයි ඔව්හු කල්පනා කරති. "මට බොරු කියන්න බැහැ. මා ඉඳ-හිටලා, මත්-පැන් ටිකක් බොනවා තමයි." අමද්‍ය සේවකයන් අතර මෙ සේ ඇත්ත කියන්නකු නැත්තේත්, "මට අඩියක් නො ගහා ඉන්න බැහැ. ඒකේ අනිෂ්ට විපාක දක-දකත් මට එයින් වළකින්නට බැහැ. ඒ නිසා තමයි, මා මේ හැමට ම කියන්නේ, හැකි නම් මේකෙන් වෙන් වෙයල්ලා කියා." සභාවක දී එහෙ ම ඇත්තක් කියන්නට තරම් ධෛර්ය



සම්පන්න පුද්ගලයකු නැත්තේත්, "මාත් හැම දා ම මත්පැන් පානය කරනවා. ඒ නිසා මට වන හානියක් නැහැ. පවුලේ වියදමට තිබෙන මුදලෙන් නො වෙයි. මා මත්පැන් බොන්නේ. බීගෙන ගේ ම, මා කවදා වත්, හොතැන වත්, කානු පල්ලේ හිටියේ වත්, කල-කෝලාහල කෙළේ වත් නැහැ. එහෙත් සමහර මිනිසුන්ගේ කටේ-තොලේ සුරා ටිකක් ගෑවුණා ම, ඔවුන් නොයෙක් ගම්පෙරළි කරනවා. ඉතින් එ හෙ ම උදවිය සුරා බොන්න ඕනෑ නැහැ." මේ ආදි-වශයෙන් තමන්ගේ හෘදයට එකඟව ඇත්ත කියන්නකු නැත්තේත්, බොරුවට මිස ඇත්තට ගරු කිරීමක් මහජනයා කෙරේ නැති හෙයිනැයි ඔවුහු කල්පනා කරති. "මහා ජනයා ගරු කරන්නේ, අවංක සිතින් කතා කරන ඇත්තට නො වෙයි- වංක සිතින් ඇත්ත මෙන් පෙනෙන්නට දක්වන නැත්තට යි. "මෙය ද ඔවුන්ගේ උද්දේශක වාක්‍යයකි. පුදුමයක හැටි! මෙ සේ ඔවුහු පස් වන ශික්ෂා පදය රකින්නට කරන වෑයමෙන් සිවු වන ශික්ෂා පදය බිඳ පියති.

අද මොවුන්ගේ චාරිත්‍රය දුසිරිතෙන් වැළකෙන එක නො වේ. දුසිරිතෙහි ගැලී හිඳිමින්, සුසිරිතෙහි සිටින්නන් මෙන් දුසිරිතට පහර දීම පමණකි. ඔවුන් දැවැද්දට විරුද්ධව කතා කරන විට ද මෙ සේ ම ය. ලියුම්-කියුම් වලින් නම්, මේ එකකුට වත් දැවැද්ද ගැන විමසීම් තබා, ඒ ගැන යෝජනාවක් වත් කනට ඇසෙන එක පිළිකුලකි. එහෙත් බැරි වෙලා වත්, මගේ නොහෙන් නමුත් ඔවුනට පෙළ වාසියක් ජෝඩු වුණු හැටියේ, පළමුවෙන් ම කරන ප්‍රශ්නය දැවැද්ද ගැන ය.

තව ද කිසි ම අමද්‍යප මෙහෙයකට වත්, ජාතික වැඩකට වත්, ආගමික වැඩකට වත්, සම්බන්ධ නොවී, සූදුවෙන් හා බීමත් කමෙන් පමණක් මේ සමාජයේ කල් ගත කරන තවත් සමහරු "වංක සිතින් අමද්‍යප සේවකයකු නොහොත් මහජන සේවකයකු වෙනුවාට වඩා, අවංක සිතින් බේබද්දකු නොහොත් සූදු කාරයකු වන එක හොඳ ය"යි සම්මත කොට, ජාතීය විෂමාචාර සම්පන්න දුෂ්ටාත්මයනට ක්ෂමා ප්‍රාර්ථනය ද කරති.

"අප බොන්නේ, ශරීර සනීපයටයි- උඹලා බොන්නේ බේබදු කමට යි" මෙ සේ ද, එක් පක්ෂයක බේබද්දෙක්, අනෙක් පක්ෂයට දොස් නගන්නේ ය.

"අප බොන්නේ, බේබදු කමට නො වෙයි. අපේ හිතේ වේදනාව නැති කර ගන්න යි. මේ බොරු වැඩ කරන මිනිසුන්හට රට අයිති වෙන හැටි පෙනෙන කොට, අපේ හිතට බොහොම. අමාරුයි. අද ඕනෑ පැත්තකට හැරී බලන්න. හරි ගිහින් තියෙන්නේ, කාට ද කියා- බොරු කාරයාට ම යි. බොරු කාරයාට හරී යන දසාවක් තවත් මෙහෙ ම නම් සිංහලයාට මතු ලැබෙන්නේ නැහැ"යි ඉහළ අඩියකින් පහත වැටුණු තිසියම් බේබද්දකු කියන හඬක් ද ඇසෙන්නේ ය. ඔව්! අද ඕනෑ ම හරි ගිය මිනිහකු අර ගෙන බලන්න. මන් කියන එක බොරු ද කියා. එතකොට පෙනේ වි, ඒ මිනිහා නැගුණේ, ලොව රවටා ලා බව. අනිත් පුදුම ය, එහෙ ම ඨවට්ලි කාරයකුට දහයකට නව සැරයක් වැරදුණත්, මහා ජනයා සමාව දෙන්න ලැස්තියි. සත්‍යවාදී සෘජු මනුෂ්‍යයකුට නම් එක වරක් වත් සමාව දෙන්න ලැස්ති නැහැ. ඇයි, මා කියන එක වැරදි ද? ඕනෑ ම උසස් තැනක බලන්න, මෙහෙ ම කපට බොරු කාරයකු සුව සේ වැඩ සිටිනවා දකින්න ලැබේ වි. සමහර විට, ඔහු වම-දකුණ වෙනස නොං දන්නා නූගතකු වෙන්නත් පුළුවනි. ඉතින් මොක ද ඒ කට, ඕනෑ ම සමර්ථයකුට කියමු. පුළුවන් නම් ඒ මෝඩ බූරුවා එ තැනින් ඇද දමන්න. එතකොට තේරේවි මාත් මේ කියන එකේ ඇත්ත නැත්ත, අපේ මුළු ජන සමාජය දූත් නැත වෙලා- හොඳට ම කැතවෙලා- ඇත්ත උඩ ගන්න බැරි තරමට යට වෙලා- දූත් බොරුව තමයි, පේසත් නගා හැම තැන ම රජ කරන්නේ. බොරුවට විරුද්ධව කා කරන්න ගියොත් වෙන්නේ. ගල් ගැහුම් කන්නයි මේවා ගැන සිතෙන කොට පපුවට බොහො ම අමාරුයි. එතකොට තමයි, අපටත් අඩි ගහන්න හිත් වෙන්නේ, එහෙත් එක සැනසීමක් තියෙනවා- මේ බොරුව වැඩි කල් පවතින්නේ නැහැ. මහා ජනයාගේ ඇස් ඇරෙන දවසක් ඒවි. එදාට ජය කෙහෙළින් සමග බොරු කඩා වැටෙන සැටි බලනැකි-"



අවසරයක් දුටු කෙණෙහි, මෙ බඳු මතාන්තරයනට අනුකූල වන පරිද්දෙන් පක්ෂ පොෂණය කරන්නෝ ද, මෙහි එමට දක්නා ලැබෙති.

"ඒ කතාව ඇත්තයි. වෙනෙකක් මොට ද, සමහර විට ජෝන්හට මත් මේක විස වෙන්න පුළුවනි. කරන්න දෙයක් නැහැ. ජෝනුත් එක ජාතික-ඇඳුම් කාරයෙක් නේ ද? මෙයාත් ජාතික ඇඳුම අඳින්නේ, ඒ වේලාවට ටික දෙනකුගේ ප්‍රසාදය දිනා ගන්න යි. නැතුව ජාතික ඇඳුමකට ඇති ආදරය නිසා නො වෙයි. මහා සභාවේ දී කලිසමට බනින කොට, පස් පඩංගුවේ බනිනවා. ගෙදර ආ හැටියේ ආයෙත් ඒ කලිසම ලා ගෙන, වෙන ගමන්-බිමන් යනවා නො වේ ද ජෝන්? ඇත්ත කියන්න."

මෙහෙ ම තැන දී, සාමාන්‍යයෙන් තරුණ ජයපාල දෙන එකම පිළිතුර නම්, "ඔව්, ඔව්," යනුවෙන් හිස, වැනීම පමණකි.

"ඔය කතාව අපි ඉතින් ඔයින් නවත්වමු." කියමින් අනෙකෙක් තවත් යෝජනාවක් කරමින්, රේස් ගැන සාකච්ඡාවක් උපද වන්නේ ය. "ජෝන්, එන පාර ගවනර්ස් කප් එක ගහන්න නම්, ඔබට ඔය අස්සයාගෙන් බැහැ. සල්ලි තියෙනවා නම්, කොහොම හරි ගන්න වෙන අස්සයෙක්-"

"බෑ,බෑ" යනුවෙන් මෙ බඳු යෝජනාවකට ජෝන් හිසටත් උඩින් යුගත් නගා, නො කැමැත්ත ප්‍රකාශ කරන්නේ ය. "ඔහොම නටන්නට ගියොත්, මට රටේ ඉන්න බැරි වේවි. දූන් මේ ටිකකට ඉස්සෙල්ලා, අම්මා මට හරියට දෙහි කපාලා යි තියෙන්නේ- සල්ලි නාස්ති කරනවායි කියා."

"ජෝන්, ගවනර්ස් කප් ගහපු දාට තමයි, ෂැම්පෙන් කානු දිගේ ගලන්නේ." අනෙකෙක් කියන්නේ ය.

"අයිසේ, ජයේ, ගියේ නැද්ද? හැරීගේ බර්ත් ඩේ පාටියට" එ තැන හරි නැටුම්- එන්ජෝයි කරන්න නම් යන්න ඕනෑ අන්න එහෙම තැන්වලට."

මේ ආදී නොයෙක් කතාවලින් වෙරි මත නගින්නට-නගින්නට තරුණ පිරිසගේ හැසිරීම අසභ්‍ය වේ- කලහ ශබ්දය ද වැඩි වේ. මෙ තැන් සිට, බොහෝ දෙනා තනිය ම කතාව පටන් ගනිති. සමහරු කතා නැතිව; ඇසිපිය මරමින් හිට ගත්-ගත් වන ම, කණු මෙන් තැන-තැන, පසු වෙති. මේ අතර ජුසේ, “මේවා තමයි, නර ලොව හොල්මන්, නර ලොව හොල්මන්” කිය-කියා ඩිකැංඩර හා වීදුරු බඳුන් අස් කරන්නට පටන් ගනියි.

මෙහි දී ගෘහ මූලිකයා වශයෙන් යුතු කම් ඉටු කිරීමට ජෝන් නියම සිහියෙන් සිටින්නේ ය.

“ජුසේ, මේ මහත්තැනාව ගිහින් දාපන්. ඒ ගොල්ලාගේ කාර්වල. කියාපන්, ඒ ගොල්ලාගේ ඩ්‍රයිවර්ලාට පරිස්සමෙන් ගෙදරවල ගිහින් දමන්නය කියා” මොවුන්ගේ කලහ පෙරළී තවත් ඉවසනු නොහැකි වූ විට, ජෝන් ජයපාල කියන්නේ ය.

“මේවා තමයි, නර ලොව හොල්මන්,” කිය-කියා ජුසේ ද එකිනෙකා වත්තම් කර ගෙන ගොස්, සිර්ත් ලෙස ඔවුන්ගේ කාර්වල දමා, යන්නට පිටත් කර හරින්නේ ය.

මේ තනිකඩ සමාජයේ, මෙ බඳු නොයෙක් අභිනයයන් යටත් පිරිසෙයින් සතියකට දෙවරක් වත්, සමන්ගිරේ දකින්නට ලැබේ. මේ බේබද්ද මිත්‍රයින්ගෙන් සමහරකුට ජෝන් ඉතා ම කැමැති ය. ඔවුන් මගින් ඔහුට අස්ප රේස් සම්බන්ධයෙන් ඉතා වැදගත් ගුරුකම් හා දන මුතු කම් නිතර ලැබේ. එසේ ම තවත් සමහරු ඔහුට ජන සමාජයේ ස්වකීය ප්‍රසිද්ධිය ඇති කිරීමට උපකාර වෙති. ජෝන් ජයපාල ලොකු උගතෙක් වත්, මහ වියතෙක් වත්, නොවේ. ජයපාලවරුන් සතු එඩිතර කම හා සහජ බුද්ධියක් ඔහු කෙරේ ද නො මදව පවතී. ඒ හැර, විශේෂයක් වශයෙන් ඔහුට ඇත්තේ ධනය පමණකි. අන් කිසිවක් නැති වත්, ප්‍රභූත්වයට හැම කල්හිම ධනය මහ පෙන්වන්නකු බැවින් ඉතා ම පහසුවෙන් ඔහු රට ප්‍රකට කිරීමට මේ ඊනියා මිත්‍රයන්ට කිසි දා අපහසුවක් නොවී ය.



පුත්‍රයාගේ අනාගත ජීවිතය සම්බන්ධයෙන් ජයපාල මැතිණිය ඇති කරන අදහස් ඉතා උසස් ය. ඔහුට කුල පරම්පරාවෙන් අඩු පාඩුවක් නැත-ධනයෙන් අඩු-පාඩුවක් නැත- උගත් කමෙන් ද අඩු-පාඩුවක් නැතැයි ඇය සිතන හෙයින්, මහා ජන බලයෙන් වුවත්, ඉතා ම උසස් අඩියකට පත් වන්නට ඔහුට බැරි කමක් නැති. ලුවී ජයපාල තව කලක් ජීවත් ව සිටියා නම් පුත්‍රයා හික්මවා ගැනීමට ඔහු ලොකු ආධාරයක් වන්නේ ය. ඔහුගේ අකාල මරණය ඇයට මහත් පාඩුවකි. එ සේ ද වුව, ඇ ධෛර්ය-සම්පන්නව නොයෙක් වැඩි-හිටි මහතුන්ගෙන් හා කුලපතියන්ගෙන් නොයෙක් ගුණ දනමුතු කම් ලැබ ගෙන, ස්වකීය ආත්ම බලයෙන් ම ජයපාල බූදලය රැකීමත්, ඊටත් වැඩි අසීරු කාරණයක් වූ ජයපාල ආධුනිකයා රැකීමත්, හිස පිටට ගත්තා ය.

ඇඩා ජයපාල, ආරම්භයෙහි පටන් ම, එ නම් ලුවී ජයපාලට විවාහ වූ තැන් පටන් ම, රෝස උපනෙතක් ඇස ලා ගෙන, අනාගතය දෙස බැලූ කාන්තාවකි. ඇයට ආවාහ වන කාලයෙහි ලුවී ජයපාල සිවිල් නිලධාරියෙකි. ක්‍රමයෙන් ඔහු රාජ කාර්යයෙහි, නිලයෙන්-නිලය උසස් බවට පත් වනු දකීම ඇයගේ අසහාය සන්තෝෂය විය. ස්වාමිපුරුෂයකුගේ දියුණුවකට නොහොත් උසස් වීමකට භාර්යාවකගෙන් යම් කිසි ප්‍රමාණයක පිහිටක් වුවමනා වී නම්, ඒ සියල්ල කිසිදු අඩු-පාඩුවක් නැතිව, ඇඩා ජයපාල විසින් පරිත්‍යාග කරන ලදී. ස්වදේශිකයකු විසින් මෙතෙක් රාජකාර්යයෙන් නොලත් උසස් තනතුරු පවා, යථා කාලයෙහි තම ස්වාමියාට පිරිනැමෙනු දකින්නට ද, ඇ පුලපුලා සිටියා පමණක් නොව, රාජකාර්යයෙන් විශ්‍රාම ලැබූ කෙණෙහි ඔහු මහා ජන සේවක කටයුතුවලට ද බඳවා, දෙ වැනි ජීවිතයක් ආරම්භ කැරවීමට ද, ඇ සිතා ගෙන සිටියා ය.

“ඔව් මේ කාලේ, මහ ජන සේවකයකු වීම තමා ඔක්කෝට ම වැඩි ගෞරවය- ඇහුණා ද? දැන් ම හිට, මහා ජන ප්‍රසාදය දිනා ගන්නා බලාපොරොත්තුවෙන් වැඩ කරන්න ඕනෑ” මේ ආදී වචන ස්වාමියා ධෛර්ය ගන්වමින් ඇ නොයෙක් විට කීවා ය.

කල් ජීවත් වන්නට ලැබුණා නම්, ලූවී ජයපාල නිසැකයෙන් ම භාර්යාවගේ මනොරථය මුදුන් පමුණු වන්නේ ය. අභාග්‍යයකා හැටි! අකාල මරණයකින් ඔහුගේ අගනා ජීවිතය, තිසි ඵල ලබන්නට පළමු, රෑ දුටු සිහිනය මෙන් අභාව ප්‍රාප්ත විය. සැමියාගේ මරණය ඇඩාට ඉවසිය නො හැකි දුකක් විය. ඇයගේ සියලු බලාපොරොත්තු එයින් ම අවසන් විය යුතුය යි, කවුරුත් කල්පනා කළහ. එහෙත්, ඒ එ සේ නො විය. එ කල, පසළොස් වියෙහි සිටි, මේ එක ම පුත්‍රයාගේ මාර්ගයෙන් යථොක්ත මනොරථයන් මුදුන් පැමිණ වීමට ඈ කල්පනා කළා ය. එ සේ කල්පනා කොට, ඒ වෙනුවෙන් මුළු කාලය යොදන්නට පටන් ගත්තා ය.

ජයපාල මැතිණී ඉතා හොඳ මවකි. දෙ වැනි කසාදයකින් තමා බැඳ ගන්නට බොහෝ දෙන කල්පනා කළ නමුත් ඒ කිසිවකටත් නොකැමැතිව, පුත්‍රයාගේ මතු ජීවිතය සිය ජීවිතය මෙන් සලකා, පුත්‍රයා ඓශ්වර්ය සම්පන්න කොට, එයින් සතුටු වන්නට පරිශ්‍රම දැරීම ඇයගේ පරමාර්ථය විය.

රාජ කාර්යයෙහි නියුක්තව, රජුන් සිත් ගන්නුවාට වඩා, මහජන සේවාවෙහි නියුක්තව, මහා ජනයා සිත් ගැනීම යෙහෙකැයි සිතන ලද හෙයින් පියාගේ මරණය මුල් කොට, ඇති වූ පස් අවුරුද්ද තුළ, හෙවත් මේ වන තෙක්, අන් කිසි රාජ කාර්යයක් අපේක්ෂා නො කොට, කල්‍යාණ මිත්‍රයන් මෙන් ම පාප මිත්‍රයන් ද එක සේ භජනය කරමින් පර්යුපාසනය කරමින් ජෝන්, දෙශපාලන ක්‍රමයන් පිළිබඳ ප්‍රතිසංස්කරණයන්හි ද උද්‍යොගවත් විය. ජෝන්ගේ ක්‍රියා පරිපාටියෙහි දුර්වල ස්ථාන එමට දක්නා ලැබේ. නව යෞවන සමය ය එ බඳු දුබල කම් ඇති විය යුතු වයසකි. එ හෙයින් ජයපාල මැතිණී ඒ සියල්ල මැදහත් සිතින් ඉවසුවා ය.

ජෝන්ගේ රළු-පරළු විසම් ගුණ මැඩ පවත්වමින්, ඔහු පවිත්‍ර චාරිත්‍රවත් අලාමක තරුණයකු කිරීම පිණිස ජයපාල මැතිණී හිතවත් තලතුනා මහතුන් කිහිප දෙනකුගේ ම උපකාර සෙවුවා ය. එ සේ ම පුත්‍රයා හිතූ මතයෙන් කරන-කියන වැඩ ගැන නිතර සෝදිසියෙන් සිටින්නටත් ඔහු සීමාව ඉක්ම වන තැනක් වෙතොත්,



එය ගැන වහා තමනට දැනුම් දීමටත්, ඈ කිසියම් පුද්ගලයකු ද පත් කළා ය. මේ මුර සෙබළ කමට පත් තැනැත්තේ වූ කලී ජයපාල බූදලයේ ගනු-දෙනු සම්බන්ධයෙන් සියලු කටයුතු කරන මැදි වියෙහි සිටි ජෙරී හැරිස් නමැති නීතිඥයෙකි. ජෙරී හැරිස්, ජන්මයෙන් ලංසියෙකි- නමින් ඉංග්‍රීසිකාරයෙකි- පෙනුමෙන් සිංහලයෙකි.

ඔහු සමන් ගිරට නිතර යන-එන්නකු බැවින් එහි කවුරුත්, ඈත දී එන මොටෝ රියෙන් ම ඔහු හඳුනන්නාහ. ජයපාල මැතිණියට නම් ඔහු දක්වන නිහතමානී කම හා ගෞරවය, සුළු-පටු නොවේ. ඇය ඉදිරියෙහි ඔහු හැසිරෙන්නේ සාමාන්‍යයෙන් නීතිඥ පදවියට වත් විශේෂ වූ අභිමානයකින් නොව, මෙහෙකරුවකුට සමාන නිහතමාන පුවච වෙසකිනි.

"හැරිස්, මට ඔබ තේරුම් ගත් බැහැ- ඇහුණාද? ඔබ කතා කෙළේ, සිංහලෙන් ද, ඉංගිරිසියෙන් ද?" කියා ජයපාල මැතිණී දිනක් තමන් දකින්නට පැමිණ තොප්පිය ළය ගන්නා ගත් ගමන්, එකත් පසකින් සිටි, මේ නීතිඥයාගෙන් ප්‍රශ්න කළා ය. ජෙරී හැරිස් නිතොරව ම කතා කරන්නේ ඉංගිරිසියෙනි. ඔහු සිංහලෙන් කතා නො කරන්නේ නොවේ. ඔහුගේ සිංහල අව්‍යක්ත බැවින් වැදගත් සාකච්ඡාවක දී ඔහු එය භාවිතයට නො ගනී.

"ඔහොම ඉඳ ගන්න හැරිස්, ඉඳ ගෙන කියන්න තියෙන දෙයක් පැහැදිලි කර කියන්න" ජයපාල මැතිණිය යළිත් කීවා ය.

ජෙරී හැරිස් ඒ වචනයට කීකරු වෙමින් නුදුරු ආසනයක හිඳ ගත්තේ ය. අනතුරුව, කැටයම් කළ රිදී හෙප්පුවකින් දුම්-කුඩු විටක් ගෙන, නාසයෙහි ලා ඇද්දේ ය. ඉන් පසු ලේන්සුවෙන් මුහුණ පිස දමා ගෙන, එ සේ ම උපනෙත ද ඔප ලා ගෙන, ඇසේ ලා ගත්තේ ය.

"ජෝන්හට ඇය පළමුවෙන් ම දකින්නට ලැබී තිබෙන්නේ වේල් පොළේ දී"යි ඔහු නැවත කීයේ ය.

මේ ආදී නොයෙක් කතාවලින් වෙරි මත නගින්නට-නගින්නට තරුණ පිරිසගේ හැසිරීම් අසභ්‍ය වේ- කලහ ශබ්දය ද වැඩි වේ. මෙ තැන් සිට, බොහෝ දෙනා තනිය ම කතාව පටන් ගනිති. සමහරු කතා නැතිව; ඇසිපිය මරමින් හිට ගත්-ගත් වන ම, කණු මෙන් තැන-තැන, පසු වෙති. මේ අතර ජුසේ, "මේවා තමයි, නර ලොව හොල්මන්, නර ලොව හොල්මන්" කිය-කියා ඩිකැංඩර හා වීදුරු බඳුන් අස් කරන්නට පටන් ගනියි.

මෙහි දී ගෘහ මූලිකයා වශයෙන් ප්‍රපු කම් ඉටු කිරීමට ජෝන් නියම සිහියෙන් සිටින්නේ ය.

"ජුසේ, මේ මහත්තැනව ගිහින් දාපන්. ඒ ගොල්ලාගේ කාර්වල. කියාපන්, ඒ ගොල්ලාගේ ඩ්‍රයිවර්ලාට පරිස්සමෙන් ගෙදරවල ගිහින් දමන්නය කියා" මොවුන්ගේ කලහ පෙරළි තවත් ඉවසනු නොහැකි වූ විට, ජෝන් ජයපාල කියන්නේ ය.

"මේවා තමයි, නර ලොව හොල්මන්," කිය-කියා ජුසේ ද එකිනෙකා වත්තම් කර ගෙන ගොස්, සිරිත් ලෙස ඔවුන්ගේ කාර්වල දමා, යන්නට පිටත් කර හරින්නේ ය.

මේ තනිකඩ සමාජයේ, මෙ බඳු නොයෙක් අභිනයයන් යටත් පිරිසෙයින් සතියකට දෙවරක් වත්, සමන්ගිරේ දකින්නට ලැබේ. මේ බේබද්ද මිත්‍රයින්ගෙන් සමහරකුට ජෝන් ඉතා ම කැමැති ය. ඔවුන් මගින් ඔහුට අශ්ව රේස් සම්බන්ධයෙන් ඉතා වැදගත් ගුරුකම් හා දන මුතු කම් නිතර ලැබේ. එසේ ම තවත් සමහරු ඔහුට ජන සමාජයේ ස්වකීය ප්‍රසිද්ධිය ඇති කිරීමට උපකාර වෙති. ජෝන් ජයපාල ලොකු උගතෙක් වත්, මහ වියතෙක් වත්, නොවේ. ජයපාලවරුන් සතු එඩිතර කම හා සහජ බුද්ධියක් ඔහු කෙරේ ද නො මදව පවතී. ඒ හැර, විශේෂයක් වශයෙන් ඔහුට ඇත්තේ ධනය පමණකි. අන් කිසිවක් නැති වත්, ප්‍රභූත්වයට හැම කල්හිම ධනය මහ පෙන්වන්නකු බැවින් ඉතා ම පහසුවෙන් ඔහු රට ප්‍රකට කිරීමට මේ රීතියා මිත්‍රයන්ට කිසි දා අපහසුවක් නොවී ය.



පුත්‍රයාගේ අනාගත ජීවිතය සම්බන්ධයෙන් ජයපාල මැතිණිය ඇති කරන අදහස් ඉතා උසස් ය. ඔහුට කුල පරම්පරාවෙන් අඩු පාඩුවක් නැත-ධනයෙන් අඩු-පාඩුවක් නැත- උගත් කමෙන් ද අඩු-පාඩුවක් නැතැයි ඇය සිතන හෙයින්, මහා ජන බලයෙන් වුවත්, ඉතා ම උසස් අඩියකට පත් වන්නට ඔහුට බැරි කමක් නැති. ලූවී ජයපාල තව කලක් ජීවත් ව සිටියා නම් පුත්‍රයා හික්මවා ගැනීමට ඔහු ලොකු ආධාරයක් වන්නේ ය. ඔහුගේ අකාල මරණය ඇයට මහත් පාඩුවකි. එ සේ ද වුව, ඇ ධෛර්ය-සම්පන්නව නොයෙක් වැඩි-හිටි මහතුන්ගෙන් හා කුලපතියන්ගෙන් නොයෙක් ගුණ දහමුතු කම් ලැබ ගෙන, ස්වකීය ආත්ම බලයෙන් ම ජයපාල බූදලය රැකීමත්, ඊටත් වැඩි අසීරු කාරණයක් වූ ජයපාල ආධුනිකයා රැකීමත්, හිස පිටට ගත්තා ය.

ඇඩා ජයපාල, ආරම්භයෙහි පටන් ම, එ නම් ලූවී ජයපාලට විවාහ වූ තැන් පටන් ම, රෝස උපනෙත් ඇස ලා ගෙන, අනාගතය දෙස බැලූ කාන්තාවකි. ඇයට ආවාහ වන කාලයෙහි ලූවී ජයපාල සිවිල් නිලධාරියෙකි. ක්‍රමයෙන් ඔහු රාජ කාර්යයෙහි, නිලයෙන්-නිලය උසස් බවට පත් වනු දකීම ඇයගේ අසහාය සන්තෝෂය විය. ස්වාමිපුරුෂයකුගේ දියුණුවකට නොහොත් උසස් වීමකට භාර්යාවකගෙන් යම් කිසි ප්‍රමාණයක පිහිටක් වුවමනා වී නම්, ඒ සියල්ල කිසිදු අඩු-පාඩුවක් නැතිව, ඇඩා ජයපාල විසින් පරිත්‍යාග කරන ලදී. ස්වදේශිකයකු විසින් මෙතෙක් රාජකාර්යයෙන් නොලත් උසස් තනතුරු පවා, යථා කාලයෙහි තම ස්වාමියාට පිරිනැමෙනු දකින්නට ද, ඇ පුලපුලා සිටියා පමණක් නොව, රාජකාර්යයෙන් විශ්‍රාම ලැබූ කෙණෙහි ඔහු මහා ජන සේවක කටයුතුවලට ද බඳවා, දෙ වැනි ජීවිතයක් ආරම්භ කැරවීමට ද, ඇ සිතා ගෙන සිටියා ය.

"ඔව් මේ කාලේ, මහ ජන සේවකයකු වීම තමා ඔක්කෝට ම වැඩි ගෞරවය- ඇහුණා ද? දැන් ම හිට, මහා ජන ප්‍රසාදය දිනා ගන්නා බලාපොරොත්තුවෙන් වැඩ කරන්න ඕනෑ" මේ ආදී වචන ස්වාමියා ධෛර්ය ගන්වමින් ඇ නොයෙක් විට කීවා ය.

කල් ජීවත් වන්නට ලැබුණා නම්, ලූවී ජයපාල තිසැකයෙන් ම භාග්‍යවතියකගේ භාර්යාවගේ මනෝරථය මුදුන් පමුණුවන්නේ ය. අභාග්‍යයකැ හැටි! අකාල මරණයකින් ඔහුගේ අගනා ජීවිතය, තිසි ඵල ලබන්නට පළමු, රෑ දුටු සීනය මෙන් අභාව ප්‍රාප්ත විය. සැමියාගේ මරණය ඇඩාට ඉවසිය නො හැකි දුකක් විය. ඇයගේ සියලු බලාපොරොත්තු එයින් ම අවසන් විය යුතුය යි, කවුරුත් කල්පනා කළහ. එහෙත්, ඒ එ සේ නො වීය. එ කල, පසලොස් වියෙහි සිටි, මේ එක ම පුත්‍රයාගේ මාර්ගයෙන් යථොක්ත මනෝරථයන් මුදුන් පැමිණ වීමට ඇ කල්පනා කළා ය. එ සේ කල්පනා කොට, ඒ වෙනුවෙන් මුළු කාලය යොදන්නට පටන් ගත්තා ය.

ජයපාල මැතිණී ඉතා හොඳ මවකි. දෙ වැනි කසාදයකින් තමා බැඳ ගන්නට බොහෝ දෙන කල්පනා කළ නමුත් ඒ කිසිවකටත් නොකැමැතිව, පුත්‍රයාගේ මතු ජීවිතය සිය ජීවිතය මෙන් සලකා, පුත්‍රයා ඓශ්වර්ය සම්පන්න කොට, එයින් සතුටු වන්නට පරිශ්‍රම දැරීම ඇයගේ පරමාර්ථය විය.

රාජ කාර්යයෙහි නියුක්තව, රජුන් සිත් ගන්නුවාට වඩා, මහජන සේවාවෙහි නියුක්තව, මහා ජනයා සිත් ගැනීම යෙහෙකැයි සිතන ලද හෙයින් පියාගේ මරණය මුල් කොට, ඇති වූ පස් අවුරුද්ද තුළ, හෙවත් මේ වන තෙක්, අන් කිසි රාජ කාර්යයක් අපේක්ෂා නො කොට, කල්‍යාණ මිත්‍රයන් මෙන් ම පාප මිත්‍රයන් ද එක සේ භජනය කරමින් පර්යුපාසනය කරමින් ජෝන්, දේශපාලන ක්‍රමයන් පිළිබඳ ප්‍රතිසංස්කරණයන්හි ද උද්‍යෝගවත් විය. ජෝන්ගේ ක්‍රියා පරිපාටියෙහි දුර්වල ස්ථාන එමට දක්නා ලැබේ. නව යෞවන සමය ය එ බඳු දුබල කම් ඇති විය යුතු වයසකි. එ හෙයින් ජයපාල මැතිණී ඒ සියල්ල මැදහත් සිතින් ඉවසුවා ය.

ජෝන්ගේ රළු-පරළු විසම් ගුණ මැඩ පවත්වමින්, ඔහු පවිත්‍ර චාරිත්‍රවත් අළාමක තරුණයකු කිරීම පිණිස ජයපාල මැතිණී හිතවත් තලතුනා මහතුන් කිහිප දෙනකුගේ ම උපකාර සෙවුවා ය. එ සේ ම පුත්‍රයා හිතු මතයෙන් කරන-කියන වැඩ ගැන නිතර සෝදිසියෙන් සිටින්නටත් ඔහු සීමාව ඉක්ම වන තැනක් වෙතොත්,



එය ගැන වහා තමනට දැනුම් දීමටත්, ඈ කිසියම් පුද්ගලයකු ද පත් කළා ය. මේ මුර සෙබළ කමට පත් තැනැත්තේ වූ කලී ජයපාල බූදලයේ ගනු-දෙනු සම්බන්ධයෙන් සියලු කටයුතු කරන මැදි වියෙහි සිටි ජෙරී හැරිස් නමැති නීතිඥයෙකි. ජෙරී හැරිස්, ජන්මයෙන් ලංසියෙකි- නමින් ඉංග්‍රීසිකාරයෙකි- පෙනුමෙන් සිංහලයෙකි.

ඔහු සමන් ගිරට නිතර යන-එන්නකු බැවින් එහි කවුරුත්, ඈත දී එන මෝටෝ රියෙන් ම ඔහු හඳුනන්නාහ. ජයපාල මැතිණියට නම් ඔහු දක්වන නිහතමානි කම හා ගෞරවය, සුළු-පටු නොවේ. ඇය ඉදිරියෙහි ඔහු හැසිරෙන්නේ සාමාන්‍යයෙන් නීතිඥ පදවියට වත් විශේෂ වූ අභිමානයකින් නොව, මෙහෙකරුවකුට සමාන නිහතමාන සුවච වෙසකිනි.

"හැරිස්, මට ඔබ තේරුම් ගන් බැහැ- ඇහුණාද? ඔබ කතා කෙළේ, සිංහලෙන් ද, ඉංගිරිසියෙන් ද?" කියා ජයපාල මැතිණී දිනක් තමන් දකින්නට පැමිණ තොප්පිය ළය ගන්නා ගත් ගමන්, එකත් පසකින් සිටි, මේ නීතිඥයාගෙන් ප්‍රශ්න කළා ය. ජෙරී හැරිස් නිතොරව ම කතා කරන්නේ ඉංගිරිසියෙනි. ඔහු සිංහලෙන් කතා නො කරන්නේ නොවේ. ඔහුගේ සිංහල අව්‍යක්ත බැවින් වැදගත් සාකච්ඡාවක දී ඔහු එය භාවිතයට නො ගනී.

"ඔහොම ඉඳ ගන්න හැරිස්, ඉඳ ගෙන කියන්න තියෙන දෙයක් පැහැදිලි කර කියන්න" ජයපාල මැතිණිය යළිත් කීවා ය.

ජෙරී හැරිස් ඒ වචනයට කීකරු වෙමින් නුදුරු ආසනයක හිඳ ගත්තේ ය. අනතුරුව, කැටයම් කළ රිදී හෙප්පුවකින් දුම්-කුඩු විටක් ගෙන, නාසයෙහි ලා ඇද්දේ ය. ඉන් පසු ලේන්සුවෙන් මුහුණ පිස දමා ගෙන, එ සේ ම උපනෙත ද ඔප ලා ගෙන, ඇසේ ලා ගත්තේ ය.

"ජෝන්හට ඇය පළමුවෙන් ම දකින්නට ලැබී තිබෙන්නේ වෙල් පොළේ දී"යි ඔහු නැවත කීයේ ය.

"ඉතින්!"

"ඉතින් තව පොඩ්ඩෙන් වෙන්දේසියක් වරදින්න තිබුණා- පිස්තල් වෙන්දේසියක් වුණා ම ඒක වෙලාවට කෙරෙන්න එපා යැ? අපට මේ ඉස්පාසු නැතුව, වෙලාවට එ තැන වෙන්දේසිය පටන් ගන්න දුවනවා- එයා මේ ඕනෑ නැති වැඩවලට අතර මග කාර්රෙක නතර කරනවා." යයි ඔහු නැවත කීයේ ය.

ජයපාල මැතිණිය කිසි කතාවක් නැතිව, එහෙත් නො සතුටු ලීලාවෙන් බලා සිටින අතර, නීතිඥ තෙමේ කාරණය තවත් විස්තර කරන්නට පටන් ගත්තේ ය.

"අපට පැය බාගයකට වඩා තිබුණේ නැහැ. වෙලාව. වෙන්දේසි කාරයාත් ගියේ, අප එක්කම යි. අප ගමන් කලේ, පුළුවන් තරම් ඉක්මනින්. හරියට අරණායක තඩ මංඩිය ළඟ දී, මිනිහා මහ කලබලයකින් කාර් එක නැවැත්තුවා. අපට හිතුණේ අදිසියක් එන ද කියායි. බලන කොට මොන අදිසියක් ද? මේ පාර අයිනේ හිටි කෙල්ලක එක්ක, මේ පටන් ගත්තේ එයා කතාව -"

"ඉතින්, ඇයි ඔහු එ තැන දමා, ජෙරී යන පාඩුවේ නො ගියේ?" මෙහි දී ජයපාල මැතිණී තරහයෙන් ප්‍රශ්න කළා ය.

"මට එය කරන්න හිතුණා- එ වෙලාවේ හැටියට ඒක කළා නම් ඔහු ඊට සතුටු වෙනවා. ඒ තරම් ඒ කෙල්ල නිසා ඔහු උමතු වෙලායි හිටියේ." නීතිඥයා කීයේ ය.

"මට පෙනෙන්නේ හැරිස්, ඔබට ජෝන් අඩංගු නැති බවයි. ඇහුණා ද?"යි ඈ මද වෙලාවකට පසු කීවා ය.

"මට කියා ඔහු කාටවත් අඩංගු නැහැ. ඒ වෙලාවේ, ඔහු කාටවත් අඩංගු මිනිහකු වගේ නො වෙයි හැසුරුණේ. ඔහු කියන හැටියට නම්, එ දා වේල් පොළේ දී ඔහු කෙරෙන් ඇය පැනලා ගිහින් තියෙන බවයි සලකා ගන්න තියෙන්නේ. දුර තියා ම ඇය දක්ක හැටියේ, මිනිසාට ඉස්පාසු නැතිව ගියේ, ඒ නිසා යි." ඔහු යළිත් කීයේ ය.



ජයපාල මැතිණියගේ සියලඟ සිසිල් විය. පුත්‍රයා සම්බන්ධයෙන් නිරන්තරයෙන් ම ඇය කෙරේ පැවති මේ ශංකාවත්, භීතියත්, දැන් යථාර්ථවත් වන්නා සේ පෙනේ. මේ අතින් වංශ විශුද්ධිය රකින පරිශ්‍රමයක් යම්තම් වත් ජෝන් වෙත ඇති බවක් ඇයට නම් නො පෙනේ. ප්‍රතිමාව නෙළුණේ කදුරු කොටයෙන් ද, නොහොත් සඳුන් හරයෙන් ද, යන්න ඔහු නො විමස යි. ඔහු බලන්නේ, රූප ශෝභාව පමණකි. රූප ශොභාව සිත්කලු නම් ප්‍රතිමාව බැඳුණේ, මැටියෙන් වුවත් ඔහු සාදරයෙන් වැළඳ ගන්නේ ය. එ හෙයින් මේ ප්‍රවෘත්තිය කරණ කොට ඇය තුළ හට ගත් සංවේග සම්පිණ්ඩන යෙන් ම, කතාකර ගත නො හැකිව මෙන් සිටියා ය.

"ඈ ලස්සන ද?" කියා ටික වේලාවකට පසු ඈ ප්‍රශ්න කළා ය.

"ඉතා ම ලස්සණයි" යනු නීතිඥයාගේ ක්ෂණික පිළිතුර විය.

"එහෙත් ඒ ගැන ඔහුට මතක නැති වේවි- ඇහුණා ද හැරිස්? ඔබට හිතෙන්නේ නැද්ද, ඒ ගැන ඔහුට මතක නැති වේවි කියා?" ඈ යළිත් ප්‍රශ්න කළා ය.

ජෙරී හැරිස් තවත් දුම්-කුඩු ටිටස් ගෙන නාසයෙහි ලා ඇද්දේ ය.

"එහෙ ම හිතන්න පුළුවන් නම් මාත් බොහෝ ම කැමැති යි. දෙයියන්ගෙන් අප ඉල්ලන්නත් ඕනෑ ඒක එහෙ ම වෙන්නය කියා තමයි." ඔහු දෙනෙත් බමවා, හිස එහෙ-මෙහෙ කොට, නැවතත් මෙ සේ කීයේ ය. "එන ගමනේ දී ඔහු මොන ගම් පෙරළියක් ද, එ තැනින් බහින්න. මේ වත්තක් ගත්තා. ඒ ගත්ත වත්ත බලන්න වත් ඔහුට ඕනෑ කෙළේ නැහැ. තඩ මංඩියට ඇවිත්, ඒ කෙල්ල සොයන්න යි ඔහුට ඉස් පාසු නැති වුණේ. බොහො ම පෙරැත්තයෙන් මා මිනිහාව කොළඹ ගෙනා වේ."

"ඇහුණා ද හැරිස්? කොයි එකටත් මිනිහා ගැන ටිකක් සැලකිල්ලෙන් ඉන්න ඕනෑ"යි ජයපාල මැතිණී අනුදන්වමින් පවසා, නැවත වත්ත වෙන්දේසි කිරීම ගැන කරුණු ප්‍රශ්න කළා ය.

මෙහි දී නීතිඥයා ලොකු මිටියකින් ලියවිලි වගයක් තෝරා අතට ගත්තේ ය.

"දැන් ඔන්න, ඉඩමේ වැඩ ඔක්කොම හරි. ලබන සුමානේ ඕනෑ ම දවසක බුක්තිය ලබා ගන්න යන්න පුළුවනි"යි. ඔහු ඒ ලියවිලි ජයපාල මැතිණිය අතට දෙමින් කීයේ ය.

"එ දා මොක ද, වෙන්දේසියට, පිටින් නැද්ද කිසිවකු ආවේ?"

"නැහැ"

"එහෙ නම් සල්ලි. ඒ තරම් රටේ අමාරුයි. ඒ හැරිස්"

"ඒ නිසා තමයි- මේ උගසට විතරක් යට වී විකුණුණේ"

ජයපාල මැතිණී වත්ත සම්බන්ධයෙන් තවත් දිගින්-දිගට කතා කරමින්, තමන් මුල් මුදලට තරමක පාඩුවක් නමුත් වෙන්නට හැර, සෑහෙන ගණනකට වත්ත පිට කිසිවකුට විකුණා දැමීමට ඇති කැමැත්ත ප්‍රකාශ කළා ය. නීතිඥයා ද වත්තේ අඩය වර්ණනා කරමින් ඒ වෙනුවෙන් විසඳු ධනයට කිසි හානියක් නො වන බව කීයේ ය. එම රබර් අක්කර දාහ දැනට වුවත් නිසි සේ පාලනය කෙරේ නම්, එම ණයකාරයට දුන් මුදලට පොළිය පමණක් නොව වැඩි මනත් ප්‍රයෝජනයක් වුවත් ලබන්නට හැකි බව ඔහු පෙන්වා දුන්නේ ය. නීතිඥයා ඉලක්කම්වලින් සියල්ල විස්තර කොට දක්වන බැවින්, ඔහු පිළිගත යුතු බව ඇත්තකි. එ සේ ද වුව, රටේ වලංගු මුදලින් ම ස්වකීය ධනවත් භාවය රකින්නට කල්පනා කිරීම ජයපාල මැතිණියගේ විශේෂ පරිශ්‍රමයකි. වතුපිටිවලින් පවතින පොහොසත්කම රකින්නට තවත් බොහෝ සේවකයන්ගේ ද පිහිට වුවමනා කෙරේ. වැන්දඹු ඇයට වතු පිටි පාලනය දුෂ්කර ය.



"ඇහුණා ද හැරිස්? මුදලින් තිබෙන තම් මට පුළුවනි ඕනෑ ම තරම් විශාල මුදලයක් රකින්න. ඒක පොළී කරලා මං ඕනෑ තරම් දියුණු කරන්නං, ඇහුණා ද? ඉතින් මේ ණයට දුන්-දුන් මුදල් වතු-පිටි වෙන්න වුණොත්, පොල් වතු-රබර් වතු- තේ වතු කාට ද මේවා බලා කියා ගන්න පල-පුරුද්ද ඇත්තේ? මට කවුද ඉන්නේ මේවා බලන්න කියන්න? ඔය ළමයකු ඉන්නවා එයාට පුළුවන ඕවා බලා කියා ගන්න?" ඇ අසුවා ය.

"එහෙත් එයා හැම දා ම, ඔහො ම කිරි-කැවි ළදරු කමට තියා ගෙන ඉන්න හොඳ නැහැ. ඕවා තමයි මුදල් ඇති පොහොසත් තරුණයන් ඉගන ගත-යුතු වැඩ" කියා පෙරී හැරිස්, තවත් දුම්-කුඩු විටක් ඇද "දැන් වත්තේ බුක්තිය බාර ගැනීමට ලබන සුමානෙ ඔහු එක්ක තමා යන්න ඕනෑ."යි කීවේ ය.

ජයපාල මැතිණී ඇත-මෑත බලා දිග සුසුමක් හෙළුවා ය. "ජයපාල පෙළෙ ඉතිහාසය ලිව්වොත් ලොකු පොතක් වෙයි. හැරිස්"යි ඇ කීවා ය.

නීතිඥ හැරිස්, කණ්ණාඩි තම ඇසින් ගළවා අතට ගත්තේ ය.ජයපාල මැතිණිය සිය කුල ගොත වනන්නට පටන් ගත් කල, ලෙහෙසියෙන නො නවතින බවත්, නැවත අන් කිසි වැඩකට අවසරයක් නො ලැබෙන බවත් ඔහු දන්නේ ය. එ සේ හෙයින්, ඔහු කෙසේ නමුත් කතාව පළමු මඟ ම ගෙන යනු කැමැතිව "මං මිනිහා ගැන සැලකිල්ලෙන් හිටින්නං. වැඩි කලබල ඇති වෙන එකක් නැහැ. එ හෙම වෙන්න ආවොත් ඒ ගැන දන්වන්න පිළිවෙලක් යොදන්නං"යි කීයේ ය.

"ජයපාල පෙළ බොහො ම ඉහළ පෙළක් හැරිස්. ඇහුණා ද? ඒකේ මෝඩයන් උපදින්න බැහැ. මෝඩ දරුවකු ඇති වීම, ඇහුණා ද? අපේ සිංහල පොත්වල කියා තිබෙන හැටියට අන්තිම දුකක් හැරිස්- අන්තිම දුකක්-"යි කියා ඇ පුටුව පිට වරින්-වර හරි ගැහෙමින් "ඔය ඉතින් ජයපාල පෙළට අන්තිමට පහළ වෙලා ඉන්න එක්කෙනා තමා යි, ඇහුණා ද? හැරිස්. ඉතින්

එයාගේ හැටි ඔහොම නම් ගැනු මම මොනවා කරම් දැයි" ඈ ඇසුවා ය.

ඇයගේ දුඃඛිත භාවය දුටු නීතිඥ තෙමේ ඇය සැනසීම තම යුතු කම සේ සැලකුවේ ය. උප නෙත් යුවළ ඔහු යළිත් මුහුණේ පිහිටුවා ගෙන, ඊට සැරසුණේ ය.

"මිසිස් ජයපාල! පුතා ගැන ඔය තරම් ඉක්මනට කල කිරෙන එක නුවණට හුරු නැහැ. තරුණ වයසේ හැටි ඔහො ම තමා- තරුණ වයසේ දී මෝඩ කම් කරන එක ස්වභාවයක්- මෝඩ කමක් දෙකක් කෙරුණාට පස්සේ තමයි, කාටත් නුවණ පහළ වෙන්නේ- ඒ නිසා ඕවා ගැන ඔය තරම් සිතට දුක් ගන්න ඕනෑ නැහැ"යි කීයේ ය.

එතකොට ම වාගේ පුරුදු සැහැල්ලු ගමනින් ජෝන් ජයපාල එ තැනට පැමිණියේ ය. සවස් කාලය බැවින් ඔහු පිජාමා ඇඳුම් කුට්ටමකින් සැරසී සිටියේය. මෙහි පවතින කතාව තමා ගැන බව ඔහුට දැන ගත නො හැකි යි. එහෙත් ජයපාල මැතිණිය අතේ තුබුණ ලියවිලි දුටු කෙණෙහි සාකච්ඡාව වත්ත ගැන විය යුතු බව ඔහු දැන ගත්තේ ය.

"හා! ජෙරී කොහොම ද? ඒ ගොල්ලා වත්තේ බුක්තිය දුන්නා දැයි?" එ හෙයින් ඔහු පුරුදු සැහැල්ලු සිතින් ම ප්‍රශ්න කළේ ය.

"තව ම දුන්නේ නැහැ. කඩුද ගන්න යන්න ඉන්නේ. එන සුමානේ ඕනෑ දවසක ගියා ම ගත්තැකි"යි නීතිඥයා කීයේ ය.

මෙහිදී ජෝන් මැණියන් දෙස සිනා මුසු මුහුණෙන් බැලුවේ ය.

"අම්මේ එහෙ නම් මන් ලබන සුමානේ ගිහින් වත්ත බාර ගන්නම්"යි යෝජනා කළේ ය.

ඈ නො දුටු ලීලාවෙන් අහක බලා ගත්තා ය. එය ඔහුගේ දොම්නසට හේතු විය. එයින් ම ඔහු මුහුණේ සිනාව ද අතුරුදන් විය. මැණියන්ගේ මේ අදිසි නො සතුටට කාරණය ඔහුට සලකා



ගත නො හැකි යි. එ සේ ද වුව, ඔහු නීතිඥයා දෙස රවා බැලුවේ ය.

"ඔබ තමා, වග කුමාරයා- පරිස්සම් වෙන්න ජෙරී කියා ඔහු ආපසු යන්නට හැරුණේ ය.

"ජෝන්" කියා ජයපාල මැතිණී තර්ජන ස්වරූපයෙන ආමන්ත්‍රණය කළා. ය.

"ඇයි?" කියමින් ඔහු හිස කරකවා, මැණියන් දෙස බැලුවේ ය.

"මේ මෝඩ කම් කර ලා හැදෙන්න කාලයක් නො වෙයි- ඇහුණා ද ජෝන්? හැදුණු මිනිසුන්ගෙන් ගුරු කම් අරන් හැදෙන්න කාලයක්- ඒ බව දැන ගන්න"යයි ඈ කීවා ය.

ඔහු පිටි අත මහ පටැහිල්ලෙන් නීතිඥයා දක්වා "මේ ජෙරීට දුම් කුඩු උරන්නේ නැතුව ඉන්න බැරුවා වාගේ තමා යි. සේලම් කියන්නේත් නැතුව ඉන්න බැරී"යි පවසා නැවතත් නීතිඥයා දෙස බැම හකුළා බලා, "ඔය හැටි මෝඩ කම් කරන්න මා පුංචි බබෙක් නො වෙයි- අම්මේ, මට ලෝකේ හොඳ-නරක තේරෙනවා"යි කියමින් යන්නට ගියේ ය.

ඔහු ශ්‍රවණ පථයෙන් ඈත් වූ කෙණෙහි ජයපාල මැතිණී, නීතිඥයාගෙන් මෙසේ ප්‍රශ්න කළා ය.

"ඔහු ඒ කතා කෙළේ, හොඳ සිහියෙන්- නො වේ ද හැරිස්?"

"ඔව්, ඔව්, හොඳ සිහියෙන්- අමද්‍යප සේවකයන්ගේ සිහිය කවදාවත් නැ නොවැ. නරක් වෙන්නේ"යි ඔහු ද හෙමින් පවසා, යන්නට නැගී සිටියේ ය.

# 4

ගලපිටකන්ද, අරණායක පලාතේ විශාල රබර් වත්තකි. මුලින් ද ඒ ලක්දිව පළමු වන පෙළේ පොහොසත් පවුලකට අයිති විය. ගලපිටකන්ද එම අයිති කාරයන්හට කිසි පාඩුවක් කළ වත්තක් නොවේ- එහි වටිනා කම දෙ තුන් ගුණයෙන් ලබා දුන් වත්තකි. ආදායම් ලබා දුන් වැඩි කම් නිසා, එහි අයිති කාරයෝ අතෘප්තිකර ලොභයෙන් එය උකස් කොට, තව-තවත් වතු මිලයට ගෙන, ඒ ගත්-ගත් දෙය, නැවත-නැවත උකස් කරමින් වඩ-වඩා රබර් ම වගා කළා හ. මේ එක සිංහල ධනවතකු නොව, වැවිලිකරු හැම සිංහලයකු විසින් ම කළ වරදකි. රබර් මිල පහත බැසීම හා සමග ඇති වූ වෙළෙඳ පරිහානිය කරණකොට මේ මෝඩ කමේ අනිෂ්ට විපාක භයානක අන්දමට පෙනෙන්නට පටන් ගැනිණි. වතුවල නඩත්තුවට වත් සෑහෙන පමණ ආදායම් වතුවලින් නො ලැබුණු හෙයින් එම වතු උකස් කළ මුදලට පොළී ගෙවීම අසීරු විය. එහෙයින් බොහෝ වතු ණය හිමියන්ගේ නියමයෙන් වෙන්දේසියේ විකුණන ලදි. ගලපිටකන්දට ද වුණේ, මේ විපතය.

පළමු අයිති කාරයෝ ගලපිටන්ද උකස් කොට, ජයපාල බුදලයෙන් මුදලක් ගත්හ. මුදල ගන්නා කාලයේ මුදලේ පොළියත් ගෙවා, වත්තටත් වියදම් කොට, සෑහෙන යමක් ලාභ වශයෙන් ද, ඉතුරු කර ගැනීමට තරම් ආදායමක් එයින් ලැබිණි. රබර් මිල පහල යන කල, ආදායම් කොතරම් හීන වී ද යත්, ලාභයක් ලබනු තබා- පොළිය ගෙවනු තබා- එයින් වත්තේ නඩත්තුව විතර වත් කර ගත නොහැකි විය. ණය මුදල ගෙවා යමක් ඉතුරු කර ගැනීමට සුදුසු මිලයකට වත් වත්ත විකුණා ගත නො හැකි



වූ හෙයින් ණය හිමියන්ට සතුටක් කර ගැනීමට හැර, අයිති කාරයෝ තර බා ගත්හ.

මේ වෙළෙඳ පරිහානියෙන් වැඩි කරදරයක් නොලත් ටික දෙනා අතුරෙන් ජයපාල මැතිණී ප්‍රධාන වන්නී ය. ජයපාල බුදලයේ අගය මුදලින් ම තබා ගැනීම පෙර සිට පැවති සිරිතකි. ජයපාලවරු වතු-පිටි හා ගම්-බිම් කෙරේ විශ්වාසය නො තැබූ හ- එහෙත් ගම්-බිම් හා ඇපයට ගෙන, මුදල් පොළියට දීම තරමක් දුරට කළහ. ණයට දුන් මුදල ආපසු ගැනීම විනා, ඒ වෙනුවෙන් කළ ඇපය අත්පත් කර ගැනීම ජයපාල පරම්පරාවේ සිරිත නො වී ය. එහෙත් මේ වෙළෙඳ පරිහානියේ දී ඒ සිරිත කඩ විය. ඇපයට ගත් වතු-පිටි කිහිපයක් ණය මුදලේ වටිනා කමට වත් නො තරම් වූ බැවින් තමන් නො කැමති වත් ඒ හැම ඔවුන් සතු විය. මෙ සේ ඔවුන් සතු වූ ඉඩම්-කඩම් වලින් ගලපිටකන්ද ද එකකි.

ගලපිටකන්ද වෙන්දේසියේ විකිණෙන බව පිස්කල් නියමයෙන් ප්‍රකාශ වූ නමුත් රටේ මුදල් හිඟ කම් නිසා වෙන්දේසියට කිසිවකු නො පැමිණි බැවින් වත්තේ මුළු අයිතිය ණයකරයේ මුදලට ම ජයපාල බුදලය වෙත පැවැරිණි.

එදා තරුණ ජෝන් ජයපාලට අරණායක දී මාලිනිය, දකින්නට ලැබුණේ ද, මේ වෙන්දේසිය සම්බන්ධයෙන් ගිය ගමනේ දී ය. මේ වෙන්දේසිය මෙ සේ නො කෙරෙන්නට- ජෝන් ජයපාල ඒ වෙනුවෙන් මේ පිටිසර ගමක නො යන්නට - එ සේ ගොස් නැවත මාලිනිය නො දකින්නට- මේ කථා ශරීරය මෙන් ම මාලිනියගේ චරිතාපදානය ද ඉඳුරා ම වෙනස් වන්නේ ය. වේල් පොළේ අතුරුදන් වූ තරුණිය නැවත මේ ජීවිතයේ දී තමාට දකින්නට ලැබෙතැයි ජෝන් කිසි විටකත් නො සිතුවේ ය. එ සේ වුව, ඔහුට ඇය පිළිබඳ මතක කුමන විදියකින් වත් යට පත් කළ නො හැකි විය. මාලිනිය මෙන් ජෝන් ද හුදකලාව සෝක තැවිලිය කෙළේ නො වේ. ඔහු මෙ සේ අදිසියේ දකුම් ලත් මේ කැලැ හඳ ගැන ප්‍රවෘත්තිය එ දා, එ කෙණෙහි ම තම යහළුවන්හට ද කීයේ ය. ඔහු එ දා වේල් පොළට ගියේ ද යහළුවන් දෙ තුන්

දෙනකු සමඟ ය. තමාට එදා කැලෑ හඳ දකින්නට ලැබුණු වේලේහි, භාග්‍යයට හෝ අභාග්‍යයට මෙන් ඒ එහා යහළුවකු ද සමීපයෙහි නො සිටි නමුත් එම සඳ අදෘශයට පත් කෙණෙහි සඳ ලකුණු පවසා, යහළුවන් ද උදව් කොට ගෙන, ඔහු අතුරක් නැතිව වේල් පොළ සැම තැන ම සෙවුවේ ය. ඇයගේ අසදෘශ රූපය ගැන මුව නො සෑහෙන පරිද්දෙන් කරනලද වර්ණනය නිසා, අන් කිසිවක් ගැන කෙ සේ වුවත්, දර්ශන සම්පත්ති ලාභය ගැන වත් සලකා මේ මිත්‍රයෝ ද ඉතා ම ඕනෑ කමින් ඇය ගැන විපරම් කළහ. පරිශ්‍රමය නිෂ්ඵල වූ කල ජෝන් සිය ළාමක කම ගැන තමාට ම දෝෂාරෝපණය කර ගත්තේ ය. බොළඳ තරුණියකගේ බසට රැවටී, නාකියකු සොයා ගිය අනුවණ කම ගැන මිත්‍රයෝ ද ඔහුට සිනාසුණා හ.

"මා ඇයට රැවටුණා නො වෙයි. මා ඇයට කීකරු වුණා පමණ යි. ඇය දුටු කිසි කෙනකුට ඇයට අකීකරු වෙන්නට බැහැ. කිසිවකුට ඇය සරදමට ගන්නට හිතෙන්නේ නැහැ. ඇත්ත කියන්න ඕනෑ-දුටු හැටියේ මගේ සිත නම් ඇය වෙත බැඳුණේ, බලවත් ප්‍රේමය කිනුයි. ඇයට හිංසාවක් කරන්නටවත්, පීඩාවක්, නැත්නම් අපරාධයක් කරන්නට වත්, මට තබා ඇය දකින අන් කිසිවකුට වත් හිතෙන්නේ නැහැ. මේ මා ඇය සොයන්නේ, ප්‍රේමයෙනුයි- නො මනා අදහසකින් නොවෙයි. මට ඇය හමු උණා නම් තුබුණි ඒ බව කාහටත් පෙන්වන්න." මෙ සේ ජෝන් එ දින සවස පමණක් නොව, පසු වත් නොයෙක් විට, ඇය පිළිබඳව තමා තුළ හට ගත් මේ අවංක හැඟීම ගැන මිත්‍රයනට නොවළහා කීයේය.

මෙ සේ සොවින් පසු වෙන අතර, නැවත ඔහුට අහම්බයෙන් ඇය දකින්නට ලැබීම සුබ ලකුණක් වශයෙන් ගැනිණි. එ දා ඔහුට ලැබුණේ, ඇය සමග සුව සේ පිළිසඳර කතා කිරීමට සුදුසු ප්‍රසාතාවයක් නො වේ. කිසි හිරියක් හෝ වකිතයක් හෝ නැතිව, අතර මග උදක් මොටෝ රිය නතර කොට, ඔහු එ දා මේ පිටිසර කෙල්ල හා කතාව පටන් ගත් සැටි නීතිඥ ජෙරී හැරිස්ට මෙන් ම ඔවුන් කැටුව ගිය වෙන්දේසි කාරයාටත් මහ විහිළුවක් විය.



"ඇය රූමත් කෙල්ලක බව නම් ඇත්ත යි. ඒත් මෙහෙ ම යන වැදගත් ගමනක් නතර කර ලා කතා කරන්න තරම් එකියක කියා අපට නම් පේනේ නැහැ. ඒ වේලේ වෙන්දේසි කාරයා පවා කීයේ ය.

ජෝන් ඔවුනට වේල් පොළේ ප්‍රවෘත්තිය විස්තර කළේ ය. නීතිඥ හැරිස් ද කාරණය ඉතා සුළු කොට සලකමින් වත්තට යන තෙක් ම විහිළු කළේ ය. එහෙත් කාරණය සුළු කොට තැකිය යුතු නොවන බව තත්ත්වාකාරයෙන් ඔහුට ප්‍රත්‍යක්ෂ වුණේ, ආපසු කොළඹ එන ගමනේ දී ය- නොහොත් අරණායක දී ජෝන් මග නතර වෙන්නට උත්සාහ කළ තන්හි දී ය.

"බෑ ජෙරී මේ ගමන් ම මට ඇය ගැන තොරතුරු විමසා ගන්න ඕනෑ. මේ තියෙන්නේ. ඇය ඒ කිවු සංගිලි පාලම යි. ඔබ ඔහො ම, කෙලින් ම කොළඹ යන්න- තානායමක නවාතැන් ගෙන, මං හෙට පිටත්ව එනකං"යි ඔහු එ වේලේ කීයේ ය.

එ හෙත්, මෙ සේ හිතු මතයෙන් හැසිරෙන්නට ඔහුට ඒ දා නීතිඥයා ඉඩ නුදුන්නේ ය. නීතිඥයා දෙ තුන් විටක ම දුම්-කුඩු උරා, මොලය පහදා ගෙන, ඊට විරුද්ධ විය.

"ජෝන්, අප මේ ගමන ආවේ, වත්තක් ගන්නට මිස ගැහැනියක් ගන්නට නො වෙයි. ආ වැඩය කර ගත් අපි, ඉතින් කොළඹ යමු. නැත්නම්- මිසිස් ජයපාලගෙන් ඔබට කොහො ම වේතත්, මට නම් බේරුමක් වෙන්නේ නැහැ"යි ඔහු කීයේ ය.

එ බසට ජෝන් මඳක් මෙල්ල වී, ඒ කැලෑ හඳ නැවතත් දකින බලාපොරොත්තුවෙන් අරණායක පසු වන තෙක් ම ඉතා ඕනෑ කමෙන් මහ දෙ පස, බල-බලා, ගමන් කෙළේ වී නමුදු අදහස නිෂ්ඵල වූ කල්හි කනගාටුවෙන් සුසුම් හෙළා, නීතිඥයාට කීකරු වුණේ ය.

එ වේලේ නම් ජෝන් කෙරේ ඇති වුණේ, පසුව දා පෙරළා අරණායකට එන බලවත් ආසාවකි. කොළඹ පැමිණියාට පසු

නැතුව. පැට්‍රල් නැතුව. අපේ මිනිසුන් දන්නේ නෑ. හැම ව්‍යාපාරයකට ම අසුබ දසාවක් ලබන බව. ඒ අසුබ කාලයේ දී ව්‍යාපාරය රැක ගන්නට මුදල් වෙන්කර තැබීම තමා කාරණාකාරණා තේරෙන යුරෝපියයන්ගේ නම් සිරිත. යුරෝපියයනට ඒ ගොල්ලාගේ වතු-පිටි විතරක් නොවෙයි. වෙළෙ-හෙළෙඳාම් පවා තවමත් රැකගන්න පුළුවන් වී තිබෙන්නේ, විපත්ති කාලය වෙනුවෙන් වෙන් කළ අරමුදල නිසා යි. අපේ මිනිසුංට, ගං වතුර වාගේ මුදල් ලැබෙන කොට වත්, එහෙම වෙන් කරන්න හිතුණේ නැහැ. පංගුවක් සෙල්ලම් කළා- පංගුවක් රස වැටිලා, ලොව් දහට ණය වෙවී, තව-තවත් ඉඩම් ගත්තා- දැන් වෙලා තියෙන්නේ, ඔක්කො ම ගහගෙන මකර කටට යන එක යි-"

"පෙරකදෝරුකමට විතරයි, ඔහොම නරක කාලයක් නොලබන්නේ- නේද හැරිස්?" කියා ජෝන් ද ප්‍රශ්නයක් උපදවා, නැවතත්, "තාගේ අඹුව තා එක්ක ගියත්, ලෙබ්බෙට නම් පණම් අට වරදින්නේ නැහැ"යි කීයේ ය.

"නමුත්, දැන් පෙරකදෝරු කමත් බොහො ම බාල්දු වෙගෙනයි යන්නෙ" කියමින් හැරිස් තවත් දුම්-කුඩු ටිටක් නැහැයේ ලා ගෙන, "ඒකටත් හොරුන් වැඩි උණා- හොරා නීතිඥයා වුණාම, නැත් නම් නීතිඥයා හොරා උණාම- ඔහුගෙන් ගන්න වැඩක් නැහැ. ඔහු රටට මහමාරියක් වෙනවා. මේ නීතිඥ වෘත්තිය එසේ ම මුදල් උපයන්න ලෙසි- ඉක්මනින් පෝසත් වෙන්න ලෙසි-රක්ෂාවක් නොවෙයි, ජෝන්. නමුත් බොහෝ දෙන, මීට පැන ගන්නේ, වඤ්චාවෙනු ය, ප්‍රයොගයෙනු යි. ඉක්මනට පොහොසත් වෙන බලාපොරොත්තුවෙනු යි" මෙසේ කියා ජෙරී හැරිස්, තිස් වසක් මුළුල්ලේ කළ ස්වකීය නීතිඥ කාරයා ගැන විස්තරයක් ද කළේ ය.

ජෙරී හැරිස්, නීතිඥ කාර්යය ආරම්භ කොට තිස් වසක් ගත විය. එහෙත් ඔහුට තවමත් සැලකිය යුතු පොහොසත් කමක් ඇති කර ගත නො හැකි විය. ඔහුගේ එක ම පොහොසත් කමත, අගයත්, අවංක නාම මාත්‍රය පමණකි. ඔහු දිවි හිමි කොටත්,



වත් නො කීවා ය. එය ගැන මතක් කිරීමක් පමණ වත් නො කළා ය. මෙ වැනි වැරදි ගැන කතා කිරීම, එයින් වළකින්නට ගුණ දහමුතුකම් දීම, අනවශ්‍ය කාරණයක් සේ ඇය විසින් සලකන ලදී. අස්ථානයෙහි කරන මෙ බඳු අවවාදයෙන් පුළු තරුණු පවා වැඩි වැදගත් බවට පැමිණෙන්නේ යයි ඈ සිතන්නී ය. පුත්‍රයා පිළිබඳ මේ කාරණය ඇයට නො වැදගත් නොවේ. එහෙත් නො වැදගත් සේ ඔහුට පෙන්වීම ඇයට ඉතා ම වැදගත් කාරණයකි. භුක්තිය බාර ගත්තාට පසු වත්තේ වැඩපොළ කර ගෙන යා යුතු පිළිවෙළ ගැන නම් ඈ සංක්ෂේප මාත්‍රයෙන් පුත්‍රයාට වුවදෙස් දුන්නාය.

"ජෝන් ඇහුණා ද? මෙහෙ ම තැන දී වැඩ කරන්න ඕනෑ හැටි ඔක්කෝම හැරිස් ඔබට කියා දේවි. ඔබ මේ යවන්නේ ඒවා හොඳින් ඉගෙන ගන්න යි. ඇහුණා ද?" ඈ විශේෂයෙන් ම කීවා ය.

ජෝන් සහ හැරිස් කිසි නොමනාපයක් නැති යහළුවන් මෙන් උදෑසන ම සමන්ගිරේ මංගල රථයකට බඳු මහ මොටෝ රියෙන් ගලපිටකන්දේ බුක්තිය බාර ගැනීමට එහි සුපිරිංටැංඩංට් වෙත, පළමු අයිතිකාරයන් ගෙන් ලබන ලද ලියවිලිත් ඇතිව, පිටත් වූහ. දැඩි රිවි රැසින් යුත් සිත් පිණ වන දිනක් වූ හෙයින්, මේ මොටෝ රිය ගමන දුර වුවත් නො සතුටක් නොවී ය. හැරිස් වරින්-වර, දුම්-කුඩු උරමින්, නැහැය පිඹිමින්, නොයෙක් දෙය ගැන කථා කළේ ය. ජෝන් අතුරක් නැතිව, සිගරට් උරමින් එම කතාවට ඇහුම්කන් දුන්නේ ය. මහ දෙපස, වල් වෙගන යන රබර් වතු දක්වා, හැරිස් එම අයිති කාරයන්ට සාප කරන්නට විය.

"රබර් ගණන් ඉහල නැගුණා ම ජෝන්, මේ මිනිසුන් සිතුවා හැම දාම ඒ ගොල්ලාට තත්තල්ය කියා. ඒ ලැබුණු ආදායම් ඔවුන් රැක ගත්තානම්, මේ මුදල් පරිහානිය තව දහ අවුරුද්දක් තුබුණාවෙතෝ- ඔවුනට ගහන හෙනයක් නැහැ. දැන් සමහරු-න්ගේ මොටෝකාර් නිකං එක තැන දිරනවා. ටයර් නැතුව. තෙල්

නැතුව. පැටරල් නැතුව, අපේ මිනිසුන් දන්නේ නෑ. හැම ව්‍යාපාරයකට ම අසුබ දසාවක් ලබන බව. ඒ අසුබ කාලයේ දී ව්‍යාපාරය රැක ගන්නට මුදල් වෙන්කර තැබීම තමා කාරණාකාරණා තේරෙන යුරෝපියයන්ගේ නම් සිරිත. යුරෝපියයනට ඒ ගොල්ලාගේ වතු-පිටි විතරක් නොවෙයි. වෙළෙ-හෙළෙඳාම් පවා තවමත් රැකගන්න පුළුවන් වී තිබෙන්නේ, විපත්ති කාලය වෙනුවෙන් වෙන් කළ අරමුදල නිසා යි. අපේ මිනිසුංට, ගං වතුර වාගේ මුදල් ලැබෙන කොට වත්, එහෙම වෙන් කරන්න හිතුණේ නැහැ. පංගුවක් සෙල්ලම් කළා- පංගුවක් රස වැවිලා, ලොව දහට ණය වෙවී, තව-තවත් ඉඩම් ගත්තා- දැන් වෙලා තියෙන්නේ, ඔක්කො ම ගහගෙන මකර කටට යන එක යි-"

"පෙරකදෝරුකමට විතරයි, ඔහොම නරක කාලයක් නොලබන්නේ- නේද හැරිස්?" කියා ජෝන් ද ප්‍රශ්නයක් උපදවා, නැවතත්. "කාගේ අඬුව කා එක්ක ගියත්, ලෙබ්බෙට නම් පණම් අට වරදින්නේ නැහැ"යි කීයේ ය.

"නමුත්, දැන් පෙරකදෝරු කමත් බොහො ම බාල්දු වෙගෙනයි යන්නෙ" කියමින් හැරිස් තවත් දුම්-කුඩු විටක් නැහැයේ ලා ගෙන, "ඒකටත් හොරුන් වැඩි උණා- හොරා නීතිඥයා වුණාම, නැත් නම් නීතිඥයා හොරා උණාම- ඔහුගෙන් ගන්න වැඩක් නැහැ. ඔහු රටට මහමාරියක් වෙනවා. මේ නීතිඥ වෘත්තිය එසේ ම මුදල් උපයන්න ලෙසි- ඉක්මනින් පෝසත් වෙන්න ලෙසි- රක්ෂාවක් නොවෙයි, ජෝන්. නමුත් බොහෝ දෙන, මීට පැන ගන්නේ, වඤ්චාවෙනු ය, ප්‍රයොගයෙනු යි. ඉක්මනට පොහොසත් වෙන බලාපොරොත්තුවෙනු යි" මෙසේ කියා ජෙරී හැරිස්, තිස් වසක් මුළුල්ලේ කළ ස්වකීය නීතිඥ කාරයා ගැන විස්තරයක් ද කළේ ය.

ජෙරී හැරිස්, නීතිඥ කාර්යය ආරම්භ කොට තිස් වසක් ගත විය. එහෙත් ඔහුට තවමත් සැලකිය යුතු පොහොසත් කමක් ඇති කර ගත නො හැකි විය. ඔහුගේ එක ම පොහොසත් කමත, අගයත්, අවංක නාම මාත්‍රය පමණකි. ඔහු දිවි ගිම් කොටත්,



තමා අතට පත් පමණින් අනුන් මුදල් තමාගේ මෙන් සිතා, අවදානම් වැඩවල යොදා, ආත්ම ලාභය කර ගැනීමට නො සිතුවේ ය. ඔහු ගත්තේ, නීතියෙන් තමාට ලැබී තිබෙන අවසරය පරිද්දෙන් ගාස්තුව පමණකි. ඉතා මෑත, නීතිඥ වෘත්තියට බැස ගත් නොයෙක් දෙන නොබෝ කලකින් තමා පසු බා, උසස් පොහොසතුන් වූ බව ඔහු දන්නේ ය. සමහරු නීතිඥ වෘත්තිය දූ කෙළිය කොට ගත්හ. අතට ලැබුණු අනුන් මුදලෙන් දූ කෙළින්නා දිනන තාක් කල් රහස රැක ගනිමින්, අවංක මහතකු වෙසින් ජන සමාජයේ පසු වෙතත්, පැරදුණු දා, මේ ගරු සම්භාවනීය වෘත්තියට පමණක් නොව, මුළු රටට ම- ජාතියට ම- පිළිලක් වන්නේ ය- කැලලක් වන්නේ ය. මෙ පමණක් නොව, අසරණ දුගී දුප්පත් මිනිසුන්හට ද ඇතැම් නීතිඥයන් නිසා වන අනර්ථය සොරුන් නිසා වන අනර්ථයටත් වඩා බරපතළ බව ඔහු කීවේ ය. වංක නීතිඥයා ලයිසම ලැබූ සොරකු බඳු ය.

"සමහර පෙරකදෝරු වරුංට විරුද්ධව , අසරණ කණ වැන්දඹු ගෑනුන්, හිඟට මිනිසුන්, කියා ගෙන මා ළඟට එන පැමිණිලි ගණන් නැහැ. ජෝන්, සමහරුන්ගේ දූක්ගැනවිලි අහංට බැරි තරම් කනගාටු යි. අතේ-මිටේ තුබුණු ඔක්කෝ ම නඩුවට වියදම් කර ලා, නඩුව දින ලා, මුදල් අතට ගන්න තැනට ආවා ම, තමන්ගේ නීතිඥයා අර පළමු විත්ති කාරයාටත් වඩා ලොකු හතුරකු වෙනවා. ඒ මුදල නීතිඥයාගෙන් අය කර ගන්න තව නඩුවක් නොකියා බැරි තැනට යනවා. දුප්පතුන්ට ඉතින් ඊට වියදම් නැති උණා ම, ඔවුන් දෙයියංට කිය-කියා යනවා. මට කියංට පුළුවනි. ජෝන්, එක පිටිසර බද නගරයක, වැඩ කරන නීතිඥයකු ගැන, ඔහු පෙරකදෝරු කම පටන් අරන් පස් අවුරුද්දක උණෙත් නැහැ- ලොකු රබර් වත්තක් වැවුවා- මහ විසාල ගෙයක් හැදුවා- හොඳ තැනකින් කසාදයක් බැඳ ගත්තා- කසාද බැන්ද තැනින් නම්, සැහෙන දෑවැද්දක් ලැබුණා තමයි. අපරාධයෙන්ම යි- වංචාවෙන් ම යි. ඔහු නඩු දිනංට නම් ගජ හපනා- එහෙත් දිනූ නඩුවල ගනු-දෙනු බේරන්න අලිම-අලි හොරා ඔහුගෙන් එක-එක ගණන්වල මුදල් යන්න තියෙන මිනිස්සු සියයකටත් වැඩියි. ඉතින් බලන්න." කියා ඔහු දුම් කුඩු විට ඇද්දේ ය.

මෙහි දී, ජෝන්, එය බලනු වෙනුවට කලබලයෙන් වට-පිට බලා, "ඒයි! ඒයි! මේ හරියේ ටිකක් සෙමින් පලයන්" යයි රිය කරුවාට නියම කළේ ය.

"ඕ! මේ අරණායක ද? එහෙනම් ටිකක් හෙමින් යන එක හොඳ තම යි." කියා ජෙරී හැරිස් ද සිනාසෙමින් වට-පිට බැලුවේ ය.

ජෝන්, මෙසේ මඟ දෙපස බැලුවෙත්, රථය හෙමින් ගෙන ගියේත් , නො අනුමානව ම තම හිතවත් තරුණිය බලාපොරොත්තුවෙන් විය යුතු ය. වෙන දවස් වල මෙන් ම මෙදින ද කඩ-මංඩියේ රැස් වූ ගමේ-ගොඩේ පිරිසක් වූ නමුත් ඔවුනතර ඒ තරුණි නො සිටියා ය.

"එ දා වාගේ නොවෙ යි- අද අරණායකට හඳ පායලා නැහැ"යි හැරිස් කඩ-මංඩිය පසු කළ හැටියේ කීවේ ය.

"රාහු ගිල ගනීය කියා බයේ වෙන්න ඇති"යි තරුණ ජයපාල ද ගණනකට නැතිව කීයේ ය.

"පරණ රාහු නම් සඳ ගිල ගත්තත් නැවත වමාරනවා- මේ අලුත් රාහු එහෙ ම අනුකම්පාවක් පෙන්වා ය කියා හිතන්න බැහැ." නීතිඥයා යළිත් කීය.

ඊට තරුණයා දුන් පිළිතුර සිනාව පමණකි. ඔහු සිගරැට් කොපුව හැර, සිගරැට්ටුවක් ගෙන නීතිඥයාට ද එකක් දුන්නේ ය. මොටෝ රිය ද නැවතත් ගමන් වේගය දියුණු කොට ගත්තේ ය.

නීතිඥ හැරිස් දුම් බොන්නේ කලාතුරකින් බැවින්, එසේ කලාතුරකින් ලත් සිගරැට් වැටිය ද දල්වා ගෙන, ගැඹුරු කල්පනාවෙන් තුෂ්ණිම්භූතව සිටියේ ය. ජෝන් ද එ සේ ම තුෂ්ණිම්භූත විය. නීතිඥයාගේ කල්පනාවට විෂය වූයේ, ජෝන්ගේ කල්පනාවට විෂය වූ කාරණය ම බව නීතිඥයා මෙන් ම ජෝන්



ද එසා සේ දැන ගත් රහසකි. ගැඹුරු නිසොල්මන ඇවෑමෙන් නීතිඥයා කතා කළේ ය.

"ඔබ පොඩි ළමයෙක් නො වෙයි ජෝන්- මෙහෙ ම පිටිසර කෙල්ලකට රැවටෙන්න-"

"ඇත්තෙන් ම නැහැ"යි ජෝන් වහා පිළිතුරු දුන්නේ ය.

"එතකොට මොක ද මේ තරම් මේ ගැන විපරම?"

"දන්නේ නැද්ද ජෙරී? නිකං විහිළුවට."

"විහිළුවට ඔවා විහිළුවට කරන වැඩ නොවෙයි. ජෝන්. ඔය සෙල්ලමට ගිහින් බොහො ම මිනිසුංට සෙල්ලම ලෙල්ලම වෙලා තියෙනවා."

"ඒ සෙල්ලමෙන් මොන ලෙල්ලමක් උණත් මට කමක් නැහැ ජෙරී."

ජෝන්ගේ මේ පිළිතුරෙන් ජෙරී හැරිස් තැති ගැනුණේ ය. ජෝන්, මේ එක හිත් හිතා ගෙන කිසි භයක්, වකිතයක් හෝ ලජ්ජාවක් නැතිව, කී වචනයක් බව ඔහු තේරුම් ගත්තේ ය. ඔහු එය සිතට ගෙන, නො ගන්නා මෙන්, හඟවමින් තම කථාවට අභිනවයෙන් ප්‍රාරම්භයක් ඇති කරන්නා සේ, ජයපාල වංශාවලියේ ගුණ කථනය කරන්නට පටන් ගත්තේ ය. එ තරම් දීර්ඝ කාලයක් මුළුල්ලේ දෙශ විපත්තීන්ගෙන් හා රාෂ්ට්‍ර විප්ලවයන්ගෙන් ද සිඳී-බිඳී යා නොදී, මොනවට රැක ගත් පරණ පෙළ පතක් ගැන මෙ සේ සුළු කොට තැකීම අයුත්තක් බවත්, ඒ පරම්පරාගත කුලජ්‍යෙෂ්ඨයන්හට කරන අගෞරවයක් බවත් යටත් පිරිසෙයින් තමා මෙ වැනි විහිළු වැඩවලට බැඳෙන්නට පළමු ජීවත්ව සිටින මැණියන් ගැන ද සිතා බැලිය යුතු බවත්, ඔහු කීවේ ය.

වග කිය යුතු කුල පරම්පරාවක් ඇත්තකුගේ ජීවිතයට වූ කලී නිදහසක් නැති හිතූ මතයේ හැසිරෙන්නට අවසරයක් නැති- ඔහු බැඳී සිටින්නේ, තමා වෙනුවෙන් පමණක් වග කියන්නට නො

වේ. තමාට අන්වය පාදා දුන් ආදී පුරුෂයන්හට ද ඔහු එග කිය යුතු ය. ඔවුන්ගේ ප්‍රතිපත්තීනට අනුකූල වන සේ, ඔවුන් තැනූ අඩි පාරේ ගමන් කළ යුතු ය. නැතහොත් මුළු පෙළේ ම සාපය ඔහු තෙමේ පැමිණෙන්නේ ය. කුල භූෂණය ආරම්භ කළ ආදී ම පුරුෂයා යම් ගෞරවයකට භාජන වී නම්, එ පමණ ම වූ අගෞරවයකට කුල දූෂණය කළ ආධුනිකයා ද භාජන වන්නේ ය. මී ආදි දෙය නීතිඥයා විසින් කියන්නට යෙදුණු කල්හි ජෝන්හට ඉවසුම් නැති විය.

"ජෙරී, ඔබ හිතන්න, මා ඒ තරුණිය කසාද බැඳ ගත්තා ය කියා. ඉතින්, ඒක අපේ පවුලට, මා කළ අගෞරවයක් වෙන්නේ කොහොම දැයි?" ඔහු තරහයෙන් ඇසුවේ ය.

"උසස් මිනිසුන් උසස් මිනිසුන් හා එක් විය යුතු යි ජෝන්."

"එතකොට ඔබ කියන හැටියට උසස් කම දක්වෙන්නේ කුලයෙන් විතරයි- එහෙම ද?"

"නැහැ. නැහැ."

"නැත් නම්, එහෙ ම කියන්නේ ඇයි? මගේ කල්පනාවේ හැටියට ජෙරී, උසස් කම කුලයෙන් දැක්වෙන්නාක් මෙන් ම, මුදලෙන් දක් වෙංට පුළුවනි. ශක්තියෙන් දක් වෙංට පුළුවනි. ශිල්ප ක්‍රමයකින් දක් වෙංට පුළුවනි. ශාස්ත්‍ර ක්‍රමයකින් .දක් වෙංට පුළුවනි. පාණ්ඩිත්‍යයෙන් දක් වෙංට පුළුවනි. කවිත්වයෙන් දක් වෙංට පුළුවනි. ඉතින් ඔය කොයි එකත් ජන සමාජය නමැති තරාදියට දමුවා ම එක බරින් තමා කිරන්නේ. අපේ කුලවත් කම්, පොහොසත් කම්, සියල්ලම ඇයගේ රූමත් කමෙන් යට කරතැකි. ජෙරී, අපේ කුලවත් කමේ අඩු-පාඩු පෙනෙනවා. පොහොසත් කමේ අඩු-පාඩු පෙනෙනවා. ඇයගේ රූමත් කමේ කිසි අඩු-පාඩුවක් නෑ. ජෙරී ඈ, ඒ ගුණාංගයෙන් දිග්විජය කළ රැජිනියක්-"

හැරිස් නිශ්ශබ්ද විය . ජෝන්ගේ තර්ක යුක්තිය ඔහුට නම් ආභාසයකි. ඡන්දයෙන් අගතියට බැස, අවිවාහකයෙක් කරන



ඝාතාවට ඔහු අප්‍රසන්න ය. ඒ හෙ ම තැන, නට පියා ගෙන නිසොල්මන් වීම යෙහෙකැයි ඔහු සිතන්නේ ය.

පෙරවරුවෙහි ම ගලපිටකන්දේ බංගලාවට සමීප වූයෙන්, ඔව්හු වත්තේ සුපිරිංටැංඩංට් විසින් ඉතා සාදරයෙන් පිළිගනු ලැබූහ. වත්තේ පොත්-පත් හා ලියවිලි ආදියත් මේ අලුත් අයිති කාරයන් වෙත පිරිනමන ලදින්, නීතිඥයා සවස මුළුල්ලේ ම එය හැම පරීක්ෂා කිරීමෙහි යෙදුණේ ය.

ජයපාල තරුණයා විස්කි බෝතලය ළං කර ගෙන, මත්පැන් පානය පටන් ගත්තේ ය. දන් ඔහු සිතේ පවතින්නේ, අමුතු ම වූ ප්‍රීතියකි. තමන්ගේ බුදලයට අක්කර දහයක රබර් වත්තක් එකතු වීම එක් අතකින් ප්‍රීතියට කාරණයක් වුවත්, මේ, ඒ ප්‍රීතිය නො වේ. මේ වූ කලී ස්වතන්ත්‍රතාව නොහොත් නිදහස් සිත නොහොත් සුඛ දායක දෙශ ගුණය නිසා ඇති වූ ප්‍රීතියකි. එ සේ ද නැතහොත්, කැලෑ හඳට මේ පමණකින් නමුත් ළං වීම නිසා ඇති වූ ප්‍රීතිය විය හැකි යි. ඔහුගේ ප්‍රීතිය මේ හැම දෙයකින් ම වැඩුණේ ය . මෙහි මෑණියන් නැති කම, එක් නිදහසකි- මිත්‍රයන් නැති කම, තවත් නිදහසකි. මනාප ලෙස මත්-පැනින් ප්‍රීති වෙන්නට ඔහුට මෙහි එක ද අවහිරයක් නැති දෙශ ගුණය පවා ඔහුගේ, ප්‍රමෝදයට උපකාරයකි. උෂ්ණය වැඩි නිසා කොළඹ දී නම් ඔහු සිත මෙ තෙක් මත් පැනෙහි නො බැඳේ. අධික ශීතගුණය ද මත්-පැනට අහිතකරය, නොහොත් මත්-පැන් බොන්නන්ට අහිතකරය. එ හෙයින් නුවරඑළිය- මහනුවර ආදී තැන්වලටත් වඩා, මේ ප්‍රදේශය ප්‍රකෘති ගුණයෙන් ඔහු සිත් ගත්තේ ය. මත්-පැන, දුක දුරු කරන්නෙකැයි සමහරු කියති. එය සැපත ළං කරන්නකු බව දන් ජෝන්ගෙන් නම් පෙනේ. අමාවක් දිනක මෙන් ඇසට වත් නො පෙනෙන කැලෑ හඳ, දන් ඔහු සිතට නම් පසළොස්වක් දිනක මෙන් ආසන්න ය.

නීතිඥ හැරිස් පොත්-පත්වල වැඩ අවසන් කොට, තම තරුණ ස්වාමියා ගැන විපරම් කර බැලුවේ ය. වත්තේ භුක්තිය කෙසේ වුවත්, ඔහු බංගලාවේ නම් භුක්තිය ගෙන ඉවර බව නීතිඥයාට

පෙනිණි. පළමු අයිති කාරයනට තානායම වූ මේ බංගලාව ගෘහ භාණ්ඩයන්ගෙන් පමණක් නොව, මෙහෙකරුවන්ගෙන් ද යුක්ත විය. එහි, දැන් මේ, අභිනව ස්වාමියා වෙනුවෙන් රාත්‍රි භෝජනය ද, පිළියෙල වන්නේ ය. තම නීතිඥ මිත්‍රයා දුටු හැටියේ ජෝන් ඔහු කැඳෙවුවේ ය.

නීතිඥයා ද කලකිරුණු ලීලාවෙන් අහක බලා ගෙන නැවතත් එම බංගලාවේ ම කොනේ පිහිටි කන්තෝරු කාමරයට ගියේ ය. එහි ඔහු සුපිරිංටැංඩට් සමඟ කතා කරමින් ජයපාල මැතිණිය ගැන කරුණු කීවේ ය.

“මේ තරුණ ජයපාල මහත්මයා වාගේ නො වෙ යි- උන්නැහේගේ මැණියෝ, මේ මහත්මයා නම් තව ම හය හතර නො තේරෙන කොලු ගැටයෙක්- හැම මාසයකටම සැරයක් ඔබ ජයපාල මැතිණියට වත්ත ගැන වාර්තාවක් යවන්නට ඕනෑ. ඒවා සියල්ල ම ඉතා හොඳින් සෝදිසියෙන් පරීක්ෂාකර බලන්නට ඇයගේ ලිපිකරුවන් ඉන්නවා. දැන් හෙට උදේ පෙරෙට්ටුව කීයට ද?” යි නැවත ඔහු ඇසුවේ ය.

“උදේ පහමාරට.” යයි සුපිරිංටැංඩංට් පිළිතුරු දුන්නේ ය.

“එහෙ නම්, ඒ වේලාවට ඔක්කෝ ම කුලීකාරයන් පෙරෙට්ටුවට කැඳවන්න ඕනෑ. ඒකත් බලා ලායි මා හෙට යන්නේ.” නීතිඥය කීයේ ය.

ජෝන් වෙර මතින් සිටිය ද, නැවත නැවත කැඳවන කල්හිත්, නීතිඥයා, මේ තමා මඟ හරින්නේ, විත්ත දූෂණයෙන් බව තේරුම් ගත්තේ ය. නීතිඥයා පිය මැණියන්හට ගතු කියන බව ඔහු දන්නා සත්‍යයකි. ඉතින් මේ වත්ත බාර ගන්නට ගිය තැන ම, හැසුරුණු හැටි මේ සේ යයි මැණියන් විසින් දැන ගන්නට යෙදිණි නම් නපුරයි. ඔහු කල්පනා කළේ ය. එ හෙයින් මේ තලතුනා නීතිඥයා කෙ සේ නමුත් වසඟ කර ගත යුතු යයි සලකා, නැවත ඔහු බංගලාශාලාවට පැමිණි කෙණෙහි කතා කළේ ය.



“ජෙරී, දැන් රෑ වුණා- දැන් වැඩ කරන්න වේලාවක් නො වෙයි. ඔහො ම වාඩි වෙන්න ජෙරී ඔය වීදුරුව- ඔය බෝතලෙ-” යනුවෙන් ඒ දෙක ම දක්වමින් හේ කීයේ ය.

“හෙට එළි වුණු හැටියේ, මට කොළඹ යන්න ඕනෑ. මටත් ඔබට වගේ සෙල්ලම් කර-කර ඉන්න පුළුවන් කමක් නැහැ, ජෝන්.” නීතිඥයා කීයේ ය.

“ඔව්. නාකි මිනිසුංට දැන් මේ සෙල්ලම් හොඳ නැහැ. මටත් ඔහොම කාලයක් ඒවි, ජෙරී. එත කොට මමත් ඔහොම තරුණයංට බණ කියන්නම්”යි ජෝන්, සිනා සෙන්නට තැත් කරමින් කීය.

“මා හිතන්නේ නැහැ, මට වගේ කාලයක් ඔබට ලැබේය කියා ජෝන්.”

“ඒ ඇයි?”

“ඔවැන්නෝ මඳ අව් කාරයෝ”

“තරුණයා යළිත් සිනාසුණේ ය. ඔහු කෙරේ වැඩි කැළඹීමක් දකින බලාපොරොත්තුවෙන් නීතිඥයා මෙ සේ කී මුත්, ඒ එසේ නො විය. ඔහු කිසි පැකිලීමක් නැතිව, නැවතත් විස්කි බෝතලය දක්වා, නීතිඥයා කැඳෙවුවේ ය. එහි බෝතලය වනාහි කැඩෙන, බිඳෙන, නොහොත් ඇට්ටකුණා වන, නෑ-මිතුරුකම් පාහන්නට නොහොත් ඉඳ වන්නට ඉතා ම ප්‍රත්‍යක්ෂ වූ කම්මල නොහොත් දුම්හල බව ඔහු අත් දැක තිබෙන සත්‍යයකි. ඒ සත්‍යය මේ නීතිඥයා සම්බන්ධයෙන් නම් පරම මිථ්‍යාවක් විය.

“ජෝන්, හෙට උදේ පහමාරටයි- මස්ටරය, ඔබට ඔබේ කුලීකාරයන් බලංඩ එපා නම්, ඔබ කුලීකාරයංට වත් පෙනෙංට ඕනෑ” යයි ජෙරී හැරිස් කීයේ ය.

“ජෝන් ජයපාල ඊට දුන් පිළිතුර හිස වැනීම පමණකි.

තරුණ ජෝන් ජයපාලට තම හිතවත් නීතිඥයා ගැන නැවත විපරම් කර බලන්නට සිතුණේ, පසුව දා උදෑසන නවයට පමණ

ය. ඒ, ඔහු එ දා අවදි වූ වෙලාව තමා. ගත වූ රාත්‍රියේ මත් පැන් පානය කළ බව මුත්, අහර ගත් බවක් වත්, ඔහුට දැන් මතක නැත- නීතිඥ හැරිස්, මස්ටරයෙන් පසු- නොහොත් කුලීකාර පෙරෙට්ටුවෙන් පසු- හයහමාරට පමණ කොළඹ යන්නට ගිය බවත්, ඔහු සුපිරිංටැංඩට් ගෙන් දැන ගත්තේ ය.

"එයා මට මොකවත් හේම පණිවුඩයක් කියා ලා ගියේ නැද්ද?" ජෝන් ඇළි-මැළි කඩමින් සුපිරිංටැංඩංට් විතාලේ ය.

"ඔහු එහෙ ම කිසිවක් කීවේ නැහැ- "මහත්තයා කැමති වෙලාවක අවදි වුණාදෙන්, කියා ඔහු උදෙන් ම පිටත්ව බස්එකෙන් රඹුක්කනට ගියා- කෝච්චිය අල්ලන්න" යයි සුපිරිංටැංඩංට් කීයේ ය.

උදේ තේ පානයෙන් පසු, ජෝන් නැවතත් සුපිරිංටැංඩංට් කැඳෙව්වේ ය.

"මට බොහො ම කනගාටුයි- ඊයේ මගෙන් කිසි වැඩක් නොකෙරුණාට- නමුත් මා හිතනවා, අපේ පෙරකදෝරු මහත්මයා වැඩ කටයුතු තිසි පිළිවෙළට යොදන්න ඇත කියා."

"ඔව්, ඒවා ඔක්කො ම සිරිත් හැටියට අපට කර ගෙන යන්න නියම කළා-" යයි සුපිරිංටැංඩංට් කීයේ ය.

"මට බොහොම කනගාටුයි, පෙරකදෝරු මහත්මයා යන්න ඉස්සෙල්ලා, කවුරුත් හරි මා නො කීද්දුවාට."

ජෝන් ස්වල්ප නිශ්ශබ්දතාවකට පසු නැවතත් කීයේ ය.

"අපට නම් කුද්දන්න හිත් උණා- ඒකට මොකද පෙරකදෝරු මහත්තයා කිවුවා, කරදර කරන්නේ මොට ද කියා? ඒ නිසා තමයි, නො කීද්දුවේ." සුපිරිංටැංඩංට් පිළිතුරු දුන්නේ ය.

ජෙරී හැරිස් දැන් ගිය හැටියේ විත්තියට කිසි ම ඉඩක් නො තබා, සිය මැණියන් ඉදිරියේ පැමිණිල්ල නො සෙල්ලෙන්නට



ගළපන බව ජෝන් දැන ගත්තේ ය. ජෝන් හිතන හැටියට නම් මේ ගමනේ දී ජෙරී හැරිස් තමාට මුල පටන් අග දක්වා කෙළේ, නොහොබනා කම්ම ය. තමාට කතා නොකර ගිය එක ඔහුගේ අන්තම-අන්ත නොහොබනා කම් ය. අදහසක් ඇතිව, ඕනෑ කමෙන් ඔහු තමා අවදි නො කොට මෙ සේ ගිය බව පෙනේ. මෙ සේ කරුණු සැලකෙන විට, ඔහු සිත තව-තවත් මුරංඩු විය.

"ඔබ කොච්චර කල් වෙනවා ද, මේකේ සුපිරිංටැංඩංට් වෙලා?"

"දහ අවුරුද්දක් වෙනවා."

"එහෙ නම් ඔබ මේ අවට තොරතුරු හොඳට දන්නවා ඇති?"

"ඔව්"

"අරණායක,අර ගහ හරහා සංගිලි පාලමෙන් එගොඩ වෙලා ගැතැප්ම තුනක් ගියා ම, තියෙන ගම මොකක් ද?"

"පොඩි-පොඩි ගම් කීපයක් ම තියෙනවා."

ජෝන් තවත් ඒ ගැන කතා නො කළේ ය. එයින් ඔබ, ඔහුට ප්‍රශ්න කළ නො හැකි ය. වත්තේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් ඔහු යම් යම් දෙය නියම කොට තමා ද කොළොඹ යන බව කියා, පයින් ගමනට සුදුසු කොට කාකි කලිසමක් හා කාකි කමිසයක් ලා ගෙන, ඩ්‍රයිවර් ලවා රිය පදවා, පිටත් කර ගත්තේ ය. අරණායකට රථය පැමිණි කෙණෙහි, තමා එන තෙක් එය කඩමංඩියේ නතර කිරීම නියම කොට, තෙමේ එයින් බැස, කැලෑ හඳ සොයා පයින් ගමනට සූදානම් විය.

ඔහු උදක් වත්තෙන් පිටත් වුණේ, කොළොඹ යන්නට නොව මේ ගමන යන්නට ම ය. එහෙත්, මොටෝ රියෙන් බැස, සංගිලි පාලම උඩට වත් කෙණෙහි, ඔහුගේ සිතේ බලවත් උනන්දුවක් හුහක් ම පසු බැසුණේ ය. මේ යන ගමන ඉවක්-බවක් නැති විකාර ගමනක් බව දැන් ඔහුට පෙනේ. මදක් නැත් ගිය හෙතෙම, ඒ හෙයින් සංගිලි පාලම උඩ නතර විය. එ දා මාලිතිය ගමට

යා ගත නොහැකිව, නතර වී සිය පණ නසා ගැන්මට පවා කල්පනා කෙළේ ද මෙතැන මය. මාලිනිය මෙන් ඔහු ද ගඟ දෙපස බැලුවේ ය. එය පළමු වරට දකින්නන්හට සිත් පිණවන දර්ශනයකි. වෙලාව පෙර-වරු දහය පමණ වූ බැවින් දැඩි රිවි රැසින් බබළන, දිය බොර මහ ඔය, ස්වර්ණ රසප්‍රවාහයක් මෙන් ශොභාවත් විය. හිරු රැසින් රන්වන් පැහැය ගෙන, මඳ පවනින් දෙ-බඩ සැලෙන කුඹුක් තුරු පෙළ. රන් දන් දීමෙහි නියැලී කප තුරු සමූහයක් මෙන් විය. ගඟ, එ-ගොඩ මෙ-ගොඩ තරණය කරමින් පියසල-සලා රැඟුම් දක් වන පියොතුන් කෙරේ බියෙන් මතු වී ගත නො හැකිව, සැඟ වුණු නිසා දෝ, එහි එක ම මසෙක් වත් නො පෙනිණි. එ සේ ද වුව, මහ ඔය මසුන්ගෙන් තොර වදියක නොවන බව, ගඟ පහල, ගැඹුරු ජලය සොයා යන්නන්ට නම් ප්‍රත්‍යක්ෂ වේ මය. ප්‍රභවාසන්න හෙයින් මෙහි චණ්ඩ ප්‍රවාහය විනා, ගැඹුරු ජලය නිබඳ දක්නා නො ලැබේ. එහෙත් ගත වූ දෙතුන් දින වට වැස්සෙන් පොෂිත හෙයින් මෙ දින සැඩ පහර බලවත් විය. ගැඹුරු විය-බොර විය.

නදිය වූ කලී, ශොභා ගුණය තරණ කොට, කවදත් මනුෂ්‍ය චිත්ත සන්තානය ආකර්ශනය කළ උදාර සම්පතකි. තිරශ්චීනයන් හා සම වූ ම්ලෙච්ඡාවස්ථාවේ දී පවා මනුෂ්‍යයා සියලු තන්හි නදින් ආශ්‍රය කෙළේ ඒ හෙයිනි. ග්‍රීකයන් මෙන් ම වෛදිකයන් විසින් ද නදීන් වෙත ආත්මයක් ඇතැයි සලකන ලදි- ඒ මනුෂ්‍යාත්මයක් නොව, දිව්‍යාත්මයක් සේ ගෙන. ඊට වැඳුම්-පිදුම් පවා කරන ලදී. පඤ්චස්කන්ධය ද නදිය මෙන් ම ක්ෂණයක්-ක්ෂණයක් පාසා, රූප කලාපයෙන් ප්‍රවාහ විපර්යය කරන්නේ ය. මොහොතින් මොහොත වැඩෙන්නේ ය. එ සේ ම මොහොතින් මොහොත නැසෙන්නේ ය. පඤ්චස්කන්ධය සත්ත්වයකු ලෙස ගැනෙන්නේ නම්, නදිය ද සිත් පිත් ඇති දෙවියකු සේ ගැනීම නිවැරදි නොවේතත්, නුසුදුසු නම් නොවේ. නදියකට වූ කලී, තමනට ම විශේෂ වූ පෞද්ගලික රූප සම්පත්තියක් ද ඇත- ඒ රූප සම්පත්තියෙහි දුටු-දුටුවන් සිත් ඇද ගන්නා බලයක් ද ඇත. එ හෙයින් බොහෝ දෙන කවිය හා ගීතය මෙන් ම නදිය ද විශ්‍රාමයට සුදුස්සක් කර ගනිති.



මේක මොන තරම් ලස්සණ නදියක් ද? මට නම් මේ තැන, නොකා-නැද හිටිතැකි. ඔව්, මෙ තැන, මෙහෙ ම ටිකක් වෙලා හිට ලා, ආපසු කොළොඹ යන එක වඩා හොඳයි. නැතුව මම් කොහේ යම් ද? ඇය සොයා ගෙන යන්නේ මොන යුතු කමක් පිට ද? ඇරත්, ඇය ඉන්නේ කොහේ ද? ඇයගේ නම කුමක් ද? මෙ තැනින් හැතැප්ම තුනක ඇත ගමක ඇය ඉන්නා බව නම් කීවා මට මතක යි. ඉතින් සුදුසු කරුණක් නැතිව, නිකම් මා ගොස්, වේල් පොළක දුටු ඇඳුනුම් කම් කියා ගෙන, මේ ගොඩේ තරුණියක සොයන්නට යෑම මහ විහිළුවක් වෙන්නේ නැද්ද? ඇත්තෙන් ම ගම්මු මට ගල් ගහාවි. මා සාමාන්‍ය තරුණයකු නම් මෙ සේ ගමේ-ගොඩේ විපරම් කර නමුත් ඇය ගැන සොයා බැලීමට මට බලය තිබේ. එතකොට ඒ වැයම සභ්‍ය ප්‍රේමයක් මෙන් පිළිගැනේ මට කොහො ම වෙතත්, දකින්නන්හට නම් මගේ මේ ගමන අසභ්‍ය ප්‍රේමයකි.'' මෙ සේ සිතා ජයපාල තරුණයා රුවල් නහා ඔරුවක් දියත් කිරීමට තරම් වූ සුසුමක් හෙළුවේ ය.

“ආ! මා ජාතික ඇඳුම- ලා ගෙන ආවා නම් මීට හොඳ යි. එතකොට මා ගැණෙන්නේ, මහා ජනයාගේ එකකු හැටියට යි. ගම්මුන්ගේ සමාජයේ හැසිරෙන්නට මට එතකොට නිදහස ලැබෙයි. මේ ඉලව් ඇඳුම ඔවුන් බිය ගන්වන ඇඳුමකි- ඔවුන් දුරු කර වන ඇඳුමකි. අනේ මට සාමාන්‍ය මනුෂ්‍යයකු වෙන්න ඇත්නම්! කෙලෙසෙන්නට කුල පරම්පරාවක් නැත්නම්! ධනයක් නැත්නම්! එහෙනම් මම ඉතා කැමැත්තෙන් මේ ගමන ඇය සොයා ගොස්, ඇයගේ දෙ පතුල දණින් වැටී, මට විවාහ වෙන්නට යයි ඇයට කියන්නෙමි.

රූපය අගය කොට සැලකිය යුතු නම්, මාගේ මේ කැලෑ හඳට ලෝකයේ පූජ්‍ය ස්ථානයක් ලැබිය යුතු නො වේද? මේ දුෂ්ට ලෝකය ධනය පුදයි- කුලය පුදයි- බලය පුදයි. ඉතින් රූපය නුපුදන්නේ මන්ද? අහෝ! ඇ කොතරම් ශොභ සම්පන්න දෙහ කාන්තියක් ද? මේ නදියගේ දර්ශන පථය මෙන් ම ඇ ද ශොභා

සම්පන්න ය. මේ නදිය මෙන් ම, ඈ ද කැලයට පැදූ හඳකි. මේ දර්ශන පථය කොළඹ ගෙන යන්නට ඇත්නම්! අගය හඳුනන මිනිසුන්හට මෙහි අගය හඳුන්වා දෙතැකි- නොයෙක් ගුණ දැනුම් කරවා දෙතැකි. මෙහි මිනිසුන්හට මෙහි අගයක් නැත- එ සේ ම, මේ රූමත් තරුණියගේ අගයක් ද මෙහි මිනිසුන්හට එ තරම් ඇතැයි සිතිය නොහැකියි. දන් මෙහි මගේ ළතැවීමෙන් ඇති පලක් නැති. ඇයට පෙර පින රූපය දුන්නා පමණකි. තත්ත්වය නුදුන් බැවින් ඒ රූපයෙන් ඇයට විය හැක්කේ විපතකි. එ සේ ම ඇයගේ මිහිරි කට හඬින් ද ඇයට කිසි පලක් නො ලැබේ. එ දා වේල් පොළේ දී ඇය සන්වේගයෙන් කථා කළ හැටි මට මේ පෙනෙන්නාක් මෙනි. ඇය ඒ මොහොතින් දක් වූ නිර්භයය ලක්ෂයක් ගෙවා බැලියයුතු විශිෂ්ටාලංකාරයකි. අහෝ! නැවත ඒ දර්ශනය දකින්නට, හැරිස් කියන මගේ මඳ ආවිසෙන් පස් අවුරුද්දක් වුවත් දෙන්නට කැමැත්තෙමි.'' මෙ සේ සිතමින් තරුණ තෙමේ කුණාටුවක් ඉපිද වීමට තරම් වූ තවත් සුසුමක් හෙළා ආපසු හැරුණේ ය.

එසේ හැරුණු ඔහුට තමා දෙස සැලකිලිමත්ව, බලා ගත් ගමන් සිටි පිටිසර තරුණයෙක් දකින්නට ලැබිණි. මේ තරුණයාගේ හිසේ රබර් මිටියක් විය- කටේ ලොකු බුලත් විටක් විය. ඔහු කිලිටි සරුවාලයක් හැඳ හිණේ ලේන්සුවක් බැඳගෙන ය. ලේන්සු කොනේ සරුවාලය සේ ම කිලිටු වූ ඔහුගේ හුනු-පුවක් මඩිසලය දවටිණි. ඔහු ජෝන් ජයපාල දෙස බලා, බුලත් කසට බැඳි සම දසන් දක්වා කට පළල් කර සිනාසුණේ ය.

ඔහු සිනාසෙන සැටියෙන්, තමා අඳුනන බව ජෝන්හට ප්‍රත්‍යක්ෂ විය. එහෙත් ඒ කෙසේ වූ හැඳිනීමක් ද? දුටු-පුරුදු හැඳිනීමක් ද? කතා-බහ කළ පුරුදු හැඳිනීමක් ද? ගනු-දෙනු කළ-පුරුදු හැඳිනීමක් ද? යන්න ඔහුට නිශ්චය කළ නොහැකි ය.

''මොක ද, උඹ මා හඳුනනවා දැයි? ඔහු ප්‍රශ්න කළේ ය.

''එහෙම යි. මහ මහත්තයා හඳුනනැකි''යි තරුණයා ද සබ කෝළයෙන් ඇඹරෙමින් කීයේ ය.''



''කොහොම ද, උඹ මා හඳුනන්නේ?''

''ඇයි- එ දා අර කාර්රෙක නවත්තලා- මාලිනීට කතා කළේ ''මහත්තයා නේ ද?''

''මොන මාලිනීට ද?''

''අර මහත්තයාට එ දා වේල් පොළේ හම්බ උණු මාලිනීට-''

ජෝන් ජයපාල නො ඉවසිල්ලෙන් ඉදිරියට පැන්නේ ය- තරුණයා දෙවරෙන්ගෙන සෙලෙවුවේ ය- ඉතින්, යාළුවා, උඹ ඇය හඳුනනවා දැයි? යුහුව ප්‍රශ්න කළේ ය.

''එහෙම යි, මන් ඇය අඳුනනවා- ඇය අපේ ගමේ.''

''එරෙන්, එහෙ නම් මට ඇය පෙන්වා දීපන්.''

''මන් මේ රබර් ටික කඩේට දීලා එන්නන්.''

''මොන රබර් ද මිනිහෝ- විසි කරපන් ඕක ගහට කියමින් ඔහු තරුණයාගේ හිසෙන් රබර් මිටිය ගෙන ගහට විසි කර දැම්මේ ය.

තරුණයාගේ සතුටු මුහුණ එ කෙණෙහි ම දුක් මුසු විය. ඔහු වැලපෙන්නට පටන් ගත්තේ ය.

''අනේ! මහත්තයා, මේ කළ අපරාධය මොක ද?''

''පිස්සා, යමන් මා එක්ක''

''ගමට ගියොත් මා මරාවි. මේ අනුන්ගේ රබර්''

''යමන්!''

''අනේ! දෙයියනේ එ තැන රුපියල් පහක රබර්''

''ඉඳා පහට දහයක්''

රුපියල් දහයේ නෝට්ටුව දුටු කෙණෙහි තරුණයාගේ විලාපය නතර විය. ඔහු මුහුණ යළිත් සිනාවෙන් ප්‍රසන්න විය.

"මහත්තයා, එහෙ නම් මේ දහය ම රබර් වලට දෙන්නද?"

"මෝඩයා, පහක් රබර් අයිති කාරයාට- පහක් උඹට- පෙන්නාපන් ඉතින් මාලිනිය ඉන්න තැන මට"

මේ තරුණයා අන් කිසිවෙක් නොවේ එ දා මාලිනියට තනියට නන්ද රාළගේ නියමයෙන් ගිය අන්දා ම ය. ඔහුට දැන් මේ මහත්මයාගේ විදිය පුදුමයකි. මේ කදිම තරුණ මහත්මයා පිස්සුවෙන් යයි ඔහු සිතුවේ ය. මේ බඳු කඩිමුඩියක් සිහි මොලේ ඇති කිසිවකු වෙත, ඔහු විසින් මීට පෙර නොදක්නා ලදි.

"මහත්තයා, දැන් ගමට ගියා ම මහ කලබල ඇති වේවි"යි අන්දා රුපියල් දහය මඩිසලයේ රුවා ගනිමින් කීයේ ය.

"ඒ මන්ද?"

"එ දා මහත්තයා, මාලිනීට කතා කළ ටිකට ගමේ පද හැදිලා ඉවර යි."

"එහෙ නම් ඇයට මගෙන් වුණේ කරදරයක් ද?"

"හැබෑ ම කරදරයක්! ඈ දවස් කීපයක් ම, ගෙයින් වත් එළියට නැවිත් අඩා-දුකින් පසු උණා- මන් හිතන්නේ නෑ- ඈ ඉතින් කලකට පන්සල් වත් යාවි කියා" අන්දා තව-තවත් විස්තර කළේ ය.

"ඇය මට සාප කරනවා ඇති"

"හා! නෑ, නෑ!" කියා මෙහි දී අන්දා මහත් සංවේගයක් දක්වා "මහත්තයා සොයා ගෙන ඒවි කියා තමයි, ඇය බලා ගෙන ඉන්නේ"යි අනතුරුව කීයේ ය.

"එහෙ නම්, යමන්".

මෙසේ කියා තරුණ ජයපාල පිටත් වුණේ ය. ඔහු අනුව අන්දා ද පිටත් විය. තරුණයා යන සැටියෙන් ඔහු පයින් ගමන් පුරුදු



කෙනකු බව අන්දාට පෙනිණි. හේ එ සේ ම ය. පාසැලෙන් අස් වූ ළඟ දී නිසා ඔහුගේ ව්‍යායාමශීලී දෙහය තව ම ආලස්‍යයෙන් ඔතැනි නො විය. ඔහුගේ ගමන සැප්ප ය- බර ය- තේජස්වත්ය. බරක් හිසේ තුබූ බැවින් අන්දාට ඔහු හා ගමන ලෙහෙසියක් නො වී ය. බර ගෙන යාමට පුරුදු වූ මිනිස්සු සැහැල්ලුවෙන් යන කල ඉක්මන් ගමන් යාමට අපොහොසත් මෙනි. එ හෙයින් අන්දා වරින් වර දුවමින් ජයපාල තරුණයාට එක් වුණේ ය.

මඟ දී ඔවුනට නගරය බලා, නොයෙක් දෙය ගෙන යන ගැහැනු-පිරිමි කිහිප දෙනෙක් හමු වූහ. පෙනෙන තෙක් මානේ ම ඔවුහු කවුරුත් මේ වැදගත් මගියාට මග හැර නිහතමානී ක්‍රමෙන් පසකට වී සිටියා හ- එසේ ම ඔහු ඉක්මවා, අන්දාගෙන් මේ ගම වැදීම ගැන වග-තුග ද විතාළා හ. ඔවුනට කරුණු පහදා දීමට අවසරයක් නොලත් අන්දා මේ පලාත්වල ගම්මුන් හැම එකකට ම දෙන නොට පිළිතුරු "මේ නිසාමී යනවා." යන්න හමු වන තාක් පිරිසට කියමින් යුහුව- යුහුව ගමන් කළේ ය.

මේ දූ කලී, නොයෙක් කඳු ගැට සිසාරා, වැටුණු මහත් වංගුවලින් යුත් අඩි පාරකි. මෙහි අතරින් පතර පසු කර යා යුතු වෙල් කට්ටි කිහිපයක් ද විය. ජෝන් මෙ බඳු පිටිසර පලාතක මේ පයින් ගමන් කළ පළමු වන වතාව ය. බොහෝ තැන් යන තෙක් මග දිගට හමු වූ මිනිසුන් හැර කිසි ගෙයක්-දොරක් ඔහු විසින් නොදක්නා ලදි. තමා දකින පිට, මේ මිනිසුන් දක්වන හරසර ඔහුට පුදුමයකි. එය ඔවුන්ගේ ශිෂ්ට සම්මත ආචාර විශේෂයක් වුවත්, සමානාත්මවාදී ශිෂ්ටයනට නම් ඉවසුම් නොදෙන බියසුළු කමක් සේ පෙනේ. ජෝන්, තරුණයාගේ නම අසා දැන ගත්තේ ය- මග දිගට ඔහු සමඟ නොයෙක් දෙය ගැන කතා කළේ ය. පළමුවෙන් අන්දා තමාට 'මහත්මයා' යනුවෙන් ආමන්ත්‍රණය කළ නමුත් පසුව 'හාමුදුරුවනේ' යන්න ඒ වෙනුවට යොදන්නට වූ කල, ඔහු ඊට කරුණු විතාළේ ය. ඊට පිළිතුරු වශයෙන් පුදුස්සක් කීමට අන්දා අපොහොසත් වූ නමුත් මග හමුවන තාක් පිරිස- මහත්මයා පවා, කුඩය හකුලා ගෙන, මග හැර සිටි

බැවින් එ සේ 'හාමුදුරුවනේ' කියන්නට ඔහුට ද සිතුණු බව කීයේ ය. මේ මිනිසුන් මහත්ත්වයට නොහොත් මහත් වෙසට- මහත් නමට- මහත් කමට- හිස නමන්නට පුරුදු-පුහුණු පිරිසකැයි ජෝන් නොඑළහා තේරුම් ගත්තේ ය- එ සේ තේරුම් ගෙන ගුණ යහපත් කම්වලට ඔවුන්ගේ ගෞරව කිරීමක් නැත යන විමතියක් ද ඇති කර ගත්තේ ය. ලක්දිව පිටිසර සිහළ මිනිසුන් ගෞරව කරන්නේ, දන-උගත් කම්වලටත්, ගුණ-යහපත් කම්වලටත් වඩා බලයට හා තිලයට යයි කිසි යම් පඬිවරයකු වතාවක් තමාට කීවා ඔහුට මතක් විය. ඔහු ඒ ගැන ද අන්දාගෙන් ප්‍රශ්න කරමින්, සුචරිතයට, සිල්වත් බවට, දන උගත් කම්වලට, ඔවුන්ගේ යම් කිසි ගෞරවයක් නැද්දැයි විතාළේ ය. ඊට අන්දාගෙන් ලැබුණු පිළිතුර ඒ ගැන තවත් කල්පනා කිරීමට සිත් දෙන්නකි.

"ඇයි නැත්තේ? අපි ගුණ-යහපත් කම්වලටත්, සිල්වත් කම්වලටත් හාමුදුරුවනේ කියනවා. ඒ හන්දා තමයි අපි පන්සලේ ඉන්න හාමුදුරුවංට හාමුදුරුවනේ කියන්නේ."

කිසි උගත් කමක් නැති වත්, මේ ගොඩේ ගැටවුන්ගේ සහජ බුද්ධියක මහිමය ඇත්තෙන් ම ඔහුට විශ්මයකි. ඔවුන් නිකම් කටට ආ පළියට හැමට ම හාමුදුරුවනේ නොකියන බව ද මෙයින් පෙනේ. එ සේ ම දණ්ඩ නමස්කාරයෙන් ගෞරව කරන්නේ බලයට පමණක් නොවන බව ද මෙයින් පෙනේ. මහණ කම එක් අතකින් කිසිත් නැති හිඟනකමකි- අන්ත නිවට තාපස කමකි. ඉතින් එ තැනට මේ කරන ගෞරවය ම සිල්වත් කමට කරන පිදීමකි. අන්දාගේ මේ එක ම පිළිතුරෙන් පණ්ඩිත මුඛයකින් මුළු ජාතියකට ම නැගුණු චොදනාව කෙණෙහි අස් වන බව ඔහුට පෙනුණේ ය.

කොයි හැටි කෙ සේ වෙතත්, 'හාමුදුරුවනේ' යන ආමන්ත්‍රණ ශබ්දයට තමා නො කැමැති බව ජෝන්, අන්දාට කීවේ ය.

"තමුන්නාන්සේ එ හෙ ම කියනවාට මොක ද- මේ අපේ ගමේ ම ඉන්නවා, ටිකක් එක විදියකට යමක්-කමක් හරි කර ගත්ත



මිනිහෙක්- හාමුදුරුවනේ කියන- කියන පාරට එයා සත විසි පහ ගණනේ ගෙවුවා" යයි අන්දා කීයේ ය.

එහෙ නම් මිනිහාට ගජ වියදමක් වෙන්න ඇති" ජෝන් සිනාසෙමින් කීය.

"නැහැ, මිනිස්සු අන්තිමේ ඔහුට රුපියල් පහට වත් හාමුදුරුවනේ නොකියා අත් හැරියා-"

අන්දා තවත් ඔහු ගැන කරුණු කියමින්, වලව් පෙළට ඇතුළත් වෙන්නට ඔහු කළ වෑයමක් ගැන ද කීවේ ය. ඔහු වලව්වක් හා යම්තමට තැවරුණු වැන්දඹුවකට ලොකු වියදමකින් ආවාහ වූ සැටිත්- ඒ පෙළකට අයිති නමක් දමා ගත් සැටිත්- එ තැන් පටන් හාමුදුරුවනේ කියවා ගන්නට වෑයම් කළ සැටිත් කීවේ ය.

"එහෙමත් පුළුවන් ද- හාමුදුරුවනේ කියවා ගන්න? මේ ඊයේ පෙරේදා වතුවල නෙළුම් කන්කානම්කම කළ මිනිහා- එයාට ගම ඔක්කෝම විරුද්ධ වෙලා. අන්තිමේ දී 'බොරු සිංහයා' ය කියන්නට පටන් ගත්තා- ටිකක් ඉවසන්න එපායැ, කල් ගත වෙනකන්- මිනිසුංට සුල-මුල ටිකක් මතක නැති වෙනකන්? මේ ටික දවසකට ඉස්සෙල්ල මිනිහාගේ ගැති මළා- හිතු පන්දහේ වලව්වේ හාමුදුරුවනේ වලව්වේ හාමුදුරුවනේ! වලව්වේ හාමුදුරුවනේ! කිය-කියා එයා විතරක් මිනිය බදා ගෙන ඔන්න ඔහේ අඬනවා බලාගෙන යි."

ජෝන් තනිය ම සිනාසෙමින් මිනිසුන්ගේ මෙ බඳු ළාමක කම් ගැන පුදුම විය. මේ නූගත් මිනිහා පමණක් නොව, උගත් මිනිසුන් පවා, තමන් කොතරම් උසස් පවුලක වුවත්, කිසි යම් කුල මලයකින් නිතර පෙළෙන බව ඔහු ප්‍රත්‍යක්ෂ කර තිබෙන සත්‍යයකි. ජයපාල කුලය ඉතා ම උසස් කුලයකි. ජයපාල කුලයටත් දන නිය විය හැකි තවත් බොහෝ පවුල් රටේ ඇත- ඒ පවුල්වලට එක ම අඩු-පාඩුව ස්වකීය තත්ත්වය යථාස්ථානයෙහි තැබීමට අවශ්‍ය ධනය හා බලය නැති කම පමණකි. මේ න්‍යායයෙන්

ලෝකේ ඉතා ම උසස් කුලීනයෝ පවා කුල හීනත්වයෙන් පෙළෙත් නම්, මේ කාහටත් පොදු ස්වභාව ධර්මයක් විය යුතු ය. මෙ වැනි කරුණුවල දී අඩු-පාඩුව දෙස බල-බලා දුකින් තැවෙනුවාට වඩා, සදාචාරයෙන් හා පරාර්ථචර්යාවෙන් ආත්ම භාවයෙහි ගෞරවය වැඩි දියුණු කිරීම නුවණට හුරු බව පොදු ජනයාට අවබෝධ කට යුතු යයි තරුණ ජයපාල සිතුවේ ය.

දුන්-දුන් තමා සමීප වන්නේ, ගම්මානයකට බව, අවට භූමි ලක්ෂණය කරණ කොට ජෝන් තේරුම් ගත්තේ ය. රබර් වතු යාය අවසන් විය. පොල්-දෙල්-අඹ-කොස් ආදියෙන් ගැවසුණු උයන් බිම පෙනෙන්නට විය. ලොකුවට පටන් ගැනුණු- එහෙත් වැඩ අවසන් නුණු- ගෙපොළවල් කිහිපයක් ද ඔහු විසින් දක්නා ලදි.

"හාමුදුරුවනේ, මේවා තමයි, රබර් ජය කාලේ පටන් ගත් වැඩ. දැන් හරියට මේවා පෙනෙන කොට පොළොන්නරු ගියා වාගෙයි" තේද ඒ ගෙපොළවල් දක්වමින් සිනා සුණේ ය.

ඒ දැක්මෙන් ජෝන් ජයපාල කෙරේ නම් ඉපදුණේ, බලවත් කනගාටුවකි. ණය ගැති කමෙන් මිදී, මුළු ජාතියට ම නැගී සිටීමට ලැබුණු එක ම ප්‍රස්තාවය මෙ සේ නිරර්ථක වූයේ, මේ ගමේ මිනිසුන්හට පමණක් නො වේ- හැම සිංහළුන්හට ම වාගේ පොදුවේ නිරර්ථක විය. අද සිංහලයා ස්වකීය ජන සංඛ්‍යාව මෙන් පන් සිය ගුණයක් රුපියලින් විදේශීනට ණය කාරයෙකි. දුප්පත්, දුගී, නුගත් සිංහලයා ද ස්වල්ප ලාභයකින් මළුව තරක් කර ගන්නකු බව දුන්-දුන් හොඳ හැටි පෙනේ.

මෙ සේ ගමන් කරන විට, වංගුවකින් හැරී එන මිනිසෙක්, අදිසියෙන් ම ජෝන් දැක, ආපසු දිවන්නට පටන් ගත්තේ ය. ඔහු මහත් තැති ගැනීමකින් දිව්වේ ය- ඈත වංගුවකින් හැරෙන විට ද, ආපසු බල-බලා දිවුවේ ය. ඔහු දිවන සැටි දුටු අන්දා ද ජෝන් මෙන් ම සිනා සෙන්නට විය.



"ඔය දුවන්නේ, තමුන්නාන්සේ ඇක්සයිස් ඉස්පැටරය කියා හිතා ගනයි. ඔහු දැන් දුවලා, ගම මත්කොට ම, කියාවි රා හංගන්න" යයි අන්දා කීයේ ය.

"මගේ ගමන බොහො ම ප්‍රසිද්ධ වෙනවා වැඩියි අන්දෝ"

"ඒක නම් එහෙ ම තම යි, හාමුදුරුවනේ."

ජයපාල තරුණයාට නැවතත් ඇඳුමේ අවාසිය ගැන කල්පනා විය. මේ ගමන හැකි තරම් අප්‍රසිද්ධියේ කරන්නට ඔහු බලාපොරොත්තු වූ නමුත්, වැඩි දුර කල්පනා නො කොට මේ ලා ගත් ඇඳුමෙන් ඔහුගේ ගමනත්, ඔහුත් මුළු ගමට ම සති ගණනක් කතා කරන්නට කාරණයක් වන බව පෙනේ.

"දැන් මේ තිකිණියාන තමයි, හාමුදුරුවනේ" කියමින් අන්දා මග දෙපස තැන-තැන පිහිටි ගෙවල් දොරවල් පෙන්නුවේ ය.

ගස් සෙවණක වාඩිවී, සැප සාතාලේත් නොහොත් ඕපාදූප කතාවෙන්- එ නම්, තරුණියක පැනවී ගිය සැටි, ගොයම් මැස්සනට කෙම් කළ යුතු සැටි, නත්කල් කැස්සට බෙහෙත් කළ යුතු සැටි, හිතෙල් වල මුඩු අරින සැටි, ආදි නොයෙක් දේ ගැන කතාවෙන් පසු වූ ගැහැණු කට්ටියක් මේ ගම් වදින ජයපාල තරුණයා දුටු කෙණෙහි සී-සීකඩ විසිර ගියාහ. ජෝන්හට බැලූ-බැලූ අතින් පෙනුණේ, දොර-කවුළු වලින් පමණක් නොව, දෙල්-කොස් ආදී මහ ගස් අතුරෙන් ද එබී-එබී බලන නොයෙක් වයස්වල ගැහැනු මුහුණු පමණකි. කොළඹ නගරයේ නම් තමන්ගේ පාඩුවේ යන සුර කුමරකු දෙසවත් මිනිසුන් මෙ සේ මීනැ කමින් නො බලති. එහෙත් තිකිණියානට ආගන්තුකයකු- විශේෂයෙන් ම කලිසම් ලා ගත් ආගන්තුකයකු- දකින්නට ලැබීම පුදුමයටත්, සැකයටත් කාරණයකි. ඒ අත් කිසිවක් නිසා නොව, ස්ථානය යම් පමණකට කුඩා ද, එහි එ පමණට ම ජීවිත ව්‍යවහාරය ද අල්ප වන හෙයිනි.

"හාමුදුරුවනේ, මෙන්න මෙ තැනින් තම යි, මාලිනීලාගේ ගෙදරට හැරෙන්නේ." කියමින් අන්දා මං සන්දියක නතර විය.

"මේ අඩි පාර කෙලින් ම ඒ ගෙදරටයි. අවසර, ඉතින් යහපත් වේවා" යයි නැවතත් කියමින් ඔහු යන්නට ගියේ ය.

ජෝන් මෙහි දී තනි විය. අමු සොහොනක තනිය ඔහුට මෙ තරම් දරුණු විය නො හැකි යි. අන්දා නැති පාළුව මහත් අසරණ කමක් සේ හැඟිණි. ඔහු රුවල බිඳුණු ඔරුවක් මෙන් යා ප්‍රුතු අත යා ගත නොහී ළතැවෙන්නට විය. ඔහුගේ ප්‍රිය වස්තුව දන් පෙනෙන තෙක් මානේ ඇතත්, පුදුමයක මහත ඔහුට තවත් එ දෙසට පා නගා ගත නො හැකි ය. කොහොල් සිත නිසා ඔහු දෙපය විළියෙන් වෙළෙන්නේ ය. ඈත මෑත බලන කල්හි, නුදුරුව වල-කජු සෙල්ලම් කරන කොලු පෙළක් දකින්නට ලැබුණාහ. ඔවුන් සමඟවත් හාද කමක් ඇති කළ මැනවැයි සිතා, එ තැනට ළං වූ නමුත් අභාග්‍යයක හැටි! ඔහු දුටු කොලු බුරුත්ත ද, පයින් පහර ලත් රසදිය මුලක් මෙන් සී-සී කඩව ගියාහ.

# 5

රබර් ජය කාලයේ නම් නිකිණියානට නිතර යන-එන අමුත්තන්ගෙන් කිසි හිඟයක් නොවී ය. එ තල මෙහි අමුත්තකු දක්මෙන් කිසිවකුට අමුත්තක් ද නොවී ය. දන් දන් නම් මෙහි අමුත්තකු පැමිණෙන්නේ, ඉතා ම කලාතුරකිනි. ගොලෑ පුවක් ගන්නට එන තලතුනා මරක්කල මිනිහාත්, එළුවන් හා ගවයන් මසට ගෙන යන තරුණ මස්කඩ කාරයාත්, දුම්කොළ වෙළෙන්දා හා රෙදි පොට්ටනි කාරයාත්, පිට මිනිසුන් වුවද , මෙහි නිතර යන එන්නන් බැවින්, අමුත්තන්සේ නොගැණෙති. ගොලෑ පුවක් කාරයා නම් ගමේ ඉතා ම ප්‍රසිද්ධ ය- ගමට ඉතා ම කුලුපග ය. ගමේ ළදරුවන් හැර, ඔහුට ණය නැති කෙනෙක් ද නැත්තාහ. ගස්වල තිබිය දීම පුවක්වලට අත්තිකාරම් දෙන හෙතෙම කිසි තරගයක් නැතිව, නිකිණියාන ගොඩුරු ගම් තර ගෙන හැසිරෙයි. යන-එන තැන කවුරුනුත් ඔහුට, පෙන්වන්නේ සිනා මුහුණකි-කියන්නේ මිහිරි බසකි. ඔහු ද ගනු-දෙනු කරන විට පවා මිහිරි බසක් විනා කටුක වචනයක් නො කිය යි. පවුල්කාරයන්ගෙන් නම්, සුව-දුක් විමසීම්, තනිකඩයන් ගෙන් නම්, රැකීරක්ෂා ගැන විමසීම, මහල්ලන්ගෙන් නම්, ගත දුන් හිර-හිඳලන් ගැන විමසීම, ඔහුගේ සිරිතකි. ඔහු මුස්ලිම් කාරයකු වුවද නිකිණියානට නම්, බෞද්ධයෙකි. රළු-කරළු කමක් හෝ දඩි-දඬි කමක් දුටු තැන, පිටු පා නො යන මේ තෙමේ දෙන තරමක් අවවාද බුද්ධාගමයෙන් ම දෙන්නේ ය.

මස් කඩ කාරයා ද මුස්ලිම් භක්තිකයෙකි. ඔහු ඇත්ත කතා කරන්නකු හැටියට මුළු ගමේ ම ප්‍රසිද්ධ ය. ඔහු ගෙන යන තරමක් එළුවන්-ගවයන් ගෙන යන්නේ ද, මසට මැරීමට නොවේ-වැඩට හා පට්ටිවලට විකිණීමටය.

"අනේ! තම්බි. ඔය හරකා මරන්න හේම දෙන්න එපා. මා මරන්න නොවෙයි උඹව වික්කේ."

"චී! අයියා, අපිලා එහෙම ද කරනවා? මේ දිවට කුණුවෙලා තම යි යනවා. අපි තමයි නම් එහෙ ම කරනවා."

මස් කඩ කාරයා මෙ පමණ සහතිකයක් කළ පමණින් මේ ගම්වැසි බෞද්ධයන්ගේ සියලු සැක දුරුඋන්නේ ය. ඔහු, ඔවුනට එ තරම් විශ්වාසය. වතාවක් ගවයකු විකුණු එක් උපාසකම්මා කෙනෙක් හරකා හඬව-හඬවා බැඳගෙන යන සැටි බලාගෙන සිට, "අනේ ඔය තම්බීට පිනරයි. හිත එකලස් කර ගෙන හරකකු විකුණන්න පුළුවන්. වෙන මිනිස්සු ගෙනිච්චා ම මේ සතුන්න මොනවා කරනවාද කියා කවුද දන්නෙ?" යනුවෙන් කීහ.

දුම්කොළ වෙළෙන්දාත්. රෙදි පොට්ටනිකාරායාත් දෙදෙනාම-සිංහලයෝ ය. දුම් කොළ කාරයාගේ වෙළෙඳාම කඩවලට පමණකි. කිසි අන්දමකිනුත් තේවෙල් නො ඉවසන, ඉක්මනට කිපෙන, ඔහුගෙන් දුම් කොළයක් ගැනීම ගම්මුනට මහත් කරදරයකි. "අපොයි! ගිනි කපුරු වෙළෙන්දා- ඔයාගෙන් කොහේ ද බඩුවක් ගන්නේ?" යන ආදිය ඔහු නිසා නිතර කියැවෙනවා අසන්නට ලැබේ.

සිංහලයකු වුව ද, රෙදි පොට්ටනි කාරයා නම් උත්සාහවත් වෙළෙන්දෙකි. ඔහු එළිපතක් දමු තැනක් නැර ගෙන්-ගෙට ඇවිදින්නේ ය. ඔහුට ද ගමේ වැඩි කොටස ණය ගැතියහ. එහෙත් ගොලු පුවක් කාරයාට මෙන් ණය ගැති උදවිය ඔහුට නම් හොඳ මුහුණක් තබා නරක මුහුණක් වත් නො දක්වති- ඔහු කෙරෙන් මුහුණ සඟවා ගන්නට උයම් කරති. පුවක් කාරයාට මෙන් නුවමාරුවට යමක් දීමෙන් ණය කෙටි කිරීමට ඔහු හා ගනු-දෙනු කරන්නනට විදියක් නැතිවීම ප්‍රධාන කාරණය වේ.

"අනේ! අනේ! සොපියෝ, උඹ යන හැටි, මාව නො දක්කා වාගේ! ඔය ඉණේ තියෙන කම්බායට වත් උඹ නව ම ගෙවලා



ඉවර නැහැ නොවේ ද? හොඳයි, හිංගල අවුරුද්දත් ළඟ නෝ? එතකොට වත් මගේ මූණ බැලේ ද කියා බලමු."

මේ ආදි වශයෙන් ඔහු මග හමු වන්නන්හට කියන ඇනුම්පද නිතර අසන්නට ලැබේ.

"ඔන්න බොල පොට්ටනි කාරයා එනවා." යන්න ද, තරුණ ගැහැනුන් බිය වද්දන්නට මේ ගම ඇතැම් මහල්ලන් සරදමට කියන පදයකි.

රටේ වෙන මිනිසුන්ගේ සිත් අලවන අන් කිසිවක් පෞරාණික විහාරස්ථානයක් නොහොත් හාස්කම් ඇති දේවාලයක් මෙහි නො මැත්තේ ය- යටත් පිරිසෙයින් හොඳ ජේන කාරයෙක් නොහොත් සාස්තර කාරයෙක් වත් මෙහි නැති. වරිච්චියෙන් හා කටු මැටියෙන් බිත්ති බැඳ, පොල් අතු සෙවිලි කළ පනහක් පමණ කුඩා ගඩොලින් ද, ගලින් බිත්ති බැඳ, හුනු කපරාරු කොට, තහඩු සෙවිලි කළ කිහිපයක් ගෙවලින් හා උළු සෙවිලි කළ, තරමක ගෙවල් කිහිපයකින් ද, සමන්විත වූ මේ ගම් ස්වභාවයෙන් ද දර්ශන සම්පන්න ස්ථානයක් නොවේ. පුද්ගලයාගේ ප්‍රමාණය ඉදින් වාසස්ථානයෙන් සලකනු ලැබේ නම් තිකිණියාන දුගී ගමකි.

තිකිණියානට අමුත්තන් වශයෙන් කිසියම් විටෙක ඇක්සයිස් මුලාදෑනියෙක්- මිනින්දෝරුවෙක් - රට මැද යන රටේ මහතෙක්- පැමිණෙන්නේ ය. පසුව කී දෙ තැනින් වන පීඩාවක් නැතත්, මුලින් කී ඇක්සයිස් මුලාදෑනියකුගේ පැමිණීම නම් මෙ ගමට මහ පීඩාවකි- මහා භීතියකි. එ දාට මුට්ටි පිටින් රා ගෙන ගොස් කැලේ සඟවන්නන් ගස්වල හැර කපන්නන්, අතුරු කපන්නන්, මල් උදුරා දමන්නන් මුට්ටි බිඳ ලන්නන් හා ඒ කිසිත් කර ගත නො හැකිව අඬු දරුවන් කැටුව, වල් වැද, සැඟවෙන්නන් ආදී වශයෙන් ගම්මුන්ගේ කලබල ඉතා මහත් වන්නේ ය.

තිකිණියාන ගම්මු කවුරුත් අන්‍යොන්‍යයෙන් හා ඥාති සම්බන්ධ-යෙන් යුක්ත වුව ද, පංති වශයෙන් පවතින නා නා ප්‍රකාර හෙද

ඇත්තෝ ය. මේ නිසා සුළු අඩ දබරයක දී පවා කුල මල ඇවිස්සෙන්නේ ය. නිකිණියාන සියල්ලනට ම සියල්ලන් තුඩ-තුඩ පවතින කුල මල ඇතිවත්, ඉදින්, කිසිවකුට අලුත් කුල මලයක් හැදෙන්නේ නම්, හිසෙන් මලක් පිපුණා සේ නො හොත් ගමට වරප්‍රසාදයක් ලැබුණා සේ කවුරුත් ඉතා ම සතුටු වෙති.

නන්ද රාළ නිකිණියානට පරණ කුල පතියෙකි. අවුරුදු උත්සවයකදී ඔහුට ලැබෙන බුලත් හුරුලු ගොඩ කරණ කොට, ගමේ ගෞරවය මහත් බව පෙනේ. ඔහුට ලොකු පොහොසත් කමක් නැති වත්, ගොඩින් රබර් අක්කර දහයක් ද, මඩින් කුඹුරු ලියැදි කිහිපයක් ද ඇත්තේ ය. ඔහු කවදත් සම්බ කිරීමෙහි නොව, සම්බ කර ගත් දෙය රැක ගැනීමෙහි නම් සමත් විය.

එ දා මාලිනියට කළ අපහාසයෙන් කිපුණු හෙතෙම පළි ගැනීම් වශයෙන් අන් කිසිවක් කර ගත නො හැකිව ගෙදර සිට ගෙන, දවස් කිහිපයක් මුළුල්ලේ මුළු ගමට ම බැණ වැදුණේ ය. අහලින් පහලින් පිරිමියෙකු යන කල නන්ද රාළ බැණුම ම බාල කරන්නේ ය- ඇතැම් විට , අසලින් යන්නා ළහට කැඳවා දුක් ගැනවිල්ල පැමිණිලි කරන්නේ ය.

“බලාපන් අප්පුවේ, මේ හරි වැඩ ද කියා. මන්න අප්පුවේ නො කීවෙයි කියන්න එපා- මන් හුනා කියන්නා වාගෙයි මේ කියන්නේ- මේ ගමේ අර දූප්පත් කෙල්ලට පද හදන එවුංට බලාපන් වහංගතියක් දමන්නේ නැද්ද කියා.”

මෙ සේ කියනු ලබන සමහරු සමහර විට කතා කරති- නො යෙක් විට, කතා නැතිව, කර බා ගන යන්නට යති. කතා කළාත්, නො කළාත්, ඔවුන් තුරන් වූ පැටියේ නන්ද රාළ බැණුම් නම් නොනවත්වා, යළිත් පටන් ගත්තේ ය.

නන්ද රාළ දොස් මුර දෙන වෙලාවට ගැහැනියක් බිහිරි නම් විනා, නො බිහිරි නම්, ඉතින් පෙනෙන තෙක් මානෙකින් වත් නො යන්නී ය. ගැහැනුන් දකින විට, ඔහු බණින බැණුම



මුද්‍රණයට පවා නොහොබනා කටුක භාෂාවකි. ඔහු බණින තරමක් සිය ගෙදර සිට ගෙන ම බණින හෙයින්, අන් හැමට ම වඩා, එයින් කන්දොස් කිරියාව, අසරණ මාලිනියට ම ය.

“සියාගේ බැණුම්, අහෙන්න ඕනෑ මිනිසුන්ට නො වෙයි ඇහෙන්නේ- මේ මොන එකක් ද? මට නොවැ මේකෙ කන ඇහිලා ඉන්න නැත්තේ? ඉතින් මදෑ සීයේ? ඕක ඔයින් නවත්තන්නකෝ” දවස් කිහිපයක් මේ ආදී නො යෙක් පින් සෙංඩුවෙන් කරුණු කියා මාලිනී යම්තම් මහල්ලා අස්වසා ගත්තා ය.

ඒ පදය හැදුණු තැන් පටන් දවස් ගණනක් ම මාලිනී මුළු ගැන්නී ගත් ගමන් සිටියා ය. වෙන දවස්වල අහල පහල නොයෙක් ගැහැනු නිතර ඇය දකින්නට පැමිණෙති- පන්සල් යන නො යන බව විමසන්නට පැමිණෙති- ගනු දෙනු පිණිස පැමිණෙති. දැන් කිසිවකු නොපැමිණෙන හෙයින් ඇයගේ කනගාටුවත්, ලජ්ජාවත්, දවසින් දවස ම ලිය ලන්නේ ය.

මාලිනියට ගමේ ස්ත්‍රී පක්ෂය නම් අන් හැමටත් වඩා සතුරු බව පෙනේ. මාලිනියගේ සුළු නො හොඳ පවා ඔවුනට මහමෙර සේ පෙනෙන්නේ ය. මහමෙර වැනි හොඳ පවා කොහෙත් ම නො පෙනෙන්නේ ය. අනෙකක් තබා ඇයගේ නමත් ගමට නො රිස්සෙන්නකි. මෙ වැනි නමක් ගමේ කියවුණු මේ පළමු වන වතාව ය. දරුවන්ට මෙ වැනි “ආර්ය නාම” තැබීමේ වැදගත් කම කියා පන්සලේ හාමුදුරුවන් දවසක් බණක දී, පුංචි රාළ නිදසුන් පිණිස දැක්කු නමුත්, “ඕවා අප වගේ මේ දූප්පත් නර පණුවන් දමා ගත්තා ම වස් වදිනවා නේද? හාමුදුරුවෝ කොච්චර කිවුවත් ඕක වැඩි හොඳක් වෙන්නේ නැහැ. කියන්නා කොහොම කිව්වත් අහන්නා සිහි මොලේ ඇතිව අහන්න ඕනෑ. කියමින් එවිට ද, කවුරුත් ඊට විරුද්ධව කතා කළා ය.

මාලිනියගේ මෑණියන්ගේ නො කල් අදිසි මරණයත්, මේ නම නිසා වැදුණු වසකැයි සලකන ලදි. නැවත පියා ද අදිසියෙන් මළ

කල ගම්මුන්ගේ මෙ ගම් මතය දේව මතයක් මෙන් සිද්ධාන්ත විය.

"අපි කිවුවේ නැද්ද? තවත් බලා පල්ලාකෝ. මොනවායින් මොනවා වෙලා ද කියා නවතින්නේ." මෙ සේ කියමින් බොහෝ දෙනා නමට දොස් නැගූහ.

"නොදකින්, එයාගේ සිදේවි කං, තුන් වයසින් එක වයසක් යන්න ඉස්සෙල්ලා අම්මායි-අප්පායි දෙන්නා ම කා ගත්තා" සමහරු මෙ සේ කියමින් ඇයගේ ශෝභන දේහ විලාසයට අගරු කළහ.

මාලිනියට අගුණ වශයෙන් මෙ තෙක් කියැවුණේ ඇයගේ "හැට පැහිච්ච කමේ" වැරැද්දත්, රූමත් කමේ වැරැද්දත්, නමේ වැරැද්දත්, පමණකි. එ සේ ම ප්‍රවෘත්ති පත්‍ර හා පොත් බැලීමේ පුරුද්දත් ඇයගේ බලවත් නොහික්මුණු කමක් හැටියට සමහරු කල්පනා කළහ.

"අපට වත් නෑ, තථ ම පත්‍රයක් තැපැලෙන් එන්නේ. ඒකට මොකෝ- බලාපියව් කෝ නන්ද රාළගේ මිනිබිරියට එන තැපැල්!" මේ වතාවත් ගමේ ප්‍රභූ වරයකු සේ ගැණෙන්නකු කළ කතාවකි.

ගමේ නූගතුන්ගේ මෝඩ සිරිත්-විරිත්වලට උපහාස කරන සිරිතක් ද, මාලිනිය කෙරේ පැවැති බැවින් ඇතැම් මැහැල්ලන්ට ද, මහල්ලන්ට ද, ඇය පෙනෙන විට, ඇසේ කටු ගසන්නාක් මෙන් විය. "දූන් කොහේ ද ළම්ස්සියෝ? දූන් ඉන්නේ හැට පැහිච්ච අම්මලානේ! මේ ළම්ස්සියන්- එක්ක කතා කර ලා දූන් පුළුවනැයි බේරෙන්න?" මේ ආදි අනියම් අපවාදයන්ගෙන් ද, ඇතැම් විට වඩාත් නියමයට ම "ඒකට මොක ද, මත් දන්නේ නෑ.නන්ද රාළගේ මිනිබිරියට සම කරන්න තෙයියක්" යනුවෙන් ද වැඩිහිටියෝ දොස් කීහ.

මාලිනියට කුල මලයක් කියන්නට ප්‍රස්තාවයක් නැතිව සිටි ඇතැම් ගම්මුන්හට අරණායක සිද්ධිය දෙව බලයකින් ජනිත වර



ප්‍රසාදයක් මෙන් වැටහිණි. ගැනු, තමනට හිතෙන-හිතෙන හැටියෙන් බිසි ද වකිතයක් නැතිව මේ අරණායක සිද්ධියට නානාප්‍රකාර විවරණයන් කළහ. ඉඩ ලැබුණු හැම තැන දී ම, අන්දා පමණක් මාලිනියගේ නිදහසට කතා කළේ ය. එක ගැහැනු කටක රාවයට පිරිමි කට සියයකුත් නොපිරිමැසෙන කල ගැහැනු කට සියයකට අසරණ අන්දාගේ වැනි එක පිරිමි කටත් කෙ සේ නම් පිරිමැසෙන්නේ ද?"

"මේ ගමේ ඉන්නවාට වඩා හොඳයි මේ ගම අත් හැරලා යන එක. මේ කවුරුනුත් බලා ගෙන ඉන්නේ හොඳ කෙනෙකුට පදයක් හදන්න යම්තම් ඉඩක් ලැබෙන කන් තමා. ඉතින් ඉඩක් ලැබුණු හැටියේ, අං දහසක් කඩා ගත්තා වාගේ වාරං කිය-කියා නටනවා. ඕක තම යි මේ ගමේ කාටත් කරන්න පුළුවන් හපන් කම" මේ ආදී දෙය කියවමින් මාලිනී නිතොරව ම පාහේ ළ තැවිල්ලෙන් පුවා ය.

මාලිනී මේ පමණක් නොව. තරුණයා ගැන ද ළ තැවිල්ලෙන් පසු වුණා ය. තරුණයා තමනට හමු වූ දෙ වතාවේ ම මාලිනී නිකම් ඉටි රූපයක් මෙන් නිසොල්මන්ව, නොසිටි තැනැත්තී, ස්ත්‍රී මායමක සැටියෙන් කෙ සේ වුවත්, ස්වකීය චිත්තාභ්‍යාසයට අනුරූප වශයෙන් රූපය ආයුධය කොට ගෙන, ඔහු පෙළුවා ය. රූපය ආයුධය කොට ගත් ස්ත්‍රිය, කඩකැත්ත කෙළි බඩුව කොට ගත් ළදරුවකු මෙන් ද වන හෙයින් දූන් එයින් තුවාල වූ සිතින් ඈ පසු වන්නී ය.

"එ දා ජාතික ඇඳුමෙන් සිටිද්දී වාගේ නො වෙයි. දූන් නම් මේ තරුණයා අපට කොහෙත්ම ගැළපෙන්නේ නොවේ. ඔහු උසස් තරුණයෙකි. ජාතික ඇඳුම ද හඳින නිසා නිහතමාන අදහස් ඇත්තකු බව සිතිය හැකි යි. කලිසම්-කෝට් ලා ගත් හැම තරුණයෝ ම රට ජාතිය වෙනුවෙන් වැඩ නො කරති. එහෙත් ජාතික ඇඳුම ලා ගත් හැම තරුණයා ම රටට ජාතියට ආදරයෙන් වැඩ කරන්නෙකි. ඒ ඇඳුමට කෙ සේ වෙතත්, ඒ තරුණයන්හට මම නම් ඉතා ම කැමැත්තෙමි. මේ තරුණයා, ඈ හිතැත්තෙක්

නම් ඔහු පංති භේදයක් නො දකින්නෙකි. සමහර විට, ඔහු ඒ මොටෝ රිය පවා එදා තකහණියක් නතර කොට, මට කතා කළේ මේ සමානාත්මතා ගුණය නිසා විය යුතු ය. ඔව්, ඔහුගේ අන් කිසි නො මනා අදහසක් නිසා නො වේ.

"ඉතින් අපේ ගමේ නූගත් මිනිස්සු මේ කිසිවක් ගැන නො දනිති. ඔවුහු ද මා මෙන් පොත්-පත් කිය වත් නම්, වර්තමාන ජාතික ප්‍රබෝධය ගැන දනිත් නම්, මහා ජන සේවය ගැන දනිත් නම්, ජන සමාජයේ හැසිරෙන සැටි දනිත් නම්, මේ තරුණයකු තරුණියක හා කතා කළ විකට මෙහෙ ම වැඩ නැති ඕපාදූප නො කියති. මේ ගමට මගේ විතරක් මෙවා දකීම මහ අපලයකි. මාත් පොත-පත නො බලා මෙවා ගැන කිසිවක් නො දැන, නූගත් කමේ ම ගැලුණු ගමන් සිටියා නම්, හිතට මේක මෙ තරම් කරදරයක් වෙන්නේ නැත- මේතේ නෝබිනා කම් තරන ගෑනු කොපමණ ද? ඒ එකියකට වත් මට විතර විලි ලජ්ජා නැත- ඒකට මොක ද, විලි ලජ්ජා නැති ගැහැනියක හැටියට කවදත් ගමේ ප්‍රසිද්ධ මා පමණකි- මට සබකෝලය නැති කම, විලි ලජ්ජා නැති කම යයි ඔවුන් වරදවා තේරුම් ගෙන තිබේ."

ඇක්සයිස් මුලාදෑනියකුගේ ගම් වැදීම තවමත් මෙහි ඇතැම් ගැහැනුනට කැලෑ වදින්නට සිත් දෙන කාරණයකි. මේ මුලාදෑනි නිවැරදි තැන් වලට ද අයුත්තේ වරද පමුණුවතැයි ඔව්හු කියති. ඇක්සයිස් මුලාදෑනියකුගේ තබා අන් කෙබඳු වූ මුලාදෑනියකුගේ නමුත් තිකිණියානට පැමිණීම මාලිනියට නම් හැකිළෙන්නට හෝ පැකිළෙන්නට හෝ කාරණයක් නොවේ.

නන්ද රාළ කිසි කලකත් හොරෙන් රා මැදීම වත්, විකිණීම වත්, නො කළේ ය- එ හෙයින් ඇක්සයිස් දෙපාර්තමේන්තුවේ කිසි පොතක-පතක ලියැවුණු නම නො මැත්තේ ය. එ පමණක් ද නොව, කිසි ම දවසක, ඔහුගේ වත්තට ඇක්සයිස් මුලාදෑනියෙක් අඩිය වත් නො තැබුවේ ය. කරුණු මෙසේ වුව ද ඇක්සයිස් පරීක්ෂකයකු ගම් වැදුණු කෙණෙහි, ඒ ප්‍රවෘත්තිය ඔහුට ද ලැබෙන්නේ ය. මුළු ගමේ ම එය විදුලි පණිවුඩයක් සෙයින්



නොහොත් මළ- ඉළවුවක් සෙයින් ගෙයක් දොරක් පාසා පැතිරෙන්නේ ය. මළ-ඉළවුව ද, ඇක්සයිස් කලබලය මෙන් ම, මෙ ගම, ඉතා වේගයෙන් පැතිරෙන්නකි. මරනයක් වූ කෙණෙහි ගමේ සියලු වැඩ අත් හරිනු ලැබේ. සමහරු ගෙවල ලිපි ගිනි මෙළවීම පවා නොකරති. සමහරු කෑම්-බීම් වලින් වළකිති.

එ දා, ඇක්සයිස් පරීක්ෂකයකු ගම් වැදුණු බව නන්ද රාළට ද සැළ විය. ඔහු එය කිසි ගණනකට නො ගත්තේ ය. "ගවයින් නැති අප මොට ද බත් කොටිංට ඔය හැටි බය වෙන්නේ?" කියා, ඔහු ආරංචියට ඇහුම් කන් දෙන බවක් වත් නො පෙන්වා, ගෙදර වත්තේ කෙසෙල් වළවල් කපමින් සිටියේ ය. ඔහුගේ ගෙදර ද, මේ වේලේ කිසිවෙක් නොවූහ. ගත වූ දින කිහිපයේ ම නොනා, නෑඳ, කලකිරුණු සිතින් පසු වූ මාලිනී මේ දින, වත්ත පහළ වෙලේ ලිඳට නාන්නට ගියා ය. වෙලාව පස්වරු එකොළහ පමණ විය. හොඳට අව්ව පායන - වැසි නැති දවසක් වූයෙන් වැඩ කැමති නන්ද රාළට ද මේ දින ප්‍රීතියකි. ඔහු කෙසෙල් වළවල් කිහිපයක් කපා, සරුවාලේ හිණ බැඳ ගත් හුනු- පුවක් මඩිසලය ගෙන විට කන්නට ලෑස්ති වන කල්හි, තම වත්තේ, ඉදි කඩුල්ල සමීපයෙහි ඇක්සයිස් පරීක්ෂකයකු සිටිනු දැක, පුදුම විය. "මොකද බොල, මේ කවදාවත් නැතුව, ඇක්සයිස් කාරයෙක් මෙහෙ එන්නේ?" කියා නන්ද රාළ තමාගෙන් ම ප්‍රශ්න කරමින් "අපට විරුද්ධව කවුරු නමුත් බොරු ගතුවක් ද කොහේ ද කියා ලා තියෙනවා. ඔව්, මේ එන්නේ, කාගේ ද ඉගැන්නුම් බහකට තමයි. නැත් නම් මා කවද්ද රා වික්කේ" මා කවද්ද රා මැද්දේ?" කිය-කියා කන්නට ගත් විට ද නො කා, ඉස් පාසුවක් නැතිව මුලාදෑනියා ඉදිරියට ආවේ ය. ඔහුගේ සිතේ පවතින කැළඹීම, දහඩිය මහන්සියෙන් අවංක ජීවිකාව සරිකර දුන් සිහින් කේඩා පොටවල් වැනි තහර වැල් ඉල්ප නැඟී ගත් සියලඟ සැලෙන සැටියෙන් පෙනිණි.

"අනේ! හාමුදුරුවනේ, අපි මේ නොපණත් කම් කරන මිනි-ස්සු නො වෙයි. මා උපන් තේකට රා පොදක් මැද ලා වත්, රා

පොදක් විකුණලා වත් නැහැ. හාමුන්නාන්සේට මේ කියා තියෙන්නේ කවුද බොරු ඉගැන්නුම් බහක්- කැමති නම් ඇවිත් ගෙය සෝදිසි කර ලා උණත් බලන්න." යයි නන්ද රාළ නිහත මානි ලෙස කීයේ ය.

එ කල, මේ මුලාදැනියා යම්තමට සිනාසී, සුරාබදු දෙපාර්තමේන්තුවේ මුලාදැනීන් මෙන් රළු බැල්මකින් නො බලා හික්මුණු නිරහංකාර කරුණාවත් බැල්මෙන් මහල්ලා හිස පටන් දෙ පතුල දක්වා බලා, අනතුරුව "එහෙ නම් මෙයා තමයි ඇයගේ සීයා" යන්න තමාට ම ප්‍රත්‍යක්ෂ කර ගත්තේ ය.

"ලොකු උන්නැහේ හිතන්නේ, මා ඇක්සයිස් කාරයකු කියා ලායි. මං ඇක්සයිස් කාරයෙක් නො වෙයි. ඒ නිසා ඒ අයින් බයක් වෙන්න කාරියක් නැහැ"යි ඔහු පැහැදිලි බසින් කීයේ ය.

නන්ද රාළට ඒ වචනයෙන් ම සිත උපන් බිය දුරු වී ධෛර්යක් ඇති විය. කලිසම් කාරයකු තමා වැනි මහලු ගැමියකුට "ලොකු උන්නැහේ" කියා කලාතුරකින් වත් කතා නො කරන බවත්, තමා වැන්නකට ඔහු දිලග තිබෙන ඉතා ම හොඳ වැදගත් වචනය "ලොක්කා" යන්න බවත්, මීට වැඩි වැදගත් කමක් දක්වන්නට තරම් වැදගත් කම් කලිසම් කාරයා ළඟ නැති බවත්, නන්ද රාළ දන්නේ ය.

කලිසම වැදගත් කමට ලකුණක් නො වේ- නවීන කමට ද ලකුණක් නො වේ. එය ඉංගිරිසි දන ගත් කමට ලකුණක් වශයෙන් ගැනීම කරණකොට කාහටත් පොදු විය යුතු මේ ඇඳුම විශාල පිරිසකගේ ද්වේෂයට කාරණය විය- ඉංගිරිසි නො දත් හැම දෙනාට ම පීඩාවක් ද විය. විශේෂයෙන් ම ඉංගිරිසි පමණක් නො දත්, එහෙත්, සෙසු හැමකින් ම වැඩිහිටි අධිකතර පක්ෂයකට ද, මෙයින් පීඩා ඇති විය. කලිසම් ලා ගත් පුතාට, මේ කලිසම ලා ගැනීමට උදව් කළ පියා පිළිකුල් විය- එවැනි ම වූ බාල සොහොයුරුට වැඩිමහල් සොහොයුරු පිළිකුල් විය. මහතුන් ලා ලත් කලිසම් නො මහතුන් ලා ගෙන, මහතුන් වෙස් ගත් නිසා



හට ගත් මේ කලබලයෙන් කලිසම් නො ලා ගත් මහතුන්නට ද කලිසම් ඉන්ද්‍රජාලයක් සේ දනිති. අලුත් කලිසමටත්, පරණ රෙද්දටත්, අතර "ජාතික ඇඳුම" නමින් අමුතු ඇඳුමක් ප්‍රචාරයට පැමිණ වීම ඇතැමකුට අභිමත වී නම්, හේ බයක් හෝ සැකයක් හෝ පිළිකුලක් හෝ නැතිව, උභය පක්ෂයට ම සම ගෞරවයෙන් නැගිරෙනු හැකි සාධාරණ භූමියක නිර්මාණය කරන අභිප්‍රායයෙන් විය යුතු ය. එසේ නම්, එය ඉතා ම ප්‍රශස්ත ය. එහෙත්, අදහස පමණට ඇඳුම ප්‍රයෝජන නො වීම පරිශ්‍රමය නිෂ්ඵල වීමට කාරණය වන්නේ ය.

වැඩි හිටි අඩංගු මිනිසුන් හෙළා-කළා කතා කිරීමට කලිසම ලයිසන් කර ගත් ඇතැමකුට ආංඩුවේ කිසි යම් පුර නිල-තලයක් ද ඇත්තේ ය. එ හෙයින් මේ සිය කෙනාට පෙනෙන කාකී පැහැය. ඒ බිය ගෙන දෙන නාපුරු නිලතලයට ලකුණ නො වන බව දන ලත් කොණේහි මහල්ලා කුරු කරනකු හා කතා කරන්නා වැනි අවදානමෙන් නොව මිනිහකු හා කතා කරන්නා වැනි ප්‍රදානමෙන් කතාව පටන් ගත්තේ ය.

"ඉන්න, මහත්තයාට කියංඩ, මගේ ඇගේ ලේ නැතුව යි හිටියේ. මේ දන් හැම තැන ම පතළ උණා, ඇක්සයිස් කාරයෙක් ආවයි කියා. මන් මේ කියන්නේ ඇත්තමයි මහත්තයා- අපි මෙහෙ ම හිටියාට අපේ ඉඩම්-කඩම්වලට එහෙම මුලාදැනි එනින්නේ නැහැ. අපට බයේ නො වෙයි- අපි කවදා වත් එහෙ ම වැරදි කරන මිනිස්සු නො වෙයි. ඉතින් මහත්මයා මේ මොක ද? මේ බැරක් ද?" නන්ද රාළ ප්‍රශ්න කළේ ය.

"මේ මිනිස්සු ඇක්සයිස් කාරයෙක් කියා, එහෙනම් රැවටෙන්න ඇත්තේ මට තමයි. මා ඇර වෙන කවුරුත් වත් අද මෙහෙ ආවේ නැහැ"යි කාකී කාරයා ද අනෙකක් කියමින් පිළිතුරු පමා කළේ ය.

"ඔව්, ඔව්, වෙන්න පුළුවනි."

"ලොකු උන්නැහේට මා අඳුනන්න බැහැ- නමුත්-" කියා කාකි කාරයා නිශ්ශබ්ද විය.

"ඉතින්!"

"මට ලොකු උන්නැහේ හඳුනතැකි."

මහල්ලා සිනා සුණේ ය. නැවතත් ඔහු හුනු-පුවක් විට කෑමට ලැස්ති වුණේ ය. ඔහු දත් නැත්තකු බැවින් බුලත් විට සාදා අල්ලේ දමා අනෙක් අතේ මහපටහිල්ලෙන් පොඩ කරන සැටි අමුත්තා පුදුමයෙන් බලා සිටියේ ය. එසේ පොඩි කර ගත් විට, නැවත කටේ ලා ගෙන තලු ගසන සැටි ද බලා සිටියේ ය.

"ඉතින් මහත්තයා මා අඳුනන්නේ කොහොම දැයි?" ගැට බැඳි රළු අතුල් මදිමින් මහල්ලා ඇසුවේ ය.

"මා ලොකු උන්නැහේ දැක්කා එ දා වේල් පොළේ දී"

"ඔව් මත් පසු ගිය දා වේල් බලන්න ගිහින් හිටිය එක නම් ඇත්ත යි."

"ලොකු උන්නැහේගේ මිනිබිරියට එ දා වේල් බලන්න උදව් වුණේ මා තමයි."

නන්ද රාළ විස්මයානුකූල විය. ඔහු මේ කිසි කලකත් දකින්නට බලාපොරොත්තු නුවූ පුද්ගලයෙකි- අසන්නට බලාපොරොත්තු නුවූ වචනයකි. මේ කදිම පෙනුමකින් යුත් නිහතමාන තරුණයා තමා සොයා පැමිණියේ, නවාතැනක් පිණිස යයි ඔහු කලින් සිතුවේ ය. මේ පලාතේ යන එන ආගන්තුකයෝ නවාතැන් ගැනීමට සුදුසු තානායමක් නැති බැවින් නොයෙක් විට ගම්මුන් පිහිට සොයති. මේ එ සේ නවාතැනක පිහිට සොයන්නකු නොව, තම මිනිබිරිය දුටු ඇඳුනුම් කම් සොයා පැමිණි කොළඹ තරුණයා බව දැන ගත් කෙණෙහි, ඔහුගේ බැම සහළ පුදුමයෙන් උඩ නැගුණේ ය. ඔහු දෙ තොල් එකලස් කොට, සිහින් කෙළ පහරක් ගසා, අඳුරු නෙත් සහල දල්වා, තරුණයා දෙස හොඳ හැටි බැලුවේ ය.



"ඕක තමයි, මං කියන්නේ- හූනා කියන්නා වාගේ මත් කියන්නන්, මහත්තයා තේ ද, මේ පසු ගිය දාක අපේ ළමයා අරණායක දී දැක ලා කතා කෙළේ?"යි ඔහු ප්‍රශ්න කළේ ය.

"අන්න හරි"

"අන්න හරි තමයි මහත්තයා. ඒකෙන් අපේ ළමයාට ගමේ ඉන්නත් බැරිවෙලා තියෙනවා. අනේ! හැදිලා තියෙන පදයක් හැටි" මහල්ලා නො මනාපයෙන් කීය.

තරුණ ජයපාලට ඇත මැත බැලිණි. අන්දා කී සියල්ල කරුණු රහිත නො වන බව දැක, තමා ඒ ගැන දන්නා බව අඟවමින් ඔහු කතා කළේ ය. තරුණයා මේ සියල්ල දැන ගත්තේ කෙසේ ද යන්න සලකා ගැනීමට අපොහොසත් වූ මහල්ලා එවිට ද පුදුම විය. අන්දාගෙන් මග අසා දැන ගත් සැටිත්, මාලිනිය කෙරේ නගන ලද කුල මලය ගැන අන්දා තමාට කී සැටිත්, තරුණයා මහල්ලාට නොවළහා කීයේ ය. මහල්ලා ද සියලහ මුළු බර එක කකුලකට ගෙන ඇල ගසා ගත් ගමන් සිට, අතක් තුනටියට දී, අතකින් නිකට කසමින් උඩ බල-බලා සියල්ල ශ්‍රවණය කළේ ය. තමා එහි පැමිණියේ ඔවුනට හිතවත් කමෙන් බවත්, මේ අපවාද සන්සිඳුවන බලාපොරොත්තුවෙන් බවත්, වෘද්ධයාට වැටහෙන ලෙස ඔහු කරුණු කීයේ ය.

"මේවා සංඩු සරුවල් කර ගන්න වැඩ නො වෙයි, ලොකු උන්නැහේ."

"මේවා තමයි මහත්තයා, අපට මිනී මරා ගන්න වැඩ, මේ ගමේ මිනිස්සු මහ නරක මිනිස්සු. දැන් මේ මහත්තයා ආව ගමන ඇති. තව පදයක් හදන්න" නන්ද රාළ නැවතත් උස්හඬින් කීයේ ය.

නන්ද රාළගේ මේ වචනයෙන් කා වැදුණු සිතැහි ජයපාල තරුණයාට මේ ගමනින් තමා කරන්නේ ගිනි නිවීමක් නොව, තව-තවත් ගිනි ඇද්දීමක් බව කල්පනා විය. එහෙත් කැදර කම

බලවත් බැවින් අනූනට වන පාඩුව ගැන ඔහුට කිසි බරක් නො දුනේ. තරුණ වයස ඇතැම් විට සදාචාරයට අතිශයින් ම අහිත කර වූ සතුරෙකි. ශිෂ්ටාශිෂ්ට ධර්මයන් පිළිබඳ විශේෂ විභාග තත්ත්වාකාරයෙන් සැලකීමට තරම් පොහොසත් කම් ඇති වන් නොයෙක් විට තරුණ සිත ජාත්‍යන්ධයකු මෙන් කිසිවකටත් කිසි තැකීමක් නො කොට, ආත්ම ලාභ විෂයක තෘෂ්ණාවක් සෙවීමෙහි ම ආසන්න වන්නේ ය. සිද්ධි ලාභය අපේක්ෂා කරන ස්වෛච්ඡාව තදාසන්න විපාකය නො දකින්නේ ය. එහෙයින් වංක සිතින් ම අවංක සිත දක්වා හේ නොයෙක් වචනවලින් කනගාටුව ප්‍රකාශ කළේ ය.

මහල්ලා වයසින් පැහුණ ද, නුවණින් නො පැහුණ ළාමක පුරුෂයෙකි. මේ තරුණයා ළපටි බාලයකු වුව ද, තමාට වඩා නුවණින් වැඩී සිටියකු බැවින් දනමුතු කම් ගැනීමට කල්පනා කළ මහල්ලා තවත් කෙළ පහරක් ගසා කට සිස් කොටගෙන, ගෙය දක්වමින් හිඳ ගැනීමට කැඳෙවුවේ ය.

ජයපාල තරුණයා රජ ගෙදරට කරන කැඳවීමක් මෙන් උනන්දුවෙන් බලා සිටි මේ ආරාධනය මහල්ලාගේ කටින් පිටවූ ඇසිල්ලේ බලවත් ආසාව වසන් කොට ගෙන, නොකැමැත්තෙන් මෙන් ඇලි-මැලි කරමින්, ගෙය දෙසට පා නඟන්නට විය.

නන්ද රාළගේ ගෙය ද මේ ගමේ සැහෙන්නන්ගේ සෙසු ගෙවල් මෙන් ඉතා ම පරණය. හොඳ ලී-දඬුවලින් කල් පවතින්නට සැලකිල්ලෙන් ගොඩ නංවා, උළු සෙවිලි කොට හුනු කපරාරු කරන ලද හෙයින් ගමේ තරමට මෙහි ද වැදගත් කම හා පොහොසත් කම නො මඳව පෙනේ. පිරිසිදු හෙයින් සැලකිලිමත් කම ද පෙනේ. මේ ඉඩම පාරේ පටන් පහළ වෙල දක්වා, පිළිවෙළින් ගිය බෑවුමක් වුවත්, ගෙයත්, ගෙ-මිදුලත්, පිහිටි කොටස, උස්-මිටි කමක් නො පෙනෙන සම භූමියකි. මිදුලේ තැන-තැන වල් ගොමු ද විය. මේ, මෙ ගම, මේ ගෙදර පමණක් දක්නා ලැබෙන විශේෂයකි. ගෙ-මිදුල සීමා කොට වතු-සුද්ද මල් යායක් ද හාත්පස පිහිටියේ ය. මේ ගෙය, පල දෙකකින් වැසුණු එක ම



පියස්සකින් යුක්ත ය. පෙර දොරත්, පැල දොරත්, හැර උභයාංශයෙන් නම් කිසි ද ප්‍රවේශනයක් නොවී ය. එහෙත් උභයාංශයෙහි මුදුන් වහළට ළංව පිහිටි කවුළු කුට්ටම බැගින් ඇත්තේ ය. එයින් වාතය හා එළිය ලැබුණා පමණකි. උස වැඩි ම නිසා එයින් බැලීම නුපුළුවන. ඇතුළෙන් පිටත බැලීම හෝ පිටතින් ඇතුළ බැලීම පරණ කුල සිරිත් අනුගමනය කරන්නන්හට අනභිමත වූ බැවින් මේ කවුළු පුරුෂ ප්‍රමාණය ඉක්මවා පිහිටුවන ලද බව පෙනේ. දොරින් සරනේරු සිට පැදෙන හරහට බෙදුණු වාම් දොර-පළු ජෝඩුව බැගින් එකි-එකී දොරකඩකට ආවරණය පිණිස විය.

සමන්ගිර හා මෙ තැන, පෙනෙන වෙනෙස කොතරම් ද? සමන්ගිර තරමට සමන්ගිර රැකෙන්නා මෙන් ම, මෙ තැන තරමට මෙ තැන ද රැකෙන්නේ ය. සමන්ගිරට, සමන්ගිර වැසියන් ප්‍රිය කරති. සමන්ගිර මෙන් ම මෙය ද සිත්-පිත් ඇති, ආත්ම ගෞරවය ඇති වැදගත් කම් ඇති මිනිසුන්හට සෙවන දෙන තැනකි- සැනසීම දෙන තැනකි.

තරුණ ජයපාල මිදුලට ඇතුළුව, මිදුලේ පසකින් පිහිටි ගැඹුරු ළිඳට කර පොවා, කැටපතක් ඉදිරියට වන් ළඳ බොළඳ තරුණියක මෙන් නිශ්චල ජලය මතුයෙහි වැටුණු ස්වකීය ඡායාව දෙස ඕනෑ කමෙන් බැලුවේ ය. සමන්ගිරේ නම් සියලඟ එක පැහැර දක් වන මහ කැටපත් එමට ඇතත් සමන්ගිරෙන් ආවාට පසු ඔහුට තමා දකින්නට ලැබුණේ මේ ළිං පතුලේ ය. මේ ළිං පතුලෙන් පෙනෙන්නට වූ ස්වරූපයෙන් පවා ඔහු මේ වේලේ සියලඟ සකස් කර ගත්තේ ය.

තරුණ ජයපාල ඉතා ම දර්ශන සම්පන්න පුද්ගලයෙකි. ඔහුගේ මුදුම මුහුණ හෙවත් සම්පූර්ණයෙන් මුඩු කරන ලද රැවුළ ඇති මුහුණ, තව ම ළමා පෙනුමෙන් යුතුවත්, ඔහු නියම පුරුෂ ප්‍රමාණයට වඩා උස ය. දෙ නෙත්- දෙබැම- කට- නැහැය- නිකට- නළල - සවන් හා සවන් මුල් කිසි ම වරදක් දකිය නො හැකි තරමට සිත් පිණවන සුළුය. ඔහු සිනා සෙන විට, ඉතා ම

ප්‍රසන්න ය. එ කල ඔහුගේ මුතු වන් දීප්තිමත් දසන් මොනවට දක්වේ. ඔහු පැහැයෙන් තළෙළු ය. දේහයෙන් නිරෝග ය. ශක්තිමත් ය. ඔහුගේ කථාව ද ඉතා ම ව්‍යක්ත ය. ඊට විශේෂයෙන් ම ව්‍යක්තිය ලැබෙන්නේ, දීප්තියෙන් තීක්ෂණ වූ දෑ නෙත්‍රයෙනි. කටින් කරන කතාවට වඩා ඔහු ඇද නෙතින් කරන කතාවට මිනිස්සු වසඟ වෙති.

“මෙහෙ හොඩ කෑරට වෙන්න ලිං බොහොම ජනුරු යි. වෙල පහලට වෙන්න තමයි ලිං වතුර ළඟ.” තරුණයා ලිඳට නැමුරු වුණ දුටු මහල්ලා කීයේ ය.

“හාමුත් මේ වතුර, වෙල් වතුරට වඩා හොඳ වෙන්න ඕනෑ” යයි තරුණයා කීයේ ය.

“ඔව්, අපි බොන්න කරන්න ගන්නේ මේ වතුර තමයි.” මහල්ලා ද එය අනුමත කළේ ය.

තාන්ද රාළ පළමුවෙන් බරාඳයට ගොඩ වී එහි ඉතා ම හොඳ ආසනය සකස් කොට, තරුණයාට පිළිගැන්නුවේ ය. තරුණයා එහි වාඩි විය. ඔහු හිස් වැස්ම ගළවා කිස්සියේ පටි කරන ලද ගෝනා අං කට්ටුවේ එල්ලා, ආසනයෙහි හාන්සි වූණේ ය.

ඔහුට විඩා සන්සිඳුවා ගන්නට හැර, මහල්ලා ගෙට ගියේ ය. තරුණයාගේ කයට නම් දැන් විශ්‍රාමය ඇතත් සිතට නම් කිසි ම විවේකයක් නැති. මහල්ලා දැන් තමා ආ පවත් මාලිනියට කියනු විය යුතු ය යි, ඔහු සිතුවේ ය. දැන් ඈ නො පමාවා තමා දකින්නට එන්නී යයි ද ඔහු සිතුවේ ය. එ සේ සිතමින් ඔහු සිටින්නේ මහත් සන්වේගයෙනි. තරුණ සිරිතට අනුව, මණමාලියක් දක ගන්නට ගිය මණාලයකුට වත්, මෙ තරම් කොහොල් කමක් ඇති නො වන්නේ ය. ඔහුට කපුද එන බව ශ්‍රවණය විය. නො අනුමානයෙන් මේ මාලිනිය වනැයි සිතා, ඔහු සන්සුන් විය- රඟ මඬලක තිරය රොත් වන කල පිරිස සන්සුන් වන්නාක් මෙන් සන්සුන් විය.



“හාමුණේයාට බොහොම ගමන වෙහෙස ඇති නොවැයි?” කියමින් තාන්ද රාළ ඇස්ස ගැසූ නැඹිලි ගෙඩියක් ගෙනැවිත් පිළිගැන්නුවේ ය.

සඳ රැසින් බඳ වැටී කිරි මුහුද මෙන් වූ පොත් ඉපිළුණු ඔහු සිත, නැවත මහල්ලා දුටු කෙණෙහි, රාහුගෙන් පීඩාවට පත් සඳ ඇති කලෙහි මෙන් කිලා බැස්සේ ය. එ සේ ද වූව, ඔහු එය ප්‍රකට මුහුණෙන් පිළිගෙන මේ කැන තමා නො පිළිගන්නා දෙයක් නැත්තා සේ, මද-කුඩ, නොපැකිල පානය කළේ ය. කාලය ගත කරනුවට වෙනුව, ඔහු මහල්ලා පම්බ නොයෙක් දෙය ගැන කතා කරමින්, දැන්-දැන් මාලිනිය එතැයි මොහොතක් මොහොතක් පාසා බලාපොරොත්තු වූයේ ය. එහෙත් මාලිනී නො පැමිණියා ය. “ඇය නො එන්නේ මන් ද? කොහොල් කම නිසා වත් ද? එසේ නම් එය තමා විසින් දුරු කට යුතු ය” මේ සේ සිතමින් ඔහු මාලිනිය ගැන මහල්ලාගෙන් ප්‍රශ්න කරන්නට කිසිව වරක් ම කට ගත්තේ ය- ඒ කට ගත්-ගත් කිසිව වාරයෙහි ම මන්දෝත්සාහයෙන් පසු බැස්සේ ය.

ඔහුගේ මේ කතාවෙන් තාන්ද රාළට කිසි ම ගත ප්‍රශ්නයක් නැති. පීඩාදුව කතා කියන ගම්මුන්ගේ කට ඊට කර ඊට බඳින උපායක් තරුණයාගෙන් නො පළවන බැවින් ගෙයි කැළඹුවනට ගෙත්තු වී සිටි මහල්ලා එහි ද තුන් වරක් ම සිට පිරිමදිමින්, ලුණුම් නැති බඩ දක්වා කැන-කැන සිටි කෙසෙල් වළ දෙස ද බැලුවේ ය.

තමා පිටු දකින තැනැත්තෙන් මහල්ලා පසු වන බව ජයපාල තරුණයාට ද පෙනෙන්නේ ය. මාලිනිය නො දක ඔහුට නම් මෙ තැනින් යා ගත නො හැකි ය. මහල්ලා කතාවෙහි බැඳෙන තාක් ඔහුට ද මෙහි රැඳෙන්නට පුළුවන. නො එසේ වූ කලෙහි ඔහුට කතාව පමණක් නොව, මාලිනිය දකින බලාපොරොත්තු ද කඩ වන්නේ ය. කතාව කඩ වීම පාඩුවක් නොවේ. මෙ වැනි මහල්ලකු සමග කරන කතාව ඔහුට පීඩාවකි. මිණී මුතු සොයන රිසින් අඹිල මඩින්නකු මෙන් මාලිනිය දකින රිසින් ඔහු මහල්ලා හා මේ කතා කරනු පමණකි.

ඔහු ගමේ තොර-තුරු විචාළේ ය- දෙශ ගුණය ගැන විචාළේ ය- ගොයිතැන ගැන, රබර් මිල ගැන මහල්ලාගේ එළ-ගොන ගැන ද විචාළේ ය. මහල්ලාගෙන් ඒ හැම දෙයකට ම සුදුසු පිළිතුරු ලැබුණේ වී නමුත් ඒ පිළිතුරුවල කිසි ම ප්‍රසාදයක් නො වී ය. ඔහුගේ ඉතා ම දිග ප්‍රශ්නයට පවා නොයෙක් විට, මහල්ලාගෙන් ලැබුණු ඉතා ම දිග පිළිතුර "ඔව්, නැ" යන්න පමණකි.

මහල්ලාගේ කතාවත්, හැසිරීමත්, සියල්ල පිඬු කොට ගත් කල, දැන් ඔහුට "පල නො කියා පල" කියන්නා මෙනි. පැයක් පමණ ගත විය. දැන් ඔහුට අහර කිසට ද සුදුසු වේලාවකි. කෑම වේලක් දෙන්නට නො කැමැත්තෙන් මහල්ලා, මේ ඔහු පිටු දකින්නට කරන වෑයමක් ද? අමුත්තකුට කෑම්-බීම් පිණිස හෝ නවාතැන් පිණිස හෝ යාමට මේ ගමේ තානායමක් ද නැත්තේ ය. බොහෝ දෙනා නවාතැන් පිණිස ගම්මුන්ගේ ම පිහිට සොයති. මේ සියල්ල සාකච්ඡාවේ දී මහල්ලාගෙන් ම ඔහු දැන ගත්තේ ය.

සිංහල මිනිස්සු ආගන්තුක සත්කාරයෙහි කැමැත්තෝ ය. විශේෂයෙන් ම පිටිසර බද මිනිස්සු ඉතා ම කැමතියහ. එහෙත් සංග්‍රහය නිග්‍රහයක් වීමට කරුණු ඇතැයි සිතන තන්හි, එ නම් ආගන්තුකයාගේ තත්ත්වයට ඔබින පරිද්දෙන් විය යුතු සංග්‍රහයට අනවකාශ වූ කල්හි, සමහරු පැකිළෙති.

"මට කරන්න පුළුවන් දෙය තමයි, මන් ඔය කළේ. මන් මේ හංගා හොර බොරුවක් කියනවා නොවෙයි. පස් පඩංගුවේ දවස් ගාණක් ම මුළු ගමට ම බැන්නා. අපෙන් වරදක් නැහැ. ඉතින් මහත්මයාටත් පුළුවන් එකක් කළාට" ය යි නන්ද රාළ නැවතත් කීයේ ය.

"මා කැමතියි. මේ ගැන ලොකු උන්නැහේගේ මිනිබිරිය එක්ක කතා කරන්න." යයි සිතට විශේෂ ධෛර්යයක් ගනිමින් ජයපාල තරුණයා කීයේ ය.

නන්ද රාළ මෙහි දී සිය බැම සහල හකුළා මහත් නපුරු වෙසකින් ජයපාල තරුණයා දෙස බැලුවේ ය. එය මිනිහකු දෙස



මිනිහකු බලන්නා වැනි බැල්මක් වත්, සතුරකු දෙස සතුරකු බලන්නා වැනි බැල්මක් වත් නොවේ. එහෙත් පල් සොරකු දෙස මුර බල්ලකු බලන්නා වැනි බැල්මකි.

"මහත්මයා, මේ මහත්තයාට කියන්න, අපි ලස්සෙට කොඩි දාපු මිනිස්සු නොවෙයි. දුප්පත් වුණාට අපි නම්බුකාර මිනිස්සු. මේ ගෙවල් ඇතුළේ හැදෙන ළමිස්සියංට ඔය නන් නාඳුනන ඉළන්දාරි එක්ක අපි කතා බස් කරන්න දෙන්නේ නැහැ. මන් මේ මූණට ඇන්නා වගේ කතා කරනවාට තරහ වෙංට එපා" නන්ද රාළ කීවේ ය.

ඔහු මෙ තෙක් මාලිනිය ගැන නො විමසා සිටියේ මහල්ලාගේ මේ ඇනුම් පදවලට බියෙන් ම ය. මේ ලැබුණේ ඇනුම් පදයක් නොව මහල්ලා කියන්නාක් මෙන් මුහුණට ඇන්නා වැනි දරුණු පහරකි. ගිය ගිය තැන, උගත් නූගත්, පොහොසත් දුප්පත්, බාල මහලු, හැම දෙනෙකුන් අතර ම තම අණසක පිහිටු වන මේ තෙමේ, මේ මොහොතේ දී පමණක් නොව, මේ ගමන එන්නට පටන් ගත් තැන් සිට ම ක්‍රමයෙන් පිරිහෙන තේජස ඇත්තේ ය. සිතින් ද බැගෑපත් ය- ඔතැනිය-පිටතින් අභිමානය ගෙනැවිත් දැමීමට තරම් අධම ය. බලවත් තෘෂ්ණාවය, බලවත් ලොභය යන දෙ දෙනා ඉතා ම උදාර චිත්ත සන්තානයකින් වුව ද ඖදර්යය හා ආනුභාවය බැහැර කොට ලන අතිශයින් ම අතීත තර වූ ධර්මයෝ ය. තෘෂ්ණාවෙන් ද, ලොභයෙන් ද, නො මග යන මිනිසුනට හීන-දීන තත්ත්වයක යථා ස්වභාවයට ද ප්‍රත්‍යක්ෂ නො වේ. එ සේ නො මග යැම තරුණ ජයපාලට තව ම හොඳ හැටි නුපුරුදු හෙයින් මහල්ලාගේ ඇනුම් පදයෙන් ඔහු මුහුණ, මළ මිනියක් මෙන් සුදු මැලි විය. කොපය ද නිරන්තරයෙන් ම වාගේ ලජ්ජා ව අනුගමනය කරන හෙයින් මේ නිග්‍රහය ඉවසුම් නුදුන් ආත්ම ගෞරවය කරණ කොට ඔහු සුදු මැලි මුහුණ අනතුරුව තරහයෙන් ගිනි ගත්තා සේ වෙන්නට විය. එහෙත් මේ තේජස දක්වීමට තැනක් නො වේ.

දැන් ඔහුට මුදලෙන් වත්, තරාතිරමෙන් වත්, අන් කිසි ගුණ විශේෂයකින් වත්, පිහිට සෙවිය හැකි බවක් නො පෙනේ. මාලිනියට

නම් මේ අසරණ කමෙන් ඔහු මුදන්නට පුළුවන. ඇය තමන් දක්වා සිටි පමණින් ඔහු සොරෙන් මේ සියලු නිවට කම් හිරු දුටු අඳුරු මෙන් දුරු වන්නේ ය. එහෙත් ඇය නො එන්නේ, තමා ලබන මේ අතවරය ඇයට ද සෙල්ලමක් විය යුතු හෙයිනි. ඔවුන් අතර, මේ දෙ බසට ගෙය තුළ පසු වන ඇය ඇහුම්කන් දෙතැයි ඔහු සිතන්නේ ය. යම්තම් වත් දයා සිතක් ඇති තරුණියකට නම් තමන් සොයා පැමිණි තරුණයාගේ මේ බඳු අසරණ කම් දක-දකත් පිළිසරණ ලෙස ඉදිරිපත් නොවී මෙ තෙක් පසු විය නො හැකි ය.

මෙහි දී ගෙයි කිසිවකු ගැවසෙන බව ඔවුන්හට ශ්‍රවණය විය. තරුණයාගේ සිතට අමා පිරුණාක් මෙන් දැනිණි. නො අනුමානයෙන් ම ඒ මාලිනිය විය යුතු යයි ඔහු සිතුවේ ය. කණුවට පිට දී සිටි මහල්ලා ද එයින් නැගිට ගොස්, දොරකඩින් එබී බැලුවේ ය.

"මොක ද බොල, සිළිඳු, තී මේ කරන්නේද?" මහල්ලා මදක් උදහසින් මෙන් ප්‍රශ්න කරනවා ඇසිණි.

ඊට පිළිතුරු ලැබුණේ, ගැහැනු කටකින් වුව ද, හඬ අමිහිරි විය.

"මන් මේ විටකට හුනු ඉල්ලා ගන්න ආවා. කෝ මාලිනී?"

"මාලිනී වෙල පහල නාන්න ගිහින්. මෙහි ඇති හුනු විටක් නැහැ. පල යන්න" නන්ද රාළ උදහසින් තර්ජනය කළේ ය.

ගෙයින් නම් තවත් කිසිවක් වචනයක් නො නික්මිණි. ගැහැනු කට හඬ මළාක් මෙන් නිශ්ශබ්ද විය.

"බැහැපිය එළියට-" නන්ද රාළගෙන් මෙහි දී කියවුණේ, මුද්‍රණයට අයොග්‍ය අසභ්‍ය වචනයකි.

තවත් මිනිත්තුවකට පමණ පසු, සිළිඳු ඇඹරි-ඇඹරි එළියට ආවා ය. ජයපාලට ඇය පෙනෙන්නේ දැන්ය. ඇයගේ රූපය ද,



ඒ අමිහිරි හට හඬටම සුදුසු ය. අපිරිසිදු කම නිසා ඈ වඩාමත් විරූප වූවා ය. වෙන කටවලට අලංකාරය දුන් බුලත් විට පවා ඇයගේ කටට විකාරයකි. එයින් ඇයගේ කට පඩික්කම විය. ඇය කෙරේ විශේෂයක් වශයෙන් දක්නා ලැබෙන්නේ, නැහැය පමණකි. එය මැදින් බිඳුණු, අගින් උඩට නැගුණු, පුදුම නැහැයකි. ඇයගේ මේ නැහැයට විරුද්ධව නම් වචන මාත්‍රයක් කතා කිරීම මුළු ගමට ම තහනම් ය- ළමයිනට ඉතා ම තහනම් ය. ඈ කරබා ගෙන, දොරට බසින්නී යටැසින් තරුණ ජයපාල දෙස ද බලා ගෙන ගියා ය.

"ගෙදරට ආ මිනිසුංට ලොකු උන්නැහේ කතා කරන හැටි බොහො ම නරකයි." මේ සියල්ල ශ්‍රවණය කළ තරුණ ජයපාල ප්‍රස්තාවයෙහි ප්‍රයෝජනය ගනිමින් කීයේ ය.

"මහත්තයා දන්න කෙහෙල් මලක් නැහැ. මන් මේ කියන්නේ හුනා කියන්නා වාගෙයි. ඕකි ඔය හුනු විටක් ඉල්ලා ගෙන ආවාට මොකද, ආවේ වෙන එහෙකටයි. මෙ තැන, වෙන්නේ මොකද කියා බලාගෙන යංට යි. මෙච්චර දවසක් උණා, අර පදය හදලා. ඕකිලා එකෙක් මේ පැත්තට ආවේ නැහැ. මහත්තයා මෙහෙ ආ දා ම, ඒකිලාටත් හුනු ඉල්ලා ගෙන එංට ඕනෑ උණා. ඔය සිළිඳු තමයි, මේ ගමේ විදුලි කම්බිය. ඕකි ළඟ තමයි, මේ ගමේ ඔක්කෝගේ ම තෝම්බු මිටිය තියෙන්නේ. ඕකි කතන්දර නො කියන කෙනෙක් නැහැ. ගමේ ළමිස්සියන්ගේ කුලමලවල අරපරෙස්සංකාරී ඕකි තමයි. දැන් අර දූප්පත් කෙල්ල මේ ගෙය හරියේවත් නැතුවාට මොකද, ඒකි ගිහින් රට ගිනි තියාවි" මහල්ලා වෙව්ලමින් කීවේ ය.

නන්ද රාළ හා සිළිඳු අතර, දෙ බස කරණ කොට මාලිනිය ගෙදර නැති බව තරුණයාට පැහැදිලි විය. නැමට ද සුදුසු කල් ගත වූ හෙයින් දැන්-දැන් ඇය එතැයි ද ඔහු සිතුවේ ය. මහල්ලාගේ තපුරු ගුණය ද වැඩි-වැඩියක් ලිය ලන බව ඇත්තකි. සිළිඳු නො පෙනී යන තෙක් ම මහල්ලා බැනුම් නො නැවැත්තු වේය- අතරින් පතර තරුණයාට ඇනෙන්නට ද නොයෙක් දෙය කීවේ ය.

"මේ ගමේ ගැනියක් මලා ම, මිනිය නාවා ගන්න කෙනෙක් නැහැ- ඒ හින්දා ඒකිව තියලා තියෙනවා මිසක්- නැත්තං මගේ අම්මපා, මන් මේ කියන්නේ හූනා කියන්නා වාගෙයි- ඔකිව ගං හතකින් මෙහා ඉන්න දෙන්නේ නෑ-" නන්ද රාළ ගර්ජනය කළේ ය.

"හැබෑට ම ලොකු උන්නැහේ, මේ පලාත කෙහෙල් වලට හොඳ ද?"

"මන් මෙහෙ රැවුල ගිනි අරන් දනවා- මහත්තයා ආවා සුරුට්ටු පත්තු කරන්න."

කතාව වෙනස් වූ කෙනෙහි ඇතැම් මිනිසුන්ගේ ගුණය වෙනස් වන බැවින් තරුණයා මෙසේ ප්‍රශ්න කෙළේ මහල්ලාගේ කෝපය සංසිඳු වන අදහසින් ය. එහෙත් මේ මහල්ලාට නම් එයින් වූණේ, ඇවිලෙන ගින්නට පිදුරු දැමීම වැනි වැඩකි.

"මහත්තයා, ඉතින් යන තැනක යන්න, අපට වැඩ තියෙනවා" යයි මහල්ලා වැඩි දුරටත් කියන්නට යෙදුණෙන් ආගන්තුකයන් නොඉවසන මේ දුෂ්ට ස්ථානයෙන් බැහැර වීම යෙහෙකැයි තරුණයා කල්පනා කළේ ය. මින්පසු තවත් ඔහුට එහි නතර විය නො හැකියි. පිළිඳුට නම් දරුණු තර්ජනයකින් ඔහුට බැණ නො වැදුණත්, දන්වන්නේ මේ ගෙයින් බැහැර වන්නට ය. එ හෙයින් පිළිඳු මෙන් ම ඔහු විසින් ද කටයුතු, දූන් කර බා ගෙන මෙ තැනින් පිටව යෑම ය.

මේ අතර, ඔහුගේ කල්පනාව වෙනස් කිරීමට සුදුසු අනෙක් කරුණක් පහළ විය. කිලිටි හැඳ ගත්, මැදි වියෙහි සිටි, එක්තරා ගැහැනියක් ඈත සිට ම මහ කලබලයකින් දිවගෙන අවුත්, අත වනා, මහල්ලා පසෙකට කැඳෙව්වා ය- කැඳවා, මොකක්දෝ කීවා ය. ඉන් පසු මහල්ලා ද මහත් කලබලයෙන් ඈය කැටුව වත්ත පහල දුවන්නට පටන් ගත්තේ ය.

# 6

මාලිනිය නාන්නට ගිය ලිඳ, ගෙදර වත්ත සීමාවේ වෙල් යායට යා බදව, මහ කුඹුක් ගසක් ළඟ පිහිටියේ ය. ලිඳ නිසා කුඹුක් ගස ඇති වී නම්, ලිඳ ඉතා ම පරණ මිනිසුන්ගේ වැඩක් විය යුතුය. පිරිසිදු පැන් කැමති පරණ මිනිසුන් ලිඳක් කැපූ කල සමීපයෙහි කුඹුක් පැළයක් හිඳ වීම සිරිතක් වශයෙන් කරන ලදී. කුඹුක් මුල කරණකොට පැන් පවිත්‍ර වන බවත්, සිසිල් වන බවත්, කියති. එ හෙයින් සමහරු කුඹුක් ගස් ආශ්‍රය කොට ද ලිං කැපූහ. මෙය ගස නිසා ඇති වූ ලිඳක් ද, නොහොත් ලිඳ නිසා ඇති වූ ගසක් ද යන්න නො දනිමු. ලිඳ නම් නො ගැඹුරු ය. ගස නම් විශාල ය. මදක් කිරිමැටි පැහැයට හුරු ජලයෙන් කට ළඟට ම පිරුණු හෙයින් බාල්දියකින් මෙන් එයින් නෑම ඉතා ම පහසු ය. ලිඳ කොටු කර වටේ අවුරන ලද හෙයින් බවලතුනට නෑමට ද සුදුසු ය. මාලිනීලාගේ ගෙදර ලිඳේ නම් කිසිවෙක් නො නාති. ගෙදර ලිඳ පැන් බීමටත්, මල් ගොමුවලට පැන් වත් කිරීමටත් පමණකි. එය ගැඹුරුය. නො ගැඹුරු වුවත්, පැන් බොන ලිඳකින් නම් නො නෑම මෙහි පවතින වැදගත් සිරිතකි.

නන්ද රාළගේ මේ ලිඳ, ඔහු සතු පෞද්ගලික වස්තුවකි. එහෙත් සතුරු-මිතුරු කවුරුත් කිසි විශේෂයක් නැතිව, මෙයින් ප්‍රයෝජන ලබති. සතුරකුට මුත් ලිඳක පරිභොගය තහනම් කිරීම නීච කමක් නොහොත් පාපයක් සේ ඔවුහු සලකති. එ හෙයින් කැමති පරිද්දකින් කවුරුත් මෙහි පොදුවේ නාති- පොදුවේ රෙදි සෝදති.

නන්ද රාළ නම් කලාතුරකින් නාන්නේ ය. කුඹුරු වැඩ කරන කල්හි නම් ඔහු දිනපතා ම වුවත් නො නාන්නේ නො වේ. ඇත

සේදීම නම් අවශ්‍යයෙන් ම ඔහු දින පතා කරයි. මාලිනියගේ පුරුද්ද එසේ නොවේ. යටත් පිරිසෙයින් සතියකට දෙ වතාවක් වත් ඇ ජලය ස්නානය කරන්නී ය.

සිත් කලකිරීමෙන් පසු වූ නිසා කලකින් නෑමක් නො ලත් මාලිනියට මෙ දින සේදීමට ලොකු ඇඳුම් පොට්ටනියක් ද විය. ඇ පළමුවෙන් ම ඇඳුම් පොදිය හොඳ හැටි සෝදා, වැලක වැනුවා ය. දෙවනුව, නානු ගා හිස පිරිසිදු කොට ගෙන, නාන්නට පටන් ගත්තා ය. ඇ සාමාන්‍යයෙන් නෑමට ද හුඟක් කාලය ගත කරන්නියකි. නෑම අවසන් කොට අලුත් ඇඳුම් හැඳ-පැළඳ ගෙන, ආ පසු ගෙදර එන්නට ලෑස්ති වන ඇයට, එ තැනට පැමිණි අමුත්තෙක් දකින්නට ලැබිණි. ඔහු, ගමේ මිනිහෙක් නො වේ. රෙදි-කෝට් හැඳ ගත්, කොටකර කපන ලද හිසකෙස් ඇති මේ තරබාරු පුද්ගලයා ළඟ, යුගත් මාංචු ලන ලද, දුක් මුසු පෙනුමකින් යුත් මිනිසෙක් ද විය. මේ මිනිසා නිසා යථෝක්ත පුද්ගලයා සිවිල් ඇඳුමෙන් පසු වෙන පොලිස් භටයකු බව මාලිනී ප්‍රත්‍යක්ෂ කළා ය. ඇ ඔහු දෙස සංවේගයෙන් බැලුවා ය. බන්ධනයට පැමිණි අසරණ මනුෂ්‍යයා වෙනුවෙන් ඇය සිත්හි අනුකම්පාවක් ද පහළ විය.

මේ පිටිසරට නම්, පොලිස් කාරයා ඉතා ම අශුභ නිමිත්තකි. ඔහු එන්නේ ද ඉතා ම කලාතුරකින් ය. ඉතා ම කලාතුරකින් එන උලමා මෙන්, ඔහු ද ගමට එන විට යම් කිසි බලවත් විපතක් අනුගමනය කරවන්නේ ය. නිකිණියාතට පොලිසියක් නැත- එය ගම්මුලාදෑනියකුගේ වසමකි. එහෙත් මිනීමැරුමක් වැනි බරපතළ අපරාධයක දී ගම්මුලාදෑනි කම පමණක්, රාජ කාර්‍යයට නො පිරිමැසෙන හෙයින් ආසන්න පොලිසියකින් ද උපකාරයක් ලැබෙන්නේ ය. විශේෂයෙන් ම පොලිස් භටයා, අශුභ දර්ශනයක් සේ ගම්මුන්හට පෙනෙන්නේ, මේ කරුණුකොට ගෙන ය.

බන්ධනයට පැමිණි අසරණයා දෙස බලන මාලිනියට නම් ඔහු මිනීමරුවකු සේ නො පෙනේ- මං පහරන භයානක චෞරයකු සේ ද නො පෙනේ. පොලිස් කාරයා කෙරේ නම් මිනීමරුවකුට,



චණ්ඩ චෞරයකුට නොහොත් ඉතා ම සාහසික අපරාධ කාරයකුට සුදුසු අරිෂ්ට ලක්ෂණ පවතින බව පෙනිණි. ඔවුනට ළං වෙන්නටත් බයින් ගමේ උදවිය කිහිප දෙනෙක් ද ඈතින් බලා සිටියා හ. මරු වයසට පත් හිතවතකුට පිටුවහලක් සෙවිය නො හැකිව, අසරණව බලා සිටින්නන් සේ ඔවුන් සොවින් පසු වන බව පෙනිණි.

"මෙහාට දන් මිනිහෙක් දුවගෙන ආවා. උඹ දකින්න ඇති"යි නීතිය පිළිබඳ මේ අවයවය ගිගුම් දෙමින් මාලිනිය විතාළේ ය.

කට හඬින් ම ඔහු කාහට වුවත් අප්‍රසන්න වන්නේ ය. ඔහුගේ කථා ලීලාව ද ඉතා ම අශිෂ්ට ය. තර්ජනයෙන් බිය ගන්වා බලාත්කාරකම් කිරීමට වැනි සූදානමක් ඔහු කෙරේ පවතින බව හැටියෙන් ම ප්‍රකාශ විය.

"නෑ මා දුටුවේ නෑ" කියා මාලිනී කිසි පැකිලීමක් නැතිව, පිළිතුරු දුන්නා ය.

ඒ පිළිතුර දුන් හැටියේ ම ඇය ඇදහිය යුතු බව මේ මුලාදෑනියාට එකහෙළා ප්‍රත්‍යක්ෂ විය. ඔහු විසින් වෙන තැනක නම් සෑහෙන වැදගතුන් මැදක නම්, කරන්නට යෙදෙන්නේ, කර බාගෙන යන්නට යාම පමණකි. එහෙත් මෙ තැන, ඔහු එසේ කතා කළේ ය. මාලිනියගේ පිළිතුර අවංක වුව ද, ඒ ඔහුට ඉවසිය නොහෙන තරමට අවිලම්බිත විය. මෙ බඳු කැලෑ පෙදෙසක මෙ තරම් බිය සැක නැති නාගරික ඔපයක් දැක්වීම ඔහුට කරන අපහාසයකි. වෙන ගම්මුන් කෙරේ මෙන් තමා දැක්මෙන්, මේ තරුණිය තුළ කිසි දු තැති ගැන්මක් ඇති නොවීම නිසා ඔහු කිපුණේ ය. පොලිස් කාරයා දුටු-දුටුවන් තැති ගත් වන බිල්ලකු බව දක්වන බලාපොරොත්තුවෙන් දැන් ඔහු පසු වේ.

ඔහු කොනකින් කට දල්වා, දෙ නෙත් ඔරවා, රකුසු වෙසකට බඳු ඉතා ම විරූප මුහුණක් දක්වා, ඇය දෙස බැලුවේ ය.

"ඔහු දිව්වේ මෙහෙනුයි. උඹට ඔහු දකින්නට ලැබෙන්න ඕනෑ. උඹ හදන්නේ, ඔහු වසන් කරන්න යි. නො කිව්වොත් මත් උඹව

සිර බාරයට ගන්නවා" යයි පොලිස් කාරයා නැවතත් තර්ජනය කළේ ය.

පොලිස් කාරයා සිත යටින් අදහස් කරන්නෙ, කිසියම් හිංසාවක් බව, ඔහුගේ මේ කතාවෙන් මාලිනියට ඉඳුරා ම ප්‍රත්‍යක්ෂ වේ. නැතහොත්, මෙ බඳු අභූත දෝෂාරෝපණයකින් ඔහු ඇයට මෙ සේ තර්ජනය නොකරයි. ඇය මේ නාන කොටුවෙන් එළියට ආවා පමණකි. ඇයට ඉතින් යමකු දකින්නට ලැබුණා නම්, ලැබුණේ හේ මේ අශුභ දර්ශන සම්පන්න පොලිස් කාරයා හා සිරකරුවා පමණකි. ඒ හැර, අන් කිසිවකු වසන් කිරීමට තබා, දකින්නට වත් ඇයට නොලැබුණු බව ඇ නැවත-නැවතත් කීවා ය.

කෙ සේ වත් පොලිස්කාරයා නම් ඇය නො අදහන්නේ ය. ඔහුට දන් මාලිනී අපරාධයක් කළ වරද කාරියකි. පොලිස්කාරකම සුළුවෙන් තකන්නට තිලයක් නොවේ. මේ පිටිසර කෙල්ලකගෙනුත් ඉදින් ඊට ගෞරවයක් නො ලැබේ නම් ලැබෙන්නේ කවරකුගෙන් ද? පොලිස් කාරයාගෙන් අනාදරයක් මිස සැනසිල්ලක් නොලැබෙන බව පෙන්වන්නට ඔහු සිතට ගත්තේ ය.

"මට ඒ, මේ, වගක් ඕනැ නැහැ- කියාපිය තිගේ නම කවුද?"

මෙහි දී මාලිනියගේ මුහුණ කොටි දෙනකුගේ මෙන් රෞද්‍ර විය. ඇයට තබා ගමේ ඉතා ම පහත් ගැහැනියට වත් ගමේ මුලාදැනියකුගෙන් නම් මෙ බඳු නින්දිත වචනයෙන් කරන ආමන්ත්‍රණයක් අසන්නට නො ලැබේ. පොලිස් කාරයාට තත්ත්වයක විශේෂය නොදනෙන්නේ ද?" එසේ නම් ඔහු මහ ජන සේවයට නොසැහෙන මෘගයකු විය යුතු ය. දනෙන්නේ නම්, ඔහු තම මුලාදැනි කම, අවංක උදවිය හෙළා තළා තිගා කිරීමට ලයිසමක් කර ගෙන තිබෙන බව මේ නින්දිත වචනයෙන් කතා නො කළාහ. පොලිස් කාරකම් නිසා නො වේ නම්, කොතෙක් කඳ-බඩ තුබුණ ද මෙලාකටත් ඇයගෙන් ඔහුට සෑහෙන යමක් කියවී ඉවර ය. එහෙත්-



"මොකද තිට කතාව බැරි? තී-"

"බලාගනින්. උඹ මට "තීට තීට" කියන්න එන්න එපා-" මාලිනී ඉවසුම් නැතිව, තර්ජන ස්වරයෙන් කීවා ය.

මාලිනියගේ මේ තර්ජනය පොලිස් කාරයාට පමණක් නොව, අවට බලා සිටින ගම්මුන්හට ද පුදුමයක් විය. එයින් ගම්මුන්ගේ නම් සිත තව-තවත් බිය ගැනිණි. ඉතින් නම් ඇයට මේ නිත්‍යවයෙන් කිසි ම බුරුලක් නො ලැබෙන බව ඔවුනට සහතික ය. ඔවුහු අසරණ කමෙන් අසරණ කමට පැමිණ, කිසිත් කර ගත නො හැකි වූ තැනැත්තෝ, මාලිනිය කෙරෙහි උපන් කරුණා චිත්තයෙන් සුසුම් හෙළූ හ.

මේ තර්ජනයෙන් පොලිස් කාරයා පුදුම වුණා පමණක් නො වේ. ඔහු චිත්ත ධෛර්යයෙන් ද පිරිහුණේ ය. ඒ බව ඔහු මිස අන් කිසිවෙක් නො දනිති. දුර්ගුණ ඇති හෙයින්, මේ තෙමේ පොලිස් කාරයකු වූව ද, බිය සුල්ලෙකි. නො එ සේ වූවෝ මුලාදැනි කමෙන් මහා ජනයා රකින්නට මිස, බිය ගන්වන්නට කිසි කලෙකත් නොසිතති. චිත්ත ධෛර්යයෙන් හීන වූ කල්හි බිය සුල්ලා පලා යන්නට ම සිතන නමුත් මුලාදැනි කම නිසා ඔහුට දන් එ සේ පලා යන්නට නුපුළුවන. මග අරින්නට නොහැකි ලෙස මෙසේ මුලු ගැන්නුණු කල, ඔහු තමාට පුරුදු ඒ ළඟ පුරුද්දෙකි. එ නම් සැහැසි වීමෙහි යුහුසුලු විය.

"මෑ කොතන වලව්වේ හාමුදුරු කෙනෙක් ද? හරියට ම කතාව කුමාරි හාමි කෙනෙක් වාගෙයි" පොලිස් කාරයා නැවතත් කීයේ ය.

"මා කුමාරි හාමි කෙනකුට සෑහෙන්තියක තමා- වැරැද්ද මගේ නමේ අගට ගමක නමකින් වලිගයක් නැති එක යි." මාලිනී කීවා ය.

එයින්ද පොලිස් කාරයා තව-තවත් කිපුණේ ය. ඔහු සාක්කුවකින් නෝට් පොතක් ගෙන, නැවත-නැවතත් ඇයගේ නම විචාළේ ය. ඇ නම නොකීවා ය.

"මන් නුඹ මාංචු දමා, පොලිසියට ගෙන යනවා" යයි පොලිස් කාරයා නැවතත් තර්ජනය කළේ ය.

"මා මර ලා මිසක් පණ පිටින් ගෙන යන්න නොලැබේවි" යයි ඈ ද එඩිතරව සිට කීවා ය.

මෙ තැන් සිට, පොලිස් භටයාගේ හැසිරීම තවත් අශෝභන විය. ලංකා පොලිස් දෙපාර්තමේන්තුව ඉතා ම ශිෂ්ට ප්‍රතිපත්ති ධර්මයක් ප්‍රතිඥා කොට ස්වකීය භටයන් රාජ කාර්යයෙහි පුරුදු පුහුණු කරන බව නම් ඇත්තකි. එහෙත් සමහරුන්ගෙන් පුරුද්දට වඩා ජන්මයට රුකුලු ලැබේ. ජන්ම ප්‍රාවණ්‍යයෙන් බිඳුණු අභ්‍යාස වීර්යය ඇති කල්හි පොලිස් කාරයා ද නියම අපරාධ කාරයෙක් වන්නේ ය. ඔහුට පොලිස් ප්‍රතිපත්ති ධර්මය මතක නැති වෙයි- තමා මහා ජනයාගේ ආරක්ෂකයා බව මතක නැති වෙයි- තමා සමාධානයට ලාංඡනය බව මතක නැති වෙයි- ජන්ම දායාදය කොට ඇති රළු-කරළු කම් ඉදිරිපත් කොට ගෙන බියසුලු කම් ඉදිරිපත් කොට ගෙන, අහිංසකයනට අනදර කිරීම, හිරිහැර කිරීම, ඔහු හපන් කමක් කොට ගනියි.

සියැසින් දකින්නට පණ පිටින් නො ලැබුණත්, නොයෙක් ඡායා රූපයන්ගෙන් හා ලිපිවලින් මාලිනියට ලන්ඩන් පොලිස් කාරයා දකින්නට ලැබෙන්නේ ය. ඔහුගේ ඉවසීමත්, දයාවත්, අනුග්‍රහ ශීලයත්, සමස්ත බ්‍රිතාන්‍ය වර්ගයාට ම ගෞරවයකි. බ්‍රිතාන්‍ය ශිෂ්ටාචාරය පිළිබඳ චාරිත්‍ර හා විනයයන් ප්‍රකාශයට පැමිණෙන්නේ ඔහු ගෙනි. මං සංදියක මුරට සිටින ඔහුට හසුරු වන්නට ඇත්තේ, යාන-වාහන හා නර-නාරීන් පමණක් නොවේ. ඔහු මං සලකුණු කියන්නෙකි- වාර්තා සපයන්නෙකි- මහ යා ගත නොහෙන දුබල මහල්ලන්, මැහැල්ලන් හා ළදරුවන් රකින්නෙකි. අපරාධ කාරයන් හා අභියොගයට පැමිණි කල්හි ද ඔහු දක්වන ඉවසීම පුදුමයකි. ශිෂ්ට චාරිත්‍රයෙන් ඔහු වෙඩරු පිඩකට බඳුය- ප්‍රතිපත්ති රක්ෂණයෙන් යකඩයකට බඳු ය.

එහෙත් මේ පොලිස් කාරයා "එහෙනම් බලමු" යන තර්ජන-යෙන් මහත් ශූරවීර යොධ භටයකු වෙත අභීත වික්‍රමයෙන් ගමන්



කරන්නකු සේ මේ අසරණ බොළඳ තරුණිය ඉදිරියට පැන, ඇය අත් කරින් ගෙන, යුගත් එක් කොට ගත්තේ ය. මොහුගෙන් මෙ වැනි බලාත්කාර කමක්, සැහැසි කමක්, නොහොත් උපද්‍රවයක් වෙතැයි මාලිනී නො සිතුවා ය. ඇය අතින් දිය රෙදි හා පනිවිටුව ද ගිලිහිණි. තමන් අත් හරින ලෙස ඈ දෙ තුන් විටක් ම ඔහුට කීවා ය- ඔහු එසේ නො කරන කල, වෑයමෙන් යුගත් බේරා ගන්නට දඟළුවා ය. මේ දඩු අඩුවකට බඳු දෘඪ හස්ත ග්‍රහණයෙන් මිදෙන එක මාලිනිය වැනි බොළඳ තරුණියකට බලවත් ආයාසයකි. ඈ එහෙයින් බැරි තැන, පොලිස් කාරයාගේ අත විකුවා ය. ඔහු අත ගසා ගෙන ඉවතට පැන්නේ ය. මාලිනී ගෙදර බලා දුවන්නට පටන් ගත්තා ය. එහෙත් ඇයට වැඩි දුර දිව ගන්නට නො ලැබිණි. සාවකු ලුහු බැඳ ගත් ව්‍යාඝ්‍රයකු මෙන් පොලිස් කාරයා ද ඇය පසු-පස්සෙහි දිව ගොස් නැවත අල්වා ගෙන, යුගත් පිටිකරට කර, ලේන්සුවකින් බැන්දේ ය. ඈ දෙපා පොළොවේ සෙමින්, තියුණු වචනයෙන් බෙණෙමින් නටන්නට වූවා ය. ඇයගේ විලාසය අතිශයින් ම භයංකර විය. දිවි දෙනකුගේ මෙන් දෙනෙත් රෞද්‍ර විය. ඒ රෞද්‍ර නෙත්‍රයෙන් හුණු කඳුළු ද ගලන්නට විය. ඇයගේ සර්වාංගය ගිනි ගෙන දැවෙන ලෝ පිළිමයක් මෙන් රත් විය.

"ගමේ නිරපරාධ තරුණියකට කරන මේ අතවරය බලා සිටින උඹලාත් පිරිමි ද?" කියා අවට බලා සිටි ගම්මුන්ගෙන් ඈ විතාළා ය.

ගමේ තව-තවත් පිරිස එ තැනට රැස් වූහ. එ සේ ද වුව, මේ පොලිස් කාරයාගේ ක්‍රියා කලාපයට විරුද්ධව ප්‍රශ්නයක් නැඟීමට ඔවුනතුරෙන් කිසිවෙකුත් අපොහොසත් වූහ. ඔවුන් කවුරුනුත් සන්වේගයෙන් හා කෝපයෙන් බලා සිටියා පමණකි. දුප්පත් අසරණ මිනිස්සු අන් කුමක් කිරීමට පොහොසත් වෙත් ද? කරන්නේ, නොතරම් කමක් වුව ද, මේ දුෂ්ට භටයාට තමන්ගෙන් නොතරම් කමක් වී නම්, එය මුළු පොලිස් හමුදාවට ම කළ අගෞරවයක් සේ පිළිගැනෙන බවත්, ඊට පළියට ගම මුළුල්ල ම වධයට කැප වන බවත්, ඔවුන් අත් දැක ඇත්තේ ය.

එ තැනින් යන්නට පැමිණි ගොළු පුවක් වෙළෙඳා ද, මේ අරගලය බලා සිටියේ ය. මේ ඉවසුම් නො දෙන අයුක්තට වචන මාත්‍රයකින් නො මනාපය දක් වූවේ ඔහු පමණකි.

"චි! චි! ලාළහාමී, කතයි, කතයි, ගානී තේ ද?" හරිනා මේක බඳිනවා. මේක චිඹි කර ලා තමයි යනවා" ඔහු මහත් පිළිකුල් මුහුණක් දක්වමින් කීයේ ය.

පොලිස් කාරයා, ගොළු පුවක් වෙළෙඳා හඳුනන බැවින් ඔහුට වැඩි තර්ජනයක් නො කළත්, (මේ වෙළෙඳා අරණායක පොලිසිය ළඟ ම පදිංචි කාරයෙකි) "තම්බී, උඹ යන තැනක හොඳ හිතින් පලයන්, මට මගේ රාජ කාරීය කර ගංට ඉඩ හැරල" යයි රළු හඬින් කීයේ ය.

තම්බී හොඳ හිතින් යන්නට ගියේ නැති- එහෙත් ඔහුගේ රාජකාරිය ඔහුට කර ගන්න ඉඩ හැර පසකට වී බලා සිටියේ ය.

තම පිරිමි සිරකරු මෙන් කැරැවීම පොලිස් කාරයාට අපහසුවක් නො වේ. අපහසුව, මේ ගෑනු සිරකාරිය ගෙන යෑම ය.

මාලිනිය අඩියක් ගමන් කැරවීම ගලක් ගමන් කැරවීම වැනි කරදරයකි. පොලිස් කාරයාගේ හැඩි-දැඩි කමටත් වඩා ඇයගේ මුරංඩු කම නිසා, ඔහුගෙන් මෙහි දී තව-තවත් පීඩා ඇති වූ බව ඇත්තකි. ඇ, කෑ ගාන්නට වූවා ය- දඟලීම කරණ කොට මිදුණු දිගු වරලසින් ද යුක්ත වූ තැනැත්තී නපුරු වචනයෙන් බැණ වැදුණා ය.

මෙහි දී ලිඳට සමීපව පිහිටි විශාල ගල් ඇන්දක මුවාවේ සැඟවුණු තරුණයෙක්, එයින් එළියට අවුත් "මෙන්න රාළහාමි මාව ගන්න හිර බාරයට- ලිහන්න මාලිනීගේ බැම්ම." කියා යුගත් දක්වා සිටියේ ය. ඒ අන්දා බව කවුරුත් ඇඳින ගත්හ.

"හා! හා! මෙයා තමයි මිනිහා. මං කිවුවෙ නැද්ද? මේකා වසත් උණේ මැය දැනුවත්ම ය කියා. ඔය දත් කැමැත්තෙන් ම බාර උණේ." පොලිස් කාරයා මෙ සේ කියමින් අන්දා අතින් අල්වා ගත්තේ ය.



"රාළහාමි! ඇය මාව ඇහින් වත් දුටුවේ නැහැ."

"එහපිය කට."

මේ වැදගත් පොලිස් කාරයා මෙ සේ තර්ජනය කොට පළමු සිරකරුගේ මාංචුවෙන් අතක් මුදා, ඒ අතට අන්දාගේ අතක් ඇදුවේ ය.

"ඉතින්, ලිහන්න රාළහාමි, ඒ බැම්ම. බවලතුංට හිංසා කරන එකත් නීතියක් දැයි?" අන්දා නැවතත් වේගයෙන් ඇසුවේ ය.

පොලිස් කාරයා මෙහි දී අන්දාට දුන් එකම පිළිතුර කන හරහා කම්මුල් පහරකි. අන්දා එයින් ක්ලාන්ත වන සැටි දුටු මාලිනී නැවතත් බැණ වදින්නට වුණා ය.

"මොහු මුලාදෑනි කමකට තබා, ඌරත් මස් කරන්නට වත් සෑහෙන වනචරයෙක් නොවෙ යි." කියා හැපින්නකු මෙන් ඇ පිම්බා ය.

"උඹත් මගෙන් ඔය කන්නයි හදන්නේ." කියා පොලිස් කාරයා මාලිනිය දෙසට කට විලිස්සමින් කළු පඬු කොට ගහන දත් දෙ පෙළක් දක්වා, රකුසකු මෙන් රවා බැලුවේ ය.

"ඔව්, උඹ මහ හපනෙක්- මෙහෙ ම අත පය බැඳපූ ගෑනුන්න තමයි. උඹගේ හපන්කම්-" කියා මාලිනී යළිත් බැණ වැදුණා ය.

පොලිස්කාරයා සන්සුන් වුණේ ය- නොහොත් සන්සුන් වූ වෙසක් දක්වූවේ ය. "හා! ඉතින් යන්" කියා ඔහු තම සිරකරු වන්ට ගමනට අණ දුන්නේ ය. පිරිමි දෙදෙනා නම් ඔහු අණට පිය එස වූහ. එහෙත් මාලිනී පළමු පරිද්දෙන් ම අඩියක් වත් නොසලා, සිටි වන ම සිටියා ය.

"උඹ හොඳ හිතින් එනවා ද නැද්ද?"

"නෑ මා එන්නේ-"

"එහෙ නම් මට වෙන්නේ, උඹව ඇදගෙන යන්නයි"

"ඔව්, මැරෙනකන් උඹ මාව ඇදගෙන යාවි."

මෙ සේ කියමින් මාලිනී ගො ඝාතකයකු අතට පත් තරුණ ගව දෙනක මෙන් බිම ලැග, සහන ගුණාධිගත ප්‍රතිෂ්ටම්භයෙන් නොසැලී සිටියා ය.

"ඇයි බාන්, උන්ගේ සීයාට වත් ගිහින් කියාපල්ලාකෝ මේ කරන අපරාදේ." කියා පසකින් සිටි මැහැල්ලක් ළෙහි අත් ගසා, කෑ ගැවා ය. එ පමණකින් වත්, පිහිටක් වන්නට සිතූ ගැහැනියක්, එ කල නන්දරාළ සොයා දුවන්නට පටන් ගත්තා ය.

මාලිනියගේ වැටීමෙන් මාලිනියටත් වඩා වේදනා ඇති වූයේ බලා සිටින්නන්හට ය. බලවත් සන්වේගය කරණ කොට උඩට ඇදුණු හුස්ම පහත හෙළා ගත නොහැකිව, ඔවුහු ගල් රූ මෙන් නිශ්චල වූහ. මේ ඔවුන් නුහුටු-නුපුරුදු දෙයකි. ඇතැම් විට, සිය සැමියන්ගෙන් නම් මෙ ගම ගැහැනුන්හට අතවර ලැබෙන එක ඇත්තකි. එ පමණක් මුත්, පිට පිරිමින්ගෙන්, පිට ගැහැනුන්හට නම් කිසි කලකත් මෙ බඳු දරුණු සැහැසි කම් නො කෙරෙන්නේ ය. පැළ දිගින් ණයට ගත් ස්ත්‍රියුපචාරයක් නැතිවත්, මේ අහිංසක අකලංක සිංහලයන් කෙරේ ද, ස්ත්‍රීන් විෂයෙහි එක්තරා ගෞරවය පැවැත්තේ ය. කොතරම් වරදකට වුවත්, පිට බවලතකුට හිංසා කිරීම, මේ නිසා ඔවුනට ඉතා ම පිළිකුල් කට යුතු නොපිරිමි කමක් සේ පෙනිණි.

මේ වැටීමෙන් පසු මාලිනියගේ සිත තව-තවත් සැහැසි විය. ඇය හැඬුම් නතර කොට ගෙන, කොපදීප්ත නෙත්‍රයෙන් බැලූ බැල්මට පොලිස් කාරයා ගිනි ගන්නා දෙයක් නම්, එ කෙණෙහි ම සොහොන් පිඩක් මෙන් අලුවිය යුතු ය. විසුරුණු හිස කෙසින් ද, රොසින් පිපිරෙණ මුහුණෙන් ද, අවුල් වූ ඇඳුම්-පැළඳුම් වලින් ද, වැලි-දූලි වැකුණු කසල පිඩක් බවට පැමිණ පිටීතොල බැම්මෙන්



බිම ලැග හිඳින්නී ඕ තරහ නොපොරොත්තු කමෙන් වෙව්ලන්නට ද වූවා ය.

"මා කාත් නැති දුප්පත් අසරණ කෙල්ලක නිසා ද උඹ මට මෙහෙම අතවර කරන්නේ?" ඈ කෝපයෙන් ද ශෝකයෙන් ද විතාළා ය.

"උඹ හිතුවා ද, උඹ කුමාරිහාමි කෙනෙක් ය කියා?" පොලිස් කාරයා යළිත් පණු දත් විලිස්සමින් ඇසුවේ ය.

"නීතිය නම් කුමාරිහාමිටත්, අසරණ දිළින්දියටත්, එක වගේ වෙන්න ඕනෑ කොස්තපල්."

"ඒ උඹේ නීතිය. මේ මගේ නීතිය නැගිටපන්. පැහිච්චකං තියෙද්දී" මෙ සේ කියමින්, ඔහු මාලිනිය ළහට ගොස්, ඇය නගා සිටුවන්නට වෑයම් කළේ ය.

මාලිනියගේ වචන සම්පූර්ණයෙන් ම නිරර්ථක නොවී ය. එඩිතර කම් තරමට ම, ඇය කෙරේ පැසුණු කම් ද පවතින බව දැන්-දැන් පොලිස් හටයාට පෙනෙන්නේ ය. කලින් ද, ඔහුට මාලිනිය පෙනුණේ සැලකිය යුතු රූමත් කාන්තාවක හැටියට ම ය. එහෙත් රූපයට සරි ලන සිදාදී කම, මෙ වැනි පිවිසරක දකින්නට ලැබෙන්නේ ඉතා ම කලාතුරකිනි. අභාග්‍යයක හැටි! කලාතුරකින් ම දකින්නට ලැබෙන දේ ඔහුට එක් වරට ම හමු විය. මේ නොනීතියටත් කීකරු වෙමින්, පසහ පිහිටු වන තාලේ අහනක නොව, නීතිය ම ඉල්වමින් ඒ වෙනුවෙන් දිවි පුදන්නට ද සූදානම් තැනැත්තියක බව ඔහුට දැන් පෙනේ. දැන් ඉතින් නීත්‍යානුකූල වීම මතු මත්තට ය. මෙ තෙක් පිරිස බලා සිටිය දී, ගැහැනියක මෙල්ල කොට ගත නො හැකිව, ගැහැනියකට මෙල්ල වීම පොලිස් කාර කමට පමණක් නොව, පිරිමි කමට ද ලජ්ජාවක් සේ මේ බියසුල්ලා සිතුවේ ය- තවත් වරක් මීට මැදහත් වන්නට පුවක් වෙලෙඳාවත් එන්නේ නම්, එය පිට ලා, මේ හැකිරීයගෙන් බේරෙන්නට මහක් වුව මැනවැයි ද සිතුවේ ය.

පුවක් ලේළෙඳා නම් දන් පලාතක එක් නැත- මේ නින්දිත අපරාධය දකිනු නො රිසි වූ ඒ මහමදිකයා පමණක් නොව, නවත් සිංහල බෞද්ධයෝ ද, අකර්මණ්‍යයෙන් බලා සිටිනු වෙනුවට, අස්වයැම මැනැවැයි සිතා, ඒ තැනින් ඉවත්ව ගියා හ.

මෙහි දී සිතේ සැනසිලි බැහැර කැර වූ අනෙක් කරුණක් ද ඔහුට සිහි විය. මේ නොතරම් සැහැසි කම් කෙරෙන්නේ, රූමත් තරුණියකට බැවින්, සැහැසි කමට සුදුසු වරදක් නීතියට අනුව නොදක් වෙන කල මෙ වැනි තන්හි නිරායාසයෙන් ම නැහෙන, රාජ කාර්යයෙහි භ්‍රෂ්ටශීලී වීම නම් වූ චෝදනාවට තමා පහසු වෙන් ම ලක් වෙන බව, ඔහු දන ගත්තේ ය. මේ පොලිස් කාරයාගේ වාසියට ගැණෙන ඇත්තක් නම්, ඔහු චරිතයෙන් කාමුකයකු නොවන බව පමණකි. ඔහුගේ ක්‍රියා පරිපාටියෙහි එක තැනකින් වත්, මේ දුබල කම නොදක් වුණේ වී නමුදු මාලිනියගේ රූපයත්, වයසත්, පෙනෙන කාහට වුවත්, මේ සියලු ම කලබලයට මුල නිසැකයෙන් මේ යයි මේ දුසිරිත ම බඳවා, ප්‍රත්‍යක්ෂ කැරැවීම අපහසු නොවේ. ඔහු කෙරෙන් සැනසිලි බැහැර වීමට මේ සැකය ද ප්‍රධාන කාරණයකි.

මාලිනිය නහා සිටු වන්නට කරන ඔහුගේ වෑයම ද නිරර්ථක විය. ඈ පණ නැති දෙ දණ ඇත්තියක මෙන්, කෙලින් සිටුම තිබිය දී බිම ළගින්නට ම වූවා ය. දෙතුන් වතාවක් නොව, මිනිත්තුවක්-මිනිත්තුවක් පාසා ම, ඇය සිටුවන්නට ඔහු කරන වෑයම, ඇයට කරන අමුතු හෙලෙත්තඩුවක් මෙන්, බලා සිටින්නන්හට පෙනිණි. පොලිස් කාරයා ද හති ලන්නට පටන් ගත්තේ ය. ඔහු සියලඟ දහදියෙන් නැවිණි. දාස් දෙන අවිව ද ඉවසිය නොහැකි තරම් කටුක විය. උපකාර පිණිස කිසිවෙක් ද නොළං වූහ.

"අනේ! මේ අම්මා-අප්පා නැති දුප්පත් කෙල්ලට කරන අපරාදේ මොක ද දෙයියනේ?" කියමින් මෙහි දී නන්ද රාළ හිස අත් ගසා මහ විලාපයකින් හඬා ගෙන ආවේ ය. එය අතිශයින් ම ශ්‍රවණ කටුක විය. ඔහු කෙලින් ම මිනිබිරිය දෙසට දිවගෙන ආවේ ය-



මිනිබිරිය නැඟුටුවා ගෙන, නැවත-නැවත හඬන්නට පටන් ගත්තේ ය. ඔහුගේ කට තොල හා සර්වාංගය ම වරම් ගත් නපුවකුගේ මෙන් වෙවුලන්නට විය.

"කවුද මේ නාකි යක්සයා?" පොලිස් කාරයා කලබල වෙමින් විකාලේ ය.

"මේ ඇයගේ සීයා." කවුරුත් කීහ.

"වහපන් නාකියා කට- නැත් නම් උඹවත් ඇදනවා මේ බුරුක්කට." කියා පොලිස් කාරයා තර්ජනය කළේ ය.

ඒ තර්ජනයෙන් කිසි පලක් නොවී ය. මහල්ලාගේ විලාපයත්, ළතෝනියත් පෙර පරිද්දෙන් ම කෙරුණේ ය.

"නාකියා, අහක් වෙයන් ඔතනින්."

"මා මරාලා මිසක්, මගේ දුව ගෙනියන්න දෙන්නේ නැහැ"

"උඹ මගේ ඔළුවට යකා නඟගන්නේ නැතුව, අහක් වෙයන්"

"සීයේ මගේ බැම්ම ලිහන්න සීයේ- උන්දැට මත් දෙයියන් සිහි කර වන්නම්."

මාලිනියගේ වචනයෙන් මහල්ලා ධෛර්යවත් විය. පණ ඇතිව තෙපලන මෙ වැනි බසක් අසන්නට ඔහු ඇයගෙන් මෙ වෙලේ බලාපොරොත්තු නුණේ ය. ඔහුට ලැබුණු ප්‍රවෘත්තියේ හැටියට නම් මාලිනියට කොහෙත් ම කතාව නුපුළුවන් විය යුතු ය. ඔහු දිව ගෙන ආවේ, පණ ඇති-නැති තරමේ මරණාසන්න මිනිබිරියක දකින්නට විනා ඇයගෙන් මෙ වැනි එඩිතර වචනයක් ශ්‍රවණය කිරීමට නොවේ. තරුණ ජයපාල සමඟ සාකච්ඡාවේ යෙදී සිටිය දී, අර ස්ත්‍රිය ඔහුට කියන්නට යෙදුණේ, "අනේ! නන්දයියේ, අන්න අරහේ උඹේ මිනිබිරිය මරා මිනියට බාවලා." යන නපුරු ආරංචියකි.

ඔහු කිසි පැකිලීමක් නැතිව, මිනිබිරිය නියම කළ පමණින් පිටි තොල බැම්ම ලිහන්නට සූදානම් විය. ඔහුගේ වෙව්ලන ඇඟිලි

බැම්මට ළං වුණා පමණකි. පොලිස් භටයා විසින් ඔහු යළිත් ආපසු තල්ලු කරනු ලැබුවේ ය. මෙහි දී මහල්ලා සහ පොලිස් භටයා අතර, නපුරු දෙ බසක් විය. අතරින් පතර, ඉඩ බල-බලා, මාලිනී ද ඊට එකතු වුණා ය. මහල්ලා නැවතත්, වහසි බස් බෙණෙමින් බැම්ම ලිහන්නට ළං විය. මෙහි දී කෙස් රොදකින් ගෙන මහල්ලා ඉවත ලන්නට පොලිස් කාරයා වෑයම් කළ නමුත්, ඔහුට ඉවත් කර ගන්නට ලැබුණේ, අතට ගැළවී ආ මහල්ලාගේ කෙස් රොද පමණකි. මහල්ලාට මෙ තරම් වීර්යයක් ඇති බව ඔහු විසින් නො සිතන ලදි. කිසි විදියකිනුත් වළකා ගත නො හැකි තැන, ඔහු මහල්ලාගේ ඉළයට පයින් ඇන්නේ ය. ඒ ඉවසා ගත නො හැකි වූ අසරණ නන්ද රාළ වේදනාවෙන් ගොනකු සේ මරහඬ දෙමින් ඇද ගෙන වැටුණේ ය. ඒ ශබ්දය අතිශයින් භයංකර විය. අවට බලා සිටි සමහර මහලු ස්ත්‍රීහු ද, ඒ අනුව භයානක විලාපයෙන් හඬන්නට වූහ.

"බලාපල්ලා, බොලාට කරන දෙය. මට මේ රාජකාරිය කරන්න බොලා එකෙක් වත් ඉඩ දෙන්නේ නෑ. බොලා එකෙක් වත් කිසි උදව්වක් දෙන්නේ නෑ. බොලා ඔක්කෝට ම මං එල්ල කරන්නං." මෙ සේ කියමින්, පොලිස් භටයා, අවට මර හඬ දෙන්නන්හට තර්ජනය කොට, නැවතත් මේ මහ කලහ මැද්දේ, මාලිනිය ඇද ගෙන යන්නට ඉදිරියට පැන්නේ ය. මෙහි දී මාලිනියට පළමු පරිද්දෙන් බිම ළගින්නට තරම් අවසරයක් නො ලැබිණි. ඈ පස්සට පැන්නා ය- එහෙත් තමන් පොලිස් භටයා අතට පත් වන්නට පළමු, එ තැනට සැලකිය යුතු අමුත්තකු පැමිණි බව දුටුවා ය. ඒ තැනැත්තෙ, එ කෙණෙහි ම, තරබාරු හුරු තඩියකු වන් පොලිස් කාරයා පිට කරින් ගත් ගමන්, ලුණු මල්ලක් මෙන් ඈතට විසි කර දැම්මේ ය. එ සේ විසිකර දමා, වහා තරුණිය තමන් වෙත ළං කර ගත්තේ ය. පිරිස භ්‍රාන්තියෙන් මත් වූහ. හැමට ම වඩා භ්‍රාන්තිය දෘඪවත් වූ යේ මාලිනියටය- ඈ, ඔහු අතේ ම විසංඥ වූවා ය.

"විනාඩි කිහිපයක් ගත වන තෙක් කවුරුත් නිශ්ශබ්දතාවයෙන් පසු වූහ. හැම දෙනකුගේ ම නෙත් සිත් රැඳුණේ, මේ ශූර වීර



අමුත්තා වෙත ය. මේ යුක්ති ධර්මය, මිනිස් වෙස් ගත් අවස්ථාවකැයි ඔවුහු සිතූහ. "තවත් මෙ තැන, විප්ලවයක් ඇති විය නො හැකියි. ළතෝනියක් ඇති විය නො හැකියි. අරගලයක් ඇති විය නො හැකියි. සියල්ල පිළිපැදීමට සුදුසු උතුමෙකි. මේ සිටින්නේ" යන්න හැම දෙනකුට ම එකාකාරයෙන් ප්‍රත්‍යක්ෂ විය. එහෙත් මේ අමුත්තාගේ ඇස් පමණක් පොලිස් කාරයා වෙත ම රැඳිණි. පොලිස් කාරයා තවමත් ඒ වැටුණු තැන, වැටුණු සැටියට ම පසු වන්නේ ය.

"මේ උඹ රාජ කාරිය කරන හැටි, ඒ?" කියා ඔහු භග්න ස්වරයෙන් විචාළේ ය. "ගළවාපන් මේ බැම්ම."

"පොලිස් කාරයා ද අදිසියේ ලෙඩ වූ රෝගියකු මෙන් එ තැනින් නැගිට, වැනි-වැනී අවුත්, මාලිනියගේ පිටිතොල බැම්ම මිදුවේ ය. ඉන් පසු, අමුත්තා සිය කලිසම් සාක්කුවෙන් ගත් අත් පිසූ ලේන්සුවක් පොලිස් කාරයා ලවා පැන් පොවා ගෙන්වා, එයින් මාලිනියගේ නළල තෙමා, මුහුණ පිස දැම්මේ ය. එකල මාලිනී ඇස් ඇරියා ය- මඳක් වෙලා තරුණයා දෙස උමතුවෙන් මෙන් බලා ගත් වනම සිටියාය- නැවත, සිහි එළවා ගත් කෙණෙහි තැතිගත් පක්ෂිධේනුවක් මෙන් ඔහු කෙරෙන් පලා ගියා ය.

"මේ අහිංසක මිනිසුංට උඹ කළ අඩම්තේට්ටමට මං යන්නේ, උඹට විරුද්ධව රපෝර්තු කරන්න යි. ඉතින් කොන්ස්ටෙබල්, උඹ මේ නටංට හැදූ නාඩගම මොකක්දැයි?" මේ අමුත්තා හෙවත් තරුණ ජයපාල ප්‍රශ්න කළේ ය.

මෙහි දී පොලිස් කාරයා පිළිතුරු නැත්තකු සේ නොහොත් කතා කළ නො හැකි ගොළුවකු සේ ලජ්ජාවත්, භීතියත්, දුරුවන තෙක් මඳක් වෙලා බිම බලා ගෙන සිටියේ ය. මේ කළ වරද ඔහුට ප්‍රත්‍යක්ෂ වන්නේ, දැන් ය. පොලිස් ප්‍රතිපත්තියේ හැටියට ඔහු නිසා මේ දැක් වුණේ මහාජන සේවක ලක්ෂණය ද? මහා ජනාරක්ෂක ගුණය ද? මහාජන මිත්‍රයා විය යුතු තැන- ඡන්දයෙන්

අධර්මයට පෞද්ගලිකාර්ථයට, ක්‍රොධයට, ලොභයට, තෘෂ්ණාවට, දහස් නොවිය යුතු තැන- මේ වුණේ කුමක් ද? සාහසික අපරාධ ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීමකි. තිවට මිනිසුන් අතරට හපන් කම් දක් වන අහංකාරාභිලාෂය නිසා රාජකාර්යය කළ යුතු සැටි ඔහුට අමතක විය. දැන් මේ සිටින්නා, තමාට නිලධාරී කම් කිරීමට සුදුසු මහතෙකි. නීතිය අතට ගෙන, බලහත්කාර කම් කිරීම ඉතින් ඉවර ය. කළ බලහත්කාර කම් වලට සුදුසු කරුණු දක්වීම දැන් කට යුතු ය.

මේ අමුත්තා මහත්මයෙකි. මහතුන් දුටු පුරුදු පොලිස් හටයාට ඒ බව අමුත්තාගේ හැසිරීමෙන් හා කතාවෙන් ම සැලකෙන්නේ ය. මහත් කමට පමණක් නොව, ඔහු අමුත්තාගේ බලවත් කමට ද බිය විය. රාත්තල් සිය ගණනක් එකපැහැර ඔසවා විසි කිරීමට හැකි බාහු බල වික්‍රමයට, මෙ වැනි තත්හි හිස නැමීම නුවණට හුරු බව පෙනිණි.

සිහි එළවා ගත් කෙණෙහි, පොලිස් කාරයා තම නිදහසට කරුණු කියන්නට පටන්ගත්තේ ය. ඔහු ගමට ම චෝදනා නගමින් තමා රබර් සොර කමක් ගැන විභාගයට පැමිණි බව කීයේ ය. පිටිතොල බැඳ, මාලිනිය ගෙන යන්නට වුවමනා කළ කාරණයත්, එ සේ ම දුක් මුසු පෙනුමෙන් යුත් සිරකරුට ඇදා, අන්දා, ගෙන යන්නට වුවමනා කළ කාරණයත්, ඔහු විස්තර කලේ ය.

මේ දුක් මුසු පෙනුමැති සිරකරු අරණායක මිනිසෙකි. ඔහු අහිංසකය- ඇතැම් විට, සිඟන්නකු සේ ඉල්ලා කැමෙන් දිවි රැක ගත්තේ ය. ඔහු එ දින, වේලාසනින් ම, අරණායක කඩ මංඩියේ රබර් පාර්සලයක් විකුණන්නට වෑයම් කළ බව සැළ විය. එක රබර් ගහක් වත් අහිමි ඔහු, මේ රබර් ලැබුණු සැටිය ගැන ඇදහිය යුතු වචනයක් කියන්නට ද නො හැකි විය. තමාට ඒ රබර් මිටිය ගඟෙන් ලැබුණු බව ඔහු කීයේ ය. කිසිවෙක් ඔහු නො ඇදවූ හ. එ හෙයින්, කවුරුත් ඔහු පොලිසියට බාර කළහ. පොලි- සිය ප්‍රශ්න කරන්නට වූ විට, ඔහු තව ටිකක් කාරණය පැහැදිලි



කරමින් ගඟට රබර් ලැබුණු සැටිය ද කීයේ ය. නිකිණියානේ අන්දා රබර් මිටියක් ගෙනැවිත් ගඟේ දමූ බවත්, මේ ඒ රබර් මිටිය බවත්, ඔහු කීයේ ය. ඒ නිසා කාරණය තවත් ඈතට පටලැවෙන බව පොලිසියට පෙනුණු හෙයින් අන්දා සොයා, මේ ගැන විභාගයක් පවත්වා, රපෝර්තු කරන හැටියට තමා, පිටත් කර එවූ බව පොලිස් හටයා කියා සිටියේ ය.

"හොඳයි, උඹට මේ තරුණියකගේ පිටතොල බඳින්නට වුවමනා කෙලේත්, ඇය පොලිසියට ගෙනියන්නට උවමනා කෙලේත්, මන්දයි?" මෙහි දී තරුණ ජයපාල ප්‍රශ්න කලේ ය.

"ඇය මේ ගැටයාව වහන් කළ නිසා යි." පොලිස් කාරයා, අන්දා පෙන්වමින් කීය.

"අනේ! හාමුදුරුවනේ, ඒක නම් පොලෝ පැළෙන බොරුවක්- මා නම් මාලිනීගේ ඇහැටවත් පෙනුණේ නැහැ.

මේ මා කියන්නේ, ඇත්තයි, හාමුදුරුවනේ. මෙයා" යනුවෙන් අන්දා සිතන සිරකරු දක්වමින්, "මාව පෙන්වා දීපුවා ම මේ රාළහාමිට, මා දැන ගත්තා මොකක්ද ගැටයක් තමයි, මෙක කියාලා- මා පැන්නා, ඒ පාර වෙල පල්ලෙහාට- අර ගල් ඇන්දට මුවා වෙලයි, මා හිටියේ. මාලිනී මාව ඇහින් වත් දක්කේ නැහැ. එතකොට මාලිනී කොටුව ඇතුළේ නානවා. නාලා එළියට එන කොට තමයි මේ රාළහාමිට හම්බු උණේ. ඉතින් ඇයට හෙලෙක්කාඩු කරංට උනාම, මත් කැමැත්තෙන් ම ඇවිත් රාළහාමිට බාර උණා. ඇය නිදහස් කරන්නය කියා" අන්දා වැඩි දුරටත් කීයේ ය.

ජයපාල තරුණයාට මෙහිදී අන්දාගේ අගය තව-තවත් පෙනෙන්නට විය. අන්දා නූගත් තරුණයකු වුව ද උදාර ගුණ සම්පන්න වීරයෙකි. නාගරික ලොකයා අතර නම් මෙ වැනි ආත්ම ත්‍යාගය මුව නො සැහෙන පාරට්ටුවට කාරණයකි. එ සේ ද වුව, මේ ගම්මුන්හට මෙහි අගයක් නො දනෙන්නේ

ඔහුන්ගේ නුගත් කම ද, නොහොත් ඔවුනට මෙහි විශේෂයක් නොදනෙන නිසා ද?" මේ වැනි දෙය සමහර විට, මේ පිටිසර අහිංසක මිනිසුන් අතර, නිතර කෙරෙනවා විය යුතු ය.

"අන්දා මේ රබර් පාර්සලය ගහේ දමන කොට, උඹ කොහේ ද හිටියේ?" තරුණ ජයපාල සිහන සිරකරුගෙන් ඇසුවේ ය.

"මන් එතකොට, පාලම යට නානවා. හාමුදුරුවනේ" යනු ඒ අසරණ මිනිසාගේ ක්ෂණික පිළිතුර විය.

"කොන්ස්ටෙබල්" නිසා මෙහි දී ජයපාල විශේෂයෙන් ආමන්ත්‍රණය කොට, "මේ සිරකරුට රබර් පාර්සලය නිසා මෙ තරම් කලබලයක් ඇතිවේ ය කියා මට නම් හිතුණේ නැහැ, මේකට වැරදිකාරයා මායි" කියා කීයේ ය.

ජයපාල තරුණයා රබර් මිටිය ගහට ගිය සැටි විස්තර කරන්නට වූ විට, එම විස්තරය පොලිස් කාරයාට මෙන් ම අවට රැස් වූවන්හට ද පුදුමයක් විය. අන්දාගේ චිත්තියෙනුත්, සිහන සිරකරුගේ චිත්තියෙනුත් ඒ එක සේ ස්ඵුට විය.

"මේ රබර් අයිති මට යි. මීට මුදල මගෙන් ගෙවිලා ඉවර යි. ඒ දුප්පතා මා වෙනුවෙන් ඒක විකුණා ගත්තාවේ." යයි ජයපාල නැවතත් කීවේ ය.

සිරකරුවන්ගේ නිදහසට මෙ තරම් වැදගත් සාක්ෂ්‍යයක් කියැවුණාට පසු, ඔවුන් මාංචුවෙන් මිදීම පොලිස් කාරයාගේ යුතු කම විය. සිහන සිරකරුට පමණක් නැවත පොලිසියට පැමිණී අයිතිකාරයා වෙනුවෙන් රබර් පාර්සලය බාර ගෙන, කැමැත්තක් කර ගන්නට යයි ඔහු කීයේ ය.

"ඉතින් මට මහත්මයාගේ නම ඕනෑ මේ දෙදෙන නිදහස් කර දම්මේ, මහත්මයාගේ සාක්කිය නිසා යි" කියමින් පොලිස් කාරයා, තම නෝට් පොත එළියට ගත්තේ ය.

"මාගේ නම ජෝන් ජයපාල."



නම ලියනු වෙනුවට, මේ පොලිස් කාරයා ගල් ගැසුණා සේ තරුණ ජයපාල දෙස බලාගත් ගමන් සිටියේ ය. ඔහුගේ සිතේ තැති ගැන්ම වැඩි වුණු බව මුහුණෙන් ද පෙනිණි.

"මේ ගලපිටකන්ද ළඟ දී ගත්තේ තමුන්නාන්සේ දැයි?" ඔහු පසල සිතින් ඇසුවේ ය.

"අන්න හරි"

මේ පිළිතුරු ශ්‍රවණය කළ පොලිස් කාරයා පමණක් නොව, ගම්මු ද තැති ගැනුණු සිතැත්තෝ වූහ. තරුණයාගේ රූපයත්, තේජසත්, වික්‍රමයත්, ඇස් ඇති කාහටත් පෙනේ. එ සේ ද වුව, මේ අසල පිහිටි විශාල රබර් වත්ත අලුත මිලයට ගත් මහා ධනවතා, මොහු බව මෙ තෙක් මේ කිසිවෙක් නොදත් හ. නන්ද රාළ ද මහත් සේ කැළඹුණේ ය. කිසි ගරු සරු කමක් නැතිව තමා කළ සමච්චල් කතාව ඔහුට සිහි විය.

"කොන්ස්ටෙබල්, මට බොහොම කනගාටුයි. තරුණිය නිදොස් බව දන දනත්, උඹ ඇයට කළ හිංසාව, උඹේ පොලිස් කාර කමට තියා පිරිමි කමට වත් ඔබින වැඩක් නොවෙයි. මේ වැඩිහිටියාගේ හිස නිකට වත් නො බලා උඹ ඔහුට කළ අඩම්තේට්ටමත් ඉතා ම නින්දිතයි" ද ජයපාල කීයේ ය.

සාවද්‍ය චිත්තය කරණකොට ඇති වන පශ්චාත්තාපයත්, ලජ්ජාවත්, පොලිස් හටයාට නම් දුන් ඉවසුම් නො දෙන තරම් ය. ඔහු බැගෑපත් නිවට සිතින් තරුණයාට සමීපව, කන් කෙඳිරි ගාන්නට විය. ඒ කොඳුරන දෙය නොඇසුණත් ඔහු යදින්නේ, සමාව බව කවුරුත් තේරුම් ගත්හ. තරුණයා ඒ කිසිවක් කනට ගත් බවක් නො පෙන්නුවේ ය- ඔහු නන්ද රාළ දෙස පමණක් බලා සිනාසුණේ ය.

"අනේ! තමුන්නාන්සේට බුදු බව අත්වෙන්න ඕනෑ. දුප්පත් අපට මෙහෙ ම පිළිසරණක් උණාට" කියමින් මහල්ලා ගැඹුරු ඇද නෙතින් වැගිරෙන කඳුළු පිස ලන්නට විය.

"කොන්ස්ටෙබල්, තවත් උඹට මෙහෙ රාජකාරියක් නැත් නම් යන එක හොඳයි. ඔය දනමුතු කම් උඹට දෙන එක තම යි, දතට මට කරන්නට පුළුවන් උදව්ව." කන් කෙඳිරි ගානා පොලිස් භටයාට ජයපාල කීයේ ය.

පොලිස් කාරයා කර බා ගෙන, යන්නට ගියේ ය. සෙසු බොහෝ දෙනා ජයපාල පිරිවරමින් ගමන් කළාහ. නන්ද රාළ ද ඒ මේ අත වැනි-වැනී, බකළ ගසමින් පසු-පස්සේ ගියේ ය. ඔහුගේ මුහුණ දුක් මුසු ය- තවමත් බැගෑපත් ය. දැන් අත් වුණේ, ලොකු ජයක් වුව ද, එහි ප්‍රීතිය ඔහු කෙරේ නොපෙනේ. තරුණයා මේ කොයිබ යන්නේ ද කියා ඔහු දන්නේ ය. තරුණයා සිය මිනිබිරිය පොලිස් භටයා අතින් ගළවා ගත්තේ, පිනට හැරීමට නොවේ. දිවියා කටින් සාවා ගළවා ගත් වැද්දා මෙන් තමාගේ ම ප්‍රයෝජනය සලකා විය යුතු ය. පළමුවෙන් නම් තරුණයා ගණනකට නො ගෙන පන්නා ගන්නට ඔහුට පුළුවන් කම තිබිණි. ඒ පුළුවන්කම් දූන් නැති එක කනගාටුවකි. තරුණයාගේ මේ ගමනට තවමත් ඔහු නොකැමැති ය. මේ ගමනින් අනර්ථයක් විනා, අර්ථයක් නො වන බව ඔහුට පෙනේ.

චිත්ත ධෛර්ය ඇති.කරවන කතාවෙන් ජයපාල ගම්මුන්හට අනුශාසනය කළේ ය. ආංඩුවේ ඉතා උසස් නිලධාරියා පවා මහා ජනයාට සේවය පිණිස සිටින්නකු විනා, මහා ජනයා පෙළන්නට සිටින්නකු නොවන බවත්, නිලධාරින් යැපෙන්නේ, මහා ජනයාගේ මුදලින් බවත්, එ හෙයින් නිලධාරීන්හට අයුතු හරසර දක්වා, ඔවුන්-ගෙන් පීඩා විඳින්නට නොතරම් නිවටයකුට වුවත් කිසි ම යුතු කමක් නැති බවත් නිලධාරීන්ගේ අයුතු බලාත්කාරකම්වලින් වළකින්නට නම්, ගම්මුන් විසින් ග්‍රාමාරක්ෂක සමිති පිහිටුවා ගත යුතු බවත්, එකල ආංඩුවේ සේවකයන් ගෙන් හිංසා පීඩා ලබනු වෙනුවට නියම ප්‍රයෝජනය ලබන්නට හැකි වන බවත් කීයේ ය.

"මට ලොකු උන්නැහේගේ විලාපය ඇහෙන කොට, මහ පුදුමයක් වුණා- වරක් ඇහුණා, ගැනියකුගේ වැනි හීන් හඬ



හඬක්- නැවත ඇහුණා, පිරිමියකුගේ වැනි මහ ගොරෝසු කට හඬක්- මට හිතුණේ නැහැ. එතකොට, මේ වත්ත පහල වෙල මෙ තරම් එ පිට බව" ජයපාල නැවත මහල්ලා දෙස බලා කීයේ ය.

"අනේ! නන්දයියාට ගහන කොට අපට ඔක්කෝට ම කැගැහුණානේ- තමුන්නාන්සේගේ හතර ගාතේට යෝධ බල, යෝධ හයිය ලැබෙන්න ඕනැ- නැත්නම් උන්දැව මෙලාකට මරා මිනියට බාවලා නේ?" මෙහි දී ගැහැනියක් කීවා ය.

මාලිනියට අඩමතේට්ටම් කරන බව කලින් නන්ද රාළට දනුම් දුන් ගැහැනිය ද මෝ තොමෝ ය.

නන්ද රාළගේ නිවෙස පෙනෙන්නට පටන් ගත් තැන් සිට, ජයපාලට සිහි වුණේ, මාලිනිය ගැන ඔය ඇය දකින නොඉවසිල්ලෙන් ඔහු ලෙඩකින් මෙන් පෙළෙන්නට විය. මේ අරගලය මෙ සේ නො වෙන්නට මාලිනිය දකින ප්‍රස්ථාවය මෙ තරම් පහසු වෙන් ඔහුට නො ලැබෙන්නේ ය. මේ දෛවයෙන් සිදු වූ දෙයකැයි ඔහු සිතුවේ ය.

"අහෝ! ඇය ඒ වේලේ මා දෙස බැලූ හැටි! මා හැඳින ගත් හැටියේ, තැති ගත් හැටි! නැවත විසංඥ වූ හැටි! ඔව් ඇයට වුණේ කිසිත් බලාපොරොත්තු නැති වෙලාවක මා හමුවෙන්නට ය." මේ ආදි දෙය සිතමින්, ඇයගේ විසංඥ දෙහයෙහි පවා රූප ශ්‍රිය, හේ ආවර්ජනය කළේ ය.

කෙණෙහි පණ නල ගිය කිරිල්ලියක මෙන් ඈ මොහොතින් මැල වුණා ය. ඇයගේ රූමත් දෙහයෙහි වර්ණ සම්පත්තියට පමණක් එයින් හානි විය. එයින් ඇය කිරි ගරුඬ පිළිමයක් මෙන් පුදු වුණා පමණකි. කිසි ම ශිල්පියකුගේ වත් මෙ තරම් විශිෂ්ට නිර්මාණයක් නුදුටුවෙමි. ඇය සිහි ලත් සැටියේ, දෙනෙත් විකසිත කළ සැටි! විකසිත වූ දෙනෙතින් මදක් බලා ගත් වනම සිට, නැවත විළියෙන් මිරිකී උමතුවෙන් මෙන් පලා ගිය සැටි! හා! පුදුමයකි.

විනාඩි ගණනකට පළමු සිදු වූ මේ සියල්ල ඔහු මෙ සේ නැවත මෙනෙහි කරමින් නන්ද රාළගේ නිවෙසට පැමිණි නමුත් ඔහුට මාලිනිය දකින්නට ලැබුණේ, බලාපොරොත්තුවේ සැටියට නොවේ. මාලිනී සිත්-පිත් නැති ඉටි රුවක මෙන් සෝපාවක වැතිර ගෙන සිටියා ය. ගැහැනු පිරිසක් ඇය වට කොට ගෙන, නොයෙක් ලෙසින් ප්‍රතිකාර කරන්නට වූහ. හුස්ම තිබෙනු පමණක් මුත් සෙසු සියලු ලකුණු වලින් ඇය නම් දැන් මළ මිනියකි.

ඇය දුටු කෙණෙහි, ජයපාල බිය පත් විය. ඔහුගේ තලෙළු මුහුණ සුදු කර්දාසියක් මෙන් හෙල් මැලි විය. මේ සාමාන්‍ය විසංඥතාවක් නොවන බව පෙනේ. එ හෙයින් ඔහු මහත් කලබලයෙන් හා සන්වේගයෙන් ඇයට කතා කළේ ය. කිසි පිළිතුරක් නොලත් තැන, නළල අත ගා බැලුවේ ය. ඇයගේ සියලඟ කෙසෙල් කඳක් මෙන් සිසිල් විය.

"ලොකු උන්නැහේ, මෙහාට එනවා, ඔතන අඩා වැටිලා කිසි පලක් නැහැ. මෙහෙ කිට්ටුවක දොස්තර කෙනෙක් නැද්දයි?" මිදුලේ මර ළතෝනියෙන් හඬන මහල්ලා කැඳවමින් ජයපාල ඇසුවේ ය.

"දොස්තර කෙනෙක් නැහැ. වෙද මහත්තෙක් නම් ඉන්නවා."

"එක්ක එන්න."

ජයපාලගේ පළමු ප්‍රශ්නයට පිළිතුරු ලැබුණේ මහල්ලකුගෙන් නොවේ. අන්දාගෙනි. වෙද මහතා ගෙනෙන්නට අන්දා ම එ කෙණෙහි පිටත් විය. අන්දා විදුලි වේගයෙන් දිව්වේ ය. පෙර කවදා වත් නොදිවූ තරම් ඉක්මනටත්, මතු කවදා වත් නුදුවන තරම් ඉක්මනටත් දිවුවේ ය.

මුහුණ පුරා රැවුල ඇති, කරුණාවත් පෙනුමකින් යුත්, මේ වෙද මහතා පස් පනස් විය සිටි තලතුනා පුද්ගලයෙකි. ඔහු පෙනුමෙන් වෙදකුට වඩා ජන නායකයකුට හුරු ය. සෙසු ගම්මුන් කෙරේ නො දැක් වුණු කුශල බලයක්, ඔහු කෙරේ පවතින්නේ ය. රැස් වූ පිරිස කවුරුත් වෙද මහතාට හරසර දක්වා පසකට වූහ.



වෙද මහතා ලෙඩා පරීක්ෂා කරන සැටියෙන් ම ලෙඩය බරපතළ බව ගම්මුන්හට නම් එක හෙළා ප්‍රත්‍යක්ෂ විය. ඔහු රළු බසින් බැණ වදිමින් ළඟ සිටින්නන්ට සැර-වැර දක්වයි නම්, ලෙඩය අසාධ්‍ය නොවන බවට එය ම ලක්ෂණයකි. එ හෙත් වෙද මහතා අද ඉතා ම උපශාන්ත ය. එ හෙයින් කවුරුත් දුකින් සුසුම් හෙළූහ.

"ඉතින් නම් ජීවකයා ගෙනාවත් බැහැමයි. පුළුවන් නම් පිටකන්දේ වෙද මහත්මයා ඔහො ම ඉන්නේ නැහැ." ගැහැනියක්, තවත් ගැහැනියකගේ කනට කර කීවා ය.

"දැන් පණ ගිහිල්ලා- පේන්නේ නැද්දයි?" තවත් ගැහැනියක් එය අනුමත කළා ය.

වෙද මහතා ද, ස්වකීය මතය ප්‍රකාශ කරමින් මෙය අදිසියෙන් ලේ කෝප වීම කරණ කොට ඇති වූ මූර්ජාවක් බවත් මීට ප්‍රතිකාර පිණිස අවශ්‍ය ඖෂධ විශේෂයන් තමා ළඟ නැති බවත්, කීයේ ය.

"එහෙ නම් මෙහෙ බෙහෙත් සාප්පුවකින් වත් ගන්න නැද්දයි?" ජයපාල පුදුම වෙමින් ඇසී ය.

වෙද මහතා සිනා සුණේ ය. "අපේ බෙහෙත්, දොස්තර බෙහෙත් මෙන් සාප්පුවල ඇත්තේ නැහැ. හදා ගත් බෙහෙත් ළඟ තිබෙන කලියෙන් වෙද කම් කරතැකි. නැති වුණා ම ඉතින් නිකං ඉන්න ඕනැ.. ඔය අපට වෙලා තියන දෙයක සැටි තමා" යයි වෙද මහතා කීයේ ය.

ගම් ගොඩෙන් යන්නකුට ගලපිටකන්ද ඉතා කිට්ටු බව දැන ගන්නට ලැබෙන හෙයින් ජයපාල මෙහි දී නෝට් පොතෙන් කර්දාසියක් ගෙන ලියුමක් ලියා, අන්දා අත ම, වත්තේ දොස්තර වෙත යැවූවේ ය. ඒ අතර, වෙද මහතා සමග කතා කරන ඔහුට සිංහල වෙද මහතුන්ගේ විශේෂයෙන් ම පිටිසර වෙද මහතුන්ගේ, පුදුම වැඩ පිළිවෙළ ගැන දැන ගන්නට ලැබිණි. මේ වෙද මහත්වරු,

වෙද කමට ගාස්තුව වශයෙන් කිසිවකුගෙන් කිසිවකුත් අය නො කරති. වෙද කම් පමණක් නොව, ලෙඩුනට තෙල් බෙහෙත් ආදිය සපයන නමුත්, ඊට ද කිසිවක් අය නොකරති. දොස්තරවරුන්ගේ වැඩ පිළිවෙල දන්නා ජයපාලට මේ සන්වේගයට කාරණයක් විය. මෙ සේ නොමිලයේ වෙද කම් කරන වෙද මහතුනට මෙලෝ වශයෙන් ලැබෙන පලය ඉතා ම අල්පය- අවුරුද්දකට වතාවක් ගම්මුන්ගෙන් ලැබෙන බුලත් හුරුල්ලත් ගෞරවයත් පමණකි. පින් සලකා කරන බව මුත් නො එසේ නම් මෙ තරම් මහන්සියෙන් හා වියදමෙන් තෙල්-බෙහෙත් ආදිය සම්පාදනය කොට ගෙන, මෙ සේ මේ වෙද කම කිරීමට කවරෙක් නම් සතුටු වෙද්ද?

"වෙද කමට නිතර උවමනා කරන බෙහෙත් ටික විතර යි, අප සාදා ගන්නේ- මෙහෙ ම ලෙඩක් හැදෙන්නේ, බොහොම කලාතුරකින්- මෙහෙ ම ලෙඩට දෙන බෙහෙත් නරක් වී අහක දමන්නයි වෙන්නේ. ඒ නිසා අප ඒවා හදන්නට වැඩි මහන්සියක් වෙන්නේ නැහැ. හැම වෙදුන් ම, මෙහෙම බෙහෙත් නැතෙයි කියා යන්නේ නැහැ. ඔහේ කොළ ඉස්ම ටිකකින් මොකක් නමුත් ගුළියක් දිය කොට, නස්නයක් තර ලා තමා, බැරිය කියතොත්, බැරිය කියන්නෙ,යි වෙද මහතා වැඩි දුරටත් කීයේ ය.

වෙද මහතා ගියාට පසුවත් ජයපාලට සිංහල වෙද මහතුන් ගේ දයාදක්ෂිණ්‍යය ගැන නොසිතා සිටිය නොහැකි විය. මෙයින් සිංහල වෙදකම පිරිහෙනු විනා දියුණු විය හැකි බවක් ඔහුට නොපෙනිණි. මෙයින් කෙරෙන්නේ, පින් කම පමණකි. වෙද කම නොවේ. වෙද කම ඉතා ම ඇවැස්ස කම වැනි තැනක දී, පින් කමත් වෙද කමත් දෙක ම නැති වේ. මෙ සේ පින් කම් කරමින් වෙද කම් අත පසු කිරීම වෙදුන් තමන්හටත්, රටටත්, කරන බලවත් හානියකි. සිංහල වෙද කම ඉතා ම සුළු වියදමකින් ලද හැකි නිසා එය ම රටේ ප්‍රචාරයට පැමිණි විය යුතුය- එය ම ආරක්ෂා කට යුතු ය. තව ද තමාට යම් කිසි ප්‍රස්තාවයක් ලැබුණු කෙණෙහි සිංහල වෛද්‍ය කර්මයට අයත් ඖෂධ විශේෂයෙන් සියල්ල බල පත් ලත් රසඥයන් ලවා සාදවා ඉතා පහසු මිලයකට හැම වෙදුනට ම ලබා ගැනීමට ක්‍රමයක් ආංඩුවේ නියමයෙන්



ව්‍යවහාර ප්‍රාප්ත කිරීමට ජයපාල සිතට ගත්තේ ය. සිංහල වෛද්‍ය ක්‍රමය පහත බැසීමට ප්‍රධාන හේතුව සේ දත් ඔහුට පෙනෙන්නේ, බෙහෙත් නැති කමය. මේ අඩුපාඩුව සිංහල වෛද්‍ය ශාස්ත්‍රයට වන හානියටත් වඩා මහා ජනාරක්ෂාවට වන හානියකි. මේ වෙද මහතාගේ එක ගුණයකට ජයපාල විශේෂයෙන් ම පැහැදුණේ ය. රොගයට අවශ්‍ය ඖෂධය නොමැති කල අනවශ්‍ය ප්‍රති කර්මයන්ගෙන් රෝගියා නොපෙළා ඇත්ත ප්‍රකාශ කිරීම වෙද මහතාගේ වටිනා ගුණයක් සේ ඔහුට පෙනිණි.

පිරිස ක්‍රමයෙන් වැඩි වූහ. ඔවුනතර කලබලය ද බලවත් විය. ඔවුන් ලෙඩා වට කොට සිටි සැටියෙන් කරන්නේ අනර්ථයක් බව පෙනුණු බැවින් ජයපාල බලාත්කාරයෙන් ඔවුන් එළියට පන්නා දැම්මේ ය. ඉන් පසු එකෙක් වත් මාලිනිය හුන් තැනට යන්නට නො සිතූහ. හැම දෙනා මිදුලට වී විලාපයෙන් හඬන නන්ද රාළ දෙසත්, කෝපයෙන් හා සන්වේගයෙන් පසු වන ජයපාල දෙසත්, මාරුවෙන් මාරුවට බැලූ හ. සමහරු දොස්තර ම ඇවිත් අවසාන තීරණය කරන තෙක් බලා හුන් හ.

ජයපාල දොස්තර එන තෙක් මහ බලා සිටියා විනා මාලිනිය සමීපයට වැඩිපුර නොගියේ ය. මළ සිරුරක් වන් ඒ දේහය දෙස ඔහුට කොතෙකුත් බැලිය නො හැකියි. අදිසියකට වෙද කමක් වත් නොලද හැකි මෙ වැනි ගමක පවතින දුඃඛිත භාවයක හැටි! ඔහු ඔර්ලෝසුව බල-බලා හොර පාරෙන් ගලපිටකන්දට ඇති දුර ප්‍රමාණය ගැන මිනිසුන්ගෙන් නැවත-නැවත ප්‍රශ්න කළේ ය. "දැන් දැන් දොස්තර මහතා ළඟ එනවා ඇතැයි" කවුරුත් කීහ. ගලපිටකන්දේ එක මායිමක් නිකිණියාන බවත්, කඳු ගැටයක් තරණය කළ කෙණෙහි කෙලින් ම යැවෙන්නේ, වත්තේ බංගලාවට බවත්, ඔහුට මෙහි දී දැනගන්නට ලැබිණි. ජෝන් ජයපාලට මෙය ද අලුත් ආරංචියකි. ඒ මෙ වේලේ හැටියට නම් ඇදහිය නො හැකි තරම් තුෂ්ටි, දායක ය. "මාලිනියට තව මෙ ලොව ඉන්නට වාසනාව තිබිය යුතුයි. මාත් මෙ නැති සිටිය දී කිසි වෙද කමක් නැතිව, ඇයට- හා! හා! වචන මාත්‍රයකින් වත් ඇයගේ නමට 'මරණය' 'සම්බන්ධ කිරීමට මැලිව, ඔහු ලොමු දැහැ ගනිමින් තිගැස්සුණේ ය.

# 7

ගලපිටකන්දේ දොස්තර, එම වත්තට පමණක් නොව, ඒ ළඟ වතු කිහිපයකට ම වෙද කම් කරන, මැදි වියෙහි සිටි මිනිහෙකි. ඔහුට කවුරුත් දොස්තර යයි කියත් නමුදු, ඔහු නම් නියම දොස්තර කෙනෙක්- එනම් විභාගයන් නිසා අධිගතයට පැමිණි උපාධි ධාරියෙක්- නොවේ, ඉංගිරිසි හෝඩියෙන් අකුරු අටක් දහයක් සිය නම අගට යොදා ගත් ඇතැම් විශේෂඥයනට වඩා මේ වෛද්‍යවරයා කෙරෙහි රෝග නිදාන නිරූපණ ශක්තියත්, කෘතහස්ත භාවයත් පවතී. ඔහු මුලින් වැඩ පටන් ගත්තේ, ඩිස්පැන්සර් කෙනෙකු මෙනි. ඩිස්පැන්සර්වරුන් වෙදකමට අවසර ලත් විට, බලය ලත් මිනීමරුවන් වෙතැයි සමහරු කියති. එ හෙයින් වතුවල වැඩ කරන දෙමළ කුලී කාරයකුගේ විනා සැහෙන්නකුගේ පණක් ඔවුන් අතට පත් කිරීමට සමහරු ඇළි-මැලි කරති. කරුණු මෙ සේ වුව ද, සියලුම ඩිස්පැන්සර් වරුන් මිනීමරුවන් සේ පිළිකුල් සිතින් බැහැර කිරීම අයුතු බව, ගලපිටකන්දේ මේ දොස්තර නිසා ප්‍රත්‍යක්ෂ විය.

ගලපිටකන්දේ මේ දොස්තර මහතා සිංහලයකු බැවින් සිංහල පහසුවෙන් කතා කරන්නේ ය- දෙමළුන් ආශ්‍රය කරන බැවින් වඩා හොඳට දෙමළ කතා කරන්නේ ය. ඔහුට ඉංගිරිසි ද තරමක් දුරට පුළුවන. ඔහු කෙරේ අන් කිසි ගුණයක් නැතිවත්, උපායනය හෙවත් ශාස්තුව ම සලකා වෙද කම් නොකරන්නකු හෙයින්, දුප්පත් බොහෝ දෙනා නියම දොස්තර කෙනකුට වඩා මොහු ප්‍රිය කළාහ. වතු අයිතිකාරයනට නොහොත් වතු සුපිරිංටැංඩංට් වරුනට ද ඔහු ප්‍රිය මනාප වසතුවකි. ශාස්ත්‍රයෙහි අධිගතයට පැමිණි අභිනව උපාධි ධාරීනට මෙන් ඔහුගේ හිසේ "රෝග බීජ"



නැති කම මීට ප්‍රධාන කාරණය විය. එ තරමම ප්‍රත්‍යක්ෂ නුවූ වත්, වියදම අඩුවෙන් පහසු පිළිවෙළකට කරන ප්‍රතිකාරය, වියදම් වැඩි රෝග බීජ න්‍යායානුසාරී නවීන ක්‍රමයකට වඩා වතු කාරයෝ ප්‍රිය කළාහ. එ හෙයින්, මේ කුඩැල්ලන් අරින, අබ පැලැස්තර දමන, පරණ දොස්තර නිසා අලුත් දොස්තර වරුනට මේ පලාතෙන් කිසි වාසියක් නොවීය.

අන්දා ගෙනා ලියුම දුටු කෙණෙහි, මේ දොස්තර මහතා එ වේලේ ම නිකිණායානට පිටත් වුණේ ය. වෙන කෙනකුගේ පණිවුඩයකට නම්, ඔහු එ තරම් ඉක්මන් නොවන්නේ ය. ඔහුගේ විශේෂ උනන්දුව, මේ අභිනව ස්වාමියාගෙන් ලැබුණු මේ ප්‍රථමාරාධනය හෙයිනි. ඔහු ගෙට ගොඩ වූ හැටියේ තරුණ ජයපාලට අත දී ආචාර කොට, කුනටිය දෙ පැත්තේ පුගත් හැන ගෙන, හති හැරියේ ය. ගමන් මහන්සිය ඔහුට එ තරම් බලවත් ය. සුව සේ හුස්ම ගත හැකි වූ කෙණෙහි ගෙට වන් හෙතෙම ලෙඩා පරීක්ෂා කිරීම පටන් ගත්තේ ය.

ජයපාල, වෙදා කැටුව, ලෙඩා වෙත නො ගොස් බරාඳයේ ම නතර විය. රෝගියාගේ කාමරය වෛද්‍යයාගේ ආඥා චක්‍රයට යටත් රාෂ්ට්‍රයකි. වෛද්‍යයා එහි රජ කරන්නේ ය. එ හෙයින්, ඔහු අතවැසි බව නො පතන හෙතෙම එහි වදින්නට නොකැමැති විය. එ පමණක් ද නොවේ. ලෙඩා පරීක්ෂා කරන වෛද්‍යයෝ රෝග පරීක්ෂණයෙහි දී රෝගයෙහි සාධ්‍යත්වය නොහොත් අසාධ්‍යත්වය තුමූ නො දැනුවත්ව ම පළ කරති. වචනයෙන් කරන ප්‍රකාශයට වඩා මේ වස්ත්‍රයෙන් කරන ප්‍රකාශය බලා සිටින්නනට ඉවසුම් නො දෙන්නකි. ගමේ මිනිසුන්ගේ කල්පනාවේ හැටියට නම් මාලිනී මැරිලා දත් පැයක් ගොසින් ය. ඇය වත්ත පහලින් දිව ගත් එක පිම්මට ගෙදර ගියේ, මරු විකලෙන් බවත්, එ සේ ගොස් සෝපාව උඩ වැටුණේ, ජීවිත හානියෙන් බවත්, ඔවුහු කීහ. ඔවුන් කියන දේ ජයපාලට ද ඇසෙන්නේ ය. එයින් ඔහු සිතේ ද සැක උපදින්නේ ය.

ගම්මුන්හට නම් මෙය, යක්ෂෝපද්‍රවයකින්- මදන මෝහනය වැනි යක්ෂෝපද්‍රවයකින්- වැලඳුණු රෝගයකි. යක්ෂ දෘෂ්ටියක සම්බන්ධය නැති කිසි ම රෝගයක් මේ ගම කිසිවකුට නො වැලඳෙන්නේ ය. ඉස රදය ආදි කොට ඇති "අට අනූවක් රෝග- නවානූවක් වැදි- දෙසිය තුනක් අන්තරා" සියල්ල ම අමනුෂ්‍ය හයින් හට ගනිතැයි කියන හෙයින්, වෙද-හෙද කම් පමණට ම ඔවුහු යකැදුරු කමට පමණ ගෞරවය වෙද කමට වත් නොලැබේ. මාලිනිය සිහි සන් නැතිව දිව්වේ, ඉර මුදුන් වේලෙ බැවින් යස්ස බැල්මෙන් තනි කම් වීමට එය ම කාරණය වූ බවත්, එ වේලේ ම, සැහෙන ගොඩ පිළිවෙතක් නො ලැබුවේ, ඇයගේ මහත් කරුම බළය බවත් බොහෝ දෙනා කීහ. දැන් නම්, මාලිනියට කට හැකි ප්‍රතිකාරයක් නොමැති බැවින්, ඇය පිළිබඳ ආලයය අත් හළ ඔවුහු තමන්ගේ සාත්තුවට සුදුසු හෙයින් නන්ද රාළ රැගෙන, පිටු පස බරාඳයට ගොස්, ඔහුට සිත් වූ පරිද්දෙන් ප්‍රතිකාර කරන්නට පටන් ගත්හ.

නන්ද රාළගේ බැරි කමට නම් කට යුතු වෙද කම් ඔවුහු කවුරුත් හොඳ හැටි දනිති. කෙනෙක් බෙහෙත් තෙල් ගෙනවුත් ඔහු පිට දළ හා ළැම ගැල් වූහ. කෙනෙක් පත්තු ගා මැල්ලුම් පිළියෙල කළාහ. කෙනෙක් බිත්තර-අරක්කු සංයොගය සෙවූහ. කෙනෙක් යකැදුරකු ගෙන්වා, ඇප නූලක් නොහොත් "ආරස්සා නූලක්" ජප කැරැ වූහ. නූල බාගයක් මැතුරුණ පමණින් නන්ද රාළ කතා කළේ ය.

"අනේ! මගේ අබින් හෙප්පුව හොය ලා දියල්ලා" යයි ඔහු කෙඳිරි ගෑවේ ය.

එයින් ම කාහටත් නූලේ ආනුභාවය ප්‍රත්‍යක්ෂ විය. එහෙත් එය කිසිවකුටත් අරුමයක් සේ නොපෙනිණි. නූල නිසා යම් ගුණයක් නොලැබිණි නම් ඔවුනට අරුමය විය යුතු එය ම ය.

"ගුරුන්නාන්සේ, ඔන්න ලෙඩා කතා කරනවා" යයි ගැහැනියක්, යකැදුරා වෙත යමින් කීවා ය.



"ඔහේ දොඩවන්දෙන්- නිකං හිටිල්ලා" යයි මතුරන අතර ම යකැදුරා කීයේ ය.

මෙහි දී තවත් ගැහැනියක් අබින් හෙප්පුව සොයා ගෙනවුත් නන්ද රාළ අත, තැබුවා ය. එ කෙණෙහි මහල්ලාගේ බැරි කම් හරි අඩක් දුරු විය. ඊට අනතුරුව, යකැදුරාගේ නූල ද කරේ බැඳුණේ ය. "ඔය නූලට අහන්නැති අලියෙක් නැහැ. ඉතින් මුන්දැගේ වගක් බලන්න එපල්ලා" යයි යකැදුරා නූල බැඳ, අසිරක් ගසා, ගුරු කම අවසන් කරමින් කීයේ ය.

"මා ගැන සොයන්න එපල්ලා! අම්මා-අප්පා නැති දරුවාට කොහොම ද කියා බලාපල්ලා" යනුවෙන් නන්ද රාළ එය ළහට කෙඳිරි ගෑවේ ය.

ගලපිටකන්දේ දොස්තර මහතාගෙන් මාලිනියට ප්‍රතිකාර කෙරෙන බව, මෙහි දී මහල්ලාට දන්වන ලදි. පලාතේ හැටියට මීට වැඩි වෙද-හෙද කමක් තවත් බලාපොරොත්තු විය නො හැකි යි.

"ඕන් හුනා කියන්නා වාගේ කිවුවා- ඔය ළමයාට නාන්න යන්න එපයි කියලා. මේ ඔක්කෝ ම වුණේ, මන් කිවූ දේ නො ඇහුවායින් නොවැ?" යි මහල්ලා අබින් කෑමෙන් පසු බුලත් විටක් සපමින් කීයේ ය.

බෙහෙත් ගෙයක වත් මහල්ලා කෙරේ පමණ තෙල් බෙහෙත් ගඳ නොමැත්තේ ය. ඔහුගේ සකල ශරීරය ම ඔප නැගුණු කළු ගල් කණුවක් මෙන් තෙල්-කයිලම් ආදියෙන් පැහැපත් විය. අගිදා ඔහුගේ අවුල් හිස-කෙස් ටික එක ලස් කොට, කොංඩය බැන්දා ය.

"ඕයේ, මාලිනීටත්, නූලක් මතුරා ලා, බන්දවපන් බන්. ගොඩ එනවා නම් එන්නේ, නූලකට තමයි. ඔය දොස්තර වෙද කම් කර ලා ඕවාට හරි යන්නේ නැහැ"යි අගිදා, එ සේ කොංඩය බඳිමින් කීවා ය.

"මාලිනීව ගොඩ ගන්න ඉතින් නුලකින් තියා කඹයකිනුත් බැහැ."යි ඒ ළඟින් ම සිටි සිළිඳු කීවා ය.

සිළිඳු, අගිදා පමණක් නොව, තවත් නොයෙක් දෙනා මහල්ලාගේ අභිමුඛයෙහිත්, අනභිමුඛයෙහිත් මෙ සේ තම-තමන් අදහස් නොපැකිල ප්‍රකාශ කළාහ. මෙ සේ මත ප්‍රකාශ කළ සමහරු, දර්ශන මාත්‍රයෙන් වත් ලෙඩා නුදුටු අය වෙති. එහෙත් කටින්-කට පවතින රාවයට අනුව, මෙ සේ කීම සමහරුන්ගේ සිරිතකි. ලෙඩා මැරෙනුවාට කැමැති අය කෙසේ වුවත්, කටින්-කට පවතින රාවය බොරු වෙනුවාට කිසිවෙකුත් නො කැමැතිය හ. එ හෙයින් සමහරු "මාලිනීත් මේ ටිකට නැටූ නැටුමක් නැටුවා නොවෙ යි. ඉතින් ඔක්කෝ ම ඉවර නොවැ? අනිච්චං දුක්කං" යන ආදි වශයෙන් ද කීහ. නුගුණ දකින්නට පුරුදු වූ දෙනෙතට බැලූ බැලූ අතින් පෙනෙන්නේ නුගුණ ම ය. නුගුණ කියන්නට පුරුදු වූ කට, ගත්-ගත් අතින් කියන්නේ, නුගුණම් ය. මේ නිකිණියාගේ පමණක් නොව, වෙන තැන්වල ද දක්නා ලැබෙන දුශ්චරිතයකි. එ හෙයින්, යම් කිසි විටක පොහොසත්තු දුප්පත් වූ කෙණෙහි, ඔහු ත්‍යාගවත්ව සිටියේ නම්, ඔහුගේ ඒ උදාර ත්‍යාග ශීලය ම, ඔහුට ගැරහීමට සුදුසු භූමිය කොට ගෙන, "අනේ! අනේ! අතමිට තුබුණු කාලයේ ඔයා නැටූ නැටුම්, සල්ලි නිකම් කජු-කොස් ඇට ගණනට වත් නැතුව යි වැඩ කෙළේ." යන ආදිය කියමින් ගරහති. ඉඳින් මසුරු මල බැඳුණු ලුබ්ධයකු වී නම්, එම ලෝභ කම මුල් කොට ගෙන, "තොදකින්, උන්දෑට දා ලා පිලිස්සිලා ගිය එකම යි කාරිය. තුබුණු කාලේ කාටද සීයා සතයක උදව්වක් කෙළේ?" කියමින් නින්දා කරති.

"දේව පිහිටෙන් නන්ද රාළට දන් ඉතින් අමුත්තන් එන එකක් නැහැ. ඉතින් කොයි එක වෙතත්, දුප්පත් මාලිනීට තමයි." මෙ සේ කියමින් මහල්ලාට සිත් සේ බුදියන්නට ඉඩ හැර, පිරිස නැවතත් ගෙය ඉදිරියට රැස් වූහ.

මාලිනිය පරීක්ෂා කළ වෛද්‍යයා ද, උගුර රැල්-බුරුල් හරිමින් බරාදයට පැමිණියේ ය. පිරිසට මෙන් ම ජයපාලට ද, ඔහු කතා



කරන තෙක්, ඉවසුම් නැත- ඔහු දෙතොල් තද කොට පියා ගෙන, උස නෙතට උඩින් ජයපාල මුහුණ බලා මඳක් සිනා වුණේ ය.

"කොහොම ද ලෙඩාට?" ජයපාල ප්‍රශ්න කළේ ය.

"බය වෙංට කාරණයක් නැහැ"යි ඔහු තව-තවත් සිනා පැතිරෙන මුහුණින් යුතුව, කීයේ ය. "ලේ කෝපයකින් ඇයගේ මොලය තද වෙලා, මේ විෂ මූර්ඡාවකින් වාගේ ඉන්නේ, ඒ නිසා තමයි. තව ටිකකින් ඔය අමාරු හුඟක් දුර ඇරේවි. මන් ඇයගේ අතට බෙහෙතක් විද්දා-" යයි ඔහු වැඩි දුරටත් කීයේ ය.

සතුටු සුසුමකින්, ඒ කෙණෙහි ජයපාලගේ ළය සැහැල්ලු විය. ඔහු මුහුණේ ඇලි-මැලි කම් එයින් ම දුරු විය. මල් වැස්සකින් ආශ්වාසිත මල් වත්තක් මෙන් ඔහු මුහුණ සිනහාවෙන් පුබුදු විය. ඔහු සිගරැට් කොපුව ගෙන දොස්තර දෙසට දිගු කළේ ය. දොස්තර සිගරැට් වැටියක් දල්වා ගෙන පුටුවක් පිට හිඳ ගත් පැටියෙනුත්, ජයපාල තරුණයාගේ තදනුරූප හැසිරීමෙනුත්, මාලිනියට තමන් සිතන පමණ ලෙඩා බරපතළ නොවන බව, අවට සිටින්නන්හට පෙනිණි. එහෙත් හොඳ පැත්තට වඩා නිතොරුව ම නරක පැත්ත පිළිගන්නට කැමැත්තෙන් සිටි බොහෝ දෙනකුට තවත් නොයෙක් කතා ඉපිද වීමට මෙය තවත් කාරණයක් විය. "මායම් ලෙඩවල හැටි ඔහොම තමා, වෙදා ළං වෙන කොට ලෙඩය හොඳ යි. වැඩිය වෙන්නේ, වෙදා ගියාට පස්සෙයි." සමහරු කීහ. "ඔය හිනා වෙනවාට අප දන්නවා යැ. ලෙඩාට මොකද කියා, මාලිනී මළා ම, දොස්තර මහත්මයාට ඇති අමාරුව මොකද- අනිත් මහත්මයාට ඇති අමාරුව මොකක් ද- ඒ ගොල්ලා ඔහේ හිනා වේවි." මේ තවත් අය කී පදයකි. ජයපාල හා දොස්තර අතරේ කතාව, ඉංගිරිසියෙන් හෙයින් එහි භාවය ඔවුනට තේරුම් ගත නො හැකි ය. එහෙත්, මෙ තෙක් ඔවුනතර කටින්-කට පැවති රාවයට පහර වදින බවත්, නොහොත් එම රාවයට ඉස් මතු වෙන්නට ඉඩක් නො ලැබෙන බවත්, එයින් නොපෙනෙන්නේ නොවේ. ඒ හෙයින තව දුර එහි රැඳෙන්නට සුදුසු ධෛර්යයක් නොලත් පිරිස, ටිකින්-ටික තුනී වෙන්නට පටන් ගත්හ.

දොස්තර, තරුණ ජයපාල මහතා පිළිබඳ තම අවංක හැඟීම මෙහිදී ප්‍රකාශ කරන්නට විය. ගලපිටකන්දේ අලුත් අයිතිකාරයා මෙ තරම් සත් ගුණවත් ත්‍යාගවතකු බව ඔහු කලින් නො දත්තේ ය. ජයපාල හා මාලිනිය අතර, දනහැඳුනුම් කම් ගැන ඔහු කිසිවක් නො දනී. මේ නිශ්ශරණාධ්‍යාශයෙන් කරන උපකාරයක් හැටියට ඔහු තේරුම් ගත්තේ ය. එහෙත් ජයපාල තරුණයාගේ මුහුණ, වරින්-වර විළියෙන් රතු විය. මේ වෛද්‍යයා කතා කරන්නේ, සිත යට කිසිවක් තබාගෙන බව ඔහුට නොපෙනේ. එසේ ද වුව, තමා මෙ තරම් වෙහෙසෙන්නේ, පරාර්ථකාමී භාවයෙන් ම නොවන බව තමාට ප්‍රත්‍යක්ෂ හෙයින්, මෙ සේ වරින්-වර, බොළඳ තරුණියකගේ මෙන්, ඔහු මුහුණ විළිබර විය.

"ජයපාල මහත්මයා, මා, මේ බය වෙංට එපාය කී පමණින් ලෙඩා අන්තරාය අඩියෙන් අස් වෙලාය කියා හිතන්න එපා. තව ටිකකින් සහලවලා උණ ගනීවි ඒක තමයි හයාඃ ග. වෙද කමට වඩා එතකොට සාත්තුව තිබෙංට ඕනෑ. ඇය ළඟ රෑ-දාවල් නිතර සාත්තු කාරියකට ඉංට වේවි. නැත් නම් ඉස්පිරිතාලයට යවංට වේවි"යි වෛද්‍යයා අනතුරුව කීයේ ය.

සාමාන්‍යයන් පිටිසර මිනිස්සු ඉස්පිරිතාලය නොකැමැත්තෝ ය. ඒ බව වෛද්‍යා දනියි. අන්දා ද, රටේ හැඟීම එ සේ ම බව කීයේ ය. ඉස්පිරිතාලයට යෑම ඔවුනට මදි කමකි. ඉස්පිරිතාලය කාත්-කවුරුත් නැති හිඟන්නන් වැනි දිළින්දනට මිස, ගෙයක්-දොරක් ඇති, ඥාති මිත්‍රයන් ඇති, සැහෙන්නන්ට නො වන බව ඔවුන්ගේ හැඟීම ය. ගම්මුන්ගේ මේ පුදුම අදහස්වට ජයපාලට සිනා නොවී සිටිනු නො හැකි විය. එහි සාත්තුකාරයන් දෙ දෙනකු එවන ලෙස ඔහු දොස්තරට නියම කළේ ය. දොස්තර ද, තරුණයාගේ ත්‍යාගවත් භාවයට නැවත-නැවතත් ස්තුති කරමින්, ඉතා හොඳ සිංහල තරුණියන් දෙ දෙනකු සාත්තු කාරියන් වශයෙන් එවන්නට පොරොන්දු විය.

දොස්තර, නන්ද රාළ ද සෝදිසි කර බලා, ඔහුට තමාගෙන් වෙද කමක් වුවමනා නො කරන බව කීයේ ය. මුළු ගමකට



වෙන්නට ගිය. මෙ තරම් බලවත් කරදරයකින් මේ අසරණ ගම්මුන් බේරා, ඔවුනට ලබා දුන් සැනසීම ගැන ජයපාලට, දොස්තර මහතා නැවත නැවතත් ස්තුති කොට තම අත් බෑගය ද රැගෙන, අන්දා කැටුව, ගමනට පිටත් වෙමින්, "මං දුන් මේ ගැටයා අත කුඩු බෙහෙතකුත්, වතුර බෙහෙතකුත්, එවන්නම්. මුලක් බැගින් කුඩ, දවසකට තුන පාරක් දෙන්න ඕනෑ. වතුර බෙහෙත පැය හතරෙන් හතරට වරක් බැගින් දෙන්න ඕනෑ." කියා යන්නට ගියේ ය.

දුන් වේලාව දවල එක පමණ විය. පෙර වරුවේ නන්ද රාළ දුන් තැඹිලි ගෙඩියෙන් ජෝන් ජයපාල මෙ තෙක් පසු කළ නමුත් දුන් නම් ඔහුට කුසගින්න ඉවසිය නො හැකි ය. ඔහු ආහාරයක් නො ලැබ, පසු වන බව තවමත් වට-පිට බලා සිටින, ගම්මු හොඳ හැටි දනිති. ඔහුට ආහාර ගැනීමට සුදුසු හෝටලයක් හෝ තානායමක් නිකිණියානේ නැති බව ද ඔව්හු දනිති. එසේ ද වුව, පිසූ ආහාරයකින් ඔහු පවරන්නට කිසිවෙක් නො සිතූහ. හේ මේ ගම්මුන්ගේ අශිෂ්ටභාවය නිසා වත්, ආගන්තුක සත්කාරයෙහි කුසිත වූ මසුරු කම නිසා වත්, නොව තමන් ගෙවල පිසන ලද ආහාරයෙන් උතුමන් පැවරීම ගරු සරු නැති නොතරම් කමක් මෙන් පිළිගැනේ දෝ යන සැක නිසා ය. තත්ත්වයෙන් උසස් අමුත්තකු ගම් වැදුණු කල්හි, එ වැන්නන්හට නිතොරව ම කුරුම්බයකින්, දොඩම් ගෙඩියකින්, නොහොත් අත් කිපි පලතුරකින් සංග්‍රහ කිරීම ඔවුන් සිරිත ය. ජෝන් ජයපාල පැරණි කුලවතකු වුව ද, හැම පැරණි කුල සිරිතකට ම ගරු කරන්නෙක් නො වේ. ඔහු සමානාත්මතා වර්ධනයෙහි නියැලී, නවීන අදහස් ඇත්තෙකි. මේ මිනිසුන්ගෙන් කැඳවීමක් ලැබෙතොත්, ඔහු ඕනෑ ම ගෙදරකට ගොස්, ඕනෑ ම ආහාරයක් සතුටින් පිළිගන්නට කැමැති ය. එහෙත් වැරැද්ද, මේ එකකු වත් ඔහු නො කැඳවන එක ය.

කොහොමටත් ඉවුම්-පිහුම් දන්නකු මෙහි නතර විය යුතු බැවින්, ඊට සුදුස්සකු ඔහු පත් කර ගත්තේ ය. ඔහු විශේෂයෙන් ම මාලිනියට හා නන්ද රාළට කැඳ-බත් පිළියෙළ කිරීම පිණිස

ය. ජයපාල තුළ, මෙහි නවතින බලාපොරොත්තුවක් නැති- ඒ තමා සැහැල්ලු බවට පමුණු වන, සීමාව ඉක්මවන වැඩකි. මේ නතර කොට ගත් මිනිසා ලවා,. තමනට අහර කිසිවක් පිසවා ගැනීම ද, ස්වකීය ආත්ම ගෞරවයට මදි කමකි. බංගලාවට යන තෙක්, කෙසේ නමුත් තැඹිලිවලින් යැපෙන්නට කල්පනා කළ හෙතෙම, නන්ද රාළට පින් සිද්ද වෙන්නට ගෙයි මුල්ලේ තැඹිලි වල්ලේ ඉතිරි ගෙඩි කිහිපයෙන් තවත් එකක් කපා ගත්තේ ය.

සවස් වන්නට-වන්නට පිරිස තව-තවත් තුනී වූහ. මාලිනියට රැකවලට ඉතුරු වුණේ, ජයපාල පමණකි. ඔහු ඇයගේ සෝපාව සමීපයේ, පුටුවක් පිට හිඳ ගෙන, තවමත් නිසන්සලව මෙන් සැතපෙන මාලිනිය දෙස බලා සිටියේ ය. මාලිනියගේ ශරීරයේ පළමු පැවැති සිසිල් බව, දූන් දූන් දුරු වේගන යන්නේය. ඒ එක්ක ම, බලවත් උණයක් හට ගැනෙන බව ද දක්නා ලැබේ. ඇයගේ හුස්ම ගැනීම ද ක්‍රමයෙන් වේගවත් වන බව පෙනේ. ඇ ඇළයෙන්-ඇළයට හැරෙන්නට ද, විටින්-විට ශීතලෙන් වෙව්ලන්නට ද වූවා ය. ඇයගේ කෙඳිරිය ද ක්‍රමයෙන් බලවත් විය. ජයපාල කිහිප වරක් ම ඇයට කතා කළේ ය- ඇය අවදිකරවා ගන්නට වෑයම් කළේ ය. ඒ සියල්ල නිරර්ථක විය. ඇයගේ මුසපත් බව තව මත් එසේ ම ය.ඔහු ඇයගේ යුගත් දෙස බැලුවේ ය. පොලිස් කාරයාගේ ලේන්සු බැම්මට කැපුණු ඇයගේ යුගත් කර, පහර, රත් මල් වළයක්සේ තව මත් පෙනේ. ස්වල්ප වේලාවකින් උණය බලවත් විය. ඇය උණ විකාරයෙන් දොඩවන්නට පටන් ගත්තා ය. ඇයගේ වචනවල ව්‍යක්තිය හෝ සම්බන්ධය හෝ නැති, එ හෙයින්, ඇය කියන්න තේරුම් ගත නො හැකි යි. ජයපාල වට-පිට බලා, වුලන් සාළුවක් දැක, එය රැගෙන විත්, මාලිනියට පෙරෙව්වේ ය. ඇය වෙව්ලන සැටියෙන් ඇයගේ ඇඟ සීත කරන බවත්, උණය ද එ හෙයින් ඉතා බලවත් වන බවත්, සිතිය හැකි ය.

සවස හතර-පහ පමණ වන විට, අන්දා බෙහෙත් රැගෙන ආවේ ය. දූන්-දූන් මාලිනී ඉමක් කොනක් නැතිව දොඩවන්නී ය-



දෙ තෙක් හැර, හිස් බැල්මෙන් අවට බලන්නී ය. ඇයගේ වචනයෙහි මෙන් ම, බැල්මෙහි ද කිසි විපත්තියක් හෝ ඇල්මක් ඇති බව නො පෙනේ. ජයපාල වරින් වර, ඇයට නම කියා කතා කරන්නේ ය. එහෙත් ඇයට, ඔහු කට හඬ ශ්‍රවණය වන බවක් නො පෙනේ- ඔහු මුහුණ පෙනෙන බවක් නො පෙනේ. ඇ වරින්-වර දඟලන්නටත්, ඇතැම් විට ඇඳෙන් නැඟී සිටින්නටත්, තැත් කරන්නී ය- ඇතැම් විට, ජයපාල දෙස ද බලා ගත් වන ම සිටින්නී ය. ඒ සියල්ල විකාරයෙන් විනා, සිහියෙන් කැරුණු දේ නො වේ.

මෙ තෙක් මාලිනිය ළඟ තනියටත්, සාත්තුවටත් සිටියේ ජයපාල පමණකි. ජයපාලට ලෙඩුන් සාත්තුව නො තේරේ. එ හෙයින් ලෙඩාට සාත්තු සප්පායම් පිණිස, ඔහු එම ගමෙන් ම තලතුනා ගැහැනියක කැඳවා ගත්තේ ය. නියම සාත්තු කාරියන් දෙ දෙන කැගල්ලෙන් එන තෙක්, මෙ සේ හැකි-හැකි පරිද්දෙන් අඩු-පාඩු පිරිමසා ගත යුතු විය.

මාලිනිය උණ විකාරයෙන් කරන-කියන දෙය දකින විට වෙනත් ගමුමුන්හට මෙන් අන්දාට ද ඇය බලවත් අමනුෂ්‍ය දොෂයෙකින්, පෙළෙන බව ප්‍රත්‍යක්ෂ විය. සාත්තු කාරියගේ කල්පනාවේ ද ඊට කිසි වෙනසක් නො වී ය. දෙ දෙනා ම, මෙය ගැන නොයෙක් අතේ කල්පනා කොට, ගොඩපිළිවෙතක් ගැන ජයපාල මහතාට සැළ කළාහ. "ගොඩ පිළිවෙත" යන වචනය පවා ජයපාලට අමුතු ශබ්දයකි. අන්දා ද, සාත්තු කාරිය ද, ඔහුට එය හොඳ හැටි තේරුම් කර දුන් පසු, ඔහු කළ දෙය අන්දා ලවා ඕඩිකොලොන් බෝතලයක් ගෙන්වා, දිය පා මිශ්‍ර කොට, රෝගියාගේ හිස ගැල්වීම පමණකි. එයින් රෝගියාගේ නන් දෙඩුම් හුහක් දුරට සන්සිඳුණේ ය. බලවත් උණයක් ගැනුණු විට, එයින් රත් වන ලෙය හිස් මුල් කරා දිවීමෙන් රෝගියා විකල බවට පත් වී නන්දෙඩීම කරනු විනා, එය අන් කිසි බාහිර උපද්‍රවයක් නිසා නො වන බව ජයපාල විශේෂයෙන් ම අන්දාට තේරුම් කළේ ය. එහෙත් අන්දාවත්, සාත්තු කාරිවත්, එය නො

පිළි ගත්හ. යකුන් ඇදහීම, දෙවියන් ඇදහීම, ස්වකීය සමයයට ඉඳුරා ම විරුද්ධ වුව ද, ඊට විපක්ෂව කතා කිරීම සමය විරෝධී අපරාධයක් ලෙස, වෙනත් නුගතුන් මෙන් ඔවුහු ද සැලකූහ. යකුන් ඇදහීම සහ දෙවියන් ඇදහීම ඔවුනට බුද්ධාගමයේ ම කොටසකි. ඇතැම් තැන, බුදුනට නොලැබෙන ගරු සම්මාන දෙවියනටත්, යකුනටත් ලැබේ. නුගත් ගිහියන් පමණක් නොව, නුගත් පැවිද්දෝ ද, මේ විමතියට ඹහලව සිටිති. ප්‍රවුජිත පක්ෂයෙහි ඇතැම් උදවිය දෙවියාට හා යකාට කප්පු කම් පවා කරති. ඔවුන්ගේ පාලනයෙහි පවතින සිද්ධස්ථානයන්හි බුදුනට ආවරණය පිණිස ඇත්තේ, එක තිරයකි. දෙවියන්ට තිර හතකි. ඉතින් ලක්දිව පිරිසිදු බුද්ධාගමය පවතින රටක් වූ. සිංහලයා තෙරුවන් සරණ යන පිරිසක් වූ. එ හෙත් ඔවුන්ගේ සංකර භක්තිය දකින්නන්හට, එ වැන්නක් නො පෙනේ.

එ දා ජයපාල ආපසු වත්තට පිටත්ව යන්නට පළමු ලෙඩාට කටයුතු ප්‍රතිකාර විශේෂයෙන් අන්දාට හා සාත්තු කාරියට ද නිල කොට දී, වේලාව සලකා ගැනීමට තම අත බැඳි, ඔරලෝසුව ද ගළවා දී වියදමට මුදල් ද දුන්නේ ය. පසුවදා එළි වෙන්නට ඔහු දොස්තර කැටුව, නැවත ලෙඩා වෙත පැමිණි නමුත් ලෙඩා කෙරේ සැලකිය යුතු වෙනසක් ඔහුට දකින්නට නො ලැබිණි. ලෙඩා කෙරේ සැලකිය යුතු වෙනසක් ඇති වුණේ, සතර වන දින සවස් කල්හි ය. මෙ දින, ඇ ප්‍රකෘති සිහි ලැබ, අවට බලා, නො හඳුන තරුණියන් දෙදෙනෙකු ළඟ සිටිනු දැක, පුදුම වූවාය. ඔවුන් කැගල්ලෙන් ගෙන්වනු ලැබූ සාත්තු කාරියන් බව මෙහි දී අන්දා විසින් තේරුම් කර දෙන ලදි. මාලිනී යම්තමකට සිනා සුණා ය. මේ තරුණියන් දෙ දෙනාගේ කතාවත්, ඔවුන්ගේ හැසිරීමත්, ඔවුන්ගේ ඇඳුමත්, ඇයට පුදුමයකි. ඇ තම සීයා කැඳෙවුවා ය. මේ සාත්තු කාරියන් නන්ද රාළගේ වියදමෙන් මෙහෙ කෙරෙතැයි යන සැකය ඇය කෙරේ ඇති විය. වෙන අන් කිසි වක් ගැන, ඇයට සිතිය නො හැකි යි. ජයපාල මහත්මයා ගැන වත්, ඇය මෙ සේ ඔත්පොළ වෙන්නට පැමිණි කාරණය ගැන වත්, තව ම



සිහි කළ නො හැකි යි. මිහි දුම් පටලයකින් වැසුණු දර්ශන පථය ඇත්තියක සේ. දුන්-දුන් ඡායා මාත්‍රයෙන් ඇය වස්තු සැලකිය කරනු පමණකි. නන්ද රාළගෙන් ද ඇයට සෑහෙන විස්තරයක් නො ලැබුණේ ය. ඇයගේ ප්‍රශ්නයන්හට නියම පිළිතුරු දෙනු වෙනුවට, කවුරුත් ඇයට කතා නො කර සිටින හැටියට ම අවවාද කරති.

"ළමයා, ඔන්න මන් හුනා කියන්නා වාගේ කියනවා- ආයෙත් නො කීවෙයි කියන්න එපා- පණට ආදරේ ඇත්නං කතා කරන්න විතරක් එපා." මේ ඇයගේ ප්‍රශ්න මාලාවකට ම මහල්ලාගෙන් ලැබුණු එක ම පිළිතුර ය.

පසුව දා වන විට, ඇ ස්වෝත්සාහයෙන් ද අන්දාගේ උදව්වෙන් ද, එ සේ ම ඇයගේ සුව දුක් විමසන්නට පැමිණි නෑ මිතුරු පිරිසගෙන් ද, කාරණා කාරණා හුභක් දුරට තත්ත්වාකාරයෙන් ප්‍රත්‍යක්ෂ කර ගත්තා ය. එහෙත් ඇයගේ සිතිවිලි දමට පුරුක් කිහිපයක් තවමත් අඩු ය. එය කිසිවකු විසින් ඇයට සපයන බවක් නොපෙනේ. දිනක් කිසි යම් කලබලයක් වූ බව ඇයට ඡේයාවක් මෙන් මතකය. ඒ කලබලය කුමක් පිළිබඳව ද යන්න නැවත-නැවත කල්පනා කර බලන කල, මහ මුහුදේ මහ දුර පෙනෙන බිම් ඡේයාවක් මෙන් ඇයගේ මනැසට ගෝචර වන කිසිවක් විය.

"අන්දෝ, උඹව පොලිස් කාරයෙක් සොයාගෙන ඇවිත් මහ කලබලයක් උණා නේ දැයි?" ඇ සමීපයෙහි සිටි අන්දා විතාළා ය.

"ඒවා ඔක්කෝ ම හරි මාලිනී. ඒ ඔක්කෝ ම කරදර වලින් අපි නිදහස් උණා- ඒ කොස්තාපල්ට දැන් හෙට අනිද්දා ම එල්ල වේවි"යි අන්දා කීයේ ය.

ඇයගේ සිහියට ගැලූ මිහි දුම් පටලය දැන් ක්‍රමයෙන් තුනී වෙගන යන්නේ ය. ඒ කරණකොට යට පත් වූ මතක ටිකින්-ටික

මතු වෙන්නට විය. සිහිවිලි දම සම්පූර්ණ වීමට ඇයට අඩු තවත් එක් පුරුකකි. හේ ද නුදුරින් ම ඇතත්, ඒ දෙස බලන වරක්-වරක් පාසා, අදිසි විදුලි කෙටීමකින් මෙන් ඇයගේ නෙත්-සිත් තැති ගැනෙන්නේ ය.

"අන්දෝ! මට කතා කරන්න හොඳ නැත් නම්, උඹවත් කතාකරපන්කෝ. මං අහගෙන ඉංනන්-කියාපන්, මොකද උණේ කියා." අන්තිමට මාලිනී ඉවසුමක් නැතිව කීවා ය.

ඉන් පසු අන්දා සිදු වූ දෙය මුල සිට කතන්දරයක් මෙන් කියන්නට පටන් ගත්තේ ය. මාලිනී ද නෙත් පියා ගෙන, ඒ සියල්ල ශ්‍රවණය කළා ය. ජයපාලගේ නම කියවෙන වරක්-වරක් පාසා ඇයගේ, සුදු මැලි මුහුණේ ජම්බු ගෙඩියක මෙන් රත් පැහැය නැගෙන්නට විය.

"ජයපාල මහත්මයා ඊට පස්සේ ආවේ නැද්ද අන්දෝ?" කියා ඇ ඔතැනි හඬින් ප්‍රශ්න කළා ය.

"මන්ද නැත්තේ? එදා පටන් අද වන තෙක් ජයපාල මහත්මයා හැම දාම උඹව බලංට ආවා- අදිසි උවමනාවක් නිසා අද පාන්දර තමයි, මහත්මයා කොළඹ පිටත් වෙලා ගියේ." යි අන්දා කීයේ ය.

සාත්තු කාරියන් අතර කතාවෙන් හා අන්දාගේ කතාවෙන් ද, තමා සිහි සත් නැතිව සිටිය දී නොයෙක් නත් දෙඩුම් කර තිබෙන බව, මාලිනියට මෙහි දී තේරුම් ගත හැකි විය. සිහි විකලින් කළ කී දෙය ගැන, දන් ඇයට නොයෙක් සැක සිත් පහළ වේ. ඒ දෙඩූ අනම්-මනම් ගැන ඇ සාත්තුකාරියන් අතින් විස්තර විතාළා ය. එසේ ම අන්දා අතින් ද විතාළා ය. එහෙත් ඇයගේ සැකය දියුණු වීමට විනා, පසිඳා ගැනීමට සුදුසු පිළිතුරක් ඔවුන්ගෙන් ලබා ගත නො හැකි විය.

"මා විකාරයෙන් නොයෙක් දෙය දොඩවා ලා තියෙනව. මේ ගොල්ල දන්මට හිනහා වෙනවා" යයි මාලිනී, එ දින සවස පැමිණි දොස්තර මහතාට පැමිණිලි කළා ය.



"උණ විකාරයෙන් දොඩවන විට කොයි ලෙඩාත් හිතේ තියෙන දෙවල් කියනවා තමා"යයි දොස්තර ද කිසි ගණනකට නැතිව කීයේ ය.

ඇයගේ හිතේ කලින් පැවති දෙයත්, දන් පවතින දෙයත්, ඇයට හොඳට මතකය. දිවිහිමි කොටත් කිසිවකු ඉදිරියේ සිහියෙන් නම්, ඇ ස්වකීය මනොරථය ගැන වචනයක් හෙළි නො කරන්නීය- ඉදින් නො සිහියෙන් දොඩවන විට, ඇයගෙන් ඒ හැම කිය වෙන්නට ඇතැයි ලජ්ජාවෙන් මැල වුණා ය. ඇයගේ ලෙඩය බලවත්ව පැවති දෙ තුන් දවසේ සාත්තු කාරියන්ට විනා, අන් කිසිවකුටත් යටත් පිරිසෙයින් අන්දාට වත්, පියාටවත් සමීපයෙහි රැඳෙන්නට ඉඩක් නො ලැබුණු බව දැන ගත් හැටියේ, එය ම මාලිනියට ලජ්ජාව තුනී කර ගැනීමට සුදුසු කාරණයක් විය.

කල් යාමෙන් ඇයට හොඳ හැටි සුවය ලැබුණේ වී නමුදු සාත්තු කාරියෝ තමන් පාලනයෙන් ඇය බැහැර නො කළා හ. ජයපාල මහතාට ලෙඩා බාර දිය යුතු බැවින් ඔවුහු, එ තෙක් එහි නතර වන බව කීහ. කොළඹ ගිය ජයපාල මහතා තව ම නොපැමිණියේ ය. ඔහු එන තෙක් මාලිනියට ද ඉස් පාසුවක් නැතුවත්, ඉස් පාසුවක් ඇත්තියක මෙන් එය ගැන අමුතු කතාවක් හෝ කලබලයක් හෝ නැතිව නිසොල්මනින් කල් ගත කළා ය.

සත් වන දින, උදේ, කැටපත ගෙන මුහුණ බලන මාලිනියට සත් දවසක් උණෙන් පසුවීමේ තරම සලකා ගත හැකි විය. කැටපතෙන් මේ පෙනෙන්නේ සිය මුහුණ ද යන සැකය ඇයට පළමුවෙන් ඇතිවිය. ඇයගේ රුමත් මුහුණ අන් හැමට ම වඩා, ඇ හොඳට අඳුනන්නී ය. ඒ දන් අඳුනන්නට නොහැකි තරමට සුදු මැලි ය- කෙට්ටු ය. ඇ කනගාටු වන හැටි දක සාත්තු කාරියෝ මෙහි දී සැනසීමට සුදුසු වචන කීහ. "මගේ පාට වෙනස් වී නැත්තේ, දත්වලත්, ඇස්වලත්, කෙස් වැටියෙත් පමණකැයි" ඇ සිනාසෙමින් කීවා ය. ඇයගේ දත් කුඩාය- මුතුමෙන් දීප්තිමත් ය. ඇසි පිය හා දෙ බැම හා කෙශ කලාපය දෙ නෙත මෙන් ම, එකම ගන තිල් පැහැයකි. කතා කරන විට

ද, සිනා සෙන විට ද, පාටින් දක්වෙන අලංකාරයත්, බලන බැල්මට නෙත් සඟලින් දක් වෙන කාන්ති යත්, තව ම මඳ කුඩු නොඅඩුව, පළමු පරිද්දෙන් ම පවතී. ඒ ලොකු සැනසීමකි. ජයපාල තරුණයාට හැකි තරම් ප්‍රිය මනාප මුහුණක් දක්වීම, ඇයගේ එක ම බලාපොරොත්තුව ය. තවත් සතියකින් නම් මේ සියලු ඇලි-මැලි කම් දුරුවන්නේ ය. එහෙත් සතියක් තබා, සති බාගයක් ගතවන්නටත් පළමු ජයපාල තරුණයා ඇය දකීමට එන බව සහතික ය.

දවසක් උදෑසන, ඈ තම සාත්තු කාරියත් හා ප්‍රිය සල්ලාපයෙන් කාලය ගත කරන්නී, දුර තියා ම සිනා මුසු මුහුණෙන් දිව ගෙන එන අන්දා දුටුවා ය. ඔහු ගෙනෙන්නේ, සුබ අස්නක් බව සාත්තු කාරියනට පවා පෙනේ. මාලිනියට නම් දෙවියන් කෙරෙන් එන දෙව දූතයෙක් මෙ තරම් ප්‍රිය මනාප නො වන්නේ ය.

"මාලිනී, කලබල වෙන්න එපා- අන්න, ජයපාල මහත්මයා එනවා"ය යි ඔහු ගෙට ගොඩ වදිමින් කීවේ ය.

ඈ; එ කෙණෙහි ම එ තැනින් නැගිට, ඇයගේ පුරුදු ගිලන් හලට නොහොත් ලෙඩ කාමරයට ගියා ය. සාත්තු කාරියන් ද, අවට සිටින්නන් ද බලා සිටිය දී ඇයට ඔහු පිළිගැනීම කළ නොහැකි ය- නෙත් ඔසවා ඔහු මුහුණ බැලීමවත් කළ නො හැකි ය. ඇය දැන් සිහියෙන් ද සනීපයෙන් ද, පසු වන බව කවුරුත් දනිති. එහෙයින් ජයපාල මහතා අනුගමනය කරමින් අසල් වැසි ගැහැනුන් ද එහි එතැයි ඈ සැක කළා ය. අනෙක් අතින් ඇය සිත් තුළ පවතින තවත් බලවත් කුළැටි කමක් නම් ඔහු මුහුණ බලන්නට බැරි කම ය. ඈ කුලඟනකට සුදුසු ගුණ යහපත් කම් පුරුදු පුහුණු කළ නමුත්- එම ගුණ යහපත් කම්වලින් ම තමන් තත්ත්වය තරුණයාට පෙනෙන්නට මෙතෙක් හැසුරුණු නමුත්- පොලිස් කලබලය කරණ කොට නිසර්ගයෙන් ම කලහ කාරියක බව- ඉතාම දරුණු පංක්තියේ කලහකාරියක බව- තරුණයා විසින් තේරුම් ගන්නට යෙදුණාදෝ යන්න කල්පනා කළාය. "මම ඔහු කෙසේ පිළිගනිම් ද? ඔහුට කෙසේ වැදගත් මුහුණක්



පෙන්වම් ද? මා එ දා හැසුරුණේ කෙසේ ළඳ බොළඳ තරුණියකට අයිති ගුණාංගයකින් නො වේ. රළු කරළු වල් ගැහැනියකට වත් එ බඳු වෙසක් මවා ගත නො හැකියි" යන ආදිය කල්පනා කරමින් සිටින්නී, එහි පිවිසෙන ජෝන් ජයපාලගේ ශක්ති සම්පන්න දෙහය දුටුවා ය.

සන්වේගය බලවත් බැවින් ජයපාල දුටු කෙණෙහි මාලිනී නැඟී සිටියා ය. ඇයගේ සුදුමැලි මුහුණ වරින්-වර රතු පැහැ ගැන්මෙන් බබළන්නට විය. ඈ කිහිප වරක් ම එක එල්ලේ තරුණයා මුහුණ බැලීමට වෑයම් කළා ය. එහෙත් නෙත් කොනින් කළ බැලුම් පමණක් මුත් ඇයට සුව සේ හිස ඔසවා ගත නො හැකි විය. තරුණයාට ද ඇයගේ ලජ්ජාවේ නොහොත් කොහොල් කමේ තරම පෙනුණේ ය. එය හැකි තරම් ඉක්මනින් දුරු කොට දමා, ඇය යහළු කර ගැනීම ඔහුට අයිති වැඩකි. එ හෙයින් සමීපයට යමින්, ඔහු ඇයගේ සුව දුක් විතාලේ ය. තොල් මතුරන හඬක් විනා අන් කිසි පිළිතුරක් නො ලත් බැවින් ජයපාල තවත් ඇයට සමීපව හෙමින් උරයට අත ගසා, ඇය සෝපාව පිට හිඳුවා තෙමේ ද පසකින් හිඳ ගත්තේ ය. ඇයගේ පබළු දළුවන් ඇඟිලි නා දළු මෙන් සැලෙන සැටියෙන් ඇය කෙරේ පවතින සන්වේගය හොඳ හැටි ඔහු තේරුම් ගත්තේ ය. අද මේ ඔහුට පෙනෙන්නේ අමුතු මාලිනියකි. පෙර දෙ වතාවක ම සිහියෙන් සිටි මාලිනී, මීට වඩා වෙනස් ගති ගුණ ඇත්තී ය. ඇතැම් විට, මේ ඇය ලෙඩින් දුබල වූ නිසා විය යුතු ය.

"මොකද මාලිනී, ඔබ මෙහෙ ම තැති ගැනෙන්නේ? ඔබේ හිතේ ලොකු ලජ්ජාවක් පවතින හැඩයි. ඔබට, තව ම සනීප නැතුවා දැයි?" ජයපාල ප්‍රශ්න කළේ ය.

"දැන් මට හොඳට සනීප යි, මහත්මයා. දොස්තර උන්නැහේ කිවුවා, දැන් මට කොහෙත් ම උණ නැහැ කියා." ඈ පහත හඬින් තෙපලා ය.

"ඔබට දැන් උණයක් නැහැ. ඒක ඇත්ත යි. ඒකට මොකද තව මත් හිතේ බොහො ම බය පවතිනවා" යයි ජයපාල කීයේ ය.

"මට බයක් නැහැ - නමුත් ලැජ්ජායි" ඈ හෙමින් තොල මතුළා ය.

"ලැජ්ජායි! ඒ, මන් ද?"

"එ දා මහත්මයාට මං නැහැදිච්ච මහ වල් ගැහැනියක හැටියට පෙනෙන්නට ඇති" ඈ කර බා ගෙන කීවා ය.

තමා ඇයගේ මතයට එකඟ නැතිබව දක්වමින් තරුණයා හිස වනන්නට විය. "නෑ නෑ මාලිනී, එ දා ඔබ හැසුරුණු හැටියෙන් මට නම් ඔබේ කිසි වල් කමක් පෙනෙන්නේ නැහැ, අයුතු කම් දුටු තැන ළඳ බොළඳ කම් පැත්තකින් තියෙද්දී, ඔන්න ඔහොම සටන් කර, යුක්තිය ම බලාපොරොත්තු වන තරුණියන් දකින්නට මා ඉතා කැමති යි. ඒ පොලිස් කාරයාගේ සැහැසි කම් වලට ඔබ නිකම් මී දෙන වාගේ යටත් වුණා නම් තමා, ලැජ්ජාවෙන් මැරෙන්න ඕනෑ" යි ඔහු කීයේ ය.

මෙහි දී මාලිනිය පළමු වරට හිස ඔසවා, තරුණයාගේ මුහුණ බැලූ සැටියෙන්, ඔහු වචන කවට කමක් කොට ගත්තා සේ පළ විය. "මහත්මයා, මා සනසන අදහසින් මේ බොරු කියනවා නොවේ දැයි?" ඈ සිනා සෙමින් පිළිවිසියාය.

"නෑ, නෑ, මාලිනී, මා කියන්නේ, මගේ අවංක හැඟීම යි." මෙ සේ කියා ඔහු නැවතත්, අමුතු ස්වරයෙකින්, "මට බොහො ම කනගාටු යි, මාලිනී, මගේ එදා තිකිණියානට පැමිණි ගමනින් මුළු ගමට ම- විශේෂයෙන් ම ඔබටත්, ඔබේ අසරණ සීයාටත් මේ තරම් මහ කරදරයක් වුණු එක ගැන"යි කීයේ ය.

"මහත්මයා අන්දාගේ රබර් පාර්සලය මොටද ගහේ දැම්මේ? මේ ඔක්කො ම වුණේ, ඒ නිසා ය"යි ඈ සිනා සෙමින් විතාළා ය.

"අන්දා, එහෙ සියලු පුවත් ඔබට කියා ලා තිබෙන හැඩ යි- එහෙම ද මාලිනී?"



"ඔව්, මහත්මයා අතින් වුණේ වරදක් නම්, ඊට වන්දිය දන් සැහෙන්න ගෙවිලා තිබෙනවා"යයි ඈ කීවා ය.

"ඒ මොකක් ද, අන්දාට ගෙවූ මුදල ද?"

"නෑ, නෑ, මගේ ලෙඩට කළ වියදම."

"ඒක, කෙරුණු අලාභයට සෑහෙන වන්දියක් නො වෙයි- එහෙත් ඒක එහෙ ම උණාට මා කැමති යි. මේ මා කියන්නේ, ඇත්තයි- මා විශ්වාස කරන්න-"

එහෙත් තරුණී තොමෝ ඔහු ඇදහිය නො හැකි ලීලාවෙන් නැවත-නැවත අදහස් විමසමින් මුහුණ බලන්නට වූවා ය.

"ඔව්, මාලිනී, එ දා ඒක එ හෙ ම නොවෙන්න- කවදා වත් මට ඔබ සමග මෙහෙ ම කතා කර-කර ඉන්න ලැබෙන්නේ නැහැ"යි ඔහු අනතුරුවත් කීයේ ය.

"එහෙ නම් ඒ පොලිස් කාරයාට තෑග්ගක් තුදුන්නේ?" යනුවෙන් තරුණී, මෙහි දී අහක බලාගෙන කීවා ය.

"අනේ! දුප්පතා" කියා තරුණයා ශොක ප්‍රකාශයක් කළේ ය.

"ඔහුට මොක ද වුණේ?" තරුණී නැවත පිළිවිසියා ය.

"ඔහු දිස්මිස් වේවි. දනට ඔහුගේ වැඩ නවත්වාලා." ය යි ජයපාල කීයේ ය.

ඒ ප්‍රවෘත්තියෙන් තරුණියගේ සිතට ඇති වූ සතුට මහ සිනාවකින් විකසිත වූ මුව පියුම නිසා මොනවට ප්‍රකාශ විය. ඒ අභාග්‍ය සම්පන්න භටයාට ජයපාල කෙරේ නම් ලෙශ මාත්‍ර වූ අනුකම්පාවක් ඇත්තෙන් ම පවතින්නේ ය. එහෙත් මාලිනියගේ පළි ගැනීමට ඇති බලවත් ආශාව නිසා ඒ අනුකම්පාවෙන් දත් කිසිත් පලක් ගන්නට නුපුළුවන.

"ඒ පොලිස් කාරයාට නම් කිසි ම සමාවක් දෙන්නට වටින්නේ නැහැ. ඔහු නිලයෙන් පහකර දමා ලා මදි- ඔහුට සීලාචාර කම්

උගත් වන්නට යම පල්ලන් වෙත යවන්න ඕනෑ.'' යයි ඈ දරුණු හඬකින් කීවා ය.

ඒ ගැන තවත් කතාව දිගට ගෙන යන්නට ජයපාල නො කැමති විය. එ දා ඇය ලත් නො තරම් අතවර සිහි වන විට, දැනටත් සිත, වණයක් මෙන් පැරෙන බව ඈ කීවා ය. මෙහිදී නොමසුරුව, ඈ ජයපාලට ස්තුති කළා ය. එ දා ජයපාල නො පැමිණෙන්නට කාරණය නිසැකයෙන් ම ඉතා බර පතල වන බවත්, තමාගේ ජීවිතය රැකුණේ, ජයපාල නිසා බවත්, එහෙයින් අවශ්‍ය ප්‍රස්තාවයක දී ඔහු වෙනුවෙන් ජීවිතයෙන් පුදන්නට තමන් සූදානම් බවත්, ඈ නොපැකිල කීවා ය.

''මා වැනි දුප්පත් තරුණියකගෙන් මහත්මයාට උපකාරයක් වුවමනා කරාවිය කියා මට නම් හිතෙන්නේ, නැහැ. මහත්මයා ධනවතෙක්-කුලවතෙක්-බලවතෙක්, එහෙත් යම් දවසක මහත්මයා නමින් මරුවාට බිලි කිරීමට මිනිස් පණක් වුවමනා කළොත් ඊට නිකිණියාගේ බිල්ල ඇති බව මතක තබා ගත මැනවයි.'' ඈ කීවා ය.

මෙය ව්‍යාජ ස්තුතියක ස්වරූපයෙන් ජයපාලට ශ්‍රවණය වුව ද, ධෘතිමත් නිශ්චයකින් කළ ප්‍රකාශයක් බව ඇයගේ ස්වභාවයෙන් පෙනිණි. මේ වේලේ ඇයගේ සිවුමැලි මුහුණේ ළඳ බොළඳ කම වත්, සුදු මැලි දුබල පෙනුමවත් නොව, දකින්නට ලැබුණේ, දුර්දර්ශනීය උද්වේගයකි. ජයපාල ඇයගේ ජීවිත පරිත්‍යාගයක් අපේක්ෂා නො කරන්නේ ය. ඔහු කෙළේ ජීවිත පරිත්‍යාග යෙන් කෘතඥතාව දැක්වීමට සුදුසු උපකාරයක් නො වේ. එ හෙයින්, එ බඳු නො කන්කලු වචන ශ්‍රවණය නො කැමැතිව, ඔහු අප්‍රසන්නයෙන් අහක බලා ගත්තේ ය.

''මහත්මයා, අහක බලන්නේ ඇයි? මහත්මයාට මගේ වචන පිළිගැනුණේ නැති හැඩයි. හොඳයි! ඒක එ සේ නම් එහෙ ම ගියදෙන්.'' කියා මාලිනී මඳක් කල් නිශ්ශබ්දයෙන් සිට, ''මෙ-හෙම මේ කලබලය නුණා නම් මහත්මයාට මා හා කතා කිරීමට



අවස්ථාවක් නො ලැබෙන බව කීවේ මන්දයි?'' අනතුරුව ප්‍රශ්න කළා ය.

''මාලිනී, ඔබ දකින්නට ආ මට, එ දා ඔබගේ පියාගෙන් නොලැබුණේ පයින් පහර පමණකැයි'' ඔහු කීවේ ය. මාලිනිය පුදුමයෙන් බලා සිටින විට, එදා නන්ද රාළ තමාට කළ වෙනස් කම් සියල්ල ඔහු විස්තර කරන්නට විය.

''මහත්මයාට ඔහු එහෙම ආඩම්බර පෙන්නන්නට ඇත්තේ, මහත්මයා නිකම් රස්තියාදු කලිසම් කාරයකු කියා හිතා ගෙන.'' යයි මාලිනී සිනා සෙමින් පවසා, අනතුරු වත් ''ඔහු මහත්මයා ගැන ඇති සැටියේ, තරුණු දැන ගත් හැටියේ, බොහොම බය වෙන්නත් ඇති. නුගත් පරණ මිනිසුන්ගේ හැටි ඔහොම තමා-නිවටුන් දුටු තැන, පාගන එක, බලවතුන් දුටු තැන වඳින එක. ඉතින් මහත්මයාට ඔහුගෙන් යම් කිසි පමාවක් වී නම් ඊට සමා වුව මැනවැ යි'' යටත් පහත් ලෙස කීවා ය.

''මාලිනී, ඔබේ කතාව නිකම් පව්-පින් හරින්නා වැනි කතාවක්-මොක ද මේ?'' ජයපාල දොම්නස් සිතින් නැඟී සිටිමින් විතාළේ ය. ''මට ඔබෙන් ස්තුතියක් ඕනැත් නැහැ- ජීවිත පරිත්‍යාගයත් ඕනැත් නැහැ- සමා යැදීමක් ඕනැත් නැහැ. මට ඕනෑ ඔබ සනීපයෙන් සිටිනවා දකින්න පමණ යි- ඔබ සතුටු සිතින් කතා කරනවා අහන්න පමණයි'' ඔහු යළිත් කීයේ ය.

කරදරයෙන් මුකුලිත වූ ඔහුගේ මුහුණ දෙස බලා මාලිනී සිනාසුණා ය. ''සතියක් කරපු නත් දෙඩුම් මදිව, දැනුත් මා නත් දොඩනවා- නො වේද මහත්මයා?'' කියා නැවත බැගෑපත් ලෙස ඔහු මුහුණ බැලුවා ය.

''මාලිනී, ඔබට තව ම වැඩියේ කතා කරන්න හොඳ නැහැ. ඔබ ඔහොම දොඩවන්න ගියේ මේ සාත්තු කාර්යත් මා පන්නා ගනීවි. ඉඳා, ඔබට බල-බලා ඉන්න හොඳ පොතක්'' කියා ජයපාල ඇයට තෑගි කරන්නට ගෙනා පාර්සලයකින් නව කථා පොතක් ගෙන දුන්නේ ය.

# 8

තරුණ ජයපාල වත්තේ සිටින තාක් දවස ගාණේ ම මාලිනිය බලන්නට එන්නේ ය. ගලපිට කන්දේ සුපිරිංටැංඩංට් ද, ලියන්නෝ ද, කොන්දොස්තර වරු ද තමන් තරුණ ස්වාමියා මෙ ලෙස දින පතා නිකිණියානට ආකර්ෂණය කර වන අයොමණිය මාලිනිය බව දනිති. අරණායක ද, එම අහල-පහල කඩ පොළවල ද, හැසිරෙන උස් පහත් කවුරුත් ජයපාල තරුණයාගේ, මේ අපූර්ව චරිත කලාපය ගැන බිය සැක දෙකින් තොවේ. ප්‍රසිද්ධියේ ද අප්‍රසිද්ධියේ ද සාකච්ඡා කළාහ. තමාගේ මේ අපූර්ව ක්‍රියා පරිපාටිය මහා ජනයාගේ මෙ තරම් බර පතළ සංවාදයකට කාරණයක්ව, පවතින බව ජෝන් ජයපාල නො දන්නේ ය. ඔහුගෙන් එ එල්ලේ ම මේ ගැන ප්‍රශ්න කළ-නොහොත් ඔහුට උපහාස මුඛයෙන් සරදම් කළ- නොහොත් අපවාද මුඛයෙන් නින්දා කළ- අහල පහල වැසි කිසිවෙකුත් නුවූහ.

මාලිනියට සම්පූර්ණ සුවය ලැබුණු වහාම ඔහු කැගල්ලෙන් කැඳ වූ සාත්තු කාරියන් දෙ දෙන අස් කර දමා මාලිනිය වෙනුවෙන් ගෙ දොර-දොරේ වැඩ කිරීමට අමුතු මෙහෙ කාරියන් දෙදෙනකු පත් කළේ ය. පළමු පරිද්දෙන් ගෙ දොර-දොරේ වැඩ කිරීම දැන් මාලිනියට තහනම් ය. ඇයට ඇත්තේ, සංවිධානය කිරීමත්, පොත්-පත් කියවීමත්, හොඳට හැඳ-පැළඳ ගෙන, රජ කුමරියක මෙන් පසු වීමත් පමණකි. මෙ සේ මේ රස බොජුන් කකා, රන් කුඩුවක කරන වාසය ඇයට ද, ඇයගේ සීයාට ද, එක් අතකින් තුෂ්ටි දායක වුවත් තවත් අතකින් ඔවුන්ගේ ආත්ම ගෞරවයට ඉවසුම් නොදෙන කටුක පීඩාවක් විය. ගම්මුන් තුඩ-තුඩ පවතින කටුක වචන ඔවුනට මැඩ පැවැත් විය නො හැකියි.



"ටට වට කර වැට බැංදත්, කට වටකර වැට බැඳීම නුපුළුවන."
යන ජනාලාපය මෙන්, තමන් මේ ආගන්තුක ධනවත් තරුණයා-ගෙන් ලබන ආදර සංග්‍රහයන් අනාචාරාත්මක අධමෝපායයක් ඇඟිය කොට නැති බව අනුනට අවබෝධ කැරවීම කිසි සේත් නො කට හැකි වැඩකි.

ජෝන් ජයපාල පොහොසත් තරුණයකු වුව ද, සදාචාර කැමැත්තකු බවත්, කුලවත් තරුණයකු වුව ද, නිහතමාන සමානාත්මතා වාදියකු බවත්, රට-දය-සමයය වෙනුවෙන් දියුණුවට වැඩ කරන්නකු බවත් මාලිනී දන්නීය. තමා මහාජන- සේවකයකු බව ජෝන් ජයපාල කිසි විටෙකත් මාලිනියට නො කීවේ ය. ගලපිට කන්දේ අයිතියත්, කුලවත් කමත්, පොහොසත් කමත්, හැර තමා ගැන අන් කිසිවක් මාලිනිය විසින් නො දන්නා ලදැයි, ඔහු කල්පනා කරන්නේ ය. එහෙත් සත්‍යය අනෙකකි. ජෝන් ජයපාල පිළිබඳ පෞද්ගලික වූ ද, ජාතික වූ ද, සියලු ම ව්‍යාපාර විශේෂයන් ගැන, වෙනත් නාගරික මහා ජනයා මෙන් ම මාලිනී ද හොඳ හැටි දන්නීය. සිංහල ප්‍රවෘත්ති පත්‍ර නො කඩවා කියවන ඇයට ඒ හැම, රහසක් නොවේ. ජෝන් ජයපාලගේ චරිතය තමන් මෙ සේ හොඳ හැටි දන්නා බැවින් එ වැන්නකු යම් කිසි අපේක්ෂාවක් මුල් කොට ඇඳහීම අස්ථාන ප්‍රයුක්ත නොවන්නේ යයි. ඈ කල්පනා කළා ය. ජෝන් ජයපාල ගෙන් ඇය මෙ සේ ආදර සංග්‍රහයන් නො පැකිල ලබන්නේ, එ හෙයිනි.

තන්ද රාළ වූ කලී නිකිණියානේ වෙනත් නූගත් ගම්මුන් හා සම වන්නෙකි, එ හෙයින් ජෝන් ජයපාලගේ චරිතාපදානය පිළිබඳ මාලිනිය දන්නා ගුණ පක්ෂය ඔහු නො දන්නේ ය. ඔහුට ජෝන් ජයපාල අහල-පහල ඇතැම් පොහොසත් වතු-පිටි හිමියන් වැනි ගුප්තාර්ථවත් දුෂ්ටශීලී නරාධමයෙකි. එ හෙයින්, ජෝන් ජයපාල හා ඇති කළ මේ මිත්‍ර සන්ථවයෙන් අනිෂ්ට විපාකයක් විනා ඉෂ්ට විපාකයක් නම් ඔහු විසින් අනපෙක්ෂිත ය. ඔහු නොයෙක් වර මාලිනිය හා සමඟ මේ ගැන සාකච්ඡා කරමින් තම නො කැමැත්ත ප්‍රකාශ කළේ ය.

"මාලිනී, ඔන්න නො කීවෙයි කියන්න එපා. මන් හූනා කියන්නා වාගෙයි මේ කියන්නේ, ඔය ගලපිට කන්දේ මහත්මයාගේ ගමන්-බිමන් වලින් අපට හොඳක් වෙන්නේ නෑ. ඒ නිසා ඔයාගේ ගමන ඔයින් නවත් වන එක හොඳයි." නන්ද රාළ ඉඩ ලැබුණු-ලැබුණු හැම වතාවක දී ම කීයේ ය.

මාලිනී, පියාගේ අවවාද නො පිළිගත්තා ය. ජයපාල තරුණයා නො මනා අදහස් ඇති අධම පුද්ගලයකු නො වන බවත්, වෙනත් නරාධමයන්ගේ මිම්මෙන් ඔහු මැනීම අපරාධයක් බවත්, මිනිහා-නො මිනිහා විමසා ගන්නට තමන් පොහොසත් බවත්, ඈ කීවා ය.

මහල්ලා, එ පමණකින් නො නැවතී, මිනිබිරියගේ ඇස බැඳුණු පටලය ඉවත් කිරීමට සුදුසු තවත් නොයෙක් දෙය ස්වකීය ග්‍රාම්‍ය භාෂිතයෙන් ප්‍රකාශ කළේ ය. ඇතැම් තැනක දී, ඔහු කොතරම් දරුණු වී ද යත්, ඔහුගේ මැර ප්‍රහාරයන් ඉවසිය නොහී මාලිනී වැලපුණා ය. එහෙත් මාලිනියට මහල්ලා කෙරේ උපදින අප්‍රසන්නයක් ද නැත- මහල්ලා දුප්පතකු වුව ද, අප්‍රසිද්ධ මනුෂ්‍යයකු වුව ද, තම තරමට තත්ත්වය රැක ගැනීමට දරන පරිශ්‍රම ඇත්තෙකි. ඔහු තම හත් මුතුන් පරම්පරාවක නම්-ගම් කියන්නට දන්නේ ය. ඔහු ට මෙන් ම, ඔහුගේ මුතුන් මිත්තන් එකකුට වත්, පට බැඳි නමක් හෝ වැඩ තිල ආදියක් හෝ නො ලැබුණ ද, ආත්ම ගෞරවය ඇති අවංක මනුෂ්‍යයන් වශයෙන්, කුල දූෂණයට කාරණය වූ කලංකයක් හෝ අපරාධයක් හෝ කිසි විටකත් ඇති නොවී ය. දැන් ඉතින් මාලිනිය නිසා ආච්චි-මුත්තා කාලේ වත් නෑසූ දේවල් අසන්නට වන බව කියා ඔහු කඳුළු වගුළේ ය. මහල්ලා සනසාගත නුහුණු තැන, ඔහු හිස මුදුන සිඹිමින් මාලිනී ද කඳුළු වගුරන්නී ය. "කඳුළු වැහි වැස්සත් දුව, ඉතින් ඔය ඔළුවේ තවත් හිස කෙස් නම් වැටෙන්නේ නැතැයි" කියමින් මහල්ලා ඇතැම් විට, සරදම් ද කරන්නේ ය. කොයි හැටි කෙසේ වුවත්, මේ වාද-බේද පැවතුණේ, දෙ තුන් සතියක් ගත වන තුරු පමණකි. "කිව්වා නාහන ගුරු එහෙ නම් එහෙයි-



මෙහෙ නම් මෙහෙයි" කියා ඔහු දවසක් මිනිබිරියට දැනමුතු කම් දීම අවසන් කළේ ය. "උඹට ඕනෑ එකක් කර ගනින් මාලිනී, මන් ඉතින් තවත් කටේ කෙල බිම එළන්නේ නැහැ. උඹේ හිතුවක්කාර කම් තමයි. උඹට විනාසෙට හිටින්නේ. දුම් පටලයෙන් වැහිලා නිසා උඹ වැටෙන්න යන පාතාලය උඹට පෙන්නේ නැහැ. මට පේනවා- ඔන්න මන් හූනා කියන්නා වාගේ කිවුවා ඉතින් උඹට කැමැත්තක්." මෙ සෙ මේ කත් කෙඳිරි ගෑම මහල්ලාට නතර කරන්නට සිතුණේ, කල් ගත වෙන්නට-වෙන්නට ඔහුගේ පරාදයටත් මාලිනියගේ දිනුමටත්, වැටහෙන නොයෙක් කරුණු මුල් වෙන්නට පටන් ගත් හෙයිනි.

තරුණ ජයපාල හිතවත් කම් දක් වන්නට වුණේ, මාලිනියට පමණක් නොවේ. අවිශේෂයෙන් කාහටත් ඔහු හිතවතෙකි- පිහිට විය යුතු කාහටත් පිහිට වන්නෙකි. මේ කරණකොට තිකිණියාන ගම්මුන්ගේ දොඩමළු කම්වලට හූහාක් ම මුක වාඩම් බැඳුණාක් මෙන් විය. මුල දී නම් මාලිනියත්, මේ තරුණයාත්. තමන් ඔපාදූප කතාවටත්, අනම්-මනම්ටත්, පද බැඳුමටත්, කාරණය කොට ගෙන, කිසි ගරු-සරු කමක් නැතිව, ගම්මු කවුරුත් සිත් සේ මැන දෙඩූහ. එ විට තරුණයා ගැන කිසිවක් ඔවුහු නො දත්හ. දැන් ඔවුහු පෙනුමෙන් පමණක් නොව, ගති ගුණවලින් ද තරුණයා හඳුනති- ඔහු, කිසිවකුගෙන් කිසි පිහිටක් වුවමනා නො කරන, එහෙත් වුවමනාවක දී කවරකුට වුවත් පිහිට වෙන්නට නො පැකිලෙන, දෙහ ශක්තියෙන් ගම්මුන් කිහිප දෙනකු හා සම වන, කුලවත් කමෙන් හා ධනවත් කමෙන් කිසිවකුටත් අසම වන තරුණයකු බව දනිති. සමහරු ඒ හැමටම වඩා ගලපිටකන්දේ අයිතිය නිසා ජයපාල තරුණයාට බිය වූහ. මෙ ගම, දුප්පත්තු, මේ වත්තේ වැඩ කොට දිවි රැක ගනිති. පොහොසත්තු තමන් ගවයන් ආලපාළුවට බැදෙනුවාට බියෙන් වතු හිමියන් සමඟ හොඳ සිතින් පසු වන්නට පරෙස්සම් වෙති.

යටි සිතින් කෙසේ වෙතත්, මතු පිටින් ජයපාලගේ රක්ෂාවරණය නිසා නන්ද රාළට ද, මාලිනියට ද ගමේ ගෞරවය වැඩි විය.

මාලිනියට මෙන් ම නන්ද රාළට ද, ජයපාල තුළ විශේෂ ප්‍රේමයක් පවතින බව ඉතා ම පැහැදිලි කාරණයකි. ජයපාල තරුණයා මහල්ලාට නොයෙක් ප්‍රිය තෙපුලෙන් කතා කරන්නේ ය. නොයෙක් තෑගි-බෝගවලින් ඔහු සිත් පිණ වන්නේ ය- මහල්ලාට කිලුටු ඇඳුම් පැළඳුම් වලින් පසු වන්නට ඉඩ නො දෙන්නේ ය. මහල්ලාගේ පළමු පුරුද්ද නම්, ඇඟ ලා ගත් ඇඳුම් ඇඟට ම ජීර්ණ වන තෙක් දිගට ම ඇඳීම ය. එහෙත් දැන් ඔහුට එසේ කළ නො හැකි ය. ඔහු නො කැමති වත්, මෙහෙකරුවන් විසින් හෝ දවස් පතා ඔහු ඇඳුම් මාරු කරනු ලැබේ. ඒ මේ ආදි කරුණුවලින්, අවශේෂ ගම්මුන් මෙන් තමා ද ජයපාල ගැන මුලින් පහළ කළ අදහස, එ නම් ආත්මාර්ථකාමී අභිමානවත් නරාධමයෙකැ යන අදහස, යුක්ති යුක්ත නො වන බව මහල්ලාට දැන්-දැන් ප්‍රත්‍යක්ෂ වේ.

තරුණ ජයපාල නිසා අන්දාගේ තත්ත්වය ද, වෙනස් විය. දැන් ඔහු ගමේ සැලකිය යුත්තෙකි. සිරිත් ලෙස කළ කුලී ඇදීම දැන් ඔහු නො කරයි. දැන් ඔහු සෑහෙන පඩියකට ගලපිට කන්දේ වැඩ කරන කංකානම් කෙනෙකි. එසේ ද වුව, මාලිනිය හා නන්ද රාළ මෙන් අන්දා ද, නිකිණියානේ හැම ගමයකු හා ගම මහගෙයක විසින් යටි සිතින් හෙළා දකිනු ලැබුවේ ය- ඊර්ෂ්‍යා කරනු ලැබුවේ ය- ද්වේෂ කරනු ලැබුවේ ය. ගමේ කවුරුත් මේ තිදෙනාගේ පහත වැටීම දකින්නට නො ඉවසිල්ලෙන් පසු වූහ. ගම්මු රහසින් සම්මත කොට ගෙන, ටිකින්-ටික ඔවුන් හා ආශ්‍රය අඩු කළහ. ගමේ අවුරුදු පතා කරන දෙවොල් මඩුවට සිරිතක් වශයෙන් නන්ද රාළ ගෙන් ද සම්මාදම් හා නොයෙක් උදවු බලාපොරොත්තු වන නමුත් මේ වතාවේ එය වෙනුවෙන් කිසිවෙක් එහි නොපැමිණියාහ- කිසි දැන්වීමක් ද නො කළාහ. අං කෙළියේ ද, පොල් කෙළියේ ද, නන්ද රාළ වට්ටාඩියෙකි. ඔහුගේ අනුමැතියක් නැතිව එ බඳු කෙළි සෙල්ලම් ගමේ ඇතිවූ පළමුවන වතාව මේ විය. තමාට මේ කරන නො ගරු කම්වලට මුළු ගම ම විනා, එකකු දෙන්නකු වෙන් කර ගැනීම නන්ද රාළට නුපුළුවන. එ සේ එකකු වෙන් කර ගත හැකි තැනක දී- එනම් ඉළව්-මඟුල් ආදියක දී- පමණක්, නන්ද රාළට ද, මාලිනියට ද, සිරිත් පරිද්දෙන් බුලත් හුරුලු හා කැඳවීම් පත් ලැබේ.



තවදත්, මාලිනී උඩඟු සිතැත්තියකි. දැන්-දැන් ඇයගේ උඩඟු නම් දියුණු තියුණුව ගම්මුන්හට පෙනෙන්නේ ය. ඇය දැන් අඳින-පළඳින නොයෙක් වර්ගවල සාරි, පා වහන් ආදියත්, කන-කර ආයිත්තම් ආදියත්, මේ උඩඟු කමේ අධික ගුණය වශයෙන් ඔවුනු සලකන්නට වූහ. නිතර පොත්-පත් කියවීමෙන් ඇයගේ කාලය ගත වීමත්, සවස් වරුවේ තරුණයා සමග පිළිසඳර කතාවෙන් පසු වීමත්, පරිසර්යාට පිණිස කලාතුරකින් ඔහු සමග වෙල පහළ යාමත්, ගම්මුන්ගේ පරිහාසයට ද, ඊර්ෂයාවට ද කාරණ විය.

මේ වෙනස් කම් පෙනෙන විට මාලිනිය විසින් ද ගම්මු පිළිකුල් කරනු ලැබූහ. "මා උඹලාට එක පාරක් එපා නම්, උඹලා මට සිය පාරක් එපා." යයි මෙ වැනි ඒිනස් කමක දී, සිත් කෝපයට පත් ඇය විසින් අසල් වැසි තරුණියන් කිහිප දෙනකුට ම කියන ලදී. මේ ආදි වශයෙන් පොඩි වැරදි පවා මහත් කොට ගැනීමෙන් ගමේ ස්ත්‍රී පක්ෂය ද, එකිනෙකා දවසින් දවස නො මනාප වූහ. නන්ද රාළ අත් හැරුණු කළ, ඇයට ගමේ සිටින එක ම හිතවතා අන්දා පමණකි. ගම් මැද්දේ කියන-කරන සියලු තොරතුරු ඇ, අන්දාගෙන් අසා දැන ගන්නී ය. අන්දා ගමේ-ගොඩේ තොරතුරු පමණක් නොව, ජෝන් ජයපාල ගැන ද නොයෙක් දෙය කියන්නේ ය. වත්තේ, බංගලාවේ ඔහු ගත කරන කාලය ද, අන්දා නිසා මාලිනියට නොරහසකි. අන්දා මෙ සේ කියන්නේ, කේලම් කියන ස්වරූපයෙන් නො වේ. එහෙත් ඔහුගෙන් කියැවෙන්නේ, කේලමක් ම ය. ඔහු ඒ බව නො දනී.

"මාලිනී,.. හරි සෙල්ලං, ඊයේ රෑ බංගලාවේ." අන්දා සතුටකින් කීයේ ය.

"ගලපිට කන්දේ දැයි" මාලනී ඇසුවා ය.

"ඔව්"

"මහත්මයා ආවා යැ?"

"ඊයේ හවස ආවා. තවත් කට්ටියකුත් එක්ක, කොළඹ හිටන්" අන්දා කඩින්-කඩ දොඩමින් කීයේ ය.

"ඉතින් කවුද කට්ටිය?" මොකද සෙල්ලම්?" මාලිනී ගණනකට නැතිව මෙන්, එහෙත් යටි සිතින් උපන් බලවත් උනන්දුවෙන් ප්‍රශ්න කළා ය.

"හරි බොනට්'ලා කට්ටියක්- ඔක්කො ම ඉලංදාරි. හරි සිල්ලාරමක් බීම කම්මුතු වෙංට ඇති-"

"මොනවා. අන්දෝ බීම?"

"ඔව්, මාලිනී! ඊයේ රෑ බෝතල පිටින් විස්කි කම්මුතු උණේ"

"ජයපාල මහත්මයාත් බිවුවා ද?"

"නෑ, නහයෙන් පහතට ඉම්බා" අන්දා කවට කම් කරමින් කීයේ ය.

එහෙත් මාලිනියට එය කවට කමක් නො වී ය. මෙ තෙක් බොරුවට නමුත් සිනා මුසුව, පෙනුණු ඇයගේ මුහුණ එක වරට ම උපශාන්ත විය. ඈ, අන්දා දෙස නො සතුටු බැල්මෙන් බලා සිටියා ය. වුණේ, අත් වැරැද්දක් බව එ නම් නො දනුවත්ව නමුත් තමාගේ කටින් පිට වුණේ දරුණු කේලමක් බව අන්දාට ද දන්-දන් පෙනෙන හෙයින් ඔහු ද මුහුණ පුළුටු කර ගත්තේ ය.

"අනේ! මාලිනී, මන් කී බවක් කියන්නට එපා, ජයපාල මහත්තයා නම් බිව්වේ ටිකයි." ඔහු නැවත කීයේ ය.

මෙහිදී අන්දා වැයම් කෙළෙ, වැරැද්ද හැකි තරමක් දුරට හරි ගැස්සීමට ය. ඔහු කීවේ, කේලමක් වුව ද, එය නම් බොරුවක් නො වේ. ගත වූ රෑ ජෝන් ජයපාල කොළඹ සිට පැමිණ ස්වකීය මිත්‍රයන් සමග බීමත්කමෙන් කාලය ගත කළ බව ඇත්තකි.

---

1. අන්දා "බොනපාට්ය" කියන්නේ මත් පැනින් ප්‍රමාදයට පැමිණෙන බේබද්දාට විනා නැපෝලියන්ට නො වේ.



අන්දාට නම් ජයපාල කෙරෙහි පහදින්නට විනා කලකිරෙන්නට මේ කාරණයක් නො වේ. ගලපිට කන්දේ මෙ බඳු උත්සව හැම දා ම පවතිනවා නම් අන්දා එ පමණට කැමති ය. එයින්, කුස්සිය පැත්තෙන් යන තමාටත් අඩියක්-හමාරක් ලැබෙනු පමණක් නොව, ගලපිට කන්දේ සිටු පුත්‍රයාගේ ලෝබ නැති කම් රටට ද දක් වෙන හෙයිනි. මේ ප්‍රවෘත්තිය මාලිනියට මෙ සේ විස වන බව ඔහු නො දත්තේ ය. එ හෙයින්, තවත් කතා නො කොට, මාලිනිය එ තැනින් නැගිට, යන්නට ගිය එක ඔහුට පුදුමයකි.

මෙ සේ අන්දාගේ මෙන්ම මාලිනී වත්ත පහල වෙල් යාය දෙසට ගමන් කළා ය. වෙලාව සවස පහ පමණ විය. සන්ධ්‍යා මේඝය, වේගවත් පුලහකින් පෙර දිග බලා ගමන් කරන්නට විය. පුලහින් පීඩාවට පත් රබර් ගස් ද, කඳුළු වගුරුවමින් වැලපෙන්නා සේ ඉදුණු කොළ සලන්නට විය. මේ වැනි කුණාටුවක් නො වේ. මේ ඍතුවේ දී මේ පලාතට ම විශේෂ වූ අදිසියේ හමන වියළි උණුසුම් වාත වෙගයකි. අව්ව ද තව ම බලවත් ය. තවමත් ඉදිබුවෝ ද නියරවල් උඩ, තැන-තැන" අවට තපිමින් පවුල් පිටින් පසු වෙති. වෙල් කකුළුවන් හා කුඩා මසුන් අග්‍ර භෝජනය කොට ගත් කොක්කු තව ම දිය පිරි ලියදිවල අවයමෙන් හැසිරෙති. මඩ වැකි ගතින් නගුල් මිටි එල්බගෙන, හී හානා ගොවීන්ගේ හූ නාදය ද තව ම එක සේ පැතිරේ එ සේ ද වුව, තෙළා ගත් පලා හිණ බැඳ ගෙන කඩා ගත් දර හිසින් ගෙන, ඇකයෙන් දරුවන් ගෙන ගැහැනු පමණක් සතුටු සිතින් තම-තමන් ගෙදරවල බලා ගමන් කළාහ.

මාලිනී, වත්ත පහල සීමාවේ වෙල් යායට යා බදව, පිහිටි කළු ගල් ඇංදට ගොඩ නැගී ඈත වෙල් මඩේ ළඟ, සිසිල් සුව විඳිමින් නිසන්සල ගල් රූ මෙන් සිටි මී හරකුන් දෙස බලා ගෙන සිටියා ය. ඇය දෙනෙත් මෙ සේ මී සරකුන් දෙස අවනත වූ නමුදු සිත් සතන් අවනත වූයේ, අනෙක් කරුණකට ය. ඒ කරුණ ඇයගේ අවංක ළඳ බොළඳ සිතට දැරිය නො හැකි බරකි. ඒ බරින් පැලෙන්නා සේ ඇයගේ කුඩා වුව ද අතිශයින් ම ශොභන ස්තන

ප්‍රදේශය හ්‍රස්ව, ශ්වාසයෙන් ගැහෙන්නට විය. "දවසින් දවස ම මට නම් සිතේ සැනසීම නැති වෙන දෙය මිසක් අන් කිසිවක් අසන්නට නො ලැබෙයි. මා හොඳයි. උපන් නැකත. උපන් විට දිනකින් මව මරා ගත්තා- ඕනෑ කරන වයසේ දී පියා මරා ගත්තා- මගේ අම්මා තාත්තා හිටියා නම්, මට කල යන්නේ, මෙහෙ ම නො වෙයි. මගේ කල, දූන් කලට ඕනෑ විදියට මිසක් මට ඕනෑ හැටියට නො ගෙවෙයි. මගේ දුබල මහලු සීයා මොනවා කරන්න ද? සාමාන්‍ය අන්තරායක දී නම් ඔහු මට පිහිට වෙන්න සමර්ථ වේවි- අපේ පවුලේ නම්බුව රැක ගන්න බලාවි. මේ පත්ව සිටින අවස්ථාවේ හැටියට ඔහු මටත් වඩා අන්ත ය. අනේ! අනේ! කියා මාලිනී සොවින් තැවුණා ය- කඳුළු වගුරවමින් වැලපුණා ය.

මාලිනී, ජයපාල තරුණයාගේ සමාගමය ඉවසනවා නම් ඉවසන්නේ, විළි බිය නැති, සැක නැති, සිතකින් ම නො වේ. නොයෙක් වර, ඇයගේ තලතුනා සීයා විසින් හිතවත් බසින් දෙන්නට යෙදුනු ඔවදන් ඇයට මතක නැත්තේ ද නොවේ. ඇයට ජයපාල තරුණයාගේ තරුණ කම කෙරෙහි වත්, ධනවත් කම කෙරෙහි වත්, කුලවත් කම කෙරෙහි වත් විශ්වාසයක් හෝ පැහැදීමක් හෝ නැති, ඇයගේ විශ්වාසය සම්පූර්ණයෙන් ම පිහිටියේ, ඔහුගේ චරිත ශක්තිය කෙරෙහි ය. පත්‍ර මාර්ගයෙන් දින පතා ම වාගේ දකින්නට ලැබෙන චරිත රූපයට වඩා, ඔහු හා මෙ තෙක් කළ ආශ්‍රයෙන් ඔහුගේ පෞද්ගලික ජීවිතයෙහි ද අමුත්තක් ඇති බවත්, කිසි විටකත් ඇයට දකින්නට නො ලැබිණි. එහෙයින් "ඔය ජන ප්‍රභූවරයන් කෙරෙහි කිසි විශ්වාසයක් තබන්නට එපල්ලා! ඔවුන් කරන්නේ, තැනට ඔබින හැටියට හැසිරෙන එක යි. එයින් තමයි, ඔවුන් මහා ජනයා වසහ කර ගන්නේ. ඔවුන්ගේ නියම ගති ගුණ සලකා බලන කොට, ඔවුන් සාමාන්‍ය මනුෂ්‍යයාට වඩා හැම අතින් ම නරක යි. ඔවුන් කියන්නේ එකක්, කරන්නේ එකක්, පෙන්වන්නේ එකක්, ඇති කරන්නේ එකක්- ඔවුන්ගේ ඔක්කෝම වැඩ තමන් ගේ ආත්ම ලාභය උදෙසා ම යි."යන ආදී වශයෙන් රටේ නොයෙක් ලෙසින් කියැවෙන ඇතැමුන්ගේ වචන, සර්ව



සාධාරණ නොවන බව, ඈ පිළිගෙන සිටියා ය. එහෙත් අන්දා නිවූ ප්‍රවෘත්තියෙන් ජයපාල තරුණයා ද යථෝක්ත දෝෂාරෝපණයට හසු වන්නකු බව දූන්-දූන් ඇයට පෙනේ. ඇයගේ දොම්නස ඒ හෙයිනි.

මෙ සේ සොවින් තැවෙන මාලිනියට තමා සොයා ගෙන වෙල් යායට එන තරුණ ජයපාල ඈත දී ම දකින්නට ලැබුණේ ය. එ විට, ඈ වහා මුහුණ පිස දමා ගත්තා ය- අවුල වූ හිස කෙස් සකස් කර ගත්තා ය. සිනා මුසු මුහුණෙන් යුතුව, ඔහු පිළිගන්නට ගල් ඇංදෙන් බැස, ඉදිරියට ගමන් කළා ය. තරුණයා ද සිරිත් ලෙස දක්වන සිනා මුසු මුහුණින් තරුණියට සමීප වෙමින් ඇයගේ ප්‍රගත් අල්වා ගෙන, රන් දම් මෙන් පදවන්නට විය.

"මාලිනී, ඔබ දූන් අඬ ලා තිබෙන හැඩ යි. ඔබේ ඇස්, අද වෙනදාට වඩා රතු යි. මේ මොකද?" කියා ඔහු තැති ගත්තකු සේ දෙ තුන්පියවරක් පසු බැස, පුදුමයෙන් බලා සිටියේ ය.

මෙහි දී ද මාලිනියට හැඬුම් යන්නට ආ නමුත් ඈ ඊයමෙන් හැඬුම් නවතා ගෙන, සිනා සුණා ය. එහෙත් ඒ නිරායාසයෙන් කෙරුණු සිනාවක් නොව, උත්සාහයෙන් ආරූඪ කර ගත් වේශයක් බව තරුණයාට වැටහුණේ ය.

"මොක ද, මොක ද, ඔබ අඬන්නේ මොක ද? කියන්න කියන්න." කියමින් ඔහු තවත් පෙරැත්ත කරන්නට විය.

ඈ ඊට ද කතාවක් නැතිව ඔහුට පිටු පා, ගල් ඇංදට අභිමුඛව, ගමන් කරන්නට වූවා ය. ඇයගේ සිතේ පවතින කලබලය ඉකි බිඳිමින් හඬන්නට පුදුසු ශෝකයක් මෙන් ඇයට හැඟෙතත්, කෙනෙකුට කියන්නට වත් තරම් වූ සැලකිය යුත්තක් සේ ද ඇයට නො පෙනේ. ඇයගේ රන් රුවක් ආභරණ වෙට්ට පිත්තල බවට පැමිණියා නම් ඇයට මෙ තරම් කනගාටුවක් නැති, දඹ රන් කඳක් වැනි කසි කවලමක් නැතැයි සිතන ලද, චරිත ශක්තියක, මෙ තරම් ඉක්මනින් යකඩ මල මතු වන්නට පටන් ගත් කළ, ඇයගේ භීතියත් සංවේගයත් දියුණු-තියුණු වීමට අන් කිසි උපද්‍රවයක්

වුවමනා නො වී ය. සාමාන්‍ය තරුණයෙකුගෙන් වන නො තරම් නො තරම් කමට වුවත්, මිනිස්සු ඉක්මනින් නො කලකිරෙති. ඔවුන් කෙරේ මිනිසුන් තබන්නේ ද ඉතා ම අල්ප විශ්වාසයකි. එහෙත් විශ්වාසයට ආදර්ශය වන පුද්ගලයකුගෙන් වංක ලක්ෂණයක් ලෙස මාත්‍රයෙන් හෝ ප්‍රකාශ වෙයි නම්, එය මහත් බේදයටත්, හිතියටත් කාරණය වීම ස්වභාවයකි.

ජයපාල ද ඇය පසු පස්සේ ගමන් කළේ ය. එ සේ ගමන් කරමින් ඇයගේ මේ දොම්නසට හේතුව සලකා ගන්නට වෑයම් කළේ ය. මේ මාලිනියගේ මෙ බඳු විලාසයක් ඔහුට දකින්නට ලැබුණු පළමු වන වතාව ය. ඔහු, මාලිනිය ගල් ඇංදට නංවා ගෙන, එහි පුරුදු තැන වාඩි ගන්වා තෙමේ ද පසකින් හිඳ ගත්තේ ය. ඉන් පසු ද නොයෙක් අයුරින් ඇය විතාළ නමුත් ඔහුට ඒ කිසිවක් දැනගත නොහැකි විය. අනතුරුව, ඔහු තවත් ඒ ගැන ප්‍රශ්න නොකළේ ය. "මාලිනී ඔබට මේ වන තුරු මගෙන් නම් හඬන්නට සුදුසු වරදක් වුණේ නැති බව මට සහතිකයි. හැබැයි ඔබට මගෙන් නොයෙක් වතාවල කරදර ඇති වෙන්න ඇති. ඔබ, ඔබේ සැප පහසු පිණිස වියදම් කරනවා මදි නිසා, ඔබට මා කියන්නේ පුළුවන් තරම් වියදම් කරන්න යි. ඉතින් ඉඳ හිටලා සාරි කෑල්ලක් ගත්තොත්, ඒක තමයි, ඔබ කළ මහ ලොකු වියදමක් හැටියට මට පෙන්වන්න හදන්නේ-"

"මහත්මයා, මට කියන්නේ එතකොට, රේස්වලට ගිහින් ඔට්ටු අල්ලන්න දැයි?" මෙහි දී මාලිනී ගැඹුරු මුහුණින් ප්‍රශ්න කළා ය.

"රේස් ඕ!" කියමින් තරුණ තෙමේ පුදුමයෙන් බලා ගත් ගමන් සිට, "ඔබ දුන්නේ කදිම පිළිතුරක් මාලිනී, මේ පලාතේ සිටින උදවිය කොහොම ද රේස්වල වග දන්නේ?" කියා නැවතත්, "ඉතින් ඔබේ දොම්නසට යමක් වුණා නම්, වෙලා තියෙන්නේ , පිට කිසිවකුගෙනු යි. ඊට පිහිටක් වන බලාපොරොත්තුවෙන්- ඒ නිසා, මා මෙ තරම් දුරට ඔබගෙන් ප්‍රශ්න කෙළේ, ඔබ ඒ ගැන කියන්නට කැමති නැති බව මට පේනවා. ඔබ නොකැමති දෙයක් ඔබ ලවා කරවා ගන්නට මා කැමති නැහැ"යි කීයේ ය.



"මහත්මයා ආවේ කවද් දැයි?" ඈ මෙහි දී ප්‍රශ්න කළා ය.

"ඊයේ රෑ. මෙහෙ එන්නට හවස් වුණා වැඩි නිසා, ආවේ නැහැ. ඇරත් කොළඹින් මහ කට්ටියක් මා එක්ක ආවා ඒ ගොල්ලා අද උදෙයි, ආපසු ගියේ"යි තරුණයා පිළිතුරු දුන්නේ ය.

මාලිනියට මෙහි දී අන්දා කිවු සියල්ල ගැන ප්‍රශ්න කරන සිත් පහළ විය. එහෙත්, ඒ සිත් මැඩ පවත්වා ගෙන, ඈ. නිසොල්මන්ව සිටියා ය. තරුණයා ඉන් පසු, නොයෙක් දෙය ගැන කතා කරමින් කල් ගත කොට අනතුරුව, මෙ සේ කීයේ ය. "මාලිනී, මා විශේෂයෙන් ම අද ආවේ, ඔබට වැදගත් යෝජනාවක් කරන්න යි. මා ගැන කලකිරෙන්නට ඔබට යම් කිසි කාරණයක් ඇතැයි කියා මට නම් හිතෙන්නේ නැහැ. අවංක සිතින් මා කියන්නේ, මාලිනී, මට නම් දවසින් දවස ම ඔබගේ අගය වැඩි-වැඩියක් දියුණු වී පෙනෙන බවයි. ඒ නිසා අප අතර, දැන් ඉතින් විවාහයක් සිදු විය යුතුය"යි ඔහු කීයේ ය.

මේ තුෂ්ටිදායක යෝජනාවෙන් තරුණිය කෙරේ මහත් ප්‍රසන්න චිත්තයක් ඇති වනු දකින්නට තරුණ තෙමේ පුල පුලා සිටියේ ය. එ හෙත් එ වැන්නක් නො සිදු විය. සිත් කැළඹීමත්, සන්වේගයත්, ඇත්තේ ඔහු කෙරේ පමණකි. වේගයෙන් ගමන උණුසුම් වාතය නිසා ආසන්න රබර් කැලේ ද කැළඹීම පවතී. මාලිනී නම් ගල් ඇංද මෙන් නිශ්චල ය. ඇයගේ විලාසය අවබොධ කර ගත නො හැකිව, තරුණයා පුදුමයෙන් බලා ගත් වන ම සිටියේ ය.

"මොක ද මාලිනී, ඔබ මේ කතා නො කර සිටින්නේ? පුදන්නට පුළුවන් ඉතා ම ලොකු ගෞරවය පුදන්නට තමයි මා මේ යෝජනාව කෙළේ. ඉතින් ඔබ ඉටි රූපයක් මෙන් කර බා ගෙන ඉන්නේ මොකද?" ඔහු නැවතත් ඇසුවේ ය.

මාලිනිය මෙ සේ නිසොල්මන්ව සිටිතත්, ඇයගේ සිතේ නම් නිසොල්මනක් නැති, එහි පවතින කලබලය ඉතා ම බලවත් ය.

මොහු මේ විවාහ යෝජනා කරන්නේ, සත්‍ය වූ ප්‍රේමයකින් ද, නොහොත් අමද්‍යප සභාවක මුල් පුටුව බාරගන්නා වැනි වංක අදහසින් ද? මොහු මට මේ තරම් ප්‍රේම කරන්නේ, කෙ බඳු ගුණාංගයක් මුල් කොට ගෙන ද?" මට පොහොසත් කමක් නැත- කුලවත් කමක් නැත- උගත් කමක් නැත- වෙන අත් සිසු අපූර්ව ගුණයක් ද නැති. මට ඇත්තේ, රූපය පමණකි. රූපය ද සැලකිය යුතු එකක් නමා. සමහරු පොහොසක් කම්, කුලවත් කම්, වෙනකක් තබා, දත උගත් කම් පවා රූපය නමැති පිළිමයට පුද කරති. එහෙත් එය කරන්නේ, භක්ති ප්‍රේමයකින් ද? සමහරු ඒකාන්ත භක්තියෙන් ද එ සේ කරති. මොහු වසලයකු බව දන් මට පෙනේ. මොහු සරණ යාමෙන් මට වෙන්නේ, මහ කරදරයකි. ඉවසිය නො හැකි දුකකි"යි ඇ සිතුවා ය. අනතුරුවත්, නමුත් ඒ වග දන් මෙහි දී ම විසින් නො කිය යුතුයි. අනෙකක් ම කිය යුතුය"යි සිතුවා ය.

"බෑ! බෑ! මහත්තයා, අප අතර විවාහයක් වෙන්නට පුළුවන් බවක් මට නම් පෙනෙන්නේ නැහැ"යි ඇ කීවා ය.

"එතකොට මා සමග මෙ තෙක් ප්‍රිය සංවාදයෙන් ඔබ කාලය ගත කෙළේ කුමක් සිතා ගෙන දයි?" තරුණයා නො සතුටු මුහුණින් ප්‍රශ්න කළේ ය.

"එ සේ කෙළේ මහත්මයා නැඳිනය"යි ඇ හිස ඔසවා ගෙන අහංකාරයෙන් කීවාය.

"මා නැඳින?" තරුණයා වේගයෙන් ප්‍රශ්න කෙළේ ය.

මී ළඟට සුදුසු පිළිතුර දෙන කල, එයින් බලවත් අප්‍රසන්නයක් හට ගැනෙන බව දත් හෙයින් මාලනී නැවතත් නිසොල්මන් වූවා ය. තරුණයා වෙහෙසන්නට ද, ඇ නො කැමැත්තී ය. ඔහු කෙරේ බැඳී පවතින බලවත් ප්‍රේමය නිසා ඔහුගෙන් වෙන් වෙන්නට ද ඇයට හැටියක් නැති- ඇයට ඔහුගෙන් වෙන් වීම මාරයා හා එක් වීම වැනි භයානක විපතකි. එ සේ ද වුව, ඇ මෙසේ කියන්නට වූවා ය.



"එපා! එපා! මහත්මයා, මට විවාහ යෝජනාකරන්න එපා! අපි මේ මෝඩකම මෙයින් නවත්වමු. එය නවත්වන්න බැරි තැනකට අප තව ම ඇවිත් නැහැ. මේ තෙක් මහත්මයා වැඩ කෙළේ, මහත්මයා කවුද කියා නැඳිනයි. මං වැඩ කෙළෙත් මා කවුද කියා නැඳින යි. මේ තියහට මහත්මයා ගේ ඔළුවත් නරක් වුණා- මගේ ඔළුවත් නරක් වුණා- දන් මට ඇත්ත ඇති හැටියට පෙනෙද්දී මහත්මයා මේ පිස්සුවෙන් කරන යෝජනාව පිළිගෙන මහත්මයාට පාඩු කරන්න මා කැමති නැහැ. සමහර විට මේ තියග පසු වුණු හැටියේ ම, මහත්මයාටත් මා හා විවාහ වුණේ පිස්සුවෙන් බව දනෙන්න පුළුවනි. එතකොට මහත්මයාගෙන් මට සුළු සමාවක් ලැබෙන්නේ නැහැ"යි ඇ කීවා ය.

"මාලිනී, පිස්සුව මට නො වෙයි ඔබටයි" කියමින් තරුණයා සරුම් සිනාවකින් මුව සරසා ගෙන, "ඔබට මේ ගැන සිහි වෙලා තිබෙන්නේ දනුයි. එහෙත් මං මේ ගැන කල්පනා කරලා ඉවර යි. ඔබ මට හොඳ නැතුවා නොවේ යි. මාලිනී, ඇත්ත නම්, මා ඔබට හොඳ මදි- ඔබ සුදුසු මා වැන්නකුට නො වෙයි, දෙවියකුට යි. හා! ඔබේ අගය ඔබට පෙනෙන්නේ නැහැ. ඔබට දනෙන්නේ නැහැ. ඔබ දන් කැලයට පායාපු හඳ වගෙයි. ඔබ මගේ කැලෑ හඳ! ඔබ මීනෑ ඔබ නුවර හඳක් කරන්න යි. ඒ නිසා සිදේවී ඔය අනම්-මනම් අල්ලා දමා මා කියන්නට එකඟ වෙන්න" ය යි කියමින් ඇය වැලඳ ගන්නට සැරසුණේ ය.

"එපා! එපා! මහත්මයා," කියමින් මෙහි දී, මාලිනී හිස අහකට හරවා ගෙන තරුණයාට පෙර උන් හැටියට එ තැන වාඩි වෙන්නට නියම කොට, නොයෙක් දෙය කියන්නාට පටන් ගත්තා ය. ඇ ඔහුට ඉතා හිතවත් මවක මෙන් ද අවවාද කළා ය. ඔහුගේ පොහොසත් කම ගැනත්, වැදගත් කම ගැනත්, මතක් කර දුන්නා ය. ඔහුගේ නෑ සියන් ගැනත්, මෙහි දී කල්පනා කළ යුතු බව කීවා ය.

"ඔබට දත් ද මාලිනී, මා ගැන මේ ඔක්කෝ ම පෙනෙන්නටත්, සිතෙන්නටත් පටන් ගත්තේ?" කියමින් ඒ සියල්ල ඉවසිල්ලෙන්

ශ්‍රවණය කළ ජයපාල වේගයෙන් ප්‍රශ්න කොට, "ඔබ ඇත්ත වසන් කරන එක බොහොම වැරදියි. ඒක ඔබේ නුගත් කමත්, නොහික්මුණු කමත් පිටිසර කමත්, නිසා කෙරෙන වරදක්- කියන්නට තිබෙන දෙය ඉදිරිපිට කියා පෑම තමා වැදගත් කම. එතකොට ඇත්ත නැත්ත විමසා ගතැකි. කවදාවත් නැතිව, ඔබ අද දොම්නසින් පසු වන්නේ, මොකක් නමුත් කලකිරීමක් ඇතිව යි. නො අනුමානයෙන්. එය මා නිසා ඇතිවූ කලකිරීමක් වෙන්නට ඕනෑ. කියන්න මොක ද ඒ?" යනුවෙන් වැඩි දුරටත් ඇසුවේ ය.

මාලිනියගේ මුහුණේ, මෙ වෙලේ මතු වූ සරදම් සිනාව ම ජෝන් ජයපාලට වැදුණු මරු පහරක් මෙන් විය. දෙ නෙත් අඩවන් කොට, ඔහු දෙස යටැසින් බලා, නැවත අහක බලා ගෙන ඈ මෙ සේ කීවා ය. "මා නම් නො හික්මුණු කෙල්ලක තමා- නුගත් පිටිසර කෙල්ලක තමා- මෙතෙක් ඇත්ත කතා නො කෙළේ, ඒ නිසා යි. දැන් ඉතින් මං ඇත්ත කතා කරන්නං. මහත්මයා පොහොසතකු බව දැන ගෙනත්, කුලවතකු බව දැන ගෙනත්, උගතකු බව දැන ගෙනත්, නාගරිකයකු බව දැන ගෙනත්, මහත්මයාට මා ප්‍රෙම කෙළේ, මිනිහෙකැයි සිතා ගෙනයි. මිනිහකු කෙරෙහි නම් කුමකින්-කුමක් වුවත්, ගැහැනියකට විශ්වාසය තබන්නට පුළුවනි. දැන් බලන කොට, පිටිසර අපට බැහැ, උගත් වැදගත් නාගරිකයන්ය කියන ලොකු ලොක්කන් කරන රැවටිලි වැඩ කරන්න-"

"ඇත්තෙන් ම මාලිනී, මට පුදුම යි. ඔබ මේ කාගේ පාරේ ද එළ වන්නේ?" කියමින් ජයපාල ඉස් පාසු නැතිව, කෑගැවේ ය.

"මා එළ වන්නේ, ජෝන් ජයපාල කියන මහාජන සේවකයා පාරෙයි- ජෝන් ජයපාල කියන දේශපාලකයා පාරෙයි. ජෝන් ජයපාල ලෝකයාට පෙන්වන්නේ, ආදර්ශවත් චරිතයක් ඇති තරුණයකු හැටියට යි- එහෙත් ලෝකයාට පෙනෙන ඇත්ත එ සේ නොවෙ යි."

"මාලිනී"



"එව් මහත්මයා" කියා, ඈ ඔහු දෙසට මුහුණ හරවා, "කියන්නට තිබෙන දෙය ඉදිරි පිට ම කියා පෑම තමා වැදගත් කම. මහත්මයා පසු ගිය සතියේ අමද්‍යප රැස්වීමක මූලාසනය ගත්තා නො වේ දැයි?" යළිත් ප්‍රශ්න කළා ය.

"ඔබ මේවා දන්නේ කොහොම ද මාලිනී?"

"ඒකේ වගක් ඕනෑ නැහැ. අමද්‍යප වැඩ කරන මහත්මයා, මද්‍යයෙහි පිහිනන මී මැස්සකු නම්- මහාජන සේවාව කරන මහත්මයා, ලොවට සූදුව පුරුදු කරන, රේස් කාරයකු නම්-"

"ඇති, ඇති, මාලිනී! ඔය කටුක දෙශනාව නවත්වන්න! ඔය විදියට නම් තරුණයකු සොයන්නේ. ඔබට බඹ ලොවින් වත් පුරුෂයකු සොයා ගන්නට නොලැබේවියි"යි තරුණයා ඇය නිශ්ශබ්ද කරන අදහසින් කීයේ ය.

"එ සේ නම් බඹසර රැකීම වඩා හොඳය"යි කියමින් ගල් කුළට හිස දී, ඈ ඉකි ගස-ගසා හඬන්නට පටන් ගත්තා ය.

තරුණයා එකෙණෙහි ම එතැනින් නැගිට, උර-උරා සිටි සිගරැට් වැටිය ගල උඩ දමා, පයින් පාගා පොඩි කොට, ගල් ඇඳෙන් පහතට බැස්සේ ය. තමාගේ අමද්‍යප සේවාව ගැනත්, මහා ජන සේවක ව්‍යාපාරයන් ගැනත්, රේස් ක්‍රීඩාදිය ගැනත්, ඇය දැන ගෙන තිබෙන්නේ, කෙසේ ද යන්න ඔහුට සලකා ගත නො හැකි යි. කැකෑරෙන පැන් තලියකින් මුව නිමිත්ත බලන්නට කරන වෑයමක් මෙන් නිරර්ථකවූ පරිශ්‍රම ඇත්තේ, මාලිනියගේ නො සන්සුන් සිතින් සෝක තැවුලිය හැර ගන්නා තෙක් ඉවත්ව යෑම මැනවැයි සිතා, ඔහු ගල් ඇංද සිසාරා, අනෙක් පැත්තට යන්නට ගියේ ය.

මේ ගල් ඇංද ගොඩ බිම හා මඩ බිම යා වන සීමාවේ මුල්ලක පිහිටියේ ය. එ දා මාලිනිය නැව ලිඳ ද ඇත්තේ ඊට නුදුරින්ම ය. ගල් ඇංද පිටිපසින් වෙල යායේ, දිය අගල අයිනේ, දිගට ම ගොඩ බිමින් ගම් මැද්දට වැටුණු අඩි පාරක් ද ඇත- ජයපාල

කල්පනාවෙන් බරවූ හිසින් යුතුව, කටේ රුවා ගත් අලුත් සිගරැට් වැටිය පත්තු කර ගැනීමට වත් මතක නැතිව, මේ අඩි පාර දිගේ හෙමින් හෙමින් ගියේ ය. මේ කළු ගල් ඇ◌ංද දිගින් අඩි පනහක් පමණ ඇත- උසින් ඉතා ම අධික තැන, අඩි දහයකට වැඩි නොවේ. මේ ගම්මුන්හට එ තරම් සැලකිය යුතු තැනක් නො වන නමුත්, ජයපාලට නම් ඉතා ම සිත්කලු ය. හිතවතියක හා පිළිසඳර කතාවට මේ හරියෙන් මීට වඩා හොඳ තැනක් තවත් සෙවිය නො හැකියි. මීට ගොඩ වුණු කල්හි පෙනෙන අවට වෙල්යාය හා රබර් වතු යායත්, නෙත් සිත් දෙකට විශ්‍රාමයකි. එදා පොලිස් කාරයාගේ සැහැසි කම්වලින් මාලිනිය හා ඇයගේ සීයාත්, අන්දාත්, ජයපාල විසින් මුදා ගනු ලැබුවේ ද මේ තැන්හි දීම ය. එදා මාලිනිය වෙනුවෙන් පොලිස් කාරයාට අන්දා කැප වුණේ ද, තමා සැඟවී සිටි මේ ගල් ඇ◌ංද පසු පසින් පැමිණීමෙන් ය. එ හෙයින් ජයපාල මෙ තැන, ජය බිමක් සේ සිතා හැම දිනක ම පාහේ මාලිනිය සමග පිළිසඳර කතා පිණිස මෙ තැනට එන්නේ ය. එහෙත් සිරිත් ලෙස ගල් ඇ◌ංද පිට වාඩිවී සිටිනු විනා, එහි පශ්චිම භාගයට යන්නට ඔහුට අද මෙන් කිසි ද වුවමනාවක් නොවී ය.

පසු පසින්, මේ ගල් ඇ◌ංද එක ම බිත්තියකි. ඉබේ පිහිටි තාප්පයක් මෙන් දිගට ම පෙනෙත්, මෙහි හරි මැද්දට වෙන්නට ඇතුළට කා වැදුණු, තරමක් ඉඩපාඩු ඇති, කුඩා කටකින් යුත් ගල් ගෙයක් වන් වළක් ද තිබේ. ජයපාල, සිගරැට් වැටිය පත්තු කර ගැනීමට මෙ තැන නතර විය. සුළඟ බලවත් බැවින් පළමු වන ගිනි කූර නිවුණේ ය. දෙ වන ගිනි කූර ගහන්නට පළමු ඔහු ආවරණයක් සොයනු පිණිස අඳුරු ගල් ගෙයට නැඹුරු විය. එවිට එයින්, තිගැස්සුණු ගැහැනියකගේ අදිසි හැඬීමක් වැනි රාවයක් නික්මිණි. ඔහු පුදුමයෙන් පසු බා සිට නැවත එහි නැඹුරු වී බැලුවේ ය. එවිටමේ ගල්ගෙයි ගැහැනියක සැඟවී සිටිනුවා ඔහුට දකින්නට ලැබිණි.

“බැහැපන් එළියට, උඹ මොකද කරන්නේ, මෙ තැන?” කියා ජයපාල තර්ජනය කළේ ය.



ඇය සැඟ වී සිටියේ, කිසි යම් අභිප්‍රායයක් ඇතිව බව ඔහුට නිරූපයෙන් ප්‍රත්‍යක්ෂ විය. නැතහොත් එය නිකරුණේ කෙනකුට ලගින්නට හෝ විවේකයෙන් පසු වන්නට හෝ තැනක් නො වේ. ඈ එළියට ආවා ය. ඕ තොමෝ කිලිටි කම්බායක් හා කිලිටි කොපුරුත්තුවක් හැඳ ගත්, විසුළු නැහැයකින් විරූප වූ කළු මුහුණින් හා පුළුටු හිසකින් ද යුත්, දොර කඩක් හා කඩුලු දෙකක් වැනි කටකින් හා දෙනෙතකින් යුත්, මැද වියෙහි සිටි, එ හෙත් රාවට ගිය ගැහැනියකි.

“මට මතක යි. මීට පළමු උඹව දක්කා- ඒ කොහේදී ද? කියාපන්”යි ජයපාල නැවතත් තර්ජනය කෙළේ ය.

ගැහැනිය කතා නැතුව මහපටැඟිල්ලක් විකා-විකා, බිම බලා ගෙන සිටියා ය.

“මොක ද උඹ කතා නො කරන්නේ? කතා කරපන්”යි ජයපාල නැවතත් තර්ජනය කළේ ය.

එහෙත් ස්ත්‍රී, කතාවක් නැතිව, පළමු පරිද්දෙන් ම සිටියා ය. ජයපාලගේ අතියම් තර්ජන ස්වරයෙන් අවදි වූ මාලිනිය ද ශෝක චිත්තය යටපත් කොට ගෙන, ගල් ඇ◌ංදෙන් බැස, එ තැනට පැමිණියා ය. ගැහැනිය දුටු හැටියේ මාලිනියගේ මුහුණ ද වෙනස් විය.

“මොකද සිළිඳු, උඹ මෙ තැන කරන්නේ?” කියා මාලිනී තරහයෙන් ප්‍රශ්න කළා ය.

“හා! තම කියන කොට යි, මට මතක් වුණේ” කියමින් ජයපාල මෙහි දී උදහස් වෙමින්, “මා එදා ලොකු උන්නැහේ එක්ක කතා කරන කොට, උඹ නොවේ ද, හුනු විටක් ඉල්ලා ගෙන, එහාට ආවේ?”යි නැවතත් ප්‍රශ්න කළේ ය.

සිළිඳු තව මත් කිසි කතාවක් නැතිව තම විසුළු නැහැය පෙන්වන්නට නො කැමැත්තෙන් මෙන් බිම බලා ගත් වන ම

සිටින විට, මාලිනී සමීපයට ගොස්, හෙමින් උරය අලවා, ඇය ගම් ගොඩ දෙසට හැරෙවුවා ය. "පලයන්! ගම් මැද්දට ගිහින් කියාපන්, උඹේ හොරය අද අහු උණාය කියා. උඹලාට ඉතින් කරන්න පුළුවන් මෙහෙ ම කේලම් විකුණා ගෙන රැකෙන එක තම යි. ඉතින් හොඳ හිතින් ඇහැට නො පෙනී පලයන්"යි ඈ කීවා ය.

සිළිඳු පිය නග-නගා, හෙමින් මදක් තැන් ගොස්, නැඳින පුරුදු ගමනින් පසු නො බලා යන්නට පටන් ගත්තා ය. ඇය නො පෙනී ගියාට පසු, ජයපාල නො ඉවසිල්ලෙන් වට-පිට බැලුවේ ය- තොප්පිය හිසෙන් ගෙන, ගල් ඇඳ උඩ තබා හිස කැසුවේ ය. මේ ගැහැනිය මෙ සේ හැම දාම ඇවිත් ඔවුන් කියන කරන දෙය රහසින් අසා ගෙන තිබෙන බව මාලිනියට මෙන් ම ජයපාලට ද පැහැදිලි විය. පිරිමියකුට නම් මෙහෙ ම තැන දී ජයපාලගෙන් ඔහො ම ලෙහෙසියෙන් යන්නට නො ලැබේ.

"මට මතක යි. මාලිනී, මැයට නො වෙ ද, විදුලි කම්බිය ය කියන්නේ?"යි සිළිඳු ඇසෙන තෙක් මානෙන් ඈත් වූ කෙණෙහි ජයපාල ඇසුවේ ය.

"ඉස්සර නම් විදුලි කම්බිය මැ විතර යි. දැන් එහෙ ම නො වෙයි. මුළු ගමේ හැම තැන ම ටැලිගරැම් කන්තෝරු" යයි මාලිනී ද අහක බලා ගෙන කීවා ය.

ඉන් පසු ඔවුනතර දෙ බස මඳකට නතර විය. සිළිඳුගේ පැමිණීම කරණ කොට ඔවුන් සිත් සතන්හි අමුතු අදහස් පහළ වෙන්නට පටන් ගත්තේ ය. මේ තරුණයා නො ලැබුණොත් තම සීයාට වත්, තමාට වත්, ගමේ වෙහෙසෙන්නට නම් ඉඩක් නො ලැබෙන බවත්, ගමේ මිනිසුන්ගේ කට හැකර කටුක ඇනුම් පද වලින් බේරෙන්නට නම්, දැන් ඇය විසින් කට යුතු, තරුණයා හා විවාහ වීම පමණක් බවත්, එ හෙයින් තරුණයා ප්‍රතික්ෂේප කිරීමට දැන් ප්‍රස්තාවය නොවන බවත්, ඈ කල්පනා කළා ය. ජයපාල තරුණයා ලෝකයෙන් ඉතා ම නරක බේබද්දා වූණා



වේ- ඉතා ම නරක සූදු කාරයා වූණා වේ- ආවාහයට පැමිණි විත දිනකින් තමා පලවා හැර දමා, අන් කුල කාන්තාවක සොයන අසත්පුරුෂ වසලයා වූණා වේ- ඔහු නොලත් විට ගමෙන් අසන්නට වන කටුක ඇනුම් පදවලට සම කරන කල, එයින් වන විපත සැලකිය යුත්තක් සේ දැන් ඇයට නො පෙනේ. ඇයට මත් පැන් බොන්නා බේබද්දෙකි. පරදු තබන්නා සූදු කාරයෙකි. බේබද්දා විළි බිය දෙකින් තොර බවත්, විළි බිය නසනු පිණිස මත් පැන් පානය කරන බවත්, එ හෙයින් වෙරි මත සිඳෙන-සිඳෙන කල් බලා, විළි බිය දෙකට ඉස් මතු විය නො දී, නැවත-නැවත මත් පැන් ම පානය කරන බවත්, ඇය දන්නා පැත්තකි. ප්‍රකෘති සිහියෙන් පසු වීම බේබද්දාට නම් අපායකට බඳු ය. එ විට ඔහුට අනාගතය පෙනෙන්නේ ය- ප්‍රමාදය කරණ කොට නෂ්ට ප්‍රාය ධනය ද, ශරීර සුඛය ද, ආත්ම ගෞරවය ද, පෙනෙන්නේ ය. ඉතින් එය මතක නැති කිරීමට නම් ඔහු දන්නා එක ම උපායය නැවත වෙරි මතින් පසු වීම පමණකි. එ හෙයින් බේබද්දා ඇයගේ කල්පනාවේ හැටියට පරමාශොධ්‍ය පුද්ගලයෙකි. සූදු කාරයා ගැන ඇයගේ කල්පනාව ඊටත් දරුණු ය. සූදු මතය, අන් සියලුම දෙය මතක නැති වේ. වෙනෙකක් තබා, කුස ගින්නට ගන්නා ආහාරය ද, සූදු කාරයාට මතක නැති වේ. ඔහු නිරන්තරයෙන් ම හීන වූ කුස ගිනි ඇත්තෙකි- මන්දාහාරයෙන් යැපෙන්නෙකි. ඔහු කුටුම්බ ප්‍රේමයෙන් තොර වූවෙකි. අඹුවන්ගේ හෝ දරුවන්ගේ දුක-සැප නො බලන්නෙකි. එ හෙයින් සූදු මතය, සුරා මතය, වැනිවූ ම නොහොත් වඩාත් දරුණුවූ ම, අපරාධයක් ලෙස මාලිනී කල්පනා කරන්නී ය. ඒ අතර ම ජෝන් ජයපාල මේ දුශ්චරිත ද්වයෙහි කොටි ප්‍රාප්ත වූ, අන්ත දූෂකයෙක් ද යන්න ඇයට සැක සහිත ය.

මාලිනියගේ අස්ථාන භීතියට ස්ථානය වූ භූමිය තරුණ ජයපාලට දැන් දැන් නො තේරෙන්නේ නොවේ. තමා නො දනිතත්, තමාගේ ජීවිතය පිළිබඳ ප්‍රසිද්ධාප්‍රසිද්ධ උභය පක්ෂයෙහම වූ ව්‍යාපාර විශ්ලේෂයෙන් ඇයට නො රහසක් බව ඔහුට දැන් නො පෙනෙන්නේ ය. ලෙශ මාත්‍ර වූ ප්‍රමාද දොෂයෙක් පවා ඇය චිත්ත

දූෂ්‍යයට පැමිණෙන කෝමල හෘදයක් ඇත්තියක බව පැහැදිලි හෙයින් ඇයගේ සිතේ සැකය දුරු කොට, ඇය සනසන්නට ඔහු කල්පනා කළේ ය. ප්‍රේමාවනද්ධ වූ කල්හි ජෝන් ජයපාල ප්‍රිය පුද්ගලයෙකි. ඔහු ප්‍රිය තෙපුලෙන් කතා කොට මෙසේ කියන්නට විය. "මාලිනී ඔබට මගේ ඇති ප්‍රේමය කවදාවත්ම නැසෙනවා ය කියා හිතන්න එපා. අන් හැම දෙයකින් ම මගේ චපල කම් දක් වුණත්, මේ ප්‍රේමයෙන් නම් වෙනසක් වේ ය කියා නො සිතන්න. මගේ මත් පැන් බීම ගැන ඔබ දන ගන්න ඇත්තේ පත්තෙන් වෙන්න ඕනෑ. මං, ඔබ ඔය හිතන තරම් ලොකු බේබද්දෙකු නොහොත්, සූදු කාරයකු නොවෙයි. රේස් එළවීම තමා මගේ ප්‍රධාන සූදුව. ඔබ මේවා ගැන දන ගෙන ඇත්තේ, පත්‍ර කියවීමෙන් වෙන්න ඕනෑ. සිංහල පත්‍ර මේ තරම් විස්තරයෙන් ප්‍රවෘත්ති දෙන බවක් මං දන්නේ දැනුයි. මේ ජන නායකයන් ය කියන්නන්ගේ හුනක් වැරදි තිබෙන එක ඇත්තයි. ඒ වැරදි සිංහල පත්‍රයෙන් පෙනෙන කොට, බොහො ම ලොකු වෙලා පෙනෙන එකත් ඇත්ත යි. සිංහලයා ආදර්ශවත් චරිතයක කිසි ම අඩු-ලුහුඬක් ඉවසන්නේ නැහැ. මිනිස් සිතක දුබල කමට කිසිම අනුකම්පාවක් පෙන්වන්නේ නැහැ. හොඳයි, මාලිනී, මා මෙ තැන් සිට, ඔබේ හිතේ හැටියට පුළුවන් තරම් හොඳ උපාසකයකු වෙන්නට බලන්නම්, මා විශ්වාස කරන්න." කියා ඔහු ඇයගේ අත අල්වා ගත්තේ ය.

මාලිනී ද තවත් කතා නැතිව, කර බා ගෙන සිටියා ය. තරුණයා ස්වල්ප වේලාවකට පසු නැවතත් කතා කරමින්, "මේ සංචු කළා මදැ මාලිනී? ඉතින් සවස් වුණා- අපි යමුයි" යෝජනා කළේ ය. ඊට එකහවූ තරුණි, තරුණයා සමග හෙමින් හෙමින් ගෘහාභිමුඛව ගමන් කළා ය.

# 9

සමන්ගිර නිතර මංගල ශ්‍රීයෙන් බබළන ස්ථානයකි. උසස් දෙපස් ඇති, උසස් සමාජය ප්‍රිය කරන, උත්තම කාන්තාවක් වූ ජයපාල මැතිණි, ඉදිරි පත් විය යුතු කිසි කටයුත්තක දී අවලංගු න්නට හෝ පසු බසින්නට හෝ නො සිතන්නී, ප්‍රීති ප්‍රමෝදයත්, ප්‍රිය සම්භාෂණයත්, සලකා ප්‍රස්තාවයක් ලත් විට, උත්සව පවත්වන්නී ය. මේ උත්සවයට ඇයගෙන් ආරාධනයක් නො ලබන ජන නායකයෙක්- පඬිවරයෙක්- ධනපතියෙක්- ශ්‍රේෂ්ඨ ංතියේ නිලධාරියෙක්- පඬිවරයෙක්- ශිල්පියෙක්- නො වන්නා හ. සමන්ගිරෙන් ආරාධනයක් ලැබීම ඇතැමකුගේ ගෞරවයටත් ඇතැමකු ගේ ප්‍රීතියටත් කාරණයකි. අමද්‍ය ප්‍රචාරයෙහි නියැලි සේවක පක්ෂයට නම් සමන්ගිරෙන් ලැබෙන ආරාධනය තමනට රන නිග්‍රහයක් සේ නිතර පෙනෙන්නේ ය. කවර හෙයින් ද යත්, ජයපාල මැතිණිය, විශේෂයෙන් ම උත්සවයක දී ආගන්තුක සංග්‍රහය මත් පැනින් තොර නො කරන බව ඔවුන් දන්නා හෙයිනි. ජයපාල මැතිණි සැක පුරුවම කැමති වුවත්, මසුරු කම නො කැමැත්තී ය. එ හෙයින් උත්සවයක දී මත් පැනින් අමුත්තනට සංග්‍රහ නො කිරීම ගුණ ධර්මය පිට ලා, ලෝබ කමෙන් ලොව රවටන ඇතැම් බොරු සිල්වතුන් අනුගමනය නො කොට, අමද්‍යප ප්‍රචාරය ඉතා බලවත්ව පැවැත කාලයේ පවා, ඕ තොමෝ මත් පැනින් කරන සංග්‍රහය අත් නො හළා ය. ජෝන් අමද්‍යප සේවකයකු වුව ද මද්‍යයෙන් නො වැළකුණු හෙයිනුත්, සිය මිතුරන්හට සිත් සේ මත් පැනින් සංග්‍රහ කිරීමට ප්‍රස්තාවය ලබන හෙයිනුත්, කිසි විටකත් මැණියන්ගේ මේ හිතු මතයට විරුද්ධ නො විය. මෙ සේ අමුත්තන්ට මත් පැනින් සංග්‍රහ කළ පමණින්,

ජයපාල මැතිණිය මත් පැන් ප්‍රිය කළායයි නො සිතිය යුතුය. ඈ කිසි කලකත් කිසිවකුගෙන් මත් පැනින් සංග්‍රහයක් නො ලැබුවා ය. එ මෙන් ම, කිසි කලකත් ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ හෝ මත් පැන් පානය නො කළාය. "මා නම් මත් පැන්වලට විරුද්ධ යි. ඉතින් එයින් සංග්‍රහ විඳිනු කැමැති අයට සංග්‍රහ කරන්නට හැටියක් නැති වෙන කොට මගේ හිතට බොහොම අමාරු යි" මේ ඈය නොයෙක් විට අවංක සිතින් කී දෑ ය.

එහෙත් සමන්ගිරට මත් පැන් නො ගත් එක ම ප්‍රස්තාවය- එ නම් ගෞර පුර මහා රාජා සහ පිරිස පිළිගැනීම වශයෙන් පවත්වන මේ උත්සවය පමණකි. මේ ප්‍රස්තාවයට ද සෙසු නොයෙක් ප්‍රස්තාවයනට මෙන් ම, සමන්ගිරට මහත් පිරිසක් පැමිණියහ. සමන්ගිර හා භූමිය ද දර්ශන සම්පන්න ස්ත්‍රී පුරුෂයන්ගේ ආශ්‍රයට යෝග්‍ය වන පරිද්දෙන් නානා වර්ණවත් විදුලි එළියෙන් හා නොයෙක් විසිතුරු මල් කම් හා ලිය කම් වලින් ද බබළන්නට විය. උද්‍යානයෙහි තැන-තැන, පණ වන ලද අසුන් වල, වාඩිගත් සිය ගණන් අමුත්තන්ගේ සුව විහරණය සලසා, නොයෙක් දෙය රැ ගත් මෙහෙකරු පිරිසක් ද කඩිසරව හැසිරෙන්නට වූහ. පෙර-අපර දෙ දිග, සංගීතයෙන් වරින්-වර උත්සවය ප්‍රාණවත් කරන ලදී- රසවත් කරන ලදී. ගෘහ මූලිකයන් වශයෙන් ජයපාල-මැතිණී ද, එම පුත්‍රයා ද, අමුත්තන් පිළිගනිමින්, සමස්ත උත්සව ශ්‍රීයට සාදර ලක්ෂණය පෙන්වමින්, වෙන දා මෙන්ම, ඉතා උනන්දුවෙන් හැසුරුණා ය. මෙහි පැවැති එක ම අමුත්ත, මත් පැන් නැති තවත් මත් පැන් නිසා ඇති වන කලබලය නැති කමත් පමණකි.

මේ අදිසියේ සමන් ගිරට මත් පැන් එපා වුණේ, මන්ද යන්න පැමිණි අමුත්තන් අතර පමණක් නොව, පත්‍ර වාර්තාකාරයන් තුඩ-තුඩ ද, පැවැති ප්‍රශ්නයකි. සම්පූර්ණයෙන් ම මත් පැනින් වැළකුණු ජෝන් ජයපාලගේ බලවත් ඉල්ලීම නිසා, සමන්ගිර මෙ සේ අමද්‍යප වූ බව, ජයපාල මැතිණී කීවා ය. ජෝන් වැළකුණේ, මත් පැනින් පමණක් නො වේ. හේ රේස් ක්‍රීඩාව ඇතුළු සෙසු



නොයෙක් දූ කෙළියෙන් ද, වැළකුණේ ය. තම රේස් අස්සයන් ද ඉස්තාලය පිටින් ම විකුණා දැම්මේ ය. ජෝන් කෙරේ, මෙ බඳු බලවත් වෙනසක් පහළ වෙන්නට කාරණය කිම? මේ සම්බන්ධයෙන් නොයෙක් නො නොයෙක් මත පහළ කළහ. මේ අමද්‍යප සේවාවට දක්වන ලද අවංකාදර්ශයකැයි කෙනෙක් කීහ. රාජ මන්ත්‍රණ සභාවට පැන ගන්නට ජෝන් බඳින වෙස් මුණකැයි තවත් සමහරෙක් කීහ. ක්‍රීඩාවෙහි විදග්ධ වූ චංචල වූ සිත් ඇති, ජෝනගේ පරණ පුරුදු මිත්‍රයෝ, මෙය ජෝන්හට උපහාස කිරීමට සුදුසු ප්‍රස්තාවයක් කොට ගත්හ. "තවද්ද ජෝන් ඔබ සිල් සමාදන් වුණේ?" යනුවෙන් එකෙක් පිටට පහරක් ගැසුවේ ය. "ඉස්තාලය පන්සල කර ගෙන, කෙස් පිටින් වස් නො සිටියේ මන්දයි?" තවෙකෙක් ඇසුවේ ය. "අප මෙහි ගෙන්නුවේ, මේ ඇල් වතුර පොවා ලා මරන්නද යි?" තුන් වැන්නෙක් ඇසී ය.

ඔවුනට උපස්ථායකයා තමා බැවින්, ජෝන් මේ සියලු අතවර සන්සුන් සිතින් ඉවසුවේ ය. එහෙත් ඔහු, තමා මේ දුශ්චරිතද්වයෙන් වැළකෙන්නට කාරණය මෙ යයි කිසිවකුටත් නො කීවේ ය. "මේ ගැන ඕනෑ කෙනෙක් ඕනෑ දෙයක් තමන් කැමති පරිද්දෙන් සිතා ගනිත්වා!" යයි ඔහු කර බා ගෙන සිටියේ වී නමුදු, දෙ තුන් පැයක් ගත වන ගමන් ඇත්ත ඇති සැටියේ දන ගත්තන්ගෙන් ද, එ තැන, නො සිස් බව ඔහුට පෙනිණි. "ජෝන්, ඔබ බී ම යි, රේසුයි අත් හැරියේ, පිටිසර කෙල්ලකගේ කීමට ය, කියා ආරංචියි. අනේ! ජෝන්, එහෙ නම් කියන්න. ඒ කෙල්ලට මටත් කියන්වෙයි කියා, මේ දුසිරිත්වලින් වැලකෙන්න" යනුවෙන් පවසන්නක්, තම යහළුවකුගේ කටින් නික්මුණු හැටියේ, ඔහුගේ මුහුණ දං ගෙඩියක් මෙන් කළු විය. "ඈය මායා කාරියක වෙන්න ඕනෑ ජෝන්, ඔව්, ඔව්, පිටිසර බඳ පලාත්වල, මහ නපුරු කොඩිවින කාරයන් ඉන්නවලු. දූප්පත් ජෝංට හැබෑ ම ඉතා බෙහෙතක් තමයි, හැවිලා ඇත්තේ." කියා, ඒ එක්ක ම, තව යහළුවකු කරන පරදමක් ද ශ්‍රවණය විය.

තමාටත් මාලිනියටත්, පමණක් විශේෂ වූ මේ රහස, දන් ලෝකයාට රහසක් නො වන බව, ජයපාල දන ගත් ඇසිල්ලේ

පුදුමයෙනුත් පුදුමයට පැමිණියේ ය. මේ රහස, මෙ සේ ප්‍රසිද්ධියට පැමිණියේ, කෙසේ ද? සිළිදුගෙන් විය යුත්තක් සේ පෙනුණේ ද නමුදු, සිළිදු හා මොවුන් අතර, කිසි ම සම්බන්ධයක් නො පවතින බැවින් ඝේ ද ඇදහිය නො හැකි ය. මේ උත්සවය අවසන්වන්නට පළමු මේ රහස හෙළි පෙහෙළි වූ සැටි කෙසේ නමුත් දත ගත යුතුම ය යි ඔහු සිතුවේ ය.

මිත්‍රයන් කරන මේ නපුරු කවට කම් තවත් ඉවසා ගත නො හැකි වූ තැන, ජෝන් ජයපාල ඔවුන් කෙරෙන් ඉවත්ව මහා රාජා ප්‍රමුඛ පිරිසට එකතු විය. ගෞර පුර මහා රාජා, උස් වූ දෙහයකින් යුත් මහල්ලෙකි. මේ ඔහු විශ්‍රාම පිණිස ලක්දිව පැමිණි ගමනකි. දඹදිව කාන්තා සම්මේලන කොමිටියේ සාමාජිකාවෝ කිහිප දෙනෙක් ද, මේ පිරිසට ඇතුළත් වූහ. මේ මහා රාජා, ලූවී ජයපාල මහතාගේ- එ නම්, ජෝන්ගේ නැසී ගිය පියාගේ- මිත්‍රයෙකි. ලූවී ජයපාල මහතා ඉන්දියාවට ගිය ගමනක දී මේ මහා රාජාගෙන් නොයෙක් ආගන්තුක සත්කාර ලබන ලද හෙයින්, ඊට කෙලෙහි ගුණ සලකන ජයපාල මැතිණි, මෙ සේ උත්සවයකින් මහා රාජා පිළිගත්තා ය.

මේ පිරිස කැටුව, ගත කල කාලය ජෝන්හට ලොකු සැනසිල්ලක් විය. භාරත කාන්තාවන්ගේ වර්තමාන ප්‍රබෝධයට, වැදගත් රුකුලක් වශයෙන් ගැණෙන නවදිල්ලි පුර, තාරා දේවියගෙන්, විශේෂයෙන් ම භාරතීය ප්‍රතිසංස්කරණයන් සම්බන්ධයෙන් නොයෙක් දේ ප්‍රකාශ විය. තාරා දේවී නවීන ස්ත්‍රී පක්ෂය ගැනත්, දෙරු විවාහ චාරිත්‍රය ගැනත්, බහු භාර්යා ප්‍රශ්නය ගැනත්, කථා කළා ය. ඒ සියල්ල ගැන ඇය කථා කරන විට, ශ්‍රවණය කාහටත් ප්‍රිය වී. ඈ හින්දු කාන්තාවක් වුව ද පරණ හින්දු චාරිත්‍ර ධර්මයන්හට විරුද්ධව කථා කළා ය. එහෙත් ඒ කථාවෙහි හින්දු භක්තියට විරුද්ධ වචන මාත්‍රයකුදු නො වී ය. මහා රාජා කතා කෙළේ, ස්වකීය පරපුර ගැන ය. එහි ඉතිහාසය ඔහු විවෘත කොටැ එහි ආදි ම පිතෘවරයා ගැන කීයේ ය- බ්‍රිතාන්‍යයන් විසින් ඉන්දියාව යටත් කර ගන්නට පළමු අසල් වැසි රජුන් හා ස්වකීය මී මුත්තන් කළ යුද්ධ ගැන ප්‍රවෘත්තිය ද කීයේ ය. මෙහි දී තාරා



දේවී, රජුනටත්, රජුන් ගේ පාලන ක්‍රමයනටත්, විරුද්ධව, නොයෙක් මත ප්‍රකාශ කරන්නට පටන් ගත්තා ය. ඒ කථාවෙන් මහා රාජාගේ අදහස් වලට පහර වදින බව දුටු ජයපාල මැතිණි, රූමත් සිංහල තරුණ කාන්තාවක ගෙනවුත්, තාරා දේවියට අඳුන්වා දුන්නා ය. මේ අලුත් කුලඟන දෙස ජෝන් ජයපාල ද ඉතා ඕනෑ කමෙන් බලන්නට විය. මී තොමෝ චක්ෂු මොහනය කිරීමට සමර්ථ මායාකාරියක වන්, අභිරූපවත් කුමාරිකාවකි. තමා නො හඳුනන බැවින් ඒ රූමත් තරුණිය ගැන එක ගොත, ජයපාල තරුණයා මැණියන්ගෙන් විතාළේ ය.

"පුදුමයක් නොවෙයි ජෝන්, ඇහුණා ද? ඔබ වැදගත් මිනිසුන් ආශ්‍රය නො කරන තොට, වැදගතුන් නො හඳුනන එක." යනුවෙන් පවසා, ජයපාල මැතිණි, හුන් තැනින් නැගිට එකී තරුණිය ළඟට ගොස්, "මැ තමා- වෙයි අත්තනායක කුමරි." කියා පුත්‍රයාට හඳුන්වා දුන්නා ය.

අත්තනායක කුමරි ද ගණනපාට නැතිව මෙන් අත දෙනුවා වෙනුවට යම්තමකට ඔහුට අත දී, නැවත තාරා දේවිය හා කතාවේ යෙදුණා ය. ජෝන් ජයපාලට බැල්මකින් හෝ සැලකිය යුතු සංග්‍රහයක් නොකොට, මෙ සේ කර බා ගන්නට සමත් තරුණියක උසස් සමාජයේ සෙවීම ලෙහෙසි කාරණයක් නොවේ. උසස් සමාජයේ පැවතුම්වල හැටියට නම්, ජෝන් ජයපාල කිසි අඩු-පාඩුවක් නැතිව, රාජකුමාර පරිහරණයෙන් වැඩෙන තරුණයෙකි. එහෙයින් ඔහු සිතන හැටියට හැම තරුණියකම, යටත් පිරිසෙයින් අනිමිස ලොචනයෙන් වත් තමා පිදිය යුතු ය. එහෙත් මේ තරුණිය දක් වන අභිමානය ඔහුට කරන අපහාස යකි. ඇය රූමත් නිසා, අහංකාරයෙන් මෙ සේ කළා විය යුතුය යි ඔහු සිතුවේ ය- එ සේ ද වුව, ඇය කෙරෙන් දෙ නෙත් අස් කර ගත නොහැකිව, තව-තවත් එ තැන ම රැඳී සිටියේ ය.

තාරා දේවිය සමග ඇය යෙදුණු සාකච්ඡාව ගැඹුරු, කාරණයක් ඇසුරු කොට ගෙන බව, ඔවුන් කතා කරන සැටියෙන් දක්නා ලැබේ. ඔවුන් තරමට, පහත් හඬින් කෙරුණු සාකච්ඡාවක් බැවින්

ඊට සම්බන්ධ වීමට හෝ ඇහුම් කන් දීමට සෙසු කිසි වෙකුත් නුවූහ. කාතොපාසන ප්‍රජා විද්වද්වරයන් මණ්ඩලයකට මහා රාජා ද එක් වූණේ ය. අනතුරුව, එහි සිටි තවත් අය, වෙන වෙන පිරිසක්-පිරිසක් කෙරේ ආසන්න වූහ. ජෝන් ජයපාල පමණක් සිටි වන ම තුටුරින් සිට ගෙන, අත්තනායක කුමරිය දෙස, බලා සිටියේ ය. මේ තරුණියගේ දෙහ විලාසය පමණක් නොව, ස්වභාවය ද ඔහුට පුදුමයකි. මේ උත්සවයට පැමිණි තවත් බොහෝ තරුණියෝ සිටිති. ඔවුහු තමන් දක්වන අදහසින්, නොහොත් තමන් වෙත අනුන් නෙත් සිත් පැහැර ගන්නා අදහසින් මිථ්‍යා ගතියෙන් හැසිරෙන්නෝ ය. එහෙත්, මේ තරුණිය කෙරෙහි නම්, එ බඳු බොරු වෑයමක් දක්නා නො ලැබේ. ඇයගේ හැසිරීම ඉතා ම ස්වාභාවික ය- අනායත්ත ය- සාමාන්‍ය ය. මේ තරුණිය ඔහු නොතැකුවේ, අභිප්‍රාය වත් අභිමානයකින් ද, නොහොත් අනභිප්‍රේත ප්‍රමාදයකින් ද, යන්න අවිනිශ්චිත හෙයින් උත්සවය අවසන් වන්නට පළමු මෙය ද විමසිය යුතු දෙයක් වශයෙන් සිතට ගෙන, ජෝන් ජයපාල, වෙන අතක යන්නට ගියේ ය.

මෙසේ මේ උත්සවයෙහි දී සමන්ගිර භූමියේ එක එක තැන, එක එක විදියේ, කතා පැවතෙන්නට විය. සමස්ත ලොකයට ම පීඩාවක් වූ වෙළෙඳ පරිහානිය සම්බන්ධයෙන් ද, නොයෙක් උගතුන්ගේ නොයෙක් මතාන්තරයන් ප්‍රකාශයට පැමිණි නමුත්, ජෝන් ජයපාලගේ සිත් සතන් ඒ කිසිවකටත් නොව, නැමුණේ, මාලිනිය හා තමා පිළිබඳ රහස ප්‍රකාශයට පැමිණි ප්‍රභවය සෙවීමට ය. රෑ වෙන්නට-වෙන්නට උත්සවාලංකාරය අනුක්‍රමයෙන් දිදුණු වන්නේ, අන්තස්ථානයට පැමිණ නැවත අමුත්තන්ගේ විසිර යෑම හා සමඟ පරිහානි පක්ෂය භජනය කළේ ය. සමන්ගිරේ ප්‍රධාන මෙහෙකරුගේ කටින්-එනම් ජුසේගේ කටින් "නරලොව හොල්මන්" යන පදය, එක වරක් වත් නො කියැවුණේ මෙ දා පමණකි. මෙ දා වීදුරු බිඳෙන හඬක් හෝ නොවී ය- බීමත් කමෙන් කරන නැටුම් හෝ ගී කීම් හෝ නො වීය- අභිනය දක්වීම් හෝ නොවී ය. වෙන දා මෙහෙකරුවන් ගේ වෑයමෙන් ගෙන ගොස් දමනු ලැබූ ජෝන්ගේ බේබදු මිත්‍රයෝ, මෙ දා නොපමාව සිය කැමැත්තෙන් ම අස්ව ගියා හ.



උත්සවාවසානය දක්වා ම, තමා සොයන ප්‍රවෘත්තිය- එ නම් ත මා පුරා-සුදු අත් හල රහස ප්‍රකාශයට පැමිණි ප්‍රවෘත්තිය- ජෝන් හට දැනගත නොහැකි විය. ඔහු එක එල්ලේ මිත්‍රයන්ගෙන් එය ගැන ප්‍රශ්න නො කළේ ය. වෙරි මතින් පසුවන කල්හි මෙන් නොව, සිහියෙන් සිටියදී විශේෂයෙන් ම කෙළි දෙළෙන් පසු වන මෙ වැනි ප්‍රස්තාවයක දී- ඔවුන් පිළිවිසීමෙන් වෙන්නේ, කාරිය පුරිමැසෙනු වෙනුවට කටට කම් තව-තවත් බලවත් වීම පමණකි. ඔවුන්ගෙන් කියැවුණු යම් යම් අස්කොත් පදවලින් මේ සියලු කටකම්වලට මුල ජෙරී හැරිස් බව ජෝන්හට සලකා ගත හැකි විය.

සමන් ගිරෙන් අන්තිමට පිටත් වූ අමුත්තා ද ජෙරී හැරිස් ය. ඔහු ජයපාල මැතිණියට අන්තිම වාරයටත් ආචාර පවත්වා, අන්තිම වචනයක් කතා කොට, යන්නට යන ගමන් උද්‍යානය මැද දී තරුණ ජයපාලට හමු විය.

"ජෙරී, ඔහොම හිටින්න. මා කැමැති යි, ඔබට වචනයක් කතා කරන්න." කියා ජයපාල ඔහු කතර කළේ ය.

"මොක ද?" කියමින් දුම් කුඩු මිටක් ඇද, ජෙරී නතර විය.

"මා කැමති යි, ඔබට මගුලක් ජෝඩු කරන්න."

"මගේ කාලය දැන් පහු වෙලා-"

"කමක් නෑ, හරි යන ගැනි ලැබුණේ, දනුයි."

"මොන ගැනි ද?"

"සිළිඳු"

ජෙරී හැරිස් නිශ්ශබ්ද වෙමින් බිම බලා ගත්තේ ය. ජයපාල සිගරැට් උගුරක් ගෙන, දුම් රැසක් නිකුත් කොට, සිළිඳු නිකිණියානට විදුලි කම්බිය, කොළඹට විදුලි කම්බිය ජෙරී. සිළිඳු නිකිණියාන ගිහි තියනවා. ජෙරී, කොළඹ ගිහි තියනවා- දෙන්නා එකතු උණොත් රටක් ගිනි ලතැකි"යි වියරු සිනාවකින් යුතුව කීයේ ය.

නීතිඥයා ද වචනයක් වත් නො තෙපලා, ඒ පහර ද කා ගෙන, කර බා ගත් ගමන් යන්ත්‍ර රූපයක් මෙන් යන්නට ගියේ ය. ජයපාල වැනි ගති ගුණ ඇති තරුණයෙකුගෙන් මෙ වැන්නක් ඇසීම ඔහුට එ තරම් කරුණක් නො වේ. ඔහු ජයපාලගෙන් මෙ වැනි පරිභාසයක් ලැබීමට ද, එක් අතකින් සුදුස්සෙකි. ඔහුගේ අදහස් අවංක වුවත්, ඔහු යෙදූ වැඩ පිළිවෙළ නො නිසි හෙයින් තරුණ ජයපාල සම්බන්ධ තිකිණියාන ප්‍රවෘත්තියට විෂම ප්‍රසිද්ධියක් ලැබුණේ ය. ඔහු, එ දා තරුණ ජයපාල හා නො මනාපයෙන් ගලපිටකන්දෙන් පිටත්ව ආවාට පසු, තවත් එහි නො ගියේ ය. එසේ ද වුව, එහි කරන කියන සියල්ලක් නො ලස්ව දන ගැනීමට සුදුසු මාර්ගය, ජෝන් ජයපාලට ද රහසින්, ඔහු විසින් යොදන ලදි.

ඔහු වරින් වර, සමන්ගිරට අවුත්, තමාට ලැබෙන-ලැබෙන පරිද්දෙන්, ජෝන් හා මාලිනිය පිළිබඳ සියලු පුවත්, නොමසුරුව ජයපාල මැතිණිය ඉදිරියේ තබන්නේ ය. කරුණු මෙ සේ හෙයින් ජෝන් සුරා සූදු වැනි දුශ්චරිතයන් දුරින් දුරු කළ රහස නතු වූ පරිද්දෙන් ජයපාල මැතිණී දන්නී ය. නුගත් මවකට නම් පුත්‍රයා හා කලබල ඇති කිරීමට, මෙ වැනි දෙය ප්‍රමාණ වුවත්, ජයපාල මැතිණී තව දුරටත් ඉවසමින්, කිසිත් නොදන්නා තැනැත්තියක මෙන් හැසිරෙන්නී, මේ මාගම් සෝලිය නමැති භයානක අන්තරායෙන් පුතා මුදන උපායයක් සෙවූවා ය. දන් ටිකකට කලින් ඇය ජෙරී හැරිස් සමග සාකච්ඡාවේ යෙදී සිටියේ ද මේ ගැන ම ය. ජෝන්, දන් මාලිනිය හා විවාහ වන බලාපොරොත්තුවෙන් පසු වන හෙයින් එය වැළැක්වීමට කට යුතු වැඩක් වෙතොත්, වහා ම කළ යුතු බව, නීතිඥයා ඇයට පෙන්වා දුන්නේ ය. ජෝන් හා මාලිනිය පිළිබඳ රහස් නීතිඥයාට ලැබෙන්නේ, කෙලින් ම සිළිඳුගෙන් නොවේ. සිළිඳු හා නීතිඥයා අතර, කුලියට වැඩ කරන තවත් ගම්මු දෙතුන් දෙනෙක් වෙති. එ හෙයින් මේ අසන්නට ලැබෙන තාක් දෙය සත්‍ය ප්‍රවෘත්ති හැටියට මුදුනෙන් පිළිගන්නට ජයපාල මැතිණී, එකහ නොවන්නී ය.



ජෙරී හැරිස් උපායයෙහි ද, ප්‍රයොගයෙහි ද, දක්ෂයෙකි. ඔහුගේ ඉවදෙස් පිට, පුත්‍රයාගේ ගෞරවයට ද හානියක් නො වන පිණිස, මේ විෂම මොහනයෙන් පුත්‍රයා මුදන උපාය ද්වයයක් ඇය විසින් යොදන ලදී. එකකින් ජෝන්ගේ සිත අන් අතකට අවනත විය යුතු ය. එකකින් ඔහුට තිකිණියාන ගමන එපා විය යුතු ය. මෙහි ඵල විපාක ප්‍රත්‍යක්ෂ කොට, අනතුරුව, තවත් කටයුතු දය කිරීමට ඈ නීතිඥයාට නියම කළා ය.

"ජෝන් අර ගෞර පුර මහා රාජා කොපමණ හොඳ සත් පුරුෂයෙක් ද? ඔහු නියම මහත්මයෙක්- රජකු වුණාට මොකද ඔහු කොපමණ නිහතමාන දයි?" උත්සවය අවසන්ව, අමුත්තන්ගෙන් සමන්ගිර හිස් වූ කෙණෙහි, ජයපාල මැතිණී පුත්‍රයාට කීවා ය.

"මහා රාජා හොඳ තමා. ටිකක් ආත්ම වර්ණනාව වැඩි එක විතරයි වරද?" යනුවෙන් ජෝන් ද කීයේ ය.

"එහෙ ම කියන්න එපා ජෝන්, ඒ මිනිසුන් තමන්ගේ කුල ගෞරවය ගැන හැඟිම ඇතුව යි, කොයි එකත් කරන්නේ, ඒක ඔබට දන් ම වැටහෙන්නේ නැ. තලතුනා මිනිහකු වුණා ම, ඔබටත් ඒකේ අගය තේරේවි. ඔව්. තරුණ වයසේ සිටින පිරිමි ළමයිංට කුලයක අගේ වත්, ධනයක අගය වත්, තේරෙන්නේ නැහැ. ඒ නිසා, දුර දිග නො බලන සමහරුන් කුල ගෞරවයත්, ධනයත්, තරුණ වයසත්, ඒ වෙලාවට ඇති වෙන බොරු පිස්සු කම්වලට කැප කරනවා." යයි ඈ කීවා ය.

ජයපාල මැතිණිය අවවාදයක ව්‍යාජයෙන් මෙ සේ කියන්නට යෙදුණේ නමුදු, ජෝන්ගේ සිතට නියම ඇනුම් පදයක ස්වරූපයෙන් ඒ කා වැදුණේ ය. එහෙයින් හෙතෙම කතා නැතිව, මෙහෙකරුවන් බඩු අස්පස් කරන සැටි බලන්නා සේ අහක බලා ගත්තේ ය.

"ජෝන්, අපට මහා රාජාගෙන්, ආරාධනයක් ලැබිලා තිබෙනවා. ඉංදියාවට එන්න. තාරා දේවිත් උදක් ම එන්නට කියා ඉල්ලා හිටිනාළු. අර අත්තනායක කුමාරි හාමි ගැන තාරා දේවියගේ පැහැදීම පුදුම යි." ඈ යළිත් කීවා ය.

"ඈ මහ ආඩම්බර කාරියක්-"

"කවුද තාරා දේවිය ද?"

"නැ, අත්තනායක තරුණි"

ජයපාල මැතිණි සිනාසුණා ය. අනතුරුව, පුත්‍රයාට සම්පව ඔහුගේ පිටට අත ගසා "ජෝන්, ඔබේ පැවතුම් වාම් වුණාට, කුල ගෞරවයෙන් යුක්ත උදවිය, හැමෝ ම එහෙම නො වෙයි. ඉතින් මොක ද, ඈය ඔබට පෙන්නු ආඩම්බරය?" කියා ප්‍රශ්න කළා ය.

"මට කිසි හැකීමක් කෙළේ නැහැ"යි ජයපාල ලජ්ජා සිහින් කීයේ ය.

"ඔබ ගැන නරක රාවයක් ඇති වෙලා තියෙනවා. ජෝන්- එහෙ නම් ඒ නිසා වෙන්න ඇති"යි ජයපාල මැතිණි කීවා ය.

"ම්! එහෙම ද?" කියා ජෝන් පිටු පා, ඉවතට යමින්, "අම්මාට පෙනේනවාද, මා දන් හිටියාට වඩා නරක මිනිහකු වෙලා ඉන්නවා?" යනුවෙන් නැවත මැණියන් මුහුණ බලා, ප්‍රශ්න කළේ ය.

"නැ, ජෝන් ඔබ දන් හිටියාට වඩා හුඟක් හොඳයි, ඇහුණාද? ඔබේ හොඳ පෙනෙන්න වෙලා තාම දෙ සතියකට වඩා නැහැ: ඔබට මෙහෙ ම උන් හිටී හැටියේ හොඳ වෙන්න හිතුණේ මන්ද කියාත්, තව ම ලෝකයා දන්නේ නැහැ. ජයපාල පෙළට දන් සිටින්නේ, එකම ඔබ විතරයි. ඊට කැලලක් ඇති වෙන්නට වත් කිලුටක් ඇති වෙන්නට වත් ඉඩ දීම අයුතු යි. ඔබේ ඉතිහාසය අර ගෞර පුර මහා රාජාගේ ඉතිහාසයටත් වඩා පුදුමයි. ඉතින් රටේ මෙ තරම් සාමය ඇති කාලයක- පවුලේ මෙතරම් ධනය ඇති කාලයක- කු ලය නැසෙන වැරදි වැඩක් ඔබෙන් කෙරුණොත්, මුළු ජයපාල පෙළ'ම සොහොන් පිටිවලින් නැගිට, ඔබට සාප කරාවි"යි ඈ කීවා ය.



"මගෙන් එහෙම වැරදි වැඩක් කෙරෙන්නේ නැ අම්මේ," කියා ජෝන් කෝටින් පිළිතුරු දුන්නේ ය.

"එහෙ නම්, ඒක මට ලොකු සැනසීමක්- එහෙත් ඔබට තව එකක් කියන්න තියෙනවා. රූපයට පමණක් ජයපාල පෙළේ කිසි ම කෙනකු රැවටුණේ නැහැ. රූපයට පමණක් රැවටෙන්නා, හරියට ම, ජායා මාත්‍රයක් වැළඳ ගන්න නරා වළකට පනින්නකු වාගෙයි. ඉතින් එයාට වෙන්නේ, මඩේ ගිලිලා මැරෙන්න" යයි ඈ යළිත් කීවා ය.

"අම්මේ, ජයපාලයකුට වඩා, මට ඉහල නගින්නත් බැහැ. ජයපාලයකුට වඩා මට පහල බහින්නත් බැහැ"යි පවසා ජෝන් ගණනකට නැතිව, යන්නට ගියේ ය.

මේ සාකච්ඡාවෙන් පසු, නොහොත් මේ උත්සවයෙන් පසු, ජෝන්හට වෙසෙසින් ම පැහැදිලි වූ කාරණය නම් තමා ගැන තමා නොසිතන ලද තරම් කරුණු මැණියන් දන ගෙන තිබෙන බව ය. මේ සියලු හදි-හූනියම්වලට මුල ජෙරී විය යුතු බවත්, ඔහු නිසැකයෙන් කල්පනා කළේ ය. ජෙරී දුම් කුඩු උරමින් කර බා ගෙන, බැණුම් අහන පළියට, එසේ කර බා ගෙන නිසොල්මනින් නො සිටින බවත්, ඔහු නිසොල්මනින් සිටියත්, මැණියන් ඔහුට නිසොල්මන් වෙන්නට ඉඩ නොදෙන බවත්, මැණියන් විසින් අනුදන්වන ලද කල්හි, ඔහු කරන්නට පැකිලෙන කිසි දු අපරාධයක් නැති බවත්, ජෝන් දන්නේ ය. උදාසීන වීම හෝ ප්‍රමාද වීම, පසුතැවීමට හේතුවකි. එ හෙයින්, මාලිනියට පිහිට වීම පිණිසත්, ස්වකීය ආත්ම ගෞරවය ආරක්ෂා කර ගැනීම පිණිසත්, කටයුතු යමක් වෙතොත්, එය වහා ම කරන තැනට, ජෝන් වැඩ සම්පාදනය කළේ ය.

ඔහු නැවත තිකිණියානට ගියේ, තුන් දවසකට පසුව ය. එදා තිකිණියාන ගිනි වැද්දුණු දවසකි. මේ දින, උදය අවදි වූ තිකිණියාන ගම්මුන්හට තැන-තැන, ගස්වල අලවන ලද ලද ලියවිල්ලක් දකින්නට ලැබී, මහ කලබලයක් විය. තිකිණියානේ

ලියුම්-කියුම් පුළුවන් ඉතා ම ටික දෙනකුට හෙයින්, ඔවුන්ගෙන් ඈත්ත හෙළි-පෙහෙළි වන තෙක්, සෙස්සෝ, මෙය තුවක්කු ලයිසන් අලුත් කිරීම, හරක් හංවඩු ගැසීම් ආදි වශයෙන් ආංඩුවෙන් නිකුත් වන දැන්වීමක් නොහොත් පින් කම් දැන්වීමකැයි කල්පනා කළාහ. උදෑසනින් පාරට එන නන්ද රාළට ද, තම වත්තේ ඉදි කඩුල්ලේ ද, මේ දැන්වීමක් අලවා තිබෙනු දකින්නට ලැබුණේ ය. නන්ද රාළට නම් ලියුමක් අමාරුවෙන් කියවා තේරුම් ගැනීමට පුළුවන් උගත් කමක් ඇති වත්, ඔහුට දැන් ඇස් නො පෙනෙන බැවින් කිසිවක් කිය විය නොහැකි යි. එහෙත් මේ දැන්වීම ඔහුට පුදුමයකි. මඟ යන-එන මිනිසුන්ගේ දැන ගැනීමට අලවන ආංඩුවේ ලියවිලි නොහොත් මහා ජනයාගේ ලියවිලි, මෙ සේ පාරෙන් ඈත, වත්ත ඇතුළේ පිහිටි තම කඩුල්ලේ අලවන එක සිරිතක් නො වේ. මේ උදක් ඔහු වෙනුවෙන් ම අලවන ලද හෙයින් නැවතත් තම අඳුරු දෙ නෙත් ළං කොට, එය කියවන්නට වෑයම් කළේ ය. එහි අකුරු එක ම අවුල් කෙස් රොදක් මෙන් පෙනුණු හෙයින්, වෙන් වශයෙන් කිසිත් පළකා ගත නො හැකිව, නන්ද රාළ ද අකුරු නො දත් සෙස්සන් මෙන්, දන්නා තැනකින් පසුව දැන ගන්නා බලාපොරොත්තුවෙන්, දැන්වීම් තොළය, එසේ ම තිබිය දී පාරට බැස්සේ ය.

නන්ද රාළ ද, උදෙන් ම ගමේ කෝපි කඩයට යන්නෙකි. වැඩට යන්නට පළමු, ඔහු එහි ගොස්, අන් කිසිවක් නො කැවත්, සිරිත් ලෙස අබින් වේල ගෙන, කෝපි කෝප්පයක් හෝ බොන්නේ ය. මෙ දින, කෝපි කඩය බලා යන ඔහුට, එහි තොක් හඬලමින් සිනා සෙන්නන්ගේ ද, උස් හඬින් කතා කරන්නන්ගේ ද, ශබ්දය ඈත දීම ශ්‍රවණය විය. වෙනදාට, මෙතරම් පිරිස මෙහි රැස් වන්නේ, ඈත වැඩට යන ගම්මුන් කිහිප දෙන හා ඔවුන් අග්‍ර පිණ්ඩය කන කපුටුවන් කිහිප දෙන පමණකි. අද නම් අහල-පහල ගෑනු-පිරිමි කවුරුත් එහි රැස්ව සිටිති- මොකක්දෝ ගැන සිනාසෙති- කතා කරති. ඊට සම්බන්ධ වන කැමැත්තෙන් නන්ද රාළ වහ වහා එහි ගිය නමුත්, පිරිස ඔහු දුටු කෙණෙහි දිව දමින්



වැසුණු යක් සෙනගක් මෙන් නිශ්ශබ්ද වූහ- එක එක බැගින් සියල්ලෝ අත වූ දැන්වීම් කොළ ද පිටු පසට කර ගත්හ.

මැතක පටන්, තමාටත්, තම මිනිබිරියටත්, ගම්මුන් කරන වෙනස් කම දන්නා හෙයින්, මෙ කෙළේ ද කිසියම් වෙනස් කමකැයි සිතූ නන්ද රාළ, කිසි කතාවක්-බහක් නැතිව, කෝපි කඩයට ගොඩ වී, පුරුදු බංකුවේ පුරුදු කොනේ, හිඳගෙන කෝපි කෝප්පයක් ගෙන්වා, අබින් හෙප්පුව එළියට ගත්තේ ය. අබින් හෙප්පුව අතට ගත් ඔහුට යහළුවකු නැති කමේ පාඩුව නො දැනේ. අබින් හෙප්පුව ඔහුට යාළුවෙකි- නෑයෙකි. කිසිවකුත් නැති කාන්තාරයක වුවත්, අබින් හෙප්පුව ඇති කල්හි, ඔහුට සති ගණනක් නමුත් තනියක් නැතිව, ගත කළ හැකි යි.

ගමේ වැදගත් පවුලකින් පැවැතෙන, නන්ද රාළ මෙන් ම මහලු වියෙහි සිටින, කිසි විටෙක කිසිවකුගේත් සිත ලේඩිත්තක් විතරක් නො රිදවන, කවුරුත් සමගත් හොඳින් පසු වන එ හෙයින් නන්ද රාළට ද අබ මල් රේණුවක පමණින් වෙනස් කමක් නොකරන, ඉතා සැලකිල්ලෙන් කහටත් එක සේ කෝපි කෝප්පය වත් කර දෙන, කෝපි කඩ කාරිය ගෙන් ද, නන්ද රාළ මේ ගැන විමසුවේ ය.

"අනේ! මන් දන් නෑ නන්දයියේ, ඕවා කොහෙන් ගිහින් කොහෙන් නවතින වැඩ ද කියා" එ පමණක් කියා කෝපි කඩකාරී ද නිසොල්මන් වූවා ය.

හැට පැනුණු, කෙස් පැසුණු, දත් වැටුණු නන්ද රාළ කෝපි කඩ කාරීගේ පිළිතුරෙන්, මේ දැන්වීම් කොළය සෙසු කාහට කෙසේ වුවත්, තමාට නම් විනෝදයට කාරණයක් නොවන බව තේරුම් ගත්තේ ය. එ කෙණෙහි ඔහු කෝපි කඩෙන් පිටමං ව එන්නේ, අන්දා දුටුවේ ය. මාලිනියට අපහාස්‍ය මුඛයෙන් කිසි යම් දුෂ්ට පුද්ගලයකු විසින් රචිත වල් සිවුපද කිහිපයක්, එම නිර්නාමික පත්‍රිකාවේ ඇතුළත් බව අන්දාගෙන් දැන ගත් කෙණෙහි, මහල්ලාට විස පත්තු විය. ඔහු ක්‍රෝධයෙන් වෙවුල - වෙවුලා,

බණින්නට පටන් ගත් කල, ගෙළෙ දෙ පස හා නළලෙ, නහර වැල් ලනු පොටවල් මෙන් ඉපිළ සිටියේ ය. පළමුවෙන් ඔහු, ළඟ නැති අයට බැනුම් පටන් ගෙන, පසුව-පසුව ළඟ සිටි අයට ඇනෙන්නට ද බැන්නේ ය. පරණ විරුද්ධ කාරයනට, තමා බැඳි 'කාව්‍යයන්' කට පාඩමෙන් කිය-කියා, නටන්නට ද වුණේ ය. කිසිවෙක් කිසිවක් කතා නො කළාහ. මහල්ලාගේ විකාරය කවුරුත් විනොදය කොට ගත්හ. අන්දා විසින් ඔහු එ තැනින් බැහැර කොට ගත් කෙණෙහි, පිරිසගේ සිනාවත් කතාවත්, පළමු වතාවටත් වඩා අධික විය.

“අපට කාවියන් බැඳ ලා, ඔවුංට කියංට තියෙන්නේ, මොනවා ද බොල? කාවියන් බඳින්න නිසි වැඩ මෙහෙ තව කොච්චර තියෙනවා දැයි?” මහල්ලා පසු බැස යමිනුත්, අන්දා සමග කීයේ ය.

දකින්නන්හට තව-තවත් කොහොලමක් නොවන පිණිස අන්දා ද ඔහු අසුවසමින් ගෙදරට ම කැඳවා ගෙන ආවේය. මාලිනියට ද කවි කොළය ගැන දැන ගන්නට ලැබුණේ, මෙහි දී ය. ඇය එම කවි කොළය මුල පටන් අවසානය දක්වා ම, හෙමින්-හෙමින් සැලි-සැලී තනිය ම කියෙවුවා ය. කැලෑ හඳ බුරන බල්ලන්ගෙන් බේරී ගනු සඳහා කැලෑව අත් හැර, නගරයට යන බවත්, සමන්ගිර මුදුනේ දී ජයපාල අසුරේන්ද්‍රයාට වසඟ වන බවත්, ජයපාල අසුරේන්ද්‍රයා නගරයයේ බුරන බල්ලන් කට බඳින්නට උපායයක් සොයන බවත්, යන ආදී නොයෙක් දේ, එහි කවියට නඟන ලද්දේ ය. ඇ කවි කොළය කියවා, අන්තයෙහි යහනෙහි වැතිර ගත් ගමන් අහර ද නො ගෙන, සවස් වන තෙක් ම සයනයෙන් කල් ගත කළා ය. ඇයගේ සිත් වේදනාවට ප්‍රධාන කාරණය නම් ජයපාලට එහි කරන ලද අපහාසය වේ. තරුණ ජයපාල ඇයට දන් දෙවියෙකි. විශේෂයෙන් ම සමන්ගිරේ උත්සවය ගැන වාර්තාව පත්‍රයෙන් දුටු තැන් සිට, ඇ, ඔහු කෙරේ සම්පූර්ණ භක්තිය ඇති කළා ය. “මත් පැන් හා සුදුව, විශේෂයෙන් ම රේස් සුදුව, තමා විසින් අත් හරින ලද්දේ මන්ද?” යන ප්‍රශ්නයට



උත්තර දෙමින් වාර්තාකාරයා හා කළ ජෝන්ගේ සාකච්ඡාවක් ද පත්‍රයේ වෙන ම තැනක පළ විය. හෙ ද ඇය විසින් ඉතා ඇලකිල්ලෙන් කියවන ලදී. තරුණ ජයපාල මුළු ගමට ම දෙවියකු මෙන් පිහිටන ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකි. ගමේ ඉතා ම උසස් ගම් දෙටුවා වුවත්, ජෝන් ජයපාල වැනි උතුමකුගේ පාපිස්නාවටත් තරම් නො විය යුතු තැන- ඔහු දුටු පමණින් නැමෙන, හැකිළෙන, ගම්මුන්- කටේ කෙල බිම නොහෙළා ගම්මුන්- ඔහුගේ නම් මේ තරම් නිදහසකින් ඉදිරිපත් කොට ගෙන, තමා වැනි පහත් ගැහැනියක හා සම පෙළේ තබා, සමච්චල් කිරීම ඇයගේ බලවත් සන්වේගයට කාරණය විය.

සවස් වන තෙක් ම, මාලිනිය නො නැගිටි නිසා, නන්ද රාළ බලාත්කාරයෙන් ඇය අවදි කොට, මහල් ව්‍යාඝ්‍රයකු මෙන් ගර්ජනය කරමින් තම හත් මුතුන් පරම්පරාවකටත් නුණු දෙයක්, ජෝන් ජයපාල නිසා වුණු බව කියා, ඔහුගේ ගමන මෙයින් ම නතර කරන ලෙස නියම කලේ ය. හැම දා කෙසේ වුවත්, මෙ දා නම් මාලිනී, මහල්ලාට ඉතා ම කරුණාවෙන් යටත්-පහත් කම් පෙරදැරි කොට, කතා කරන්නී. එයින් කිසි පිරිමැස්මක් නොවන බව පෙන්වා දුන්නා ය.

“ඇයි සීයේ, කෝපය ටිකක් සංසිඳුවා ගෙන කල්පනා කර බලන්න කෝ- ජයපාල මහත්තයාගේ ගමන තහනම් කිරීමෙන් මේ නැගී තිබෙන නින්දාවට ලැබෙන පිරිමැස්ම කුමක් ද? එතකොට මිනිස්සු තවත් අපට හිනා නො වෙද්දැයි?” ඇ ප්‍රශ්න කළා ය.

“ඔන්න මන් කිවුවා- එහෙ නම්, මට ඇත්තේ මේ ගම අත් හැරලා, ඉහ ලූ ගම් හතේ යන එකයි” මහල්ලා නැවතත් ගර්ජනය කලේ ය.

මෙහි දී මාලිනී ඉතා මෘදු භාෂිතයෙන් කතා කොට මහල්ලා සන්සුන් කරවමින් ජයපාල මහතාගේ අදහස් විස්තර කළා ය. ජයපාල මහතා, ආවාහ වන බලාපොරොත්තුවෙන් තමා කොළඹට කැඳවන බව මාලිනිය කටින් පිට වූ කෙණෙහි මහල්ලාගේ

වාසනාව හිරු දුටු අඳුරු මෙන් දුරුවිය. එපමණක් නොව, ඔහු පුදුම විය- අනතුරුව, මාලිනිය කියන්න ඇඳහිය නො හැකිව, ව්‍යාකූල විය. මේ නව නින්දාවෙන් මිදෙන උපායයක් සොයන ඔහුට කවදත්, කොයි වේලෙත්, පෙනුණේ, මෙ පමණකි. තම දිළිඳු මිණිකිරිය හා මේ ශ්‍රේෂ්ඨ කුල ජ්‍යෙෂ්ඨයා අතර, විවාහය නම් අහසට පොළොව මෙන් නො ළං වන හෙයින් මෙ බඳු යෝජනාවක් කිරීමට දිව නැමීමෙහි හෙතෙම, එ හෙයින් අපොහොසත් විය.

"මට නම් මාලිනී, මේක කොහෙත් ම විශ්වාස කරන්න බැරි කතාවක්- මත් මේ හූනා කියන්නා වාගෙයි, කියන්නේ. මත් විශ්වාස කළත්, ගමේ මිනිස්සු නම් මේක කොහෙත් ම විශ්වාස කරන්නේ නැහැ"යි ඔහු දෙ නෙත් බමළු-බමළා ඇත-මෑත බලමින් කීයේ ය.

"ඒකට කරන්න දෙයක් නැහැ සීයේ" මාලිනී මෙහි දී කීවා ය.

මහල්ලා, ජනේලයෙන් පිටතට බුලත් කෙල පහරක් ගසා, කට පිස දමාගෙන, යෝජනාවක් කරන්නේ ගමේ ලේකම් රාළහාමි ලවා කසාදය බඳවා ගෙන මාලිනිය සිරිත් ලෙස යන තැනක කැඳවා ගෙන යා යුතු බව කීයේ ය. "එතකොට මට කතා කළැකි මුළු ගමට ම කනේ ඇඟිලි ගහ ගන්න"යි ඔහු වැඩි දුරටත් කීයේ ය.

මේ අතර, ජෝන් ජයපාල එහි පැමිණි බව මෙහෙකාරියක විසින් දන්වන ලදින්, මහල්ලා කතාව එපමණකින් නතර කොට, කාමරයෙන් පිට විය.

මාලිනිය නොයෙක් සිතිවිලි ගෙන, අසනීපයෙන් පසු වන බව දුටු කෙණෙහි, ජයපාල ඇය සනසන්නට පටන් ගත්තේ ය. බංගලාවට පැමිණි හැටියේ ම වාගේ ගලපිට කන්දේ සුපිරිංටැංඩංට්ගෙන් ඔහුට මේ කවි කොළය ගැන දැන ගන්නට ලැබුණේ ය. ඔහු කෙළේ එය කියවා බලා, සිතා සෙන එක



පමණකි. මෙය අසරණ ගම්මුන්ගෙන් වැඩක් නො වන බවත්, මෙ වැනි දෙයක් කිරීමට තරම් බිය සැක නොවන ගම්මුන් තිකිණියාගේ නො සිටින බවත්, තිකිණියානට යන තමාගේ ගමන නතර කර වන අදහසින් ජේරී හැරිස්, කුලිය ගෙවා ගතු කියන්නන් ලවා, මේ කර වන ලද වැඩක් බවත්, ජයපාල තරුණයා එ කෙණෙහි ම තේරුම් ගත්තේ ය. මේ නිසා මුළු තිකිණියාන ගමේ හට ගන්නා ලද කලබලය ගැනත්, නන්ද රාළගේ ද, අන්දාගේ ද, දෙස් දෙවොල් හා ඇනුම්-බැනුම් ගැනත්, ඔහු කලින්.ම දැන ගත්තේ ය.

නගර බදව මෙන් නොව, පිටිසර ගම් බදව නම්, නම්-ගම් නැති ම වැනි අසභ්‍ය පත්‍රිකා නිසා නොයෙක් විට සැලකිය යුතු කලබල ඇති වන්නේ ය. සමහරු ඕපාදූප කතාවට මෙන්ම මේ කාව්‍යන්වලට ද වසිත වෙති- හීත වෙති. ඕපාදූප කතාව වැඩකට නැති පහත් ගැහැනුන් කටිනුත්, කාව්‍යන් හොළය හීන-දීන බිය සුලු මිනිසුන් අතිනුත් කෙරෙන්නේ ය. ඉදින් දුසිරිතකිනුත් රටට වැඩක් වෙයි නම් මෙයින් ද වන එක්තරා යහපතක් ඇත්තේ ය. නීතියට එල්ල නො වන, පොලිසියට එල්ල නොවන, නොයෙක් දුසිරිත් අල්ලස් නොගෙන යුක්තිය ම ඉෂ්ට කරන සත්‍ය ගුණ සම්පන්න නිලධාරියකුට බඳු මේ නිහීන පත්‍රිකා කාරයාත්, ඕපා දූප කතා කාරියත්, නිසා බොහෝ දුරට මැඩ පවතින්නේ ය.

ජයපාල තරුණ තෙමේ මේ බඳු සමච්චලයකින් සෙලවෙන්නට තරම් සැහැල්ලු පුද්ගලයෙක් නො වේ. සිතිවිලි ගෙන ආතුර වූ මාලිනියට නම් ඔහුගේ විලාසය පුදුමයකි. ඔහු මාලිනිය සනසමින් මෙ සේ කියන්නට විය.

"කවුද මාලිනී, ඕවා ගණනකට ගන්නේ? ඔහේ යම්තමකට පද හතරක් ගළපා ගන්නට පුළුවන් බියසුල්ලකුට මහොම වැඩක් කරන එක කාරියක් නො වෙයි. ඔ වැනි බිය සුලු කම්වලට අපට ඇත්තේ, උපෙක්ෂා වන එකයි. ඕවා හරි හපන් කම් නො වෙයි. එපා! එපා! සීදේවී, ඔය වල් පල් සිතට ගෙන නිකරුණේ තැවෙන්න එපා. මදුරුවන්ගේ හැටි ඔහො ම තමා. නො කන්කලු හඩින්

හඬන එකත්, ඉඩක් ලැබුණු තැන දණ්ට කරන එකත් තමා උන්ගේ සිරිත. ඒක කරදරයක් නො වේය කියා මා කියනවා නො වෙයි. දණ්ට කළත්, ඒකේ වේදනාව ඒ වෙලාවට විතර යි. ලෙඩ නැති, හොඳ ශරීරයකට එයින් වන කිසිම පීඩාවක් නැහැ. ඒ නිසා මය මලානික මුහුණ අත් හැර, ප්‍රීතිමත් වෙන්න. මාලිනී, මේ ගැමියන්ගේ කට හැකර කම්වලින් කිපෙන්න අපිත් ඔවුන් වල්ලේ වෙමු දැයි?" ඔහු ඇයගේ හිස පිරිමදිමින් විතාලේ ය.

මේ වචනවලටත් වඩා, මාලිනියගේ සිතින් දොම්නස පහව යන්නට ප්‍රධාන කාරණය වූයේ ජයපාල තරුණයා සැහැල්ලු සිතින් පැමිණි මේ ගමනට ය. මේ කවි දූසින් බාගය කරණ කොට ඔහුට තවත් ඉතින් නිකිණියාන එපා වෙතැයි ඇ සිතුවාය. මග දෙ පස, අලවන ලද කවි කොළ දෙස බලා බලා, කිසි ද වකිතයක් නැතිව, ඔහු මාලිනිය වෙත යන මේ ගමන, නිකිණියාන වෙනත් උදවියට ද මහ පුදුමයකි.

"මට පුදුමයි, මහත්තයා අදම කිසි වකිතයක් නැතුව, මේ ආව ගමනට" යනුවෙන් මාලිනී සිනා මුහුණ දක්වමින කීවා ය.

"කවුරුන් නමුත් මේ වැඩය කෙළේත්, මගේ මේ ගමන් වැළකිය කියා හිතා ගෙන තමයි. මා ඔ වැනි පීඩාවකින්, අවහිරයකින්, පසු බසින්නේ නො වෙයි- මෙල්ල වන්නේ නො වෙයි. බර පැටවෙන්නට-පැටවෙන්නට වේගය වඩ වඩා දියුණු වන යන්ත්‍රයක් වගෙයි මගේ හිත" ඔහු මෙසේ කියා, නැවත මේ දුෂ්ට කුමන්ත්‍රණයට මුල් වූවන් ලෙස තමා සැක කරන්නන් ගැන ද කීවේ ය.

ජයපාල මැතිණියගේ හා එම නීතිඥයාගේ අනුදැනුමෙන් එහෙත්, ගමේ ගතු කියන්නන්ගේ අදහස පිට, සිළිඳුගේ කේලම් බසින්, මේ බිය සැක නැති වැඩය කෙරුණු බව දැන්-දැන් මාලිනියට ද වැටහෙන්නේ ය. ගම්මුන් ජය ගැනීම ඇයට ඒ තරම් කාරණයක් නොවේ. දැන් පෙනෙන හැටියට නම් කාරණය ජයපාල මැතිණියගේ සිත් දිනා ගැනීමය. ජෝන් කළ, විස්තරයෙන් පසු, එය කවර



සලක වත් නොවන වැඩක් නොහොත් නොකට හැකි වැඩක් හැටියට ඇ තේරුම් ගත්තා ය. නන්ද රාළගේ ඉල්ලීම ලෙස, ගමේ ලේකම් මහතා, ඒ නම් නිකිණියානේ රෙජිස්ට්‍රාර් රාළහාමි ලවා විවාහය කැරවීමට ද තරුණ ජයපාල කැමති විය. හිතේ හැටියට සියලු සුව පහස් කම් ඇතිව, කිසිවකිනුත් නොඅඩුව, විවාහ ජීවිතය සැපෙන් ගත කිරීමට අවශ්‍ය සියලු දෙය තමා විසින් සම්පාදිත බව ද ජෝන් කීවේ ය. එසේද වුව, ජෝන්ගේ මැණියන්ගේ විරෝධය, අස් කළ නො හැකි, නොහොත් මර්දනය කළ නො හැකි, බාධාවක් සේ ඇයට පෙනේ.

"මහත්මයා මා කැඳවා ගෙන යන්නට. හදන්නේ සමන්ගිරට දැයි?" මාලිනී ප්‍රශ්න කළා ය.

"සමන් ගිරට!" කියා මෙහිදී තරුණයා මඳක් නිශ්ශබ්ද විය. ඔහු මුහුණේ පැහැය ද මඳක් වෙනස් විය. මාලිනී, මට දැන් ම ඔබ සමන්ගිරට ගෙන යන්න හැටියක් නැහැ. සමන්ගිරට යන්නේ, මැණියන් සතුටු කර ගත්තාට පසුව"යයි ඔහු තරුණාවෙන් කීයේ ය.

"ඒක ලේසි වැඩක් වේ ය කියා මට හිතෙන්නේ නෑ මහත්මයා." කියා ඇ සුසුමක් හෙළා, අහක බලා ගත්තා ය.

"නෑ මාලිනී. එහෙ ම කනගාටු වෙන්න එපා මගේ මැණියන් පසුව කැමති කර ගන්න එක අමාරු වෙන්නේ නැහැ. දැන් ඇයගේ මනැසට පෙනෙන්නේ, ඔබ, මගේ තත්ත්වයට නො ගැළපෙන තරුණියක හැටියට යි. කවදා නමුත් සියැසින් දුටු දා, ඇයට පෙනේවි, ඔබ මට නො වෙයි- දෙවියකුට සැහෙන දේව දුවක බව. නෑ, නෑ එවිට කවදාවත් ඇය ඔබට විරුද්ධ වෙන්නේ නැහැ." කියමින් තරුණයා හිස වනන්නට විය.

"පිරිමිංට පෙනෙන තරම් හොඳට ගැහැනුංට, ගැහැනුන් පෙනෙන්නේ නැහැ."යි මාලිනී, එකලාවම තෙපලා, නැවත, "ඉතින් මැණියන්හට මේ වග නිකම්වත් දැනුම් දුන්නේ නැද්දැයි?" මුහුණ බලා, ප්‍රශ්න කළා ය.

"නැහැ, එහෙම දනුම් දීමෙන් කිසි පලක් වෙන්නේ, නැහැ. දන් මේ බව දන ගත්තොත්, ඇය කලබල ඇති කරාවි. මා, මේ තරම් ඉක්මනින් විවාහ වන බව ඇය දන ගන්නා එක හොඳ නැහැ. යමක් වුණාට පස්සේ, ඊට අවනත වීම වෙනම එකක්- එය ඇයගේ සිරිතය."යි ඔහු කීයේ ය.

මාලිනී කිසි හොල්මනක් නැතිව, බිම බලා ගත් ගමන් සිටියා ය. මෙ තෙක් නියම පුරුෂයකුගේ වේශයෙන් පෙනුණු මේ ශක්ති සම්පන්න තරුණයා, දන් ඇයට පෙනෙන්නේ, හිතුවක්කාර කොල්ලකුගේ සැටියෙනි. මේ තරම් විශාල කුල පරම්පරාවකට වග කිය යුත්තෙක්, තම එක ම වැඩි හිටියා වූ මෑණියන්හට වත් දන්වීමක් නො කොට, තමා වැනි දිළිඳු පහත් තරුණියකට ආවාහ වෙන්නට සිතන්නේ නම්, ඒ අන්තම අන්ත හිතුවක්කාර කමකි. මේ කර ගත් මෝඩ කම නිසා පසු තැවෙන දවසක් ඔහුට කවදා නමුත් ඇති විය යුතු ය. එ විට ඔහුගේ පිරිහීමට තමා ප්‍රධාන හේතුව මෙන් ගෙන නිග්‍රහයෙන් සලකන කාලයකුත් නො ලංව ඇති වෙන්නට පුළුවනැයි ද ඈ සිතුවා ය.

"මහත්මයා, මේ මගේ රූපයට මුළා වී කරන්නේ, මහ හිතුවක්කාර කමක්- මහත්මයාගේ සිහි විකලය හැරුණු දා මහත්මයාට මා පෙනේවි. මහත්මයා කන්නට උපන් දිවි දෙනක හැටියට, ඒක තමා මට භය." මාලිනී ශීතලෙන් ගැහෙන්නා සේ දෙවුර හකුළා ගනිමින් කීවා ය.

"මේක හිතුවක්කාර කමක් නොවෙයි, සිදේවි. ඔබ මා ගැන පමණක් මෙහෙ ම කල්පනා කරන්නේ ඇයි? මා නො ලැබුණොත් ඔබට වන පාඩුව?" කියමින් ජයපාල යුහුව ප්‍රශ්නයක් ද ඉදිරිපත් කොට, "එතකොට ඔබට හිතෙන්නේ නැද්ද මා ඔබ මරා දමා ගිය කොටියකු හැටියට? බෑ. බෑ මාලිනී. මගෙන් එහෙම අයුත්තක් කෙරෙන්නේ නැහැ"යි ඔහු වේගයෙන් පා සපා, නැගී සිටිමින් කීයේ ය.

මෙහෙ ම තැනදී මාලිනියට පුරුදු නිශ්ශබ්ද වීම ය. ඇය කර බා ගෙන සිටියද, සිතේ නම් ඇයගේ කිසි ම නිසොල්මනක් නැති.



ඈ අහංකාරයෙන් පුත් ගැහැනියකි- අපහාස විදිමින් කරන රජකමට වඩා, මදි කමක් නැතිව, කරන මෙහෙකරු බව ප්‍රිය කරන්නකි. මේ, රජ කම පතා කරන මෝඩ කම්වල දරුණු විපාක පඩිපන් දෙන්නට පටන් ගත් කල. රටේ විසුම පවා එපා වෙන්නට පුළුවන් බව කල්පනා කරන්නී, ඔහුට බිරින්ද වෙනුවට වඩා දාසිය වීම යෙහෙකැයි සිතා සැහෙන තැනකින් සුදුසු කුල කාන්තාවකට ආවාහ වන හැටියටත්, දාසියක මෙන් සේවය කිරීමට තමාට ඉඩදෙන හැටියටත්, ඈ උදක් ම ඉල්ලා සිටියා ය.

"මාලිනී, ඔබ මේ කියවන්නේ මොනවාද? මට ඔබ අත් හැරිය නො හැකිවා මෙන් ම ඔබටත් මා අත්හැරිය නොහැකි බව මට නොපෙනෙන්නේ ද? ඒ නිසා, මේ විකාර කතාවෙන් අපට යන පලක් නැහැ. ලබන පසළොස් වැනි දා මම විශේෂ බල පත්‍රයක් අරගෙන එන්නං. එ දාට ගමේ ලේකම් මෙහෙ ඇවිත් අපේ විවාහය සිදු කරාවි. එදා හොඳ නැකත් ඇති දවසක් වූ. ඒ නිසා අප එදා ම හවස කොළඹ පිටත්ව ගොස්, මා අරන් තිබෙන ගෙයි පදිංචි වෙන්න ලැස්ති වුව මැනවැයි" තරුණ තෙමේ යුගතින් ඇය සිරස වැළඳ ගෙන කීයේ ය.

# 10

ජෝන් ජයපාල ස්වකීය විවා ජීවිතය ගත කිරීමට පිළියෙල කොට ගත් ගෙය වනාහි කොළඹ, කුරුඳු වත්තේ පිහිටි, ප්‍රදේශ රාජ්‍යකුගේ පුවත් වාසයට සුදුසු මහාර්ඝ ගෘහ භාණ්ඩයන්ගෙන් හා අලංකාරවත් වස්තු සමූහයෙන් විභූෂිත මහා මන්දිරයකි. මේ සමන්ගිර වැනි පැරණි ගෙයක් වත් එතරම් විශාල ගෙයක් වත්, එ තරම් ප්‍රසිද්ධ ගෙයක් වත්, නො වේ. එ සේ ද වුව, නවීන ක්‍රමානුකූල ස්වස්ථ්‍යාභිවෘද්ධීන්ගේ පක්ෂයෙන් සර්වාංගයෙන් සම්පූර්ණය- සුබ විහරණයට අතිශයින් ම යොග්‍ය ය-මනොඥය. මේ තමා සතු නොහොත් ජයපාල බුද්ලය සතු ගෙයක් නොවේ. උදක් ස්වකීය ප්‍රියාවගේ විනෝදයටත්, ආශ්වාශනයටත් සුදුසු වන පරිද්දෙන් සම්පාදනය කරවා, කුලියට ගත් ගෙයකි. එහි පළමු නම අනෙකකි- දැන් "මාලිනී ගෙය" නමින් ප්‍රසිද්ධය. මාලිනිය, මල් සාත්තුවට කැමැති හෙයින් ඇයගේ එම විශේෂ ව්‍යායාමය උදෙසා මෙහි අංගනය හා උද්‍යානය විවිධාකාර පරිච්ඡේදයන්ගෙන් සමන්විත කොට සකස් කරවන ලදි.

විවාහයෙන් පසු මේ යුවති පති දෙදෙනා, එ දින ම සවස, මේ මාලිනියගේ වාස ග්‍රාහණය කළහ. ඔවුන්ගේ විවාහය, තිකිණියාන ගමේම ලේකම් ලවා නන්දරාළගේ ගෙදර දී ම, අදිසියේ එහෙත් ප්‍රසිද්ධියේ කරවන ලදි. නන්ද රාළ සතියක වේලේ පටන් තමාට හිත වූ අන්දා ආදි දෙතුන් දෙනකුගේ ද පිහිට ඇතිව, මේ වැදගත් ප්‍රස්තාවය උදෙසා සුදු හුනු ගෑම් පින්තාරු කිරීම ආදි වැඩවලින් තම ගෙය කල එළි කරන්නට වන් විට, කාහටත් මෙහි මඟුල් ලකුණු පහළ වන බව පෙනෙන්නට විය. එහෙත් මඟුලක් නම් වෙතැයි කිසිවෙකුත් නොසිතූහ. ගම්මුන්හට නම්, ජයපාල හා



මාලිනිය අතර, විවාහය අහසට පොළොව මෙන් නො ලංවන්නකි- සමුද්‍රයෙහි එ තෙරට මෙ තෙර මෙන් දුරින් ම දුරු වන්නකි. එ හෙයින් මේ ප්‍රවෘත්තිය පැළ වූ කෙණෙහි ම භූමි චලනයකින් ප්‍රකම්පනය ලත් කලක් මෙන් කුපිත වූ තිකිණියාන ගම් වැස්සෝ- විශේෂයෙන් ම මාලිනියට හා නන්ද රාළටත් සතුරු වූ ගම් වැස්සෝ- පුදුමයෙන් මත්ව, නෙත් උඩට දල්වා ගත් ගමන් සිටියහ. වතු පිටි හිමියන් වැනි මහ පොහොසතුන් දනැඳින ගැන්මෙන් ආශ්‍රයට වැටුණු හැටියේ, රූපය පමණක් ධනය කොට ගත් පිටිසර තරුණියට යන කල-මල භාවිකථනයෙන් නොහොත් ජේනයෙන් කීම, මේ පලාත්වල මිනිසුන්හට නුපුරුදු නුහුරු වැඩක් නො වන හෙයින්, ගලපිටකන්දේ තරුණ ධනපතියා හා මිත්‍රත්වයට පැමිණි මාලතියට ඉරණම වශයෙන් ඔවුන් විසින් සඳහන් කරන ලද්දේ, මීට ඉඳුරාම විරුද්ධ ඵල විපාක දෙවන හඳහනකි. ඡන්දයෙන් අගතියට යෑමත්, පක්ෂග්‍රාහී චිත්තයත් කරණකොට ඔවුන්ගේ ජේනයට පෙනුණේ, මාලිනියගේ දශාකාරකාව අස්තයට නොහොත් ඇදෑමට යන්නාක් මෙනි. ඒ හා සමඟ මාලිනියගේ පිරිහීමත්, වැටීමත්, ඔවුහු අපේක්ෂා කළහ. දැන් ඔවුනට මාලිනිය කැලෑ හඳස් හොඳ හඳටත් උඩින් ගමන් යන්නා වූ නයන විෂය ඉක්ම වන්නා වූ, එහෙත් කාන්තියෙන් නෙත්‍ර ක්ලාන්ත කරන්නා වූ සූර්ය මණ්ඩලයකි. විවාහයෙන් පසු ස්වකීය ස්වාමියා හා නගරය බලා ගමන් ආරම්භ කරමින් මහට බැසි කෙණෙහි, ඊර්ෂ්‍යා පරවශ නුවූ ගම්මුන් ටික දෙනාට හැර සෙසු කාහටත්, මාලිනියගේ මුහුණ එක එල්ලේ කෙලින් බැලීම පීඩාවක් වූ හෙයින් දොර කවුළු හා ගස්-ගල්වල මුවාවෙන් සමහරු එසේ කළහ. මාලිනියගේ තබා නන්ද රාළගේ වත්, අන්දාගේ වත්, මුහුණ ඔවුනට දැන් ලෙහෙසියෙන් බැලිය හැකි නොවේ.

තිකිණියානේ උපන් බැවින් තිකිණියානේ ම ඇට දමිය යුතු යයි කියන නන්ද රාළ, මේ දම්පතියන් හා නාගරික ජීවිතයක් ගත කිරීමට නො කැමති හෙයින් කොළඹ නො ගියේ ය. එහෙත්, කුඩා කල පටන් මවක මෙන් තමා ආරක්ෂා කොට ලෙඩව -

දූකට බලමින්, කන්නට අදින්නට පවා දෙමින්, ඇති දඩි කොට, වැඩ සැලසූ සීයාගේ දෙ පතුල, මාලිනී වැඳ වැටී, එම දෙ පතුල් සිම්බා ය. අනතුරුව, ස්වකීය මළ ගිය මැණියන් වෙනුවෙනුත්, පියාණන් වෙනුවෙනුත්, තමා වෙනුවෙනුත් ස්තුති කොට, පින් දෙමින් සිය සැමියා හා යන්නට අවසර ගත්තා ය.

පෙර කිසි කලක, නො හැඬූ තරම් හඬන්නට වත් නන්ද රාල මෙහිදී හිමියකුට පැවතිය යුතු සැටි ගැන මිනිබිරියට තමා දන්නා පමණින් දැනමුතුකම් දෙන්නේ, කොතෙකුත් ක්‍රීඩා ශීලී නොවිය යුතු බවත්, සිහිපත් ඇතිවම, අප්‍රමාදව, අනින්දිතව, සියලු කටයුතු කළ යුතු බවත්, එ ලොව, මෙ ලොව, වැඩ නො නසා, ආචාර සම්පන්න විය යුතු බවත්, සැප සේ ගෙව-දොරව සිටිය යුතු බවත්, ආදී වශයෙන් නොයෙක් අවවාද තමාගේ පුරුදු ග්‍රාම්‍ය භාෂිතයෙන් ම කීයේ ය. තවද, ඔහු කඳුළු පිරි දෙනෙතින් හෙළන බැගෑපත් බැල්මෙන් යුතුව ජයපාල තරුණයා වෙත එළඹ, මාලිනියගේ පියවී ගුණ මුල් කොට ඇති දුබල තම් දක්වමින්, සිත කෝපයෙන් රළුව තිබෙන කල්හි, ඇය අමද්ධ්‍යස්ථ කටයුතු විචාරණ බවත්, මුරංඩු වන බවත්, සැහැසි කියන බවත්, ලත් මෙහෙවර ඒ නිසා වට නො කරන බවත්, දෙස් තරන බවත්, එහෙත් කරුණාවෙන් පොළඹා ගෙන පිළිපැද ගත් කල්හි, සංවිභාගශීලී වන බවත්, මිහිරි වන බවත්, මටසිළුටු තෙපුල් හා පිනීත වූ ස්වරූප ඇති කරන බවත්, පවසා ස්ත්‍රී ලීලාව නිසා, ස්ත්‍රී ජාතියට අනුකම්පා කටයුතු හෙයින් තම මිනිබිරියට වෙනස් කමක් නො කරන හැටියට උදක් ඉල්ලා සිටියේ ය.

මාලිනියට මෙහි දී අන්දා ද, අමතක නො වීය. ඈ ඔහු ගුණ සිහි කරමින්, සොහොයුරකුට මෙන් සිරස සිඹිමින්, ආචාර කොට, ස්තුති කළා ය. අන්දා ඉකි ගසමින් හඬන්නට පටන් ගත්තේ ය. ඉන් පසු ඔහු නන්ද සීයා හා තවත් හිතවතුන් හා කැටුව, මේ යුවති-පතියන් මෝටෝ රියට නගින තැන් දක්වා පසු ගමන් කළේ ය.



මාලිනී මේ සතුටු සොම්නස් සිහින් යන ගමනක් වුව ද, ගම අත් හැර යන බැවින්, හැම දෙයකින් සමු ගන්නා සේ සිත් පිත් ඇති මිනිසුන් දෙස පමණක් නොව, සිත්-පිත් නැති ගස්-කොළං හා පරණ ගෙවල්-දොරවල් හා වතු-පිටි හා වෙල්-කුඹුරු දෙසත්, ප්‍රේමයෙන් හා ආදරයෙන් කෘතඥ පූර්වකව බැලුවේ ය. මෙ දින, සිත් පිණ වන සන්සුන් සෘතු ගුණයක් පැවති හෙයින් බැලූ-බැලූ අතින් සැම තැන ශාන්ත ශ්‍රීයෙන් ද, ඇය සිත් සතන් පිණ වන්නා වූ දර්ශන සම්පත්තියක් ම විය.

මෙ සේ, මේ යුවළ, එදා මාලිගයට ළහා වන විට සවස අට පමණ විය. ජෝන් ජයපාලගේ ආරාධනයෙන් එහි කලින් පැමිණි හිතවතුන් කිහිප දෙන විසින් ඔවුහු මාලිගයට පිළිගනු ලැබූහ. විදුලි ආලෝකයෙන් දිව්‍ය මන්දිරයක් මෙන් බබළන මාලිගය ද, නොයෙක් විසිතුරු මහාර්ඝාභරණයෙන් සැරසුණ වූ කාන්තාවන් හා එහි හැසිරෙන තදීය පුරුෂයන් ද දක-දක තමා මෙ බඳු මාලිගයකට අධිපතිවන්නේ, කෙසේ දැයි, මාලිනී සංවේගයෙන් මෙනෙහි කළා ය. තමා වැනි පිටිසර බද දිළිඳු ගැහැනියකට මෙ බඳු මන්දිරයක දොර කඩ පතින්නට තරම් වත් භාග්‍යයක් ඇති වීම ඇයගේ පුදුමයට කාරණයකි. එදින, එහි විශේෂයෙන් පණවන ලද රාත්‍රී භෝජන සංග්‍රහයත්, භෝජනයට භාජනය වූ භාණ්ඩයන්ගේ වෛචිත්‍ර්‍යයත්, එහි දී අනුගමනය කරන්නා වූ විනය රීතියත් ඇයගේ පුදුමයට තව-තවත් කාරණ විය.

මාලිනියට ස්වකීය අභිනව ජීවිතය පිළිබඳ නියම ඓශ්වර්යය තත්ත්වාකාරයෙන් ප්‍රත්‍යක්ෂ වන්නට පටන් ගැනුණේ, මාලිගය අමුත්තන්ගෙන් සිස්ව ගිය, පසුවදා පෙරවරු කාලයෙහි ය. රාත්‍රී භෝජන සංග්‍රහයෙන් පසු ජයපාලගේ මිත්‍රයෝ සියලු දෙනා මේ අලුත් යුවළට ශුභ ප්‍රාර්ථනය කොට, එවේලේ ම විසිර ගියාහ. එහෙයින් පසුවදා, ඇයට ස්වකීය ප්‍රේමවන්ත ස්වාමි පුරුෂයා කැටුව, එහි නොයෙක් විසිතුරු බඩු හා සැරසිලි බලමින් දවස මුළුල්ල ම විශ්‍රාමයෙන් ගත කළ හැකි විය. මෙවැනි පළස්, මෙ වැනි ඇතිරිලි, කොට්ට, මෙට්ට හා තිර, ඇය විසින් කිසි කලකත්

නො දක්නා ලදි. ඇඳ-පුටු-අල්මාරි මේස වශයෙන් ද, මෙහි දක්නා ලැබෙන්නේ, ඉතා ම දකුම්කලු, ඉතා ම විසිතුරු බඩු මුලා වස්තු මය. විශාල පියානෝ දුටු කෙණෙහි, ඈ සිය පෙම්වතාගෙන් එය ගැන උදක් ම ප්‍රශ්න කළා ය. ඔහු එවිට එය වාදනය කොට පෙන්නුවේ ය. උසින් මහතින් බිත්තියට සමාන විශාල පළිඟු කැටපතකට අභිමුඛ වූ මාලිනියට ඒ තමන් බව හඳුනා ගත නො හැකිව, මේ පුදුම ගෙයි සිත්කලු සැරසිලි බලන්නට පැමිණි තවත් යුවළකැයි. ඊට රැවටී, මොහොතක් දෙකක් විස්මිප්තියෙන් ද පසු වූවා ය. ඒ තමන්ගේ ම ඡායාව බව ප්‍රත්‍යක්ෂ කළ ඇසිල්ලේ, අහෝ! ඇය ලජ්ජාවට පත් වූ හැටි! ඒ ලජ්ජාවට පත් මුහුණ කිසි දයාවක් නැතිව, නැවත-නැවත එම කැටපතින් ගෙන, ඇයට ම දක් වූ සැටි! නිර්ව්‍යාජ ඇයට, අහෝ! ඒ පුදුමයක්ම විය. ඉක්බිති මෙ තරම් විශාල දර්පණ තලයක් ඉදිරියෙහි සිට ස්වකීය දේශාලංකාරය සිත් සේ නැරඹීමට මාලිනියට මේ ලැබුණු පළමු වන ප්‍රස්තාවය හෙයින්, උදක් එය වෙනුවෙන් නතරව, එයින් ප්‍රයෝජනය ලබන්නට ද නො මැලි වූවා ය. "මේ මහත්මයා මට ආසා වුණු එක පුදුමයක් නොවේ. දැන් නම් මාත් මට ආසායි" කියා ඈ තමාට ම කියා ගත්තා ය.

මෘදු ආස්තරණ හා උපධාන සමන්විත පර්යංකයන් ගෙන් හා ශාසනාසනයන්ගෙන් මොනවට සැදුම් ලත් උඩු මහලෙහි වූ යහන් ගබඩා ඇඳුම් ගබඩා, තමන් කැමති පරිද්දෙන් මේ යුවතිපතියන් විසින් වෙන් කර ගන්නා ලදි. එකී එකී ප්‍රස්තාවයනට සුදුසු වන පරිද්දෙන් පිළියෙළ වූ මහත් ගණනක් ඇඳුම්-පැළඳුම් ඇති ජයපාල තරුණයාට නම් ස්වකීය පෞද්ගලික පරිහොගය පිණිස අල්මාරි කිහිපයක් අවශ්‍ය මය. ඇඳුම්-පැළඳුම් අතින් එක අල්මාරියකට වත් තව ම වත්-පොහොසත් කම් නැති මාලිනියට ද, එපමණ ගණනක් අල්මාරි වෙන් කරන ලද කල්හි, ඈ ඔහුගේ ත්‍යාගවත් භාවයට දොස් නගන්නාක් මෙන් "මෙ පමණ අල්මාරි මට මොටදැයි" ප්‍රශ්න කළා ය.

"මාලිනී, ඔය ගමේ-ගොඩේ නටන නැටුම් වාගේ නොවෙයි. මේ උසස් සමාජයේ නටන නාගරික නැටුම්. ඊට ඔහොම ඇඳුම්



තැම් දෙකක්-තුනක් තිබිල බැහැ. තව ටික දවසක් යන කොට, මේ අල්මාරි විතරක් නොවෙයි- ඔබ කියාවි මාලිනී, මේ ගේත් මදියි"යි තරුණයා සිනා සෙමින් කීයේ ය.

ඉඳුරු සිවිය මෙන් විනිවිද පෙනෙන සුදු මහඟු පිඟන් බඩුවලින් ද, ඝන බොල් පළිඟුවන් ඉතා ම පිරිසිදු පැහැති වීදුරු බඩුවලින් ද, පිළිබඹු නැගෙන රිදී කැටපත් මෙන් නිබඳ ඔපයෙන් බබළන රිදී බන්දේසි, කුසලාන සහ හැඳි-ගෑරුප්පු ආදියෙන් ද, මොනවට සැදුම් ලත් භොජනාගාරයත්, ගෑස් බලයෙන් ඇනමල් බඳුන්වල ඉවුම්-පිහුම් කෙරෙන මුළුතැන් ගෙයත්, පිඟන් ගලින් තළ බිත්ති හා ගෙබිම ඇති පිරිසිදු නාන කාමර ආදියත්, බල-බලා, ඈ පෙරවරුව මුළුල්ලේ ප්‍රීතියෙන් මත් වූවා ය. ඇයට පස්වරු කාලය උද්‍යාන ශ්‍රීය නැරඹීමෙන් ගත විය. මේ විශාල ගෘහය සතු අක්කර දෙකක් පමණ වූ උයන්බිම, අග්‍ර භාගය මනා සේ රොපිත විවිධාකාර පුෂ්ප පාටින්ගෙන් සැදුම් ලත් පුෂ්පොද්‍යානයකි. අපර භාගය නොයෙක් ක්‍රීඩා විශේෂයන් උදෙසා වෙන් කරන ලදි කෙළි-බිම්වලින් ද තැන තැන පිහිටි, පලතුරු ඇති තණ බිම්වලින් ද සක්මන් මළුවකින් ද, විශ්‍රාම භූමියකින් ද යුක්ත විය. ගොඩ-මඩ බිම් හැර, මෙ වැනි සම බිමක් නිකිණියාවේ කිසි නැනෑ, කිසි කලකත් නුදුටු හෙයින් තිල් විලු ද පළසක් මෙන් සම කොට, කපන ලද මෙහි සම බිම, අන් හැමටත් වඩා මාලිනියට අතිශයින් ප්‍රිය ජනක විය. "අනේ! මේවා දකින කොට, නිකිණියාවේ මිනිසුංට නම් මොනවා හිතේවි දැයි" නොයෙක් විට, සංවේගයෙන් මත් වූ තැනැත්ති තමාගෙන් ම ප්‍රශ්න කළා ය.

මල් සාත්තුවෙහි කැමති මාලිනියට මේ මල් ගොමු පෙනෙන විට, පැළයක්-පැළයක් පාසා බැඳුණු සිත් ඇති හෙයින් ඒ නිසා කල් ගත වන බවක් හෝ නො දනේ. සවස් කාලයේ, මාලිනියට නොයෙක් හිතවතුන්ගෙන් නොයෙක් තෑගි බඩු ළඟා වන්නට පටන් ගත් විට, ඒ හැම බඩුවකම "ජෝන් ජයපාල මහතා සහ එම මැතිණී" යනුවෙන් දක් වෙන නාම පාඨය නිසා ඇය කෙරේ තවත් අමුතු හැඟීමක් පහළ විය. උසස් ජන සමාජයේ නිතර-නිතර රැව් දෙන පුවත් පත්වල, නිතර-නිතර දකින්නට ලැබෙන

මේ ප්‍රෙම නාමය. දැන් තමා කෙරේ පිරීනැමෙන හැටි ඇයට ඇදහිය නොහැකි ආශ්චර්යයකි. "ජයපාල මැතිණී මෙය ඉවසීමට මා පොහොසත් ද? මෙය තනියම මා පිට පැට වුණි දින, අසරණ මාගේ කොඳ බිඳෙනු නිසැක ය"යි ඈ සිතුවා ය.

ජෝන් ජයපාලගේ ඉතා ම හිතවත් යහළුවනට පවා, රහසක්ව පැවති. මේ හිතුවක්කාර විවාහය සතියෙන්-දෙකෙන් නගරය පුරා පැතිරෙන්නේ, දනන් කුඩ-කුඩ මන්ත්‍රයක් මෙන් මැතිරෙන්නට විය. උදක් මේ විවාහ ප්‍රවෘත්තිය වෙසෙසින් ඇතුළත් කොට, කිසි ම පුවත් පතක. ලිපියක් නො පළ වූ නමුදු, ජෝන් ජයපාල අවිවාහකයකු නො වන දක්වන, නොයෙක් ලකුණු හැම පුවත් පතක ම පහළ වන්නේ ය. ඔවුනට දින පතා ම ආශිර්වාද මුඛයෙන් ලැබෙන ලියුම් ද අපමණ ය. අතරින් පතර නින්දා මුඛයෙන් ද, ලියමණක් නො ලැබෙන්නේ නො වේ. තව ද ඔවුන් දකින්නට එන හිතවතුන්ගේ සංඛ්‍යාව ද, දිනෙන් දින ම, අධික වන්නට පටන් ගැනුනෙන්, එය ඔවුන්ගේ විවේකයට බාධාවක් විය- නොහොත් සැපයට පීඩාවක් විය. "මෙ තැන, අපට සැනසිල්ලේ පසු වෙන්නට බැරි තරමට කරදරය වැඩි වේගනයි එන්නේ. යමු, අපි ටිකක් රට-තොට බලන්න." කියමින් දිනක් ජයපාල සිය පුරතලිය කැටුව දීර්ඝ පර්යටනයක යෙදෙමින් පිටත් වුණේ ය.

දින පතා, වැල නො කැඩී එන අමුත්තන්ගෙන්, මෙ සේ කලකට නමුත් ලබන නිදහස මාලිනියට නම් මහත් සැනසීමකි. ඇයට වචනයක් වත් තවම ඉංගිරිසි බැරි බව දැන-දැනත් ස්වරයක් වත් පියානෝ වාදනය බැරි බව දැන-දැනත්, ඇතැම් කාන්තාවෝ සමච්චල කරන අදහසින් ඇයට ඉංගිරිසියෙන් ආමන්ත්‍රණය කරති- ඇයගෙන් සංගීතයක් ඉල්වති. දැන් බලන කල, පියකරු සමනලයන් සේ පෙනුමෙන් අහිංසක වුවද, මේ නාගරික කාන්තාවන් කෙරේ මටසිළුටු කම් නැති පිටිසර ගැහැනුනට වඩා හෙතු ධර්මයෙන් කිසි ද අමුත්තක් නැති බව ඇයට පැහැදිලි වන්නේ ය. ඉසි සිතින් පහරක් දෙන්නට ලැබුණු තැන, විනීත වුව ද, අවිනීත වුව ද, නාගරික වුව ද, පිටිසර වුව ද, මහලු වුව ද, තරුණ වුව ද,



කුලීන වුව ද, කුලහීන වුව ද, ගැහැනියකගෙන් නම් කිසි කලකත් කිසිවකුට කිසිම සමාවක් නොලැබෙන බව දත් ඇයට ඉඳුරාම ප්‍රත්‍යක්ෂ කාරණයකි. එ හෙයින් ගමනට පිටත් වූ තැන් සිට ඇඹුලෙන් සේදෙන තඹ තලියක් මෙන් ඇය සිත දවසින් දවසම වඩ-වඩා පැහැපත් විය. දැන් ඇයට තමා හඳුනන්නකුට ඇත්තේ, නොහොත් තම වග-තුග දන්නකුට ඇත්තේ, ස්වාමි පුරුෂයා පමණකි. සඳුන් කල්කයකට බඳු සිසිල් දයාබර සිතක් ඇති හෙයින් ස්වාමි පුරුෂයාගෙන් නම් ඇයට චිත්ත සන්තාපයට හේතු වන වචනයක් හෝ නොකියැ වෙන්නේ ය. මුළු ජීවිතයට ම දෙවතාවකට වඩා ගමෙන් පිට, ඈත ගමනක් නොගිය මාලිනියට සුව පහස් දෙන ඉතා ම අලුත් මොටෝ රියක, ඉතා ම ප්‍රිය මනාප තරුණයා හා ලංකාව මුළුල්ලේ ඇවිදින්නට ලැබීම කිය නොහැකි තරම් සන්තෝෂයකි. මේ ගමන උදක් විනොදය සලකා පිටත්වුවත්, මෙ තෙක් ශ්‍රැති මාත්‍රයෙන් විනා සියැසින් දක, වැඳුම්-පිදුම් කරන අවසරයක් නො ලත්, ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථානයන් කරා එළැඹි කල්හි, ඇයගේ ස්වාමිපුරුෂයාට වඩා ඇයට නම් ඇති වූදේ ශ්‍රද්ධාතිශය භක්ති ප්‍රේමයකි. මහනුවර, කුරුණෑගල. දඹුල්ල. අනුරාධපුරය,හා පොළොන්නරුව මෙ තරම් පහසුවෙනුත්. ඉක්මනිනුත්. දකින බලාපොරොත්තුවක් ඇය තුළ, කිසි කලකත් පහළ නොවීය. මෙ පමණක් ද නොව, සේරුවාවිල, දීඝවැව හා බදුල්ලත්, තිස්සමහාරාමය හා දකුණු දිග සෙසු නොයෙක් ඓතිහාසික සිද්ධස්ථානයනුත්, ඇය විසින් මේ ගමනින් සියැසින් දක, වැඳ-පුදා ගන්නා ලදි.

ජෝන් ජයපාල බාහිර ශාස්ත්‍රාන්තරයන් පසළා වූ විශාරදයකු වුව ද, ඉංගිරිසි-රෝම-ග්‍රීක ආදි ඉතිහාසයන් විනා සිංහල ඉතිහාසය සම්බන්ධයෙන්, ලංකාව ඉංගිරිසින්හට යටත් රටක් බව පමණක් මුත්, අන් කිසිවක් ගැන සැහෙන යමක් නො දත් හෙයින්, මේ ඓතිහාසික සිද්ධස්ථානයන් කරා එළඹි කල්හි තෙමේ මාලිනියගේ අනුශාසනයෙහි පුවච කීකරු ශිෂ්‍යයකු මෙන් පිහිටියේ ය. මාලිනියට කුඩා කල පටන් ආගමානුකූල පොත-පත හා ඉතිහාසය කියවීමෙන් ඓතිහාසික සිද්ධස්ථානයක සම්බන්ධයෙන් තම සිත්හි අල්ප මාත්‍රයෙන් ඇඳී පැවති සිතුවම් සියල්ල මෙහි දී ජීවය ලැබ

පණ පිටින් මෙන් පෙනෙන්නට වූ කල්හි, ප්‍රීති ප්‍රමෝදය ඉවසා දරා ගත නොහී, එකී-එකී ඓතිහාසික සිද්ධස්ථානයක් පිළිබඳ සම්පූර්ණ වෘත්තාන්තය ඈ තම සැමියාට අතිවිස්තාරයෙන් කියා දෙන්නට පටන් ගත්තා ය. මෙ තෙක් ඇයගේ රූප සම්පත්තියට පමණක් ගරු කරන්නට පුරුදු වූ ජෝන් ජයපාල, ඇයගේ ඓතිහාසික ඥානය අතින් ද, පුරා විද්‍යාත්මක පරීක්ෂණයන් අතින් ද, වැඩුණු ප්‍රඥා සම්පත්තියට ගරු කරන්නට ද, මෙහිදී පිනට ගත්තේ ය.

දෙතුන් මසක් මෙසේ තැන-තැන කල්ගත කරමින් ඔවුන් ආපසු මාලිනිගයට පැමිණි කෙණෙහි ජයපාල සිය පුරතලියට, බටහිර උගත් කම් නැති පාඩුව පිරිමසනු පිණිස ඉංගිරිසි හා සංගීතය ඉගැන්වීමටත් උසස් සමාජයේ චාරිත්‍ර විශේෂයෙන් ප්‍රගුණ කැරවීමටත් සුදුසු. ඩැනියෙල් නෝනා නමැති ගුරුවරියක පත් කලේ ය. මාලිනිගයේ ඉංගිරිසි පොත් ගුල කියවා කවදා තේරුම් ගන්නට ලැබේවි ද යන බලවත් ආසාවෙන් පසු වන මාලිනි වහ වහා ඉංගිරිසි ඉගෙන ගැන්මෙහි උනන්දු වූවා ය.

හැකි පමණ ඉක්මනින් කොහොල් කම් දුරුකොට, සමාජ ව්‍යවහාරයෙහි අභ්‍යාස කරනු කැමති හෙයින් ජෝන් ජයපාල ඇය රැගෙන, සියලු ම රැස්වීම්-සභා-උත්සව හා ප්‍රදර්ශනයන් වෙත පැමිණෙන්නට ද මතක නැති නො කලේ ය.

කාය-ආත්ම-භොග-මන්ත්‍රණ-කුල-ප්‍රඥා ආදි වූ බල විශෙෂයන්ගෙන් සමෘද්ධ හෙයින් තරුණ ජෝන් ජයපාලටත්, මාලිනියටත්, සිහිනයකින් වත් දුකට හෝ දොම්නසට හෝ කාරණය වන කිසිවකුත් ඇති වන්නාසේ නො පෙනේ. මාලිනි ද දිනෙන් දිනම, පූර පක්ෂයෙහි වූ චන්ද්‍රයා පරිද්දෙන් කුල කාන්තාවකට අවශ්‍ය සකල ගුණ සමූහයෙන් පුහුව-මුහුව වැඩෙන්නී ය. පළමු පරිද්දෙන් යම්-යම් අය, ඇයට සමච්චල් කරනු වෙනුවට දැන් දුටු-දුටු කෙණෙහි දර්ශනය හා සමග මහත් වූ ප්‍රෙම උපදවා, ගෞරව කරති. සභාවකට ඇයගේ සම්ප්‍රාප්තිය ම මෙඝ මුඛයෙහි ගසන ලද සිය රැළි විදුලියක් මෙන් දැන් ප්‍රභා සම්පන්න ය. කවුරුත් දත්-දත් තැන-තැන, ඇයගේ අසදෘශ රූප විලාසයට



පමණක් නොව, මධුර ප්‍රගීතයට ද, සංගීතයට ද, වාග් විලාසයට ද, ස්තුති කරන්නට වූහ. සංගීතයෙහි ඇති කළ ලෙස මාත්‍රවූ අභ්‍යාසයෙන් පවා ඇය කරන පුදුම ගායනය හා වාදනය දුටු ඩැනියෙල් නෝනා නොයෙක් විට ස්තුති කරමින් මාලිනිය සංගීතය ජන්ම දායාදය කොට අද්භුත බුද්ධි සම්පන්න කාන්තාවක හැටියට පිළිගත්තා ය. තව ද, සිනිමා දර්ශනය කෙරෙහිත්, නාටක මණ්ඩපය කෙරෙහිත් අතිශයින් ම ආසක්ත වූ බැවින් ඈ ස්වාමියා කැටුව නිතර-නිතර ඒ සියල්ල බැලීමට ද යන්නී ය.

විවාහයෙන් මෙ තෙක් කල් ගත වූ නමුදු මාලිනියගේ රූපය හා ශබ්දය විෂයෙහි බැඳුණු සිත් සතන් ඇති හෙයින් එ තෙක් කල් ගත වූ බවක් නො දත් ජෝන් ජයපාලට සිය මැණියන් පවා මතක නැති විය. ඔහු දැන් ගලපිටකන්දට යන්නේ වත්, ජයපාල මුදලය සතු වැඩ කටයුතුවල යෙදෙන්නේ වත්, නොවේ. ඔහු කිහිප වරක් මාලිනියට ජයපාල මැතිණිය ගැන කතා කළ බව නම් ඇත්තකි. ඒ කතා කෙලේ ද මාලිනිය හඳුන්වා දීමට සුදුසු ප්‍රස්තාවයක් සොයන අදහසින් විනා, අන් කිසි අභිප්‍රායයකින් නො වේ.

ඔහුට මැණියන් ගැන මතක පමණක් නොව, පරණ පුරුදු මිත්‍රයන් ගැන මතක ද, ක්‍රමයෙන් යට පත් විය. මාලිනියට ප්‍රිය මනාප වූ ද, ඇයට ආදර්ශය පිණිස ආශ්‍රයට සැහෙන්නා වූ ද, ඉතාම විනීත පවුල් කීපයකට පමණක් ඔහු හිතවත් කම් දක්වමින්, ඔවුන් වරින්-වර මාලිනිගයට කැඳවා ආදරයෙන් සංග්‍රහ කලේ ය.

මෙ නයින්, මෙ සේ ඔවුහු තමන්හට ප්‍රිය මනාප දෙය පමණක් ළං කොට ගෙන, අප්‍රිය දෙය දුරින් දුරු කොට ගෙන, සැප කතාවෙන් හා කෙළි දෙළෙන් ස්වකීය විවාහ ජීවිතය පිළිබඳ මධුර සමයය ප්‍රීතියෙන් ගත කළහ. සිත් පිණවන දෙයින් සිත් පිණවමින්, නෙත් පිනවන දෙයින් නෙත් පිණවමින්, මධුර සංගීතයෙන් හා රස තෙපුලෙන් සවන් පිණවමින් පුෂ්ප මකරන්දයෙන් සුවඳ කැවුණු වාතයෙන් ආශ්වාසය ලබමින්, දිව බොජුන් සදිසි

මධුර භෝජනයෙන් ආස්වාදනය ලබමින්, සන්ධ්‍යා, පරිසර්යාවෙන් හා ක්‍රීඩා දර්ශනයෙන් සවස ගත කරමින්, සිහිනෙන් පමණවත් දුකක් නො ලැබ, වෛවාහික ප්‍රේමයෙන් මත්ව, කල් හරින ඔවුනට කවුරුනුත් පතන දිව සැපත නම් මෙය ම යයි කල්පනා විය.

එහෙත්, දිනක් ජෙරී හැරිස්ගේ අත් අකුරින් පිට නම ලියැවුණු හසුනක් තැපැලෙන් ලැබුණු කෙණෙහි, දිව සැපතට මෙන්ම තමන්ගේ මේ වෛවාහික ප්‍රහර්ෂයටත් අවසානයක් නොහොත් කාල සීමාවක් ඇතිවිය හැකි බව ජයපාල තරුණයාට පෙනුණේ ය. ජෙරී හැරිස් මඟුලට සුදුසු වචන කියන්නෙක් නො වේ. ඔහු නම්, ජයපාලට උලමකු මෙන් සුබ ලකුණු පෙන්වන්නෙකි. උලමාගේ හඬට කිසිවෙක් කැමැත්තෙන් නම් හැනුම්කන් නො දෙති. එසේ ද වුව, හඬ නම් ශ්‍රවණය විය යුතු මය. එහෙයින්, ඔහු ලියුම කඩා බැලුවේ ය. එහි සිංහලානුවාදය මෙසේ ය.

“මා හිතවත් ජෝන්,

“ඔබ හිතන තරම් මම නරක නො වෙමි. ඔබ ඇති කළ අයුතු ප්‍රේමය වෙනුවෙන් මා විරුද්ධකම් පෑ එක ඇත්තකි. ජයපාල පවුලේ නීතිඥයා වශයෙන් එහි අභිවෘද්ධියත්, ගෞරවයත් ම විසින් රැක්ක යුතු ය. එ හෙයින් මගේ යුතුකම් නිසා ඔබේ හිතුවක්කාර අදහසට මම විරුද්ධ වුණෙමි. කරුණු මේ තරම් ඉක්මනට මේ තරම් බර පතළ වෙතැයි මම නම් නොසිතුවෙමි. දැන්, වුණු දෙය නූනා කරන්නට හැටියක් නැත- හැටියක් ඇතත්, ඊට මා එකඟ නැත- එසේද වුව ජයපාල මැතිණියට නීතිඥයා වන හෙයින් මට ඇය කියන්නක් කරන්නට සිදුවේ.

“ඔබගේ විවාහය අවලංගු කරන ලෙස ඇ මට නියම කරන්නී ය. දැන් එසේ කිරීම නුවණට හුරු නැති බව මම ඇයට කීවෙමි. ඇය මගේ වචනය නොගෙන, වෙන නීතිඥයකු ලවා එසේ කරවන අදහස,ඇති කළ හෙයින්, මම අන්තිමේදී ඇයට කීකරු වුණෙමි.



“ඔබ තව ම, වයසින් අඩු බාලයෙකි. මැණියන් වයසෙහි වැඩෙන බැවින් ඇයගෙන් අවසරයක් නැතිව හිතුමතයේ විවාහයකට බැඳෙන්නට ඔබට තවම බලයක් නැත- එහෙයින් ඔබ කර ගත් විවාහය අවලංගු කරන්නට ඇයට සම්පූර්ණ බලය තිබේ. ඒ සම්බන්ධ පෙත්සම උසාවියට ඉදිරිපත් කිරීමට පළමු ඔබට මෙසේ දැනුම් දුන්නේ, මගේ හිතවත් කම නිසා බව දත යුතුයි. මෙය පෞද්ගලික ලියුමක් මෙන් සලකන හැටියට ද උදක් ඉල්ලමි.

“මීට-හිතවත්,
ජෙරී හැරිස්”

ජෝන් ලියුම කියවා, අවසන් කළ නමුත් එය අවසන් කළ බවක් මතක නැත්තේ, සිහි විමසා ගත නො හැකිව පිළිමයක් මෙන් ගල් ගැසී, මේ භයානක ලිපිය දෙස බලා ගත් ගමන් සිටියේ ය. ඔහුගේ හිස් මොලය කිත්තන් හුයෙන් බැඳ, කැටි කළ දෙයක් මෙන් දැඩි විය- රත් විය, එයින් ඔහු සිහිය යන මං නො දන, වන්නි මුඛයෙහි වැටුණු වෙඩරු පිඩක් මෙන් මිලිනව ගියේ ය. නැවත සිහිය ගමන් කර ගත හැකි වූ ඇසිල්ලේ, ප්‍රහාර වේගය බලවත් වුවද, ඔහු නැවත-නැවත දෙතුන් වරක් ම ලියුම කියවා එහි භාවය ප්‍රත්‍යක්ෂ කොට ගෙන, කටයුතු නො කට යුතු විමසන්නට විය.

මේ නම් ඔහුට දරිය නොහැකි, ඉසිලිය නොහැකි, පිඩාවකි-දුරු කර ගත නොහැකි වසංගතයකි. මෙය සිතින් ගසා දමා, ළය සැහැල්ලු කර ගන්නා බලාපොරොත්තුවෙන් නැගී සිටි නමුත්, එයින් සිත හා ළය පමණක් නොව, මිරිකුණු සර්වාංගය ම ඇත්තේ පියවරක් විතර වත් තබා ගත නොහැකිව, යළිත් ඒ තැන ම හිඳ ගත්තේ ය. කිසි කලකත්, මෙ වැනි අනර්ථයක් නො කළ-නොලත්-නුදුටු ජයපාල, මෙ බඳු අයසට පත් පුද්ගලයන් විස්තාරයෙන් දක්වන ගත් කරුවන්ගේ කියුම් සිහිපත් කොට, ස්වතන්ත්වය සාක්ෂ්‍ය කොට, ඔවුන් සත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීමට තරම් වූ බලවත් සංවෙදන ස්කන්ධයකින් මෙ වේලේ පෙළුණේ ය.

නපුරු පහරකින් පීඩාවට පත් හිසක් ඇත්තකු සේ, ඔහු විකල විය-මූඪ විය-ජඩ විය ශල්‍ය කර්මයක් උදෙසා විශෝෂධයකින් මත් කරනු ලැබුවේ, ශල්‍ය කර්මයෙන් පසුව ද, ඖෂධ මතය හැර ගත නොහැකිව, සිහි එළවා ගත නොහැකිව, ස්වප්න දර්ශනයෙන් පෙළෙන්නේ යම් සේ ද, එපරිද්දෙන් උමතු විය. මෙ වැනි භයානක විපත්තියක් අවසන් කොට ගත් හෙයින් ඔහුගේ වෛවාහික ප්‍රහර්ෂය, වැඩිහිටියන් හා රැකවලුන් ඇතිව, උදේ පටන් සවස් වන තෙක් ම නොයෙක් කෙළි සෙල්ලමෙන් හා සිනාවෙන් උයන් කෙළි කෙළ, අවසාන පැයේ දී, හසර නො දත, වල්මත් වූ ළමයකුගේ විනාශ මුඛය වෙත පැමිණීම හා සමාන බව පෙනිණි.

දුන්-දුන් ඔහුට මාලිනිය යා බඳ සාලාවේ අභ්‍යාස කරන පියානාවත්, ඇයගේ කන්කලු මධුර ප්‍රගතියත්, සිනාවත්, ගුරුවරිය අනුගමනයෙන් කියන ගීතයක මධුර ස්වරයත්, ශ්‍රවණය වේ. සිත් පිත් නැති බව මුත්, ඇති නම්, ගස්ගල්වල පවා සවන පැහැර ගැනීමට සමත් ඇයගේ ශබ්දය දුන් ඔහුට කන් කටුල්ලකි.

"අහෝ! දුන් මම ඇයට කුමක් කියම් ද? ඇයගෙන් නම් මට කිසිම සමාවක් ලැබිය නොහැකියි. දුප්පත් අසරණ තරුණිය-මම ඇය රැවටුවෙමි. විපත්තියෙහි දමුවෙමි"යි කියා ඔහු සුසුම් හෙළන්නට ද පටන් ගත්තේ ය.

ජයපාල අපකීර්තියට නම් ඉතාම භය ඇත්තේ ය. එහෙත් තමා නිසා මාලිනියට ලැබෙන අපකීර්තිය ඔහුට කෙසේ වත් ඉවසුම් නො දෙන ඉතාම බරපතළ ශෝකයකි. මැණියන් තමාට ඉතා හිතවත් හෙයිනුත්, තමා වෙනුවෙන් කොතරම් පාඩුවක් නමුත් ඉවසන්නට නො පැකිලෙන හෙයිනුත්, මෙබඳු උගුලක, හසු කොට තමා පෙළන්නට ඇය කිසි කලක නොසිතන හෙයිනුත් මැණියන්ගේ කරුණා ගුණයෙහි අචල විශ්වාසය ඇති කොට, තමා වයසින් බාල බව දන-දනම ජෝන් හිතු මනාපයෙන් මේ සැහැසි කම් කළේ ය. එහි අනිෂ්ට විපාකය නීති විරෝධී අපරාධයක වශයෙන් දුන් මෙනෙහි වන්නට පටන් ගත් කල, අපරිහාර්‍ය්‍ය නිදහස වශයෙන් තමා ලෝකයට විහිළුවක්වන බවත්, මාලිනියට බොරු කාරයකු වන බවත්, හොඳ හැටි ඔහු තේරුම් ගත්තේ ය.



මේ අතර, ඉගනීම පිළිබඳ එදිනට නියම වැඩ කොටස අවසන් කළ මාලිනී, ගුරුවරියගෙන් සමු ගෙන මිහිරි තෙපුලෙන් යුතුව, පිය සැමියා දකිනා ආසාවෙන් කන්තෝරු කාමරයට දිව ගෙන ආවාය. සැමියාගේ දුකින් මැල වුණු පඩුවන් මුහුණ ද, ඉපිළ තුණු නහර බහතින් වලඳනා ලද ශරීරය ද, මිරිකුණ වූ චක්ෂුරාදි ඉන්ද්‍රියයන් ද, දර්ශනය කළ කෙණෙහි, ඇය කෙරෙන් ද ප්‍රීති ප්‍රමෝදය විදුලි වේගයෙන් අතුරුදන් විය. සුදු මැලි වූ එතින් හා කඳුළු පිරි දෙ නෙතින් යුතුව, ඕ තොමෝ සැමියා ගෙළ වැලඳ ගෙන "මේ මොක ද? මාගේ රත්නයට අසනීපයක් වත් දැයි" යුහුව විකාළා ය.

"නෑ, මාලිනී, මට කිසි අසනීපයක් නැහැයි" ඔහු සිනා මුහුණ දක් වන්නට වෑයම් කරමින් කෙඳිරි ගෑවේ ය.

මාලිනිය, ඔහු වචන නො පිළිගත්තා නම්, නොඇසුවා නම් මේ, ඒ පළමු වන වතාවය. බලවත් චිත්ත පීඩාවකින් නොහොත් බලවත් ශරීරාබාධයකින් ඔහු පෙළෙන බව ඇයට සක් සුදක් සේ පෙනෙන හෙයින් නොයෙක් සැනසිලි බසින් ඈ නැවත-නැවතත් ඔහු විකාළා ය.

හිස කැරකීමක් වැනි ස්වල්ප මාත්‍ර වූ අපහසුව විනා, අන් කිසි මනස්තාපයක් හෝ ලෙඩක් තමාට නොමැති බව ඇත්ත යටපත් කොට, බොරුවක් ම ගොතමින් ජයපාල, නැවත-නැවතත් කීයේ ය. "ඔබ, අද උදෑසන සිටියේ කොයි තරම් සනීපයකින්ද?" දුන් ප්‍රමානයක් මුළුල්ලේ නිරාහාරයෙන් සිටියා වාගේ ඔබ සුදු මැලිය. මේක ස්වල්ප අසනීපයක් වෙන්නට බැහැ- එන්න, මා සමග කාමරයට යන්න." කියමින් මාලිනී බලෙන් ඔහු එ තැනින් නැඟුවා, වත්කම් කර ගත්තා ය.

එ සේ වත්කම් කරගනු ලැබුව ද, නැගී සිටි කෙණෙහි, රුධිර ප්‍රකෝපය කරණ කොට වලංගු නැති බවට පැමිණි දෙ කකුල් ඔහුට අමුතු බරක් මෙන් දැනෙන්නට විය. කකුල් හිරි හැර ගත් ඇසිල්ලේ, මාලිනියට හිරිහැරයක් නො වනු පිණිස, එම වහල්

බවෙන් මිදී, ඔහු ස්ව ශක්තියෙන් ම යහන් ගැබට ගමන් කළේ ය.

වෙදකු කැඳවනුවාට හෝ, අන් කිසි පිළිවෙතක් කරනුවාට හෝ, තමා නොකැමති බව වචනයෙන් පවසා, තමාට වැලඳුණු ක්ලාන්තය මග හැරෙන තෙක් සයන යෙන් පසු විය යුතු බව, ජෝන් විසින් කියන ලද හෙයින්, එම විවේක සුවයට අවකාශ දෙමින් මාලිනී කාමරයෙන් අස්ව ගියා ය.

තමා වංක හෙයින්, අවංක මාලිනියගේ මුහුණ බැලීම දැන් ඔහුට කළ නො හැකි විළි බිය නැති කමකි. එ පමණක් ද නොවේ. තිනයම පසු වන ඔහුට මේ උවදුරෙන් යම් කිසි සැනසීමක් ලැබීමට මගක් වෙතොත්, ඒ ගැන ද කල්පනා කරන්නට පුළුවන. මේ ගැන ඇත්ත මාලිනියට කියන්නට කෙසේ වත් ඔහු දිව නම් නො නැමෙන්නේ ය. එහෙයින් ම නුවණ ඔහු තමාගෙන් ම සෙවිය යුතු ය.

මේ කරන නපුරු කමට ඔහු තම මෑණියනට සිත යටින් නොයෙක් ඇවිටිලි-අවලාද කියන්නට විය. තමාගේ මතු දියුණුවටත්, දිව සැපතට බඳු පරම සැපතටත්, ශරීර සනීපයටත්, සියලු යස ඉසුරටත්, අනර්ථ කළ- බාධා කළ- තමාගේ විනාශයට අසහාය මාර්ගය අනාවරණය කළ- කාරිකාවක වශයෙන් ඔහුට දැන් තම මෑණියෝ පෙනෙති. ඔහුගේ විවාහය ගැන සැළ වූ ඇසිල්ලේ, මෑණියන් හට කෙබඳු චිත්ත පීඩාවක් ඇතිවීද යන්න ඔහු නොදත්තේ ය.

මේ සංවේගජනක ප්‍රවෘත්තිය- එ නම්, ජෝන්ගේ විවාහය- ජයපාල මැතිණියගේ සවන් ගතවූ කෙණෙහි අවට ලෝකය ඇයට අත් බමරයක් මෙන් කරකැවෙන්නට විය. දවස මුළුල්ලේ ම ඈ නිරාහාරයෙන් නිදි ගත් සැටියෙන් ඔත්පොළව ම කාලය ගත කළා ය. එදා පටන් ඇය පමණක් නොව, මුළු සමන්ගිර ම, අමු සොහොනක් මෙන් නිශ්ශ්‍රීක විය. මෙහෙකරුවෝ ද කම්මුල් අත් තබා ගත් ගමන් කම්පාවෙන් පසු වූහ.



සිය පුතණුවන් මුහුණ නො දැක, ගත කළ මෙ තුන් මස මුළුල්ලෙහි පුතා සිහි නො කොට ඇය කඳුළු නොවගුළ එක ම දිනක් වත් නොවීය. ඔහු, මාලිනිගය නම් ගෙයක සිය බිරින් දැ සමග වාසය කරමින්, ඇය කැටුව කිසි ලජ්ජාවක් නැතිව, හැම රැස්වීමක් පාසා, උත්සවයක් පාසා, යන බව දැනගත් හැටියේ ඈ තම ගමන්-බිමන් සියල්ල අත් හැර දමා, සමන්ගිර තමාට සිර ගෙයක් කොට ගෙන හැඬූ කඳුළෙන් හුදකලාව, එහි ම වාසය කළාය. ඇයගේ ස්වාමියාගේ මරණයෙන් වත්, ඇයට මෙ තරම් දොම්නසක් ඇති නොවීය.

ඈ දිනපතා ම, සමන් ගිරේ කාමරයක්-කාමරයක් පාසා ජෝන් හා සම්බන්ධ කිසවක් දෙස බලා වැලපෙන්නී ය. ඔහුගේ පුස්තකාලයට වන් විට, ඔහුගේ යහන් කාමරයට වස් විට, ඔහුගේ ව්‍යායාම ශාලාවට වත් විට, බොක්සිං තරග වලිනුත්- රේස් තරඟවලිනුත්- ඔහු දිනූ කුසලාන දකින විට, ක්‍රිකට්-ෆුට්බෝල්-රග්බී ආදි ක්‍රීඩාවලිනුත් දිනූ නැගි දකින විට, ඇයට කෙබඳු වෑයමකින් වත්, කඳුළු නො හෙළා සිටිය නො හැකි විය. "අනේ! ජෝන්, ඔබ රේස්වලට අශ්වයකු ගන්න කොට කරන සෝදිසිය-විපරම- මේ ගෑනියක ගන්නට කළා නම්, මට මෙ තරම් දුකක් නැතැයි" ඈ තනියම කියන්නී ය.

මේ වියොගය තවත් ඉවසිය නො හැකි වූ තැන- පුත්‍රයා හා තමා අතර වෙනස සමුද්‍රය මෙන් මහත් වන බව පෙනෙන්නට වූ තැන- මේ අනර්ථකාරී ස්ත්‍රියගෙන් පුත්‍රයා මුදවන්නට තවමත් කල් ඇති හෙයින්, එයින් විය හැකි පාඩුව ද නො තකා, ඕ තොමෝ පුත්‍රයාගේ විවාහය අවලංගු කිරීමට කල්පනා කළා ය. ජෙරී හැරිස් ඇයගේ මේ කල්පනාවට විරුද්ධ විය. ඊට එකඟ විය නො හැකි බව, ජෙරී හැරිස් අවසානයට මෙ සේ ද කීයේය.

"මිසිස් ජයපාල මට කියන්නේ, හිතට එකඟව කතා කරන්න නොවෙයි- කතාවට එකඟව හිතන්නයි. එහෙ ම නොවේදැයි?" ඔහු දුම් කුඩු විටක් අදිමින් ප්‍රශ්න කොට, මිසිස් ජයපාල නම් මා කරන්නේ, දැන් ඉතින් මේ සිද්ද වෙච්ච දෙය ඒ හැටියට අනුමත

කර දමන එක යි. විවාහය අවලංගු වුණා ම අසරණ ජෝංට වෙන්නේ, බලවත් හානියක්- අන්තිමට බලන කොට එයින් පිරිමැස්මක් වන එකත් සැක සහිතයි. ඔහු වයස් සම්පූර්ණ වුණු හැටියේ, ආයෙත් ඇයට ආවාහ වේවි. එතකොට ඒක නවත්වන්න පුළුවන් හපනා කවුද්දයි?" අනතුරුවත් ප්‍රශ්න කළේ ය.

කිපුණු බවක් හෝ කැලඹුණු බවක් හෝ කිසි විටකත් නොදක්වන, ජයපාල මැතිණි, "හැරිස්, ඔබ මෙහි ගෙන්නුවේ, ඔබෙන් නුවණ අහන්න නො වෙයි. මා කියන හැටියට මගේ වැඩ ඔබ ලවා කරවන්නයි. ඇහුණා ද? ඔබේ දනමුතු කම්වලින් මේ තරම් දුරට මට හරි ගියා මදැ? මාත්, ජෙරී හැරිස් වැනි කුල ගර්වයක් නැති කෙනකු නම්, මටත් නිකම් ඔහේ දුම්කුඩු උර-උරා කර බාගෙන ඉන්න පුළුවනි. රකින්නට කුලයක් නැති මිනිසුංට අවරෙන් ගියත් එකයි ඈණියෙන් ගියත් එක යි. මට එහෙ ම කරන්න බැහැ හැරිස්, මගේ වැඩ මට ඕනෑ හැටියට කරන්න ඔබ අකැමැති නම්, ඇහුණා ද? මට ඇත්තේ, ඉතින් මගේ වැඩවලට වෙන පෙරකදෝරුවකු සොයා ගන්නා එක යි." කියමින් ඈ නැගිට එ තැනින් යන්නට ගියා ය.

ජෙරී හැරිස් ආරම්භයේ පටන් ම ජයපාල බුදලයේ වැඩ කරන්නෙකි. ඔහුට එයින් සැලකිය යුතු ආදායමක් ලැබෙන හෙයින්, තැලි වළෙන් පණ කෙන්ද හැරෙතත්, මේ බුදලය නම් අත් හැරෙන්නට ඉඩ නො දෙන්නේය. වදින හෙණයක් නම්බුවට වදින්නට හැර, මඩිය ආරක්ෂා කිරීම ඇතැම් පුද්ගලයන්ගේ නිසර්ග ගුණයකි. ඔවුන්ගේ ඉෂ්ටාර්ථ සිද්ධිය පිළිබඳ රහස නම් වාසි පැත්තට හොය්‍යා කීම ය. එ හෙයින්, මේ නීතිඥයා ද ජයපාල මැතිණිය සමා කරවා ගෙන, ඇය කියන්න ලෙස වැඩ කිරීමට කැමති විය.

ජෙරී හැරිස්ගේ ලියමනෙන් ඔහුගේ අදහස් අවංක බව ජෝන්හට තේරුම් ගතහැකි විය. ස්වකීය අභිමතයෙන් නම්, ජෙරී හැරිස් මේ වැනි දෙයක් කරනු තබා සිනයකින් වත් නොසිතන බවත්, මේ ඔහු කරන්නේ, මැණියන්ගේ ම අභිප්‍රාය බවත්, එ හෙයින් මීට



සහනය මැණියන්ගෙන් ම විනා අන් කිසිවකුගෙන් නොලද හැකි බවත්, මෙහෙකරුවන් අතින් පවා නෙරෙන අපමණ වරද ඉවසන, අතවැසියන්ගේ ද නුගුණ කිසි කලකත් නොකියන ජයපාල මැතිණිය ඉදින් වැදගත් එක ම දරු කෙනකුට කෙසේ වත් ළය ගලක් කොට ගෙන දරුණු නොවන බවත්, ජෝන් විසින් අන්තිමයට සලකන ලදී. එ හෙයින් ඔහු මැණියන් දක, සහනයන් ලබන අදහසින් සමන් ගිර බලා පිටත් වන්නට සිතා ගත්තේ ය.

ඔහු සිත නොදත් මාලිනී, හුණු වැල්ලෙහි කඩා හෙළන ලද පද්මයක් පරිද්දෙන් මලානික වූ වතින් යුතුව මේ ඔහුට බැහැර කරන්නට වේලාවක් නොවන බව පෙන්වමින්, යන ගමන වළක්වන්නට වෑයම් කළා ය. නොකීකරු දරුවකු හසුරු වන මවක මෙන්, නොයෙක් කතා කියමින්, නොයෙක් උපායයන් යොදමින්, තමා හික්ම වන්නට දරන ඇයගේ වෑයම ඔහුට පුදුමයකි. ඔහු සහෝදරයකු, සහෝදරියක වැලඳ ගන්නා සේ ඇය මෘදු ආලිංගනයෙන් ගෙන, නළල හෙමින් සිඹ, ගමනට අදිසි කාරණය විමසද්දීත්, නොකියා ම, නොපමාව පෙරළා එන පොරොන්දුවෙන් එ වේලේ ම පිටත් වුණේ ය.

මධ්‍යාහ්නය සමන්ගිරට අමුත්තන් පිළිසිතියේ එන වේලාවක් නොවේ. එහෙයින් ජෝන්ගේ මොටෝරිය ගේට්ටුවෙන් කරකැවී පෝටිකෝව යට, නතර වෙන තෙක් ම සමන් ගිරේ කිසිවෙක් නො දත්හ. කලකට පසු පැමිණි ස්වාමියාගේ දර්ශන ලාභයෙන් තුල්මත් වූ බල්ලෝ කිහිප දෙනා පමණක්, ඔහු බරාඳයට ගොඩ වූ ඇසිල්ලේ වට කර ගෙන, පෙම් කෙළින්නට වූහ. දෙකන් බා ගෙන, නගුට සලමින්, ව්‍යක්ති ගත ආලම්බනයෙන් ඔවුන් දක්වන සාදරය පිළිගත් හෙතෙම ප්‍රත්‍යුපකාර වශයෙන් හිස පිරිමැද ඔවුන් සනසා අවකාශ ලත් කෙණෙහි ඇතුළට ගියේ ය.

කිසි හැලහොල්මනක් නැති සොහොන් ගෙයක ගමන් කරන්නකු මෙන්, මෙහෙකරුවකුගේ පමණ වත් මුහුණක්, නො දක, සිත සතුටු වීමට සුදුසු කිසි ම සුබ ලකුණක් නොදක මහා ශාලාදිය ඉක්මවා, ගමන් කරන ඔහුට, මැණියන් දකින්නට ලැබුණේ ප්‍රදර්ශන

කර දමන එක යි. විවාහය අවලංගු වුණා ම අසරණ ජෝංව වෙන්නේ, බලවත් හානියක්- අන්තිමට බලන කොට එයින් පිරිමැස්මක් වන එකත් සැක සහිතයි. ඔහු වයස් සම්පූර්ණ වුණු හැටියේ, ආයෙත් ඇයට ආවාහ වේවි. එතකොට ඒක නවත්වන්න පුළුවන් හපනා කවුද‍යි?" අනතුරුවත් ප්‍රශ්න කළේ ය.

කිපුණු බවක් හෝ කැළඹුණු බවක් හෝ කිසි විටකත් නොදක්වන ජයපාල මැතිනී, "හැරිස්, ඔබ මෙහි ගෙන්නුවේ, ඔබෙන් වුවණ අහන්න නො වෙයි. මං කියන හැටියට මගේ වැඩ ඔබ ලවා කරවන්නයි. ඇහුණා ද? ඔබේ දනමුතු කම්වලින් මේ තරම් දුරට මට හරි ගියා මදෑ? මාත්, ජෙරී හැරිස් වැනි කුල ගර්වයක් නැති කෙනකු නම්, මටත් නිකම් ඔහේ දුම්කුඩු උර-උරා කර බාගෙන ඉන්න පුළුවනි. රකින්නට කුලයක් නැති මිනිසුංට අවරෙන් ගියත් එකයි ඇණියෙන් ගියත් එක යි. මට එහෙ ම කරන්න බැහැ. හැරිස්, මගේ වැඩ මට ඕනෑ හැටියට කරන්න ඔබ අකැමැති නම්, ඇහුණා ද? මට ඇත්තේ, ඉතින් මගේ වැඩවලට වෙන පෙරකදෝරුවකු සොයා ගන්නා එක යි." කියමින් ඈ නැගිට ඒ තැනින් යන්නට ගියා ය.

ජෙරී හැරිස් ආරම්භයේ පටන් ම ජයපාල බුදලයේ වැඩ කරන්නෙකි. ඔහුට එයින් සැලකිය යුතු ආදායමක් ලැබෙන හෙයින්, තැලි වලෙන් පණ කෙන්ද හැරෙතත්, මේ බුදලය නම් අත් හැරෙන්නට ඉඩ නො දෙන්නේය. වදින හෙණයක් නම්බුවට වදින්නට හැර, මඩිය ආරක්ෂා කිරීම ඇතැම් පුද්ගලයන්ගේ නිසර්ග ගුණයකි. ඔවුන්ගේ ඉෂ්ටාර්ථ සිද්ධිය පිළිබඳ රහස නම් වාසි පැත්තට හොය්යා කීම ය. ඒ හෙයින්, මේ නීතිඥයා ද ජයපාල මැතිණිය සමා කරවා ගෙන, ඇය කියන්න ලෙස වැඩ කිරීමට කැමති විය.

ජෙරී හැරිස්ගේ ලියමනෙන් ඔහුගේ අදහස් අවංක බව ජෝන්හට තේරුම් ගතහැකි විය. ස්වකීය අභිමතයෙන් නම්, ජෙරී හැරිස් මේ වැනි දෙයක් කරනු තබා සිතයකින් වත් නොසිතන බවත්, මේ ඔහු කරන්නේ, මැණියන්ගේ ම අභිප්‍රාය බවත්, ඒ හෙයින් මීට



සහාය මැණියන්ගෙන් ම විනා අන් කිසිවකුගෙන් නොලද හැකි බවත්, මෙහෙකරුවන් අතින් පවා කෙරෙන අපමණ වරද ඉවසන, කතුරියන්ගේ ද හුඟක් කිසි කලකත් නොකියන ජයපාල මැතිණිය ඉතින් වැදගත් එක ම දරු කෙනකුට කෙසේ වත් ළය ගලක් කොට ගෙන දරුණු නොවන බවත්, ජෝන් විසින් අන්තිමයට සලකන ලදී. ඒ හෙයින් ඔහු මැණියන් දක, සහනයත් ලබන අහසින් සමන් ගිර බලා පිටත් වන්නට සිතා ගත්තේ ය.

ඔහු සිත නොදත් මාලිනී, හුණු වැල්ලෙහි කඩා හෙළන ලද පද්මයක් පරිද්දෙන් මලානික වූ වතින් යුතුව මේ ඔහුට බැහැර කරන්නට වේලාවක් නොවන බව පෙන්වමින්, යන ගමන වළක් වන්නට වෑයම් කළා ය. නොකීකරු දරුවකු හසුරු වන මවක මෙන්, නොයෙක් කතා කියමින්, නොයෙක් උපායයන් යොදමින්, තමා නිස්ම වන්නට දරන ඇයගේ වෑයම ඔහුට පුදුමයකි. ඔහු සහෝදරයකු, සහෝදරියක වැලඳ ගන්නා සේ ඇය මෘදු ආලිංගනයෙන් ගෙන, නළල හෙමින් සිඹ; ගමනට අදිසි කාරණය විමසද්දීත්, නොකියා ම, නොපමාව පෙරළා එන පොරොන්දුවෙන් ඒ වේලේ ම පිටත් වුණේ ය.

මධ්‍යහ්නය සමන්ගිරට අමුත්තන් පිසිත්තියේ එන වේලාවක් නොවේ. එහෙයින් ජෝන්ගේ මෝටෝරිය ගේට්ටුවෙන් කරකැවී පෝටිකෝව යට, නතර වෙන තෙක් ම සමන් ගිරේ කිසිවෙක් නො දත්හ. කලකට පසු පැමිණි ස්වාමියාගේ දර්ශන ලාභයෙන් තුල්මත් වූ බල්ලෝ කිහිප දෙනා පමණක්, ඔහු බරාදයට ගොඩ වූ ඇසිල්ලේ වට කර ගෙන, පෙම් කෙළින්නට වූහ. දෙකන් බා ගෙන, නගුට සලමින්, ව්‍යක්ති ගත ආලම්බනයෙන් ඔවුන් දක්වන සාදරය පිළිගත් හෙතෙම ප්‍රත්‍යුපකාර වශයෙන් හිස පිරිමැද ඔවුන් සනසා අවකාශ ලත් කෙණෙහි ඇතුළට ගියේ ය.

කිසි හැලහොල්මනක් නැති සොහොන් ගෙයක ගමන් කරන්නකු මෙන්, මෙහෙකරුවකුගේ පමණ වත් මුහුණක්, නො දක, සිත සතුටු වීමට සුදුසු කිසි ම සුබ ලකුණක් නොදක මහා ශාලාදිය ඉක්මවා, ගමන් කරන ඔහුට, මැණියන් දකින්නට ලැබුණේ ප්‍රදර්ශන

ශාලාභිමුඛ වූ තැන්හිදී ය. ප්‍රදර්ශන ශාලාවේ කොණේ, ස්වර්ණාලේපයෙන් බබළන විශාල ආසනයක් ඇත්තේ ය. සිංහාසනයකට බඳු මේ අලංකාර භාණ්ඩය පුරාණ කර්මාන්තයකි. පසු පසට හා දෙපසටත්, අත් ඇඳ පුවරුවටත්, කැටයම් කළ එකී පෙණය බැගින් ඇති, දරණ වැල ආසනය කොට ඇති නාග පුවරුවක් බඳු මේ මහ පුටුවේ ඈ ඉඳගෙන සිටියා ය.

පිනිබර නිලුපුල් පුවළක් විකසිත කළාක් මෙන් කඳුළු පිරී ඇ නෙත් දල්වා පුත්‍රයාගේ මුහුණ බැලූ සැටියෙන්, මේ වෙලේ ද ඇය ශෝකයෙන් වැලපෙන බව පෙනෙන්නේ ය. එක මසක් මුළුල්ලෙහි පුත්‍රයා වෙතින් බැල්මක් නො ලැබ පුත්‍ර ශෝකයෙන් පෙළෙමින් කල් ගත කළ හෙයින්, සූර්යාලෝකයෙන් වෙන්ව අන්ධකාරයකට හසු වූ පියුමක් පරිද්දෙන් ඇයගේ මුහුණ මලානික විය- රෝගාතුර විය. ජයපාල තරුණයාගේ කායබල සම්ප්‍රයුක්ත දෙහ විලාසයෙන් නොව, අඩු-පාඩුව පෙනෙන්නේ, පෙම්වත් පැහැයෙන් පමණක් හෙයින්, වලාකුළකින් වැසුණු සඳ මඬලක් සෙයින් දැන් නම් නිෂ්ප්‍රභ වුව ද, අවමංගල වස්තුවක් පරිද්දෙන් අප්‍රසාද ජනක වුව ද, ඔහු මුහුණ දක්මෙන් ඇය සිත්හි පහළ වූයේ, කුස ගිනි නිවුණාක් වැනි, පිපාසාව සංසිඳුණාක් වැනි, බලවත් ප්‍රීතියකි.

මරණයට හසු වූ රාජනායකයකු අභය ඉල්වමින් මහරාජයකු වෙත එළඹෙන්නේ යම් සේ ද, එ පරිද්දෙන් ජෝන් ජයපාල තෙමේ, පිය මැණියන් වෙත දුක් මුසු ලීලාවෙන් එළඹ, "අම්මේ, ඔබ මගේ විවාහය අවලංගු කරන්නට හදන්නේ ඇයි දයි?" බැගෑපත් හඬින් විචාළේ ය.

"ඔබේ හොඳට යි, ජෝන් ඔබට මගේ ඇති කරුණාව නිසා යි. තනි කැමැත්තට විවාහයක් කර ගන්න ඔබ තව ම මිනිහෙක් නො වෙයි- ඊට නිසියෙන් ඔබට තවම ඉඩක් නැහැ යි" ජයපාල මැතිණී සන්සුන් ලෙස පිළිතුරු දුන්නා ය.

"අම්මේ, මා කෙළේ මෝඩ කමක් නො වන බව, ඇය දුටු විට, එකවරට ම පිළිගනීවි. මේ ලොකයෙන් ම රූමත් කාන්තාව ඇය



යි. මා නම් කිසි තැනක ඇයගේ වැනි රූපයක් දුටුවේ නැහැ යි" ඔහු සන්වේගයෙන් කීයේ ය.

"මෝහයෙන් මුළා වූ තරුණ ඇසට, ඡන්දයෙන් අගතියට ගිය තරුණ සිතට, කො තරම් විරූප වැදිරියක වුවත් පෙනෙන්නේ, දෙව්ඟනක හැටියෙනැයි" ඈ ද ගණනකට නැතිව කීවා ය.

"අම්මේ, ඔබ මගේ මේ විවාහය අවලංගු කළත්, ඇයගෙන් මා වෙන් කරන්නේ තව කී කලකට ද? අවුරුද්දකින් මා නැවත නිසි වයස් වූ කෙණෙහි ඇය හා විවාහ වෙන්නෙමැයි" ඔහු මුරණ්ඩු හඬින් කීයේ ය.

"නිසි වයස් වූ විට, ඔබට වුවමනා දෙයක් ඔබ කර ගන්න. නමුත් දැන් මා වසමේ සිටින තෙක් මගේ අනුමතියෙන් වැඩ කෙරෙන්න ඕනෑ. ඇහුණා දයි?" ඈ තර්ජන ස්වරයෙන් කීවා ය.

ළය විනිවිද ගිය කඩු පහක් ඇත්තකු සේ, ජෝන් ජයපාල හදය වේදනාවෙන් ඇඹරෙන්නට විය. ජයපාල මැතිණී- මේ දවස් කල් තමා දත සිටි මැණියන් සේ නො පෙනෙන්නීය. එහෙත් පෙනෙන්නේ, ගලක් වන් හදයක ඇති, පක්ෂග්‍රාහී භාවයට නැමුණ කටයුතු පරීක්ෂා නොකොට, හැහැයි කියන, යුක්තිය නො පිළිපදින, නපුරු රැජිනියකගේ විලාසයෙනි. ඔහු බැගෑපත් අසවැස්සකු මෙන් ඇය දෙ පතුල දණින් වැටී, අත ගෙන සිඹිමින් මේ සේ කියන්නට පටන් ගත්තේ ය. "අම්මේ, ඒ තරුණිය මට කොතරම් අගය ඇති වස්තුවක් ද කියා ඔබට නො හැඟෙයි. ඇය මේ බව දැන ගත් හැටියේ- හා! සමහර විට, ශෝකයෙන් ළය පැලී මැරෙන්න පුළුවනි. මේ නිසා ඇයට, යම් කිසි හදියක් වී නම්, මරණයක් වී නම්, එදා මට මේ ලෝකය විනාශ වූ බව දැන ගත මැනවි. ඇයගෙන් හිස් වූ කල්හි, මේ විශාල ලොකයෙහි අබ පියල්ලක තරම් වත් සැපවත් තැනක් මට නම්, ඉතින් කවත් සෙවිය නො හැකි යි. ඇයගෙන් හිස් වූ කල්හි, මේ ජන බහුල ලොකයෙහි රූකඩයක තරම් වත් ප්‍රිය මනාප වස්තුවක් මට නම් ඉතින් කවත් සෙවිය නො හැකි යි. ඇය නොමැති තැන, දිවා

ලොකය වුව ද, මට නම් දිව්‍ය ලොකය නො වන්නේ ය. ඇය සිටින තැන අපායය වුව ද, මට නම් අපායය නො වන්නේ ය. ඇය සමග අත්වැල් බැඳ ගෙන, දෙව්ලොව වදින්නාසේ අපායයට වුවත් ප්‍රීතියෙන් යන්නෙමි. ඇය නම් ඔබට වත්, මට වත්, කිසි වරදක් නො කළ නිදොස් ගැහැනියකි. මේ කළ අපරාධයට, ඇය මට සාප කරනු නො අනුමානයි. මා ඕනෑ ම දඬුවමකට යටත් කොට, ඒ දුප්පත් තරුණියට නින්දා ගෙන දෙන මේ අපරාධයෙන් මා වැළකුව මැනවැයි." ඔහු යාච්ඤා කළේ ය.

හැඬුම මැඩ පවත්වා ගෙන කළ කතාවක් හෙයින් තරුණයාගේ කට හඬ, වරින් වර රළු විය- ඉකි ගසන්නක් මෙන් විය. ඔහු වේදනාවෙන් මිරිකෙන සැටි දකීම, ඔහු වෙනුවෙන් නිතර හුණු වන ලයක් ඇති ජයපාල මැතිණියට ද සන්තෝෂයක් නො වන බව ඇයගේ දෙ නෙත් මුල පැන නැඟුණු මහත් කඳුළු ගුළි වලින් ප්‍රත්‍යක්ෂ විය. ඈ ආසනයෙන් නැගිට්ටා ය- නැගිට පුතණුවන් නැඟුටුවා ගත්තා ය.

"ජෝන්, ඔබට වඩා ලොකු වස්තුවක් මටත් මේ ලෝකයේ තවත් ඇත්තේ නැති බව දන ගන්න. මා, ඔබ වෙනුවෙන් කොතරම් ආත්ම ත්‍යාගයක් කළ මවක් ද කියා ඔබට වැටහෙන්නේ නැහැ. මගේ සැපතට වඩා, මා ඔබේ සැපත යි තවදත් අගය කොට සැලකුවේ. ඔබේ සිතට අබමල් රේණුවක තරම වත් දුකක් නො දී ඔබේ දියුණුවට හැකි තාක් දෙය කරන්නට මා නිතර සූදානම් බව තේරුම් ගන්න- ආහුණා ද ජෝන්? නමුත් ඔබට වන පාඩුව සියැසින් දක-දක, ඔබ අපාය ගත වන සැටි සියැසින් බල-බලා, ඔබ එයින් මුදා ගන්නට පුළුවන්කම තිබිය දීත්, එ සේ නොකොට, ඉතින් කර බා ගෙන සිටියොත්, තමන්ගේ ඇටවලට නින්දා කළා ය කියා, මේ මිනිසුන් මට සාප කරතැයි" කියමින් මෙහි දී ඈ ජයපාල පරම්පරාවේ කුල ජ්‍යෙෂ්ඨයන්ගේ ඡායා රූප දක්වා, නැවත, "ඒ මේ කරුණු නිසා මට ඔබේ මේ හිතුවක්කාර විවාහය අනුමත කරන්නට බැහැ"යි තදින් ම කියා සිටියා ය.



ජෝන් කර බා ගත් ගමන් සිටියේ ය. ඔහුගේ යුග නෙතින් හුණු කඳුළු පමණක් වැගිරෙන්නට විය. හසරක් නො පෙනෙන මරු කතරකට පැමිණියකු සේ, නොහොත් සරණ සොයා ගිය දෙවොල, දෙවි දුවට බිලි වන මුව පොව්වකු සේ, කිසි ද අනුහරණයක් නැතිව, පසු වන ඔහුට ජයපාල මැතිණී නැවතත් මෙ සේ කීවා ය.

"ජෝන්, මට පෙනෙන්නේ, ඔය ස්ත්‍රිය කිසියම් ඉනා බෙහෙතකින් ඔබ වසඟ කර ගෙන සිටින හැඩයි. ඔව්, ඔය පිටිසර මිනිස්සු මහ හදි හූනියන් කාරයෝ ලු. ඔවුන් ඉනා බෙහෙත් කවා, සිත් බඳවා ගන්න දන්නවාලු. ඔය මායාවට අසු නො වී, ඔ පමණකින් ඇය අත් හැර දමන්න. ඇහුණා ද? අපි ඇයට ඊට සැහෙන්නක් කරමු."යි කීවා ය.

"සැහෙන්නක් කරන්න?" කියමින් මෙහිදී ජෝන් අදිසියේ ධ්‍යානයකින් අවදි වූ තැනැත්තකු සේ මහත් කොට දෙ නෙත් දල්වා, මෑණියන් මුහුණ බලා, යළි පිළිකුල් සිනින් මුව විපුළු කොට ගෙන, "චී! චී! අම්මේ තවත්, ඔය කැත කතාව මට නො කියනු මැනවි. ගැහැනියකට විරුද්ධව ගැහැනියකගේ කටින් මෙහෙ ම දෙය කියැවෙන්නේ, සිහියෙන් ද? ඇය කුලයෙන් අසම වූ පමණින් වැදගත් කම් නැති ගැහැනියකැයි නො සිතුව මැනවි. ඈ ද, ඔබ වැනි වූ ම ගැහැනියකි. ඇයට කළ යුතු එක ම සැහෙන්න, අපේ විවාහය අවලංගු නො කරන එක පමණකි. වෙන ලාභයකට සැහෙන්නියක වන්නට ඇය ඔබ සිතන විදියේ සැහෙන්නියක නො වන බව දන ගත මැනවි"යි කියා ඔහු තවත් එ තැන, සිටිය නො හැකිව, සිත් වේදනාවෙන් තව-තවත් පීඩාවට පත්ව, වෙඩි කෑ කොටියකු මෙන් පිටත් ව, මොටෝරිය තුළ වැදගෙන ආපසු එන්නට පටන් ගත්තේ ය.

# 11

සිය මැණියන්ගේ ව්‍යක්තාව්‍යක්ත ගුණාගුණ සමූහය තත්ත්වා- ලෙසක් පරිද්දෙන් සර්වප්‍රකාරයෙන් හඳුනන ජෝන් ජයපාලට මේ මොහොතේ දී ඇය කෙරේ දකින්නට ලැබුණේ, කිසි කලෙක් නුදුටු, ඒ මෙන් ම දකින්නට ද නො ලැබෙන, අතිශයින් ම නීච ප්‍රකෘතියකි. ඇයගේ සියලු ගුණාගුණයන් පිළිබඳ සීමාන්තය- ඒ නම්, කෘපණත්වයේ කෙළවර, ඉවසීමේ කෙළවර මසුරු කමේ කෙළවර, ආඩම්බරයේ කෙළවර හා හීන-දීන කම්වල කෙළවරත්, දන්නා ජෝන්හට, ජීවිත ප්‍රියාව සම්බන්ධයෙන් කළ යෝජනාව නිසා, මේ තරම් වැදගත් කම් දක්වන තම මැණියන් පවා, මනොරථයක් මස්තකප්‍රාප්ත කිරීම වශයෙන් අපමානය නමැති මඩේ කර වටක් ඉක්මවා, ගිලෙන්නට වුවත් ලජ්ජා නැති වන බව පෙනිණි. මෙයින් ද, ඕහුගේ සන්වේගයත්, සන්තාපයත්, තව- තවත් අධික විය. මාලිනිය වෙනුවෙන් කළ යෝජනාව මාලිනියට පමණක් නොව, තමාට ද කළ අන්තිම දරුණු අපහාසයක් මෙන් ජෝන් තේරුම් ගත්තේ ය. ඕහුට මැණියන් හා තවත් දුර කතාව නො රිසි වුණේත්, රිසි වුව ද, හෘදය පීඩාව නිසා එසේ කර ගත නො හැකි වුණේත් ඒ හෙයිනි.

මුදල් නැති තැන, කුලවත් කම, වැදගත් කම, උගත් කම, රූමත් කම ආදි කිසිවක කිසි වත් කමක් නැතැයි ද, මුදල් ඇති තැන, හැම වත් කම ම ඇතැයි ද සිතමින් ඉතා ම නීච මාර්ගයන්ගේ හා නින්දෝපායයන්ගේ සහායයෙන් මුදල් රැස් කරන ඇතැම් අධමයන් හා සිය මැණියන්ගේ ද වෙනසක් නැති බව ඕහුට දැන්-දැන් පෙනේ. නො එසේ නම්, මාලිනිය මුදලින් මිලයට ගැනීමට සුදුසු ගැහැනියකැයි, ඈ කෙසේ කල්පනා කරන්නී



ද මාලිනිය කෙරේ නැත්තේ. පොහොසත් කම පමණකි. උතුම් කුලවත් බව ඉතින් වැදගත් කමට අංගයක් නම්, මාලිනී ජයපාල කුමාරිකාවට වඩා ශත ගුණයෙන් අධික උත්තමාවකි. එහෙත් මුදලින් ම මිනිසෙකුගේ තරා-තිරම මනින, මුදල් ම දෙවි කොට සලකන, මුදල් හැර අන් කිසිවක අගය නොදන්නා, නොසලකන ඇගේ, නීච මිනිසුන්ගෙන් ගැවසුණු මේ වැනි සමයක, ගුණ ධර්මයක හෝ, වෛශාරද්‍යයක හෝ, සෞන්දර්යයක හෝ අගය අර එදා කුමරියගෙන් කලබල ඇති කළ, ඔල මොට්ටල පොලිස් කාරයාට මෙන් ම, තම මැණියන්හට ද නො තැඟෙන බව ඔහු තේරුම් ගත්තේ ය.

තව-තවත් දුර කල්පනා කරන කල්හි, ජෝන් හට සිය මැණියනට පමණක් නොව, තමාට ද වඩා මාලිනිය අධික ගුණ සම්පන්න උත්තමාවක බව පෙනෙන්නට පටන් ගත්තේ ය. උසස් සමාජයේ හැසිරෙන දත උගත් කම්වලින් අඩුන, විචිත්‍ර කාන්තාවන් සේ පෙනෙන කුලීන ස්ත්‍රී ජාතියෙහි පවා, ඔහු නුදුටු මරු මායමක් නැත්තේ ය. ඔහු නො ඇසූ බොරුවක් නැත්තේ ය. විවාහ ජීවිතයෙන් ගත කළ තුන් මස පමණක් නොව, තිකිණියාහට ආ ගිය කාලයෙහි දී වත්, මාලිනිය කෙරේ නම්, බොරුවක් හෝ මායමක් හෝ මිථ්‍යාවක් හෝ ඇති බව ජෝන් විසින් නො දක්නා ලදි. මැණියන් විසින් නො තරම් තැනැත්තියක සේ පිළිගැනුණු ඒ පිටිසර මාලිනියගේ ජීවිතය මෙසේ වුව ද ධනයෙන් හා කුලයෙන් පමණක් නොව, ස්වභාව බලයෙන් ම ප්‍රකර්ෂ පර්යන්තයට පැමිණි ඇයගේ විශිෂ්ට ගුණ, එම පිටිසර තරුණියට කළ බොරුව, රැවටීම, මිථ්‍යාව ගැන සලකන කල්හි, තමා පමණක් නොව, මුළු ජයපාල පෙළ ම, ඇයගේ සිය පස් කිසිත් දරන්නට වත් තරම් නො වන පිරිසක් සේ ජෝන්හට ප්‍රත්‍යක්ෂ වූයේ ය.

මෙසේ නොයෙක් කටුක සිතිවිලිලෙන් මඩනා ලද ඇත්තේ සමන්ගිරෙන් පිටත් වූ තැන් පටන් වම දකුණ පවා විමසාගත නොහැකි ව ඇතැම් තැන මඟ යන අහිංසකයන් ද සිය

මොටෝරියට යට කරන්නට ගියේ ය. ඔහුගේ අවුල් වූ හිසත්, මැල වුණු මුහුණත් තමන් තුළ පවතින කලබලය දක්වන කැටපතක් මෙනි. මාලිනිගයට යන මේ ගමන දැන් ඔහුට අපායයට යන ගමනක් මෙන් ඉතා ම කටුක ය. වැදගත් මහතකුගේ වෙසින් මෙතෙක් පෙනී සිට, අසරණ මාලිනිය මුළා කොට, භයානක අපරාධයකින් ඇය දුර්භාග්‍යයට පත් කළ නිසා, දැන් ඔහු විසින් ඇයට සිය මුවින් ම ප්‍රකාශ කළ යුතු ය. මේ කෙසේ වත් කළ නො හැකි වැඩකි. ඊට ඔහු දිව කෙසේ වත් නො නැමෙන්නේ ය. දැන-දැනම කරන ලද සැහැසි කමක් හෙයින් ඊට සාධක වශයෙන් සිය නිදහස තකා පෙන් විය හැකි යම් බඳු කාරණයක් ද නැත්තේ ය.

ජෝන් මාලිනිගයට කරකැවී එන්නේ, ඇතදී ම එහි බරාදයේ නො සන්සුන් ලීලාවෙන් ඔබ-මොබ සක්මන් කරමින්, මග බලා-බලා සිටි ස්ව ප්‍රියාව දුටුවේ ය. ඔහුගේ සිතේ කලබලය වඩ-වඩා වේගවත් විය. වඩ-වඩා වේගයෙන් දොස් නගන්නට වූ චිත්ත සන්තාන ගත සංවද්‍යත්වය කරණකොට දැවෙන හිස් මොල ඇත්තේ, උන්මත්තකයකු මෙන් ගෙට ගොඩ නැගී, මාලිනිය මුහුණ බැලීමට තරම් වත් අවංක සිතක් නැති හෙයින්, එ සේ ද නො කොට, කෙලින්ම දිව ගොස්, යහන් කාමරයට වැදුණේ ය.

සැමියා දුක් මුසු මුහුණින් යුතුව , මොටෝ රියෙන් බැස ගෙට වැදුණු සැටි දුටු පමණින්, ඔහු ගිය ගමනින් අපලය විනා සපලයක් වී නොමැති බව මාලිනී තේරුම් ගත්තා ය. වෙන දා ගෙට ගොඩ නගින විට, ඔහු මුහුණ දකුම්කලු සැරසිල්ලක් පරිද්දෙන් ප්‍රීතියෙන් බබළන්නේ ය. එහෙත් අද, කෙලින් බලන අවංක පුරුදු බැල්මෙන් ඔහු දෙ නෙත සිස් විය- මෘදු වුව ද, කාය බල වික්‍රමය දක්වන මන්ද ස්මිතයෙන් මුඛ ව්‍යඤ්ජනය සිස් විය- උසින් මහතින් සුදුසු පමණට වැඩුණු නළල් තලයෙන් ද, එසේ ම සුදුසු පමණට වැඩුණු නැහැයෙන් ද, නිකටින් ද, සුසැදි අනුභාව සම්පන්න මුඛ මණ්ඩලය ප්‍රතාපයෙන් හා ශ්‍රී විභූතියෙන් සිස් විය. ජවසම්පන්න ප්‍රත්‍යංගයෝ ගති ගුණයෙන් හීන වූහ.



ස්වල්ප වේලාවකට පසු මාලිනී ද ස්වාමියා අනුගමනය කරමින් යහන් ගැබට පිවිසියා ය. ඇඳුම්-පැළඳුම් පිටින් ම සයනයෙන් පසු වන ස්වාමියා දැක, ඕ තොමෝ හෙමින්-හෙමින් සමීපයට එළඹ, ඇය නළල් තලය පිරිමදිමින් සැනසිලි බස් කියන්නට පටන් ගත්තා ය.

“මාලිනී, මා කුණපයක්- ඔබට අත ගහන්නට වත් නො වටින කුණපයක්- ඔව්, මට අත ගසා ඔබේ පිරිසිදු අත කිලිටි නො කළ මැනවි” යයි ඔහු කෙදිරි ගාමින් කීයේ ය.

කතාවට මුල පුරන අදහසින් ඔහු මෙ සේ කීයේ වී නමුදු මාලිනී ඊට කිසි තැකීමක් නො කොට, පළමු පරිද්දෙන් සිය තෙපුල් බෙණෙමින් ඔහු සනසන්නට වූවා ය. ඉක්බිති, ජයපාල තරුණයා නැවතත් කතා කරමින් මෙ සේ කීයේ ය.

“දැන ගන්නට රහසක් ඇති තැන, එය දැන ගන්නා තෙක් ඉවසුම් නැති වීම ස්ත්‍රීන් පිළිබඳ ස්වභාවික ගුණයකි. ඉතින් මාලිනී, ඔබ පළමුවෙන් නම් මගේ මේ අදිසි සිත් තැවුල ගැන ඉස්පාසුවක් නැතිව, ප්‍රශ්න කළා මට මතකයි. එහෙත් දැන් එය ගැන කිසිවක් නො විමසා, මා සැනසීමට පමණක් ඔබ සිතන්නේ මන්දැයි?” ප්‍රශ්න කළේ ය.

“මහත්මයා, මැණියන් දකින්නට ගිය ගමනෙන් කිසි පලයක් වුණා මට පෙනෙන්නේ නැහැ”යි ඈ කඳුළු පිරි දෙනෙතින් ඔහු මුහුණ බලා කීවා ය.

ජයපාල තරුණ තෙමේ පුදුමයෙන් මහත් සේ දෙනෙත් විකසිත කොට, ඇය මුහුණ බැලුවේ ය. තමා ගියේ, මැණියන් දකින්නට බව, මැය දැන ගත්තේ කෙසේ ද යන්න, ඔහුට තේරුම් ගත නො හැකි ය.

“ඔව්, මාලිනී, මා මැණියන් බලන්න ගිය බව ඇත්ත යි. ඒ ගමනෙන් පිහිටක් නො ලත් බවත් ඇත්තයි. එහෙත් ඔබ මේ ගමන ගැන දැන ගත්තේ කොහොම දැයි?” ඔහු නැවතත් පුදුම වෙමින් ඇසුවේ ය.

"ඔබගේ මැණියන් අපගේ විවාහය අවලංගු කරන්න හදන එක, දන් මා නොදන්නවා නොවේ. ඔබට හැරිස් නීතිඥ තැන එවූ ලියුම මට දකින්න ලැබුණා ඒක මං ඩැනියෙල් නෝනා ලවා කියවා ගත්තා" යයි ඈ ඉකි ගසමින් කිවා ය.

"මාලනී, මට සමාවෙන්න, මාලිනී, මම දත දත ම ඔබට සැහැසි කම් කළ අපරාධ කාරයෙක්."

"ජයපාල මැතිණිය ඇයගේ ස්වාමි පුරුෂයාට ප්‍රේම කළාක් මෙන්, මාත් ඔබට ප්‍රේම කරන බව, ඇයට නො කීවෙහි දැයි?" ඈ ඔහුගේ කතාව නතර කරමින් ඇසුවා ය.

මෙහි දී තරුණ ජයපාල පිස්සුවෙන් මෙන් තැගී සිටියේ ය. ඔහු පිස්සකු මෙන් නොයෙක් දෙය කියවන්නට විය. ඇතැම් විට, මැණියන් හා කළ සාකච්ඡාවෙන් කොටසක් ඔහු හෙළ කෙළේය. ඇතැම් විට, මැණියන්හට මුව නො සැහෙන පරිද්දෙන් සාප කළේය. තමන් ද එපරිද්දෙන් සාප කරගත්තේ ය. මාලිනියගේ අත ගෙන සිඹිමින් තමා කළ වරදට සමාව ඉල්ලුවේ ය. ඇතැම් විට, කිසිදු කතාවක් නො කොට වේදනාවෙන් මිරිකුණේ ය.

ඔහු කතාවට සුදුසු අවස්ථාවක නොසිටි හෙයින් එය ගැන කතාව පසුවට කල් දමා, ඔහුට සාත්තු සප්පායම් කිරීමේ ඈ ව්‍යාපෘත වූවා ය. ඕඩිකොලොං ආදි සුවඳ පැන්, අයිස් හා මිශ්‍ර කොට, ඔහුගේ හිස ගල්වා, අනවශ්‍ය ඇඳුම්-පැළඳුම් ආදියෙන් ඔහු මුදා, ලෙඩකු මෙන් යහන සතපා, චිත්ත විප්ලවය දුරුවන තෙක් සයනයෙන් විශ්‍රාම ගැන්නුවා ය.

මෙදින, මාලිගය, මිනී මළ ගෙයක් මෙන් හැමටම දුඃඛිත විය. දවස් වත්, රෑ වත්, කිසිවෙක් අහරක් පමණවත් නොගත්හ. මෙහෙකරුවෝ පවා තමන් පුරුදු පුරුදු තැන්වල, මුලු ගැන්නී මනස්තාපයෙන් පසු වූහ. මාලිනී තමාට පිටුවහල් පිණිස ඩැනියෙල් නෝනා ද නතර කොට ගත්තා ය. ඩැනියෙල් නෝනා වනාහි සිංහලෙන් කතාව පමණක් තරමකට දන්නා අපරදිග සංගීතය



හා ඉංග්‍රීසි ද හොඳ හැටි උගත්, මැදි වියෙහි සිටි ගැහැනියකි. ඈ ඉතා ම කරුණාවන්ත ය. මාලිනියට නම් ඉතා ම හිතවත් ය. උසස් සමාජයේ කුමාරිකාවන්, ප්‍රතීචීන සංගීතයෙහි පුරුදු කිරීම ජීවිකා වෘත්තිය කොට ගත් මේ ගුරුවරිය මාලිනිය විශිෂ්ට ගුණ සම්පන්න ශිෂ්‍යාවක බව දැන ගත් තැන සිට, ඇයට ඉතා සැලකිල්ලෙන් වුවදෙස් දෙන්නී ය. කවදා නමුත් මේ පිටිසර තරුණිය සංගීතය නිසා පොහොසත් වන බවත්, සංගීතය ද මේ පිටිසර තරුණිය නිසා පොහොසත් වන බවත්, ඈ නිතර කියන්නී ය.

අන් හැමදාටමත් වඩා, මාලිනියට ඩැනියෙල් නෝනා මේ දුඃඛිත ප්‍රස්තාවයෙහි දී පිහිට වූවා ය. සැනසිලි බසින් ඇය තළවා ගන්නට ඩැනියෙල් නෝනා එ වෙලාවට එතැන සිටි හෙයින් මාලිනියට මේ චිත්ත පීඩාව එතරම බරපතළ නොවිය. ජෝන් කලබලයෙන් පිටත් ව ගිය තැන් පටන් මාලිනී, ඩැනියෙල් නෝනා විචාරමින් ස්වාමියාගේ මේ අදිසි විපර්යාසයට කාරණය සෙවුවා ය. ජෙරී හැරිස්ගේ ලියුම මාලිනියට තේරුම් කර දෙන ඩැනියෙල් නෝනා, අව්‍යක්ත භාෂිතයෙන් එහෙත් ඉතා පරෙස්සමෙන් එය සිංහල කළා ය. මේ ලියුම, ජෝන්ගේ නිදන කාමරයේ පලසක් උඩ තිබෙනු දැක, මාලිනිය විසින් අවුලා ගන්නා ලදි. ලියුම අවුලන විට නම්, තමා සොයන රහසට නිදානය එහි වෙතැයි මාලිනියට යටි සිතින් වත් නො සිතිණි. ඒ ගුටි ගැසුණු කර්දාසි ගුලිය කැයි සිතා, ඉවත ලන්නට අදහස් කළ නමුත්, නැවත ලියුමක් බව එනම්, ස්වාමියා නමට එවන ලද ලියුමක් බව දැක, සැක සිත් උපදවා ඩැනියෙල් නෝනා ලවා එය බලවා ගත්තා ය.

එතැන් පටන් ඇයගේ සංවේගය දියුණු තියුණු විය. තවත් ඉගීම වෙනුවෙන් වත්, ඇයට සිහිය මිඩංගු කළ නොහැකි විය. ඩැනියෙල් නෝනා, පියානාවෙන් හෝ ඇය සතුටු සිත් ගන්වන්නට වෑයම් කළා ය. ඉතා ම මධුර සංගීතයට වුව ද, දැන් ඇය සිත් නො නැමෙන්නේ ය. ඇය සිත් නිරවශේෂයෙන්, මේ හිස පිට

තඩා වැටෙන හෙණ ගුළිය කෙරෙහි ආසක්ත වන්නේ ය. මෙ තෙක් ස්වාමියා විෂයයෙහි පැවති ඇයගේ අචල භක්තිය පවත් අනුව යන වලා කඩක් මෙන් දැන් ඇය කෙරෙන් ඉගිලුම් කන්නේ ය. ජෝන්, මේ කෙළේ ඇයට යන එන මං නැති කළ සතුරු කමකැයි ඇ සිතුවා ය. මෙයින් පසු තවත් ඇයට ඔහු සමග වාසය නුපුළුවන. නැවත විවාහ වන තෙක් හෝ, ඔහු කෙරෙන් වෙන්ව වෙසෙන්නට වීම ඇයට දරිය නො හැකි දුකකි. දත් වූ කලී ස්වාමියා ම අසහාය ආරක්ෂකයා කොට ඇති හෙයින් ඉතින් ඔහු-ගෙන් වෙන්ව, ඇ කොයිබ වෙසෙන්නී ද? කඩා ගත් කඹ කොටස කරේ ඇතිව, පුරුදු ගෙදර බලා දිවන ගව දෙනක මෙන්, මේ කඩා බිඳ ගත් කසාදයෙන් පසු ඇයට නම් තවත් ගමට පා තැබිය නොහැකියි. ඇයගේ ජීවිතය සීමාව ඉක්මවා මොහොතකට රසවත් වුණා පමණකි.

ජෝන් ජයපාලගේ ප්‍රේමය වෙනුවෙන් නම් සැක කිරීමට ඉඩක් නොමැති බව ඩැනියෙල් නෝනා මෙහි දී ඇයට විස්තර කළා ය- ඔහු මෙසේ දන-දන ම කෙළේ, අපරාධයක් වුවත්, ඊට අඩුව කැටෙන්නේ මැණියන් ගෙන් හෙයින්, මැණියන් සමාකර ගැනීම අපහසු නොවන නිසා, අපරාධ සිතින් නොව ඉස්පාසු නැති කමෙන් කළ මෝඩ කමක් බවත් පෙන්වා දුන්නා ය. තව ද, ඔහු මෙසේ එක පැහැර පිටත්ව යන්නට ඇත්තේ ද මැණියන් වෙත බවත්, ඩැනියෙල් නෝනා කීවා ය. "ඩැනියෙල් නෝනා ඇදහිය යුතු කතා කියන්නකි. නො පමාව මැණියන්ගෙන් සහනයක් ලැබ ගෙන, ස්වාමියා පැමිණෙන තෙක් මාලිනිය උදක් බල-බලා සිටියේ ද එහෙයිනි.

මිරිඟුව දක-දක, දිව ගොස්, වෙහෙසට පත් මුව පොව්වකු සේ ජයපාල මැතිණිය කෙරෙන් කිසි ද සහනයක් නො ලැබ, ආපසු පැමිණි ස්වාමි පුරුෂයා දුටු කෙණෙහි ගිනි දුටු වෙඬරු පිඩක් මෙන් හුණු වූ ළය ඇති මාලිනී අස්ථාන දෝෂාරෝපණයෙන් තවත් ඔහු වෙහෙසෙන්නට නොසිතුවා ය. චිත්ත පීඩාව සන්සි-දෙන තෙක් ප්‍රිය මනාප වචනයෙන් ඔහු සනසන්නට ඇය අදහස්



කෙළේ ද එ හෙයිනි. චිත්ත විප්ලවයෙන් පසු වන සැමියා අත් නො හැර, රෑ වන තෙක් ම, ඇ ඔහුට සාත්තු සප්පායම් කළා ය. මෙ දින රාත්‍රිය ද, මාලිනිගය වාසීන්ගේ සිත් සතන් මෙන් ම, අතිශයින් කළුවර විය. සුබ ලකුණක වැනි තරුවක් වත් නො පෙනෙන තරමට අහස ද කළු වලාකුළු වලින් යුක්ත විය. වරින්වර ඉකි බිඳිමින් හඬන්නා වැනි ලොකු වැහි පොද කඩා හැළෙන වැහි වලාවක හඬ විනා, අන් කිසි ශබ්දයක් ද නො විය.

පෙර වරුවේ පටන් කුසයට ගත් අහරක් නැති වත්, සිතට ගත් සුසිව්ලි ඇති හෙයින්, එයින් මඬනා ලද ජෝන් ජයපාල පෙර යම් රැය ගතවන විට, යම්තමකට නිදි ගත් තෙනින් යුතු විය. මෙ තෙක් සිය සැමියාට නොයෙක් උවටැන් කරමින්, සමීපයෙහි ම රැ දෙමින්, සුව දුක් බැලූ මාලිනී සැමියාට නින්ද ගිය බව දැක, අලුත් වාතයෙන් වත් සිය සිත් දොම්නස දුරු කරනු පිණිස ඩැනියෙල් නෝනා සමග කතා කරමින් එළියට ආවා ය. ගුරුවරිය හා සමග කරන කතාවෙන් වත්, මාලිනිය සිත් සනසා ගත යුතුය. මේ කරදරයෙන් සහනයක් ලබනු කැමති නම් තවත් කළ යුතු වැඩක් ඇති බව ඩැනියෙල් නෝනා දුන් පිළිතුරකින් මාලිනියට පැහැදිලි විය. දිය බත් වන්නට යන්නකුට හසු වූ දඬු කඩක් නොහොත් රැහැනක් පරිද්දෙන් එය වැලඳ ගත් මාලිනී, බරාඳයේ පුටුවක ඩැනියෙල් නෝනා හිඳුව, සිය සවනට මී පැණියක් මෙන් මිහිරි විය යුතු ඒ ගුරුපදේශය විතාළා ය. ඉතාම සුළු දෙයක් වුවත්, කියන්නට පළමු ලොකු ආඩයක් ඇල්ලීම ඩැනියෙල් නෝනාගේ සිරිතකි. එහෙයින්, ඇ පුටුවේ හොඳ හැටි හරි ගැහෙමින් වාඩි වී, කකුලක් පිට කකුලක් දමා ගෙන, තනි කල්පනාවෙන් මෙන් හිස නටව-නටවා සිට, අව්‍යක්ත සිංහලෙන් කතාව පටන් ගත්තා ය.

"මාලිනී, උඹ වගේ ලස්සන ගැනිලා මන් කවදා වත් බලලා නෑ. ලන්සි ළමිස්සිලා- ඉංගිරිසි ළමිස්සිලා- කාටවත් මෙච්චර ලස්සන මන් බලලා නෑ-"

"ඒ ලස්සන වග පැත්තකින් තියෙද්දී, කොටින් කියන්නකෝ නෝනා, අදහස් කරන වැඩය." යි මාලිනී නො ඉවසිල්ලෙන්, එසේ ද වුව, සිනා සෙමින් කීවා ය.

කොතරම් වැදගත් කරුණකට වුවත්, කොතරම් ඉක්මන් කරුණකට වත්, ඩැනියෙල් නෝනා තම වරක් ඇල්ලූ ආඩය අඟලකින් වත් අඩු නොකරන්නියකි. ඒ වෙනුවෙන් කරන කතාවකට ඇය ඇහුම් කන් දෙන්නේ වත්, එසේ ඇහුම්කන් දෙන්නට ඇය එය අහන්නේ වත් නැති.

"උඹේ මූණට ලස්සන නෙමෙයි මාලිනි. උඹේ කටේ සද්දේට තමයි ලස්සණෙ, ජ්පා! මට කවදා වත් ඇහිලා නෑ. ඒක වගේ සද්දයක්. අදගේ රෑ කිවුවයි කිය ලා හිතාපන් උඹ තමයි, මෙ සෙයිලමට සිඳු කියලා නම තියනවා"

මාලිනී පුටුව පිට හිඳ ගත් ගමන් නාග ධේනුවක මෙන් එහි ඇඹරෙන්නටත්, හැරෙන්නටත්, කැරකෙන්නටත් වූවා ය. එහෙත්, ඒ, ඇයගේ ඉවසිලි නැති කම කිසිවක් ඩැනියෙල් නෝනාට නොපෙනේ. කුඩා අත් ලේන්සුවෙන් කට පිස දමා ගත් ඉක්බිති ඩැනියෙල් නෝනා නැවතත් මෙසේ කීවා ය.

"උඹ වගේ ළමිස්සිලා තමයි. වෙන රටවල්වලට එක සිංදුව කියලා. එක රෑට ලස්ස ගණනට කාසි ගන්නවා. මේ රටේත් පිරිමිලා විතරක් නොවෙයි. ගෑනිලාත් උඹට ආසයි, මාලිනී."

ඇයගේ කියවීම ඇයට සිත් සේ කියවා ගන්නට ඉඩ දී එතැනින් නැඟී යන්නට තරම් සිතක් මෙහි දී මාලිනියට ඇති විය. එසේ නැඟී ගියත්, ඇයගේ කියවීම නම් නො නවතින බව මාලිනී දන්නී ය.

"ඔව්, ඔව්, උඹට ඔක්කොමලා ආසා වෙන. මිසිස් ජයපාල, බලාපන් උඹට ආසා වෙනවා. උඹ මිසිස් ජයපාලට පලයන් පලයන් වෙලා. කියාපන් නරකාදියට තමයි ගියා මේ මඟුලට කැඩුවොත් කියලා." යයි ඩැනියෙල් නෝනා අවසානයට කීවා ය.



ඩැනියෙල් නෝනාගේ කතාවේ අවසන් කොටසට ඉතා හොඳින් ඇහුම් කන් දුන් මාලිනියට ඇය මේ කියන්නේ, අසදෘශ රූප විලාසයත් මධුර ප්‍රගීතයත්, නිසා ජයපාල මැතිණිය තමාට වසඟ කර ගත හැකි හෙයින්, ඇය වෙත ගොස් තමාත් ජෝන්හටත්, අනුකම්පා කරන හැටියට උදක් ඉල්ලිය යුතු බව පැහැදිලි විය. ඩැනියෙල් නෝනාගේ අදහස් ඉතා අවංක බවත්, ඇයට පෙනෙන්නේ ය. ඇයගේ රූපයෙන් හා කට හඬින් ජයපාල මැතිණිය වසඟ කිරීම කෙසේ වෙතත්, නියම භක්තියෙන් යුක්ත ව ස්වාමියා වෙනුවෙන් මේ යාච්ඤාව කරන්නට ඇයට බැරි කමක් නැත. ජයපාල මැතිණියට ස්වාමියා කළ යාච්ඤාව ප්‍රතික්ෂේප වූ හෙයින් ඔහු චිත්ත පීඩාවෙන් ගිලන් ව, උමතු බවට පැමිණ ලෙඩින් පසු වන බවත් කියා, ඇයගෙන් සහනයක් නොලත් කල්හි, ඔහුට අසනීප බලවත් විය හැකි බවත්, කියන්නට බැරි කමක් නැත. පිටිසර දිළිඳු ගැහැනියක වුවත්, මාලිනියට ද තම පමණට එක්තරා ආත්ම ගෞරවයක් ඇත්තේ ය. එහෙයින්, එම ආත්ම ගෞරවයෙන් කුපිත වූ සිත් ඇති ඕ තොමෝ මුහුණ ඇඹුල් කොට ගෙන, උදාසීන භාවයෙන් මෙහි දී මිරිකුණා ය.

එදා එළි වන තෙක් ම මාලිනී, ඩැනියෙල් නෝනා ගේ යෝජනාව කරන කොට වසංගත වූ සිතැඟි පිස්සියක මෙන්, අත් නොහැර ම, එය ගැන තව තවත් කල්පනා කළා ය. ඇතැම් විට, ඇය සිත මේ ගමන යන තැනට පෙළඹෙන්නේ ය. ඇතැම් විට, නොයන තැනට පැකිළෙන්නේ ය. පුතුයාට නුදුන් අභය දෙන්නේ, ඉතින් තමාට ද යන්න ඇයට දූත් ස්වතන්ත්‍රයෙන් ම ඇසෙන නිරුත්තර ප්‍රශ්නයකි. ඉදින් යම් කිසි සහනයක් ලද හැකි නම්, එය වෙනුවෙන් ජයපාල මැතිණිය වෙත යන මේ ගමන නොව, ඊට ද පහත් බැගෑපත් හැඩයක් වුවත් කරන්නට ඈ සූදානම් ය. එහෙත් සහනයක් නොලද හැකි නම්, එයින් වන්නේ, මේ ලබන්නට යන නින්දාවට තවත් නින්දාවක් එකතුවීම පමණකි. ඩැනියෙල් නෝනා, ජයපාල මැතිණිය ආශ්‍රයෙන් පවා හඳුනන හෙයින්, ඇයගේ වගතුග දන්නා හෙයින්, නො වරදින සුලු උපායක් වශයෙන් ගෙන, මේ යෝජනාව කළ බව මාලිනියට හොඳ හැටි

පෙනේ. වෙන තැරැන්නට ද දෙයක් නැති හෙයින්, වරදිනත් මේය ම තටුවුනු යයි ද, ඈ නැවත සිතුවා ය. එක ම දෙයක් ගැන නිතර-නිතර සිතන්නාහුට, නොකට නැති පුවත්, අන්තිමේ දී එය කට නැති දෙයක් සේ පෙනේ. සිහින් නිතර සිසිටක් ගැන වෙනෙහි කිරීම, එය තමන් වෙත සමීප කර ගැන්මකි- නොහොත් ආරූඪ කර ගැන්මකි. භයානක දර්ශනයක පවා නපුරු කම පෙනෙන්නේ, ඒ බලන පළමු වන බැල්මට පමණකි. නැවත-නැවත බලන ඇසට දර්ශනය පුරුදු වේ. එයින් එහි බිහිසුණු කම තුනී වේ. සැහැල්ලු වේ. සිත පිළිබඳව පමණක් නොව පසිඳුරන් පිළිබඳව ද, මේ න්‍යාය තාකටත් සාධාරණ ය- මෙ සේ මය. කරුණු මෙසේ හෙයින් මේ යෝජනාවෙන් වශංගත වූ ඇය සිතට මදින් මදව, නින්දාව තුනී වන්නා සේ පෙනිණ.

එය මුරිල්ල නො නිදා සැමියාට රැකවල් පිණිස සිටි හෙයින් ඔහු පිහිනෙන් පවා මතුරන නොයෙක් දෙය මාලිනියට ශ්‍රවණය විය. නින්ද සියලු දොම්නස් දුරු කර වන මහෞෂධයකි. ඔහු සිත් අළ සා වැදුණු දුන් පසු පහර පොහොරම් දරුණු ද යත්, නින්ද නමැති මහෞෂධයෙන් ලබන ආලේපය ඇති කල්හි පවා, එය පහ නොවන බව මාලිනියට පෙනිණි.

පහන්ව ගිය කල්හි, දවස යහපත් නියා දැක, ඈ එළියට ආවා ය. මල් බරින්, පලු බරින්, නැමී සිටි නොයෙක් තුරු පඳුරුහයෝ රැ දින වරින් වර වට, වැසි පොදෙන් අමුතු පණවත් බවක් ලැබ, මන නෙත් පොළඹමින් සිටියා හ. නොයෙක් පුෂ්ප රසයෙන් හා ඵල රසයෙන් මත්ව, රැව් පිළිරැව් දෙමින්, තුරු හිසින් තුරු හිසට තඩා බසිමින්, පැන නගිමින්, රැඟුම් රඟමින්, හැසිරෙන ගිරා-කොබෝ-කෑරල-මලිසි-බටිසි-දෙමළිසි-පොල්කිසි ආදී නොයෙක් පක්ෂි සමූහයාගෙන් උද්‍යානය ද ගැවසුණේ ය. මල් මුව රද රස බොමින් මත්ව, හැසිරෙන, භ්‍රමරාවලියෙන් පුෂ්ප පරිච්ඡේදයෝ ආකීර්ණ වූහ.

නිබද වසින වැසි ඇති සමයයක සූර්ය ප්‍රකාශයෙන් බබළන දවස තාකටත් ප්‍රීතියකි. සිත්-පිත් ඇති මිනිසුනට පමණක්



නොව, ගස්-කොළන්වලට ද, එම ප්‍රීතිය දැනෙන්නේ ය. ප්‍රීතියෙන් බබළන පැසවතුන්ගේ දර්ශනය පවා දුප්පතුන් සැපය කොට ගන්නා හෙයින්, නිබද ම දවස් කිහිපයක් වැස්සෙන් තෙමුණු උයන් වත්ත ද, මල් වත්ත ද රිදී වතුරු තුහිමින් සූර්ය ප්‍රකාශයෙන් බබළන කැවීන්, එම උයන් වත්ත හා මල් වත්ත කෙළි බිම් කොට ගෙන, ගියොතුන්, බමරුන් හා ලෙහෙනුන් රැඟුම් රඟන සැටින් දකීම දුප්පත් මාලිනියට පවා ප්‍රීතියක් විය.

මාලිනී, ජයපාල මැතිණිය වෙත යන ගමනට සිත එකඟ කර ගත් හැටියේ, ඩැනියෙල් තෝර්නාට ද ඒ පවත් කියා, තමා එන තෙක් සැමියා බලා ගැනීම ඇයට පවරා, ගමනට සූදානම් වූණ ය. ඇය, මේ සැමියාට නො දනුවත්ව යන ගමනකි. සැමියා පිබිදෙන කල්හි, මේ බඳු ගමනකට ඔහු අනුමැතිය නො ලැබෙන්නට හෝ පුළුවන. එ හෙයින් ඔහු නොවිමසා, මිත්පොලුව ගස් යටයෙන් ඔහුට එසේ පසු වන්නට හැර, ඈ මේ ගමන රහසින් යන්නට ම සිතුවා ය.

ඈ, එදා, මණිමාලිය දාටත් වඩා සැලකිල්ලෙන්, දෙවඟනන රද වන ලෙසින්, හැඳ-පැළඳ ගත්තා ය. ලේඩිත්තලු පමණ වත් පිරිසර පෙනුම් දුන් ඇය කෙරේ නොමැත්තේ ය. අභලක්-අභලක් පසා, සකල ශරීරයෙන් ම- සර්වාංගයෙන්ම- ඈ නම් දුන් නියම රූ කුමරියකි. ඇය දුටු ඩැනියෙල් තෝර්නා තමා සතුටු සිනාවකින් යුතුව, "උඹට මිට හොඳට ආස යි" කියා කීවා ය.

මේ සේ හැඳ-පැළඳ ගත් ඉක්බිති, මොටෝර් රිය පිළියෙල කොට ගෙනෙන තෙක් මාලිනී, සැමියාගේ යහන් ගැබ තුළ පිවිස, ඔහු නිදන සැටි බලා ගත් වනම සිට මෙ සේ සිතුවා ය.

"අහෝ! දුප්පත් සිතට නිංද පරම රමණීය සැපතකි. මේ, මෙ තරම් ශාන්ත සුවයක් බව, මීට කලින් නම් මම නොදත්තෙමි. අහෝ! සාමිනී, එ හෙයින් කව-කවක් සැප සේ නිංදෙන් ම පසුවුව මැනවි. නිංදෙන් පසු වන හෙයින් දුන් ඔබට මැණියන්ගේ දරුණු කමක් නො හැඟෙන්නේ ය. විවාහයක අවලංගු බවක් නො

දනෙන්නේ ය. සිහිවතුන්ගේ සතුරු සමත් හෝ මිතුරු සමත් හෝ ඔබ සිතට එල්ල නො දෙන්නේ ය. දැන් ඔබ සියලු දුකින් මිදුණා වූ සිතැත්තෙහි ය. ඔබට ප්‍රේමය හෝ ආලය හෝ ආසාව හෝ නො හැඟෙන්නේ ය. අතීතය හෝ අනාගතය හෝ, වර්තමානය හෝ නොදැනෙන්නේ ය. ඔබ දැන් සිහින් පහ වූ ජාති ජරා මරණ ඇත්තෙහි ය. මැලවුණා වූ පසිඳුරන් හා පිරිස ඇති බැවින් දැන් ඔබ ශාන්ත සුඛයට බඳු සැපයකින් පසු වන්නෙහිය. එහෙත් මේ නින්දෙන් අවදි වූ කෙණෙහි ඔබ සියලු සැපයෙන් පිරිහුණේ වන්නෙහි ය. සිහිය සමඟ පසිඳුරන්ගේ හැඟීම ප්‍රකෘතිමත් වීමෙන් සිත බල්ලන් විසින් වට කොට ගෙන පෙළනු ලබන මුව පොව්වකු මෙන් වෙව්ලන්නෙහි ය. එහෙයින් සාමිනි, මා එන තෙක් වත්, සැපයේ නිදි ගත මැනවැයි" ඈ මුළු සිහින් පැතුවා ය.

"ජෝන් ජයපාල, දවස පස්වරුවෙහි පටන් රිය මුළුල්ලෙහි සයනයෙන් පසු වුව ද, පීනෙන් හා හැඬුකින් නොයෙක් දෙය මතුරන්නට වුව ද, ඔහුට නියම වශයෙන් නින්ද ගියෙන් මේ අරුණෝදගමන වේලෙහි ය. ඔහු දැන් නම් නො සැලී සරතැවෙන බඹරයක් මෙන් බර නින්දෙන් නිදන්නේ ය. මල බැඳුණු ලෝහයක රන් නො ඇලෙන්නාසේ කරදර බැඳුණු සිතක නිදි නොලැගෙන හෙයින්, ජෝන් ජයපාලට ඒ කාලයෙහි සියලු දුක් නසන මිතුරකු ලෙසින් මත් පැන ගැන ද සිහි වූ නමුත් මේ දුසිරිතෙහි නැවත බැඳෙන කල්හි මත් පැන් නො ඉවසන මාලිනියට තමා නිසා තමත් දුකක් පැළඹෙන හෙයින්, එයින් පිහිට ලබන්නට නොකැමැති විය. ජෝන්, ප්‍රතිපත්ති පැණවීමෙහි අසල වුව ද, පණවා ගත් ප්‍රතිපත්ති රැකීමෙහි සමත් විය. මත් පැනින් හා සුදුවෙන් වෙන්වීම ප්‍රතිපත්තිය කොට ගත් ඔහුට මෙබඳු නපුරු ප්‍රස්තාවයක දී පවා එයින් වළකින්නට හැකිවීම ඔහුගේ වාසියට ගැණෙන විශිෂ්ට ගුණ ධර්මයකි. දුසිරිතක් වශයෙන් තරුණ ජෝන් ජයපාල කෙරේ පැවතුණේ, මේ දෙක පමණකි. සුරා සුදු වෙසඟන යන තුන් දුසිරිතෙහි ගැළුණු මිත්‍රයන් ඔහු ආශ්‍රය කෙළේ වී නමුදු තුන් වෙනුවට නී වෙසඟන ජෝන් මුළු හිතින් ම අප්‍රිය කළේ ය.



ගුණගොටට වුවත්. ඔහු තුළ මේ යම් නැසීමක් වී නම්, හොඳ සමාජ ස්ත්‍රීයකට අනුව තුළ ගෞරව මාත්‍රයකි. ස්ත්‍රීන් ඇති සමාජයට වඩා ඇති සමාජය නිතර ප්‍රිය කළ හෙතෙම කිසි කලෙක උදක් ම ස්ත්‍රී සේවාව නො සෙවුවේ ය. එහෙත් සෞන්දර්ය ඉතා අගය කොට ගන්නා හෙයින් සෙසු සියල්ල පසකින් තිබිය දී රූපය ම මුල්කොට සුදු මාලිනියට ආවාහ විය. එසේ විවාහ ජීවිතයට ඇතුළත් වූ ඔහුට මිත්‍රයන් හා ගත කළ ජීවිතයටත්, මත්පැන් හා ගත කළ ජීවිතයටත් ලෙසකක් නඩා අශ්වයන් හා ගත කළ ජීවිතයටත් වඩා මාලිනිය හා ගෙ තළ ජීවිතය ප්‍රියා මනාප විය. රෝස ගසට කටු ඇත්තා සේ විවාහ ජීවිතයට ද ගැහැට නැත්තේ නොවේ. දැන් විස බැදී මෙසේ වුවත් ව, පසු වන ඔහුට මේ ඇනී ඇත්තේ එයින් එක් කටුවකි.

මෙසේ නිද්‍රෝපගත වූ ස්වාමියා දෙස බලා ගත් වන ම පිට මාලිනී, ඔහු රැක්ම ඩැනියෙල් නෝනාට බාර කොට, ගමනට පිටත් ව උදේ අටට පමණ සමන්ගිරට ළඟා වූවා ය. මේ විශාල ප්‍රාසාදය දුටු කෙණෙහි, තමන් මාලිගය හා මෙහි ඇති වෙනස සැලකිය යුතු වුවත්, මෙහි අලුත් පෙනුමක් නැති වත්, ඉවසුම් නො දෙන අනුභවයක් පවතින බවත් මාලිනියට එක හෙළා ප්‍රත්‍යක්ෂ විය. විශිෂ්ට ආචාර ගුණ සමන්විත හෙයින් එහි පැමිණි මාලිනී, පිරිසිදු දුඹ වස්ත්‍රයෙන් සැරසුණු සේවකයකු විසින් ගෞරව බහුමාන පූර්වක ව, අමුත්තන් උදෙසා වෙන් කරන ලද ශාලාවට කැඳවා ගෙන යනු ලැබුවා ය. සුව පහස් දෙන ආසනයක හිඳවනු ලැබූ දෙවිසිනි, ස්වකීය විසිටිං කාඩ් පත මෙහෙකරු අත, තැටියෙහි තැබුවා ය.

මෙතෙක් යන්ත්‍ර රූපයක් පරිද්දෙන් හැසිරෙමින් කටයුතු කළ මේ සමන්ගිරේ මෙහෙකරු, තැටියට වන් විසිටිං කාඩ් පත දුටු කෙණෙහි, පුදුමයෙන් ඇස් දල්වා, මාලිනිය දෙස ඉතා විතැකමෙන් බලා සිට, නෙතුරු ව ගනු ලුවළ තද කොට ගෙන, කොන් කුඳය දුරු කොට, ඊට පවටක් මෙන් කෙළින් ගමන් කරමින් ගෘහෝදරයට වැදුණේ ය.

මාලිනියට මෙහි දී සේවය කරන ලද්දේ, මහලු ප්‍රූසේ විසිනි. නානා ප්‍රකාර වූ මහා ජන සේවක ව්‍යාපාරයකට ජයපාල මැතිණියගේ දායකත්වය සොයන නොයෙක් තරාතිරමේ කාන්තාවන් සමන්ගිරට නිතර පැමිණෙන හෙයින්, ප්‍රූසේට පළමුවෙන් පෙනුණේ, මාලිනිය එවැනි කාන්තාවක සැටියෙනි. එහෙත් සමන්ගිර, කළු වලාකුළකින්වසා, ලොකාන්තරීය වැනි අන්ධකාරයක නිමග්න කොට, එහි වාසීන්ගේ දිවා- රෑ දෙකම සාකච්ඡාවට ජ්වකීය නාමය ප්‍රත්‍යක්ෂ කළ, ඒ කැලෑ හඳ නම් මෙ යයි, නාම පත්‍රිකාවෙන් හැඳින ගත් ඇසිල්ලේ, ඔහු විසින් මේ අභිමානය දක්වන ලදී.

ප්‍රූසේ එන සැටියෙන් සමන් ගිරට පැමිණියේ, අසාමාන්‍ය පුද්ගලයකු බව තේරුම් ගත් ජයපාල මැතිණී දුර සිටම, "කවුද ප්‍රූසේ, ඒ ආවෙ?" කියා ප්‍රශ්න කළා ය.

"ජෝන් ජයපාල මැතිණී" යනු මෙහෙකරුගේ ක්ෂණික පිළිතුර විය.

ජයපාල මැතිණී තිගැස්සුණා ය. පානය පිණිස ගත් තේ කෝප්පය ද අතේ ඇතිව, දෙ නෙත් මහත් සේ විකසිත කොට ගෙන, මෙහෙකරු ඇදහිය නො හැකිව මෙන් පුදුමයෙන් බලා ගත් වන ම සිටියා ය.

"මේ කාඩ්එකේ තිබෙන්නේ, ඒ නම තමා." යයි ප්‍රූසේ නැවතත් කීයේ ය.

තේ මේසයට හිඳගත් ජයපාල මැතිණියට එයින් ඇතිවූ බලවත් පිළිකුල නිසා, මෙ වේලේ තේ පානය පවා අප්‍රිය විය. එම කාඩ් පත, සැටියෙන් සියතට ගැනීමට වත් කරම් නො වන කුණුපයක් මෙන් සලකා, ඈතට කර බලා ඒ බැල්මෙන් පවා කිලිටු වූ දෙ නෙත් ඇත්තියක සේ ඒ කෙණෙහි ම මුහුණ අහකට හරවා ගත්තා ය.

"ප්‍රූසේ! මා හැර, වෙන ජයපාල මැතිණියක තව ම රටේ ඇති වුණේ නැහැ. උඹ ඒ බව දන-දන ම, මන්ද මේක මා ළඟට



ඇරගෙන ආවෙ? මේ ස්ත්‍රියට මා දකින්නට බැරිය කියාපන්, ආයෙ යන කැනක ඇයගේ පාඩුවේ යන්න කියාපන්"යි ඈ, උදහස් වෙමින් කීවා ය.

ප්‍රූසේ ද, කිසි කතාවක් නැතිව, පූර්වොක්ත ස්වභාවයෙන් ම කොඳු ඇද-කුද හැර ගෙන, ඊයක් නොනොත් පිට පළුවක් ගමින් ගන්නා සේ කැටියක් ඊගෙන, ආපසු යන්නට හැරුණේ ය. එවිට, ජයපාල මැතිණී නැවතත් ඔහු නතර කළා ය.

"ප්‍රූසේ, එහෙ ම හිටින්, ඈ මොන විදියේ ගැනියක්ද?"

"ඉතා ම ලස්සණ කාන්තාවක්"

"මට දකින්න පැහෙන ගැහැනියක් ද?"

"මුදලක් ගෙටා ලා දකින්න කාන්තාවක්"

ජයපාල මැතිණී සිනාසුණා ය. නැවත මඳක් කල්පනා කරමින් සිට, "එහෙ නම් ඇය දකින්නට මා එන බව කියාපන්"යි කීවා ය.

විසිත්ත කාමරයේ පසු වන මාලිනියට බැලූ-බැලූ අතින් පෙනෙන්නේ, සමන් ගිරේ ශ්‍රී විභූතිය හා අනුභාවය මය. මෙහි රැඳී ගත් ඇයට හුන් තැනින් පෙලවෙන එක පවා, කල්පනාවෙන් සළ ප්‍රඥ වැඩක් සේ පෙනිණි. ජයපාල පෙළේ ආදි පුරුෂයන්හට, සිංහල, පරංගි ඕලන්ද, ඉංග්‍රීසි වැනි ආදි කාලයන්හි රජුන්ගෙන් හා රාජ්‍යයන් ගෙන් ද, තෑගි වශයෙන් ලැබුණු නොයෙක් පත්තස්, ආයුධ, දේරියන මාල හා කස්තාන ආදිය පෙනුමට තබන ලද හෙයින් කෞතුකාගාරයකට බඳු මහා ශාලාවක් ද මෙහි ඇයට එක් අතකින් පෙනෙන්නේ ය. එක් අතකින් කලා ස්ථානයක් බඳු මහ සිතියම්වලින් ගැවසී ගත් තවත් ශාලාවක් පෙනෙන්නේ ය. විසිත්ත කාමරයට ප්‍රවේශන ස්ථානය වූ ප්‍රධාන ද්වාරයට ඉහළින්, භිත්තියේ සවි වූ විශාල ඡායාරූපය අත් තැබිට ම වඩා ඇය නෙත්-සිත් පැහැර ගත් වස්තුවකි. එය වූ

තලි. ජෝන් ජයපාලගේ ජීවමය රූපය බඳු නියම පුරුෂ ප්‍රමාණයෙන් චිත්‍රිත ප්‍රතිමූර්තියකි. ජයපාල මැතිණියගේ ද ප්‍රතිරූපයක් දකිනු රිසින් ඇය පෙනෙන තෙක් මානේ ඈත මෑත බැලූ නමුත් සැබෑ සිතින් හෝ ගැනීමට සුදුසු ඒ බඳු රූපයක් අහලක පහළක නො විය. පෙනෙන පමණට වඩා නො පෙනෙන පමණ වැඩි හෙයින්, සමන්තිර නම් දෙකුන් දවසක් මුළුල්ලෙහි පරෙස්සමෙන් බැලීමට සුදුසු දෙයින් සමන්විත බව දත. එම විසිත්ත කාමරයේ විශාල කැටපත ඉදිරියෙහි හිඳ ගත් ගමන් ඈ අවසානයට සිය පිළිබිඹුව බල බලා සතුටු වූවා ය.

දෙවනත් කොට දමා, විනාශ කරන අදහසින් කුඩා බරුවක් වෙත සමීප වන මහා බලසම්පන්න යුද්ධ නෞකාවක් මෙන් ස්වකීය තේජසින් හාත්පස කම්පා කරවමින් ජයපාල මැතිණී, මාලිනිය බලා විසිත්ත කාමරයට යාත්‍රා කළ ගමන්, කිසිදු කතාවක් නැති ව පහර දී ම චාරිත්‍ර ධර්මය කොට ගත් යුද්ධ නෞකාව පරිද්දෙන් මේ ප්‍රෞඪ ස්ත්‍රී, මාලිනිය නැඟී සිටිමින් තමාට පිදූ ගෞරවය වත්, සමාචාර පිණිස දුන් අතවත්, නො පිළිගෙන, අත්‍යන්තාභිමානයෙන් ගමන් කොට, ඈතින් ආසනයක හිඳ ගත්තා ය. මේ දර්පිත ක්‍රියාවෙන් අසරණ මාලිනියට වැදුණු පහර කොතරම් බලවත් ද යත්, ඇයගේ සකල ශරීරය යතෙහි ලා පෙළන ලද තලක් මෙන් දේහ සාරයෙන් පිරිහී ගියේ ය. හීන, දීන, බා ගිය සිතින් යුතු ව, ඕ තොමෝ, මේ රුදළ මහගෙන් නම් කිසිදු අනුකම්පාවක් හෝ කරුණාවක් හෝ අනපේක්ෂ බව ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන, කිසි කතාවක් නැති ව බිම බලා ගත් ගමන් පිළිමයක් මෙන් සිටියා ය.

ජයපාල මැතිණියගෙන් බැල්මක් ලැබීමත් ඇතැම්කුට ගෞරවයක් නොහොත් සංග්‍රහයක් වන හෙයින් ද, ඈ ආසනයෙහි හිඳගත් තැන් පටන්, එක එල්ලේ බලන බැලුම් පමණකින් වත් මාලිනියට දයාවක් නො පෙන්වා, සිය නෙත් කොනින් මේ හිටි පිළිමය දෙස බලන්නට පටන් ගත්තා ය. නෙත් කොනින් බලන ගැහැනියකට පෙනෙන තරම් දෙය, දහසක් නෙතින් බලන සක් රජුට ද නො



පෙනෙතැයි කියන ලද හෙයින් මේ වංක බැල්මෙන් බලන ජයපාල මැතිණියට මාලිනියගේ ආධ්‍යාත්මික රූප කාන්තිය සිත් වූ පරිද්දෙන් නො පෙනුණා යයි කිය නො හැකි ය.

"ඉතින්, මොකද උඹේ මේ ගමනේ තේරුම? මොකද මට කියන්න තියෙන්නේ? මොනවා ද උඹට මගෙන් ඕනෑ?" යි කියා ජයපාල මැතිණී අහක බලාගෙන සිටි ගමන් ප්‍රශ්න කළා ය.

මාලිනිය හෙමින් හෙමින් මේ ප්‍රෞඪ කාන්තාව වෙත එළඹ දෙ පතුළ දනින් වැටී, යුගත් බඳවා, "මැතිණී මට අනුකම්පා කළ මැනවැයි" යාච්ඤා කළා ය.

"තරුණී, උඹේ නම කොහොම දයි?" ජයපාල මැතිණී ප්‍රශ්න කළා ය.

"මාලිනී!" යනු ඇයගේ මඳ ප්‍රත්‍යුත්තරය විය.

"හොඳයි, මාලිනී, උඹට මං එහෙ නම් නුවණක් කියන්නම්" යි තෙපලමින් ජයපාල මැතිණී මෙහි දී අපූර්ව මඳ ස්වභාවයක් ආරූඪ කොට ගෙන, මාලිනිය මුහුණ බලා, "මං උඹට මැණී සොහොයුරක් මෙන් සලකන්නම්, උදව් කරන්නම්, ඇහුණා ද? උඹට ජීවිතාන්තය දක්වා සැප විඳින්න සියලු ම කටයුතු සලසන්නම්- ඇහුණා ද? උඹ ඕහු අත් හැර දමාපන්" යි කීවා ය.

" ඔහු අත් හැර දමන්න " යනුවෙන් තිගැස්සුණු මාලිනී කණ්ඨරාවයෙන් හඬ නගා, භීතියෙන් ජයපාල මැතිණිය දෙස බලා, "අහෝ! මට ජීවිතය අත් හරින්න නියම කළ මැනැවි. මම එය ඉතා සතුටින් කරන්නෙමි" යි කීවා ය.

"එතකොට එයින් තේරුම් ගන්න තියෙන්නේ උඹ, ජෝන් අත් නො හරින එක යි - එහෙම ද?"

" ඔව් මට ඔහු නැතුව බැහැ ."

"කසාදය අවලංගු වුණු හැටියේ උඹට ඔහු නැති වෙනවා නො වේ ද?"

"ඔව්, නමුත් වයස් සම්පූර්ණ වූ හැටියේ, . මහු නැවත මා බඳිවි."

"එ හෙ නම්, උඹ එහෙම කර ගනින්. මට වැඳුම්-පිදුම් කර මෙ තැන. ළ තැවෙන්නේ මොටදැයි?" උදහස් වෙමින්, ජයපාල මැතිණි යන්නට නැගී සිටියා ය.

"මේ නො කටයුත්තෙන් ඔබගේ එකම පුත්‍රයාට ඔබ කරන්නේ, මහත් විපතකැයි" මාලිනී නැගී සිටිමින් කීවා ය.

"මගේ පුත්‍රයාට වන විපතින් මට ඔහු බේරා ගන්න පුළුවනි මට, උවමනා කෙළේ, උඹට වන පාඩුවෙන් උඹව බේරාගන්නයි" ජයපාල මැතිණී පළමු උඩඟු වෙස යළිත් ගනිමින් කීවා ය.

"ඒ කොහොම ද?"

"කැලෑ හඳ, උඹ එක්ක සැප කතාවෙන් මට කොතෙකුත් වෙලා පසු වෙන්න පුළුවන් කමක් නැහැ. උඹ තවත් ඉතින් මා සොයා එන්න එපා. ඇහුණා ද? උඹට ඉතින් යන්න පුළුවනි" කියා මේ රදළ මහගේ, ඉතුරු පණ ටිකත් අසරණ මාලිනිය කෙරෙන් බැහැර කොට දමා, දිග් විජය කළ රැජිණියක මෙන් කර නගා ගෙන යන්නට ගියා ය.

# 12

මාලිනිය, ජයපාල මැතිණිය වෙත ගියේ, නො කැමැත්තෙන් වුව ද, බලවත් අදහසක් ඇතිව මය. පුත්‍රයා උදෙසා නො සැලෙන කඳුළු ඇති මේ උණහපුළු දෙන, ඉදින් අන් කවරකු උදෙසාවත් කඳුළු නො සලන බව මාලිනී නිසැකයෙන් දන්නී ය. ජයපාල මැතිණිය තමාගේ අසහාය නෙත්‍රයට බඳු පුත්‍රයාට නුඹුන් පැනසිල්ල, මේ සියලු අනර්ථයට උපස්තම්භක වූ තමාට නම් තිසි කලකත් නො දෙන බවත්, එහෙත් ඇයගෙන් අන් කිසිවක් ලබා ගත නො හැකි නැන. ඇහුම්කන් විතරක් නමුත් ලබාගත හැකි වී නම් එ පමණක් ප්‍රයෝජනවත් විය යුතු බවත්, මාලිනී කල්පනා කළා ය. එ කල මාලිනිය විසින් කිය යුතු තාක් දෙය සිත් වූ පරිද්දෙන් කියන්නට ද යෙදෙන්නේ ය. තමාට ඇහුම්කන් තබා, මේ අහංකාර රදළ මහගේ කෙරෙන් අවංක බැල්මක් විතර වත් නො ලැබුණු හෙයින්, ඒ පාඩුව කටුවලු කතාවෙන් තමා වෙහෙසන නෝක්කඩුවෙන් එකට එක කරන, තිකිණියාන වැසි නුගත් නො හික්මුණු ග්‍රාමිකයන්ගේ හිංසාවට තබා, දෙහ පීඩාවෙන් ද මනස්තාපයෙන් ද, අපමණ දරුණු ලෙස තමා වෙහෙසූ පොලිස් කාරයාගේ අයුතු කමටත් වැඩි, අතිශයින් ම බලවත් පාච්චලයක් ලෙස මාලිනී සිතුවා ය. ගම්මු තමන් රළු-කරළු හෙයින්, පොලු පහරවල් වැනි රළු-කරළු ඇනුම්-බැනුම් කියතත්, ඒ හැමට ඉවසුම් දීම ඇයට අපහසුවක් නොවේ. අපහසුව, සමාජ චාරිත්‍රයනට ද පිටු නො පා, තමා සමන් ගිරට පිළිගනිමින් ඇහට නොදනී, හද වත පහරමින් ජයපාල මහගේ දූත් තියුණු කිනිසි පහර වැනි, අනාදර පූර්වක සාවමානයට ඉවසුම් දීමය. ජයපාල මැතිණිය පටන් ගැන්මේ දී නම් මෘදු භාෂිතයෙන් සදයාවත් වර්ණ

කථනයකට සූදානම් වුව ද එයත් අවංක සිතින් නොව, තමා වසඟ කරන ලෙසින් දෙ උපායක් බව දූත් දූත් මාලිනියට කල්පනා වේ.

ජෝන් ජයපාලගේ දුඃඛිත ස්වභාවය තත්ත්වාකාරයෙන් හෙළිපෙහෙළි කළ ඉක්බිති, මවක සතු අභිමතය පරිද්දෙන් පුත්‍රයාට සෙත් විය යුතු දයාව නම් නම් දයාව- උදහස නම් උදහස- බාධාවක් නැතිව ම, ජයපාල මැතිණියගේ අගති විරහිත විචාරණයට භාජන කිරීම මාලිනියගේ අධිෂ්ඨානය විය. එහෙත් මේ අධිෂ්ඨානයට අනුව වැඩ කර ගැන්මෙහි පොහොසත් වූ තැනැත්තී, තමා ජයපාල මැතිණියගෙන් ඇහුම්කන් ලබනු වෙනුවට ජයපාල මැතිණියට ඇහුම්කන් දී විපිළිසර සිතින් හා හිස් අතින් ද ගෙදර පැමිණියා ය.

මාලිනියට වන පාඩුව නිසා කකියන ළය ඇති මවක මෙන් පිහිට වන බව කියා, ජයපාල මැතිණිය තම පුත්‍රයා අත් හර වන පරිද්දෙන් කළ යෝජනාව නිහීන උපහාසයක් ගර්භ කොට ඇති බව මාලිනිය දැන ගත්තේ, ජෝන් කීවාට පසු ය. ගමනට පිටත්ව යන කල්හි නම්, මෙයින් සහනයක් ලැබුණත්, නො ලැබුණත්, මේ ගමන, සිය හිමියා කෙරෙන් රහසක්ව රැක ගත යුතුයයි මාලිනිය විසින් සිතන ලදි. එසේ ද වුව, සෙසු සියලු ගුණයෙන් කොතෙක් සමෘද්ධ වුවත් කරුණා ගුණයෙන් අතිශයින් අසමෘද්ධ වූ ජයපාල මැතිණියගේ ඒකාග්‍ර චිත්තයෙන් කළ අසභ්‍ය නිග්‍රහයෙන් වෙහෙසට පත් තැන් සිට, පරහට දුක් ගැනවිලි කියාත් සැහැල්ලු කර ගැනීම සිරිත කොට ඇති මාලිනී, තමාට ඉතා ම හිතවත් සැමියා හෙයින්, සැමියා වෙත ම ගොස්, සිදු වූ පවත් සියල්ල විස්තර කොට, සිත සනසා ගැනීම යෙහෙකැයි නැවත කල්පනා කළා ය. එ සේ කල්පනා කොට, ගුරුවරිය හා සාකච්ඡා පවත්වා, ගුරුවරියගේ විශේෂෝපදේශයෙන් ජයපාල මැතිණිය වෙත තමා ගිය බවත්, මාලිනිය ඉකි බිඳ-බිඳ හඬමින් පවසන්නට වන් කල්හි, නිද්‍රා සුඛයෙන් මදක් සයනය වූ ජෝන් ජයපාලගේ සිත් සතන් ලුණු අල්ලන ලද වණයක් මෙන් යළිත් පැරෙන්නට පටන් ගත්තේ ය.



“ඔබ මොකට ද මාලිනී ගියේ? මා දන්නවා නම් කවදා වත් ඔය ගමන යන්න දෙන්නේ නෑ. ඔබ මගෙන් නැහුවේ මන්දයි?” ඔහු වගපල ද කියන්නට විය.

ආත්මාර්ථයෙන් ද, අභිමානයෙන් ද, අන්ධ වූ දෙ නෙත් ඇති හෙයින්, තම වාසිය විනා අන් කිසිවක් නො දකින ජයපාල මැතිණිය. අසරණ මාලිනියට කළ නොහොබනා යෝජනාව ගැන විස්තරය ජෝන්හට ශ්‍රවණය වූ කෙණෙහි, මැණියන්ගේ මහා ජන සේවක ව්‍යාපාර විශේෂයන් කෙරෙහි සිත් දූන් සදාචාරාත්මක ගුණ ධර්මයට නිගා කරමින් ඔහු සිය මුහුණ දහර වැටුණු මස් ගොබයෙන් හා ඉපිළ නැගුණු නහර වැලින් යුක්ත වන තෙක් අවලාද කරන්නට විය. කාරණයට නො පිහිට වූ, මේ ගමන කරණකොට මාලිනියට මෙන් ම ජෝන්හට ද සැලසුණු එක්තරා යහපතක් ද නැත්තේ නොවේ. මෙය නිසා, පැමිණි දුක් පැණි රසය යන ජනාලාපයට අනුව, එන් සිත් සිතා ගෙන. නො වැළැක් විය හැකි මේ දරුණු විපතට සමඟියෙන් නො බියව මුහුණු දෙන්නට ඔවුහු සම්මත කර ගත්හ. එහෙත් ඇසූ දුටුවන් සිත් සතන් පැහැර ගත් මාලිනිගයේ පෙර පැවති වාග්විෂයාතික්‍රාන්ත වූ උත්සව ශ්‍රීය දැන නම් දක්නා නො ලැබේ. එසේ ම නීතිඥ හැරිස්ගේ මාරාත්මක ලියුම ලැබුණු දා පෘථිවි කම්පාවක් පරිද්දෙන් එහි ඇති වුණු භයානක විප්ලවය ද, තවත් හට නො ගත්තේ ය. එහෙත් රට පුරා පැතිරෙමින් දනන් තුඩ තුඩ පැවති ජයපාල මාලිනී විවාහය කොළඹ දිස්ත්‍රික් අධිකරණයෙන් අවලංගු වූ දින ද, යළිත් මාලිනිගය අවමඟුල් ගෙදරක් මෙන් නොහොත් වලාකුළකින් වැසුණු සඳ මඬලක් මෙන් නිඃශ්‍රීක විය. එදා මේ මලානික ගෙදර වැසි මලානික අතවැසියෝ ද, තමන් එහතුට එකකු නො පෙනෙන පරිද්දෙන් මුලු ගැන්නෙමින්, එකී එකී තැනැත්තහු, හිස පිට කඩා වැටුණු මහ මෙර වන් විපතක් ඇති සෙයින් තැන-තැන කම්පා වූහ.

අවලංගු වූ විවාහය කරණ කොට සිතින් අඩාල-නිවට-අසරණ-හිස් බවට පැමිණි මාලිනී, හුදෙකලා තැනැත්තියක බැවින් හුදෙකලා

වාසයට කැමතිව, වෙඩි කෑ සිංහියක සිය ගිරි ලෙන සොයා සැඟවෙන්නට යන ගමන් ඇති සේ, සිය යහන් ගැබ තුළ වැද, තනියම දවස ගත කළා ය.

ඇයට දැන් නීතියට පිළිගැනෙන ස්වාමි පුරුෂයෙක් නැත්තේ ය. නීතියට පිළිගැනෙන විවාහ ජීවිතයක් නැත්තේ ය. ශිෂ්ටත්වයට පිළිගැනෙන තරුණ බවක් නැත්තේ ය. මෙ තෙක් තමාට නිති ප්‍රකාර ස්වාමියාව සිටි- ආරක්ෂකයාව සිටි- ජෝන් ජයපාලට අයිති කම් කියන්නට තවත් ඇයට කිසි ද යුතු කමක් නැත්තේ ය. තමාට ජෝන් ජයපාල සතු කොට දුන් මේ නීතිය ම, ජෝන් ජයපාල වෙත සෙවණ සොයා තමා පිටත් කළ මේ නීතිය ම, දැන් ඔහුගෙන් තමා වෙන් කරන්නේ ය- අන්‍යොන්‍යයන් කැමති වත්, එක් වෙන්නට ඉඩ නො දෙන්නේ ය. මේ භයානක නීතිය- නෙතමනයක් හෝ දයාවක් හෝ නැති දුෂ්ට නීතිය- සිය ගමෙන් ද සිය පවුලෙන් ද, තමා අස් කර දැම්මේ ය- පුරුෂයකුට විවාහ කර දැම්මේ ය- යළි විවාහයෙන් අස් කර දමා, පළමු පැවති නමත් නැති කර දැම්මේ ය. අභාග්‍ය ප්‍රපාතයට හෙළුණු හෙයින් තවත් ඉතින් මේ දිව්‍ය ප්‍රාසාදයක් වැනි මාලිනීගෙයට තමා සතු අයිතියක් ද නැත්තේ ය. දැන් ඉතින් එක් රැයක් නමුත් මෙහි ගත කිරීම පර පුරුෂයකු හා පසු වීම වැනි චාරිත්‍ර විරෝධි දුශ්චරිතයකි. එ හෙයින්, දැන් ම සුදුසු පිළිවෙළක් යොදා ගත යුතු යයි. ස්වකීය විවාහය අවලංගු බවට පැමිණි යථොක්ත මාරක දින, අපර භාගයෙහි ම මාලිනී සලකා ගත්තා ය.

මාලිනිය නො දැක- මාලිනිය හා කතා නො කොට- මාලිනියගේ සමාගමයෙන් තොරව- පැයක් ගත කිරීම සූර්‍යාලොකයෙන් හා වාත ඉස්කන්ධයෙන් තොර වූ අපායක අඳුරු කපක් ගෙවන්නා වැනි දුකක් කොට සලකන ජෝන් ජයපාල විවා නිරස්ත වූ මේ අවමංගල දිනයෙහි නම් ඇයට පෙනෙන අසලක වත් නො සිටියේ ය. ලලිත මොහනයෙන් මත්ව, අනුන් දැක නම් කොහෙත් ම නො දැන, තමන් වරද නම් දැන-දැන ම, දැක-දැක අත් නො හළ, නැණ හීන තරුණ ස්වාමියාගේ දැන් වාසයක වගක් වත්, තරන



දෙයක් වගක් වත්, මාලිනී නොදන්නී ය-නො සොයන්නීය. එහෙත් මාලිනිය වෙඩි කෑ, කොටි දෙනක මෙන් රෞද්‍ර විලාසයෙන් යහන් ගැබ ගිරි ලෙන කොට ගෙන, හුදකලාව ම වෙසෙන බව ජෝන් ජයපාල නම් දන්නේ ය. ජෝන් ජයපාල ආත්මාක්‍රොශයෙන් පරිපීඩිත වූ සිතැත්තේ, ඇවැත් දෙසීමට ප්‍රස්තාවයක් සොයන්නේ, කිහිප වතාවක් ම සොවින් පෙළෙන මාලිනිය හා කතාවේ යෙදෙන්නට සිතු නමුත්, තත්ත්වය නො දන්නා හෙයින් ඇයගේ උදහසට බියෙන් එසේ නො කළේ ය. එහෙත්, මේ මන්ද භාග්‍ය දින, සවස, අදිසියේ ම මාලිනිය විසින් කැඳවනු ලැබූ හෙතෙම සාමි දුවකගේ නියොගයට අවනත වන සුවච අතවැසියකු මෙන් නො පමාව ගොස්, ඇය බැහැදැක සිටියේ ය.

“මහත්මයා, මා ඉතින් යන්න ඕනෑ”යයි ඈ, ඔහු දුටු හැටියේ කීවා ය.

“කොහේ යන්න ද මාලිනී?” යන ප්‍රශ්නයෙන් යුතුව, හෙතෙම සොවින් ද, නොමනාපයෙන් ද පීඩිත වූ ඇය වෙත සැනසීම නමැති අමෘතය ගෙනෙන්නකු මෙන් සමීප විය.

මාලිනී ද කොපයෙන් ඔහු ඉවත පන්නා ගනිමින්, “මහත්මයා, මේ අපට ලලිත මොහනයෙන් හැසිරෙන්න වේලාවක් නො වෙයි. මට ඉතින් තවත් එක රැයක් වත් මේ ගෙදර නවතින්න නො හැකි බව මහත්මයාට නො පෙනෙන්නේ දැයි?” වේගයෙන් ඇසුවා ය.

“ඇයි, ඇයි?” කියා තරුණයා ද පසු බැස සිටිමින් ප්‍රශ්න කළේ ය.

“මේ මගේ ගෙයක් නො වෙයි” ඈ පූර්වොක්ත ස්වභාවයෙන් ම නෙපලා ය.

“මේ ඔබේ ගෙයක් තමයි මාලිනී. ඔබට යන්න වෙන තැනක් නැහැ. එ හෙයින් මෙ තැන නවතින්න. මම-මම- අද ම දැන් ම මෙයින් පිට වෙන්නම්”යි ඔහු කීයේ ය.

අනතුරුව, ඇය සිත්නො රිදවා ඉතා ම හිතවත් ලීලාවෙන් කැඳවා ගෙන, කන්තෝරු කාමරයට ගොස්, ගෙදරින් එදා ම පිට මං වන සිතින් තමා සූදානම් වන සැටි ඔහු ඇයට පෙන්නුවේ ය.

ජෝන් ජයපාලට වයස් සම්පූර්ණ වෙන්නට තවත් ඇත්තේ, අවුරුද්දකුත් දෙ මාසයකි. ඒ කාල පරිච්ඡේදය තුළ, තමා නැතිවත්, සියලු වැඩ සිරිත් ලෙස මාලිනියට කර කියා ගැනීමට ඔහු කල් තියා ම පිළිවෙල යෙදුවේ ය. ඔහු විසින් මාලිනියගේ බද්ද ඇය නමට පවරන ලදි. තමා අවුරුද්දකුත් දෙ මසකින් ඔහු නැවත පෙරළා, එහි එන තෙක් මාලිනියට ආරක්ෂාවටත්, ඉගැන්වීමටත්, තනියටත්, ඇය සමඟ, එහි ම පසු වන පිණිස උදක් ඩැනියෙල් නෝනා යොදනු ලැබුවා ය. තමා නැති අතර, මෙහෙකරු ජනයාට වැටුප් ගෙවීමටත්, පෞද්ගලික වියහියදම් වලට ගැනීමටත්, සෑහෙන පමණ මුදල් මාලිනිය වෙනුවෙන් බැංකුවක තැන්පත් කරන් ලදි. ඒ සියල්ල මෙ සේ කොට, තමා එදා ම, මාලිනියගෙන් පිට මං වීමට ඇඳුම්-පැළඳුම් පවා අසුරන සැටි ද, ඔහු ඇයට පෙන්නුවේ ය.

ඔවුන් පිළිබඳ විරහ දුක පටන් ගැන්ම වශයෙන් ගැණෙන ඒ දින, සවස තේ මේසයේ දී පවා, ඔහු ඇයට මෙසේ කීයේ ය.

"මාලිනී, මට සමා වෙන්න. මේ වියොගය වුණේ, මගේ ඉක්මන් කමෙනුයි-මෝඩ කමෙනුයි - දුර-දිග නො බැලීමෙනුයි. මේ දූන් ඉතින් වෙච්ච දෙයට පසු තැවිලි වෙලා පලක් නැහැ. මේ ලබන ඔක්තෝබර නො වෙයි. අනික් ඔක්තෝබර මාසේ විසි හත් වැනි දා මට වයස් සම්පූර්ණ වෙයි. ඒ තෙක් මා මෙහි නැවත එන්නේ නැහැ. ඒ අතර, මම ඔබට ලියුම් එවන්නම්. ඔබේ සියලු දුක් සැප ලියුම් මගින් දූන ගන්නම්. එතෙක් ඔබට කිසි කරදරයක් නැතිව, විවේකයෙන් ඉගෙනීමේ වැඩ කර ගෙන යතැකි. හරියට ඔක්තෝබර විසිහත් වැනි දා නො මළොත් මා මෙ තැන ඇති. ඉන් පසු අප වෙන් කරන්න මරුවාට මිසක් වෙන කිසි කෙනකුට පුළුවන් වෙන්නේ නැහැයි" ඔහු කීයේ ය.



"ඉතින් මහත්මයා මේ යන්න හදන්නේ කොහේදැයි?" මෙහි දී මාලිනී ප්‍රශ්න කළා ය.

"ඒ ගැන මට දූන් ම කියන්න බැහැ. කොහේ ගියත් මාගෙන් ඔබට ලියුම් ලැබේවි. සමහර විට මා යන්නේ, ඉන්දියාවට වෙන්න පුළුවනි. නැත් නම් ජපානයට වෙන්න පුළුවනි. ලංකාවේ නවතින්න මට හැටියක් ම නැහැ. මැණියන් කළ දෙයින් මට මිනිසුන්ගේ මූණ බලන්න තව ම ලැජ්ජා ය" යි ඔහු කීයේ ය.

ඉන්පසු මාලිනී, කර බා ගත් ගමන් සොවින් තැවෙමි තේ කෝප්පය ටික-ටික තොල ගා බොමින්, කතාවක් නැතිව ම සිටියා ය. ජෝන් ජයපාල ද ඇය අනුගමනය කරන්නකු සේ නිශ්ශබ්දතාවෙන් කර බා ගත් ගමන් සිටියේ ය. ඕවුහු දෙදෙනාම දෛවයට නමන ලද සිරස ඇති, නොහොත් දෛවයෙන් පහළ සේසත ඇති, දිනයන් පරිද්දෙන් ද, දෙව් ලොවින් සැව, නරකයට යන තිරිසනුන් පරිද්දෙන් ද පිරිහී ගිය සම්පත් නැවත ලබන උපායය කල්පනා කර කර සිටියා ය.

මෙ සේ මඳක් කල් සිටි ඉක්බිති, "මහත්මයා!" කියා මාලිනී හිස ඔසවා, කතා කොට, "මගේ නම්, මෙ තැන නවතින කිසි ම බලාපොරොත්තුවක් මේ වන තෙක් තුබුණේ නැහැ. මේ විදියට වැඩ පිළියෙල කොට තිබෙන නිසා දූන් මං එහෙ නම් මෙ තැන නවතින්නං. හොඳයි! ඉතින් මහත්මයා ඔක්තෝබර් මාසේ විසි හත් වැනි දා මෙහි නාවොත්?" කියා ප්‍රශ්න කරමින් ඔහු මුහුණ දෙස කෙලින් බැලුවා ය.

"මා නො මළොත්, ලෝකයේ කොතැන සිටියත්, එදාට මෙ තැන ඇති. ඒ ගැන කිසි සැකයක් නැති" ඔහු ද ස්ථිර වූ අවංකාධ්‍යාශයෙන් කීයේ ය.

ජෝන් ජයපාල, මේ ගමනට කරන සූදානම පරලොව යන්නට කරන සූදානමක් සේ මාලිනියට නම් සන්වේග ඇති කරන්නකි. පරලොව යන්නට උදවු නො දෙන්නා සේ ම, මේ යන ගමනට

ද උදව් වශයෙන් ඈ කිසිවකුත් නොකළා ය. එමෙන් ම, ඔහු නතර කර ගැන්මට ද වචන මාත්‍රයකින් හෝ වෑයම් නොකළා ය. ඉවසීම ගුණ ධර්මය කොට රකින මාලිනියට එම ධර්මයෙන් පිරිහෙන සීමාන්තය ජයපාල ගෙදරින් පිටත් වීම හා සමග පැමිණියේ ය. මෙහි දී සිහි මුළා වීමෙන් විකල බවට පත් නැනැත්ති, තමා ප්‍රේම කරන ඉතා ම උත්තම වස්තුව තමාගෙන් ඈත් වන සැටි දක-දක, සිත් දැඩි කර ගත නො හැකිව, දිව ගෙන ගොස් ඔහු ගෙළෙ වැලඳ ගෙන, ඉකි ගසමින් හඬන්නට පටන් ගත්තා ය.

කඳුළු ඉස-ඉස පසකින් බලා සිටි ඩැනියෙල් නෝනා මෙහි දී රන් ලියක් කප් තුරකින් පැහැර ගන්නා සේ ජෝන් වෙතින් මාලිනිය ඉවත්කොට ගෙන, යහන් කාමරයට ගමන් කරවා, යහනය සයනය කැර වූවා ය. ඒ සයනයෙන් ඔත් පොළ වූ ගමන් ඕ තොමෝ උපවාසයෙන් ද දෙ දවසක් ගත කළා ය. මාලිනිගය සියලු යස ඉසුරෙන් හිස් කරමින් දුකට භාජන කළ හැරිස්ගේ දුර්විපාක සම්පන්න ලියුම ලැබුණේ යම් දිනක ද, එදින මුල් කොට අහර ගැනීමෙහි ද, වෙනත් සැප පහසු ගැනීමෙහි ද නො සැලකිලිමත් වීමෙන් මාලිනී ශරීර සුඛයෙන් ද පිරිහුණා ය. සැමියාගෙන් වූ වියොගය ඉවසිය නො හැකි දැඩි දුකක් මෙන් ඇයට දැනිණි.

වියොග දුඃඛයෙන් තැවෙන්නෝ අමූලක මනොරථ යාඥාවන්ගේ මාර්ගයෙන් දහසක් කරුණු උපායය කොට ගෙන, සිතේ පාළුව හැර ගනිති. ඔවුහු අන්‍යොන්‍යයෙන් නො දකිති. අන්‍යොන්‍යයන් හා ගනු-දෙනු නො කරති. කතා-බහ නො කරති, එසේ ද වූව, බන්ධනයට පැමිණි කිසියම් යක්ෂයකු ලවා, ඔහුගේ බිරින්දෑට මෙසය දූත ක්‍රියාවෙහි යොදා, සන්දෙශයක් නිකුත් කරන සිත් මහා කවි කාලිදාසයනට දුන්නා සේ ම, එයින් තම හිතවතුන් වෙත පණිවුඩ යවන සෙස්සනට ද නොයෙක් දෙය වහල් කොට ගන්නා සිත් දෙන්නේ ය. එ හෙයින් වියොදුකින් තැවෙන්නෝ ඇතැම් විට සියොතුන් හඬ ද, ඇතැම් විට මල් සුවඳ හා බමර



ගුමුව ද, මිහිරි කෙලි-කොලු වදන් හා බොළඳ සිනාව ද ඇතැම් විට සන්ධ්‍යාලොකය ද, ඇතැම් විට චන්ද්‍රාලොකය ද, මන්ද මාරුතය හා තාරකාවලිය ආදී කොට ඇති සකල මංගල වස්තූන් ම ස්වකීය සන්දෙශයට දූතයන් කොට ගනිති. වියොදුකින් තැවෙන්නාට යථොක්ත පූජ්‍ය සම්මත වස්තු සමූහය පමණක් නොව, සමස්ත ලොකය ම ස්වකීය ප්‍රෙමයට සේවය පිණිස මැවිණැයි සිතෙන්නේ ය.

මෙ සේ කිසිවෙකුට කිසි සම්බන්ධයක් නැති, වෛරයක් හෝ දයාවක් හෝ නැති, මධ්‍යස්ථ වස්තූන්ගෙන් පවා ඥාතීත්වයත්, අනුකම්පාවත් ලබන, හෙවත් ලබන්නා සේ සිතන, වියොදුකින් මත් වූ සත්ත්ව කෙනකුට ස්වකීය සන්තාපයට නිමිත්ත වූ වස්තුව හා සමග නියම සන්දෙශානුසාරයෙන් සංයොගය ලත් කල්හි මහත් සැනසීමක් ලැබෙන්නේ ය. ජයපාල පිටත්ව ගිය දෙ සතියකින් මදුරාසියේ තැපැල් සලකුණ දරන ලියුමක මාර්ගයෙන් මාලිනිට ද මේ සැනසීම ලැබුණේ ය.

අසරණ මාලිනිය වෙනුවෙන් ඔහු සිත්හි පවතින ප්‍රෙමයත්, එම ප්‍රෙමය සදාචාරාත්මක ප්‍රතිපත්තියකට අනුව ගෞරවයෙන් රක්ෂා කටයුතු හෙයින්, විශෙෂයෙන්ම ලංකාව අත් හැර තමා ඈත් වෙන්නට අදහස් කළ බවත්, එම ලියුමේ විස්තරයෙන් සඳහන් විය.

"ඒක ඇත්තයි, ඔහු මෙහි සිටියා නම්, මා දකින්නට නැවිත් සිටින්නේ නැහැ. දන් මෙහෙ ම කළ එක බොහොම හොඳය"යි ඈ ලියුම කියවා අවසාන වූ හැටියේ ඩැනියෙල් නෝනාට කීවා ය.

එතැන් සිට සති පතා ම ඔහුගෙන් ලැබෙන්නට වූ ලියුම්වල ප්‍රෙමාන්විත වාක්‍ය ඛණ්ඩයන් පමණක් නොව, මාලිනියගේ ප්‍රඥාභිවර්ධනයට ද, අතිශයොපකාරී වන වාර්තා විශෙෂයන් ඇතුළත් විය. ඇතැම් විට, ඔහු දක්ෂිණාපථයෙහි ද්‍රවිඩයන්-ගේ චාරිත්‍ර ධර්මයත්, සමාජයත්, රූප විලාසයත්, විශ්වාසය හා

ආගම භක්තියත් , දුබල සම් හා දොෂාදිය ගැනත්, විස්තර කරන්නේය. ඇතැම් විට, භූමි ලක්ෂණ වාර්තාදිය හා නගර වර්ණනාදිය කරන්නේ ය- ඇතැම් විට, කෘෂිකාර්මික වූ ද, වාණිජ්‍ය විෂයකවූ ද, ව්‍යාපාරයන් ගැන විස්තර කරන්නේ ය- ඇතැම් විට, ඓතිහාසික වූ ද, සාමයික වූ ද, නිර්මාණයන් ගැන කියන්නේ ය- ඇතැම් විට, දෙශ ගුණය හා තදනුකූලව උපදනා නොයෙක් ද්‍රව්‍ය විශෙෂයන් ගැන ද කියන්නේ ය.

ඔහු මෙසේ මාස ගණනක් ම දක්ෂිණාපථයෙහි සඤ්චාරය කොට, අනතුරුව උත්තරාපථයට යන බව දන්වන ලදී.

"අනේ! මාලිනී, මට ඔබ සමග මේ ගමන එනන ලැබුණා නම් ඔබටත් මටත් මීට වැඩි සැපතක් මුළු ජීවිතයට ම තවත් නො ලැබෙන්නේ ය"යි මෙසේ එවන තාක් ලියුම් වල ඔහු නිතොරව ම පාහේ කියන්නේ ය .

නවද භාරතීය ප්‍රතිසංස්කරණයන් සම්බන්ධයෙන්, මේ අතර, ඉන්දියාවේ පුවත් පත්වල මෙන් ම, ලක්දිව පුවත් පත්වල ද, ඔහුට ම පෞද්ගලික වූ නොයෙක් මත ප්‍රකාශයට පැමිණියේ ය. ඔහුගේ අදහස්වල සාරාංශය සිහළ පුවත්පත් මඟින් ද, නොයෙක් විට දකින්නට ලැබුණු නමුත් ඩැනියෙල් නෝනා ලවා ඉංගිරිසි පුවත්පතින් තර ගන්නා සිංහලානුවාදය මාලිනී වඩා ප්‍රිය කළා ය.

බොම්බායේ ඉංදියානු ජන නායක මණ්ඩලයක් විසින් ජෝන් ජයපාල පිළිගත් සැටි දක්වන පත්‍ර වාර්තාවක් දිනක් මාලිනියට දකින්නට ලැබී, ඈ ඩැනියෙල් නෝනාට මෙ සේ කීවා ය.

"ජයපාල මහත්මයා ගිය-ගිය තැන මිනිසුන්ගේ සිත් දිනා ගන්න හොඳ හපනා- බලන්න ඩැනියෙල් නෝනා මේ තාරා දේවිය කියා තිබෙන කතාව. ජෝන් ජයපාල මහතා පමණ හොඳට ඉංදියානු අරගලය ගැන පෞද්ගලික මත මෙ තෙක් කිසි ම සිංහලයකුගෙන් ප්‍රකාශ වුණු නැත කියන්නේයි" කීවා ය.



ඒ ළඟ දීම වාගේ ජයපාල තරුණයාගෙන් ලැබුණු ලියුමක මේ පිළිගැනීම ගැනත් තාරා බායි නම් මහතා සේවිකාව ගැනත්, තවත් ජන නායකයන් කිහිප දෙනකු ගැනත්, තරුණු සඳහන් විය.

සමහරු ජයපාලගේ අදහස්වලට ස්තුති කළහ. සමහරු දොස් කීහ. කොයි-කොයි සැටියෙන් නමුත් ස මසකින් පමණ ජෝන් ජයපාල දඹදිව දකුණු පතයේ මෙන් ම උතුරු පතයේ සැලකිය යුතු ප්‍රසිද්ධියක් ඇති කළේ ය. ගෞර පූර මහා රාජාගෙන්ද තමාට කැඳවීමක් ලැබුණු බවත්, මහා රාජා දකින්නට ඔහු ළඟදීම නව දිල්ලියට යන බවත මාලිනිය වෙත එවූ ජෝන්ගේ නවත් ලියුමක සඳහන් විය.

"මට මතකයි, මේ මහා රාජා හා තාරා දේවිය මේ ළඟ දී ලක් දිව සිටියා වාගේ" මාලිනී, ඩැනියෙල් නෝනා සමග කීවා ය.

"ඔව්, ඒ ගොල්ල කොච්චර කලක් ද කොළඹ නමයි හිටියා- මා රාජා ජයපාලලාට බොහෝම ආසයි." කියා ඩැනියෙල් නෝනා ද උත්තර දුන්නා ය.

සත් මසක් ගත වූ මේ කාලය මුළුල්ලෙහි දෙශාටනයෙහි යෙදුණු ස්වකීය ස්වාමි පුරුෂයාගෙන් ලැබෙන මේ ආදී නොයෙක් ලියුම්වලින් හා පුද පඬුරු වලිනුත් මාලිනියට නම් කිසිම හිඟ පාඩුවක් නැත්තේ ය. ස්වකීය ස්වාමි පුරුෂයාට සර්ව ප්‍රකාරයෙන් හොබනා භාර්‍යාවක වීමට ඉතා උනන්දුවෙන් හා අප්‍රමාදයෙන් ඈ තම ඉගනීමේ වැඩ කර ගෙන ගියා ය. ජයපාල තරුණයා මෙහි නැති කම එක් අතකින් ඇයගේ ඉගෙනීමට ලොකු වාසියකි. ඇයට දන් මුළු කාලය ඉගනීම වෙනුවෙන් යොදන්නට අවකාශ ඇත්තේ ය. වෛශාරද්‍යය, කියවීම හෙවත් පොත්-පත් බැලීම පරම ප්‍රතිඥා කොට ඇති හෙයින් එය නොපමාව ලබනු කැමැති මාලිනී පොත්-පත් කියවීම අභ්‍යාසයක් කොට ගත්තා ය. තව ම ඇයට ගැඹුරු බසින් කරුණු ඉංගිරිසි පොතක් කියවා තේරුම්

ගැනීම නොහැකි වුව ද, ඉංගිරිසි පුවත් පතක නො ගැඹුරු බසින් ලියැවුණු යම්-යම් දෙය කියවා තේරුම් ගැනීම අපහසුවක් නොවීය.

“දඹදිව වන්දනාවේ යන පිරිසක්” යන ශීර්ෂයෙන් දිනක් උදෑසන පුවත් පතක පළමු වන පිටුවේ පළ වූ සිතියමක් මාලිනියට දකින්නට ලැබී එයින් ඇයගේ සිතේ කලබල හටගත්තේ ය. පිරිමි දෙදෙනකුගෙන් හා ගැහැනු තිදෙනකු ගෙන් යුත් එම පිරිසේ, වමේ සිට දකුණට නම් කියවන මාලිනියට සෙස්සන් කෙසේ වුවත් මැදින් සිටි කාන්තාව නම් තමාට කිසි කලෙකත් මතක නැති නොවන, ජයපාල මැතිණිය බව දර්ශන මාත්‍රයෙන් ම හඳුනා ගත හැකි විය. ජයපාල මැතිණියගේ වමෙන් සිටි නව යොවුන් තරුණිය හැර, සෙසු තිදෙන වෙනුවෙන් නම් ඇය සිතට හෝ නෙතට වැඩක් නොහොත් අප්‍රසන්නයක් පහළ නො විය. ඩේසි අත්තනායක නමින් දක්වෙන යථෝක්ත තරුණ ගැහැනු මුහුණ මාලිනියගේ සිතට කරදර කැඳවන නපුරු අවතාරයක් බව බැලූ බැල්මට ම පෙනිණි. සිතියමේ මුලට ම සිටි තෝමස් අත්තනායක, මේ තරුණියගේ පියා බවත්, දෙවනුවට සිටි සාරා අත්තනායක මැණියන් බවත්, අන්තයට සිටි සත්‍ය ප්‍රිය සංඝදාස නම් උපාසක තැන දේශාටනයෙහි පලපුරුදු කම් ඇති හෙයින් ඔවුන්ගේ මාර්ග දර්ශකයා බවත් ඇයට සලකා ගත හැකි විය.

මාලිනී මේ සිතියම දුටු හැටියේ ඩැනියෙල් තෝර්නාට පෙන්වමින් එයින් තමාට මෙන් ඇයගේ සිතට ද ඇති වන අමුත්ත දකින රිසින් උදක් මුහුණ බලා ගෙන සිටියා ය. කවදාත් ප්‍රීතියෙන් බබළන ඩැනියෙල් තෝර්නාගේ උප ශාන්ත මුහුණ, සිතියම දක, කාරණය තේරුම් ගත් ඇසිල්ලේ, ලේ සිඳී මළ මිනියක් මෙන් සුදුමැලි විය.

“මේ යන පිරිසට ජයපාල මහත්මයාවත් නව දිල්ලියේ දී හමු වෙන්න බැරි නහැ නො වේ දැයි?” මෙහි දී මාලිනී ඩැනියෙල් තෝර්නා විචාළා ය.

“හම්බු වෙන්න තමයි, යනවා වගේ පේනවා” කියමින් ඩැනි-යෙල් තෝර්නා මඳක් වේලා කල්පනා කරමින් සිට “ඉතින් මොකද



කරනවා. ඒ ගොල්ලාට හම්බු වෙනවා උණාම?” යනුවෙන් සැක සිත් බැහැර ලමින් විචාළා ය.

එ වක් පටන් කැළඹුණා වූ සිත් ඇති හෙයින් සිරිත් ලෙස කෙරෙන වැඩ කටයුතුවල, මාලිනියට මෙන් ම ඩැනියෙල් තෝර්නාට ද, පුව සේ යෙදී ගත නොහැකි විය. ප්‍රසන්න චිත්තය ස්වරූප කොට ගත් හෙයින් දුන්-දුන් විකසිත සෙව්වන්දියක් වන් සියලු කල්හි ම ප්‍රිය මනාප මාලිනියගේ මුහුණ වරින්-වර ලබන වත්නී වෙගයකට බඳු සශංක භීතියෙන් මැලවෙන්නටත්, කවදාත් තියුණු ඩැනියෙල් තෝර්නාගේ සිහිය දානවධානයෙන් ප්‍රමාද වන්නටත් පටන් ගැනුණේ ය. ජයපාල මැතිණිය ප්‍රධාන පිරිස මේ යන වන්දනාගමන, වෙනත් සැදැහැවතුන්ගේ වැනි උපශාන්ත අහිංසක ගමනක් නො වන බවත්, මෙය ගැබ් කොට, සැඟ වී ගත් නපුරු දහයක් ඇතුළත පවතින බවත්, ඔවුනට නො පෙනෙන්නේ නො වේ. එහෙයින් ඔවුහු එය ගැන සාකච්ඡා කළහ. උපායයෙහි දක්ෂ ජයපාල මැතිණිය වියොග දුඃඛයෙන් විදෙශයට පලා ගිය ස්වකීය පුත්‍රයා හසුකර ගැනීමට සුදුසු ඇමක් ද ඇතිව වන්දනා ගමනක ව්‍යාජයෙන් මේ යන්නේ දඩයමකට වුව ද, මේ ඇට වෙන්නට යන උගුල මාලිනියට හා එම ගුරුවරියට මෙන් ම ජයපාලට ද නිරායාසයෙන් ම පෙනිය යුතු හෙයින්, ඇයගේ පරිශ්‍රමය නිශ්ඵල විය යුතු බව සම්මත කොට ගත් ඔවුහු ඒ පිළිබඳ අස්ථාන භීතිය මතක නැති කරන්නට නියම කර ගත්හ. එ සේ ද වුව, පැයකට වඩා මේ සම්මතයෙහි පිහිටන්නට අපොහොසත් වූ තැනැත්තෝ ඉගනීම, සංගීතය, පොත්-පත් කියවීම, සංලාපය ආදී වශයෙන් සංවාදයට කෙ බඳු කාරණයක් නමුත් ප්‍රස්තුත වූ කල්හි වචන දෙක-තුන හුවමාරුවෙන් එය හැම මතක නැති කොට ලා, නැවත-නැවත මේ වන්දනා ගමන ගැන කතාවට ම වැටුණහ.

සශංක භීතියෙන් මඩනා ලද සිත් ඇති කල්හි අසරණ මාලිනියට කාව්‍ය-නාටක-සංගීත-සිනිමා ආදිය බැලීමෙන් වත්, ඩේසි අත්තනායකගේ මුහුණ මතක නැති කළ නො හැකි ය. ඩේසි අත්තනායකගේ මුහුණ ඇයට ස්වකීය ජීවිතය පවා තිත්ත කර

වන දර්ශනයකි. එසේ ද වූව, ඒ පත්‍රයෙන් සිතියම කපා වෙන් කොට ගෙන, පුරුකිච තබා ගත්තා ය. එ සේ තබා ගෙන, නැවත-නැවත එය දෙස වරින්-වර බැලුවා ය. ඒ බලන බලන වතාවක් පාසා සිය සිත් සතන්හි දිලුණු-තියුණු වන කැදර කම් ඇති හෙයින්, බය ඇති හෙයින් සැක ඇති හෙයින්, තමා ඊට වැඩි-වැඩියෙන් වසඟ වන බව දැන ගත්තා ය.

ලොව ඇති තාක් සියලු යටත්වීම් වලට වඩා වසඟවීම ඉතා ම පහත යටත් වීමකි. වසඟ වූ තැනැත්තේ, ස්වාමීත්වයෙහි සිටිය ද හිතූ මනාපයක් කිරීමට අපොහොසත් නිදහසක අගයක් නො දත් සේවකයෙකි, ගැතියෙකි, වහලෙකි, දහසෙකි, දහසකට වුවත්, නිදහසක අගය දනෙන්නේ ය. වසඟ වීම සැපය කොට ගන්නා හෙයින් වසඟ වූ තැනැත්තහුට නිදහස ඉතාම අහිතකර වූ දුකක් වන්නේ ය. සුරා සොඬකුට මත් පැනින් ලැබෙන මද මතය වැනි සැපයක්, වසඟ වීමට පුරුදු වූ ඇතැමකුට ලැබෙන බව ඇත්තකි. කුප්පමේණිය ගසට වසඟ වූ කල්හි එය අත් හැර දමා යා ගත නො හැකිව, එ තැන, මත් වෙමින් පසු වන බැළලියක මෙන් ඩේසි අත්තනායකගේ මුහුණට වශීකෘත වූ මාලිනී ද, ඉතා ම අප්‍රසන්නයෙන් වුවත්, ජෝන් ජයපාලගේ මුහුණටත් වඩා කැමැත්තෙන් එය දෙස බල-බලා නිතර මත්ව සිටින්නී ය.

භය වීමට සුදුසු ලකුණු පහළ වන කල්හි, නොහොත් පුද්ගලයන් දකින කල්හි, ඔවුනට භය වන පමණට ම ද්වේෂ කිරීම ද, මනුෂ්‍ය සත්ත්වයා පිළිබඳ එක්තරා ගුණාංගයකි. සපත්නිරොෂයට වැඩි දුකක් මාලිනියට තවත් නොමැති හෙයින්, එයින් කැළඹුණා වූ සිත් ඇති ඕ තොමෝ සිතින් ඉන්ද්‍ර ජාලා මවා ගෙන, ඩේසි අත්තනායක කුමරිය ජෝන් ජයපාල හා රසවත් පිළිසඳරින් පසු වන සැටිත්, ඔහු හා දෙශ චාරිත්‍ර විමසමින් හැසිරෙන සැටිත්, ගමන්-බිමන් යන එන සැටිත්, ආදී වශයෙන් සත සංඛ්‍යාත විෂම දර්ශන සිය මනැසට දක්ව-දක්වා, උමතුවෙන් කල් ගත කළා ය. මෙ සේ පෙනෙන විකාර ගැන දත්තා නුවණැති සත්ත්වයෝ මාත්සර්‍යයට වසංගත වූ චෛතසික ධර්මයක් ඇති කල්හි, ඊට



අනුබල දෙමින්, ඒ හැම පුරතල් සතුන් මෙන් වඩ-වඩා මහත් කොට තනනු වෙනුවට, විදුලිය මෙන් උපන් උපන් කෙණෙහි විදුලිය මෙන් ම, උපන් උපන් තැන, නසා දමන උපදෙස් සොයති. මාලිනියගේ සිත් නමැති සිතිමා හලේ දක් වෙන සිතුවම් පටියේ රහ දත්තා, ඩැනියෙල් නෝනා, ඇය සනසමින් වරින්-වර නොයෙක් දෙය කීවා ය. යම් පුරුෂයෙක් ස්ත්‍රී ජාතිය විසින් අගය කොට සලකනු ලබන්නේ ද අත් පත් කොට ගත නොහෙන ප්‍රිය මනාප වස්තුවක් මෙන් ඇලුම් කරනු ලබන්නේ ද, එසේ වූ පුරුෂයා හිමි ස්ත්‍රියට, ඊට වැඩි සතුටක් තවත් ඇති විය නො යුතු ඔහු ඩැනියෙල් නෝනාගේ මතයකි. තම සතු රන් රුවක් ආදි මහඟු තන කර ආයිත්තමකට කවුරුනුත් ඇලුම් කරනු දකීම නිතර සැපය කොට ගන්නා ස්ත්‍රියට ස්වකීය වල්ලභයාට පමණක් ඇලුම් කරනු දකීම නපුරැයි සිතෙන්නේ මන්ද? ජෝන් මුළු ලෝ වැසි සකල ස්ත්‍රී වර්ගයාට ම ප්‍රිය මනාප වස්තුවක් වුවදෙන්- එබඳු ප්‍රිය මනාප වස්තුවක් වීමට ජෝන්ගේ ද පරිශ්‍රමය ඇති වෙද්දෙන්- ඉතින් එයින් වන වරද කිම? ජෝන්ගෙන් සිනා මුසු බැල්මක් හෝ ප්‍රිය වචනයක් හෝ ලැබීම සේසත් නඟන්නා වැනි ඓශ්චර්‍යයක් කොට වෙන ගැහැනු සිතක් නම්, එසේ සිතා ඊට පරිශ්‍රම දරත් නම්, ජෝන්ගේ මුළු හදවත තමහට ප්‍රතිමාලයය කොට ගත් ස්ත්‍රියට අන්‍යයන්ගේ යථොක්ත පරිශ්‍රමය හාස්‍යයට හා උප හාස්‍යයට විනා මාත්සර්‍යයට නම් කාරණයක් වන්නේ කෙසේ ද? පිය හිමියන් සිත අන් අත පවරන අදහසින් යෙදෙන උපායය දකින කල්හි නුවණැති ගැහැනු උමතුවෙන් විපිළිසර නොව, උක්ත ප්‍රකාරයෙන් කරුණු සලකා බලා, නැවත ප්‍රස්තාවය ලත් කල්හි එයම හිමියන් හා පිළිසඳර කතාවෙන් සතුටු වීමට සුදුසු කාරණය කොට ගනිති.

මාලිනියට දත් එක ම සැනසීම වශයෙන් ගැනෙන ඩැනියෙල් නෝනා, බැරි-බැරි පාහේ අව්‍යක්ත සිංහලෙන් නමුත් කතා කරමින් ස්වකීය ව්‍යක්ත මතාන්තරයන් මෙ සේ, කෙ සේ නමුත් ඇයට පිළිගැනෙන පරිද්දෙන් තේරුම් කර දුන්නා ය. මේ ගුණ දනමුතු කම්වලින්, දත් - දත් දුර දිග පෙනෙන මාලිනියට ඒ වෙලාවට

නමුත් සිත සනසා ගැනීමට අතිශයින් වහල් වූ යහපතක් ම විය. කරන්නට පුදුසු වැඩක් නැතිව, නො හොත් වැඩක් කිරීමට පුදුසු සිහියක් නැතිව, සිටි මාලිනියගේ නිකම් බලාගත් ගමන් පිළිමයක් මෙන් හිස් බැල්මෙන් පසු වීම, කරදාසි කොළවලින් විවිධාකාර වූ රූප ධෙයයන් කැපීම, උන් හිටි තැන්වල, ජ්‍යාමිතියට අනුව විවරණ කරන්නා සේ පැන්සල්වලින් ඉරි ඇඳීම, අග සිට මුලට පොත් කියවීම වැනි වියරු කම්, මේ කරණකොට හුහක් දුරට ම නතර විය.

# 13

මාලිනියගෙන් වෙන්ව, දේශාටනයෙන් කල් ගෙවන ජෝන් ජයපාල තෙමේ, ගෞර පුර මහා රාජාගේ ආරාධනයෙන් මාර්තු මස එක් උදෑසනක, නව දිල්ලි නගරයට සම්ප්‍රාප්ත විය. ප්‍රතිරාජ මාලිගයට පමණක් දෙ වැනි වන්නා වූ, ප්‍රතිරාජ මාලිගයෙහි ද නො දක්නා ලැබෙන ඓශ්වර්යයෙන් හා ශ්‍රී විභූතියෙන් බබළන්නා වූ, ගෞර පුර මාලිගයට මහා රාජා සහ රැජිනිය විසින් ජෝන් ජයපාල සාදරයෙන් පිළිගනු ලැබුවේ ය. මේ දර්ශන සම්පන්න විශාල ප්‍රාසාදය ගෞර පුර නමින් ප්‍රසිද්ධ නමුදු, නියම ගෞර පුරය නම්, මේ රජුගේ බාල සොහොවුරු-විද්‍යාසිංහ නම් කුමාරයන් විසින් රක්ෂිත අවිශාල වුව ද, පරණ ඉතිහාසයකින් යුත් ඈත පිහිටි, ජන බහුල රාජ්‍යයකි. රාෂ්ට්‍ර විප්ලවයක් කරණ කොට ඡත්‍ර භංගත්වයට පැමිණි හෙයින් මේ දේවසිංහ නම් දෙටු සොහොවුරු තෙමේ සිය මලණුවන් හට රාජ්‍යය පවරා දී නව දිල්ලියේ ගෞර පුර නමින් මාලිගයක් කරවා මෙසේ විශ්‍රාමයෙන් කල් ගත කරන්නේ ය. කුවේරයාට බඳු ධන ගර්වයෙන් ද ඉන්ද්‍රයාට බඳු ක්‍රීඩාශිලාෂයෙන් ද, හස්තිනාපුර රජුනට බඳු ත්‍යාගශීලයෙන් ද, අනූන වූ දේවසිංහ රජ ස්වදේශීය වූද, විදේශීය වූ විශිෂ්ටයන් හා විශෙෂඥයන් සමාදරයෙන් පිළිගෙන ආගන්තුක සත්කාරයෙන් සතපා සංග්‍රහ කිරීම විශේෂාංගය කොට ඇත්තකි. එ හෙයින් ගන්ධි වැනි විශිෂ්ටයන් හා ප්‍රතිසංස්කාරකයන් ද, ආචාර්ය හොස වැනි විද්‍යාඥයන් ද ආචාර්ය ඨකුර වැනි කවීන්ද්‍රයන් ද, මේ රජ අතිශයින් ප්‍රිය කළේ ය. දඹදිව-දේශාටනයෙහි යෙදුණු ජෝන් ජයපාල ගැන වාර්තා විශෙෂයක් පුවත් පත් මගින් දුටු කෙණෙහි තමා වෙත කැඳවා, ආගන්තුක සත්කාරයෙන් ඔහු පිනවීමට මේ රජු වඩාමත් සතුටු වූයේ ද, එ හෙයිනි.

පෙර දඹදිව එක් සේසත් කොට රජ කළ අශෝකාදි වූ ශ්‍රේෂ්ඨ නර පතියන්ගේ ද සුදත්තාදි වූ මහා ධනපතියන්ගේ ද, පරිශ්‍රමයෙන් නිර්මිත බෞද්ධ සිද්ධස්ථානයන් හා ඈ පුරාණයෙහි සිට, අති ප්‍රසිද්ධ බාරාණසී ආදී වූ අජර නගරයන් හා උත්තරාපථයට අයත් දැකුම්කලු සියලු දෙය නො තබා දකිනු කැමති ජෝන් ජයපාලට මහා රාජාගෙන් ලැබුණේ, වැදගත් ම සහයකි. මේ මහා රාජා වූ කලී සුබ විහරණයට අවශ්‍ය වූ ධර්මොපදෙශයන් පමණක් ස්විය ලබ්ධීන්ගෙන් මෙන් ම අන්‍ය ලබ්ධීන්ගෙන් ද භාවිතයට ගන්නා වූ ඊට අහිතකර වූ සියල්ල බැහැර ලන්නා වූ අතිශයින් භ්‍රෂ්මශීලී, ශ්‍රද්ධා හීන, හින්දු භක්තිකයෙකි. ජයපාල ද ශ්‍රද්ධාධික නියම සිංහල බෞද්ධයකු නොවන නමුත්, ආචාරශීලි නො වන්නට ස්ථිර වශයෙන් කර ගත් අධිෂ්ඨාන ඇති හෙයින්, වැඳ පුදා ගැන්මට වඩා සිද්ධස්ථානයන් සියැසින් දැකීම විනොදය කොට ගෙන, ආ ගිය ගමන්වල දී වත්, මහා රාජා හා මත් පැන් බීම් ආදියෙහි කිසි විටක නො යෙදෙන්නට පරෙස්සම් වූයේ ය. මෙ සේ ජයපාලගෙන් යම් ශික්ෂා පදයක් රැකුණේ නම්, හේ මාලිනිය කෙරෙහි පැවැති භක්ති ප්‍රේමයෙන් විනා, ආගමය කෙරෙහි පැවැති ශ්‍රද්ධාවෙන් නො වන්නේ ය. එසේ ද වුව, මහ බෝසතාණන් ලොව පහළ වූ ස්ථානයත්, බුදු බව ලත් ස්ථානයත්, බුදුන් දම් සක් පැවැත් වූ ස්ථානයත්, යළි පිරිණිවි ස්ථානයත්, දුටු එකි-එකී වතාවක ආගම ධර්මය නුගත් ශ්‍රද්ධා හීන ජෝන් ජයපාලගේ පවා දෙ නෙතට කඳුළු පුරන්නට පටන් ගත්තේ ය.

බණ දහම් නොදත් කම- ආගමය නො දත් කම- මූඪ ශ්‍රද්ධාවගේ වෘද්ධියට ද, නියම ශ්‍රද්ධාවගේ හානියට ද, ප්‍රධාන කාරණය වේ. සිය රටේ ආගමය ද, ඉතිහාසය ද, තමා නො දත් බැවින්, ඒ නො දත් කම ඉතා සුළු කොට සලකන ලද හෙයින් එහි උගත් කම, වෙන උගත් කම් ලැබ ගැනීමට පොහොසත් කම් නැති සුළු මිනිසුන්හට අයිති වැඩකැයි සංකරයන් විසින් සම්මත හෙයින්, පැල දිග සියල්ල පිළිගත් එවැන්නන් කුඩා කල සිට ම අනුගමනය කළ ජෝන් කෙරේ ශ්‍රද්ධාව පහළ වීමට අවකාශයක් නො විය.



පැළ දිග සියල්ල පිළිගත් ඇතැම් උගත් මෝඩයෝ සිය බසින් තමනට කතාව නොහැකි බව කීම තවමත් ලොකු සිදාදි කමක් නොහොත් හපන් කමක් කොට සලකති. එයින් ඔවුන් තමන් ඉංගිරිසියෙහි කෙළ පැමිණියන් බව සිංහල පමණක් උගතුන්හට පෙන්වීමට කරන වෑයමක් ඇති වත්, ඔවුන්ගේ මේ ඉංගිරිසිය සිය බසින් වන අඩු-පාඩුව පිරිමැසීමට තරම් නොවන බවද, දන්නෝ දනිති. කරුණු මෙසේ හෙයින් මේ පණ්ඩිතම්මන්‍යයන් බොහෝ දෙනා ඉංගිරිසියෙන් සහ සිංහලෙන් තබා දෙකින් එකකින් වත් කිසිවක් කිරීමට කිසි වියත් කමක් නැතිව පිස්සු කම් කරති.

ශ්‍රද්ධාව වූ කලී, ආගමය පිළිබඳව පමණක් නොව, රට-දැය-බස පිළිබඳව ද ඇති වන්නකි. ආගමය දියුණුවට තදානුකූල ශ්‍රද්ධාව මුල් වන්නාක් මෙන් ම, රට-දැය-බස දියුණුවට ද එකි-එකී ශ්‍රද්ධාවක් මුල් වන්නේ ය. එහෙත් පෞද්ගලිකාභිවෘද්ධිය පමණක් සලකන, බඩ වියත රැක ගන්නා උපායය පමණක් අහසින් යට එක ම උගත් කම, සේ කල්පනා කරන, ඇතැම් වැඩිහිටියන් නිසා, දරුවන් තුළ, සැඳැහැතින් උපද වන ඉගැන්වීම් පිළිවෙල අභාවයට ගියෙන්, නොබෝ කලකින් ප්‍රතිවින පරිපාටියට පමණක් ප්‍රව්‍යක්ත වූ සංකර සමූහයක් සිංහල ජාතියේ පහළ වූහ. සංකරයෙහි හා සංස්කරණයෙහි විශෙෂ විභාග නොදත් බොහෝ දෙනා තමන් මේ නිරවශෙෂයෙන් කරන වෙස් මාරුව ප්‍රතිසංස්කරණයකැයි වරදවා කල්පනා කළහ. තුබුණු දෙය එම දෙසින් ම නැවත සකස් කිරීම, ප්‍රතිසංස්කරණය නම් වේ. අනෙක් දෙයකින් ගෙන කරන මිශ්‍රණය සංකරය නම් වේ. සංස්කරණයෙහි දී ප්‍රකෘතිය අභාවප්‍රාප්ත වීමෙන් ඊට ඉඳුරා ම වෙනස් වූ විකෘතියක් හට ගැනෙන්නේ ය. ජෝන් ජයපාල උභය කුලයෙන් පිරිසිදු වුවත්, සිරිත් අතින් තපුරු ම පෙළේ කළුවමකි. ඔහු කෙරේ ඉතිරි වුණේ, නමින් ආගමය පමණකි. එ හෙයින් යථොක්ත ප්‍රධාන සිද්ධස්ථානයන් හැර සෙසු නොයෙක් දෙය දකින ඔහු තුළ, ඒ පිළිබඳ ඉතිහාසය හා සාමයික සම්බන්ධය නොදත් බැවින්, ඇති වුණේ, ප්‍රාචීන ශිල්පීන්ගේ ශිල්ප සෞන්දර්‍ය විෂයක නිර්මාණ ශක්තියේ ගෞරවය පමණකි.

උත්තරාපථය හා මධ්‍ය මණ්ඩලයත්, මාලිනියට විස්තර කරන ජෝන් ජයපාල, බුදුන් ලොව පහළ වූ තැන් ආදි කොට ඇති ප්‍රධාන සිද්ධස්ථානයන් ගැන වර්ණනය කරමින්, මෙ තැන් දකින ඇස, හිරු එළිය වැනි තේජස ඉවසුම් දෙනා දෙන්නා සේ ශ්‍රද්ධාව ඉවසාගෙන නොහී කඳුළු සලන බවත්, පර සතුරු පීඩාවන් හා යුද්ධ කොලාහලයන් කරණ කොට නෂ්ට ප්‍රාප්ත වූ සිද්ධස්ථානයන්ගේ සුන්-බුන් පෙනෙන විට, සද්ව්‍යාපාරයෙහි ඉෂ්ට විපාකය මෙන් ම අසද්ව්‍යාපාරයෙහි අනිෂ්ට විපාකයත්, තද්ව්‍යාපාරයනට කර්තෘභූත පුද්ගලයන්ගේ ඇවැමෙන් ද බොහෝ කල් නො නැසී පවත්නා සැටි ප්‍රත්‍යක්ෂ වන බවත්, කීයේ ය. තව ද බරණැස ගැන විස්තර කරමින් ඇත අතීතයෙහි වූ ඓතිහාසික නගරයන් අතුරෙන් තව මත් නො නැසී ඇ‍තෙන එක ම නගරය මෙය බවත්, එ හෙයින් මෙය ලොක ඉතිහාසයට පටන් ගැත්ම සේ ගත යුතු බවත්, අපේ අනුරාධපුරය, බරණැසට සම කරන කල්හි උපන් ගෙයි මළ දරුවකු මෙන් මන්දායුෂ්ක සංඛ්‍යාවට ගැණෙන බවත් කීයේ ය.

ගෞර පුර මහා රාජාගෙන් මෙ සේ හෘදයංගම වූ ආගන්තුක සත්කාර ලබමින්, එම ආශ්‍රයෙන් දෙ සතියක් පමණ කල් ගත කළ ජෝන්හට, මාලිනිය නැති පාළු කම විනා, වෙහෙස ගෙන දෙන අන් කිසි කාය චිත්ත පීඩාවක් නො වීය. එහෙත්, ජයපාල මැතිණිය ප්‍රමුඛ සමූහය වන්දනාවේ යන ගමන් ගෞර පුරයට එන බව මහා රාජා සහ රැජිනිය වෙත එවන ලද ලියුමෙන් ජෝන් දැන ගත් දින, අතිශය දොම්නසට පැමිණියේ ය. එ සේ දොම්නසට පැමිණ, මැණියන් එන්නට පළමු තමා රාජ භවනයෙන් පිට මං විය යුතු බව දන් වන ලද කල්හි, පුදුමයට පත් මහා රාජා සහ රැජිනි ඊට කරුණු විකාළා ය. ත්‍යාග ශීලයට ආදර්ශ කොට ගත යුතු ඒ මහා රාජාට සහ රැජිනියටත් තොර-තුරු විස්තර කරන ජෝන් ජයපාල, මැණියන් සමග නො මනාප ඇති කළ නියා නො වළහා කීයේ ය.

ඔහු කී සියල්ලට සන්සුන් සිතින් ඇහුම්කන් දුන් ඉක්බිති මහා රාජා, මිණි-මුතු බැඳි පුරන ඔසවා, ජෝන් ඔබ කවදා නමුත්



ඔබේ ඔය පුරතලිය ද මැණියන් ද අතර සමගිය ඇති කළ යුතු ය. මා හිතන්නේ නැහැ- ඉතින් ඒකට මීට වැඩි හොඳ ප්‍රස්තාවයන් ඔබට කවදා වත් ම ලැබේ ය කියා ඔබේ මැණියන් ද සමහර විට මේ ගමන එන්නේ, ඒ අදහසින් ම විය යුතු යි. ඒ නිසා මෙ සේ මග හරින්නට නො සිතා, ඇය එන තෙක් මෙහි නතර වෙන්න. එ සේ නුණොත් ඔබට පිට මං වෙන්නට අනුබල දුන්නා ය කියා- නොහොත් ඔබ නතර කාට ගන්නට කිසි වෑයමක් නො කළා ය කියා- ඇය මටත් වගපල කියාවි" කීයේ ය.

මැණි කෙනකුන් වෙතින් පලා යෑමේ බලවත් වැරැද්ද ගැන රජින ද මෙ සේ ඔහුට කරුණු කියන්නට පටන් ගත්තා ය.

"බුද්ධාගමයේ මැණියන් ගැන කියා තිබෙන දෙය ම දන්නේ නැ- නමුත් අපේ හින්දු ලබ්ධියේ හැටියට නම් බ්‍රහ්මයාට සම කළ හැකි එකම ප්‍රේමය තමා මාතෘ ප්‍රේමය. මැණි කෙනකුගේ සිත් රිදවීම, ගෙවා ඉවර කළ නොහැකි පාපයකි. මෙධයාගයකින් වත් ඒ පාපය දුරු කොට ගත නො හැකියි. මැණියන් සිටින තැන, දෙවියන් සිටින සිද්ධස්ථානයකි. අපට නම් මැණියන් දෙවි දෙවි කෙනකු මෙනි. ඉතින් ජෝන්, දෙවියන් ඔබ සොයා එන කොට- ඔබ කළ පව්වලට සමාව දෙන්නට එන කොට- ඔබ පිට මං වෙවී, දුවනවා නම්, ඉතින් ඔබ මේ දුවන්නේ, කොහාටද? අපායයට නොවේ ද? යනුවෙන් ඈ ප්‍රශ්න කළා ය.

උපස්ථායකයන් සිත් බිඳුවා, කෙළෙහි ගුණ නො සලකා, නොකීකරු සිතින් පලා ගිය නොහැකි හෙයින් ඔවුන් අභිලාෂය මුදුන් පත් කරනු කැමති ජෝන්, යටත් පිරිසෙයින් මැණියන් එන තෙක් නමුත්, එහි ම රැදෙන්නට අදහස් කළේ ය. ගෞර පුර මාලිගයට ජයපාල මැතිණියගේ සම්ප්‍රාප්තිය වන තෙක් ම ඇය එන්නේ, කවරකු සමග ද යන්න ජෝන් නො දත්තේ ය. රූමත් තරුණ කතුන් අතුරෙන් අග තැන්පත්, ඩේසි අත්තනායක කුමරිය ද මේ පිරිසට ඇතුළත් බව දුටු කෙණෙහි ඔහු විස්මය ප්‍රාප්ත විය. ඔහු දන්නා අනෙක් කෙනකුට පැමිණි යේ තාරා දේවිය පමණකි. තාරා දේවී පමණක් ජෝන් සමහ කතාවට වැටුණා ය.

රාජ කථා, දෙශ කථා හැර, අන් කිසි කථාවක් ගැන වචනය කුදු නො දොඩන තාරා දේවිය, ජෝන් හා සංවාදය පටන් ගත් ඇසිල්ලේ, ඉංදියාවට ස්වරාජ්‍ය- පූර්ණ ස්වරාජ්‍ය- නො ලබා භාරත ස්ත්‍රී පක්ෂයෙහි උනන්දුවක් ඇති කළ නො හැකි බව කියන්නට පටන් ගත්තා ය. පුරුෂයාට යම් බඳු නිදහසක් ඇත්තේ ද, ස්ත්‍රියට ද, එබඳු ම නිදහසක් ලැබෙන තෙක් ස්ත්‍රිය දන් සිටින ස්වකීය තත්ත්වය අත් නො හරින බවත්, සත්‍රීන්ගේ තත්ත්වය පුරුෂයන් හා සම ස්ථානයෙහි තබන ලද හෙයින් යුරෝපය දවසින් දවස ම වඩ-වඩා දියුණු වන බවත්, ඈ කීවා ය.

ජෝන් ස්වභාවයෙන් ම වාදයට නො කැමති හෙයින්, විශෙෂයෙන් ම ප්‍රිය සම්භාෂණයෙන් සමාජයෙහි හැසිරෙන විට කොහෙත් ම වාද නො කරන හෙයින්, තාරා දේවියගේ හැම අදහසක් ම තමාට අනභිමත වුව ද, විරුද්ධව කිසිත් නො කීවේ ය.

“මන්ද අපේ පිරිමිංට බැරි ගැහැනුන් තමන් හා සමකොට සිතන්නට?” කියා ඕ තොමෝ භාරතීය ජන ප්‍රභූවරියන්හට ම යොග්‍ය කලහ නාදයෙන් ප්‍රශ්නයක් උපදවා, “මගේ මේ අදහස්වලට බොහෝ දෙනා විරුද්ධ යි. විශෙෂයෙන් ම ගැහැනිය ක්‍රීඩා භාණ්ඩයක් කොට සලකන පුරුෂ පක්ෂය-” කියා නෙත් කොනින් මහා රාජාගේ ද මුහුණ බලා, “විශේෂයෙන් ම පොහොසත් පුරුෂ පක්ෂය- බහු භාර්‍යා සෙවනය කැමති පුරුෂ පක්ෂය - තාම විරුද්ධයි මෙය ගැන මෙ සේ කතා කරන ගැහැනිය එත් ඔවුනට පේන්නට බැහැ”යි අනතුරු වත් කීවා ය.

මුළු සමාජයේ ම නෙත්-සිත් ඇය වෙත පෙළඹුණු හෙයින් ද, අන් කිසි කථාවකට, අන් කිසිවකුටත් ඉඩක් නො ලැබුණු හෙයින් ද, කවුරුත් ඇයට ඇහුම් කන් දුන් ගමන් පසු වූහ. ඇයගේ ඇනුම් පදය කරණ කොට මහා රාජාට පමණක් කතා කරන සිත් පහළ විය.

“නැ නැ, අපට ඔවුන් පෙනෙන්නට බැරි කමක් නැහැ. අප ඔවුන් දකින්නත් කැමති යි- අසන්නත් කැමති යි. බහු භාර්‍යා



සෙවනය මෙ රට පිරිමින්ගේ චාරිත්‍ර ධර්මයක් තමයි. ඉතින් මේ පිරිමින් හා සම ස්ථානයේ සිටින්න වැයම් කරන තාරා දේවියට වුවමනා කර තිබෙන්නේ, බහු පුරුෂ සේවනය දැයි?” ඉළ ඇට බිඳු වන හාස්‍යයකින් මුළු සමාජයම හිනස්වමින් මහා රාජා ප්‍රශ්න කළේ ය.

ස්ත්‍රීන් හට පුරුෂ පක්ෂයෙන් ලැබෙන ගෞරවය මද බව කියමින් මෙහි දී තාරා දේවිය වාදයට සුදුසු අනෙක් කොනක් මතු කර ගත්තා ය. ඩේසි අත්තනායක ද ඊට අනුව කතා කරමින් ඒ භාරත කාන්තාවන්ගේ අදහස් අනුමත කළා ය. තෝමස් අත්තනායක හා සාරා අත්තනායක ද, මෙහි දී තාරා දේවියට පක්ෂ වූහ. මහා රාජාට සහාය පිණිස සිටියේ, ජෝන් ජයපාල පමණකි.

“දන් තාරා දේවියට ලොකු අඩු-පාඩුවක් මෙන් පෙනුණේ, ස්ත්‍රියට පුරුෂයා හා සම ස්ථානයෙහි සිටින්නට නැති නිදහස නො වේ දැයි?” ජෝන් ප්‍රශ්න කළේ ය.

“ඔව්!” යනු ඇයගේ ක්ෂණික පිළිතුර විය.

“එසේ නම් ඇය පුරුෂයාගෙන් ස්තුත්‍යුපචාර පූර්වක ගෞරවයක් බලාපොරොත්තු වන්නේ කෙසේ ද?” එ විට ඇයට පුරුෂ පක්ෂයෙන් ලැබෙන්නේ, පුරුෂයකුගෙන් පුරුෂයකුට ලැබෙන සංග්‍රහය හෝ නිග්‍රහය පමණකැයි ජෝන් කීයේ ය.

ඩේසි අත්තනායක බිම බලා ගත්තා ය. සෙසු කවුරුත් මේ භාරත වාදීහසිංගිය දෙසට නෙත් යොමු කළහ. ඈ තල්ල මරා, ලජ්ජාව ගිල ගත් බව ජෝන්හට ද පෙනුණේ ය.

තාරා දේවියගේ න්‍යාය විරොධ තර්කයට විනා අදහසට නම් ජෝන්ගේ වාදයක් නැත්තේ ය. දඹදිව ගැහැනුන්හට පුරුෂ පක්ෂයෙන් ලොකු නිදහසක් වුවමනා කරන බව මහුට ද පෙනෙන ඇත්තකි. ස්ත්‍රීන්ගේ නිදහසට කිසි අවහිරයක් නැති බවට වේදයෙන්

හා කුරාන් පොතෙන් අවතාර්ක වාක්‍යයන් ගෙන හැර දක්වමින් නොයෙක් දෙනා කතා කරත් නමුදු රටේ ව්‍යවහාර සත්‍යය නම් අනෙකකි. එක ම පුරුෂයකුගේ තෘෂ්ණා විනෝදය පිණිස අන්තඃපුරය නම් වූ දකුම්කලු සිර ගෙයක බන්ධනයට පැමිණෙන දහස් ගණන් ස්ත්‍රීහු වෙති. එ සේ බන්ධනයට පැමිණි අභාග්‍ය සම්පන්න කාන්තාවෝ පර පුරුෂයකුගේ තබා ඇතැම් විට, ස්ව පුරුෂයාගේ වත් දර්ශන මාත්‍රය නො ලැබ, අනභිතාප්ත කාමාශාවෙන් ජීවිතාන්තය දක්වා හුදකලාව ම පසු වන්නාහු භාරත වර්ෂයේ පමණක් නොව, මුළු පෙරදිග මහා ජන සමෘද්ධියට ම අන්තරායකර වූ මේ දුෂ්ට චාරිත්‍ර ධර්මය කරණ කොට ස්වාමී ගෞරවයෙන් ද, ප්‍රේමයෙන් ද පිරිහුණු ස්ත්‍රීහු වෛර චිත්තයෙන් හා ද්වේෂ චිත්තයෙන් ස්වාමියා හෙළා දකින්නටත්, ඇතැම් විට ක්‍රොධ චිත්තයෙන් පුරුෂ ඝාතනය පවා කරන්නටත් පටන් ගත්හ. ස්වාමි පුරුෂයාගේ දර සෑයට අන්තඃපුර ස්ත්‍රීන් ගිනි බත් කිරීමේ සිරිත ව්‍යවහාර ප්‍රාප්ත වූයේ, මේ පුරුෂ ඝාතනයට ප්‍රතිකාර වශයෙනි. ඉතින් මෙ වැනි සිරිත් පැවති හෙයින් පෙර දිග රටවල් දවසින් දවස ම පිරිහීමෙන් පිරිහීමට යාම පුදුමයක් නො වේ.

මේ ආදි කතාවෙන් ගත වූ කාලය නිසා විශෙෂයෙන් ම තාරා දේවියගේ වාචාලකතාවය නිසා- ජයපාල මැතිණිය ප්‍රමුඛ පිරිසගේ සම්ප්‍රාප්තිය කරන කොට ජෝන්හට ඇති විය යුතු චිත්තාකූලතාවය බොහෝ දුරට ම මග හැරුණේ ය.

ඉක්බිති මේ පිරිස රාජෝද්‍යානයෙහි පසකින් පිහිටි ගෞරපුර රජ කළ නරපතියන්ගේ මිණි කිරුළු පටන් මිරිවැඩි සහළවල් දක්වා, සියල්ල තැන්පත් වූ කෞතුකාගාරයට මහා රාජා විසින් කැඳවනු ලැබ විසිතුරු බලමින් සවස් කාලය ගත කළහ. මහා රාජා කථා කීමෙහි නො සමතකු වුව ද, ඔහුගේ කථා ලීලාව නීරස වුව ද කියන්නේ, පරණ වැදගත් කුල ගෙයක හපන් කම් නිසා, එකක් පාසා, නොයෙක් දෙය දක්වමින් ඔහු කියන ඉතිහාසය, සෙස්සන්හට කෙසේ වුවත්, ජයපාල මැතිණියට නම් සංගීතයක්



මෙන් ප්‍රිය ජනක විය. දෙ පණස් වියෙහි සිටි, සුදු මැලි සිහින් කුඩා සිරුරකින් යුත්, විවේකය කැමැති, තෝමස් අත්තනායකට වත්, සැමියාට වඩා වයසින් බාල, එ හෙයින් ම රූමත් නිහතමාන, කීකරු තාරා අත්තනායකට වත්, ග්‍රීෂ්මයෙන් සහ ගමන් වෙහෙසින් පෙළෙන ඩේසි කාන්තාවට වත්, කතාවට අවසරයක් නො ලැබ, ඉවසුම් නැති කමෙන් පසු වන තාරා දේවියට වත් නොව, මේ සමාජය අතිශයින් ම අහිතකර වූයේ ස්වභාවයෙන් ම කලබල කාරයකු වූ සත්‍ය ප්‍රිය සංඝදාස නම් උපාසක තැනට ය. මේ උපාසක තැන සෙසු මිනිසුන් මෙන් නොව, සිය නම තෙ වරක් මාරු කරමින්, වෘත්තිය තෙවරක් මාරු කරමින්, ජය වන සැටියක් සොයා නො ලත් තැන, ගුරු වස්ත්‍ර ඇඟ ලා ගෙන, බෞද්ධොපාසක භාවයට පැමිණි පුද්ගලයෙකි. ඔහු ඉංගිරිසි නොදත්තේ ය. මෙහි කෙරෙන තරමක් කතා කෙරෙන්නේ, ඉංගිරිසියෙන් හෙයින් ඔහුට තම පොපියන කටින් වචනයක් පිට·ගන්නට ද අවසරයක් නො ලැබෙන්නේ ය. ගෞර පුර මාලිගය කොතරම් සුව පහසු දෙන තැනක් වුවත්, තම තරම පෙන්වන්නට තැනක් නො වන හෙයින් කිසිවකුටත් නැති කලබලයකින් හා නො ඉවසිල්ලකින් ඔහු නිතර පසු වුණේ ය.

එසේ ද වුව, එකි-එකී සිද්ධස්ථානයක් කරා එළඹි කල්හි මේ උපාසක තැන ඉගිලෙන කණ කොකකු මෙන් ස්වකීය වාග් චාතුර්‍යයෙන්, ප්‍රඥාපාටවයත්, ආගමාලයයත්, පිළිබඳ පුද කාහටත් දක් වන්නට විය. තමා ඉංගිරිසි නො දනිතත්, දඹදිව දෙ සිය විස්සක් භාෂාවන් අතුරෙන් එක් සිය විස්සක් දන්නා හෙයිනුත්, අශොක ලිපි ආදි කොට ඇති, සියලු ම ගල් ලියවිලි කියවීමට දන්නා හෙයිනුත්, බුදුන් ලොව පහළ වූ තැන සිට, තමන් මේ වන්දනාවේ පැමිණි මොහොත දක්වා පුරා වෘත්තය පැයක අඩු පාඩුවක් නැතිව කියන්නට සමත් හෙයිනුත්, දස දහසක් යොදුන් දඹදිව මාර්ග දර්ශනය අහලක එහා මෙහාවක් නැතිව කරන්නට දන්නා හෙයිනුත්, මේ මුළු පිරිස එක සවනකින් මෙන්- තමාට හැම තැනදීම සවන් දිය යුතු බව ඔහු නොයෙක් විට කීයේ ය.

"මේ යෝදයාට අප නො දන්නා ඔක්කෝ ම පුළුවනි- ඒකට මොක ද, අප ඔක්කෝ ම දන්නා කිසිවකුත් නුපුළුවනැයි" මහු වතාවක් අකුරු ගෙවුණු ගල් ලියවිල්ලක් කියවා, පුරා වෘත්තය විස්තර කරනවා දුටු ජෝන් කීවේ ය.

කුටෝපායෙහි දක්ෂ වංක මනුෂ්‍යයන් හා නොයෙක් තරා තිරමේ පුද්ගලයන් හා බේබදු කමෙන්-සූදුවෙන්-අලස කමෙන් කල් ගත කරන අනාචාර ශීලී අධමයන් ද, මිත්‍රයන් කොට ඇති ජෝන් විසින් මේ උපාසක තැන වැනි පුදුම පුද්ගලයකු කිසි කලකත් නො දක්නා ලද හෙයින්, මේ වන්දනාවේ යන පිරිස මතක් කොට ලියන මාලිනියට මොහු ගැන විශෙෂයෙන් ම විස්තර කරන ලදි. ඔහු අත්තනායක දෙ මාල්ලන් ගැන ද, ඇයට විස්තර කළ නමුත්, එම කුමරිය ගැන යම්තමකට මතක් කළා පමණකි. ඩේසි කුමරියගේ රූප විලාසය ද, කථා ලීලාව ද, විනීත ගුණ ධර්ම හා චාරිත්‍ර විශෙෂයෙන්ද කුලීන ස්වභාවය ද මොහොතක් පාසා දියුණු-තියුණු වෙමින් බබළ-බබළා වැඩෙන මහා වහ්නිස්කන්ධයක් මෙන් තමාට පෙනෙන හෙයින්, ඇය පිළිබඳ ස්වකීය හැඟීම අවංක සිතින් මාලිනියට විස්තර කිරීමට ජෝන් මෙහි දී නොකැමති වුණේ ය. මේ පිරිසේ ඡායා රූපය මාලිනිය දක ඇති බවත් තරුණ ජයපාල නො දන්නා හෙයින් ද, එය පිළිබඳ ඩැනියෙල් නෝනා හා මාලිනිය අතර පැවති කතා බහ ගැනත්, ඔවුන්ගේ අනුමැතීන් ගැනත්, නො දන්නා හෙයින් ද, තම සිත සිය පුරතලිය කෙරෙන් සඟවා ගැනීම, ඔහු මේ වංක වැයමෙන් අපෙක්ෂා කළේ ය. අත්තනායක පවුලේ වැදගත්කම්, කුලවත් කම්, දවසින් දවස වැඩි-වැඩියක් දකින ජෝන්හට, ඔවුන්ගේ සමාගමය වැඩි-වැඩියක් ප්‍රිය වුයෙන් වියොවින් පෙළි-පෙළී පිස්සකු මෙන් තැන තැන, හුදකලාව ම, ඉබාගාතේ නො ගොස්, තම කාලය අවසන් වන තෙක් මොවුන් සමග දෙශාටනය කිරීම මැනවැයි ද සිතුණේ ය.

මේ පිරිසේ, කවුරු-කවුරුත් ඉක්මනින් ම ජයපාල සමග කුළු-පග බවට පැමිණියහ. තාරා දේවී පමණක් ඔවුන් සමග දෙ තුන්



දිනක් ගත කළ ඉක්බිති කාලිකතා නගරයේ කිසි යම් රැස්වීමකට යන බව කියා, වෙන්ව ගියා ය. සතියක් ගත වන තුරු ජෝන් හා එම මැණියන් අතර, නො මනාපය ද පළමු පරිද්දෙන් ම පැවති නමුත් එක්තරා සිද්ධස්ථානයක දී සංඝදාසගේ වචනයකට ජෝන් පරිහාස කළ කල්හි, ජයපාල මැතිණිය පුත්‍රයා හා කතාවට එය ප්‍රස්තාවය කොට ගත් බැවින්, එ වක් පටන් ඒ නො මනාපය ද තුනීව ගියේ ය. බොරු බේගල්වලින් සීමාව ඉක්මවා යන සංඝදාස මහ ගල් කුළුනකින් ගැළ වී ගිය පේකඩයක් දක්වා "මෙන්න බලන්න. අර මත් කිවුව ආදි කාලේ යෝදයන්ගේ දරුවන් වළ කජු ගැහු පෙන්දෙක් තමයි මේ" කියා කී කල්හි තවත් සිය උදහසට ඉවසුම් දිය නොහැකි වූ ජෝන්, විදුලි කොටමින් ගිගුම් දෙන වැසි වලා කුළක් මෙන් "මේ පූජනීය ස්ථානය බවත් නො සලකා, මේ යෝදයා ගහන බේගල්වල හැටි! එක්කෝ මේ ගංජා මතින් දොඩන නන්දෙඩුම්. නැත්නම් මෙහෙ ම විළි ලජ්ජා නැති බොරු, සිහියෙන් සිටින්නකුට නම් කියන්නට පුළුවන් දැයි?" විතාලේ ය.

මෙ වේලේ, ජයපාල මැතිණී කිසි ද පැකිලීමක් නැතිව පුත්‍රයාගේ මුහුණ, එක එල්ලේ බලා වචනයෙන් නො කීවත් මෙ වැනි දෙය තමා නො ඉවසන බව බැල්මෙන් ප්‍රකාශ කළා ය. එයින් ධෛර්‍යවත් වූ උපාසකයා ද රැල් බුරුල් හැර උගුර පාදා ගෙන, "මැතිණී, ඕවාට අප කිපෙන්නේ නැහැ. අලි ගිලපු මිනිහකුට මදුරුවකුත් කාරියක් ද? අඩජ, ජලාබුජ, සංසෙදජ, ඕපාතික යන චතුර්විධ යෝනියෙන් එක් යෝනියක උපන් අපට ඕවා පුරුදුයි. ඉංගිරිසි පැසන් එකට හැදුණු තරුණයාට නම් මේවා ඉතින් බේගල් තමයි. මත් පැන් බීලා, සිගරැට් බීලා, රූප-ශබ්ද-ගන්ධ-රස-ප්‍රෂ්ටව්‍ය යන පඤ්චාලම්බනයෙන් මත් වෙලා නොයෙක් දුශ්චරිතවල ගැලිලා, පන කද නසා ගත් තරුණයාට හිතෙන්නේ, මෙහෙ මත් යෝදයන් ලෝකෙ ඇති වුණා ද කියා ලා යි. සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන චතුර්විධ මාර්ගය සොයන මා මේ කියන්නේ, ඇත්ත යි. අපේ ගුරුවරු අපට කියා දීපු ඒවා තමයි,

අප මේ කියන්නේ. අපට බෑ, ඔය ඉංගිරිසි කාරයන් සතුටු කරන්න. හිතු මතයට බොරු කියන්න. ඒවා පව්''යි ඔහු කීයේ ය.

ජයපාල මැතිණී, ඊට අනතුරුව, පුත්‍රයාට හුදකලාව කතාකරමින්, ''ජෝන් බොහො ම නරකයි මිනිසුංට එහෙ ම කතා කරන එක. ඇහුණාද? ඒ දුප්පත් උපාසකයා, මගේ වියදමෙන් ආවේ, අපේ තනියට යි. ඒ මිනිහාට කැමති දෙයක් ඒ මිනිහා ඔහේ කියවාපුදෙන්- ඇහුණා ද? ඒ මිනිහාව සමච්චල් කරන්න ඔබට කිසි ඕනෑ කමක් නැහැ'යි'' කීවා ය.

නො මනාපයෙන් පසු වන්නන් අතර, මෙ වැනි කතාවක් නිසා නො මනාපය තව-තවත් ලිය ලිය යුතු නමුත් මෙහි දී වුණේ, සර්වප්‍රකාරයෙන් ම විපර්‍යාසයකි. මෙ තෙක් ඔවුනොවුන් මෙන් දුරින් දුරු කළ- මෑණියන් ද පුත්‍රයා ද අතර, අතිශයින් කටුක වුව ද, පථ්‍ය කෂායකට බඳු මේ ප්‍රභවය නිසා තවත් නොයෙක් කතාවලට මුල පිරුණේ ය.

''ජෝන්, ඔබ අප සමග ආශ්‍රය කරන ටික හොඳින් ඉන්න බලන්න. ඔය අත්තනායකවරු බොහොම ස්වල්ප දොෂයෙන් ඉක්මනට කලකිරෙන මිනිස්සු- ඇහුණා ද? ඔවුන් මොන ම එහෙකින් වත් ඔය ජයපාලවරුංට දෙ වැනි වන උදවිය නො වෙයි. ඔවුංටත් කුල මල නැහැ. ණය තුරුස් නැහැ. වස්තුව තියෙනවා. දන-උගත් කම් තියෙනවා. ඩේසිගේ හැටියෙන් ඔබට පේනවා නොවේ ද? ඇයගේ වයසටත්, තත්ත්වයටත්, ඇය කොපමණ රූමත් කාන්තාවක් ද කියා- ඇහුණා ද? ඉතින් ඔවුන්ගේ සිත් දිනා ගෙන, ඔබට හැසිරෙන්න බැරි වුණොත්, මටත් එක්ක ලැජ්ජා යි'' මෙ සේද, ජයපාල මැතිණී වරක් සිය පුතණුවන්හට කීවා ය.

මේ පිරිසට මනාප චාරිත්‍ර ධර්මයෙන් හැසිරීම- ඔවුන් සිත් දිනා ගැනීම- විශේෂයෙන්ම ඩේසි කුමරියට ආරක්ෂාවට හා සාකච්ඡාවට සුදුසු වයස්‍යයකු වීම- පරමාර්ථය කොට ගත් ජෝන්, අපහසුව, අනවකාශය හෝ නො තකා, ඔවුන් කැටුව,



හැම තැනකට ම යන්නටත්, ඔවුන්ට සහය පිණිස හැම දෙයක් කරන්නටත් අප්‍රමාද විය. අත්තනායක දෙ මහල්ලෝ ද ජෝන්හට අතිශයින් කරුණාවත් වූහ. කො තරම් කරුණාවත් වී ද යත්, ගෞරව පූර්වක වී ද යත්, ජෝන් කෙරේ අචල විශ්වාසයෙන් තමන්ගේ අසහාය නෙත්‍රය බඳු එක ම දියණියන්, තමන් නැති තන්හි ඔහුගේ රක්ෂාවරණයෙහි පවා තැබීමට ඔවුහු නො කැමති නුවූහ. වතාවක් අලුත් සිලිපරයකට හැපී බුබුලු නැගුණු පාද ඇති හෙයින් පයින් හැතැප්ම තුනක් අඩි පාරක ගමන් යා ගත නොහැකි වූ ඩේසි කුමරියට, මෙසේ ජයපාල තරුණයාගේ රක්ෂාවරණය ලබන්නට සිදු විය.

හුස්ම ගැනීමට මිස ගහක කොළයක් වත් සෙල වීමට තරම් වූ වාත වේගයක් නො පැවැති, අවිඃ අතිශයින් බලවත් වූ එක් මධ්‍යාහ්නයක, මාවත දෙ පස, මුඩු බිම් යායෙන් මිනා, අන් කිසි වැව්ල්ලකින් හෝ, ගෙයක් දොරක් පිහිටි උයන් වත්තකින් හෝ, කිසි ම ආවරණයක් නො ලත්, මහ මං කඩක, නොහොත් අඩි පාරකට හැරෙන මං සන්දියක මොටෝ රථ හා ඩේසි, ජෝන් හා නතර කොට, මේ පිරිස කිසි යම් සිද්ධස්ථානයක් බලා පිටත් ගියා හ. මෙ වැනි ඉර මුදුන් වේලාවක, පොරණුවක පැසෙන්නා සේ අව්වෙන් තර වෙන, පියස්සෙන් වැසුණු මොටෝ රියක, කොතෙකුත් කල් පසු වීම නො හැකි වූ බැවින් ජෝන් ජයපාල, සිය රියෙන් එළියට පැන ගිමන් හැරීමට සුදුසු තුරු සෙවණක් සෙවුවේ ය. මෙහි දී ඔහු විසින් පිට්ටනිය මැද පිහිටි විහිදුණු අතු පතර ඇති, සිසිල් සුව දෙන විශාල වෘක්ෂයක් දක්නා ලදි. සූර්‍ය තාපයෙන් පරි පීඩිත වූ බැවින් එම රුක් සෙවණ ඔහු දෙ නෙතට දිව්‍ය විමානයක් පරිද්දෙන් ඉතා ම සැප එළවන්නේ විය. තවද, මේ වේලේ මේ රුක් සෙවණ දර්ශනයට කො තරම් ප්‍රසාද ජනක වස්තුවක් වී ද යත්, එයින් තරුණ කුකවියකුට වුවත්, කවියට සුදුසු අදහස් නිසැකයෙන් පහළ වන්නේ ය. මහල්ලකුට වුවත්, මැහැල්ලක වෙත පෙම් බඳින සිත් පහළ වන්නේ ය. මේ සෙවණ දුටු දෙ නෙතින් පිණා-පිණා හෙතෙම යළි වට-පිට බලන්නේ, රිය තුළ හිඳ ගත් ගමන් පොතක් කියවන අත්තනායක කුමරිය දුටුවේ ය.

"ඔය රථය ඇතුළට වැදුණු ගමන් ඉන්නේ ඔබට රස්නයක වගක් දනෙන්නේ නැද්දයි?" මෙහි දී තරුණ ජයපාල, සිනාසෙමින් ප්‍රශ්න කළේ ය.

පොත පසකින් තබා, ඔහු මුහුණ බලා, අත්තනායක කුමරිය ද සිනා සුණා ය.

"මට මේ රථ පියස්සේ වත් සෙවණ තිබෙනවා. ඔබ ඔය ඉන්නේ, මහ දාස් දෙන අව්වේ නොවැයි?" ඇ පුදුමයෙන් විතාළා ය.

මෙහි දී තරුණ තෙමේ, තරුණියට කතා කොට, සිය නෙත් පැහැර ගත් රුක් සෙවණ දක්වා, ගිමන් හැරීමට නම් තැන, එයම බව කීයේ ය. තව ද, තමාට අතිශයින් සා පිපිසාව ඇති බවත්, තරුණයා විසින් දන් වන ලද කල්හි, තරුණී වේවැල් පෙට්ටියක් දක්වා, එහි තමනට යැපෙන පමණ කෑම්-බීම් ඇති බව කියා, එය ගස යටට යවන උපායයක් නො දක රථ-පිට බැලුවා ය. රිය පදවන්නන් ද එකකු නො රැඳී, පිරිස කැටුව, ගිය හෙයින්, ඇයගේ බැල්මෙන් කාරණය තේරුම් ගත් තරුණ තෙමේ, කෑම පෙට්ටිය වහා සියතට ගත්තේ ය. ඉක්බිති සර්මයෙන් පරිපීඩිත වුව ද, ප්‍රීතියෙන් විකසිත වූ රත් පියුමකට බඳු මුහුණ ඇති ඩේසි කුමරි, කිසි ද පැකිලීමක් හෝ චකිතයක් නොව, බුබුලු නැගුණු හෙයින් වහන්වලින් වහන් නුවූ දෙ පා යුවළ බිමට දිගු කොට රත් ය- පටක් පැහැර යන්නා සේ ගිනි ගෙන දැවෙන මාවත පියවරෙන් දෙකෙන් ඉක්මවා, තණ තලව්වට පැන ගත්තා ය. තරුණ ජයපාලට මෙහි දී ඇයගේ දෙ පා යුවළ නිතැතින් ම බැලුණු හෙයින්, වහන් ලත් කල්හි මෙන් නොව, නොලත් කල්හි දක් වෙන ස්වාභාවික සෞන්දර්‍ය්‍ය වඩා දකුම්කලු වස්තුවක් මෙන් පෙනිණ. ඩේසි කුමරියට වැනි දෙ පා යුවළක් ගැහැනියකට පෙර පිනකින් ම ලැබෙන්නේ ය. අනෙකක් තබා, ඒ දෙ පයට ගැනෙන වහන් සඟළ පවා පෙර පිනකින් උසස් සේවයට පැමිණි සත්ත්ව කෙනෙකුන් මෙන් නෙත් සිත් පොළඹවන්නේ ය. තව ද, ඕ තොමෝ මල් දම් යුවළක් වන් අතිශයින් ම සුකුමාර යුගත් ගොබ



ඇත්තී ය- තට මත් සොළොසැවිරිදි කුමාරිකාවකට බඳු ළඳ-බොළඳ පෙනුමෙන් යුත් වුව ද ඉක්ම වන ලද විසි වයස් ඇත්තී ය-මාලිනියගේ මෙන් දුටු-දුටුවන් වසඟ කරන ප්‍රඥ දීප්තිමත් කාන්තියෙන් නොව, සඳුන් සිහිල් වැනි සැලුමෙන් බබළන නිලුපුල් පෙති වන්, නෙත් සඟළ ඇත්තී ය- ඉතා ම දකුම්කලු සිනිඳු, සුනිල් දිග, ඇසි පිහාටු ඇත්තී ය- දුරින් බලන්න වුන් හට අඳුන් මෙන් පෙනෙන සුනිල් සිනිඳු රෝමයෙන් ගැවසී ගත් බැම සඟළ ඇත්තී ය- සකල ස්ත්‍රී ලක්ෂණ සම්පන්න නායිකාව ඇත්තී ය- රතු පබළු වන් හනු මස් කෙළවර, වීදුරු මිණි මෙන් බබළන දත් දෙ පෙළ ඇත්තී ය. තව ද ඇ ශරීරයෙන් සිහින් ය, සුකුමාර ය- එ සේ ද වුව පමණට සුදුසු පරිද්දෙන් මාංසයෙන් පිරුණු අඟ-පසඟ ඇත්තී ය. ඇයගේ කෙශ කලාපය දිග ය- අතිශයින් ම කළු ය- පට මෙන් සිලුටු ය- මෘදු ය- එ සේ ම පවනින් ද යුක්ත ය.

මෙ සේ මිරිඟුවෙන් බබල-බබළා දැවෙන බලවත් උෂ්ණය ඇති හෙයින් දෝ, නොහොත් අපායයට වැටුණු සඳ එළිය ඇති තැනක් මෙන් සිසිලෙන් පිණවන රුක් සෙවණ ඇති හෙයින් දෝ, නොහොත් පෙනෙන තෙක් මානේ තමන් හැර, දස දිසාවෙහි ම අන් කිසිවකු නොමැති හෙයින් දෝ, ජෝන් ජයපාලට නම් වෙ වේලේ පෙර නුදුටු ශ්‍රී විභූතියක් ඩේසි කුමරිය කෙරේ පෙනෙන්නට විය. ඇය පෙනුමෙන් ම නො සොහොල් බවත්, අකපට බවත්, කෝමල බවත්, උගත්කම් වලින් අවිෂම බවත්, නිරහංකාර බවත්, නිශ්චල බවත්, උපශාන්ත බවත්, පුරුෂයකුගේ රක්ෂාවරණයෙන් ම රක්ෂා විය යුතු- පුරුෂයකුට ඇය රැකීම ප්‍රීතියක් විය- ඇය වෙනුවෙන් ජීවිත සංග්‍රාමයට ඉදිරිපත් වීම අභිමංගලයක් විය යුතු- පූජාර්හ වස්තුවක් බවත්, පෙනෙන්නට විය.

මෙ සේ පෙනෙන නොයෙක් අමුතු ගුණ වෙසෙසින් පිරුණු ඩේසි තරුණිය කැටුව, කොළපාට පියුද ඇතිරිල්ලකට බඳු තණ බිම සුව පහස් විඳ-විඳ පූර්වොක්ත වෘක්ෂය දිශාභිමුඛව හෙමින්-හෙමින් ගමන් කරන්නේ, ලෙහෙසියෙන් තරණය කළ නො හැකි, දිය නැති වත් පිරුණු මඩ ඇති, මහ අගලක් දක, ජෝන් ජයපාල

තෙමේ තතර විය. දුරින් බලන ඔවුනට පහත් බිමක් හැටියට පෙනුණු මෙ තැන, දන් නම් එ ගොඩ වෙන්නට නො හැකි තරම් ගැඹුරු මඩිත්තකි. ව්‍යායාමශීලි ජවසම්පන්න දෙහ බලයෙන් සමෘද්ධ හෙයින්, ජෝන්, පෙට්ටි ද රැගෙන මේ මඩ අගල කිසි ද අපහසුවක් නැතිව, එක පිම්මෙන් ම තරණය කළේ ය.

"මහත්මයා නම් සංසාරෙත් එගොඩ වෙච්චි- ඉතින් මා?" කියා තරුණි සිනා මුහුණෙන් වුව ද, අසරණ බැගෑපත් ලීලාවෙන් මෙ ගොඩ සිටගෙන කීවා ය.

ඒ ශ්‍රවණය කළ ජෝන්, සසර සයුරෙන් සතකු ගොඩ ලන බව කෙසේ වුවත්, මේ ප්‍රිය මනාප සංස්කාර පිණ්ඩය මඩ සොරොව්වෙන් මෙ ගොඩ ලන උපායය සොයන්නේ, එ කෙණෙහි ම, ගැඹුරු පටු තැනකින් ඉවුර බිඳ, අගල දෙ පස, දෙ පය රඳවා ගෙන, අය වඩා ගත් ගමන් එ ගොඩ තැබීමට කැඳෙව්වේ ය. මෙහි දී තරුණී ඇලි-මැලි කොට ලජ්ජාවෙන් මඳක් පසු බා සිටියා ය. නැවත-නැවතත් පෙරැත්තයෙන් කැඳවන්නට වූ කල්හි, ඈ ඔහු යුගකට ළං වූවා ය. එසේ ළං වූ තැනැත්තිය මෘදු ස්පර්ශයෙන් ගෙන, එ ගොඩ තබන්නට සැරසෙන්නා සමග, මේ අමුතුව ලත් බරෙන් පය පස් බුරුල්ව ගිය හෙයින් තරුණ තෙමේ ඇයත් රැ ගෙන ඒ මහ මඩ කඩිත්තට පර්වතයක් මෙන් ඇදගන වැටුණේ ය.

තරුණිය වසා ගෙන, තරුණයා උඩින් වැටුණු හෙයින් ඔහුට වහා නැගිට ගත හැකි විය. තරුණී ද වහා නැගිට ගත් තැනැත්ති, වැටීමෙන් ද මඩ තැවැරීමෙන් ද දුගඳ වැද ගැනීමෙන් ද, එකම මඩ වලාවක් වැනි වූ ඇඳුම්-පැළඳුම් දක්වා, "අනේ! මහත්මයා මාව මේ නරකාදියේ නො වේ ද දැම්මේ?" කියා හඬන්නට පටන් ගත්තා ය.

ඩේසි කුමරි ස්වභාවයෙන් ම සිවුමැලි වුව ද අතිශයින් ම විනීත හෙයිනුත්, කාරණාකාරණ දන්නා නුවණැති හෙයිනුත්, සාභිප්‍රායෙන් නොව, අහම්බයෙන් වන මෙ බඳු ප්‍රමාදය සිනාවට විනා හැඬීමට



හරුණු කොට ගැනීම නුසුදුසු බව දන්නී ය. මේ මඩ තැවරුණු දුගඳ හමන, ඇඳුම් මාරු කර ගැනීමට හැටියක් නැති කමටත්, මේ විසුළු වෙසින් ගෞරපුරයට යා ගත නො හැකි අපහසුවටත්, වඩා ඇයගේ වැලපීමට කාරණය වූ යේ, වැටීමෙන් වූ පීඩාව ය. බලවත් අඩම්තේට්ටමකින් වෙහෙසට පත් කල්හි මෙන් ඈ මෙයින් ආතුර වූවා ය- නො හඬා සිටිය නො හැකි තරමට වේදනා වෙන් පීඩිත වූවා ය. පයින් යන ගමන් පවා නැති කරලීන් කිකිළි බිජු පළුවක් සෙයින් පාදයෙහි නැගුණු දිය බුබුල ද, මේ අබග්ගය කරණකොට බතල සිව්යක්මෙන් ගැළ වී ගියේ ය. දිය බුබුල බිඳුණු දැවිල්ල ද, දැඩි රිව් රැසින් පහළ දැවිල්ල ද, ඉවසා ගත නො හැකි වූ තැනැත්තී ආයු සංස්කාරය හරනා දෙව් දූවක මෙන් ක්ලාන්ත වූවා ය. සිහිනෙනුදු දොම්නසක වග නො දත්, කොවුලහනක මෙන් නිතර සොම්නසින් ගත කළ සිත් ඇති, මේ සුකුමාර තරුණියට, තමාගේ ප්‍රමාදයෙන් වන විපත පෙනෙන කල්හි තරුණයාට ද සිත් තැවුල ඉවසුම් නො දෙන්නේ ය. ඔහු දන් හිස ගිනි ගත්තකුට නැති කලබල ඇත්තේ ය- කටයුතු නොකට යුතු පිරිසිඳ නො දක්නා අවුල් වූ සිහිය ඇත්තේ ය- සිය ඇකයෙහි ක්ලාන්තයෙන් පසු වන තරුණ කුමාරිකාවගේ නිශ්චල දෙහ ශ්‍රී සංඛ්‍යාතාමෘතය දෙ නෙත් මුවෙන් බිබී මුළාවට පැමිණි දිව්‍ය රාජයකු මෙන් ද, අවුල් වූ සිහිය ඇත්තේ ය.

"මේ, එම සවස ම, ආපසු ගෞර පුරයට යන අදහසින් පැමිණි ගමනකි. එ හෙයින් ඔවුහු මහට සුදුසු අමුතු ඇඳුම්-පැළඳුම් නොගත් හ. තරුණයාගේ ඇඳුම්වලද සැහෙන පමණ මඩ නැත්තේ නො වේ. මඩ දුටු තැන පාගන, දිය දුටු තැන සෝදන, එබන්දනට කිලුටක වගක් හෝ බරපතළක් හෝ නො දැනෙන්නේ ය. එහෙත් අපිරිසිදු බව කිසි කලකත් ගත-සිත වැද්ද නුදුන් ඩේසි කුමරිය වැනි සුවිනීත කාන්තාවකට මඩ පැහැයෙන් සිතියම් වූ වලාකුළුවලින් ද දුගඳ කැවුණු කල්කයෙන් ද, අපිරිසිදු වූ ඇඳුම්-පැළඳුම් සියල්ල ඇඟ ලා ගත් ගමන් මෙ සේ පසු වීම ඇත්තෙන් ම ඉවසිය නොහෙන දුකකි. අසලක දිය ඇති බවක් ද, නො පෙනෙන හෙයින් සියතින් මඩ සූර-සූරා, සැනසිලි දෙන රස බසින් ඇය

නළවන්නටත් දිය බුබුල බිඳුණු කුටාලයට පවන් සලන්නටත්, තරුණ තෙමේ අමතක නො කළේ ය.

“මහත්මයාට මා කැත නැද්ද? මා ගඳ නැද්ද? මා අත් හැර දමුව මැනවැයි” ඈ දෙ නෙත් පියා ගෙන, විඩාවෙන් පිටිය ද සුමිහිරි හඬින් කීවා ය. මෙහි දී ඔහුට පළමු පමණටත් වඩා ඇයගේ කට හඬ කන්කලු විය- වචනය රසවත් විය- නොහොත් කන්කලු පමණට රසවත් විය- රසවත් පමණට කන්කලු විය.

“ඩේසි!” යනුවෙන් ඔහු මෙහි දී ඇයට පරිචිතියෙන් ආමන්ත්‍රණය කොට, පෙර කිසි කලක නො පෙන්නූ හෘදයාලු භාවයක 'දක්වමින්, “ඩේසි! මට ඔබ ගඳ නැහැ- මට ඔබ කැත නැහැ- මට, මඩ ගොඩේ වැටුනත් මැණික මැණික මයි ඔබ සතුටු නම් මේ මඩ, මං දිවෙන් ලෙව කා දමන්නං”යි උමතුවෙන් කීයේ ය.

මෙහි දී ඔහුගේ කට හඬ ගැඹුරු විය- රළු විය- වැලඳ ගැත්ම ද දැඩි විය. ව්‍යාධයකුගෙන් ත්‍රස්ත වූ මෘගාංගනාවක මෙන් බිය පත් වූ ඕ තොමෝ දෙ නෙත් හැර, සන්වේගයෙන් ඔහු මුහුණ බැලූවා ය. මෙ තෙක් ඔහුගේ චරිත ස්වභාවය අර්ධමුඛ මාත්‍රයෙන් දුටු පුරුදු ඩේසි කුමරියට දැන්-දැන් පෙනෙන සම්පූර්ණ මුඛ විලාසය ඇති හෙයින්, ඔහු ස්වභාවයෙන් ම විකල වූ සිහි ඇතියකු සේ නොහොත් කාම දෙවතාවන් ගිවිසුම් කොට ගෙන, කුල දෙවතාවන් නසන්නකු සේ දැනෙන්නට විය. කාම දෙවයාගෙන් ලබන ලද වරම් ඇත්තකු සේ ඔහු සමුද්වේගයෙන් ද, හ්‍රස්ව ශ්වාසයෙන් ද, ඉපිළ නැගෙමින්, පියුමක් පරිද්දෙන් ඇයගේ මුහුණ සිත් සේ ළං කොට ගෙන අතුරක් නැතිව සිඹින්නට ද විය.

මෙ බඳු අවස්ථාවට පැමිණි කල්හි ප්‍රසන්න කාරණයෙහි ද ස්ත්‍රිය අප්‍රසන්නය දක්වීම ස්වභාවය කොට ඇති හෙයින්, අප්‍රසන්නය දක්වන ඩේසි කුමරි, ඔහු කෙරෙන් පලා යන අදහසින් පෙරළි කරන්නට පටන් ගත්තා ය- මෙ සේ පෙරළි කොට ඔහු අතින් මිදුණු කෙණෙහි ඈත මේ සියල්ල දකිමින් එන පිරිසක් දැක, ඔවුන් ඉදිරියට ම දිවුවා ය. පිරිස දුටු කෙණෙහි ජෝන් ජයපාලගේ



මෝහනය ද විදුලි වේගයෙන් අතුරුදන් විය. එහෙත් සන්ත්‍රාසය තරණ නොට අහස පොළොව දෙක එකට නටන්නා සේ පෙනුනෙන්, ඔහු බිම බලා ගත් ගමන් ගොස්, රුක් සෙවණෙහි වාඩි වුණේ ය. ඔහු මේ පිරිස සාක්ෂ්‍ය කොට, ඇස් කුට්ටම් කිහිපයක් ඉදිරියේ කෙළේ, සාහසික වූ ම ක්‍රියාවකි. ඉතින් මේ නින්දිත සැහැසි කම පෙනුණේ, තමා නොහඳුනන අලුත් පිරිසකට නම් නැවත නො හමුවන්නන් හෙයින්, එයින් අමාරුවක් නො වන්නේ ය. එහෙත් තමා සිටිනා තැනින් ම දැන් පොළොව පළාගෙන අපායගත වන්නට යම් කිසි විදියක් වෙතොත්, එය නො වළහා කරන්නට ඔහුට දැන් සිත් දෙන්නේ, සිය මැණියන් ප්‍රමුඛ පිරිස විසින් ම, මෙ සේ මේ තමන් නෝබිනා කම දකින්නට යෙදුණු හෙයිනි.

සැතැප්ම හයක, යන-එන ගමන් ඇති මේ පිරිස. පැය බාගයක් ගත වන්නටත් පළමු මෙ සේ ආපසු පැමිණියේ අන් කරුණක් නිසා නොව, මං සන්දියෙන් හැරුණු අඩි පාරේ හැතැප්ම කාලකින් පමණ ඔබපිහිටි, පයින් එතර විය යුතු නො ගැඹුරු ඔය, ගතවූ දෙ තුන් දින වට වැසි, කරණකොට අදිසි ජල ප්‍රවාහයකින් යුක්ත වූ හෙයිනි. ඩේසි කුමරියට සිපාචාර පැවැත්වීමට කිසිද යුතු කමක් හෝ අයිතියක් හෝ උරුමයක් හෝ නැති ජෝන් ජයපාලට, එ බඳු යුතු කමක් හෝ අයිතියක් හෝ උරුමයක් හෝ ඇති වැඩිහිටියකු විසින් වත් කිසි කලකත් කරන්නට නො යෙදෙන්නාවූ කාමයෙන් උමතු බවට පැමිණි පිස්සකුගේ අඩන්තේට්ටමක් වැනි ක්‍රියාවකින් බලහත්කාර කම් කරන සැටි දුටු කෙණෙහි, මේ පිරිස කවුරුත් මුල් ඇද ගත් ගස් මෙන්, ඒ ඒ තැන පා ඔසවා ගත නොහැකිව, විස්මයෙන් හා ලජ්ජාවෙන් පැකිලී සිටියහ. තෝමස් අත්තනායකගේ සුදු මැලි සිහින් සිරුර භූතාවේශයෙන් මෙන් වෙව්ලන්නට පටන් ගත්තේ ය. සාරා අත්තනායකගේ සිවු මැලි සිරුර ද ගිනි ගෙන දවෙන ඉටි රුවක් මෙන් මිලිනව ගියේ ය. ජයපාල මැතිණිය යුද්ධයකින් පරාජිත වූ රැජිනියක මෙන් තුෂ්ණිම්භූතව සිටියාය. උපාසක තැන දෙ බැම නගා, කට කසමින් තකත් කරු ගණින්නකු සේ අහස බලා ගත්තේ ය. රිය

කරුවන් හා ඔවුන් අත වැසියනුත්, අතින් හිසින් බදා ගත් බර
පොදි ඇතිව, අනතුරුව නැටෙන නැටුම දකින ආසාවෙන් පුලපුලා
සිටියා හ.

මෙස ගර්ජනයකට පළමු ඇති වන සන්සුන් බවක් පරිද්දෙන්
මෙ සේ මඳකට ඔවුන් සන්සුන් වුවත්, කර්දමයෙන් හා දුර්ගන්ධයෙන්
වැසුණු ශරීරයෙන් තමන් වෙත දිව ගෙන එන්නා වූ දියණියන් ද
තෝමස් අත්තනායක "තිගේ හැටි මොක ද මේ, ඊරියක් වගේ?
තී අප නැසුවා- පල, පල" කියා පලවා ගත්තේ ය.

සාරා අත්තනායක ද තදානුරූප වූ වේගයෙන් "තී මන් දැහේ-
මුණේ තබා හැදුවේ. මීට ද? ඉතින් තී ජීවත් වෙලා මොට ද?
මොන වැදගැන්මකට ද? තී ඉතින් බිල්ලකට මිසක් වෙන කාට
දෙන්න දැයි?" කීවා ය.

"පින්වතුනි! මේවා දෙයියන්ගේ අණ-ගුණ පවතින නපුරු
රටවල. ඉංගිරිසි පැසන් එකට වැඩ කරන්න තැන් නොවෙයි, මේ.
මේවායේ කට වරද්දා ගන්න හොඳ නැහැ. මාත් බාසා එක් සිය
විස්සක් දන්නවා- ඍග්, යජුර්, සාම, අථර්ව කියන චතුර්වේදය
ම දන්නවා. මෙහෙ ම දෙයක් නම් අම්ම මුතුන් කාලේ දුටුවේ
නැහැ"යි උපාසකයා ද කීයේ ය.

කවදත් ඉක්මනට නො කිපෙන්නා වූ- නො කැළඹෙන්නා වූ-
ඉවසීමෙන් කරුණු විමසන්නා වූ- ජයපාල මැතිණි, ඩේසි කුමරිය
ළඟට කැඳවා, මේ අභාගය සම්පන්න දර්ශනය ගැන තොරතුරු
සියල්ල අසා දැන ගත්තා ය. එ සේ දැන ගෙන, කෝපය කරණ
කොට මොහොතින් මොහොත රතු වෙමින්- සුදු වෙමින්- හුණු
වෙමින්- හිම වෙමින්- අත්තන ඇට කැවුණා සේ නොයෙක්
ලෙසින් වෙනස් වන, අත්තනායක දෙමාල්ලන් සනසන්නට පටන්
ගත්තා ය. ඇසට පෙනුණු පමණින් කාරණය බරපතළ කොට
සිතට ගත්තා විනා, ඇත්ත විමසා නො බලා ඉක්මන් වීම ගැන
පසු තැවිල්ලට පත් අත්තනායක දෙමාල්ලෝ, එයින් මඳක් සහනය



ඩු සිතැත්තෝ, වැඩි කතා පසුවට තිබිය දී, වහා දියණියන්
රැගෙන ගෞර පුරය බලා පිටත් වූහ.

වෙන දා නම්, ගෞර පුරයෙහි ප්‍රීති ප්‍රමෝදයෙන් සන්ධ්‍යා
කාලය ගත කරන මේ අමුත්තෝ, මෙ දින විසඳා ගත නොහැකි
ප්‍රහෙලිකාවකින් මඩනා ලද සිහිය ඇත්තන් සේ, වෙන-වෙන
සිතිවිලි ගෙන තැන-තැන, කල්පනාවේ යෙදී සිටියහ. උපාසක
තැන පමණක් අත්තනායක වරුන් හට පුරෝහිතයකු මෙන්
අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනය කිරීමට අදහස් කළේ ය.
"මේවා වෙන්නේ, සමය චාරිත්‍ර, දෙහ චාරිත්‍ර නො දන්නා කමෙක-
දාන, ප්‍රිය වචන, අර්ථ චර්යා, සමානාත්මතා යන සතර සංග්‍රහ
වස්තුව නො දන්නා කමෙන්- මෛත්‍රී- කරුණා- මුදිතා-උපෙක්ෂා
යන සතර බ්‍රහ්ම විහාර ධර්මය නො දක්නා කමෙන්- ඕවා
දන්නවා නම්, මේවා මෙහෙ ම වෙන්නේ නැහැ. ප්‍රාණ ඝාත-
අදත්තාදාන-කාමමිථ්‍යාචාර-මුසාවාද-සුරාපාන-පේලාම්-ඵරුෂ
වචන-සම්ඵප්‍රලාප-අභිධ්‍යා ව්‍යාපාද- මිථ්‍යාදෘෂ්ටි කියන
එකොළොස් වැදෑරුම් ගින්නක් ඇති බව මේ පින්වත් ඇත්තෝ
දන්නවා ද? සංජීවය- කාල සූත්‍රය-සංඝාතය-රෞරවය-මහා
රෞරවය-තාපය-ප්‍රතාපය-අවීචිය කියන අට මහ නරකයක් තිබෙන
බව දන්නවා ද?"

"උඹට නරක ද උපාසක රාළ එයින් එකකට යන්න?" කියා
මෙහි දී තවත් ඔහු ඉවසිය නො හැකි වූ තැන, කථා විච්ඡේදය
කරමින් තෝමස් අත්තනායක ප්‍රශ්න කළේ ය.

"මේ උදවිය අහනවා නම්, එළි වෙන කන් වුණත් බැරුවයැ.
ඔහොම දැන ගංට සැහෙන යමක් කියලා, කරලා දෙන්න.
ඉංගිරීසිවලට කොහේ ද- මේවා වච්චනාවී වගේ නො වැයි?"
කියමින් ඔහු ද, විසඳිය නො හැකි පේරවිල්ලක් හිසට ගනිමින්
යන්නට ගියේ ය.

අත්තනායකවරුන් බොරු ගිලන් බවක් දක්වා, වෙන්ව ආහා-
ර ගත් හෙයින්, එදා රාත්‍රි භෝජනය ද ප්‍රකර්ෂයෙන් හීන විය.

ජයපාල මැතිණිය වෙතින් සියල්ල අසා දැන ගත් මහා රාජා ද, එම රැජිනිය ද, මද්‍ධ්‍යස්ථ භාවය භජනය කරමින් මේ ආගන්තුක පිරිස අතර යළිත් සමගිය ඇති කරන උපායය සෙවූ හ. රාත්‍රී භෝජනය අවසන් වූ ඉක්බිති ජයපාල මැතිණි පුත්‍රයා පසකට කැඳවා ගෙන, ඔහු කළ මේ බලවත් නො හොබනා කමට චෝදනා මුඛයෙන් දරුණු අපවාද නගන්නට පටන් ගත්තා ය.

"තෝමස්, ඔබ එ තැනම වෙඩි තියා නො දැම්මා ඇති. ජෝන්- මොක ද, ඔබ කළ මේ විකාරය? ඔබට පිස්සු ද?" කියා ඈ වේගයෙන් ප්‍රශ්න කළා ය.

"ඒ ගැන මට බොහොම කනගාටුයි අම්මේ."

"ඔබේ කනගාටුව වගේ නො වෙයි. ඇයට එයින් වුණ නින්දාව"

"මට ඒ කිසිවක් ම පෙනුණේ නැහැ."

"මොක ද ඔබට වැහුණු පිස්සුව?"

"මා ඇයට ආදරෙයි."

"ඔබ-ඇයට ආදරෙයි?" මෙ සේ කියා ජයපාල මැතිණි "හා! හා!" ගා සිනාසුණා ය. සිනාසී "ජෝන්, ඔබ කොහොමද ඇයට ආදර කරන්නේ? ඔබට ආදර කරන්න අරහෙ කැලෑ හඳක් තිබෙනවා නොවේ ද?"යි යළිත් ප්‍රශ්න කළා ය.

ජයපාල තරුණයා මෙහි දී යටි තොල පිකා ගෙන, අහස බලා ගත්තේ ය. ඔහු කතා නැතිව සිටිනවා දුටු ජයපාල මැතිණි නැවතත් මෙසේ කීවා ය.

"මය පිටිසර කෙල්ලකට උගේ නෙයියාඩං පෙන්නංට බෑ ජෝන්- ඇහුණා ද, මේ රට පිළිගත් කුල කාන්තාවංට ඩේසිට ප්‍රේම කරංට නම්, ඔබ සිතින් නිදහසක් ඇති මිනිහකු වෙන්න ඕනෑ-ඇහුණා ද, ජෝන්? එහෙ ම නැතුව්, ඔබ මේ කරණ වැඩවලට-වටින්නේ , දඬුවම් ලබන්නයි. එතකොට කියන්න, ඔබ



ඩේසි සමග විවාහ වෙන්න කැමති දැයි?" ඈ එකා එල්ලේ ප්‍රශ්න කළා ය.

ජෝන් ද හර බා ගත් ගමන්, "ඔව්" කියමින් ඒ තැනින් ඉවත් ගියේ ය.

පසුව දා යළිත් ගෞර පුර මාලිගය ප්‍රීති ප්‍රමෝදයෙන් බබළන්නට විය. ජෝන් ජයපාල, ඩේසි කුමරිය හා විවාහ ගිවිස ප්‍රීතිය එහි උත්සවාකාරයෙන් පවත්වන ලදි. මහා රාජාය ද, මෙ දින, විශේෂයෙන් කැඳවනු ලැබූ, දන්නා හඳුනන තවත් බොහෝ පිරිස් ද මේ විවා ගිවිසි තරුණ යුවළට ශුභාශිංසන මුඛයෙන් ආශිර්වාද කළ හ. විවාහය ද නො පමාව ගෞර පුර මාලිගයෙහි දී ආර්ය චාරිත්‍රානුකූලව කැරවීමට ශුභ මුහුර්තයෙන් යුත් දිනයක් ද නියම කරගත් ජයපාල මැතිණි, මේ කිසිවක් පුවත් පත්වල පළවෙන්නට ඉඩ නො තැබුවා ය.

ඩේසි කුමරි, උත්තම පුරුෂයකු ස්වාමි කොට පතන්නී, කුලයෙන්, ධනයෙන් හා දැන උගත් කමෙන් ද රූපයෙන් හා යෞවනයෙන් ද අග තැන් පත් ජෝන් ජයපාල වැන්නකු ලබන බලාපොරොත්තුවක් කිසි කලකත් ඇති නො කළා ය. වාත වෘෂ්ටියකට හසු වූ පක්ෂි පක්ෂ්මයක් පරිද්දෙන් මෙ සේ දෛවයෙන් ගෙන යනු ලැබූ කෙණෙහි ජෝන් ජයපාල වැනි තරුණයකුගේ හිසක සිත්කලු පලඳනාවක් පරිද්දෙන් තැන්පත් වන්නට ලැබීම ද, ඇයට මහත් පුදුමයකි. කපට කම් නො දන්නා ඇයට මේ උපක්‍රමයකින් වූ දෙයක් සේ නො පෙනේ. ජයපාල පෙළේ ආධුනිකයා වශයෙන් විනා- මහජන සේවකයකු වශයෙන් විනා- ජන ප්‍රභූවරයකු වශයෙන් විනා- ජෝන්ගේ අතීතය පිළිබඳ අන් කිසිවක් ඈ නොදන්නී ය. සත්‍යප්‍රිය සංඝදාස උපාසක තැනගේ කටින්, යම් යම් විට, පිටවුණු අස්කොන් පදවලින් නම්, ජෝන්ගේ නිදහසට බාධක වන්, අගෞරවයට හේතුක වන්, කිසි යම් රහසක් පවතින බව ඈයට නො පෙනෙන්නේ නො වේ. එහෙත් ඒ සම්බන්ධයෙන් සංඝදාස වැන්නකු කුළුපග බවට ගෙන කරුණු

ව්‍රීමසීම තමහට තරම් නො වන බැවින් ළඳ-බොළඳ ලජ්ජාශීලය නිසා, ඕ නිසොල්මන් වූවා ය.

"හැබෑට ම මේ ශක්‍රයාගේ අතට වජ්‍රායුධය දුන්නේ, නිකම් පෙනුමට තියා ගන්න ද? මෙහෙ ම තැනට නැති හෙණ, මොනු ගහන්න බලා ඉන්නේ, කාගේ ඔළුවට දැයි?" ශක්‍රයාගේ සිත්කලු සිතියමක් දෙස බලාගත් ගමන් සිටී, උපාසක තැන, ඩේසි කුමරියට පමණක් ඇහෙන්නට කීයේ ය.

මේ දරුණු ශාපයකට බඳු ක්‍රෑර වචනය, කවදත් මිහිරි බසට පුරුදු අත්තනායක තරුණියගේ සවන් ගත වූ කෙණෙහිය හුලක් වන් කල්හි මෙන්, දෙ නෙතින් කඳුළු ගලන්නට විය. සාරා අත්තනායකට දියණියන් දෙ නෙතින් ගලන කඳුළු පෙනෙනවා විනා, ඊට හේතුව නො පෙනෙන බැවින් සතුටු කඳුළු වනැයි සලකා, දියණියන් සනසන්නට පටන් ගත්තා ය.

"මොක ද මේ අඬන්නේ? ඔහොම ද මෙහෙම දවසේ ගෑනු ළමයින් සතුටු වෙන්නේ?" කියා ඈ දියණියන් තුරුලු කොට ගත්තා ය.

"මෙහෙ ම දවසක තමයි පින්වතුනි, ගෑනු ළමයින් අඬන තරමක් අඬන්න ඕනෑ. දුන්ය-මුගුරය-අඩයටියය-කඩුවය-පාරාවළල්ලය කියන පඤ්චායුධයක් ලෝකයේ තියෙනවා. ඒ පඤ්චායුධය ඉදිරියට පනින එක කාරියක් නො වෙයි. පින්වතුනි, රවි-චන්ද්‍ර-කුජ-බුධ-ගුරු-ශුක්‍ර-ශනි-රාහු-කේතු යන නවග්‍රහ දිව්‍ය රාජයන් සමඟ, නැත්නම්, ධෘතරාෂ්ට්‍ර-විරූඪ-විරූපාක්ෂ-වෛශ්‍රවණය යන සතර වරම් දිව්‍ය රාජයන් සමග යුද්ධයට යනවා නම්, එහෙම දවසක වත් ඕනෑ නැහැ. පින්වතුනි, අඬන්න, මේඝය-හිමය-ධූමය-රජය-රාහුය යන පඤ්ච දොෂයෙන් ම යුක්ත රාත්‍රියක ඇස් දෙක පියා ගෙන ලොකාන්තරියකට පනින්නා වාගේ වැඩක් අද-" මෙහි දී මෙ තැනට පැමිණි ජෝන් ජයපාල විසින් අසරණ උපාසක තැන ගල ග්‍රහයෙන් ගෙන, පිට මං කරනු ලැබුවෙන් එම යාදින්න එ පමණකින් අවසන් විය.



ආවශ්‍යක ප්‍රස්තාවයක දී මතක නැති කළ යුතු දෙය, මතක නැති කිරීමට මතක තබා ගන්නා කදිම සිහියක් ඇති ජෝන් ජයපාලට, මේ එක දවසින් ම මාලිනියත්, මාලිනිය පිළිබඳ සියලු ගුණ සමූහයත්, අන්‍යොන්‍ය සම්බන්ධයත් පුරාණගත ඉතිහාසයක් මෙන් පරණ විය. ඔහු දැන් ඖපපාතිකව ලොව පහළ වූ අභිනව සත්ත්වයෙකි- නොහොත් ද්විප්‍රකාර ගුණ විශෙෂයෙන් යුත් අපූර්ව සත්ත්වයෙකි. ඩේසි කුමරිය සමඟ ආශ්‍රයට පත් තැන් සිට, ක්‍රමයෙන් සඳ වදින සිරිත අභාවයට හළ පරණ ජෝන් ජයපාල, සඳට බුරන අලුත් ජෝන් ජයපාලට ස්වකීය පඤ්චස්කන්ධය බාරදී එදා එකෙණෙහි ම, එතැන, ජීවිතක්ෂය කළේ ය.

# 14

ඩැනියෙල් නෝනාගේ රස බසින් මෙ තෙක් නැළවී-නැළවී සිටි මාලිනියට, ජයපාල මැතිණිය ප්‍රධාන පිරිස ගෞර පුර මාලිගයට සම්ප්‍රාප්ත වූ බව දන්වා, ජෝන් විසින් එවන්නට යෙදුණු ලියුම ලැබුණු කල්හි, යළිත් චිත්ත පීඩාව බලවත් විය. ජයපාල මැතිණිය මේ වන්දනාවේ නොව, උදක් පුතා ලුහුබැඳ ගිය ගමනක් බව, දූන් ඇයට නිසැකයෙන් පෙනෙන්නේ ය. මේ පිරිසේ වෙසෙසින් වැනිය යුතු නම්, වැනිය යුතු අත්තනායක තරුණිය මය. ඉදින් ඒ වැනිය යුතු වස්තුව ගැන සිය අදහස් උදක් අතපසු කොට සෙස්සන ගැන පමණක් හාස්‍ය මුඛයෙන් කළ වර්ණ කථනයට, තරුණ ජයපාල පෙළඹුණේ කුමන පුදුමයක් නිසා ද යන්න ඇය සිත කරදරයට පත් කළ තවත් සැකයකි.

ගැහැනු සිත මෙන් ම විසි වියෙහි පිරිමි සිත ද අතිශයින්ම චපලය- වේ බඩක් මෙන් හැම අත ම නැමෙන සුලු ය. එහෙයින්, මේ වේ බඩ කෙරෙහි විශ්වාසය තැබීම දුෂ්කර වන්නේ ය. විශෙෂයෙන් ම සතුරු උවදුරු වලින් මැඩෙන කල්හි, වේ බඩ කෙසේ වත් කෙලින් නොසිටින්නේ ය. එසේ ද වුව, ස්වකීය ජීවිතය පිළිබඳ අනාගතය රැඳි පවතින්නේ, මේ නැමෙනසුලු වේ බඩක බව පෙනෙන හෙයින් අසරණ මාලිනී දිවියකු දකින මුව දෙනකු මෙන් එයින් වරින්-වර තැති ගැනෙන්නී ය.

කල් යත්-යත් ම, ගණනිත් ලියුම් අඩු වෙන්නටත් පමණින් කෙටි වෙන්නටත්, සාදරයෙන් හීන වෙන්නටත්, පටන් ගත් කල, මාලිනී දවසින් දවස ම වැඩි-වැඩියක් පහළ වන අසාධ්‍ය ලක්ෂණ දකින රොගියකු මෙන් ජීවිතාලයය තුනී කළා ය. ඇයගේ සැකය



කරුණු සහිත බව ඩැනියෙල් නෝනාට ද පෙනෙන්නේ ය. එසේ ද වුව, සැකයට රුකුල් හෙලීම් සිරිත කොට ඇත්තී හෙයින් ජෝන් කෙරේ විශ්වාසය අන්තිම මොහොත දක්වා ම නො නැසිය දී, රැක ගත යුතු බව කියමින් ඩැනියෙල් නෝනා, මාලිනිය රැගෙන සිනිමා ශාලා වෙතත්, නාට්‍ය ශාලා වෙතත්, නිතර නිතර පැමිණෙන්නට ද, එසේ පැමිණෙමින් ඇයට විවේකය විනොදයක් කිරීමට ද, උත්සාහ දරුවා ය මනා කොට අමුණන ලද මතු වැලක් සේ එකිනෙකට ගැළපෙන, එකිනෙක හා සමවන, කියවීමට රස උපදවන, ජෝන්ගේ ඉතාම පැහැදිලි නිරවුල් ලියුම් පවා වෙන දා මෙන් නොව, දූන් නම්, කිය යුතු දෙයක් ඇති වත්, ඒ කියා ගන්නා සැටියත් නොදන, වරක් තලතුනා මිනිහකුගේ වැනි අනුශාසනායන්ගෙන් ද වරක්, කලබල සිතින් පසු වන්නකුගේ වැනි විමතින්ගෙන් ද, වරක් ඔක්තෝබර විසි හත් වනදා ගැනවත් මතක නැති ආගන්තුක කථාවෙන් ද, සිර වූ පිස්සියකගේ පළා මල්ල වැනි වල්-පල් බව ඇයට පෙනෙන්නේ ය. ඔහු උදක් පැමිණෙන්නට බලාපොරොත්තු වන ඔක්තෝබර විසි හත්වනදාට තවත් තෙ මසක් පමණ කාලය ඇත්තේ ය. ඒ අතර, කොහෙත් ම ලියුමක් නැතිව, මාසයක් පමණ ගත වීම අසරණ මාලිනියගේ සිතට ශුන්‍ය කල්පයක් මෙන් විය. එසේ මාසයක් ගත වූ ඉක්බිති ඇයට ලැබුණේ ද බැදුම් කබලෙන් ලිපට වැටීම වැනි ලියුමකි.

"වර්ෂ 192-වනුයේ ජුලයි 10 වන දින
නව දිල්ලි නුවර , ගෞර පුරයේ දීය.

"මා හිතවත් මාලිනී,

"අපි අද-හෙට ම වාගේ බුරුමයට පිටත්ව යන්නෙමු. එහි සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට ද අපි ඉතා කැමැත්තෙමු. කල් තුබුණොත් ජපන් රට බලා යන බලාපොරොත්තුවක් ද ඇත්තේ ය. කොයි හැටි වෙතත් මම හැකි පමණ ඉක්මනින් ඔබ දකින්නට එන්නෙමි.

මීට-හිතවත්,
"ජෝන් ජයපාල"

ජයපාල තරුණයාට ස්වකීය හෘදයය සිද්ධස්ථානය කොට, දිවා රාත්‍රි දෙක්හි වැඳුම්-පිදුම් පවත්වන මාලිනී, ඔහුගෙන් මෙ වැනි දරුණු ලියුමක් ලබන බලාපොරොත්තුවක් කිසි කලකත් ඇති නො කළා ය. සිය සිත අදහා ගත නොහැකිව, නෙත අදහා ගත නොහැකිව, සිතේ දොෂයක් වතැයි කල්පනා කළ තැනැත්තී අත් අකුරු ගැනත් සැක සිත් පහළ කරන්නී, වඩ-වඩා ඕනෑකමෙන් ඒ ලියමන බැලුවා ය- කියෙවුවා ය- සිතට ගත්තා ය. අදහස්වලින් විනා අත්සනින් වත්, භාෂාවෙන් වත්, එය ගැන කිසි සැකයක් කිරීමට ඇයට ඉඩක් නොපෙනේ.

මේ ලියුම දුටු කෙණෙහි මාලිනිය සැනසීමට සිටි ඩැනියෙල් නෝනා ද, සැනසුම් නැතිව ඉවසුම් නැතිව මෙ සේ කීවා ය. "මේක ආදරේ මිනිහා කවදාවත් ආදරේ ගැනිට ලියන ලියුමක් නෙවෙයි- මාලිනී, ණය කාරයාලා ණය ඉල්ලා එවනවා තම යි. මෙහෙම ලියුම්- ඞී බොහොම වසයි-වසයි!" කීවා ය.

දන් දන් මාලිනියට හොඳ හැටි ඉංගිරිසියෙන් කතාව පුළුවන් හෙයින්, ඩැනියෙල් නෝනා නිතොරව ම ඉංගිරිසියෙන් කතා කරන නමුත්, ලියමන දකීමෙන් ඇති වූ සන්වේගය නිසා ඇයට මේ වේලේ පුරුදු ඉංගිරිසිය පවා මතක නැති විය.

මෙහි දී මාලිනී, උන් හිටි හැටියේ සිය කාමරයට දිව ගොස්, එ දා පුවත් පතින් කපා ගත් සිතියම ගෙනැවිත්, එහි ඩේසි අත්තනායක දක්වමින් "මේ ඔක්කො ම කරදරය මැය නිසායි!" මැය නිසායි!" කියමින් පිස්සියක මෙන් දොඩවන්නට පටන් ගත්තා ය.

එ දින, ඉරු ඇවෑමෙන් යන කල්හි ද, මාලිනියගේ වියරු ගුණය ඇවෑමට යන බවක් නොපෙනුණු හෙයින් සංගීතයෙහි සිත් බඳවා, සංගීත රසයෙන් සතපා ඇයගේ උමතු බව දුරු කරන අදහසින් ඩැනියෙල් නෝනා පියානා වාදනය පවා පටන් ගත්තා ය. ගුරුවරියගේ සංගීතයට සවන් යොමා සිටි ඉක්බිති මාලි-නිය එයින් තෘප්තියට නො පැමිණියා සේ, ගුරුවරිය එ තැනින්



නැගුටුවා, පියානාව සියතට ගෙන, අතිශයින් ම දුඃඛිත ස්වරයක් නංවා අපූර්ව සංගීතයක් ආරම්භ කළා ය. ප්‍රේමාවනද්ධ වූවන් මෙන් ම ශොකාතුර වූවෝ ද, සරස්වතියගෙන් ලබන වරප්‍රසාද ඇත්තෝ ය. එහෙයින් කවිත්වයෙහි නිපුණ වූවෝ ශොකාකුල වූ කල්හි දුඃඛශොක සමන්විත කාව්‍ය නිෂ්පාදනය කරති. සංගීතයෙහි නිපුණ වූවෝ කරුණා රස පරිපූර්ණ විෂාදාත්මක රංග නිෂ්පාදනය කරති. මේ වේලේ තූර්ය භාණ්ඩය වෙත හිඳ ගත් තැන් පටන් මාලිනියගෙන් පහළ වන්නට පටන් ගත්තේ, ඩැනියෙල් නෝනා විසින් කිසි කලකත් නො දක්නා ලද සංගීතයකි. දෙව් ලොව දිව්‍ය ගන්ධර්මයකු වෙතින් ලත් මාධුර්‍යයක් වැනි අතිශයින් රසාලිප්ත වාදනයෙන් හා ගායනයෙන් යුත් මේ සංගීතාස්වාදනයෙන් ඩැනියෙල් නෝනා විශ්මයානුකූලව බලා සිටියා ය. මාලිනිය පඤ්චාලම්බන ශක්තියෙන් පිරිහුණා වූ ඉන්ද්‍රියය ඇත්තියක මෙන් මොහනයට පැමිණි තැනැත්තී, අවට සිටින්නන් ගැන වත්, කෙරෙන දෙයක් ගැනවත් කිසි ද තැකීමක් නොකොට කිඳුරඟනක මෙන් මධුර ස්වර නංවමින්, තූර්ය භාණ්ඩය හා ගීත ස්වරය නො ඉක්මවා, විවිධ වූ රාග විශෙෂයන් පහළ කරමින්, නොයෙක් ප්‍රාතිහාර්ය දක්වන්නට පටන් ගත්තා ය. මෙහි දී ඩැනියෙල් නෝනා පමණක් නොව, මාලිනිගයේ සේවකයෝ පවා ඇයගේ දිව්‍ය සංගීතයට වසඟව, තැන-තැන නොසැලී සිට ගත් හ. මෙ සේ ප්‍රාචීන වූද, ප්‍රතීචීන වූ ද, උභය පක්ෂයට ම සාධාරණ මාධුර්‍ය ප්‍රකාශයෙන් වෙහෙසට පත් වන තෙක් ම, නොහොත් මොහනයෙන් මිදෙන තෙක් ම, ඈ සංගීතය කර ගෙන, කර ගෙන, ගොස් අනතුරුව ඩැනියෙල් නෝනා දෙස බලා මෙ සේ කීවා ය.

"මේ මගේ සංගීතයෙන් කාට කෙසේ වුවත්, මට නම් ලැබුණේ, ලොකු ම සැනසීමක්- මට දන 'පුළුවනි, මගේ මහත්මයා ගැන ඉවසිල්ලෙන් කල්පනා කර බලන්න. මට දන් පේනවා, ඔහු ගැන දන් ම අවිශ්වාස කරන එක පව්- ඔක්තෝබර විසි හත් වන දා වන තෙක් ඉවසන එක තමයි යුතු කම. ඔහු ඔක්තෝබර විසි හත් වන දා ඒවි. එතෙක්-" කියා එ තැනින් ඇ නැගිට යහන් ගැබ තුළ වැද සැඟ වී ගත්තා ය.

ඉන් පසු, ඈ ජෝන් ජයපාල ගැන ඩැනියෙල් නෝනා සමග හෝ වචනයක් වත් කතා නො කළා ය. ඈ මෙ සේ අදිසියේ නිසොල්මන් වුව ද, ඇයගේ නිසොල්මන පෙර නිතොරවම කළ කතාවට වඩා සිය ගුණයෙන් දරුණු බව තේරුම් ගත් ඩැනියෙල් නෝනා එවක් පටන්, ලියුමක වගක් තරම වත් ඇයගෙන් විමසන්නට නො කැමති වූවා ය. දන් මාලිනියගේ ස්වභාවය සන්නිපාතාසන්න වූ මේඝ කූටයක් මෙනි- ශක්තිපාතාසන්න වූ පර්වත කූටයක් මෙනි. ක්ෂණ භංගුර භාණ්ඩයක් නොහොත් සූක්ෂම යන්ත්‍රොපකරණයක් මෙන් ඉතා ම පරෙස්සමෙන් පරිහරණය කටයුතු වස්තුවක් මෙනි. එහෙයින් ස්වල්ප වූ ප්‍රමාද දොෂයකින් වත් සිත් නොරිදවා ඇය රකිමින් අසනිපාතය හැකි තාක් කල් වළකන්නට ඩැනියෙල් නෝනා නිතර උත්සාහ කළා ය.

පසුව පසුවත්, ජෝන්ගෙන් ලැබෙන ලියුම් ඇත්තේ වී නමුදු ශොකය දියුණු කරන්නා වූ දෙයක්ම විනා තුනී කරන්නා වූ, හීන කරන්නා වූ, කිසිවකුත් ඒ කිසිවකත් නොවී ය. තැපැල බුරුම රටින් එන්නට පටන් ගත් තැන් සිට, ඇයට බොහෝ සේ ලැබුණේ, ලියුම් නොව, උඩ-පාත දෙ රට බුරුමයේ සිත්කලු තැන් සිතියමින් දක්වන පින්තූර පොස්ට් කාඩ් පමණකි. සැප්තැම්බර් මාසයේ දී ජෝන්ගේ ලියුම් ජපන් රට තැපැලෙන් එන්නට පටන්ගත් බව දක, මාලිනී ඩැනියෙල් නෝනාට මෙ සේ කීවා ය.

"දවස ළං වෙන්නට-වෙන්නට මගේ මහත්මයා මගෙන් ඈත් වන එකයි වරද? ඒ වුණාට මට යුතු කමක් නැහැ. හිත තරක් කර ගන්න ඔහු නියම දවසට මෙ තැන හිටීවි- නොමලොත් මෙ තැන හිටීවි මගේ ජීවිතය මෙන් ම ප්‍රෙමය ද, රැකෙන්නේ මේ එකම බලාපොරොත්තුව පිටයි- නමුත් දන් ඒක බොහො ම හීනයි-දුර්වලයි. මා ටිකින් ටික ම දිය වැලෙන් ඇදෙන්නේ දියඹට මයි. රළ ගෙඩියෙන්-ගෙඩිය ඉහල නගින එක-එක පාරට මට ගොඩ බිම පෙනෙන්නේ, වඩ-වඩා ඈත්ව මයි. ඒ නිසා මට හිතෙන්නේ නෑ. පණ තියෙද්දී මේ සාගරයෙන් ගොඩ වෙන්න ලැබේ කියා" දෙ නෙතින් ගලන කඳුළු ඇතිව කීවා ය.



මේ, දෙ මාසයකට පසු සැමියා ගැන මතක් කළ එක ම වතාවෙන් පවා වුණේ, මාලිනියගේ නිශ්ශබ්ද භාවයට ම සරිලන්නා වූ ශොකාකුල විෂම විලාසයක් හෙයින්, බලාපොරොත්තු කඩ වූ කල්හි, නොහොත් ආශාව නිශ්ඵල වූ කල්හි, අනතුරුව, ඇය කරන දෙය කුමක් ද යන්න විමසන්නට ද ඩැනියෙල් නෝනා භය වූවා ය. එසේ භයට පත්ව, කම්පිත වූ හෘදයයෙන් යුතුව, "ඒ නියම දින තෙක් අපි ඉවසමු- අපි ඉවසමු" යන්න පමණක් සිය බසින් කෙඳිරි ගෑවා ය.

ඉන් පසු සිය සැමියා ගැන කතාව යළිත් පෙර පරිද්දෙන් අත් හළ මාලිනියට නියම දින වන තෙක් ම සිත් දැඩි කොට ගෙන, ඉවසිල්ලෙන් පසු වීම අපහසුවක් නොවීය. එහෙත් ඇයගේ දැඩි සන්සුන් බව, දවසින් දවස ම දකින ඩැනියෙල් නෝනාට නම් භයානක කාල විපත්තියක ලක්ෂණ දකින දෛවඥයකුට මෙන් සන්වේග ඇති විය- මොහොතින් මොහොත ම දෙතිස් කම් කටුල්ලට සම්පස්ථ වන අභාග්‍ය සම්පන්න සත්ත්ව කෙනකුට මෙන් හෘදය කම්පාව ඇති විය. ඔක්තෝබර් විසි හය වනදා රෑ, මාලිනී නිංදට පළමු ඩැනියෙල් නෝනා කැඳවා, මෙ සේ කීවා ය.

"මට ඉතින් අපලය නොහොත් සපලය ලබන්නේ හෙට හිටන් තමා. සමහර විට, අපේ ගුරු-ගෝළ කම් මෙයින් අවසන් වෙන්නට පුළුවනි. මට මින් පසු නෝනාගෙන් වුවමනාවක් නොවෙන්නටත් පුළුවනි. මා සනසන්නට හෝ මට බොරු බලාපොරොත්තු මවා පෙන්වන්නට හෝ මින් පසු නො වෙහෙසුන මැනවි. මෙ තෙක් මා කීකරු වුණාක් මෙන් මින් පසු මට කීකරු වෙන්නට ද සිහි තබා ගත මැනවැයි" කීවා ය.

ඇය මෙ සේ තර්ජන ස්වරූපයෙන් කළ නියමය නිසා මොළොක් සිතැති ඩැනියෙල් නෝනාට නම් රැය මුළුල්ල ම නිදි නැති විය. තමා විසින් කො තෙක් හික්මවනු ලැබුවත් සුශික්ෂිතව පිළිපදවනු ලැබුවත්, ගුණ ධර්මයෙන් වෙළනු ලැබුවත් දන් මේ සියල්ල සිඳ-බිඳ ලමින් පළමු සැහැසි කම පියවි ගුණය කොට දක්වන මාලිනී, ඩැනියෙල් නෝනාට ඇදහිය නො හැකි පුදුමයකි.

පසුව දා හෙවත් ඔක්තෝබර් විසි හත් වනදා මාලිනී කිසි ද අමුත්තක් නැත්තා සේ පහන් දොරින් ම ස්නානය කොට, මහත් උත්සවයකට මෙන් ගෙනා ඇඳුම්-පැළඳුම්වලින් සැරසී ගෙන තමනට අසහාය නෙත්‍රය වැනි වූ ස්වාමියා එන තෙක් මග බලා ගත් ගමන් මාලිනිගයේ බරාදයේ අසුනක හිඳ ගත්තා ය. ඈ මෙ සේ හිඳ ගත්තා හා සමඟ මහා ශාලාවේ "බිග් බෙන්" නම් මහ ඔරලෝසුව සංගීත නාදයෙන් යුතුව සූර්යෝදය හෙවත් හයේ කනිසම ප්‍රකාශ කරන්නට විය. ගොඩින් හමන මඳ පවන සිසිල කොට ගත් මෙ දින උදෑසන නෙත්-සිත් පිණ වන සැතු ලක්ෂණයෙන් ශොභාවත් වුව ද, තව මත් අහස තැන-තැන රජත ප්‍රාන්තයෙන් බබළන මහ කළු වලාකුළුවලින් ගැවසී ගත්තේ ය. වාරකන් සුළඟින් හා රළු වැස්සෙන් වෙහෙසට පත් මල්ගොමු නව දළුවෙන් හා මලින් බබළන්නේ බඹරුන් හා සමනලයන් විසින් සෙවිනා ලද්දේ ය. නිල් වන් පළසකින් ආවරණය ලත් පරිද්දෙන්, නොහොත් වෙරළු මිණියෙන් පිරිකුළු පරිද්දෙන්, තෘණාංකුරයෙන් ගැවසී ගත් ගෘහොද්‍යාන භූමිය පක්ෂීන්ගෙන් ශොභාවත් විය. මෙ සේ උදාසනක් සේ ම ප්‍රීතියෙන් බබළන්නා වූ සතුටු මුහුණින් පසුවන්නට වෑයම් කරන මාලිනී ද මෙතෙක් එ වැනි දොම්නස් හා සැකය මුළු මණින් ම බැහැර කොට ලත්නී, කිසි කැලලක් හෝ පැල්ලමක් හෝ නැති පිරිසිදු පිරුවටයකට බඳු අලුත් සිතකින් යුක්ත වූවා ය.

ස්වාමියාගේ මධුර භාෂිතය කර්ණෝත්සවය කොට ඇති මාලිනියගේ සවනත, ඔහුගේ "කොතැන හිටියත්, එ දාට මා නොමලොත් මෙ තැන ඇතැයි" කී ස්ථිර වචනය තවමත් රැව් දෙන්නාක් මෙනි. එහි ව්‍යාජ ස්වරයක් හෝ අවිශ්වාස ලක්ෂණයක් හෝ තමා නො මඟ යවන මුලා කරන, මායමක් හෝ රහසිනුදු නො පැවැති බව ඇයට නම සත්‍යයෙනුත් සත්‍යයකි. එ හෙයින් ඇයට ඔහු නම් අද නිසැකයෙන් ම එන්නේ ය. තේ පානයට සුදුසු කාලය පැමිණි කල්හි ද දූන්-දූන් එන සැමියා කැටුව තේ මේසයට හිඳ ගන්නා බලාපොරොත්තුව ඇති හෙයින්, එ තෙක් තමා නතර වන බව කියා ඩැනියෙල් නෝනාට තනිය ම තේ



බීම නියම කොට . ඈ හුන් හැටියට ම හිඳගත් ගමන් සිටියා ය. නගරය බලා දහස් ගණන් මොටෝර්ය ගමන් කරනමෙ වේලෙහි ඒ එහක්-එහස් පාසා, සිය සැමියා රැගත් මොටෝරිය වනැයි සිත-සිතා මාලිනිගය නොතකා පසු කොට යන්නා දක යළි සොවින් සුසුම් හෙළුවා ය.

හත-අට-නවය-දහය-එකොළහ-දොළහ යනුවෙන් පෙර වරුව කෙමෙන් අවසන් වන අතර, පශ්චිම දිශාභිමුඛ වූ සෙවණැලි සමූහය පිළිවෙළින් එකට රොක් වන්නා සේ ගෙවී-ගෙවී ගොස් හිරු හැරෙන්නා ම, යළිත් පූර්ව දිශාභිමුඛව පැතිරෙන්නට විය. වෘතස්කන්ධය ද උෂ්ණවත් විය. දැඩි රිවි රැසින් වෙහෙසට පත් නියායෙන් තැන තැන අතු අග ලැගුම් ගත් පක්ෂි ගණයා පිය නොසලා ගිමන් හරින්නට වූ හ.

දූන්-දූන් සිතක් විනා ගතක් ඇති නියා නො දනෙන බැවින්, ඈ මෙ තෙක් කිසි අහරක් වත් නො ගත්තා ය. උදෑසනක් වැනි ඇයගේ ප්‍රසාද ජනක චිත්ත ය ද, ඉර බසින්නා හා සමග පියුමක් පරිද්දෙන් මුකුලිත විය. සිත් නමැති අහසේ අපර දිගින් බලාපොරොත්තු බැස යන කල්හි, පෙර දිගින් උදාවන සැකය ද ඇත්තේ විය. අන්ධකාර මහා වලාපටලයක් මෙන් කොපය හා සංවේගය ද නැගෙන්නේ විය.

එක-දෙක ආදි පිළිවෙළින් පස්වරුව ද අවසන්ව, තදානුගතව මළ හිරු රැස ද අතුරුදහන්ව, සියොතුන් නදින් ගුවන් ගැබ ද හිස් ව, මාලිනිගය ද විදුලි ආලෝකයෙන් බැබළිණි. තව මත් හුන් තැන මග බලා ගත් ගමන් පසු වන මාලිනියට වරින් වර කුස ගිනි ඇති වූ නමුත්, සිත ගිනි ඊට බලවත් හෙයින් දුබල කුස ගින්නට කිසි තැකීමක් නොකොට, සිසිල් නිල්පුල් දෙනෙත පවා ගිනි ගෙන දෙවේතුදු ස්වකීය ස්වාමියා ගේ ස්වරූපය නමැති චන්දනාලෙපයෙන් එම ගිනි නිවන්නට ම බලා සිටියා ය. විශේෂ ප්‍රස්තාවයන්හි දී පමණක් මාලිනිගය අභිමුඛයෙහි දල්වනු ලබන මහා ප්‍රදීපය මීට වැඩි විශේෂ ප්‍රස්තාවයක් නවත් නොමැති හෙයින් මෙහි දී දල්වන ලදින් එයින් නික්මෙන රැස් දහර අඳුරු

දුරු කරමින් ගේට්ටුව දක්වා පැතිරෙන්නට ද විය. තම-තමන් වෙසෙන තැන් බලා, ආපසු මහ මඟ ගමන් යන දහස් ගණන් මෝටෝරියවල පහන් එළිය ද, ගිනි රැස් විහිදූ වන යකුන් නෙත් සේ වරින් වර පෙනේ.

පෙර යම් ඇවෑමෙන් මහ මග හැසිරෙන මහා ජන කලබලය ද හීන විය. සත්ව ලොකය විශ්‍රාමයට පැමිණියා සේ විවේක ස්වරූපයෙන් දස අත පුරා පැතිරෙන ශාන්ති භාවය ඇති කල්හි, සූර්යොදයෙහි පටන් අහර පිණිස දියර පමණකුදු නොලබා, හිඳ ගත් වන ම හිඳිමින් කල් ගත කළ මාලිනී, "බීග් බෙන්" ඔරලෝසුව සිරිත් ලෙස කරන සංගීත නාදයෙන් මධ්‍යම යාමය ප්‍රකාශ කළ කල්හි, හෙවත් එහි රෑ දොළහ වැදුණු කල්හි, දිග සුසුමක් හෙළා නැගී සිටියා ය.

ඉක්බිති ඈ වහා මෙහෙකරුවන් කැඳවා, සියල්ල අස්පස් කොට ඒ ඒ තන්හි රැස් කරවා, සියලුම මෙහෙකරුවනට හා මෙහෙකාරියනට එවේලේ ම වැටුප් ගෙවා, ඔවුන් රක්ෂාවෙන් ද අස් කර දැම්මා ය- ගරාජය, ගබඩාවල් හා මුළුතැන් ගෙය ඈදි සියල්ල යතුරු දමා, වසා දැම්මා ය- අනතුරුව, ඩැනියෙල් නෝනාට ද අස්ව යන්නට සමුදුන් කල්හි "මාලිනී, මේ මොකද මේ කරන්න හදන හිතු මතය?" කියා එම ගුරුවරී ප්‍රශ්න කළා ය.

"ඩේසි අත්තනායක නමැති ඇමට ඔහු දන් ඇමිණිලා ඉවරයි" මාලිනී වියරු සිනාවකින් යුතුව කීවා ය.

"ඉතින් මේ මොකද, කරන්න හදන්නේ?"

"මා යන්නයි හදන්නේ, එයින් ඉස්සර නෝනා මෙ තැනින් පිටත් වෙන්න ඕනෑ. මට ඔහු මේ ගෙය දීලා ගියේ, අද වන තන් විතරය"යි මාලිනී යළිත් සන්සුන් ලෙස කීවා ය.

ඩැනියෙල් නෝනා සිරිත් ලෙස ඇය සනසමින් දිග අවවාදයකට සැරසුණු නමුත් ඒ කිසිවකුත් නො ඉවසන මාලිනී, එ වේලේ ම විදුලි පහන් සියල්ල නිවා දමා අන්තිම දොරත් වසා දමා, යතුරු



සියල්ල අතට ගෙන, ගුරුවරිය කැටුව යෙන ම නතර වන සේ කළ ආරාධනය පවා නොපිළිගෙන, ඒ මහ කළුවරේ හුදකලාව ම මගට බැස්සා ය.

* * *

ගෞර පුර මාලිගයේ දී යළිත් විවාහ ජීවිතයට ඇතුළත් වූ ජෝන් ජයපාල, බුරුම-ජපන් ආදී ඈත පෙර දිග රටවල කළ දෙශාටනයෙන් පසු, පෙරළා ලක්දිව පැමිණියේ, මාලිනිය පිටව ගිය දෙ මසකින් පසුවය. මාලිනිය ගැන විපරම් කරන ඔහුට ඇයගේ පලා යෑම, ගැන තතු සියල්ල ඩැනියෙල් නෝනාගෙන් දැන ගන්නට ලැබිණි. ඔහුට මෙහි දී ඇති වූ ඛේදය අනල්පය. ඛේදය අතිශයින් ම බලවත් වූයේ, මාලිනිගයේ දොර හැර බලන විටය. පරණ මතක මතු වීම කරණකොට හට ගත් බලවත් ශොකයෙන් ජයපාල කාමරයක්-කාමරයක් පාසා යමින් මාලිනිය විසින් පරිභොග කරන ලද භාණ්ඩයන් දෙස ආසාවෙන් බල-බලා සුසුම් හෙළන්නට පටන් ගත්තේ ය. අපවාද මුඛයෙන් නමුත් මාලිනිය විසින් තමාට ලියන ලද යම් කිසි ලියුමක් වත් නොලත් තැන ගලපිට කන්දේ සුපිරිංටැංඩංට් මගින් ඇය ගැන නිතිණියාගේ පවා විපරම් කර බැලුවේ ය. මෙ සේ විපරම් කොටත් ආ-ගිය අතක් ගැන දැන ගත නොහැකි වූ කල්හි, ඇය සිය පණ හානි කර ගන්නට ඇතැයි ද ඔහු කල්පනා කළේ ය.

මාලිනිය අතුරුදන් වූ බව අසන්නට ලැබුණ විට, ජයපාල මැතිණියට නම් හිසෙන් මලක් පිපුණාක් මෙන් විය. පුත්‍රයා දෙවන විවාහයට ඇතුළත් වූ මොහොතේ පටන් ම මාලිනිය පිළිබඳ ප්‍රශ්නය විසඳීම ජයපාල මැතිණිය සිතට, කොහෙත් ම ඉවසුම් නුදුන් බරකි. ඒ බරෙන් දැන් ඈ කිසි දු වියදමක් හෝ මහන්සියක් හෝ නැතිව ම සුව සේ නිදහස ලැබුවා ය.

ජෝන් අවලංගු වූ පළමු විවාහයක් ඇත්තකු බව මෑතක් වන තුරු ම, ඩේසිට දැනගත නොහැකි විය. ඒ දැන ගත් කල්හි පවා ඇය කෙරේ ඇති වූ සංවේගය ඉතා ම බලවත් ය. ඒ කැලෑ හඳ

නම් වූ පිටිසර තරුණිය දැන් ඉතින් නැත්තටම නැති වුණු හෙයින්, නොහොත් තවත් පායන බලාපොරොත්තුවක් ඇති නොවන හෙයින්, ඈ මඳක් සැනසුණා ය.

උසස් සමාජය පිළිපදින දෙශ පාලන වැඩ හිසට ගෙන ඈ දවල් දෙක්හි වෙහෙසෙන උගත් තරුණියෝ සැමියන් සේවයට පත් වුනු කල්හි හෙවත් විවාහ ජීවිතයට ඇතුළත් වූ කල්හි නොයෙක් විට කුටුම්බිකයෙහි කුසීත වෙති. එ බඳු කුසීත භාවයක් ඩේසි කෙරේ නොපහළ බැවින් ඈ සිය සැමියාගේ හිත සුව හා පහසුව සලකා සේවය කිරීමෙහි සියලු කල්හි තත්පර වූවා ය. දෙශ න්‍යාය විෂයක කෘතීන්හිත් මහා ජන සේවක කෘතීන්හිත්, ස්වාමියා වැඩි-වැඩියක් උද්‍යෝගවත් කිරීමෙහි අනලස් වූ ඩේසි, ස්වකීය විවාහයෙන් සිවු වසක් ගත වන්නට පළමු ලංකාවේ ප්‍රචාර ප්‍රාප්ත වූ ඩොනොමෝර් ක්‍රමානුකූල අභිනව රාජ්‍ය මන්ත්‍රණ සභාවට මහා ජන නියෝජිතයකු වශයෙන් ඔහු යැවීමට ද සියලු වැඩ සූදානම් කළාය. සමස්ත මහා ජන ඡන්දයට අනුව රාජ්‍ය මන්ත්‍රණ සභා ප්‍රතිෂ්ඨාපනය ආරම්භ කළ කල්හි, වෙළෙඳ පරිහානියෙන් යන-එන මං නැති වූ අය, ආණ්ඩුවේ සේවාවෙන් කඩමලුව, විශ්‍රාම වැටුප් ලබන අය, උසස් තිලතල වලට නගින කෙටි ඉණි මං සොයන අය ඇද පළුදු වැසීමට සුදුසු ඉටි-වාර්නිස් සොයන අය, ඉහාත්මයෙහි ම ශුද්‍රාත්මය නසා බ්‍රාහ්මණාත්මය පතන අය ජීවිකා වෘත්තිය පිණිස වැදගත් වැඩක් නැති කමෙන් ළත වෙන අය, ආදි වශයෙන් නොයෙක් පංක්තියේ පුද්ගලයන්ගේ ඉදිරිපත් වීම කරණකොට ස්වදෙශිය වූ ද, විදේශිය වූ, සකල ලාංකිකයන් අතර ම ඇති වූ කලබලය ඉතා මහත් විය. ඩොනොමෝර් වාර්තාවේ උකුණු හිසක් තරම් වත් නො තබා. සිදුරු සොයමින්, ඊට කට හැකි තාක් සියලු උපහාස කරමින්, එය ලක් දිව නසන්නට එවූ වසංගතයක් සේ පෙන්වමින්, විරුද්ධව ක්‍රියා කළ සමහරු එ හෙයින් ම එය පිහිටුවීම නැවත අපෙක්ෂා කළහ. මෙ පමණකින්වත් පොදු ලක්වැස්සා ලබන නිදහසට ඊර්ෂ්‍යා කළ තවත් සමහරු වැඩි නිදහසක් පතන්නන් සේ ලොවට පෙන්වා, ස්වරාජ්‍ය විෂයයක් ව්‍යාජාපෙක්ෂාවෙන් විරුද්ධව සටන් කළහ. කොතෙක් ඉසුරුමත් වුව ද, හිඟන්නා හිඟා කෑමෙන්



යැපෙන තාක් අලුත් ඇඳුම් ඇඟ ලෑමක් හෝ, නොයිඳුල් අහර වැළඳීමක් හෝ නොකරන්නේ යම් සේද, එ පරිද්දෙන් ම සිංහලයා හිතන අදහස් වලින් හීන-දීන අදහස්වලින්, පසු වන තාක්, නොහොත් එ වැනි අදහස් ඇත්තන්ගේ අනුශාසනයෙහි පිහිටන තාක් කොතෙක් නිදහස දෙන අභිසංස්කරණයක් වුව ද, එහි පුරුෂ පුහුණු වීම එ තරම් ලෙහෙසි වැඩක් නොවේ. කතාවට පමණක් පුරු බුහුටි කම් ඇති, ආත්ම ශක්තියෙන් හා අර්ථ ශක්තියෙන් හා ඥාන ශක්තියෙන් හීන, දුබල පිරිසක් වූ අපගේ ජන නායකයන් අතර උදාර වූ ද, අවංක වූ ද, අදහස් ඇත්තෝ සිටිත් නම් ඉතා ම ටික දෙනෙකි. ජෝන් ජයපාල, ඒ ටික දෙනාගෙන් එකකු නො වන නමුත්, අඩු-පාඩු ගහන ඩොනොමෝර් පාලන ක්‍රමය වැනි පටලැවිල්ලක තබා, පූර්ණ ස්වරාජ්‍ය ක්‍රමය වැනි නිදහසක වුවත්, යෙදෙන්නට තරම් මේරු නුවණැති හෙයින් ද, යම්-යම් දුබල කම් ඇති වත්, ආත්ම ශක්තියෙන් හා අර්ථ ශක්තියෙන් අනූන හෙයින් ද, මන්ත්‍රණ සභාසනයකට හැම අතින් ම හොබනේ විය.

මන්ත්‍රී ධූරාපෙක්ෂකයන්ගේ විශෙෂ පරිශ්‍රමයෙන් සමස්ත ඡන්දය උදෙසා, ස්ත්‍රී-පුරුෂ කවුරුත් ලියා පදිංචි කරවන මේ කලබල සහිත අවස්ථාවේදී, ඈත පෙර දිග බලා යන විශ්න බායි. නම් වූ සුප්‍රසිද්ධ නාටිකාංගනාවක ගැන කරුණු ලක්දිව පුවත්පත්වල පළ වන්නට පටන් ගත්තේ ය. විශ්න බායි නම් වූ මේ නළඟන වනාහි රූපයෙන් හා ගීතයෙන් ද, නාට්‍යාංගයෙන් ද, කිසි ම අඩු-පාඩුවක් නැති කලාකාරියක යනු පෙර-අපර දෙ දිග ම විශෙෂඥයන්ගේ අසහාය මතය විය. කිරුළු පැළඳි මහ රජුන්ගේ ද, බලසම්පන්න මහා ජනාධිපතියන්ගෙන් ද, ලබන ලද නොයෙක් ගරු බුහුමන් ඇති මෝ තොමෝ, ගායිකාවක වශයෙන් නම් යුරෝපය පමණක් නොව, ආසියාව හා අමෙරිකාව ද එක පැහැර ජය ගත් කාන්තාවකි.

භාරත දෙශය ජනම භූමිය කොට ඇති ක්ෂත්‍රිය කුමාරිකාවක යන ජනාලාපයෙන් ප්‍රසිද්ධ මේ රූමත් නළඟන ඉංදියානු නාටක සමාජයක් මගින් ප්‍රාචීන නාට්‍ය ශිල්පය ද දක්වනු කැමැතිව,

ඈත පෙර දිග බලා යන මේ ප්‍රස්තාවයෙහි දී, කොළඹට ද ගොඩ බසින බව ලක් දිව පුරා සැළ විය. ලංකා ප්‍රවෘත්ති පත්‍රයන්හි ප්‍රශංසා මුඛයෙන් ද, වර්ණ කථනයෙන් ද, ඇය ගැන පළ වූ නොයෙක් ලියුම්-කියුම් නිසා, නෘත්‍ය-ගීත දර්ශනාභිලාෂී වූ මහා ජනයා, ඇයගේ සම්ප්‍රාප්තිය බලා නො ඉවසිල්ලෙන් පුල-පුලා සිටියා හ. ඇය රඟුම් දක්වන දිනට සතියකට කලින් එම නාට්‍ය ශාලාවෙහි ඉඩ-කඩ සියල්ල විකිණී ඉවර වන හෙයින්, එහි ආසනයක් ලබා ගැනීම පවා සමහරුන්ට අසීරු විය. නිරන්තරයෙන් ම, සන්ධ්‍යාව නාට්‍ය ශාලාවක ගත කිරීම සිරිත කොට ගත් ජෝන් ජයපාල හා එම බිරින්දෑත් උදෙසා පෞද්ගලික වශයෙන් හැම නාට්‍ය ශාලාවක ම, නිති පතා වෙන් කරන ලද විශේෂාසන ඇත්තේ ය. ඩේසි ද, මාලිනිය මෙන් ම සිනිමා ආදිය දැකීමෙහි කැමති බැවින් විවාහ ජීවිතයට සැපත් මේ සිවු වස මුළුල්ලේ, මෙ බඳු දර්ශනයක් උදෙසා දවස නොවරදවා හැම සවසක ම සිය සැමියා කැටුව ගියා ය. එ හෙයින් මේ අඹු-සැමි යුවළට නම් විශ්න බායිගේ කොතැන දක්වන රඟුමක් නමුත් පළමු වන දවස ම නො වරදවා දකින්නට ලැබෙන්නේ ය.

උදක් තමා අසන-දකින ආසාවෙන් පුල-පුලා සිටි, ශ්‍රෙෂ්ඨ පංක්තියේ මහා ජන කායකින් අතුරක් නො මැති සේ ගැවසී ගත් නාට්‍ය ශාලාවෙහි, දර්ශන සම්පන්න මණ්ඩපයෙහි, විශ්න බායි නියමිත පරිදි පළමු ව දවස, කාලිදාසයන්ගේ ශකුන්තලයෙහි, සකුන්තලා ලෙසින් පෙනී සිටියා ය.

මුළු ශාලාව දෙදරවමින් පැන නැගුණු අත්පොළසන් මැද, ජවනිකාවෙන් අනාවරණය වූ විශ්න බායිගේ අසදෘශ රූප විලාසය දුටු කෙණෙහි මත් මත් වූ ඒ මහ පිරිස ප්‍රතිරූප භාවයට පැමිණියා සේ නිසොල්මන්ව, පුදුමයෙන් බලා ගත් වන ම සිටියහ. පුවත්-පත් මගින් සිතියමින් දුටු පුරුදු කම් ඇති වත්, ඔවුන් දෙ නෙතට නම් ඇයගේ මේ සජීව රූප විලාසය ඇදහිය නො හැකි අපූර්ව සෞන්දර්‍ය්‍යයකි. ස්වකීය රූප විලාස දර්ශනයෙන් සභාව මෙ සේ භ්‍රාන්තිමත් කළ ඕ තොමෝ, පියුම් ගැබක හට



ගත් වීදුරු මිණි වන් පැහැයෙන් බබලන, දත් දෙ පෙළින් සැදුම් ලත් මුව පෙදෙස මදක් විකසිත කොට, මදුර මනොහර ගීතයකින් චින්තාපහාරක රාගයක් ගායනා කරන්නට පටන් ගත්තා ය. ඒ හින්දි ප්‍රබන්ධයකි. එ සේ ද වුව, සංගීතය කාහටත් පොදු බැවින් එය ශ්‍රවණය කළවුන්හට භාෂා විශෙෂයක වගක් නො දනී, තම-තමන් බසින් කළ ගායනයක් පරිද්දෙන් අර්ථාවබෝධය සුකර විය. ඒ නළඟන, නෘත්‍ය-ගීත-වාද්‍යයෙන් ද නාට්‍ය කලාවෙන් ද, අතිශයින් ස්වාභාවික හෙයින්, රඟුම් දක්වන කල ඇය දකින්නන්හට මේ ශකුන්තලා ම විනා, විශ්න බායි නමින් ගායිකාවක හෝ නර්තකියක හෝ එහි සිටි බවක් කිසි විටකත් නො පෙනිණි.

මෙ සේ රඟ බිම, පෙනී සිටි මේ නළඟන කෙරෙහි විශෙෂයක් වශයෙන් දැක් වුණු එක්තරා කාරණයක් ද ඇත්තේ ය. ඇයගේ විශිෂ්ඨ ශිල්පය විවෙචනාභිලාෂී වූ විශෙෂඥයනට හැර, අන් කිසිවකුටත්, එය අමුත්තක් සේ නො පෙනුණ ද, ඒ නම්, මෙහි දී පමණක් ඇය කෙරේ දක්වුණු අමුත්තක් ම ය. ඇය කිසිවකුට නො හැඟෙන ඉතා සියුම් බැල්මෙන්, එහෙත් බලවත් ආසාවෙන් සභාව දෙස වරින්-වර බැලූ බවත්, එසේ බැලූ ඇයගේ දෙ නෙත, ප්‍රථම පංක්තියේ විශෙෂාසනයක හිඳ ගත් තරුණ අඹු-සැමි යුවළක් කෙරේ රැඳුණු බවත්, එ සේ රැඳුණු තැන් පටන් යථොක්තාසනය ඇයගේ දෙ නෙතට ගොචර ස්ථානය වූ බවත්, ඔවුනට පෙනිණි.

"මොක ද මේ විශ්න බායි තිස්සේ ම අප දෙන්නා දිහා බලන්නේ?" කියා ඩේසි මෙහිදී ජෝන් ජයපාලගෙන් ප්‍රශ්න කළා ය.

ජෝන්, දැන් සිය නෙත්-සිත් සවන් සියල්ලෙන් මේ රූමත් නළඟන පුදන වේලාවකි. එබැවින් ඇයගේ වචන ඔහු දෙ සවන, වැකෙන බවක් නොපෙනේ. දැන් ඔහුට සිය බිරිඳ සවන් කිරීමට දෙ සවනක් වත්, දැකීමට දෙ නෙතක් වත්, මතක් වීමට සිතක් වත්, නැත්තේ ය. ඔහු ඇසි පිය නො හෙලා දැහැනකට සම වැදුණකු මෙන් නළඟන දෙස බලා ගත් ගමන් පසු වන්නේ ය.

"මේ, මේ" කියා නැවතත් ඩේසි සිය සැමියා වෑයමෙන් අවදි කොට. "මොකද, මේ විශ්න බායි තිස්සේ ම අප දිහා බලන්නේ?" කියා යළිත් ප්‍රශ්න කළා ය.

ඊට පිළිතුරු වශයෙන් හීන් කෙඳිරියක් වැනි ශබ්දයකින් ඔහු මොකක්දෝ තරහ වචනයක් පවසා, යළිත් මහා ම අනිමිසලෝචනයෙන් විශ්න බායි පුදන්නට පටන් ගත්තේ ය.

සැමියාගේ සිත, මෙ තරම් තදින් කිසි කලක, කිසිවකට යොමු වුණා නුදුටු ඩේසි, නො මනාපයක් ඇති නො කොට, එයින් ඔහු මුදන හැටියක් නො දැන, පුදුමයෙන් බලා සිටියා ය. විවාහ ජීවිතයට ඇතුළත් වූ තැන් පටන් මේ සිවු වසර මුළුල්ලේ සිය සැමියා කැටුව, ඇය විසින් දක්නා ලද නාටක නම් ගණන් නැත- ඒ එක නාටකයක වත් තමන් දෙස මෙ තරම් ඕනෑ කමෙන් නිතර-නිතර බැලූ නළුවකු නොහොත් නළඟනක සිටි බවක් ද, ඇයට මතක නැත- තරුණ ජයපාල මෙන් ම සෙසු පිරිස ද විශ්න බායිගේ යථෝක්ත ස්ථානය අවසන් වන තෙක් ම, නොහොත් එන ස්ථානයක දුෂ්මන්තයන් ප්‍රමුඛ අනෙක් පිරිසක් දක් වෙන තෙක ම, මෝහනයෙන් නො මිදුණාහ. මෙසේ නාටකාංකයේ ස්ථානය වෙනස් වූ කල්හි, ජෝන් ජයපාල සුසුම් හෙළමින් නැගිට, කොංද දිග හැර ගත්තේ ය- අනතුරුව, මිනිත්තුවෙන් එන බව කියා එ තැනින් පිටව ගියේ ය. ජයපාල මෙ තරම් ඉක්මනින් නික්ම ගියේ, නර්තකයන්ගේ ද, නර්තකීන්ගේ ද, විශ්‍රාමය පිණිස නෙපථ්‍යයෙහි වෙන් කරන ලද කාමරයකට ප්‍රවේශනය ලැබීමට ය. ඒ ඒ ස්ථානයට නියම නෘත්‍ය භාගය අවසන් වූ කල්හි, නැවත තමනට කැඳවීම ලැබෙන තෙක්, නළුවෝ එකී කාමරවල විශ්‍රාමයෙන් පසු වන්නෝ ය. නළු ගණයාට ද, රඟ මඩලෙහි කට යුතු කරන්නන්හට ද හැර, පිට කිසිවකුට නෙපථ්‍යයට ප්‍රවේශනයක් ලැබෙතොත්, හේ විශේෂයෙන් පිරිනැමෙන ගෞරවයකි. නොයෙක් විට, වත් කම් ඇති සිංහල තරුණයන්හට, ලංකාව බලා එන ඇතැම් විදෙශීය නාට්‍ය සමාජයන්ගෙන් මේ ගෞරවය පිරිනැමෙන්නේ ය. ජෝන් ජයපාල ද, ඒ පුරුද්දට



විශ්න බායි දනැඳින ගෙන කථා බස් කිරීම අදහස් කොට, මෙ සේ නෙපථ්‍ය ප්‍රවේශනය සෙවූවේ ය. එහෙත් ඔහුට ඊට අවසර නොලැබිණි. ඔහුට පමණක් නොව, අන් කිසිවකුට වුවත්, විශ්න බායි නිසා නෙපථ්‍යයට ඇතුළු වීම තහනම් බව කළමනාකරු විසින් දනුම් දෙන ලදි. ඉක්බිති ඔහු නො සන්සුන් සිතින් ආපසු විත් සිය බිරිඳ ළඟින් හිඳ ගෙන, නැටුම බලන්නට පටන් ගත්තේ ය. කොතරම් රසවත් වුවත්, කොතරම් වැදගත් වුවත්, මේ ශාකුන්තලයෙහි විශ්න බායි නැති ස්ථානයට නම් ඔහු සිත් නො ඇලෙන බව ඩේසිට ද පෙනෙන්නේ ය.

යළිත් ස්ථානය වෙනස් විය. දුෂ්මන්තයන් සොයා ගෙන ශකුන්තලා වාසලට පැමිණියා ය. යළිත් පෙර පරිද්දෙන් මෝහනයට පත් මහ පිරිස්, සිත්-පිත් නැති ඉටි රූ මෙන් නිසොල්මන් වූහ. ජෝන් ජයපාල ද නො සන්සුන් කම් සියල්ල දුරු කොට පිළිමයක් මෙන් නැන්පත් විය. ශකුන්තලා දක් මුසු මුහුණෙන් ද දුක් මුසු රාවයෙන් ද රජුට කළ යාච්ඤාව ඇසූ දුටුවන් දෙ නෙතින් කඳුළු කැඳවන තරම් තියුණු ය. මේ විශ්න බායි, ජෝන් ජයපාලට කරන යාච්ඤාවක් මෙන් අසරණ ඩේසිට පෙනුණු හෙයින්, ඈ වරින්-වර සිය සැමියා දෙසත්, මේ පුදුම නළඟන දෙසත් බලන්නට පටන් ගත්තා ය. දෙ නෙතින්, ගලන කඳුළු සඟවා ගැනීමට වෑයම් කරන ජෝන්, වරින්-වර ලේන්සුවෙන් මුහුණ පිස දමන සැටි ද, ඩේසි දුටුවා ය. ඒ නම් ඇත්තෙන් ම දුක් උපද වන දර්ශනයකි. එහෙත් දැඩි සිතක් ඇති පුරුෂයකු තුළ, එයින් මෙ තරම් කැළඹීමක් ඇති වන්නට කිසි ද යුතු කමක් නො පෙනේ.

එම ස්ථානය පිළිබඳ නැටුම අවසන් වූ කෙණෙහි ඩේසි ස්වාමියා අමතා, වහා ම ගෙදර යා යුතු බව කීවා ය. අවසානය දක්වා ම නාටක දර්ශනයෙහි ලොල් වූ ජෝන් ජයපාල ඊට නො කැමැති විය. තව-තවත් පෙරැත්ත කරනු ලැබූ කල්හි "එහෙ නම්, ඩේසි ඔබ යන්න. ගිහින්, මට කාර්රෙක එවන්න"යි ඔහු කීයේ ය.

සිය බිරින්දට, රැයක මෙ සේ තනිය ම ගමන් යන්නට කියන සිරිතක් ජෝන් කෙරේ පෙර නොපැවැති බැවින් අසරණ ඩේසිට

මෙය ද එක පුදුමයක් විය. සැමියා මේ තැනින් ඈත් කර ගන්නා උපායය සලකා විනා. නො එසේ නම් මෙ සේ ආපසු යා යුතු බවක් ඈ නො කියන්නී ය. දැන් එයින් කාරණය නො පිරිමැසෙන හෙයින් ඕ තොමෝ ඒ ගැන කතාව එපමණකින් නතර කොට සුසුම් බරින් සැලෙන හදවතින් යුතුව, නාටකයේ අන්ත ස්ථානය හෙවත් අවසානය දක්වා සිය සැමියා අත් නො හැරම සිටියා ය. මේ නාට්‍යාවසානය කරණකොට ජෝන් හා ඩේසිගේ චිත්ත විප්ලවය අනාන්තය කරා පැමිණි හෙයින්, දෙදෙනා ම ඉවසිලි නැත්තෝ වූහ. ජෝන්හට නැවත විශ්න බායි දකින්නට ඉස් පාසු නැත්තේ ය. නාටකය අවසන් වූ කෙණෙහි ජෝන්, ඩේසි කැටුව ගොස්, ඇය මෝටර් රිය තුළ හිඳුවා, තමා එන තෙක් මඳක් එසේ පොරොත්තුව සිටින ලෙස දන්වා නාට්‍ය ශාලාවෙන් පිට වන විශ්න බායිගේ දර්ශන මාත්‍රයක් හෝ ලබන බලවත් ආශාවෙන් නැවත අවුත් එහි නළුවන් පිට වන දොරටුව රැක සිටියේ ය. නුදුරින් සිට, හොඳ හැටි විශ්න බායි බලා ගන්නා ආශාවෙන්, ඔහු මෙ සේ උදක් රැක සිටියේ වී නමුදු ඇය නික්මෙන්නා හා සමඟ විදුලි පහන් නිවන ලද හෙයින් හෙ ද නිෂ්ඵල විය. විසිතුරු ඝාටකයකින් සර්වාංග පොරොණය කොට ගත් ඕ තොමෝ, මේ කුළකින් නිකුත් සිය රැළි විදුලියක් මෙන් ශාලා ගර්භයෙන් නිෂ්ක්‍රමණය කොට, ක්ෂණයකින් නැඟුණු සිය මෝටර් රියෙන් පිටත්ව, යන්නට ගියා ය.

ඉන් පසු ජෝන් මහත් දොම්නසින් ගෙදර ගියේ වී නමුදු, එළි වෙන තෙක් ම, විශ්න බායිගේ අවතාරයෙන් නැලහොල්මන් කරනු ලැබූ තැනැත්තේ, රෑ කොහෙත් ම, නො නිදා ගත්තේය. "ඔව්! ඔව්! ඇය නම් ඇය වෙන්නට ම ඕනෑ. ඒ ඇයගේ බැල්ම- ඒ ඇයගේ කට හඬ- මට මතක යි මට මතක යි! ඇය වරින්-වර මා දෙස බැලුවේ, හැඳින ලා වෙන්න ඕනෑ. හතර අවුරුද්දකින් වෙලා තිබෙන පුදුමයක හැටි! මේ කැලෑ හඳ මෙ තරම් උසස් අධියකට පත් වුණා නම්, ඒකත් මහ පුදුමයක්- සමහර විට, මේ මාලිනිය නො වෙන්නටත් පුළුවනි, මට මේ විශ්න බායි රූමත් නිසා මාලිනිය වගේ පෙනෙනවා වෙන්නටත් පුළුවනි." මෙ සේ



නොයෙක් විතර්ක පහළ කරමින් ඔහු මුළු රැය ම නො නිදා පහන් කළේ ය.

සිය සිතින් විශ්න බායි අත් හැර ගත නොහැකිව තව මත් මෝහනයකින් මෙන් පසු වන ජයපාල, මේ පුදුම නළඟන ගැන සමාජයේ තැන-තැන, කියැ වෙන නොයෙක් දෙයත්, පුවත්-පත්වල පළ වන වාර්තාදියත් සලකා බලා, කරුණු විමසන්නට පටන් ගත්තේ ය. ඇතැමකුට විශ්න බායි බ්‍රාහ්මණ කාන්තාවකි- ඇතැමකුට රාජ කුමාරිකාවකි- ඇතැමකුට යවන කාන්තාවකි- ඇතැමෙක් ඇය, අස්වාමිකයයි කීහ. ඇතැමෙක් සස්වාමිකය යි කීහ. ඇයට හිමියන් සරා ලන ඇතැම් අය, මහා ධනපතියන් නම් කළහ. ඇතැම් අය, රාජ කුමාරයන් නම් කළහ. අස්වාමික වූවත්, සස්වාමික වූවත්, ඇය නම් චරිතයෙන් ඉතා පවිත්‍ර කාන්තාවක බව සවුරුත් එක හෙළා ප්‍රකාශ කළහ.

ඩේසිගේ නො කැමැත්ත ගැන ද නො තකා, පසුවදා ජෝන් ජයපාල හුදකලාව ම නාටකය බැලීමට ගියේ ය. විශ්න බායිගේ පෙර පුරුදු බැල්ම, මෙ දින ද ඔහුට දකින්නට ලැබිණි. අද එහි ව්‍යක්තිය කොතරම් බලවත් ද යත්, ඩේසි නො පැමිණි කරුණ පවා, ඇය තේරුම් ගෙන තිබෙන බව ඔහුට පෙනෙන්නේ ය. විශ්න බායි නතරව සිටින තැනක් ගැන ද කිසිවෙක් නො දනිති. මේ දින නාටකය අවසන් කොට, ඇය නික්ම යන කල ජෝන්, එම රථය ලුහුබැඳ ගත්තේ ය. ලුහුබැඳ ගෙන, නොයෙක් මං පැදිවලින් කරකැවී ගොස්, අන්තිමට එම රථය, කුරුඳුවත්තේ විශාල ගෙදරකට හැරුණු බව දැක, පසුව අවකාශ ඇති විටක එහි යන බලාපොරොත්තුවෙන් එ තැන, හොඳට සලකා ගත්තේ ය.

පසුව දා පෙරවරු කාලයේ, ඇය බලන්නට යන හෙතෙම තෑගි පිණිස අගනා වස්ත්‍ර කට්ටලයක් ද රැගෙන, එම ස්ථානයට ළඟා වූ නමුත්, එහි දොරටුව වසන ලද හෙයින් ඇතුළු වී ගත නො හැකි විය. නැවත එක් වරක, එහි අමුත්තන් වැද්ද නො දෙන බව, මුරකරු අතින් දැනගෙන, ඛේදයෙන් ද ආපසු පැමිණියේ

ය. එහෙත් ඔහු එයත් නො වරදවා, පෑම් දාම නාටක බැලීම නම් එක සේ කළේ ය. ඔහුට වැළඳුණු පිස්සුව දැන ගත් වෙලි, ඔහු මත්තෙහි ද ඔහු වැඩි-වැඩියෙන් ම විජන බායි කෙරේ ආසක්ත වන බව දැක, එයින් මුදන්නට වෑයම් කරමින් නැන්දණියන්හට පවා පැමිණිලි කළා ය.

මේ අද්භූත නාට්‍යාංගනාව ද, එම රඟුම් ද දකීමට ජයපාල මැතිණි ද කිහිප දවසක් ගියා ය. විජන බායියගේ අනුපම වූ රූප විලාසයෙන් ද, මධුර මනොහර ගායනයෙන් ද, නෙත්-සිත් පොළඹන නාට්‍ය කලාවෙන් ද, ප්‍රකර්ෂ පර්යන්තයට පැමිණි කැනැත්තී, දිනක් යොහෙළිය සිය සැමියා වෙනුවෙන් කළ කන් කෙඳිරි ගැමට සිනා සෙමින් මෙ සේ ද කීවා ය.

“ළමයා, ඕවා ගණනකට ගන්න එපා. ඒ තැනට ගිය හැමෝට ම පෙනෙන්නේ, විජන බායි තමන් දෙස බලන්නා වාගෙයි. මටත් පෙනුණේ, නිතර ම ඇය මා දෙස බලන්නා වාගෙයි. දැන් මේ පින්තූරය දිහා බලන්න” කියා බිත්තියේ එල්ලෙන තමාගේ ම සිතියමක් දක්වා “මේකත් එහෙම යි- සියදෙනකු සිය පොළක ඉඳන් බැලුවත්, ඒ හැමටත් පෙනෙන්නේ මේ පින්තූරය තම-තමන් දෙස බලන්නා වාගෙයි. හඳට හිත වැටුණොට හඳ අයිති කර ගන්න පුළුවන් කාට ද? හැමටත් පුළුවන්, හඳ එළියෙන් සතුටු වන එක විතරයි. විජන බායි හඳක් වැනි ගෑනියක්- ඇයට මිල මුදල් හිඟ නෑ- ඔය කාගේ වත් අත පොවන හරියක හරියක නොවෙයි, ඇය ඉන්නේ- ඉතින් කවුරුනුත් සතුටු වෙන්නේ, ඇය ඔහේ ම රඟ මඬලට උදා වුණා ම තම යි. ඇය දකින ගෑනු-පිරිමි කාටත්, එක වගේ පිස්සු වැහෙන එක ඇත්ත”ය යි ඇ කීවා ය.

“......නමුත් මෙයාට වගේ පිස්සුවක්, ඒ කාටවත් හැදිලා නෑ අම්මේ” කියා වෙලි මෙහි දී නැවතත් කෙඳිරි ගෑවා ය.

# 15

උතුමන් අගය නිසා ම, උතුමන් පිදීම ගුණ ධර්මය කොට ගත්, පැළඳිග රටවල මිනිසුන්ගෙන් ලබන අගනා පුද-පඬුරු ඒ ලොව- මේ ලොව දෙ ලොව ම ආත්ම ලාභය පිණිස උතුමන් පුදන, මේ රට මිනිසුන්ගෙන් විජන බායිට නො ලැබිණි. මේ රට මිනිසුන් පිදිය යුත්තන් පුදන්නේ එයින් අත් වන පුණ්‍ය ලාභය පලකා ගෙන මිස පුද්ගලයා කෙරෙහි පවතින ගුණ පමුණයට ගෞරව කරන අභිප්‍රායයෙන් නො වේ. බොහෝ බෞද්ධයන්, බුදුන් වුව ද පුදන්නේ, නව අරහාදි බුදු ගුණ නිසා ඇති වන ආලම්බන ප්‍රීතියෙන් නොව, බත් හැඳකින්-මල් මිටකින්-පහන් සිළු රජ සැපත්, සක් දෙව් රජ සැපත්, ලද හැකි ඵල දායක වූ උදාර පුණ්‍ය කර්මයක නොහොත් විශාල ලාභ ප්‍රයෝජන ලද හැකි වාණිජෝපායයක නොහොත් රේස් හොම්මර ගැනීම වැනි සූදුවක ස්වරූපයෙනි. තමන්ට වාසියක් නො පෙනෙන තැන, මේ අඳුරු සිතැති නො පහත් මිනිස්සු දෙවියනට වත් යමක් නුපුදති.

විජන බායිට, කුඩු පඬුරුවලට වඩා නොමිලයේ රඟුම් බලන අවසර පත් ඉල්ලා කරන අඳෝනා නම්, නොයෙක් තරාතිරම්වල මිනිසුන්ගෙන් මෙහි දී ගණනක් නැතිව ලැබුණේ ය. මේ රට ඇතැම් මිනිසුන් විදෙශයෙන් පැමිණි විජන බායිට පමණක් නොව, සිය රට-බස-දය-සමයය දියුණුවට උදක් වෙහෙසෙමින් ධනයත්, කාලයත් පරිත්‍යාග කරන සිංහළ ගත් කරුවකුට වුවත්, කවියකුට වුවත්, ගෞරව කරන්නේ, පුදන්නේ, බත් හැඳක පමණ වත් සියතින් යන වියදමකින් නොව. ඒ බඳු ගත් කරුවකුගේ නොහොත් කිවියකුගේ පොතක්-පතක් කෙසේ නමුත් නොමිලයේ ලබා ගෙන කියවන්නට වෑයම් කිරීමෙනි. කැපැලෙන් ලැබෙන තෑගි පමණක්

විනා, බැහැදකීමෙන් පිරිනමන පරිත්‍යාගයන් විශ්න බායි විසින් නො පිළිගන්නා ලද හෙයින්, මේ පුදුම නළඟන ගැන අභිරහස බොහෝ දෙනකුට වැඩි-වැඩියක් ගැඹුරු විය. ජෝන් ජයපාලගෙන් නම්, ඇයට නිතොරව ම වාගේ තැපැලක් පාසා පුද පඬුරු වශයෙන් නොයෙක් දේ ලැබුණේ ය. එහෙත් ඇයගෙන් සෙස්සනට මෙන් ම ඔහුට ද ලැබුණේ, ඒ හැම ස්තුති පූර්වකව පිළිගත් බව දක් වන මුද්‍රිත කාඩ් පත පමණකි. මෙ සේ අමුතු දනැඳුනුම් කම වගා කිරීමට යොදන ලද කිසි ද උපායයක් කිසි ම විදියකිනුත් සඵල නුවූ තැන, අභිප්‍රේතාර්ථ සාධනයෙහි ලෙහෙසියෙන් උදාසීන නොවන්නා වූ ජෝන් ජයපාල බලාත්කාරයෙන් හෝ ඇය දකින අදහස ඇති කළේ ය. දිනක් සන්ධ්‍යා සමයෙහි, ඇය දකිමැයි යන සර්වරාධ්‍යාශයෙන් තෙමේ ම මොටෝ රිය පිටත් කොට, විශ්න බායිගේ වාසය කරා පැමිණි තැනැත්තේ, එහි ගේට්ටුව සිරිත් ලෙස වසන ලදු වත් යතුරු නොලන ලද හෙයින් රැකවලා ගේ නහනමට ද කිසි තැකීමක් නොකොට බලාත්කාරයෙන් ම ගෘහාංගනයට ප්‍රවිෂ්ට වූයේ ය. ඔහු බරාදයට ගොඩ වී, කර නමා බලා කිසිවකු නොදැක, ආචාර විධි හීන මන්දාදර සම්පන්න පුරුෂයකු මෙන් කිසි ද පැකිලීමක් නැතිව , කෙලින් ම ගෙය තුළ වැදුණේ ය. මෙ සේ මහා ශාලාවට පිවිසි හෙතෙම, එහි කිසිවකු නොදක නැවත පිළිවෙළින් දොරක්-දොරක් බැගින් හැර ලමින් කාමරයක්-කාමරයක් පාසා බලන්නේ, අන්තයෙහි වූ ප්‍රසාධනාගාරයක විශාල ආදර්ශතලයකට මුණ දී, හිස පීරන කාන්තාවක දුටුවේ ය. ආදර්ශතලයෙහි ප්‍රතිබිම්බිත ඡායා මාත්‍රයෙන් ම ඔහුට ඒ කාන්තාව හැඳින ගත හැකි වූ බැවින් හිම කැටියක් පරිද්දෙන්, සිසිල්ව ගිය සර්වාංගය ඇත්තේ, චිත්ත විප්ලවය කරණකොට සංවේගයෙන් දොර කඩ බලාගත් වන ම සිටියේ ය.

මෙ සේ විස්මයානුකූලව, තමා දෙස බලා ගත් වන ම දොර කඩ සිටින පුරුෂයා ආදර්ශ තලයෙන් දුටු කෙණෙහි මේ කාන්තාව කෙරෙහි ද ඇති වූණේ නව නාට්‍ය රසයෙනුදු නොපහළ වන අනුභූතියකි. ඕ තොමෝ කාරණා-කාරණ සලකා ගත නොහැකිව, සන්ත්‍රස්තරූපිව, පාෂාණීභූතව, සිත්-පිත් නැති දඬු රුවක් මෙන්



මෙසේ මඳක් කල් සිටි ඉක්බිති ශීර්ෂ ප්‍රසාධනයෙහි නියුක්ත වූ කෝමල හස්තය හෙමින්, පහත හෙළා, විගලිත කෙශ කලාපය කරණකොට වලා ගැබකින් නිකුත් සිය රැළි විදුලියක් මෙන් තරුණයාට අභිමුඛව හැරෙමින් ආදර්ශ තලයට පිටු පා සිටියා ය.

"මගේ මාලිනී! මගේ රත්නය!" කියමින් ජෝන් සියලහ සිසිල් බව හැරුණු කෙණෙහි යුගත් විදහා දිව ගෙන අද්භූත විසන්ධියට පැමිණි සන්ධියක්, යළි සන්ධි ගන්වන්නා සේ බලවත් ඇල්මෙන් ඇය වැලඳ ගත්තේ ය.

සිදු වසක් මුළුල්ලෙහි නිරාහාරයෙන් පසු වූ චිත්තයක ක්ෂුධාව සන්සිඳෙන තෙක් ඔහුට සිත් වූ පරිදි සිපාචාර පැවැත්වීමට ඉඩ දුන් ඉක්බිති ඈ ඔහු හෙමින් ඉවතට තල්ලු කර දමමින්, "මහත්මයා බොරු කාරයෙක්-රැවටිලිකාරයෙක්" යි කීවා ය.

මාලිනියගේ බැනුම්, දැන් ඔහුට ඇයගේ සංගීතය වැනි වූ ම කර්ණ රසායනයකි- තරහ මුහුණ, ඇයගේ නාට්‍ය විලාශය වැනි වූ ම නෙත්‍රාඤ්ජනයකි. දැන් ඔහු නො සැව ම දෙව් ලොව ගිය සත්ත්ව කෙනකු මෙන් ප්‍රීතියෙන් පසු වන්නේ ය. මහාර්ඝ මුක්තාමාණික්‍යාදියෙන් අනූන වස්ත්‍රාභරණයෙන් මුළු රඟ මඩල ප්‍රභාවත් කරන මාලිනිය දුටු-දුටුවන් නෙතට රසාඤ්ජනයක් වන බව පුදුමයක් ද? ගෙදරට හැඳ ගත් මෙ චාම් ඇඳුමෙන් පසු වන කල්හි පවා, ඇයගෙන් දක්වෙන්නේ, නියම දෙවඟනකගේ විලාසයකි. ගත වූ සිදු වසර තුළ, ඇය කෙරේ ගති ගුණයෙන් සමෘද්ධ වූ රූප සම්පත්තිය ඇත්තේ ය- ශරීර කාන්තිය ඇත්තේ ය- මනොඥ කථා විලාසය ඇත්තේ ය- වාක්චාතුර්‍ය්‍ය ඇත්තේ තය- මධුර භාෂණය ඇත්තේ ය- ලාලිත්‍යය හා සෞන්දර්‍ය්‍යය ඇත්තේ ය.

සිය සිත්හි පැවති දුබල බවටත්, චපල බවටත්, දාසව කළ නොතරම් කම ගැන තෙමේ ම තමාට දොස් නඟ-නඟා සිය වරද පිළිගනිමින්, පාප නිවේදනය කරන ජෝන් මෙහි දී මාලිනියගෙන් යාචක ලීලාවෙන් සමාව ඉල්ලන්නට පටන් ගත්තේ ය. එ කල,

ඈ මෙ සේ කතා කරමින්, "මහත්මයා, අපි මේ කථාව මෙ පමණකින් නවත්වමු. නවත්වා, නැවත හමු නොවෙන්නට වෙන් වෙමු. ඒක දෙගොල්ලංට ම හොඳය"යි කීවා ය.

"මාලිනී, ඔබ දුටුවාට පසු මට නම් තවත් ඉතින් ඔබගෙන් වෙන් වෙන්නට බැහැ"යි ඔහු කීවේ ය.

මෙහි දී මාලිනී සිනාසුණා ය. ඇයට ජෝන්ගේ පරණ කොලු කම්- දුර-දිග නොබලන, නැතහොත් දුර-දිග නො පෙනෙන, ඉක්මන් කම්- තව මත් නොමඳව පෙනෙන්නේ ය. එහෙයින්, ඈ ඔහුට අනුකම්පා කරමින් තමා මෙසේ පැමිණියේ, උදක් ඔහු දකින ආසාවෙන් විනා, ඔහුගේ විවාහ ජීවිතයට අනතුරු කරන අදහසින් නොවන බව කීවා ය.

මාලිනිය අවවාද මුඛයෙන් කියන කිසිවකටත් ඇහුම්කන් නො දෙන ජෝන්, මෙහි දී දඹදිව ගමන ගැන සියලු තොරතුරු විස්තර කරමින් වැඩිහිටියන්ගේ උපක්‍රමයෙන් අහිංසක ඩේසි හා තමා අතර, විවාහය කැර වූ සැටි ද කීයේ ය.

"එදා මහත්මයා නොපැමිණි දින, මට හිතුණේ, සිය පණ නසා ගන්නටයි. මා එදා සිය පණ නසා ගන්නවා- නොගත්තේ, ඒක මට මහත්මයා වෙනුවෙන් ඕනෑ වෙලාවක කරන්නට පුළුවන් ලෙහෙසි වැඩක් නිසායි. මට එ වේලේ හිතුණා ජීවත් වන එක වඩා ලොකු හපන් කමක්ය කියා. වාසනාවකට වාගේ එදා ඉබාගාතේ ගිය මට, කොළඹ හෝටලයකදී යෝගනී ජාන් නමැති ප්‍රසිද්ධ නළඟන දකින්නට ලැබුණා- ඉංදියාවට ගොස් විශ්න බායි නමින් මේ අභිනව ජීවිතය පටන් ගත්තේ, ඇයගේ සහයෙන් තමා" යයි මාලිනී කීවා ය.

මෙ සේ නොයෙක් කතාවෙන් කල් ගත කරන ජෝන් ජයපාල, ඇයගේ ආරාධනයෙන්, එ දින, රාත්‍රි භොජනයට ද නතර විය- ඉන් පසු ඇය කැටුව ම නෘත්‍ය ශාලාවට ද ගියේ ය. එවක් පටන් නෙපථ්‍යයෙහි දී වුවත්, ජෝන් ජයපාලට පමණක් විශ්න බායි දකින තහනමක් නො වී ය.



විශ්න බායි පිළිබඳ සත්‍ය ප්‍රවෘත්තිය, ජෝන් විසින් කිසිවකුටත් නොකියන ලදි. විශ්න බායිගේ ලංකා වාසය තාවකාලික වුව ද, එහෙත්, ඇය ජන සමාජයට හඳුන්වා දීම අසහාය ප්‍රීතියක් කොට ගත් හෙතෙම නොයෙක් රැස්වීම්වලට ඇය කැඳෙව්වේ ය. අනෙකක් තබා, ජයපාල මැතිණියගේ හා ඩේසිගේ ද අවසර ඇතිව, ඔවුන්ගේ බලවත් ආසාව සන්සිඳවනු පිණිස ඈ සමන් ගිරට ද කිහිප වරක් කැඳවනු ලැබුවා ය. එසේ පැමිණි ප්‍රථම වාරයෙහි ම ජයපාල මැතිණී ද ඩේසි ද ඇයට ඉතා හිතවත් වූහ. ඇයගේ වැනි සදාචාරාත්මක පවිත්‍රතාදිය කුල හීනයන් කෙරේ නො පිහිටන බව දන්නා හෙයින්, ජයපාල මැතිණී එයින් ම විශ්න බායිගේ කුලීන ජන්මය නිසැකයෙන් පිළිගත්තා ය. කොතරම් පිළිගත්තා ද යත්, "උසස් ගුණ කවදා වත් මැකෙන්නේ නෑ ඩේසි. මේ විශ්න බායි නිය ම රාජ කුමාරිකාවක බව නිසැකයෙන් ම කියතැකි. "කැලෑවකින් කැලෑවකට මාරු වුණාට දිවියාගේ තිත් මැකෙන්නේ නෑ" කියන්නේ ඔන්න ඔය නිසා තමයි. ඔබ කවදා වත් සැක හිතන්න එපා- ඇහුණා ද? විශ්න බායිගෙන් දූට, ඔය ඔබ හිතන විදියේ වැරදි කවදා වත් කෙරෙන්නේ නැතැයි" එතාවස් සිය යෙහෙළිය සනසමින් ද ඈ කීවා ය.

මෙ සේ විශ්න බායි පිළිබඳ උසස් අදහස් ඇති කරමින් කල් ගත කරන ජයපාල මැතිණියට නම්, තමා හා ආශ්‍රයට පත් මේ වීර ප්‍රසිද්ධ නර්තනිය මෙයින් සිදු වසරකට උඩ දී තමා ළඟ දණින් වැටී ගෙන හඬමින් තම පුත්‍රයාගෙන් ඇය වෙන් නො කරන හැටියට උදක් යාච්ඤා කොට සිටි, කැලෑ හඳ බව සිහිනයකින් වත් සිහි නොවී ය. ඩේසි ද සමාජ චාරිත්‍ර කඩ නොකොට, නියම ඈයි-හොඳයියෙන් කල් පසු කොට විශ්න බායි ආශ්‍රය ඉවසමින් සිටිය ද, රටේ-තොටේ ඉමක් කොනක් නැතිව, දනන් තුඩ-තුඩ කියැවෙන්නට පටන් ගත් නොයෙක් ප්‍රලාසයෙන් ප්‍රලයය වූ තැන් පටන්, ස්වකීය ස්වාමියාගේ නොහොබනා කම්වලට විශ්න බායි අනුබල නොදෙතත්, නොකැමති කමක් නොදක් වන හෙයින්, නැවත කළකිරුණා ය. එසේ ද වුව, ඇය විසින් කිසි විටකත් තම සිත යට පැවති නොමනාපය විශ්න බායිට නොපෙන්වන ලදි.

තමා ජෝන් හා විවාහයට පැමිණි සැටි, අපූර්ව කාරණයක් කොට දක්වන ඩේසි විශ්න බායිගේ සිත මොළොක් කොට අනුකම්පාවෙන් දිනා ගනු වස් වතාවක් මෙ සේ ද කීවා ය. "විශ්න බායි, මගේ සැමියා මට ලැබුණේ, මහ පුදුමයකින්- කවදාවත් ම ඔහු ලබන බලාපොරොත්තුවක් මගේ නම් තුබුණේ නැහැ. මට වුණේ, පරෙස්සමට තුබූ දෙය ඇලියාවට ගියා වැනි වැඩක්- වැඩිහිටියන් නැති අතර, මා රකින්නට බාරගත් ජයපාල මහතාම මට වධකයා වුණා- එයින් තමා, මේ විවාහය කෙරුණේ යි" සිනා සෙමින් පවසා, අනතුරුව, තමන් වන්දනාවේ ගිය ගමන ගැනත් ගෞරපුරයේ දී විවාහය සිද්ධ කළ සැටි ගැනත් විස්තර කළා ය.

"එහෙ නම් වන්දනා ගමනේ ආනිසංස අත්පිට ම පල දී තිබෙන හැඩයි" කියමින් විශ්න බායි කිසිවක් නොදන්නා තැනැත්තියක මෙන් මෙහි දී සිනා සුණා ය.

ජෝන් කිසි විටකත් කිසිවකු වෙනුවෙන් නොගත් වෙහෙස- නො කළ වියදම- නොගෙවූ කාලය- විශ්න බායි වෙනුවෙන් ගන්නා බවත්, කරන බවත්, ගෙවන බවත්, දන්-දන් මුළු කොළඹ නගරයේ ප්‍රකට රහසකි. විශ්න බායි කොතැන ද, ජයපාලත් එ තැන ම ය කියන අභිනව ජනප්‍රවාදයක් ද ඔහුට සතුරු-මිතුරු උභය පක්ෂය අතර, ප්‍රචාරයට පැමිණියෙන් මන්ත්‍රී තරඟයට පවා එයින් හානි වන්නට පටන් ගත්තේ ය. ඒ කිසිවක් ගැන සර්ෂප මාත්‍රයකිනුදු තැකීමක් නොකර, ජෝන් මෙ සේ මොහනයෙන් පසු වන්නේ, නියම බිරිඳකට සෙනෙහැති සැමියකු දක්වන්නා වැනි ප්‍රේමයකින් නොව, ස්වකීය ප්‍රියාව නමැති දේවතාවිය වෙනුවෙන් මුළු ලොකය ම වුවත්, නොපැකිල බිලි කිරීමට තරම් සැහැසි වූ, උද්ඝොෂණයෙන් හා ගර්ජනයකිනි- සර්ප ශ්වාසයෙන් නාද පවත් වන, අග්නි කාණ්ඩයකට බඳු උද්වේගයකිනි.

විශ්න බායි නමැති ප්‍රදීපයට පළගැටියකුව නොහොත් පැණි හැළියට ඇඹලයකුව, දුර-දිග බැලීමෙන් තොරව හිතවතුන්ගෙන් වෙන්ව, වැඩිහිටියනට නොකීකරුව, මතු දියුණුවට පරාංමුඛව,



කටයුතුවලට බාධකව, විනාශයට අවනතව ජෝන් මේ කරන විගඩම් තවත් ඉවසිය නොහැකි වූ තැන, ජයපාල මැතිණි ද ඩේසි ද, එක සැටි කිපෙමින් ඔහුට බැණ වදින්නට පටන් ගත්හ. එයින් සමන්ගිරේ, මෙ තෙක් පැවති සමාදානය අතුරුදහන් විය. එවක් පටන් සිදේවියගේ රැක්මෙන් අත් හැරුණු සමන්ගිර මූදේවියගේ වසයට පත් වූයෙන්, මව හා පුතා අතරත්, සැමියා හා බිරිඳ අතරත්, හට ගන්නා නොයෙක් අඩ-දබරවලින් තොර නැති විය.

"උඹලාට සංඩු කරන්න කෙනකු නැත් නම්, සංඩු කර පල්ලා හෙවණැල්ලත් එක්ක. මා පුංචි බබකු නොවෙයි. ඔහොම නැති නාස්ති වෙන්න. මා පොරොන්දු වෙලා තියෙනවා විශ්න බායිට, සිංහල උගන්වන්න. ඒ නිසායි මා නිතර එහෙ යන්නේ, උඹලාට මිනෑ නැහැ. ඒකේ වගක් සොයන්න" කරදරයෙන් බේරී ගත නොහැකි වූ තැන, ජෝන් වතාවක් කීයේ ය.

"කෝ, මේ වාගේ පණ්ඩිතයෙක්, ගෑනුංට සිංහල උගන්වන්න. ඇහුණා ද ජෝන්, ඕවා විශ්වාස කරාවි තුන්පනේ මිනිස්සු නම්" ජයපාල මැතිණි කීවා ය.

"ඔය හැටි සිංහල දන්නවා නම්, මේ මට උගන්වන්න කෝ. විශ්න බායිට වඩා සිංහල ඕනෑ කර තියෙන්නේ මට නොවැයි?" ඩේසි කීවා ය.

මේ ආදී කතාවලින්, ඇතැම් විට, මීටත් දරුණු කතා වලින් ජෝන් සිටින තෙක් ම, සමන්ගිර තෙල් මිරිකෙන සෙක්කුවක් මෙන් නිතර හඬන්නේ ය. ජෝන් නැති විට ද සමන් ගිරේ කලබල නැත්තේ නොවේ. නැන්දා සහ යෙහෙළිය අතර කලබල- නොහොත් ජයපාල මැතිණිය හා අත්තනායක දෙමාල්ලන් අතර කලබල- ආදී වශයෙන් මොකක් නමුත් සිත් තැවුලට කාරණයක් දත් එහි නිතර පවතින්නේ ය.

මේ අතර, විශ්න බායි, ඈත පෙර දිග බලා, තවත් සතියකින් නැව් නගින බව පුවත් පත්වල පළ විය. මේ ප්‍රවෘත්තිය පත්‍රයෙන් දුටු කෙණෙහි ඩේසි වහවහා නැන්දණියන වෙත යමින් "මෙන්න,

මෙන්න, මේ වහංගතිය යන්න ගමන් ගත කරන්න හදනවා.'' යයි දක්වීම දක්වා සිටියා ය.

එය කියවා බැලූ ඉක්බිති, ජයපාල මැතිණී ද, ''දූත් වත් ඉතින් කොළඹට නිංද නොයාවී'' යයි සතුටු පුසුමකින් ළය සැහැල්ලු කර ගනිමින් කීවා ය.

''කොළඹට පමණක් නොවෙයි- මුළු ලංකාවට ම නිංද යයි. මේ මාසය මුළල්ලේ, මේ මල් බලිය නිසා මුළු ලංකාවට ම නිදි නැති වුණා''යි ඩේසි යළිත් කීවා ය.

මේ දන්වීම දුටු කෙණෙහි පුත්‍ර ශොකයෙන් පෙළුණු ජයපාල මැතිණියට මෙන් ම, සපත්නිරෝෂයෙන් පෙළුණු ඩේසිට ද පරණ සැව පට හැර යන සර්පයකු පරිද්දෙන් සිතින් පහව ගිය දුක් දොම්නස් ඇති විය. චන්දන කල්කයෙන් පරිභාවිත පරිද්දෙන් සිසිල්ව ගිය හෘදය වස්තුව ඇති විය. මේ ගර්හිත ලලිත මොහනයෙන් මූර්ච්ඡිත වූ ද, ආත්ම ශක්තියෙන් හීන වූ ද, ජෝන් නින්දිත වශීකරණයකට බඳු, මේ විෂම බන්ධනයෙන් මුදා ගැනීම දැන් ඉතින් ඔවුනට අපහසු කාරණයක් සේ නො පෙනේ. නාම පත්‍ර ප්‍රදානයට ද ආසන්න වූ කාලය ඇති හෙයින් ඊට ඔහු උනන්දු කැරවීමත්, අතපසු වීමෙන් මහ හැරුණු ඉළැක්ෂං වැඩවල, යළි යෙදවීමත්, ඔවුන් විසින් අපෙක්ෂණය කරන ලදි. එ සේ අපෙක්ෂණය කොට, ජයපාල මැතිණී, එදා සවස පුත්‍රයා ගෙදර එන තෙක් බලා ගෙන සිට, පළමු නොමනාප කම් මතක නැති කොට දමා, කිසි ද අමුත්තක් නැත්තා සේ, කතාවට සුදුසු ප්‍රස්තාවයක් බලා, ආසනාපෙක්ෂකයන් විසින් නාම පත්‍ර පිරිනැමිය යුතු දවස ආසන්න බව කියා සිටියා ය.

''මට ඕනෑ ආසනයකුත් නැහැ. මා දෙන්න යන නොමිනේෂං පේපරයකුත් නැහැ''යි එවිට ජෝන් අස්ථාන උදහසකින් ප්‍රකාශ කළේ ය.

''ඇයි?'' කියා ජයපාල මැතිණී ප්‍රශ්න කළා ය.

''මට ඒ දවස්වල මෙහෙ ඉන්න වෙන්නේ නැහැ.''



''මොනවා?'' කියා ඩේසි ද සංවේගයෙන් ප්‍රශ්න කළා ය.

''මට ඈත පෙර දිග යන්න වෙලා තියෙනවා.''

''මොකද-විශ්න බායි එක්ක වත් යන්න දැයි?'' ජයපාල මැතිණී යළිත් ඇසුවා ය.

''ඔව්'' යනු ජෝන්ගේ සාහසික පිළිතුර විය.

තමන් සිතින් බැහැරව ගියේ, පරණ සැව පට විනා නාගයා නො වන බව මෙහිදී ප්‍රත්‍යක්ෂ කළ ජයපාල මැතිණීත්, ඩේසිත්, යළිත් ශොකයෙන් හා භීතියෙන් මඩනා ලද සිත් සතන් ඇත්තෝ වූහ- කල්පාන්තයෙහි ද, හලුව යන මහ මෙර වන් බලාපොරොත්තු ඇත්තෝ වූහ. එකාක්ෂරයක ස්වනයෙන් උච්චාරිත වූ ඔහුගේ අන්තිම පිළිතුර කරණ කොට මේඝ ධ්වනියකින් පරිද්දෙන් බිහිරි වූ සවන් ඇත්තෝ වූහ- ලොහො දිය වත් කළ කල්හි මෙන් කකියන සවන් ඇත්තෝ වූහ.

මනුෂ්‍යයා විචාරණ ශක්තියෙන් හීන වූ කල්හි, මානසික වේදනාවෙන් පීඩිත වූ කල්හි, එක් වන් සිතින් පුරුදු ලැඟුම් පොළ සොයා ගෙන දිවීම ආදියෙහි පටන් ම සිරිත කොට ඇත්තේ ය. මෙ සේ අභාග්‍යයට පැමිණි කල්හි සත්ත්ව තෙමේ සිය ලැගුම් පොළෙන් නොහොත් යහනෙන් පමණ අන් කිසිවකිනුත් සැනසීම නොලබන්නේ ය. එවැන්නකුට යහන, මවකි-පියෙකි-නෑයෙකි- හිතවතෙකි. කරුණු මෙ සේ හෙයින්, ජෝන්ගේ අනවධාන අශික්ෂිතාභිප්‍රායය කරණ කොට චිත්ත වෛක්ලව්‍යයට පැමිණි ජයපාල මැතිණියටත්, ඩේසිටත් තම තමන් යහන් බලා දිවන්නට සිත් වී නම්, හේ පුදුමයක් නොවේ.

බෙල්ලාට සිය කටුව අත් හැර දමා ජීවත් විය නොහැක්කා සේ දැන් අසරණ ජෝන් ජයපාලට ද, මාලිනිය අත් හැර දමා ජීවත් විය නොහැකියි. මාලිනිය සිය සිතැහි උදක් හෙළි කොට නො කියතත්, තමා නැති කල්හි ජීවිතය ඇයට ද හිරු නැති ලෝකයක් මෙන් නිතාන්තයෙන් ම අන්ධකාර විය යුතු බව ජෝන් දන්-නේ ය. ඇය මෙ තෙක් වෙහෙයෙමින් සිටු වසක් මුළල්ලෙහි සිට,

වෛශෂ්‍යයකින් හා වෛශාරද්‍යයකින් ලොක ප්‍රසිද්ධිය ඇති කොට ගෙන, මෙහි පැමිණියේ ද, තමාට ඇති බලවත් ස්නෙහය නිසා මය. ඉදින් තමා මෙ තරම් ප්‍රිය කරන, අනභිමුඛයෙහි පවා භක්ති ප්‍රෙමයෙන් තමා සිහි කරන, තමාගෙන් කෙනෙක් වෙහෙස ලදුවත්, නො කලකිරෙන, මේ ස්ත්‍රී රත්නය අනුබැඳ නො ගොස්, තවත් ඔහු නම් කිසි තැනක නොරැඳෙන්නේ ය.

මාලිනී සිය ජීවිතයට ද වඩා ජයපාල තරුණයාට ප්‍රෙම කරන හෙයින්, එ ද ඔහුගෙන් වියොවට පත් කෙණෙහි, බලවත්ව හටගත් සිය පණ නසන ආශාව ද මැඩ පවත්වා, කෙසේ නමුත් ඔහු සිත් නැවත දිනා ගනිමැයි යන අදහසින්, මෙ සේ අන් වෙසකින් දිවි රැක ගෙන, ලොක පූජ්‍ය භාවයට පැමිණ යළි ඔහු සොයා වසඟ කර ගත් නමුදු, ඒ නිර්දොෂ නිරහංකාර ඩේසි කෙරෙන් ඔහු අත් හැර ගෙන යෑම දරුණු අපරාධයක් සේ සිතන්නී, දැන් මීට කටයුතු පිළියම් නොදැන, අවිනිශ්චිත විශ්වාසයෙන් තවමත් පසු වනු විනා, ඔහු තමා වෙත රැඳවීම් වශයෙන් අනුබල දෙමින් එක ද වචනයක් වත් නො කීවා ය- පුවත් පත් මගින් දැන ගන්නට ලැබෙන තෙක් ම, මෙතරම් ඉක්මනින් කොළඹින් නැව් නැග යන බවක් වත් ඔහුට නො කීවා ය.

ඇය පිටත් වන දින ජෝන් කලින් නො දැන සිටියත් කවදා නමුත් නො ලස්ව හෝ ලස්ව කොළඹින් යන බව දන්නා හෙයින්, එසේ පිටත් වන දිනක, තමා ද ඇය කැටුව ම යා යුතු බව සිතා, කලින් ම ඊට වැඩ සූදානම් කළේ ය. පත්තර දැන්වීම දුටු ඉක්බිති ඔහු තම අදහස ඇයට කීවේ ය. ඈ ඔහුගේ අදහස අනුමත නො කළා ය. ඔහුට ඔහුගේ කරුණාවත් ඩේසි ගැන ඈ මතක් කළා ය- උදක් බලාපොරොත්තු වන රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ආසනය ගැන මතක් කළා ය. ඒ කිසිවකුත් ඔහු නො ගිවිසි කල්හි සිතු මනාපයක් කිරීමට ඉඩ දෙමින් ඈ මධ්‍යස්ථ වූවා ය.

ජයපාල මැතිණි ද, ඩේසි ද, විශ්න බායි ගේ මේ සෘජු ගුණය ගැන නො දනිති- ජෝන්, මේ, විශ්න බායිගේ අනුබලයෙන් ම යන්නට හදන ගමනකැයි සිතති. එසේ ද වුව, ජයපාල මැතිණියට



නම් මෙහි කෙසේ වත් නොපෙනෙන කොනක් ද ඇත්තේ ය. එ නම් නිතර ලැබෙන ධනය කරණකොට කුවේරයාට බිරිඳ වීමට සුදුසු, යශොකීර්තිය කරණකොට දිගැතුන් කුඹු අලෙවි දීමට සුදුසු විශ්න බායි තමා අදහන, අගය කොට සිතන සිය දහස් ගණන් වෙත ඉසුරුමතුන් සිටිය දී, ඒ කිසිවකුනුත් අතරේ කිසි තැකීමක් නොකොට, ජෝන් විෂයෙහි ම පිළිබඳ සිත් ඇති කරන රහස කුමක් ද යන්න ය.

ජයපාල මැතිණියට දැන්-දැන් ඩේසිගෙන් පමණක් නොව, අත්තනායක දෙමාල්ලන්ගෙන් ද සැනසීමක් නැත්තේ ය. අත්තනායක දෙමාල්ලෝ, ජයපාල මත්ස්‍යයා එම මැණියන් හට හසු කර දෙනු වස්, සිය වෙර මසින් ඇම තනා කළ නුනුවණ කම් ගැන පසු තැවෙමින් අපවාද නගන්නට වූහ. මෙ තෙක් කල් රක්ත මාණික්‍යයක් ලෙසින් යන-යන තැන සමන්ගිර ප්‍රභාවත් කරමින් සිටි පුෂ්ප මඤ්ජරියක් ලෙසින් සුවඳ ගන්වමින් සිටි, ඩේසි දැන්-දැන් හැල හොල්මනක් නැති ප්‍රෙතාත්මයක් පරිද්දෙන් හැඩූ කඳුලෙන් පසුවන්නී, යන යන තැන ශොකයත්, විලාපයත් ගෙන ගියා ය. ඩේසි නම් ඉතා ම හික්මුණු බාරියකි. හික්මුණු බව බිරිඳකට ඇති විය යුතු ඉතා ම වැදගත් ගුණයකි. එහෙත් එ පමණකින් හිමියන් සිත් දිනා ගැන්මෙහි බාරිය අපොහොසත් වන්නී ය. ඇතැම් පුරුෂයෝ වද කරදර නො දෙන, කීකරු බාරියක් ලත් පමණින් විවාහ ජීවිතයේ නියම සැපය ලැබුවා සේ ප්‍රීති වෙත්. නමුදු, සමහර පුරුෂ කෙනෙක් එ පමණකින් ම එය සැපය කොට නො සිතති. මාවත යහපත් වුවද, සැපවත් ස්ථානයක් නිර්දිෂ්ට කොට ඇති වුවද, වැටුණේ, කාන්තාරයක් මැදින් නම්, එහි දකුම් කලු කිසිවක් නැති හෙයින්, නොහොත් එය දර්ශන සම්පන්න වෛවර්ණ්‍යයෙන් හීන හෙයින් ද, දා ගිය පාථවක් වැනි එ බඳු මග බොහෝ දෙනා ගමන් පිළිකුල් කරති. ඩේසි සර්වාංග සම්පූර්ණ බ්‍රහ්ම නිර්මිතයකට බඳු කාන්තාවක් වුව ද විවිධාතිථ්‍ය සත්කාර විශෙෂයන් නො දත් හෙයින්, ඇය සැදූ මග, ගමන් කළ සිවු වස මුළුල්ලෙහි තරුණ ජයපාලට දුකක් නො ලැබුණත්, වෙසෙසින් ලැබුණු සැපතක් ද නොවී ය.

එ හෙයින් ඔහු තුළ, ඇය වෙනුවෙන් උපන් විශෙෂ ප්‍රෙමයක් ද නොවීය. මේ සිදු වස මුළුල්ලෙහි මොහොතින්-මොහොත ම ගලෙන්-ගල එක් වීමෙන් තමා වට කොට බැඳුණේ, සිර ගෙයකැයි ජෝන්හට දූන්-දූන් සිතෙන හෙයින්, අවසර ලත් කෙණෙහි, එය බිඳ ගත් නිදහස ලබනා උපායය ඔහු සොයන්නේ ය. මනා සේ උගත් ගෘහ සංවිධානයෙහි ම නියුක්ත වූ පමණින් ද ගැහැනුන් හට සැමියන් සිත් බැඳ ගැන්ම පහසු නොවන්නේ ය. විවාහ ජීවිතය සැපයක් නම් එම සැපය පවතින්නේ, ගෘහ සංවිධානය මුල් කොට නොවේ. බාරිය ගෙදර ඇත්තන් නමින් ප්‍රසිද්ධ හෙයින්, ගෙදර-දොරේ කටයුතු ද ඇය විසින් බැලිය යුතු වත්, ඉදින්, මිත්‍රියකට නොහොත් සහකාරියකට බඳු නිරන්තර ප්‍රසන්න සුහාද්භාවයෙන් ඕ තොමෝ ස්වාමියා නො පිණවන්නී නම්, නො සතපන්නී නම් ව්‍යසනයෙහි දී පිරිපුන් සෙසු සියලු ගුණ වෙසෙස් ඇති වත්, ඒ කිසිවකිනුත් කිසි පිහිටක් නො ලබන්නී ය. නියම ගුණාංග සම්පූර්ණ භාර්යා තොමෝ සමත් උයන් ගොව්වකු පරිද්දෙන් නිසරු ගුණැති සැමියකු වෙතින් නමුත් සිත්කලු මල්-පලු-පල උපදවන්නී ය. නො එසේ වූ තැනැත්තී, යහපත් සැමියකු ලත් කල්හි ද, අලස උයන් ගොව්වකු මෙන්, ස්වාමිහුගේ ඉතා ම සාර වූ ඒ චිත්තොද්‍යානය පවා වල් බිහි කර දමන්නී ය.

"අඩන්න එපා දුව- කිච්චා නහන ගුරු එහෙ නම් එහෙ-මෙහෙ නම් මෙහෙ- යන යකා තොරහ බිඳ ගෙන වත් ගිය දෙන්- ඔබට මා ඉන්නවා- බයවෙන්න එපා"යි හඬා දූකින් පසු වන යෙහෙළිය සනසමින් ජයපාල මැතිණි කීවා ය.

"මා මේ වාගේ කෙනකු බලා ගෙන මිස, නැන්දම්මා කෙනකු බලා ගෙන දීග ආ ගමනක් නොවේ." යයි ඩේසි ද එ බසට පිළිතුරු දෙන්නී. "එයා මෙ තැනින් නැව් නැංග හැටියේ, බලන්න පුළුවනි මොකද වෙන්නේ කියා" යළිත් කෑ ගැවා ය.

ගමනට අවශ්‍ය මාර්ගොපකරණාදිය ගමන් පෙට්ටිවල අසුරමින් සිටි තරුණ ජයපාලට මේ ආදී නොයෙක් කථා ශ්‍රවණය වන්නේ වී නමුත්, ඔහු ඒ කිසිවක් ගණනකට නො ගත්තේ ය. කිසි කලක,



තපුරු අදහසක් සිත නුපන් ඩේසි කිසි උගත් කමක් හෝ හික්මීමක් හෝ නොලත් ගමේ-ගොඩේ සාමාන්‍ය ස්ත්‍රියක මෙන් මෙ සේ වෙහෙස-වෙහෙසා බස් තෙපලන කල්හි, ජයපාල මැතිණි නො ඉවසන ඉවසුම් ඉවසුවා ය. දූන් ඇය සතු වැඩ කොටස ඉවසීම පමණකි. අත්තනායක දෙමාල්ලන් ඉවසීම, ඩේසි යෙහෙළිය ඉවසීම, වෙනකක් තබා ජෝන් ඉවසීම ද ඇය විසින් කට යුතු ය. දූන් තමා ගෙට තිවට එළිපත මෙනි. මෙ සේ හැම දෙනකුට ම ඉවසුම් දිය යුතු ය. පොදු යහපත සලකා වැඩි වැඩ කළ මෝඩ කමේ අනිෂ්ට විපාකය දූන් ඈ ලබන්නී ය.

ජයපාල තරුණයා හික්ම වීමට තමා දන්නා සියලු නුවණ යොදා නො හැකි වූ තැන, ඈ දූනමුත්තන් විමසා බැලුවා ය- එයින් ද පලක් නොලත් තැන, ජෝන්ගේ යහළුවන්ගෙන් පවා උදවු සෙවුවා ය.

"දන්න තරම් කිවුවා- මොන විදියකටවත් බෑ. මිනිහා හරවා ගන්න. විශ්න බායිටත්, ජෝන් නැතුව බැහැ. ජෝංට විශ්න බායි නැතුව බැරුවා වාගේ- ඔන්න ඔහොම ගිහින් විශ්න බායිට වෙන කෙනකු පැටලුණොත් එ දාට ජෝංට ඇය එපා වෙනවා මිස නැතුව එපා වෙන්නේ නැහැ"යි ජයපාල මැතිණියට පිළිතුරු දෙන ජෝන්ගේ යහළුවෙක් ද වතාවක් කීයේ ය. මේ අතින් යම් කිසි උපායක් සෙවිය යුතු නම්, සෙවිය යුතු ජෙරී හැරිස්ගෙන් ම හෙයින් ඕ තොමෝ මේ නීතිඥයාගෙන් ද පිළිවෙත් විමසුවා ය. නීති මාර්ගයෙන් නම් මීට පිළිවෙත් වශයෙන් කිසිවක් ම කරන්නට නැති බව ජෙරී හැරිස් විසින් කියන ලදි.

"නීති මාර්ගයෙන් මොකවත් කරන්න බැරි බව ඔබට විතරක් නො වෙයි. මටත් ජේනවා. මට ඕනෑ මේකට ඔබෙන් වෙන නුවණක් අහගන්න"යි ජයපාල මැතිණි නැවත කීවා ය.

"වෙන නුවණක් කියමින් හැරිස් නීතිඥයා නාසය පිසලමින් උස නෙත් යුවළට උඩින් ජයපාල මැතිණිය මුහුණ බලා, "වෙන කියන්න නුවණක් මට දූනෙන්නේ නැහැ"යි කීවේ ය.

"ඔබට දනෙන්නේ, දවසකට දුම් කුඩු හොංඩරයක් විතර නාසය දිගේ අදින එක විතරකැයි" ජයපාල මැතිණී තලකිරුණු සිතින් කීවාය.

"ඒක නොවේන්නං මිසිස් ජයපාල. ඔක්කෝ ම බඩු ලාබයි. දුම් කුඩු මිල විතරයි තව ම හෙල වුණේ වත් නැත්තෙ." කියමින් නීතිඥයා ද එය විහිළුවට ගෙන සිනාසුණු ගමන් යන්නට යෑම පමණකි.

ජයපාල මැතිණියට හැම අපවාදයකට ම වඩා ආත්මාපවාදය ඉවසිය නො හැක්කේ ය. ඩේසිට සහ එම දෙගුරුන් හටත් මේ අස්ථානයෙහි පැමිණි කරදර සියල්ලට ඇය ම වග කිය යුතු හෙයින්, මෙය තමාට අපායයේ කල්පයක් පැසෙන්නට සුදුසු අකුශල කර්මයක් බව පෙනෙන්නේ ය.

වැඩකට ඇති බසක් කිසි කලකත් සිතට නොගන්න ජෝන්හට නම්, මෙ ගැන තව-තවත් කීමෙන්, යැදීමෙන්, කිසි පලක් නො යෙදෙන බව දැන අනෙක් උපායයක් කල්පනා කරන්නී. ඈ කෙලින් ම විශ්න බායි වෙත යන්නට සැරසුණා ය. විශ්න බායි උගත් හෙයින් ද, උතුම් කුලවත් හෙයින් ද අතිශයින් ම කාරුණාවත් හෙයින් ද, මෙ සේ දැන දැනම නොතරම් කම් කිරීමට තරම් නොවිය යුතු ය. මීට සහනය ඇයගෙන් ම ලද යුතුය- මීට සහනය දීමට ඇය ම පොහොසත් විය යුතු ය. මෙ සේ කල්පනා කොට, මෙ තෙක් පිහිට වීම විනා පිහිට ඉල්ලීම නොදත් ජයපාල මැතිණී ස්වකීය පුත්‍රයාගේ නිදහස පතා මේ විදේශීය කාන්තාව යදින්නට ගියා ය.

විශ්න බායි විසින් ජයපාල මැතිණී ඉතා ම සාදරයෙන් පිළිගනු ලැබුවා ය- එ සේ පිළිගනු ලැබ, මෙ සේ අදිසියේ නො දන්වා ම පැමිණි කරුණ ගැන ද ප්‍රශ්න කරනු ලැබුවා ය. දෙ නෙතින් වැගිරෙන කඳුළු වලින් විනා, අන් කිසි විදියකින් සිය සිතැඟි දක්වා ගත නො හැකි වූ ජයපාල මැතිණිය කෙළේ කතා කර ගත නො හැකිව සුසුම් ලමින් බලා සිටීම පමණකි.



"මිසිස් ජයපාල, ඔබ ඉතා බලවත් ශෝකයකින් පෙළෙන්නා සේ පෙනේ. අහෝ! මෙය මට නම් දකින්නට පවා දුක් උපදවන කාරණයකි. මොක ද මිසිස් ජයපාල. මේ මොක ද? මේ මොක ද?" කියා විශ්න බායි පුරුදු සුවිනීත භාවයෙන් ම ප්‍රශ්න කළා ය.

"මගේ හැටි පේනවා නේද, විශ්න බායි? මට මහ අකුශල කර්මයක් පල දී ගෙනයි එන්නේ. ඇහුණා ද? දැන් දවස් කිහිපයකින් නිංද නැහැ. හරියට කෑම වත් නැහැ"යි කතා කර ගත හැකි වූ කෙණෙහි ඈ කීවා ය.

"අහන්නටත් කනගාටුයි" කියා විශ්න බායි ද අවස්ථානුකූලව ශෝකය ප්‍රකාශ කළා ය.

මෙහි දී ජයපාල මැතිණී, ස්වකීය පුත්‍රයාගේ නුගුණ කියන්නට පටන් ගෙන, ඔහු යුතු කම් පිරි හෙළමින්, කුල ගෞරවය නසමින්, සිය මැණියන් වූ තමාට ද නො තකරුව, නෙතක් බඳු සිය බිරින්දෑට ද දුක් දෙමින්, මතු බලාපොරොත්තු ගැන කිසි තැකීමක් නො කොට, වැඩ කටයුතු සියල්ල අතපසු කරමින්, මුළා වූ සිහිය ඇත්තකු සේ දැන් ටික දවසක පටන් කල් හරින සැටි විස්තර කළා ය.

විශ්න බායි මේ සියල්ලට ම සාවධානව සිට, පුරුදු සත්සුන් ගුණයෙන් මෙ සේ කීවා ය. "මිසිස් ජයපාල, ඔබ මේ ඉතා ම සන්වේගයෙන් හා ශෝකයෙන් පැමිණි ගමනක් වාගේ මට පේන්නේ. අපි මේ ගැන පසුව කතා කරමු. දැන් හවස තේ පානයට සුදුසු කාලය නිසා තේ ටිකක් බොමු"යි පවසා මෙ වේලේ මෙහෙකාරියක විසින් ගෙනෙන්නට යෙදුණු තේ බන්දේසිය ඇය ඉදිරියේ වී පෝව උඩ තබා, එයින් පැවරුවා ය. "මේ, ලංකාවේ තේ ඉංදියාවේ තේ වලට වඩා රසයෙන් ඉතා ම වැඩියි. ඔව තැගි ලැබිලා තියෙනවා. මෙයින් තේ පැකට් කිහිපයක් ම. මගේ කල්පනාව ඇත පෙර දිග යන කොට මෙයින් තේ ටිකක් අරගෙන යන්න"යි ඈ සිනාසෙමින් වැඩි දුරටත් කීවා ය.

මෙ සේ කතා මාර්ගය වෙනස් වූ කෙණෙහි, පිට පිරුණු ලැබූ බැඳලියක මෙන් ශාන්ත භාවයට පැමිණි ජයපාල මැතිණී සිනාසෙමින්, විශ්න බායිගේ ආගන්තුක සංග්‍රහය පිළිගනිමින් ප්‍රිය සම්භාෂණයෙහි යෙදෙන්නී, ඈත පෙරදිග යන ගමන ගැන විස්තර ප්‍රශ්න කළා ය.

"මා කොළඹින් පිටත් වෙන්නේ අනිද්දා හවස- මට නම් බොහොම කනගාටුයි. ලංකාව අත් හැර දමා යන්න" යයි විශ්න බායි කීවා ය.

"නමුත් විශ්න බායි අපේ දැනැඳුනුම් කම් පවසින්න- මට එක උදව්වක් කරන්න ඕනෑ. ඇහුණා ද? මා මේ උදක් ම ආවේත්, ඒ ගැ ම ඉල්ලීමක් කරන්නයි." ජයපාල මැතිණී සිය දුක් ගැනවිල්ලට සුදුසු ප්‍රස්තාවය ලත් කෙණෙහි යළිත් පටන් ගන්නා ය.

"දැප්පත් අසරණ මගෙන් ඔබ බලාපොරොත්තු වන උදව්ව මොකක් දයි?" විශ්න බායි සිනා මුසු මුහුණෙන් ම ප්‍රකට, ප්‍රති ප්‍රශ්න කරන ලදී.

"විශ්න බායි, නො මනාප වෙන්න එපා- මා මෙහෙ ම කියනවාට-මගේ පුතාට මොන ආවේසයක් වෙලා ද මට ම කියන්න දනෙන්නේ නැහැ. ඔහු දැන් විශ්න බායි කැටුව, ඈත පෙර දිග යන්න ලෑස්ති වෙලායි ඉන්නේ-ඇහුණා ද? ඉතින් ඔහුගේ මේ ගමන විශ්න බායි කොහොම හරි නවත් වන්න ඕනෑ. ඒක මට කරන ලොකු උදව්ව" කියා අනම්-මනම් වසයෙන් කිසිවකුත් නො දොඩා, ජයපාල මැතිණී, කෙටියෙන් එක එල්ලේ කීවා ය.

"ජයපාල මහතා මා කියන දෙයක් අහන්නේ නැහැ"යි විශ්න බායි මෙහි දී මුහුණ දුක්-මුසු කොට ගෙන, "මට ඔහු කොහෙත් ම නිස්මෙන්නේ නැහැ"යි යළිත් කීවා ය.

එ විට, ජයපාල මැතිණිය විසින් හට-හටත් අඳෝනා කියන්-නට පටන් ගන්නා ලදී. "විශ්න බායි, උතුම් කුලවත් කාන්තාවන්



නො තරම් කම් නො කරන බව දන්නා නිසායි. මා මේ ගමන උදක් පිහිට සොයා ගෙන ආවේ. කෙනකුගෙන් බැගෑ, [illegible] හඬින් කිසිවක් ම ඉල්ලන පුරුද්දක් මට නම් කවදා වත් ඇති වුණේ නැහැ. ජෝන්, විශ්න බායිට මිස වෙන කිසි කෙනකුට 'නවත්වන්නේ නැහැ. ඔහු යන්නේ, විශ්න බායිගේ අනුබලයක් ඇතිව ම වෙන්න ඕනෑ."

"මිසිස් ජයපාල" කියමින් මෙහි දී විශ්න බායි හඬා විච්ඡේදයෙන් ජයපාල මැතිණිය දෙස බලා, "මා ඔබ සිතන තරම් උසස් රාජ කුමාරිකාවක් නො වෙයි. එහෙ ම ගුණයට වා නො තරම් කම් ද කරන්නියක් නො වෙයි. ඔය කියන ගමන වෙනුවෙන් මගෙන් නම් ජයපාල මහතාට කිසි ම අනුබලයක් මේ වන තෙක් ලැබුණේ නැහැ. මට නිකරුණේ දොස් නොනැගුව මැනවැයි" කීවා ය.

"එ සේ නම් ඔහු යන්නේ, කාගේ අනුබලයක් පිට කවරෙකු සොයා ගෙන දයි?" ජයපාල මැතිණී ඇසුවා ය.

"ඒක ඔබේ පුතුයා වෙතින් කළයුතු ප්‍රශ්නයක් නොවේ ද?"

විශ්න බායිගේ මේ ප්‍රශ්නය ඉතා ම අහිංසක සේ පෙනුණ ද, ජයපාල මැතිණියගේ ප්‍රෞඪ හෘදයය ට නම් රන් කොටියක් මෙන් දරුණු විය. තමාට ලෙල්ලමක් වන මේ කාරණය මේ තරුණිය සෙල්ලමක් කොට ගෙන කතා කරන්නා සේ ජයපාල මැතිණියට නම් කඩ ම නො පෙනෙන්නේ ය. එසේ ද වූව, මේ තරුණිය පිනිවිද දකින්නට තරම් තියුණු වන්නකුට, අනුකම්පාව ගව් ගණනකිනුත් ඇයට නො ලැබ බවත්, එපමණ වෛරපාවිතිය වූ ආහ්ලාදයක් සිත යට තබා ගෙන, එම ආහ්ලාදයෙන් ම සන්තෘප්තිකව, පසු වන බවත්, නො අනුමානයෙන් පෙනේ

"ඒක පුතුයා වෙතින් පමණක් නො වෙයි- විශ්න බායි වෙතින් ද කළ යුතු ප්‍රශ්නයකැයි" කෙළමින් ජයපාල මැතිණී මෙහි දී හුන් තැනින් නැගිට, සමීපයට ගොස්, ඇය වැළඳ ගෙන, විශ්න බායි, ඇහුණා ද? කතාවෙන් නිදහස ලබන්නට වෑයම් කිරීම

කුලාංගනාවන්ගේ සිරිතක් නොවෙයි. ජෝන් යන මේ ගමන ගැන අපට වඩා හොඳට විශ්ත බායි දන්නා බව නො දන්නේ කවුද? ජෝන් වැන්නකුගෙන් විශ්ත බායිට ඇති පලයක් නැහැ. එකක් අපි තානටත් පෙනෙන ඇත්තක්- අපරාණ ජෝන්, මටත් මගේ යෙහෙළියටත් පමණක් වටිනා වස්තුවක්- ඔහුට කිසි හැකියක් නැතුව, මේ දා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ආසනයක් ලැබෙන්නටත් ඉඩ තියෙනවා. ඉතින් මේ ගමනින් වදින්නේ, මේ සියල්ලට ම මරු පහරයි. එ හෙයින් විශ්ත බායි අපට අනුකම්පා කරන්න! අනුකම්පා කරන්න!"යි යළි දෙපතුල දණින් වැටී ගෙන හඬමින් කීවා ය.

සමස්ත වාකස්කන්ධය ම සිය ළය ලා ගන්නට කරන ව්‍යායාම ඇත්තියක පරිද්දෙන් මෙහි දී විශ්ත බායි අතිශය සංවේග ප්‍රාප්ත වූ නැනැත්තී "මැතිනී මෙයින් පසර අවුරුදු පමණකට කලින් උපන් අපරාණ තරුණියක ඔබ දෙ පතුල මේ සේ ම, දණින් වැටී ජීවිත ප්‍රාණ සම වූ ස්වාමියා වෙන් නො කරන හැටියට උදව් ඉල්ලා සිටියා මතක දයි?" විචාළා ය.

"ඒ වග කොහොම ද විශ්ත බායි දන්නේ?" කියමින් මේ රදළ මහගේ මහත් සේ විකසිත කොට ගත් දෙනෙතින් හා සුදුමැලි වතින් යුතුව, එ කෙණෙහි නැගී සිටිමින් පිළිවිසියා ය.

"ඒ තරුණිය දෙ පතුල තමා, දන් මේ ඔබ වැඳ වැටුණේ." කියමින් විශ්ත බායි මන්ද හාසයෙන් යුතුව, සිය දෙ නෙත් බිම හෙළා, "එදා ඒ තරුණියගේ යාච්ඤාවට ඔබ කිසි අනුකම්පාවක් නො පෙන් වූ කල, අද ඔබගේ යාච්ඤාවට ඈ කෙසේ අනුකම්පා පෙන්වන්නී දයි?" ප්‍රශ්න කර සිටියා ය.

"එහෙනම්, ඒ ළඟ ද මේ?" කියමින් ජයපාල මැතිණී සර්ප වෙනුවක වෙතින් ඈත් වන්නා සේ භීතියෙන් ද සන්ත්‍රාසයෙන් ද හැකිලෙමින් පස්සෙන් පස්සට ගියා ය.

"ඒ මා තමා" යයි විශ්ත බායි පැකිළීමක් නැතිව යළිත් කීවා ය.



"හා! හා! හා! මට කීප වතාවක් ම හිතාම් හිතුණා- හිතාම් හිතුණා- මේ ඒ කැලෑ හඳ වත් ද කියා- නමුත්- මෙහෙ ම පුදුමයක්-"

"මැතිණී, ජයපාල මහතාට මා තවමත් මගේ ජීවිතයටත් වඩා ප්‍රේම කරන බව දන ගත මැනවි. ඔහු ද මට තවමත් ඒ සේ මයි. සුදු-මත් පැන් ආදි දුසිරිත් වලින් ඔහු වැළකුණේත්, මා නිසායි- මගේ කීමටයි. ඔහු නැත්තට ම නැසී වෙන්නට ගිය පාප මිත්‍ර සේවනයෙන් මිදුණේත් මා නිසායි. ඉතින් ඔබ ඒ දා අවලංගු කළ අපගේ කසාදය මම අද වලංගු කරන්නටයි යන්නේ" කියා ඈ වැඩි දුරටත් කීවා ය.

ජයපාල මැතිණිය කතා කර ගත නො හැකිව, පාෂාණීභූතව මෙන් සිටිනු දක, "මගේ පිළිගැනීම හරියට අපේ සීයාගේ මුං බත් කෑම වාගෙයි. මිසිස් ජයපාල, අපේ සීයා ඔබ හඳුනන්නේ නැහැ මා- උන්දෑ රදළ කෙනෙක් නොවෙයි- එහෙත් හොඳ වැදගත් මහත්තයෙක්- උන්දෑ මුං බත් කන්නේ, එක්කෝ හොඳට ම උණු-උණුවෙන්. නැත්නම් හොඳට ම නිවිලා. ඉතින් මටත් හිතුණා, ඒ වාගේ උණු-උණුවේ පළී ගන්නට බැරි නම් හොඳට ම නිල් වෙන්නට ඇරලා හරි පළිය නම් ගන්නට ම ඕනෑය කියා." ඈ මේ වර, අමු සිංහලෙන් ම කීවා ය.

මාලිනිය, මුල දීම ජයපාල මැතිණිය ළය පලා, හිඳු වන ලද රන් හොටිය මෙ සේ වචනයක්-වචනයක් පාසා සොලවමින් කට-කවත් යට බස්වනු ලබන කල්හි, නොහොත් ඇය හද මඩල තුවාලය නැවත-නැවත ඉුණු ගල්වමින් පාරනු ලබන කල්හි, ජීවාවෙන්-ජීවාවට පත් ඒ රදළ මහට තවත් මෙහි පසු වීම සිය නො හැකි වධයක් වූයෙන්, වෙඩි කෑ කේවායකු මෙන් අව පණ වූ ගමනින් වුව ද සිය තඟ-තඟා, හැකි පමණ ඉක්මනින් එ තැනින් අස්ව වහා ම එළියට පැන ගත්තා ය.

# 16

ලක් දිව ගත කළ ස්වල්ප කාලය තුළ විශ්න බායි ජාතික නාට්‍ය ශිල්පයෙන් ද අසදෘශ රූප විලාශයෙන් ද පමණක් නොව, ත්‍යාග ශීලයෙන් ද මහා ජන සමාජයෙහි ප්‍රකර්ෂ පර්යන්තයට පැමිණියා ය. ඇයගේ ධන පරිත්‍යාග විෂයක ප්‍රධානයෙන් සන්සිඳුණු දිළිඳු කම නැමැති පිපාසාව ඇති නොයෙක් සමිති සමාගම් කෘතඥ පූර්වක සාදරාතිශය ප්‍රේමයෙන් ඇය පිළිගෙන ගෞරව කරන්නට පටන් ගත්හ. සාමාන්‍යයෙන් ලක් දිව දිළිඳුව පොදුවෙන් සලකා, ගිය ගිය තැන, ඇය දන ධර්මයෙහි යෙදුණේ වී නමුදු, ඇයගේ විශේෂ පරිත්‍යාගයන් කරණ කොට, අසරණ සිංහල ජාති වර්ගයාගේ දිළිඳුබව අත්‍යර්ථයෙන් අපේක්ෂා කරන බව ද පෙනිණි. ලක් දිවින් නැව් නගින්නට දවසක් තිබිය දී නිකිණියාන නම් ගමක දිළිඳුව සලකා පිහිටු විය යුතු නොයෙක් පිප් සැල්, සත් සැල් ආදියක නඩත්තුව වෙනුවෙනුත්, එ ගම, නිවැසි නන්ද රාළ නම් වෑද්දියකු හා අන්දා නම් තරුණියකු වෙනුවෙනුත්, ඇය විසින් තැන් පත් කරන ලද ධන සම්භාරයන් ගැන ද රට පුරා පැළ විය. එ පමණක් ද නොව, ඇය විසින් ඩැනියෙල් තෝනා නම් වූ ගුරුවරියකට ද විශේෂයෙන් ධන පරිත්‍යාගයක් කළ බව ද ප්‍රසිද්ධ විය.

ඇය පිළිබඳ මෙ තෙක් දෙය හෙළි පෙහෙළි වන කළ, මහා ජනයා ඇයගේ භාරත ජන්මය ගැන සැක කළාහ- කිසියම් කාරණයක් නිසා සිය නම-ගම හෙළි නො කරන මේ ලොක ප්‍රසිද්ධ නාට්‍යාංගනාව නම් නිසැකයෙන් ම සිංහල කාන්තාවක විය යුතු බව අවසානයට නිශ්චය කළා හ. එසේ ද වුව, ඇයගේ නියම නම-ගම ද, ජයපාල හා කළ විවාහය ද, ඔහු සමග දන්



කරන ආශ්‍රය ද, පිළිබඳ ඇත්ත පුවත් පත් මගින් නම් නොපළ වන්නේ ය. ආසනාපේක්ෂාවෙන් ජෝන් ජයපාලට විරුද්ධව සටන් කරන සතුරු පිරිස නොයෙක් අපේද්වාපාරයන්ගේ මාර්ගයෙන් මේ ගැන ඒම්-ඒම් කරුණු හෙළි-පෙහෙළි කෙළේ වී නමුදු මහා ජනයා, විශ්න බායිට ඇති ගෞරවය නිසා, ඒ කිසිවක් ම නො පිළිගත් හ. මුදල් බලයෙන් අසමාන හෙයින් ජෝන් හට විරුද්ධව තරග කරන පක්ෂය මුල දී නම් මහත් ගැයකින් පසු වූහ. ලක්දිව ඉලෙක්ෂණ තරගයක දී මුදල් බලය නැති වීම ලොකු අවාසියකි. නූගත් ඡන්ද දායකයෝ ගුණ දොසෙස් සලකා පුද්ගලයා වෙනුවෙන් ජාතිය ඡන්දය පිරිනමනු වෙනුවට, රටට වන හොඳ-නොහොඳ ගැන කිසි තැකීමක් නො කොට, දෙ ගුරුන් උරුමයෙන් ලත් වස්තුවක් මෙන් සලකා වැඩි මිලයකට එය විකුණන්නට සොයති. ආසනාපේක්ෂකයකු විසින් තේ කෝප්පයකින් පමණවත් ඡන්දය පතා කිසිවකුට සංග්‍රහ කිරීම රාජාඥා පත්‍රයේ හැටියට නම් නීති විරෝධි කාරණයකි. එසේ ද වුව, මුදල් ඇති පමණින් යේ බැ නීති විරෝධී ක්‍රියා මාර්ගයෙන් සවා, බොහෝ දෙනා මන්ත්‍රණ සභා ප්‍රවේශනය සොයන බැවින්, පොහොරවි ප්‍රඥා නම් ඇති වත්, ඔවුන් හා අභියෝගයට පැමිණෙන අර්ථ ශක්තියෙන් හීනයන්හට නොයෙක් ගැහැට පැමිණෙන්නේ ය- බොහෝ විට පරාදය ම හිමි වන්නේ ය. අර්ථ බලයෙන් සමෘද්ධ ජෝන් ජයපාල හා කරන සටනින් පරාදය විනා අනෙක් වන ජයපත්ක් ගැන බලාපොරොත්තුවක් නැති විරුද්ධ පක්ෂයට, තරඟ කාරයා මෙ සේ නළඟනාව කැටුව, ඈත පෙර දිග බලා නැව් නගින බව සැළ වූ කෙණෙහි, ඇති වූ සතුට සුළු පටු නොවේ.

විශ්න බායි කැටුව, ගමනට සූදානම් වන ජෝන් කිසිවකුගේ කිසි දන මුනු කමක නො පිහිටා, ආත්ම බුද්ධියෙහිම පිහිටා, වැඩ අවැඩ නො තකා, ලොකාපවාදයට ද නො බිය, පියල්ල පිළියෙල කොට ගෙන, නැව් ගාස්තුව ද ගෙව්වේ ය. වෙසි, ශරීර සනීපය අතින් සුකුමාර අවස්ථාවක සිටින හෙයින්, සැනසිලි ඔසින් ඇය නළවා, විත්ත ධෛර්ය උපදවා, බලාපොරොත්තු ඇති කරවා, යන තැනක යා යුතු යයි සිතා, ජයපාල තරුණයා මෙහෙ දී තීරණයට මෘදු භාෂිතයෙන් කතා කළේ ය.

"වේසි, මට මේ ගමන නො ගිහින් නවතින්න හැකියත් ම නැහැ. මා මේ පිස්සුවෙන් යන ගමනක් නො වෙයි. යන්න ම යන ගමනක් ද නො වෙයි. ඔබ අත් හැර දමා, ජීවිතයෙන් විශ්න බායි පුදන්න යන ගමනක් ද නො වෙයි. එ හෙයින් සිත නරක් කොට නො ගෙන මා එන තෙක් සුව සේ සිටිය මැනවැයි" ඔහු කීයේ ය.

"මේ නම් මහත්මයා පිස්සුවෙන් යන ගමනක්මයි. මටවත්, මට මේ ලැබෙන්න යන දරුවාට වත්, පොඩියක් ළෙහි කරුණාව ඇති නම් මෙහෙ ම ගමනක් යන්නට සිත් දෙන්නේ නැහැයි" ඕ තොමෝ ගිනි මැද ලුණු පිපිරෙන්නා සේ කිපෙමින් කීවා ය.

"වේසි, උඹලා කියන්නා වාගේ ලෙහෙසියෙන් මට විශ්න බායි අත් හැර දමන්න බැහැ-"

"මොක ද බැරි?"

"මා වෙනුවෙන් ඇ ලොකු ආත්ම ත්‍යාගයක් කළ ගැහැනියක්-
"

"එහෙ ම ද?"

"ඔව්, මා ඇයට කෘතඥ විය යුතු යි."

"අනේ! මහත්මයා වාගේ පිට ගෑනුන්ගේ දුක් ගැනවිලි දකින මිනිහකු තවත් කොහෙන් හොයන්න දයි?" පවසමින් මෙහි දී වේසි වියරු සිනාවකින් ඔහු මුහුණ බලා, "ඉතින් මොකක් ද- අපටත් දැන ගන්න එක්ක කියන්න කෝ, විශ්න බායි කළ ආත්ම ත්‍යාගය"යි නැවත කීවාය.

සිය සිත පවතින රහස හෙළි කර ගත නො හැකිව, ජයපාල තරුණ තෙමේ බැහැරින් පිහිට සොයන්නකු සේ සුසුම් ලමින් අවට බලන්නේ, "මා නිසා ඇ අතර මං වූ ගැහැනියකැයි" තල්ල මරමින් කීවා ය.



"මහත්මයා නිසා අතරමං වූ ගැහැනියක්- විශ්න බායි?" කියා ප්‍රශ්නාංකය පිහිටුවා ගත් දෙනෙතින් ඒ සැමියා මුහුණ බලා ගත් ගමන් සිට, "මහත්මයා මේ කරන කතාව මට මහ අලි පුදුමයක්- මට පේන්නේ මහත්මයා, විශ්න බායි නිසා අතර මං වෙන්නා වාගෙයි- විශ්න බායි, මහත්මයා නිසා අතර මං වුණේ, කොහොම දයි?" නැවත ඇසුවා ය.

"වේසි" කියා මෙහි දී තරුණ ජයපාල මිහි තතට කතා කරන්නා සේ බිම බලා ගෙන හෙමින් කතා කරමින් වේසි ඇ විශ්න බායි නො වෙයි. ඇ-ඇ- තමා මා පළමුවෙන් විවාහ කරගත් ගැහැනි-මාලිනී"යි කීයේ ය.

මේ ශබ්ද සමුදායය වේසි කුමරියගේ ශ්‍රවණාපගත වූ කෙණෙහි ඇති වූ සන්ත්‍රාසය කොතරම් ද යත්, එය දකින ජෝන්හට ස්වකීය ජීවිතයෙන් වුවත් පුදා යථොක්ත වචන නැවත අස්සර ගත හැකි වී නම් යෙහෙකැයි සිතුණේ ය. වචනය නම් කතා නො කරන තාක් කරනයාගේ පාලනයෙහි පවතින්නකි. කතා කළ කෙණෙහි පාලනයෙන් තුරන් වන හෙයින්, නැවත කිසි කලෙකත් කිසිවකු විසින් ආපසු කැඳවීමෙහි අපොහොසත් වන හෙයින්, නො කීවා කරනු නො ලබන හෙයින්, එහි විපාකය ඇතැම් විට අතිශයින් ම අහිතවත් වන්නේ ය.

"අයියෝ! අයියෝ! මහත්මයා, මේ මාව දම්මේ මොන තරකාදියක දයි?" කියමින් ඇ සුසුම් ලමින් වෙව්ලන්නට පටන් ගත්තා ය. එ දා මඩ වගුරේ හෙරු දා පටන් නිතොරව ම වාගේ වේසි බරපතළ හිංසාවක දී ඔහුට මේ අපවාදය නගන්නේ වී නමුදු කවදා වත් ම, එය නිසා මේ තරම් සන්වේගයක් හා දුඃඛිත විලාසයක් නම් ඇ නො පළ කළා ය. මෙය අද ඇය තවින් පිට වුණේ, කෙ බඳු වේදනාවයක් අනුගමනය කොට ගෙන ද යත්, ඉදින් ඇයගේ යාවඥාව කොතරම් නිරණුමාන වුවත්, බැගෑපත් වුවත්, ඇවිටිලිමක් වුවත්, ඒ සියල්ල ගහට ඉති කැපුවා සේ මිරිලුණු ලුණුබැද සියා සේ, නිරර්ථක වන බවත්, හොඳ හැටි ප්‍රත්‍යක්ෂ කොට ගත් අත්‍යවබෝධයකිනි.

මේ අඹු-සැමියන් දෙදෙන තවත් ඔවුනොවුන් හා කතා කිරීමෙහි අපොහොසත්ව ඔවුනොවුන්හට ම පෞද්ගලික වූ නොහොත් විශෙෂ වූ විචාරණයන්ගෙන් ආවෘත්තව, යන්ත්‍ර රූපයන් පරිද්දෙන් පසු වන කල්හි, විශ්න බායි හා සංවාදයෙන් පැරද, හිස ගිනි ගත් තැනැත්තියකගේ විකාරයෙන් නොහොත් ඡත්‍ර භංගත්වයට පත් රාජ්‍යයකගේ ස්වරූපයෙන් නොහොත් චෛතසිකාන්ත-ර්වේගයනට ජාත භූමි වූ ස්ථානය යම් තැනෙක්හි ද එ තැනට කෙන්ද්‍ර ගත වූ දුඃඛාත්මක මනොවෘත්තීන්ගේ තාපයෙන් දැවි-දැවී කරන ගමන් ඇත්ති, වෛර චිත්තයට උපහාරය පිණිස ගත්, මී දෙනක හා පෙන් කෙළින බැළලියක මෙන්, විශ්න බායි තමා වෙහෙසූ සැටි විස්තර කරනු සැටි වූ සිතින් ජයපාල මැතිණි ද, එ තැනට පැමිණියා ය. ඇයගේ පැමිණීම අසරණ ඩේසිට නම් දිය පත්තම් වන්නකුට ළං කළ ඔරුවක් පරිද්දෙන් තුෂ්ටි දායක විය.

"අම්මා! අම්මා!" කියා ගෙන ඇ ජයපාල මැතිණිය ඉදිරියට දිවමින්. "දන්නවා ද?" දන්නවා ද? විශ්න බායි කවුද කියා දන්නවා ද? ඇ තමා, ඒ කැලෑ හඳ-අම්මා හිතුවා වාගේ. එදා ඒ හඳ නැත්තට ම නැති වෙන්න බැහැලා ගිහින් නැහැ. ඔය ආයෙත් පාය ලා තියෙන්නේ- තිබුණාටත් වඩා ලොකු කලඑළියකින්"යි කීවා ය.

"දූන් ද, මේ මෝඩයා ඔබට මේ රහස කීවේ දුව?" යනුවෙන් ජයපාල මැතිණි ඩේසි විතාරමින් පුත්‍රයා දෙස රවා බැලුවා ය.

"මෝඩයා කියන එකත් දූන් මට නම්බුවක්-අම්මාගේ මායමට හසු වූ මා ඊටත් අන්ත නිවටයෙකැයි" ජයපාල ද මෙහිදී තොල මතුලේ ය.

"ඇත්තෙන් ම ඔව්, ජෝන්- ඔබ මහ ම අලි මෝඩයෙක්- ඔබට පෙනෙන්නේ නැද්ද, මේ වදක බාරි මරහනකගේ වෙස් මවා ගෙන ආවේ, ඔබත්, මාත්, මේ අහක හිටිය ළමයාත් පම-ණක් නොවෙයි- අපේ මුළු සංහතිය ම කා බාසිතියා කර දමන්න



චිත්තිය? අනේ! මේ කිසිවක් නො පෙනෙන්නට ඔබේ ඇස් දෙක පොට්ට වුණ හැටි?" කියමින් කම්මුල අත තබා ගත් ගමන් ජයපාල මැතිණි කම්පා වුණා ය.

"බුරන තරමක් මට බුරන්න- ඒ කැලෑ හඳට බිරීමෙන් කිසි වැඩක් වෙන්නේ නැතැයි" පවසමින් තවත් නතර විය නො හැකි බැවින්, ජෝන් ජයපාල එ තැනින් යන්නට ගියේ ය.

ඉක්බිති ජයපාල මැතිණි තමා ගිය ගමන ගැන යෙහෙළියට විස්තර කරන්නී, විශ්න බායිගේ කරුණා විරහිත ක්‍රූර ස්වභාවය ගැන කීවා ය.

"ළමයා කොහොඹ ඇටේ තිත්ත අරින්න බැරුවා වාගේ, ඇහුණා ද? කොච්චර කොහොම වුවත්, ඇයගේ අර හීන ජන්මය පෙනෙනවා පෙනෙනවාමයි. කැලෑ හඳ වග නො වෙයි- ඇ නිකම් පහල පවුලකින් පැන නැගුණු ගෑනියක වග දූන ගෙන වත් හිටියා නම්, මා යනවා කියා-එහෙ යන්න දෙනවා ද, මගේ මුරුගයකුට?" ජයපාල මැතිණි අවසානයට කීවා ය.

"මා හිතන හැටියට අම්මේ අපට මේ සාපය කැව්වේ, අපේ බොරු උඩඟු කම නිසායි" කියමින් මෙහි දි ඩේසි නොමනාපයෙන් සිය නැන්දණියන් මුහුණ බලා, කැලෑ හඳ වග දූන ගන්න කලින් අම්මාට විශ්න බායි වාගේ උසස් කුල කාන්තාවක් තවත් හිටියේ නැහැ. එහෙත් දූන් ඇ පහල පවුලක උපන් බව දූන ගත් නිසා අම්මාට ඉතා ම හිරිකිතයි. හිතට ගන්න. විශ්න බායිගේ වැදගත් ජන්මයත්, උසස් ගුණයත් නිසා තමයි, අම්මා ඔ පමණකින් බේරිලා ආවෙ. මා වාගේ ගැහැනියකගෙන් නම් අම්මාට ලැබෙන සංග්‍රහය ඔහොම නො වෙයි. මා මගේ සැමියාට ප්‍රෙම කරන්නා වාගේ තමා. ඇය, ඇයගේ සැමියාට ප්‍රෙම කරන්නේ- නීතියෙන් ලිහා දම්මාට විවාහ බන්ධනය හිතෙන් ලිහා දමෙන්නේ නැහැ මගේ මහත්මයා ඒ කැලෑ හඳට ආවාහ වුණේ, මට ආවාහ වුණා වාගේ, ඒ වෙලාවට ඇති වූ බොරු පිස්සුවකින් නො වෙයි. මගේ මහත්මයාගේ නියම ප්‍රෙමය අයිති ඒ කැලෑ හඳට තමා.

මහත්මයාගෙන් විශ්න බායි වෙන් කරනවා මිස, විශ්න බායිගෙන් මහත්මයා වෙන් කරන එක ඉතින් ඒ තරම් ලේසි වෙන්නේ නැහැ. ඇයටත් වුණේ, මට වාගේ ම අපරාධයක්-කොහොමත් ඇටේ ඇත්තේ තිත්ත පමණ යි. නමුත් ජයපාල ඇටේ පුරා ම ඇත්තේ නපුරු විස-"

"ඊටත් වැඩි නපුරු විසක් තමා අත්තන ඇටේ පුරාම ඇත්තේ" කියමින් ඇයගේ කතාව නුරුස්සන ජයපාල මැතිණී ද, එ තැනින් යන්නට ගියා ය.

සවස් වන්නට-වන්නට මේ ගැඹුරු ප්‍රශ්නය මැදහත් සිතින් විසඳන වේසි සිත්හි විශ්න බායි වෙනුවෙන් හට ගත්තේ, සපත්නිරෝෂයට ඉඳුරා ම විරුද්ධ වූ චේතනාවයකි. නීතියෙන් ජෝන් තමා සතු වස්තුවක් වුව ද මුල් උරුමයෙන් නම් විශ්න බායි සතු වස්තුව බව දත්-දත් ඇයට සක් සුදක් සේ පෙනෙන්නේ ය. සිය උරුමය වෙනුවෙන් ඉදින් විශ්න බායි යම් සටනක් කරන්නී නම්, එය යුක්ති විරෝධි කාරණයක් සේ නො පෙනේ. නොදනුවත්ව නමුත් මෙ වැනි ආරාවුල් ඇති වස්තුවක පරිභෝගය අපේක්ෂා කළ හෙයින් තමාට ද මේ කරදරය සාධාරණ වධයකි. නො දත් කම දොෂ විමොචනයට කාරණය නො වන බැවින්, ඒ ගැන පශ්චාත්තාපයෙන් සුසුම් ලමින් පසු වනුවට වඩා දත් මේ සපත්නතාව පිළිබඳ තත්වාවබෝධයෙන් කටයුතු කිරීම නුවණට හුරු බව ඇ සිතුවා ය. ස්වාමියා විශ්න බායි කෙරෙන් වෙන් කිරීම දියෙන් දිය වෙන් කිරීම වැනි අශක්‍ය ව්‍යායාමයක් සේ පෙනේ. එ හෙයින් සපත්නියන් විසින් ශිෂ්ටාචාරයටත්, ලොක නීතියටත් අනුකූලව ගෞරවය රැක ගත යුතු නම්, තථ්‍ය ප්‍රෙම විෂයක ආත්ම ත්‍යාගයෙන් ම ක්‍රියා කටයුතු යයි ද නිශ්චය කර ගත්තා ය.

එ සේ නිශ්චය කර ගත් කෙණෙහි ඕ කොහෙවත් කිසිවකුට ද නො දන්වා, හැඳ-පැළඳ ගෙන, මගට බැස, රික්ෂෝ කරත්තයකින් අභිප්‍රෙත ස්ථානය බලා, ගමන් කළා ය. පිස්සුවෙන් නටන්නකු නිත්මවා ගත යුතු කල්හි, එ සේ කරන සිහි ඇතියකට ද පිස්සා



අනුව පිස්සුවෙන් මෙන් නටන්නට සැල සේ. එ හෙයින් අපරණ වේසිට ද මෙ සේ විශ්න බායි වෙත යන මේ ගමන පිස්සුවක් මෙන් නො දනුණ පුදුමයක් නො වේ.

වාත වෙගයෙන් ඇත කඳුකරය බලා ගමන් කරන වලාකුළයන්හි අන්තර්ගත වූ රශ්මි කදම්බය කරණකොට අභියයින් ම නීන වූ සන්ධ්‍යා ප්‍රකාශය ඇති මේ වේලේ, අමුතු සිසිල් ගුණයක් පැවති නමුදු, එයින් කුඩා වූද ද කල්‍යාණක වන්නියකින් මෙන් දවෙන වේසිගේ හද මඬලෙහි සිසිල කරන නම් ඇති නො වී ය. නුඹ ගැඹ හැර යන, නුඹ මීණ කෙරෙන් වෙන් වූ නුඹ මීනී කැට සමූහයකට බඳු, නන් වණින් පිරීතුරු සියොතුන් ගේ පිළිවෙළ එමට වුව ද, එයින් ඇය සැනේ පිණවීමක් නම් නො වීය. උදරාර්ථයම අර්ථය කොට ගත් නිරාජීවනයකට මෙන් ම තදර්ථයක් මනුෂ්‍යයකට ද විශ්‍රාමය පිණිස එක සේ සිත් පොළඹන්නා වූ මේ ප්‍රසාද ජනක කාල පරිච්ඡේදයෙහි, ගොයෙක් යාන බලයෙන් ද, වාහන බලයෙන් ද, පාද බලයෙන් ද, සිය විටන් බලා කරන ගමන් ඇති දහස් ගණන් ජනයෝ ඇයට හමු වෙත් නමුදු, මිනිනු නිසිවකුත් මේ පිළිමයක් මෙන් ගමන් කරන සුවිනීත කාන්තාවන්ගෙන් අභිප්‍රාය වත් බැල්මක් වීතර වත් නො ලබති. දුක සේ ලත් මනුෂ්‍ය ජීවිතය දුක සේ රකිනුවාට වඩා සැපසේ නසනු යෙහෙකැයි, ඈ දත් සිතන්නී ය. ඊට ප්‍රස්තාවය සොයන අදහසින් කරන ගමන් ඇත්තී, සිය හෙතින් මැයන පොහොත් ගෙයට සිතින් ප්‍රවෙශනය සොයන්නී ය. ඉටි රුවක් පරිද්දෙන් නො හොත් ව්‍යක්තිගත ආලම්බන ශක්තියෙන් පිරිනුණු පඤ්චස්කන්ධයක් පරිද්දෙන් කෙපේ රියනින් කරන ගමන් ඇති වත් දකින්නනට නම් දත් ඇය පෙනෙන්නේ, මිනී පෙට්ටිය පමණක් මෙ ලොවින් ලැබිව උස්කුළ කොට ගත් නැනැත්තියකගේ විලාසයෙනි.

මෙ සේ විශ්න බායිගේ වාස ස්ථානය කරා එළඹෙන වේසිට එම වාස ස්ථානය පෙනෙන්නට පටන් ගත් තැන් සිට, ඇති වූ අමුතු බෛයර් නිසා පත වූ විළි බිය ඇත්තේ විය. ගමනට පැක්

කරන ලද කොයෙන් බඩු මිටිවලින් ගැටසුණු කාලිනියගේ මේ තාවකාලික වාසස්ථානයට ගොඩ වූ කෙණෙහි, කිසි කරදර ආදියක් නැතිව ම ඈ, මෙහෙකරුවකු විසින් කාමරයක සිටි එම සාමි දූ වෙත කැඳවා ගෙන යනු ලැබුවා ය. මේ සේ මේ සපත්නීන් අන්‍යොන්‍යයන්හට හමු වීම උභය පක්ෂයට ම සංවේග ඇති කළ කාරණයකි. විශ්න බායිට නම් මේ අන්තිම මොහොතේ දී වේසි දකින බවත් සිහිනයකින් වත් පහළ නො වීය. එ සේ ද වුව, ඈ ප්‍රස්තාවයට සුදුසු ලෙස නැන් පත් කොට ගත් සිත් සතන් ඇතිව, පෙර මෙන් කොට ඇය සාදරයෙන් පිළි ගත්තා ය. ඒ ව්‍යාජයෙන් කළ බොරු පිළිගැනීමක් ද නොවේ. වේසි පැමිණි විලාසය දක් මෙන් උපන් ලෙහි කරුණාවෙන් කළ සැබෑ පිළිගැනීමකි.

“වේසි, මගේ රත්නේ- මේ මොක ද? මේ මොක ද?” කියා කතා කර ගත හැකි වූ කෙණෙහි ඈ උනන්දුවෙන් පිළිවිසියා ය.

විශ්න බායිට පමණ ඉක්මනින් අසරණ වේසිට කතා කර ගත නො හැකි විය. ඕ තොමෝ ඉටි රූපයක් පරිද්දෙන් බලා ගත් වන ම සිටි කැනැත්තී විශ්න බායි විසින් සුව පහස් දෙන පර්යංකයක වඩා හිඳු වනු ලැබුවා ය.

“විශ්න බායි, ඔබ කවුද කියා, මට දැන ගන්න ලැබුණේ දැනුයි- මේ දැනුයි. ඔබට කළ හානිය ගැන මට ඉතා ම කනගාටුයි. ඊට පාඩුව ගහන්නේ, මේ ගැන කිසිවක් නො දත් අසරණ මට යි- මට යි” කියා ඈ ඉකි ගසන්නට පටන් ගත්තා ය.

විශ්න බායි කිසි කතාවක් නැතිව, භීතියෙන් බලා සිටින සැටි දුටු වේසි යළිත් මෙ සේ කියන්නට වූවා ය.

“මෙයින් නම් මගේ ජීවිතය රැකෙන්නේ නැහැ. මගේ පමණක් නො වෙයි- හතර අවුරුදු හයමාසයකට පසු මට ලැබෙන්න යන දරුවාගේ ද ජීවිතය රැකෙන්නේ නැහැ. මේ තැව නින්දාවෙන් පසු මට ජීවිතය ඉතින් උවමනා නැහැ. මට තවත් ජන සමාජයට



මුහුණ පොඩන්නට ඉඩක් ලැබෙන්නේ නැහැ. ස්වාමියකු විසින් මෙ සේ අඹුවක අත් හරිනු ලැබීම දික්කසාදයටත් වඩා බරපතළ නින්දාවක්- ඉතින් විශ්න බායි ඔබ සතුටු නම්, මෙ සේ මා මරා දමා මාගේ ස්වාමියා පැහැර ගෙන යන්න- අඹුවක හා දරුවකු මරා දමා, සැමියකු සොරකම් කර ගෙන ගිය පෙරේත කියා ඔබට මහා ලොකාපවාදයක් නැඟේවි. එ පමණ නො වෙයි. විශ්න බායි ඔබේ මේ කෲර ක්‍රියාවෙන් ඔබේ ප්‍රේමයට නිමිත්ත වූ වස්තුවට ද එ නම් අපට මේ සියලු දුක් දුන් ස්වාමියාට ද වෙන්නේ, ඉතා ම බරපතළ හානියක්- ඔහුට මේ ඉලෙක්ෂං එකේ දී කිසි ම සැකයක් නැහැ. අභිනව මන්ත්‍රණ සභාවේ ආසනයක් ලැබෙනවා. ඔහු හොඳින් සිටියොත් ලංකා ජන සමාජයේ මුදුන් මල වීමට සුදුසු පුද්ගලයකු වෙනවා- ඔව්, ඔහු දැන් මෙහෙම පිස්සුවෙන් මෝඩ කම් කරතත්, තව ටික කලකින් කිසි ම සැකයක් නැහැ. බොහොම ලොකු උතුමෙක් වේවි. ඉතින් මේ ඔබ කරන්නට හදන වැඩෙන් විශ්න බායි, ඔහුගේ මුළු ජීවිතයට ද වෙන්නේ නස්පැත්තියකි”යි කීවා ය.

“වේසි, ඔබ කියන කතාව හරි”යි කියමින් විශ්න බායි මෙහි දී දහ දිය නැගෙන සිය මුහුණට මලානික පෙනුම වැද්ද නො දී පල වත්නා සේ විපිළිසරකින් පටන් පලන්නී, “නමුත්- ඉතා ම දරුණුයි- ඉතා ම අගති සහගතයි” ද කීවා ය.

“නෑ, නෑ, විශ්න බායි මා මේ අගතියෙන් කරන කතාවක් නො වෙයි. මා මේ ආවේ මගේ ස්වාමියා වෙනුවෙන් කතා කරන්න යි. මාගේ ආත්ම ලාභයක් සලකා කතා කරන්න නො වෙයි. ඔබ කැටුව යන ගමනින් ඔහුට යහපතක් වෙනවා නම් මා ලැස්ති යි. ඒ වෙනුවෙන් මා සතු සියල්ල පරිත්‍යාග කරන්න- ඉතින් මට පෙන්නා දෙන්න, එතකොට වන යහපත- එතකොට සැමියා රැකීම ඔබට බාර කොට, මා එහා ම අත් වෙන්නම්”යි වේසි යළිත් කීවා ය.

“වේසි ඔබ කතා කරන්නේ, ආත්ම ත්‍යාගයෙන්ම යි. ඔබේ ත්‍යාග චිත්තය පෙනෙන මට මගේ මිතුරු කම් නිසා දන්

ලැජ්ජායි" කියා විශ්න බායි හුන් තැනින් නැගිට, කවුළුව ළඟට ගොස්, පිටත බලා ගත් ගමන් සිටියා ය. ඩේසිගේ වචන විශ්න බායිගේ සිත් නමැති දිවි කුඩුවට වැදුණු ගල් අහුරක් මෙන් විය. එයින් කැළඹුණු සිතිවිලි සමූහය දිමියන් පරිද්දෙන් ඉවත්-බවත් නැතිව දිවන්නේ ය. දැන් ඇයට තමාගේ සිතිවිලි හා ඩේසිගේ සිතිවිලි හා වෙනස රැය හා දවල් හා වෙනස මෙන් දක්නා ලැබේ. සතර අවුරුදු සමයක් මුළුල්ලේ තමා මෙ තෙක් වෙහෙසුණේ, කෙ බඳු මනෝරථයක් උදෙසා ද? ඒ මනෝරථය ආත්ම ලාභය ම භූමිය කොට පවතින බව දැන් ඇයට පෙනෙන්නේ ය. හුදෙක් ස්වකීය මනෝරථය මුදුන් පමුණුවන ආසාවෙන් සෙසු සියලු ගුණ ධර්මයන් ඉක්මවා, පරාර්ථය ගැන මඳ තැකීම කුදු නො කොට, සුවිනීත ඩේසි හා එම අහිංසක දරුවා ද විනාශ මුඛයට පමුණුවා ජයපාල තරුණයාගේ ඓශ්වර්යවී ඵල දායක වූ ලොක ව්‍යවහාර ප්‍රවෘත්තිය නමැති වෘක්ෂ මූලයෙහි පොරව තැබීම බලවත් අපරාධයක් වශයෙනුත්, ආත්මාර්ථකාමී තිරශ්චීන ධර්මයක් වශයෙනුත්, ඇයට මෙහි දී පෙනෙන්නට පටන් ගත්තේ ය. සැමියා හිතැති ඩේසි ඔහු වෙනුවෙන් නැතත් පාඩු විඳිනු කැමැතිව, අවංක සිතින් මෙ සේ පැමිණි සැටි දැක-දකත්, ඊට ශත ගුණයෙන් අධික ප්‍රේමය නිසා මෙ තෙක් වෙහෙසුණු තමා අවශ්‍ය ප්‍රස්තාවයෙහි දී ,ඉදින් ආත්මාර්ථය නො දිනන්නේ නම්, ප්‍රේමය ආත්මාර්ථයට වඩා බලවත් බව කෙසේ පෙනෙන්නේ වේ ද යන ආදිය සලකා අනතුරුව ඩේසි මුහුණ බැලුවා ය.

"ඩේසි, ඔබේ ස්වාමියාට මා බොහොම ආදරෙයි- ඒ නිසා ඔබටත් ආදරෙයි- ඔබට ලැබෙන්නට යන දරුවාටත් ආදරෙයි ඔහු මේ ගමන යන්න හදන්නේ, මගේ නියමයකින් නො වෙයි. ඔහු මගේ නියමයකින් නවතින්නේ නැහැ. ඒක මට සහතික යි. ඔහු ඒ තරම් මට දැන් බැඳිලා- එහෙත් ඒ බැඳීමෙන් ඔහුට වෙන්නේ, අනර්ථයක් බව දැන් මට පේනවා. මා ආත්මාර්ථකාමී වන එක අයුතුයි" කියමින් ඈ නෙත් මුල නැගුණු කඳුළු ගුලි පෙනෙනුවාට නො කැමැත්තෙන් මුහුණ අන් අත හරවා ගෙන, දිග සුසුමක් හෙළා "ඩේසි ඔහුට ඉතින් මා පසු-පස්සේ එන්නට



දෙන්නේ නැහැ. ඔබ ඉතින් නිදහසින් සැප සේ වෙසෙමින් ඔහු රැක ගන්න" යයි යළිත් කීවා ය.

කවදත් මධුර ප්‍රගීතවත් ඇයගේ වචනය මෙ වේලේ නම් ඩේසිගේ සවනට වීණාවකින් නැගෙන තත් සරයක් පරිද්දෙන්, වෙසෙසින් ම සිත්කලු විය- අතිශයින් ම මිහිරි විය. සවන් දොහොතින් ගෙන පානය කළ මේ අමෘතය කරණකොට සිසිල්ව ගිය හෘදය මණ්ඩලය ඇති තැනැත්තී, එ තැනින් නැගිට්ටා ය- නැගිට, විශ්න බායි වෙත හෙමින් ගමන් කළා ය- ගමන් කොට, යුගතින් ගෙළ වැළඳ ගෙන, මුහුණ සිඹිබා ය.

"විශ්නබායි, ඔබට බොහො ම ස්තුතියි- බොහො ම ස්තුති යි- බොහො ම ස්තුති යි" කියමින් ඈ මේ එක ම වාක්‍යය කිහිප වරක් මතුරමින් නැවත-නැවතත් මුහුණ සිඹිබා ය.

විශ්න බායි විසින් පිළිතුරු වශයෙන් තවත් කිසිවක් ම නොකියන ලදි- ප්‍රත්‍යාචාර වශයෙන් ද කිසිවක් ම නො කරන ලදි. ඩේසිගේ තොත්තුවලින් වෙහෙසට පත් කෙණෙහි, නොහොත් එයින් අවසර ලත් කෙණෙහි, ඇය කෙළේ ආසනයක හිඳ ගත් ගමන් කොට්ටයක හිස රඳවා ගෙන, ඉකි ගසමින් වැලපෙන එක පමණකි. කොතෙක් වෙහෙස ලදුවත් ජයපාල තමා සතු විය යුතු වස්තුවක් සේ ඇයට නොපෙනෙන හෙයින්, දෛවය ද ඉඳුරා ම විරුද්ධ වෙමින් තමා එයින් වළකන හෙයින්, දැන් ඉතින් ඇව පිළිවෙළ සම්පූර්ණයෙන් වෙනස් කළ යුතු සේ ඇයට පෙනෙන්නේ ය. තමා නැති තැන, ජෝන් ජයපාලට නම් ජීවිතය නී රස වුවත් තිත්ත නො වන්නේ ය. එහෙත් තමාට- සිදු වස් හමාරක් ඔහු ලබන බලාපොරොත්තුවෙන් නො යෙක් වෙහෙස ගත් තමාට- ජෝන් ජයපාල නැති තැන ජීවිත ප්‍රවෘත්තියක් ඇති විය හැකි ද?

* * *

පතංගී රාවයෙන් ද, කීර්ති රාවයෙන් ද, ලක් දිව මුළුල්ල සවන් පිණවමින් නෙත්-සිත් පොළඹවමින් නාට්‍ය මණ්ඩපය මෙන් ම

ජන සමාජය ද ශෝකයෙන් කළ විශ්නා බායි නැව් නැගිත දින, සියලු ම පුවත් පත්වල ඇයට ස්තුති මුඛයෙන් ද, ආශිර්වාද මුඛයෙන් ද, ශුභාසිංශසන මුඛයෙන් ද, පළ වූ නොයෙක් ලිපි විය. මෙ සේ ලෙසහන සිය මුදා නැගුණි පුවත් පත් මගින් වියෝ දුක පළ කරන කල්හි, නිසි දියණියන්ද කෙනෙකුට බඳු සමන් ගිර ද, එහි නිවැසියන් මගින් නියම මිනීමළ ගෙදරක මෙන් අනෙක් වියෝවක වග පළ කළා ය.

එ දින, පෙර යම් රැය පොළොම් කොටින් පිටත් වන්නට සූදානම්ව, පෙර වරුවෙහි පටන් දූස් පාස්සුවක් නැතිව, පසු වන ජෝන් ජයපාලට හැර, සෙසු සියල්ලන්හට ම ඇති වූයේ, දොම්නසින් පෙළුණු සිත් ඇය-ශෝකයෙන් මැල වුණු මුහුණු ය. එහි පෙහෙකරු දනන් පමණක් නොව, ගව-බලු-බළල් ආදි තිරිසනුන් ද, දවස් කිහිපයක පටන් නො ලත් අහර ඇසියන් සේ වැහැරුණු කුසයෙන් ද, ගලානින් ද නෙතින් ද, තැන තැන වැතිරෙන ගමනින් ද, පසු වූහ. සුර පුර වන් සමන් ගිර, දන් ඔවුනට අසුර පුරය මෙනි. වෙළෙඳ පරිහානිය නිසා මුළු ලක පැතිර පැවති දුකඋරු සියල්ල, දෙ වන පදන් වන් විශ්නා බායිගේ සම්ප්‍රාප්තිය කාරණ කොට ඇත ලෙමින් සමන් ගිරට ම එක් තැන් වූ පරිද්දෙන්, එ දා පටන් දවසින්-දවස ම වැඩි-වැඩියක් නිසරු බවට පැමිණි එකී නිවෙස සීමාන්තයට ගියේ මෙ දින ලොකාන්තරියක මෙන් භය-භාර විය.

සමන් ගිරට මිණි පහන් වූ වැලෙන් වන් ජයපාල මැතිණියත්, වෙසිත්, දෙ දෙනා ම දන් නම් කටත් දවෙන්නට දෙයක් නැතිව මුළු මනින් ම දා ගිය හණ්මාටශෙෂයක් පරිද්දෙන් වැස, කට ගිස සුදු වන තෙක් නැතත් කල් කළ සේවයෙන් මහලු බවට පැමිණි ජුසේ ද, නොයෙක් වාත කොපයෙන් මෙ තෙක් කල් මුදුන් කළ මහා මේසය, මෙ දින අශනිපාතයෙන් ඇද හැලෙන බව දන්නා හෙයින් සිතු බිය ගෙන, තැති ගැන්මෙන් පිරියේ ය.

සමන් ගිර මෙ සේ වූ වද, මෙදින අටට ලෝකය සූර්ය ප්‍රකාශයෙන් බබළන්නේ, සිසිල් මඳ පවනින් සැලෙන්නේ, තැන-තැන පිපුණු



නුයර මල් වැනි සුදු වලාකුළුවලින් ගැවසෙන්නේ, නොයෙක් සත්කුලු හඬින් හඬ නැගෙන්නේ, සකල සත්ත්වයන්හට ශාන්ති දානයෙහි යොහොසත් දිව්‍ය රාජයකු මෙන් සිත්කලු විය.

ලක් දිවෙන් තුරන්ව යන ජෝන් ජයපාල දර්ශනාභිලාෂී වූ ඔහුගේ ඉෂ්ටානිෂ්ට මිත්‍ර සමූහය ද, මරණාසන්න ඥාතියකු වෙත එළඹෙන ප්‍රේත සමූහයක් මෙන් මෙ දින වැල නො නැවී පැමිණෙන්නට පටන් ගත් හෙයින් ඔවුන් සමග සම්භාෂණයෙහි යෙදුණු ඔහුට මේ දුෂ්ට ක්ෂණයෙහි විෂම්මතාව සිතින් බොහෝ දුර ඈත් කර ගත හැකි විය. සවස් වන කල, සමන් ගිර වැලිපෝත් රථ දෙක එන එක වාරයෙහි ජෝන් ජයපාලගේ පමණක් නොව, ජයපාල මැතිණියගේ ද, වෙසිගේ ද සිත් සතන් සෙණ හඬකින් මෙන් සියැස්සෙන්නේ ය. ඒ කන්තු මාර්ගයෙන් විශ්නා බායිගේ කට හඬ කොයි වේලේ අසන්නට ලැබේ දෝ, නැඳුවීම කොයි වේලේ අසන්නට ලැබේ දෝ යන භක්සයෝ-මාදයෙන් තරුණ ජයපාල තැති ගැනෙන්නේ ය. විශ්නා බායිගෙන් ප්‍රතිඥානුකූලව ලුත්තිය ඉෂ්ට වේ හෝ නොවේ හෝ යන වාශ්‍රොත්මාදයෙන් වෙසි ද, ජයපාල මැතිණි ද, තැති ගැනෙත්තා හ. ගත වූ සවස විශ්නා බායි සොයා වෙසි ගිය පවත් හා එසේ ගිය වෙසි, විශ්නා බායි කිව්ස ගත් පවත් හා කිසිවක් ගැන ජෝන් ජයපාල නො දන්නේ ය. විශ්නා බායිගේ ප්‍රතිඥාව පිළිබඳ රහස මේ නැන්දා-ලේලී විනා අන් කිසිවෙක් නො දනිති. විශ්නා බායි, මොහු නාතර කරන උපායය ගැන, මේ නැන්දා ද ලේලී ද නො දනිති. එ හෙයින් මෙය කෙසේ වන දෙයක් ද යන්න දකිනු කැමතිව, සාංදෘෂ්ටික ඵලාපෙක්ෂාවෙන් ඔවුහු නො ඉවසිල්ලෙන් පසු වෙති.

"ඔබට හොඳට ම විශ්වාස ද, ඇයගේ පොරොන්දුව වෙයි? විශ්නා බායි අලිම අලි අමාරු කාරී, ඇහුණා ද? ඒ කනෙන් කිසිත් මේ කනෙන් එන ගැති, එ දා මට ඇය කතා කළ හැටි තව ම මතක යි. ඒ නිසා ඇය ඔබටත් කණ ඇන්නුවා ද මොකද දන්නේ නෑ" කියා ජයපාල මැතිණි නොයෙක් පිහිටිලි ගනිමින් විතාළා ය.

"නෑ! නෑ! නෑ!" කියමින් ඊට පිළිතුරු දෙන ඩේසි, නිෂේධයෙන් හිස වනන්නී, "මට මුළු ජීවිතයට ම දකින්නට ලැබුණු ඉතාම අවංක හිතවත් කාන්තාව තමා, විශ්න බායි- මට මුළු ජීවිතයටම අසන්නට ලැබුණු ඉතා ම අවංක වචනය තමා ඇයගේ පොරොන්දුව" කියා යළිත් කීවා ය.

"මොකද, ඒ ගැන තව ම කිසි හැලහොල්මනක් නැත්තේ?"

"බලමු! බලමු"

මෙසේ කතා කරමින් ඔවුහු ජෝන් ජයපාල කෙරේ දූත්-දූත් ටැලිපෝන් පණිවුඩයකින් හෝ අන් කිසි සන්දේශයකින් හෝ ඇති විය යුතු වෙනස දකිනු කැමැත්තෙන් වෙන ම තැනක රහසේ පසු වූහ.

කාලය ඉකුත් වන නමුත්, ඒ හා සමග නො ඉවසිලි සිත වැඩි-වැඩියක් බලවත් වන නමුත්, දවසට ම විශ්න බායිගෙන් වචන මාත්‍රයක් හෝ නොලැබීම ගැන පුදුමයට පත් ජෝන් ජයපාල ටැලිපෝන් මගින් ඇය සෙවුවේ ය. විශ්න බායි විසින් නිවෙස අත් හරින ලද බැවින් ඊට දූන් ටැලිපෝන් සම්බන්ධය නොමැති බව ජෝන් දන්නේ ය. එ හෙයින් ඔහු වෙත නොයෙක් තැනින් ඇය ගැන විපරම් කර බැලුවේ ය. එසේ කර බලන කල්හි ද, කිසි තැනකිනුත් වුවමනාව නො පිරිමැසුණු හෙයින්, ඇය සමග කතා කිරීමට හැකි විදියක් කිසිවකු ගෙනුත් දූන ගත නුහුණු හෙයින්, ඇය තවමත් සිය කටයුතු නො නිමි නියාවනැයි සලකා · ඉඩ ලැබුණු මොහොතින් කොතැනින් නමුත් ඇය කතා කරන තෙක් ම, තවත් ඉවසිල්ලෙන් පසු වන්නට ඔහු සිතුවේ ය. විශ්න බායිගේ- නිසොල්මන ඔහුට පුදුමයක් නොවේ. පුදුමය නම් සිය පිය බිරින්දාගේත්, මැණියන්දැගේත්, නිසොල්වන ම තමා. මෙ දින දකුම් පිණිස මෙහි නොයෙක් ගිනි කෙළි වේතැයි ද, යන ටිකට වත් සැනසිල්ලේ විසුම් නො ලැබෙතැයි ද ඔහු විසින් කල්පනා කරන ලද නමුත්, දූන් වෙනදා පමණවත් හැල හොල්මනක් නැති වීම කෙබඳු අනුභවයක් භූමිය කොට ගත් කාරණයක් ද යන්න ඔහුට පුදුමයකි.



කල් යත්-යත් ම, ජෝන්, සිත සැක සහිත විය- සෙස්සන් සිත සැක දුරු විය. ජෝන්, ටැලිපෝනය නො තබා කතා කරන්නේ ය- විශ්න බායි ගැන විපරම් කරන්නේ ය. සෙස්සෝ සන්සුන් ලෙසින් බලා සිටින්නෝ ය- සිත යටින් සිනා සෙන්නෝ ය. ඉක්බිති ටැලිපෝන් මගින් කර ගත නො හැකි තරමට කාරණය බරපතළ වූ කල්හි, ඉස ගිනි ගත්තකු සේ පිස්සුවෙන් ඔහු මොටෝ රිය පිටත් කොට ගෙන, ඇය සෙවිල්ලේ ගියේ ය. විපරම් කර බැලිය යුතු තැනක් නො තබා, විපරම් කර බැලූ නමුත් ඇය ගිය තැනක් ගැන වත්, ආ තැනක් ගැනවත්, කිසිවක් කීමට කිසිවෙක් නොදත් හ. ඔහු නැව් තොට, නැව පිටත් වන තෙක් උදක් රැක්මෙහි ද යෙදී සිටියේ ය. ඉන් පසු, ඔහු සමන් ගිර බලා පැමිණියේ නියම උන්මත්තයකුගේ වේශයෙනි.

"ජුසේ, කවුරු වත් මා හම්බු වෙන්න මෙහෙ ආවේ නැද්ද? මට ලියුමක්- නැත් නම් පණිවුඩයක්- ආවේ නැද්ද?"යි සමන් ගිර පා තබන ඔහු ගිගුම් දෙමින් මහලු මෙහෙකරු විතාළේ ය.

ඊට පිළිතුරු දෙන මහලු මෙහෙකරු දුක් මුසු බැල්මෙන් හිස වනමින් "නැහැ"යිකීවා පමණකි.

"කවුද-? මොකද-? මට මහා ප්‍රයොගයක් කළා වාගෙයි, පෙනෙන්නේ ජුසේ, ඈත පෙර දිග යන නැව් ඔච්චර නොවෙයි තවත් තියෙනවා. ඔව්, ඒ හුනියම ගැන දූන ගත්තාට පස්සේ වැඩ හුහක් දුරටම නරක් වෙන්නට පුළුවනි"යි ජයපාල මෙහි දී මුළු සමන් ගිරට ම ඇසෙන සේ මහල්ලාට බැණ වැදුණේ ය.

ඔහු කරන කියන විකාර දකින ජයපාල මැතිණියටත්, ඩේසිටත් දූන් නම් සොම්නස් සිත ඉවසුම් නො දෙන තරම් ය.

"අම්මේ, මා කිවුවේ නැද්ද? විශ්න බායි කීවේ බොරුවක් නො වන බව. ඇය කොහොම නමුත් මෙයාට කණ අන්නාලා පැනලා ගිහින් තියෙනවා." යයි ඩේසි කීවා ය.

"ඇය තව ම ගිහින් නෑ- ඇහුණා ද ඩේසි? ගියා නම් ජෝංට නහච්චි යන්නේ නැහැ"යි ජයපාල මැතිණි ද කීවා ය.

ඒ කෙණෙහි ම සමන් ගිර බලා රැස් විහිදුවමින් එන රකුසු නෙත් යුවළකට බඳු දීප්තිමත් ආලෝකයෙන් සමන්විත මොටෝර්රියක් දක්නා ලදි. එය දුටු කෙණෙහි, තරුණ ජයපාලට මෙන් ම සමන් ගිර වැසි සෙසු කාහටත් මේ විශ්න බායි නොහොත් විශ්න බායි. පිළිබඳ කිසි යම් ප්‍රවෘත්තියක් රැගෙන එන වාහනයක් බව එක සැටියෙන් ප්‍රත්‍යක්ෂ විය. එ සේ ප්‍රත්‍යක්ෂ කොට ගත් අදහස් ඇති පිරිස් මධ්‍යයට මොටෝ රිය වන් ඇසිල්ලේ, එයින් අවතීර්ණ වූ බංගලි ජාතික පුරුෂයෙක්, ජෝන් ජයපාලට ලියුමක් දිගු කර සිටියේ ය. මේ පුරුෂ තෙම විශ්න බායිගේ කළමනාකරු වන්නේ ය. එ හෙයින් කවුරුත් ඔහු ගෙනා සන්දේශයෙහි අර්ථානාර්ථ සැළකීමෙහි ප්‍රෝත්සාහි වූහ.

"මා උඹවත් සෙවුවා නොවැ වර්මා? උඹ කොහාට වෙලා ද සිටියේ. අද දවස තිස්සේ ම?" මෙ සේ ප්‍රශ්න කරමින් ලියුම අතට ගත් ජෝන් ජයපාල විශ්න බායිගේ අත් අකුරු හැඳින ලා ගෙන, කළමනා කරුගේ පිළිතුරට ද සවන් නො දී එය වහ වහා කඩා බැලුවේ ය.

"මොකක්ද ඒ?" විශ්න බායිගෙන් ලියුමක් වාගෙයි" ඒ සියල්ලම බලා සිටි ජයපාල මැතිණි, සිය යෙහෙළිය විතාළා ය.

"ඒ වාගේ තමා- බලමු" යනු ඩේසිගේ පිළිතුර විය.

ලියුම කියවන කල්හිම, ජෝන් ජයපාල තුළ ඇති වූ කළබලය කාහටත් පෙනුණේ ය. ඔහු මොහොතින් එය කියවා අවසන් කළ හෙයින් කොට ලියුමක් බවද පෙනිණි. හේ එ සේ මය. ඒ නම්, ඉතා ම කුඩා ලියුමකි. එහෙත් එයින් තරුණ ජයපාල මළ මිනියක් මෙන් සුදුමැලි විය. ඔහු නැවත-නැවත එය දෙතුන් වරක්ම කියවා, සාරාංශය සලකා ගත නොහී, වංක ගිරියක මං මුළා වූ අසරණ පුරුෂයකු මෙන් උඩ බිම බලන්නට පටන්



ගත්තේ ය. මෙය නම් අශුභ සන්දේශයකි. එ පමණක් ඔහුට පැහැදිලි ය. එහෙත් මේ අශුභ සන්දේශයෙහි අමංගලාර්ථය පිළිබඳ දරුණු නො දරුණු කම ඔහුට තවමත් නො පෙනේ. ඒ ලියුම මෙසේ යි.

"වර්ෂ 193... වනුයේ මැයි 2 වන දින
කොළඹ, කුරුඳු වත්තේ දී ය.

"මා හිතවත් මහත්මයාණෙනි,"

"ඔබ කැටුව යන මට සෙරක යනුවෙන් නැගෙන අපවාදය දුරු කළ නො හැකි යි. ඔබේ මතු දියුණුවට අපකාරයක් විනා උපකාරයක් ද කළ නො හැකි යි. ඔබ නැතිව යන මට මේ ගමන හැර අන් ගමනක් ද ගිය නො හැකි යි. එ හෙයින් මම මේ ගමන යන්නෙමි. ඔබට ආයුබෝවන්!"

"මීට-සෙනෙහැති,
"මාලිනී"

"මේ මොක ද මේ?" කියා ජයපාල කළමනා කරු මුහුණ සන්වේගයෙන් බලා, "මට නම් මේසෝ අග මුල කිසිවක් ම තේරෙන්නේ නැහැ. කෝ විශ්න බායි?" කියා නැවත ගර්ජනය කළේ ය.

"මාත් මේ පස්වරුවේ පටන් ඇය ගැන තමා විපරම් කෙළේ. මගේ ලියුමක දමා මේ ලියුමත් මට තැපැලෙන් එවා තිබෙනවා මහත්මයාට දෙන්නට ය කියා" කළමනාකරු තැති ගැනෙමින් කීයේ ය.

විශ්න බායි විසින් කළමනාකරු වෙත ද එවන ලද්දේ, මෙ වැනි ම වූ කොට ලියුමකි. එහි සිය නළු ගණය සහිත උපකරණ සියල්ල, කලින් කළ අදහසට අනුව, ඈත පෙර දිග නො යවා, ආපසු ගෙන ගොස් යෝගිනී ජාන්හට බාර දෙන ලෙස නියම කර තුබුණේ ය. මෙ පමණක් විනා ඇය මෙසේ අදිසියේ අතුරුදන්

වෙමින් ගිය අතක් ගැන වත් කළ දෙයක් ගැනවත්, කිසිවක් මේ ලියුම් දෙකින් ම නො පෙනෙන්නේ ය. ඇය උදෑසන ම ගෙදර මෙහෙකරුවන් වැටුප් ගෙවා නිදහස් කොට, සිය මෝටෝ රියෙන් හුදකලාව ම පිටත්ව ගිය ගමන් තවත් ආපසු නො පැමිණී බව ද කළමනාකරු විසින් කියන ලදී.

දැන් නම් ඉසින් කල්පනා කිරීමට නොව, වැඩ කිරීමට කාලය බව ජයපාලට පෙනෙන හෙයින්, ඔහු එ වේලේ ම කළමනාකරු සමඟ මෝටෝ රියට නැඟී ගෙන, විශන බායි සොයනු වස් යළිත් පිටත් විය.

"ළමයා, වෙන්න තියෙන එකක් වළකන්න බැරුවා වගේ තමයි, වැළකෙන්න තියෙන එකක් වෙන්නත් බැරියි" පුතා නික්ම ගිය ඇසිල්ලේ, ජයපාල මැතිණී යෙහෙළියට කීවා ය.

"මන් හුඟක් බාර භාර වෙලා තියෙනවා. ඒවා හෙට හිට ම ඔප්පු කරන්න ඕනෑ." ඩේසි කීවා ය.

කොයෙක් සෙවිලත් ඉසින් නම් කවදා වත් ම ජෝන් ජයපාලට විශන බායි නො ලැබෙන බව ඩේසිට සවන ඉන්ද්‍රියයකින් මෙන් දැනෙන්නේ ය. ඇය යන්නට ඇත්තේ, තවත් නම් නො සෙවිය හැකි විදෙශයක ම විය යුතු ය. තවත් නාටක ව්‍යාපාරයෙන් රැකෙන බලාපොරොත්තුවක් ඇසිව, ගිය ගමනක් නො වන බව ද පෙනෙන්නේ ය. ඇය පෙවුම ලෙහෙසි වැඩක් නොවන්නේ ද එහෙයිනි. සමන්ගිර නැවතත් ප්‍රීත්‍යාලෝකයෙන් බබළන්නට විය. එහි මිණි පහන් පුවළ- නැත්තට ම දා ගියා සේ තිවුණු මිණි පහන් පුවළ- ප්‍රතිසංස්කෘත වස්තුද්වයක් මෙන් යළි සුගන්ධ තෙලයෙන් පරිපොෂිතව බබළන්නට විය. තදනුරූපව මෙහෙකරු ජනයෝ ද ප්‍රසන්න වූ සිත් සතන් ඇත්තෝ වූහ. මේ රෑ ජෝන් ජයපාලට හැර සෙසු සියල්ලන්හට ම සමන් ගිර මඟුල් ගෙදරකි. පුරා මාසයකට පසු එහි වැඩ කාහටත් ආහාරය සුභොජනයක් වී නම්, ඒ මේ රාත්‍රිය මුල් කොට ගෙනවිය. ස්වාමි පුත්‍රයා මේ විමසියෙන් මඟ හරවා ලන පිණිස මෙහි මෙහෙකරුවන් විසින් ද



තම-තමන් සරණ යන තොයෙක් දෙවියන් පිහිට සොයන ලදී. එ හෙයින් ඔවුහු කවුරුත් එක සේ ප්‍රීතියෙන් තම-තමන් දෙවියන්ගේ නාස් නම් ගැන ද මෙහි දී වනන්නට වූහ. අන්නම් එළි බැලීමෙන්- සාස්තර ඇසීමෙන්- පේන ඇසීමෙන්- පවා කළ පිළිවෙත් ගැන කතා කරන සමහරු සාස්තර කාරයන්ගේ අගය කීහ- සමහරු ඇදුරන්ගේ අගය කීහ. සමහරු දෙගොල්ල-ගේ ම අගය කීහ. ජෝන් ජයපාලගේ ජන්ම පත්‍රය බැලූ දෙවඥයාගේ අගය, ජයපාල මැතිණිය විසින් කියන ලදී. අත බැලූ සාස්ත්‍රිකයකුගේ අගය ඩේසි විසින් කියන ලදී.

විශන බායි පෙවිල්ලේ ගිය ජෝන් ජයපාල ආපසු ගෙදර එන විට, මධ්‍යම රාත්‍රිය ගතවිය. ඔහු කිසිවකු සමඟ කිසි කතාවක් බහක් නො කොට, කොපයෙන් හා ශොකයෙන් විඩාවට පත් ව, යහන් ගැබ වැදුණු ගමන් නිසොල්මන්ව සිට, නො නිදා පහන් කළ කෙණෙහි පූර්වොක්ත ශොක පරිපීඩිත චිත්තයෙන් ම යළිත් විශන බායි පෙවිල්ලේ පිටත්ව ගියේ ය. ගත වූ සවස ගත් වෙහෙසින් ඔහුට කිසි ම පලක් නො වීය. හැම පොලිසියක් වෙත ම ඇයගේ මෝටෝ රිය නොම්මරය ගැන දන්වා යවන ලද හෙයින්, එයින් ඇය ආ-ගිය අත, නොපමාව ම හෙළි විය යුතු ය. ඇය ලන්ඩියෙන් තුරන්ව ගිය බවට නම් කිසිම සාක්ෂියක් දක්නා නො ලැබේ. ලන්ඩියෙන් ඇය තුරන්ව ගියා නම්, එයත් ජෝන් සිතට එක්තරා සැනසීමකි. දැන් ඔහු සිත නො සැනසෙන්නේ, ඒ සේ ද තුරන්ව නො ගිය ඇයට මෙහි දී වූණු දෙයක් ගැන කිසිවක් කිසි ලෙසකින් නිශ්චය කර ගත නොහෙන හෙයිනි.

"ඇ! ඇ! ඇ!" දැන් ජෝන් ජයපාල කටින් මැතිරෙන එක ම මන්ත්‍රය මේ පමණකි. හිය-හිය තැනින් කෙරෙන එක ම ප්‍රශ්නය ද මේ පමණකි. දැන් මේ අකුරට ඔහු දක්වන ප්‍රෙමය ඇකාර වාදියකු කෙරෙහි ද නො මැත්තේ ය. "ඇයගේ" මාධුර්යය දන්නේ ඔහු පමණකි. එ හෙයින් ඇය නො දකින ඔහු දෙ නෙත හිරු නො දකින නිලුපුලක් මෙන් මුකුලිත වන්නේ ය- දර්ශිය නො ලබන අන්ධයකුගේ මෙන් කළුව සලන්නේ ය.

විජේන බායි අදිසියෙන් මෙ සේ නැසිවූ බව පුවත් පත් මගින් ද රට පුරා පතළ විය. මෙ තෙක් රට-තොරට කාහටත් පුදුම සිසිවිලි දුන් මේ අරුම නාළහන මෙ සේ අදිසියේ අතුරුදන්ව, කෙළේ ද තවත් උත්සවයකැයි සමහරු කල්පනා කළහ. එහෙත් අසරණ ජෝන් ජයපාලට නම් මෙහි නාස්ති ගතියක් විනා උත්සවයක් හෝ ආශ්චර්යයක් හෝ ප්‍රාතිහාර්යයක් හෝ නො පෙනෙන්නේ ය. ඉක්බිති විජේන බායිගේ නොම්මරය දරන හිස් මෝටෝ රියක් අරණායකට නුදුරින් මහමඟ බඩ පාර අයිනේ, තිබෙන බව පොලිසිය විසින් දන්වන ලද කල්හි, ජෝන් ජයපාල ද එකෙණෙහි එහි පිටත්ව ගියේ ය.

මනුෂ්‍යයා චරිතය අනාචාරාත්මක වන කල්හි ඊට වන්දිය තෙමේ තමාගේ දුබල කම්වලින් නොහොත් නුනුවණ කම්වලින් ගෙවන්නේ ය. මේ වූ කලී, කෙසේ වත් වැළැක්විය නොහැකි ධර්මතාවකි. ජෝන් ජයපාලට අරණායක දී පළමුවෙන් මාලිනිය දකින්නට ලැබුණේ, යම් තැනකද, එ තැන ම, දන් පාර අයිනේ විජේන බායිගේ හිස් මෝටෝරිය පෙනෙන්නට වූ කල්හි ඔහුට ඇති වූ හෘදය වේදනාව කිය නො හැකි තරම් දරුණු විය. මෙ තැන, මෙ සේ, මේ මෝටෝරිය අත් හැර දමා යන කල්හි විජේන බායිට නම් ඇති වුණේ, මෙයින් සියෙන් කොටසක වත් හෘදය වේදනාවක් නොව, ආත්ම ත්‍යාග විෂයක උද්දාමයකි. ආත්ම ත්‍යාගයෙහි ද විජයෝත්සවයෙහි මෙන් ප්‍රීතිය විනා ශෝකයක් නම් නො වන්නේ ය. යමෙක් තෙමේ ජීවිතය අනාචාරාත්මක ක්‍රියා දෝෂය කරණකොට විපත්තියට පැමිණි නිර්දෝෂ මනුෂ්‍යයන් දකින්නේ ද, එ කල්හි ඔහුට ඇති වන පශ්චාත්තාපය අපා දුකටත් වඩා දරුණු ය. දන් මේ දරුණු දුකින් අත් මිදෙනු කැමති ජෝන් ජයපාල හැකි නම් ඒ වෙනුවට අපායයේ කල්පයක් වුවත් ගිනි තපින්නට සූදානම් ය.

එහි රැස් වූ අපමණ පිරිස් වූහ. තමා හඳුනන-නොහඳුනන කිසිවකුගේ වත් මුහුණ බැලීමට නො සමත් වූ හෙතෙමේ ආත්මාපවාදයෙන් පෙළෙන්නට පටන් ගත්තේ ය. මේ මළ ලොව



මවිත කළ පුදුම නාළහන කවුද යන්න දන්-දන් තවුරුත් දනිති. ඒ හෙයින්, ඇය මෙසේ තම උපන් ගම සොයා යන්නට ඇතැයි ද සමහරු කල්පනා කළා ය. ජෝන්හට නම් නිකිණියාගේ මාලිනිය සෙවීම නිකිණි සෙවීම වැනි වෘථා පරිශ්‍රමයකි. මාලිනිය සෙවිය යුතු කෙසේ වූ තැනක ද යන්න දන් ඔහු සිත. ඔහුට කියන නමුත්, අනුමිති මාත්‍රයකින් හෝ කදනුකූල චේතනාය ප්‍රකාවේක්ෂණය කිරීමට අපොහොසත් හෙයින් අනෙයන් අනුමත කරමින් තෙමේ ද නිකිණියාගේ සෙවිල්ල පටන් ගත්තේ ය. මාලිනිය ආවාහයෙන් කැඳවා ගෙන ගියාට පසු, මේ ඔහු නැවත නිකිණියාහට පැමිණි පළමු වන වතාව ය. මෙහි දී පළමු කළ කී දෙය සිහිපත් වීමෙන්, මාලිනිය ගැන මතක අලුත් වීමෙන්, ඇය සමඟ පිළිපදරින් කල් ගත කළ හැටි දකින ඔහු දෙ නෙතින් කඳුළු ගලන්නට විය. මාලිනී යන නාම මාත්‍රය පවා දන් කාගෙදු පූර්වක ගෞරවයෙන් නිතර සිහි කරන නිකිණියාන ගම්මුන්හට ඇය නැති බව සැළ වූ කෙණෙහි දොම්නසින් මිප්සු වැහුණා මෙන් විය. මාලිනිය ජීවිතය ඉෂ්ට දේවතා කොට සලකන නන්ද රාළ ද, අන්දා ද ශෝකයෙන් පෙළී-පෙළී දවී-දවී වැලපෙන කැනැත්තෝ, මහ ඔයෙන් මෙ ගොඩ පලාතට වත් එදා ඇය නො පැමිණි බව කීහ.

සා දුකින් ද, සෝ දුකින් ද, පවසින් ද, ගමන් වෙහෙසින් ද, නැවෙන ජෝන් ජයපාලට දන් නම් සුව පහස් දෙන මඳ පවන පවා දුකක් මෙන් දනෙන්නේ ය. සිත්කලු, නෙත්කලු, කන්කලු, සියල්ල ද දුකක් නොහොත් පීඩාවක් මෙන් දනෙන්නේ ය. මෙ සේ ඔහු දුක් සයුරට ගලා බසින කාත් සොම්නස් ගංඟාවරු පවා නිරවශේෂයෙන් ලුණු රස බවට පැමිණෙන කල්හි, ඔහුට වෙසක් මස, මහ වැසි කාරණ කොට ජල ප්‍රවාහයෙන් බලවත්ව, නැගෙන්නට වූ මහ ඔය බව කුඹුක් අතු පතරන රැළුණු මළ සිරුරක් ගැන සැළ විය. ඔහු කනට වැද්ද දුන් මේ තරම් දරුණු ආරංචියක් කිසි කලක නො විය. ඔහුට එය කන වැකුණු පොණ හඬක් නොහොත් කන ඇනුණු ය හුලක් මෙන් වී. එයින් මොහොතක් පමණ සිහි පත් නැතිව මෙන් සිට, යළි ප්‍රවෘත්තිය අනුසරණය කළ පිරිස්

අනුව, හේ යන්නට පටන් ගත්තේ ය. ඔහු මෙ වේලේ, වැනි-වැනී යන පිස්සකුගේ නොහොත් යුදෙන් පැරද අඩ පණවී, වැටි-වැටී යන සෙබළකුගේ වැනි ගමන් ඇත්තේ, කෙසේ නමුත්, මෙසේ සෙනහ වැල නොයික්මවා යුහුව-යුහුව යන්නේ, සංගිලි පාලමෙන් පහල මහ ඔය දකුණු තීරේ, මහ කුඹුක් ගස් මුලකට පැමිණියේ ය. අනතුරුව සෙනග පීරාගෙන යුහුව-යුහුව ගං තෙරට සමීපව ජල වැල විනිවිද බලන්නේ, ගන දිය සෙවෙලක් මෙන් අතු පතර බැඳුණු කෙස් වැටිය දක, එ පමණකින් ම එය හැඳින්නේ ය. "මේ, ඇය-ඇය-තමා! ඇය තමා!" යන්න පමණක් ගොත ලන ඔහු කටින් එ කෙණෙහි පිට විය.

* * *

මාලිනියගේ ආදාහනය ඇයගේ ජන්ම භූමියෙහි ම ජෝන් ජයපාලගේ විශෙෂ පරිශ්‍රමයෙන් ද, ගෞරවයෙන් ද, සිදු කරන ලදී. ඇය සිහිවීම වශයෙන් නිකිණියානෝ දකුම්කලු සොහොන් කොතක් හා තවත් ගොඩනැගිලි කිහිපයක් ද බැඳුණු නමුත් ඒ හැමටත් වඩා විශේෂ ගෞරවයෙන් ඇය පුදන ලද්දේ ඩේසි විසිනි. ඩේසි සුදුසු කාලයෙහි ලැබූ සිය කුළුඳුල් ගැනු දරුවාට "මාලිනී" යන නාමය තැබීමෙන් මේ විශේෂ ගෞරවය කළා ය.

**නිම**